The Reader's Place
Uploaded By
The Reader's Place

මාගම් සෝලිය

මුහුණත සිත්තම
සංජය ඇපා සෙනෙවිරත්න

ඇතුළත සිත්තම
කරුණාසිරි විජේසිංහ

කාව සිත්තම
චමිලා මංගලගම

ක්‍ෂ සංස්කරණ සහ සැකසුම
SYNERGY design studio
011 2 811722

වර්ණ සංයෝජනය
ිරංජනී කුමාරප්පෙරුම

සෝදුපත් කියවීම
නිමල් දිසානායක
ායනා වික්‍රමසුන්දර

විශේෂ ස්තුතිය
ර්ය ජේ. බී. දිසානායක
ාචාර්ය අමරසිරි වික්‍රමරත්න
සිරි, උදිත සේනාරත්න

කුරා කුහුඹුවෙකුටවත් වරදක් නොකළ
එහෙත්
මහා පව්කාර වරදක් කළ විදිහට
මේ පොළොව උරුම නැති මිනිසුන් අතින් මිය ගිය
ඌව වෙල්ලස්සේ මුතුන් මිත්තන්ට
මෙය ගෞරව බහුමානයක්ම වේවා!

The Reader's Place

වචනයක් දෙකක්

සමහරු මා මේ පොත ලියා අහවර කළ විට
මෙය මොන වගේ පොතක්දැයි
නිතර නිතර මගෙන් ප්‍රශ්න කරමින් විමසූහ.
සැබවින්ම මම එවිට නිරුත්තර වීමි.
මෙය ඉතිහාස කතාවක්ද, ඇත්ත කතාවක්ද,
මනඃකල්පිත කතාවක්ද,
එසේත් නැතිනම්
මේ ලෝකයේ කවම කවදාවත්
සිද්ධ නොවන කතාවක්ද කියා
මම නොදනිමි.
මගේ කාර්යභාරය අවසන් කර ඇති බැවින්
ඔබට කැමති විදිහට එය තීරණය කරන්නත්,
ඔබට කැමති විදිහට එය රස විඳින්නත්
සැබවින්ම ඔබට දැන් අයිතියක් ඇත.
එබැවින් එයට පූර්ව පාඨ සැපයීම
මෙතැන් සිට
මෙහි සර්වබලධාරී අයිතිකරු වන ඔබට කරන
කමකට නැති මදි පුංචිකමක් කොට සලකමි.

මොහාන් රාජ් මඩවල

පුරාණ මායාවරුන්ගේ කැලැන්ඩරයේ අවසාන් දින හෙවත් ලෝක විනාශය සිදුවන බවට ඇතමුන් අනාවැකි පළ කළ 2012 දෙසැම්බර් 21 වන දින මාලබේදිය.

0722 722000
mohanmadawala@gmail.com

The Reader's Place

යනු සැබෑ ලොව අනුකරණය කරමින්
ත් නිර්මාණය කරන ලද කල්පිත ලොවකි.'

- කල්පනා ලෝකය -

චාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

පෙර සටහන

ඉංග්‍රීසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් ලන්දේසීන්ගෙන් අත්පත් කරගනු ලබන්නේ 1796 දීය. සිංහලේ අවසන් රජ වූ නායක්කාර් වංශික කන්නසාමි කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් වයස අවුරුදු 18 දී උඩරටදී අභිෂේක ලබන්නේ 1798 දීය. 1803 දී ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා යටතේ ඉංග්‍රීසින් උඩරට ආක්‍රමණය කළත් රදළ ප්‍රධානීන්ගේ සහ රට වැසියන්ගේ සහයෝගය ලබාගෙන එය සාර්ථක ලෙස මැඩ පවත්වන්නට රාජසිංහ රජු සමත් විය.

එහෙත් බ්‍රිතාන්‍ය සිවිල් සේවක ජෝන් ඩොයිලිගේ සූක්ෂ්ම උපාය මාර්ග හරහා රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා යටතේ 1815 දී ඉංග්‍රීසින් උඩරට ආක්‍රමණය කරන විට රාජසිංහ රජු රදළ ප්‍රධානීන්, භික්ෂූන් වහන්සේලා හා රටවැසියන් අතර බෙහෙවින් අප්‍රසාදයට පත්ව සිටි නිසා ඔහුට ඔවුන්ගේ සහයෝගය නොලැබිණ. ඒ අනුව 1815 දී වසර 2300 ක් මෙරට පැවති රාජාණ්ඩු ක්‍රමය අවසන් වී උඩරට රාජ්‍ය උරුමය එංගලන්තයේ තුන්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්ට බාර විය.

ඉන් පසුව ඉංග්‍රීසින් උඩරට රදළ නායකයන් සමග එකඟව අත්සන් කළ උඩරට ගිවිසුමට ප්‍රතිපක්ෂව යුද නීතිය සියතට ගෙන කටයුතු කරන්නට වූ බැවින් 1818 දී ඉංග්‍රීසින්ගෙන් රට බේරාගැනීමේ අදිටනින් යුතුව ඌව වෙල්ලස්ස කැරැල්ල ඇරඹිණ. එය එදා මෙදා තුර ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ ශ්‍රී ලාංකිකයන් අධිරාජ්‍යවාදී හමුදාවකට එරෙහිව මුහුණ දුන් දරුණුතම - ඛේදනීය විමුක්ති සටන ලෙස ඉතිහාස ගත වී තිබේ.

මේ කාල අවකාශය තුළ ක්‍රි.ව. 1809 ත් 1819 ත් අතර දශකයක කාල පරාසයේ ඌව වෙල්ලස්සේ ගමක සිදු වූ හා නොවූ සිද්ධි සමුදායක් මේ කතාවට වස්තු විෂය වෙයි.

The Reader's Place



The Reader's Place

01

සැන්දෑ හිරු එළියෙන් පෑළ දිග අහස රක්ත වර්ණ වෙමින් තිබුණු ඒ සන්ධ්‍යා යාමයේ ඇබිත්ත කොලුවා ඇහිපිය නොහෙළා බලා සිටියේ ලොකු හාමුදුරුවන් දිහාය.

'හවසට හොඳ ආසන දෙකක් හරිගැස්සුවොත් හොඳයි... මගේ ඇඳ ළඟ.'

උන්වහන්සේ මේ විධානය ඇබිත්ත කොලුවාට කර තිබුණේ එදා ඉරිමා උදයේ දෙමට කූරකින් දත් පිරිසිදු කරන ගමන්ය.

The Reader's Place

ඌව වෙල්ලස්සේ කැළෑබදට වෙන්න ඇති මේ ගම් මණ්ඩියට තියෙන එකම පන්සල මේකය. ලොකු හාමුදුරුවන්ම ඇබිත්ත කොලුවාට කියා ඇති විදිහට මේ ආරාමය ශත වර්ෂ ගණනාවක් පැරණිය. දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කාලයේ තිස්ස කුමරා මේ අඩවියට සැපත් වූ අවධියේ මේ ආරාමය පිළිසකර කරනට ඇති බවය, මුඛ පරම්පරාගතව පැමිණි විශ්වාසය වුණේ.

ඒත් උන්වහන්සේ මීට දශක හතර පහකට ඉස්සර මෙහාට වඩින විට මෙතැන තිබුණේ පන්සලක් නොවේ. ගරා වැටුණු වරිච්චි බිත්ති කීපයක් සහ ගල් කණු කීපයක් පමණි. වල් ගස්වලින් වටවුණු බෝධි වෘක්ෂය හඳුනාගන්නට බැරි තරමටම වල් වැදී

තිබිණි. ඒත් ගමම ජේන මේ ගල් පොත්ත උඩ මේ පන්සල සකසාගන්ට උවමනා දහිරිය ලොකු හාමුදුරුවන්ට ඕනෑවටත් වඩා තිබිණි. එහෙයින්ම මාස ගණනක් තිස්සේ දිවා රෑ නොබලා කරන ලද මහන්සියට පින් සිද්ධ වෙන්නට යන්තම් පන්සලක් යැයි කිව හැකි පරිසරයක් තනාගන්නට හැකියාව ලැබිණි.

ඇබිත්ත කොලුවා පන්සලට එන්නට පෙරාතුව අවුරුදු ගණනාවක් තිස්සේම උන්වහන්සේ මේ පන්සලේ උන්නේ තනිවමය. ගමේ මරණයක්, දානයක්, බණක්, පිරිතක් ඇති වෙලාවට ගම්මුන්ට පිහිටට හිටියේ ලොකු හාමුදුරුවන් විතරය. උන්වහන්සේ අඩුවක් පාඩුවක් නැතිව ගම්මුන්ගේ ඒ සියලු කළමනා ඉස්තිරේටම ඉටු කළහ. ජීවිතයත් එක්ක අනවරත යුද්ධයක යෙදුණ ගම්මුන්ට පන්සල දිහාම ඇහැ ගහගෙන ඉන්න වෙලාවක් තිබුණේ නැත. ඒත් ගම්මු පුළු පුළුවන් විදිහට මාසෙ දවස් බෙදාගෙන හාමුදුරුවන්ගේ දාන වේල සරි කළෝය. ඒත් මාසෙ දවස් හත අටක්ම උන්වහන්සේට බඩගින්නේ ඉන්නට සිදු නොවුණා නොවේ. ඒත් කටක් ඇරලාවත් ඒ ගැන උන්වහන්සේ කතා කළේ නැත.

ඇබිත්ත කොලුවා පන්සලට එන්නට පෙරාතුව ලොකු හාමුදුරුවන් පන්සලේ ගත කළ අවුරුදු හතළිහක පනහක කාලය උන්වහන්සේ තනිකරම තනිපංගලේ පන්සලේ හිටියා යැයි කීම සම්පූර්ණ සත්‍යයක්ම නොවේ. කීප විටකම ගම්මුන්ගේ කැමැත්ත අනුව කුල දරුවන් කීප දෙනෙකුම ලොකු හාමුදුරුවෝ මහණ කළහ. ඒත් ඒ එක් අයෙකුවත් අවුරුදු තුන හතරකට වඩා මහණකමේ හිටියේ නැත.

අවසන් වරට මහණකමේ හිටි පල්ලේගම උන්නාන්සේ පුරා අවුරුදු දහයකට වැඩියෙන් සිවුරු දරා පන්සලේ සිටියහ. ලොකු හාමුදුරුවන් කියන විදිහට උන්වහන්සේගේ හොඳම ගෝල තැන පල්ලේගම හාමුදුරුවෝය. ඒත් උන්නාන්සේට යන්තම් අවුරුදු දහ අට පිරුණා විතරය; එක්තරා දවසක පාන්දර යාමයේ කුකුළන් ඇහැරෙන්නටත් මත්තෙන් පැදුරවත් නොකියා උන්නාන්සේ අතුරුදන් වී සිටියහ.

ඒ සිද්ධිය සිදුව වී දැනට අවුරුදු පහකට වඩා නැත. ඉන් මාස හයකට විතර පසු ඇබිත්ත කොලුවා පන්සලට පැමිණියේය.

ඇබිත්ත කොලුවාගේ නම සුදු බණ්ඩාය. ගම මැද්දේ හාමිනා පවුලක උපන් සුදු බණ්ඩා ඔහුගේ මවට සිටි එකම දරුවාය. එය එසේ සිද්ධ වුණේ සුදු බණ්ඩාගේ අප්පොච්චාට හෙවත් පුංචි රාළට තවත් දරුවන්ට වග කියන්න පුළුවන් වෙන විදිහට සුදු බණ්ඩාගේ අම්මා ජීවතුන් අතර නොසිටි නිසාය.

සුදු බණ්ඩාගේ උත්පත්තියෙන් අවුරුද්දක් පිරෙන්න මත්තෙන් ඔහුගේ මව මියගියාය. අප්‍රමාණ පුරුෂ ශක්තියකින් හෙබි පුංචිරාළ සිය බිරිඳ, ඩිංගිරි මියයන විට තවත් දරු කැළලකට වග කියා තිබිණි. එහෙත් ඒ දරුවා වදන්ට පොදන්ට හිතන්ටත් කලියෙන් ඇ මියගියාය.

ඩිංගිරි පොළොවට යට කර තුන් මාසයක් ගත වෙන්න කලියෙන් පුංචි රාළ තවත් ගෑනියෙකු ගෙට ගත්තේය. ඇට යන්තම් අවුරුදු දාහතර පිරුණා විතරය. එතැන් සිට අවුරුද්දෙන් හමාරෙන් ළමයි වදන එක දෙවෙනි බිරින්දෑගේ රාජකාරිය වුණේය.

නමින් ගෝමරි වූ ඇය හත්වන දරුවා බිහි කරන විට සුදු බණ්ඩාගේ වයස අවුරුදු දාහතර පිරුණා විතරය. තමන්ගේ සහෝදර සහෝදරියන්ට වාගේ තමන්ගේ කුඩම්මා තමන්ට නොසලකන බව සුදු බණ්ඩා තේරුම් ගත්තේය. ඇගේ සියලු ආවතේව වැඩ බාර වුණේ ඔහුටය. රෑට රෑට ඇගේ ඇඟ උඩ සිංහල පැය දෙක තුනක දහඩිය මුගුරු වගුරා පුරුෂ ධාතු පිට කිරීම හැර පුංචි රාළ ඇ වෙනුවෙන් කළ දෙයක් නැත. පුංචි රාළ ගෝමරි ගෙට ගත් මුල් සන්දියේ ඇය රෑට රෑට ඔහු සමඟ හරි හරියට පොර බැදුවාය. කල් යත් යත්ම ඇගේ ජවය එන්න එන්නම අඩු විය. අන්තිමට දරුවන් හත් දෙනෙකු වදා යන්තම් අවුරුදු විසි හත ලබන විට ගෝමරි පැදුරු කඩමාල්ල උඩ ඔහු වෙනුවෙන් හැඟීම් රහිතව උඩුබැලි අතට වැතිරෙන තැනට වැටුණාය.

හොඳ සවි ශක්තිය ඇති මිනිහෙකු වූ පුංචි රාළ ගෙදර දොරේ අඩුපාඩු නොපිරිහෙලා ඉටු කළේය. තමන්ගේ දරුවන් අට දෙනාට සහ තමන්ගේ ගෑනිට ඇති තරම් කන්ඩ බොන්ඩ

The Reader's Place

ගෙනැවිත් දුන්නේය. ඒ සඳහා ඔහු තනිවම මහ මූකලානේ මැද කුරහන් අමුණක විතර වපසරියක් ඇති හේනක් කෙටුවේය. ගෙදරට ඇති තරම් ධාන්‍ය, කුරහන්, එළවළු, පලා එයින් ලැබිණි. ඒ හැර ගෝමරී වෙනුවෙන් මිඩංගු කරන්නට කාලයක් හෝ දරුවන් වෙනුවෙන් ගත කරන්නට කාලයක් හෝ ඔහුට නොතිබිණි. ඒ නිසාම ගෝමරීගේ සියලු ආවතේවකම් කිරීමත්, හැකි හැම විටම තම සහෝදර සහෝදරයන් රැක බලාගැනීමත් සුදු බණ්ඩා පිට පැවරිණි.

මේ නිසාම තම කුඩම්මා තමාගේ අනෙක් සහෝදර සහෝදරියන්ට වගේ තමන්ට නොසලකන බව සුදු බණ්ඩාට තේරුම් ගොස් තිබුණේය. එහෙත් සුදු බණ්ඩාගේ හිතේ තරව, තදින් මුල් බැස තිබුණ මේ සිතිවිල්ල ඉරිතලා ගිය දවසක් උදා වුණේය.

සුපුරුදු පරිදි පුංචි රාළ එදා උදෑසනම හේනට පිටත් වුණේය.

'උඹ හවහට වරෙන් හේනට. උගුල්ලාපු මයියොක්ක අල ටිකක් ගේන්ඩ තියෙනවා ගෙදරට.'

යන ගමන් පුංචි රාළ සුදු බණ්ඩාට කීවේය. එතැන් සිට සුදු බණ්ඩාට කරන්න සිද්ධ වුණේ ගෝමරීගේ ඕනෑ එපාකම් ඉටු කරන එකය. ඔහු ගෝමරීට උයන්න උදව් වුණේය. කැලෙන් දර එකතු කරගෙන ආවේය. යන්තම් අවුරුදු දෙකකට කිට්ටු කුඩා එතනා කරගෙන ආවේය. යන්තම් අවුරුදු දෙකකට කිට්ටු කුඩා එතනා බෙරිහන් දෙන හැම වරකම ඇය පරක් කළේය. අන්තිමට දහ දොළොස් වතාවක්ම වැවට ගොස් ලොකු කළ ගෙඩිවලට වතුර ගෙනැවිත් ගෝමරීට නාන්නට වතුර සරි කර දුන්නේය.

කළ ගෙඩිවලින් වතුර ඉහට වත් කරගෙන ගෝමරී නාන්න පටන් ගත්තා කියන්නේ සුදු බණ්ඩා ගෝමරීගේ රාජකාරිවලින් මඳකට අස්වැසිල්ලක් ලබනවා කියන එකය. එතැන් පටන් පැය කීපයක් යන තෙක් ඇගේ කටින් ඔහු වෙනුවෙන් විධාන පැන වෙන්නේ නැත.

ගෝමරී මිදුල කෙළවරේ නාන්න පටන් ගත්තාය. සුදු බණ්ඩා එතනා හුරතල් කරන්න බිතක්කනේ බිම ඇඳි ගත්තේය.

The Reader's Place

වැඩි වේලාවක් ගත වුණේ නැත. ගෝමරීගේ කටහඬ ඈත සිට ඇහුණේය.

'සුදු බණ්ඩේ... මෙහෙ වරේං...'

ඇගේ වැඩ රාජකාරිවලින් යම් අස්වැසිල්ලක් ලැබූ විගසම යළි ඇගේ විධානය ඇසීම ඔහුට නොරිස්සුම් සහගත වුණේය. ඔහු මොහොතක් හුන් තැනම හිටිවනම හිටියේය. යළි මොහොතක් කල්පනා කර ආයාසයෙන් පා අද්දමින් ඇය නාමින් සිටි මිදුලේ කෙළවරට ගමන් කළේය.

මිදුලේ වැලි සමඟ ගැටෙන ඔහුගේ හීන් පියවර හඬින් ඔහු එන මානය ඈ හැඳින්නාය. ඔහු එන මඟට පිටුපා බිම හිප්ප තියාගෙන කළයෙන් වතුර රැගෙන හිසට වත් කරමින් සිටි ඇය ඔහු ළඟට පැමිණි විට මෙසේ කීවාය.

'මගේ පිට ටිකක් අතුල්ලහං...'

ගෝමරීගේ පිටට පිටුපා ඔහු ඈ හිටි විදිහටම බිම හිප්ප තියාගත්තේය. රවුම් සුමට ගල් පතුරක් අතට ගෙන සියුම් ලෙස ඇගේ පිට අතුල්ලන්නට වුණේය. එක් වරම ඇය ඔහු දෙසට හැරුණාය.

'කුඩම්මට රිදුණද...?'

ඇය සිනාසී ඔහු දෙස බැලුවාය.

'උඹේ අත් කොට්ට ගෙඩි වගේ පිරිලනෙ...'

ඇය ඔහුගේ අත මත තිබුණ රවුම් ගල් පතුර බිමින් තබා ඔහුගේ අත්ල අත ගෑවාය. ඉක්බිතිව ඔහුගේ මුහුණ දිහා කෙළින් බැලුවාය.

'උඹ දැන් මහ මිනිහෙක් වෙලා...'

ඔහු බිම බලා යන්තමින් සිනාසුණේය.

'රැවුල් ගසුත් ඇවිත්...'

යන්තමට මුහුණේ මෝදු වෙන ඔහුගේ රැවුල් ගස් අත ගාමින් ඈ ඊළඟට කීවාය.

ඔහු කිසිවක් නොකීවේය. ඇත්තටම කිව යුතු දෙයක් ගැන අදහසක් ඔහුගේ හිතට ආවේ නැත.

'හ්ම්... අතුල්ලහංකො පිට...'

ගෙනැවිත් දුන්නේය. ඒ සඳහා ඔහු තනිවම මහ මූකලානේ මැද කුරහන් අමුණක විතර වපසරියක් ඇති හේනක් කෙටුවේය. ගෙදරට ඇති තරම ධාන්‍ය, කුරහන්, එළවළු, පලා එයින් ලැබිණි. ඒ හැර ගෝමරී වෙනුවෙන් මිඩංගු කරන්නට කාලයක් හෝ දරුවන් වෙනුවෙන් ගත කරන්නට කාලයක් හෝ ඔහුට නොතිබිණි. ඒ නිසාම ගෝමරීගේ සියලු ආවතේවකම් කිරීමත්, හැකි හැම විටම තම සහෝදර සහෝදරයන් රැක බලාගැනීමත් සුදු බණ්ඩා පිට පැවරිණි.

මේ නිසාම තම කුඩම්මා තමාගේ අනෙක් සහෝදර සහෝදරියන්ට වගේ තමන්ට නොසලකන බව සුදු බණ්ඩාට තේරුම් ගොස් තිබුණේය. එහෙත් සුදු බණ්ඩාගේ හිතේ තරව, තදින් මුල් බැස තිබුණ මේ සිතිවිල්ල ඉරිතලා ගිය දවසක් උදා වුණේය.

සුපුරුදු පරිදි පුංචි රාළ එදා උදෑසනම හේනට පිටත් වුණේය.

'උඹ හවහට වරෙන් හේනට. උගුල්ලාපු මයියොක්ක අල ටිකක් ගේන්ඩ තියෙනවා ගෙදරට.'

The Reader's Place

යන ගමන් පුංචි රාළ සුදු බණ්ඩාට කිවේය. එතැන් සිට සුදු බණ්ඩාට කරන්න සිද්ධ වුණේ ගෝමරීගේ ඕනෑ එපාකම් ඉටු කරන එකය. ඔහු ගෝමරීට උයන්න උදව් වුණේය. කැළෙන් දර එකතු කරගෙන ආවේය. යන්තම් අවුරුදු දෙකකට කිට්ටු කුඩා එතනා බෙරිහන් දෙන හැම වරකම ඇය පරක් කළේය. අන්තිමට දහ දොළොස් වතාවක්ම වැවට ගොස් ලොකු කළ ගෙඩිවලට වතුර ගෙනැවිත් ගෝමරීට නාන්නට වතුර සරි කර දුන්නේය.

කළ ගෙඩිවලින් වතුර ඉහට වත් කරගෙන ගෝමරී නාන්න පටන් ගත්තා කියන්නේ සුදු බණ්ඩා ගෝමරීගේ රාජකාරිවලින් මඳකට අස්වැසිල්ලක් ලබනවා කියන එකය. එතැන් පටන් පැය කීපයක් යන තෙක් ඇගේ කටින් ඔහු වෙනුවෙන් විධාන පැන වෙන්නේ නැත.

ගෝමරී මිදුල කෙළවරේ නාන්න පටන් ගත්තාය. සුදු බණ්ඩා එතනා හුරතල් කරන්න බිතක්කනේ බිම ඇඳි ගත්තේය.

වැඩි වේලාවක් ගත වුණේ නැත. ගෝමරීගේ කටහඬ ඇත සිට ඇහුණේය.

'සුදු බණ්ඩේ... මෙහෙ වරෙං...'

ඇගේ වැඩ රාජකාරිවලින් යම් අස්වැසිල්ලක් ලැබූ විගසම යළි ඇගේ විධානය ඇසීම ඔහුට නොරිස්සුම් සහගත වුණේය. ඔහු මොහොතක් හුන් තැනම හිටිවනම හිටියේය. යළි මොහොතක් කල්පනා කර ආයාසයෙන් පා අද්දමින් ඇය නාමින් සිටි මිදුලේ කෙළවරට ගමන් කළේය.

මිදුලේ වැලි සමඟ ගැටෙන ඔහුගේ හීන් පියවර හඬින් ඔහු එන මානය ඇ හැඳින්නාය. ඔහු එන මඟට පිටුපා බිම හිප්ප තියාගෙන කළයෙන් වතුර රැගෙන හිසට වත් කරමින් සිටි ඇය ඔහු ළඟට පැමිණි විට මෙසේ කීවාය.

'මගේ පිට ටිකක් අතුල්ලහං...'

ගෝමරීගේ පිටට පිටුපා ඔහු ඇ හිටි විදිහටම බිම හිප්ප තියාගත්තේය. රවුම් සුමට ගල් පතුරක් අතට ගෙන සියුම් ලෙස ඇගේ පිට අතුල්ලන්නට වුණේය. එක් වරම ඇය ඔහු දෙසට හැරුණාය.

'කුඩම්මට රිදුණද...?'

ඇය සිනාසී ඔහු දෙස බැලුවාය.

'උඹේ අත් කොට්ට ගෙඩි වගේ පිරිලනෙ...'

ඇය ඔහුගේ අත මත තිබුණ රවුම් ගල් පතුර බිමින් තබා ඔහුගේ අත්ල අත ගෑවාය. ඉක්බිතිව ඔහුගේ මුහුණ දිහා කෙළින් බැලුවාය.

'උඹ දැන් මහ මිනිහෙක් වෙලා...'

ඔහු බිම බලා යන්තමින් සිනාසුණේය.

'රැවුල් ගසුත් ඇවිත්...'

යන්තමට මුහුණේ මෝදු වෙන ඔහුගේ රැවුල් ගස් අත ගාමින් ඇ ඊළඟට කීවාය.

ඔහු කිසිවක් නොකීවේය. ඇත්තටම කිව යුතු දෙයක් ගැන අදහසක් ඔහුගේ හිතට ආවේ නැත.

'හ්ම්... අතුල්ලහංකො පිට...'

ගෝමරී යළි ඔහුට පිටුපා අනෙක් පැත්තට හැරුණාය. ඔහු බිම තිබූ රවුම් ගල් පතුර යළි අතට ගත්තේය.

'ඕක විසි කරලා ඔය අතින් අතුල්ලහං...'

ඒ වචන තුළ තිබුණේ විධානයක් නොවේ. කිසියම් දයාබර බවක් ඒවායේ සැඟවී තිබුණේය.

ඇය තන මත්තට වැහෙන්න ඇඳ තිබූ දිය රෙද්ද තව ටිකක් බුරුල් කළාය.

'මේ බෙල්ලෙත් කුණු බං... තද නොකර සිනිඳුවට අතුල්ලහං...'

ඔහු ඇයට පිටුපා ඉඳගෙනම ඇගේ බෙල්ල අතුල්ලන්නට වුණේය.

'තව ටිකක් පහළට... පපුව හරියට...'

ඔහු තම දෑත ඇගේ උරහිස හරහා පහළට ගෙන ගියේය. එක් වරම ඔහුගේ දකුණත ඇගේ වමතින් ගෙන ඇය ඇගේ පියයුරු මත තැබුවාය.

'හොඳට අතුල්ලහං කොල්ලො...'

ඔහු ඇයට අවනත වුණේය. පපුව පුරා ඇඟිලි තුඩු යවමින් ඔහු ඇගේ කුණු ඇතිල්ලුවේය. ඔහුගේ ඇඟිලි තුඩුවල ස්පර්ශයෙන් ඇගේ පියයුරු තුඩු උඩ බලාගෙන ගැහි ගැහී හුස්ම ගනිද්දී ඇ ඉවසුම් සහිතව දිගටම නෑවාය. පසුව සෑහෙන වේලාවකට පසු මෙසේ කීවාය.

'මට වතුර වැඩියි... ඉතිරි වතුර ටිකෙන් උඹ නාගනිං...'

'මං වැවට ගිහිං නාගන්නං...'

'මං කිව්ව දේ කරහංකො...ආයෙ වැවට යන්ඩ ඕන නෑ නාන්ඩ...'

ඔහුට මතක ඇති කාලයේ ගෝමරී ඔහුට නාන්ඩ කියූ පළමු වතාව මේකය. ගොඩක් වෙලාවට ඔහු කරන්නේ අප්පුච්චා සමඟ හවසට වැවේ ගිලෙන එකය. ඒත් කවදාවත් ඒ ගැන හොයන්ඩ බලන්ඩ ගෝමරීට වෙලාවක් තිබුණේ නැත. ඊටත් වඩා ලොකු කළ ගෙඩිවල ඇ වතුර ඉතිරි කළ පළමු වතාව මේකය. දැන් ඇ ඒ වතුරෙන් ඔහුට නාන්නට විධානය කරයි.

ඔහු ඇට අවනත වුණේය. ඇට ඇති වෙනකම් පිට ඇතුල්ලුවේය. පසුව ඇතිල්ලුවේය. ඇ අණ කළ විදිහට ඇ ඉතිරි කළ වතුරෙන් නෑවේය.

නා කියාගෙන පිලට එන විට ඔහුගේ මඩක්කුවට ඇය බත් බෙදා තිබුණාය. වෙනදා හැළියෙන් බෙදාගෙන කෑම කා පුරුදු ඔහු එදා ප්‍රථම වරට ඇය මඩක්කුවට බෙදා දුන් බත් කෑවේය.

ඉන් ටික වෙලාවකට පසු ඇ ඔහුට මෙසේ කීවාය.

'අප්පුච්චා උඹට හේනට එන්ඩ කිව්ව නේද...? ගිහිං වරෙං... මං හිතන්නේ අද උන්දෑ ගෙදර එන එකක් නෑ... ඒකයි උඹට එන්ඩ කියන්ඩ ඇත්තේ... මං අහගෙන ඊයේ කියනවා... කුරහන් යාය පෙරේද ඌරෙක් පාළු කරාය කියලා...'

මේ තරම් පැහැදිලි කිරීම් ඇගේ කලින් කතාවල තිබී නැත. තිබුණේ අණදීම් පමණය. ඒ අණදීම් ඔහු මඟ හැරියේ නම් හවසට අප්පුච්චාට කියන එක ඇගේ සිරිතය. ඔහුගේ හැඩි දැඩි අත්වලින් කම්මුල් පාරවල් කන්නටත්, තෙණ පත කකුල් දෙකෙන් යටි බඩට ඇණ ගන්නටත් ආස නැති සුදු බණ්ඩා හැම වේලේම ඇගේ අණ පිළිපැද්දේය.

සුදු බණ්ඩා හේනට ගියේය. සිංහල පැය දෙක තුනකට පසු ඉර සැඟවී මීහිනා පෙනෙන නොපෙනෙන වේලාවේ ඔහු මයියොක්කා අල ගොඩක් කරින් ගෙන නිවසට පැමිණියේය.

'හප්පේ උඹේ දාඩිය ගඳ... ඕක පිළිකන්නෙන් තියලා... ඇඟ හෝදගෙන වරෙං...'

ගෝමරී ඔහුගේ තිරුවත් කර උඩ තිබුණ මයියොක්කා අල බිමින් තබන්න උදව් වෙමින් ඔහුගේ පුෂ්ටිමත් බාහු දිහා බලාගෙන 'අණ' කළාය.

පසුව පිටුපා යන ඔහුගෙන් යළි මෙසේ විචාළාය.

'අප්පුච්චා එනව කිව්වද අද...?'

'නෑ... හේන මුර කරන්ට නවතිනව කිව්වා...'

සුදු බණ්ඩා ඇ දෙස හැරී එසේ කියාගෙන ඒ ගොම්මන් කළුවරේම වැවට දිව්වේය. එදා ඉර මුඳුන් දවල් වේලාවේ කවදාවත් නැති විදිහට ඔළුවට වතුර වත් කරගෙන නා කියාගෙන

The Reader's Place

තිබුණා වී නමුත් ඔහු දෙව... ...ැවේය. කිසිවකුට තේරුම් කළ නොහැකි සතුටක් ඔහුගේ සියලු ස්නා නාලිකා පුරා රුධිරය සමඟ මිශ්‍ර වී සිරුර සිසාරා සැරි සැරුවේය. ඒවා තේරුම් බේරුම් කරන්ට හෝ ඒවායේ හේතුඵල විභාග කරන්ට හෝ ඔහුට උවමනා නොවීය. සරලව ඒ සතුට වෙනදාට වඩා වතුරේ දියබුං ගසා ඔහු පිට කරගත්තේය.

නා කියාගෙන කළ ගෙඩියකට වතුරත් පුරවාගෙන හොඳටම කළුවරේ ඔහු ගෙදර ආවේය. ගෝමරී ගෙයි මැද පත් පැදුරක් එලා එතනාට කිරි පොවමින් උන්නාය. කීප දෙනෙක් හැර ඔහුගේ නංගිලා මල්ලිලා ඒ වෙනකොටත් නිදිය. වේලාසනින් නින්දට යාම කොහොමත් ඔවුන්ගේ පුරුද්දය. සුදු බණ්ඩා සුපුරුදු පරිදි කතාවක් බතාවක් නැතිව උයන ගෙට ගොස් මයියොක්කා අල බෙදාගෙන කෑවේය. පසුව පිළිකන්න හරහාම ගෙයි එළිපත්තට ඇවිත් ගෙට ඇතුළුවන දොරකඩ ළඟ හිප්ප තියාගෙන හිස් බැල්මෙන් ඈත අඳුර දිහා බලාගෙන උන්නේය.

මෙසේ ගතවෙන ටික වේලාවකට පසු ඔහුට නිදිමත එයි. එවිට ගෙයි පිලේ කොනක ඇති මුව හම බිම අතුරා නින්දට යෑම ඔහුගේ පුරුද්දය. ගෙයි පිලේ කෙළවරට වෙන්ට වරිච්චි බිත්තියට හේත්තු කර ඇති මුව හම් දෙකකි. ඉන් හොඳම එක පුංචි රාළගේය. අනෙක සුදු බණ්ඩාගේය. පුංචි රාළත් සුදු බණ්ඩාත් නිදාගත්තේ මේ ගෙයි පිලේ බිමය. ගේ ඇතුළේ තිබුණ ලී දඬු එකිනෙක පුරුද්දා වරපටවලින් බැඳ මැස්සක් මෙන් සකස් කර තිබූ ඇඳන් දෙකේ පුංචි රාළ කවදාවත් නිදාගත්තේ නැත. ඔහු නොදන්නා කාලෙක සිට පුරුදු වී තිබුණේ මේ මුව හම උඩ නිදාගන්නය. එහෙත් පුංචි රාළගේත් ගෝමරීගේත් දරුවෝ දවස් බෙදාගෙන සතියට දවස් දෙක බැගින් ඒ ඇඳන්වල නිදාගන්න පුරුදු වී සිටියහ.

දොරකඩ හිප්ප තියාගෙන ඈත කළුවර දිහා බලාගෙන සිටි සුදු බණ්ඩාගේ ඇස්වලට නිදිමත කොනිත්තන විටම වගේ ගෝමරීගේ කටහඬ ඔහුට ඇසුණේය.

'සුදු බණ්ඩේ... මං පිළිකන්නට ගිහිං එනකං මේ එතනව පරක් කරහං...'

සුදු බණ්ඩා හුත් තැනින් නැඟිට ගේ ඇතුළට ගියේය. ඒ යන විටත් පිළිකන්නට යන ගෝමරීගේ ඡායාව පාන් එළියට ඔහුට පෙනිණි. ගෙදර එළිය වුණු එකම ආලෝකය කුස්සියේ අටුව උඩ පත්තු කර තිබූ පාන් එළියයි. ඒ පාන් එළියෙන් එතනා ළඟ පත් පැදුරේ වැතිරුණ ඔහු අඩ නින්දේ සිටි ඇගේ පිටට සියුම්ව තට්ටු කරමින් ඇයව පරක් කළේය.

ටික වේලාවක් ගත විය. එක් වරම කුස්සියේ අටුව උඩ තිබූ පාන් එළිය නිවුණේය. මුළු ගෙදරම අඳුරේ ගිලිණි. රැහැයියන්ගේ ශබ්දය මහා හඬින් ඇසිණි. එක් වරම පැතිරුණු අඳුරත් සමඟ එය එක් වරම දෙගුණ තෙගුණ වී යැයි සුදු බණ්ඩේට සිතිණි. තවත් වේලාවක් ගත විය. එතනා දෙසට හැරී සිටි ඔහුට ඔහුගේ පිට දිගේ සීතල අතක් දුවටෙනවා දැනිණි. ඔහු අනෙක් ඇලයට හැරී ඒ ගැන විමසන්නට සැරසෙනවාත් සමඟම ගෝමරීගේ පිරිපුන් තිකට ඔහුගේ උරහිසේ දූවටිණ.

'කෙල්ල නිදිද...?'

ඇය ඇසුවාය.

'හ්ම්...'

ඔහු හුම්ටි තිබ්බේය. ඊට පසු ඔහු ඇගෙන් මෙසේ ඇසුවේය.

'මං යන්නද කුඩම්මෙ පිලට...'

'ඔහොම ඉඳහං... මගෙ පපුව ටිකක් හිර කරනවා... පපුව ටිකක් අත ගාපං...'

ඔහු ඇය සිටි පැත්තට හැරුණේය. ඇගේ හුස්ම ඔහුගේ පපුවේ වැදිණි. ඔහු ඇගේ පපුව අතගාන්නට වුණේය. කිහිප වරක්ම ඔහුගේ ඇඟිලි තුඩු කිරි බර ඇගේ තන පුඩුවල වැදිණි. එවිට ඔහු ලැජ්ජාවෙන් තම ඇඟිලි තුඩු ඉන් ඈත් කළේය.

'මොකෝ බං ඇඹරෙන්නේ... හොඳට අත ගාපංකො...'

එසේ කියමින් ඇය තවත් ඔහුට ළං වුණාය.

'...උඹලෑ අම්ම නැති වෙනකොට උඹට මතකද...?'

'නෑ... එතකොට මට අවුරුද්දක් විතර ඇතිලු...'

ඇය තවත් ඔහුට ළං වුණාය.

'මට සීතලයි බං... ළං වෙයන් මට...'

ගෝමරිගේ ඇ[illegible] තට්ටමේ රැඳුණ. ඒ සමගම ඔහුගේ
පසුව ඒ ඇඟිලි තුඩු ඔහුගේ තට්ටමේ රැඳුණ. ඒ සමගම ඔහුගේ තට්ටමෙන් ඔහු ඇ වෙතට තද කරගත්තාය. ඔහුගේ ඇඟ ගිනි ගත්තේය. එහෙත් ඇ මෙසේ කීවාය.

'මට සීතලයි... මාව බදා ගනින්...'

ඇය ඔහුගේ ගෙල සිපගත්තාය. කන් පෙති අත ගෑවාය. දත්වලින් නිකට හැප්පුවාය. දොතොල් උරා බීවාය. තවමත් මල්වර නොවුණු ඔහුගේ පැහිරි සිරුර තම ඇඟට තද කරගත්තාය. පසුව ඔහුගේ ඇඟ උඩට නිරුවතින් නැග මුළු ජවයෙන්ම ඔහු බදාගෙන යටි බඩ ඔහුගේ සිරුරට තද කරගෙන කෙඳිරිගාන්නට වුණාය. ඒ පැහිරි කොල්ලාට ඇගේ ඇඟ උඩට මතු වෙන්න ඇබින්දකවත් අවකාශයක් නොදී සිය ජීවිතයේ ප්‍රථම වතාවට ඇ පුරුෂ ප්‍රාණයක් ඉදිරිපිට ඇගේ ස්ත්‍රී ආධිපත්‍යය පතුරුවමින් සිටියාය. මේ අතර මේ සිද්ධ වෙන කිසිම දේක දිගක් පළලක් නොදත් යන්තම් දාහතර විය පිරුණ දිලි රැවුල්කාරයෙකු වුණ සුදු බණ්ඩා සිය කුඩම්මාගේ මවිල් පිරුණ යටි බඩට යටවී කුමර බඹසර බිඳගෙන මල්වර වෙමින් සිටියේය.

එදා සිට සියල්ල කණපිට පෙරළුණි. ගෙදර සියලු දෙනාටම වඩා ගෝමරීගේ සැලකිල්ල දක්වුණේ ඔහුටය. කවදාවත් ගෝමරීගේ අවධානයට ලක් නොවුණු සුදු බණ්ඩාගේ පිරිසිදුකම ගෝමරීගේ සැලකිල්ලට ලක් වුණේය. කවදාවත් අවධානයට ලක් නොවුණු සුදු බණ්ඩාගේ බඩගින්න ගෝමරීගේ සැලකිල්ලට ලක් වුණේය. එසේම කවදාවත් අවධානයට ලක් නොවුණු සුදු බණ්ඩාගේ උණුසුම ගෝමරීට තව තවත් සීතල ගෙනාවේය. පුංචි රාළට සුදු බණ්ඩා පිළිබඳ පැමිණිලි නැත්තටම නැති විය.

කොටින්ම දවල් වරුවේ සුදු බණ්ඩාගේ වැඩ අඩු විය. එහෙත් පුංචි රාළ ගෙදර නැති දවසට සුදු බණ්ඩාට රෑට රෑට වැඩ වැඩි විය.

ඒ සමගම ඇයට නාගන්නට වතුර කළ ගණන් ගෙදර ගෙන ඒමත් නතර විය. ඒ වෙනුවට ඇය බොහෝ විට සුදු බණ්ඩා සමඟ දවල්ට නාන්න වැවට ගියාය.

ගම්මුන් වැඩිය නාන්න නොඑන වැව් ඉවුරේ මායිමක් ඔවුහු තෝරා ගත්හ. මුලදී මුලදී ඇය වැවට බැස නාද්දී ඔහු ගොඩට වී ගම්මුන් ඒ හරියට එනවාදැයි ඔත්තු බැලුවේය. පසුව ගම්මුන් ඒ හරියට නාන්ඩ නොඑන වග සහසුද්දෙන්ම දැනගත් පසු සුදු බණ්ඩා සිය කුඩම්මා සමඟ වැවට බැස්සේය. වැව් වතුරේ නිරුවතින් නෑම ඔවුන් දෙදෙනාට මහත් ආස්වාදයක් ගෙන දුන්නේය.

ඉල්මහේ පෝය පහුවී එළඹුණු ඒ ශුෂ්ක දවසේ මහ දවල් ඉර හරි කෙළින් මහ පොළොව දිහා බලාගෙන සිටි වේලාවේ ඔවුහු වැවේ නිරුවතින් නාමින් සිටියහ. හමා ගිය හීන් හුළඟ වැව් දිය සමඟ මුහු වී සිහින් සිසිලසක් ගෙනාවේය.

සුදු බණ්ඩා සිටියේ සිය දෙඅත්වලින් වතුරට ගසමින් ඒ වතුර සිය කුඩම්මාගේ නිරුවත් සිරුරට විසි කරමිනි. හමා ගිය හීන් හුළඟත් සමඟ මේ විසිරුණු වතුර බිඳු ගෝමරීගේ සිරුර කෙතරම් සීතලෙන් කුල්මත් කළේද යත් ඇ නාඹර ගැටිස්සියක් වගේ දබර ඇඟිල්ල උස්සා එසේ නොකරන්නැයි ඔහුට කේන්තියෙන් තරවටු කළාය. ඇ ඒ කේන්තිය පිරිමසාගත්තේ දිය මතුපිටදී නොව දිය යටදී ඔහුගේ සිරුර බදා වැළඳගැනීමෙනි. සමහර වේලාවට නොගැඹුරු වැව් පතුලේ ඔහුගේ සිරුර තද කර ගෙදර පන් පැදුර උඩදී වගේ ඇ ඒ සිරුර උඩ දඟලුවාය. විටින් විට හුස්ම ගන්න බැරුව වතුර පෙවෙන විට ඔවුන් එකිනෙකාගේ ග්‍රහණයෙන් මිදී වතුර උඩට මතු වුණේ හොඳටම හති දමමින් ඇස් රතු කරගෙනය.

මේ වේලාවේ තඩිපත හෙවණැල්ලක් වැව ඉවුරේ සිට වැවට වැටී තිබුණේය. මහ දවල් නිසා හෙවණැල්ල දිගට දිගේ දිගා වී තිබුණේ නැත. එහෙත් කැළතෙන වැව් රැළි සමඟ ඒ හෙවණැල්ල කිසියම් අවිනිශ්චිත බවකින් හෙලවුණේය. එක් වරම කන් බිහිරි කරවන රළු සැඩ පරුෂ හඬක් ගොඩබිම සිට ඇසුණේය.

'ඒයි පරයා වරෙන් ගොඩ...'

සුදු බණ්ඩා වැව් දිය අතරින් ඉස්සී ගොඩ බිම බැලුවේය. ඒ සමඟම යළි දියේ ගිලුණේය. තමා දකින්නේ පියවි රූපයක්ද නැද්ද යන්න හරියටම දැනුම් තේරුම් ගන්න දැනින්ම ඇසිපිය පිහිදා ඔහු යළි ගොඩබිම බැලුවේය. ඉක්බිතිව ඔහු තමා ඉදිරියේ

The Readers Place

ඇය හිතියෙන් වචන හොයා
සිටින ගෝමරී දෙස බැලුවේය.
ගන්න බැරිව ඔහු දිහා බලමින් සිටියාය.
තවත් මොහොතක් හෝ නාස්ති කිරීමෙන් මහා විනාසයක්
සිද්ධ විය හැකි බව ඉවෙන් වටහා ගත්තාක් මෙන් සුදු බණ්ඩා
වැව් දිය දෙබෑ කරමින් නිරුවතින්ම වැව් ඉවුරට ආවේය.
වැව ඉවුරේ උසට උසේ හිටගෙන හිටි මිනිහා සුදු බණ්ඩා
ගොඩට ගිය සැණින් තම පතරංග අත්ල උස්සා ඔහුගේ කම්මුල
දෙපැත්තට තඩි බාන හැටි වැව් දිය මැද්දේ සිට ගෝමරී බලා
සිටියාය. කෙතරම් තදින් ඒ පහරවල් වැදුණේද යත් සුදු බණ්ඩා
විසිවී බඹ දෙක තුනක් ඈතට වැටුණේය. ඊළඟට තඩි මහත
කකුල් කෙටී ඉස්සී බිම වැටුණු ඔහුගේ තට්ටමට තව පහරවල්
දෙකක් වැදුණේය. දෙවැනි පහරට ඔහු යළි වැවට ඇදගෙන
වැටුණේය. යළි වැවට නැමුණු මිනිහා දකුණු කනින් ඔහු ගොඩට
ඇද්දේය. ඊළඟට සුදු බණ්ඩාගේ තට්ටම් දෙක මහ පොළොව
දිගේ අනුකම්පා විරහිතව ඇතිල්ලෙද්දී ඒ මිනිහා ඔහුගේ කන්
කෙටියෙන් ඇදගෙන පාර දිගේ ඇවිදගෙන ගියේය.
ඔහු නොනවත්වාම ගියේය. බොරලු සැරට සුදු බණ්ඩාගේ
තට්ටම් තුවාල වී මග දිගේ ලේ [illegible] හැලෙද්දී ඒ ගැන
වගක්වත් නැතිව ඔහු නොනවත්වාම ගියේය.
අන්තිමට පන්සල් මායිමට ඇතුළු වී ගල් පඩිපෙළ නැඟ
මිනිහා කෙළින්ම නතර වුණේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ
ආවාස ගේ ඉදිරිපිටය. ලොකු හාමුදුරුවෝ තට්ටම් තුවාල වී ලේ
බේරෙන නිරුවත් අහිංසකයා දෙසත්, එක හුස්මට ලොකු හුස්ම
ගනිමින් හති හලන පතරංග මිනිහා දෙසත් මාරුවෙන් මාරුවට
ඇස් මාරු කරමින් මොහොතක් විමතියෙන් බලා සිටියහ.

'මොකෝ පුංචි රාළ මේ...'

'හාන්දුරුවන්ට පුළුවන් නං මූව බලාගන්ට... නැත්තං මූ
මගෙන් මැරුම් කනවා...'

කතාව එතෙනින් නිමා විය. හාමුදුරුවන්ගේ දෙපතුල් ළඟ
කන් කෙටියෙන් ඇදගෙන ආ තමාගේ පුතණ්ඩියා අත හළ පුංචි
රාළ අඩියට දෙකට ගල් පඩිපෙළ බැහැගෙන යන්ට ගියේය.

පුංචි රාළ ගල් පඩිපෙළ බැහැගෙන ඈත යනකන්ම ඔහු දෙස බලා සිටි ලොකු හාමුදුරුවෝ ඉනික්බිතිව තමුන්ගේ දෙපා මුල වැතිර සිටි කොලුවාට ආදරෙන් කතා කළෝය.

'සුදු බණ්ඩා... ඔතනින් නැගිටල අපි ඇතුළට යං...'

සුදු බණ්ඩා එක් අතක් බිම තියා වාරුගෙන තම නිරුවත් කය කෙළින් කරන්ඩ තැතනුවේය. ඒ සමඟම සිහිසුන්ව කෙසෙල් කඳක් පොළොවට පාත් වුණා වාගේ හාමුදුරුවන්ගේ දෙපා මුල ඇදගෙන වැටුණේය.

ලොකු හාමුදුරුවන්ගේ බල පරාක්‍රමය විහිදුණ පන්සලට මීට අවුරුදු හතරකට විතර කලින් සුදු බණ්ඩා සම්ප්‍රාප්ත වූයේ එසේය.

පුරා මාස දෙකකුත් දවස් නවයක් සුදු බණ්ඩා සිහිසුන්ව සිටියේය. ඇස්වත් නොඇරියේය. මළ කඳක් වගේ ලොකු හාමුදුරුවන්ගේ පරණ ඇඳ උඩ පත් පැදුරේ වැතිර සිටියේය. බත් කටක් කන්ඩ තියා වතුර පොදක්වත් බොන්න නොහැකිවිවේය. හැත්තෑවෙනි දවසේ උදේ පාන්දර ලොකු හාමුදුරුවන් බුදු ගෙට වැඩ [illegible] ඇතුළුවෙන විට සුදු බණ්ඩා ඇඳ උඩ හිඳගෙන [illegible].

'හාන්දුරුවනේ මට වතුර තිබහයි...'

ලොකු හාමුදුරුවෝ සිනාසී මොහොතක් ඔහු දිහා බලා සිටියහ. පසුව ඇතුළු ගෙට ගොස් මැටි මඩක්කුව පුරවා වතුර ගෙනැවිත් ඔහු ඉදිරියේ තැබූහ. සුදු බණ්ඩා එක හුස්මට එය බීගෙන ගියේය. හිස් මඩක්කුව යළි ඇඳ උඩ තබා හාමුදුරුවන් දිහා බැලුවේය.

'තව වතුර ඕනද බොන්ට...'

ඔහු හිස වැනුවේය. ලොකු හාමුදුරුවෝ මඩක්කුව එතනම තබා ඇතුළු ගෙට ගොස් ලොකු කළය අරගෙන ආහ. ඇවිත් ඔහු ඉදිරියේ මැටි කළය තැබූහ. ඔහු මැටි කළය කටේ තියාගෙන වතුර බීගෙන බීගෙන ගියේය. ඇසිල්ලකින් මැටි කළයේ වතුර අහවර විය.

'තව ඕනද...?'

The Reader's Place

හාමුදුරුවෝ නැවත විචාළහ. ඔහු නැවත හිස වැනුවේය.
හාමුදුරුවෝ නැවත ඇතුළ ගෙට ගොස් මැටි කළයට වතුර පුරවා
ගෙනාවේය. එයත් මොහොතකින් අහවර විය. නැවත ඇතුළ
ගෙට ගොස් තවත් මැටි කළයක් ගෙනාවේය. එයත් අහවර විය.
මෙසේ පන්සල් ළිඳේ ළිං පතුල පේන තරමට වතුර
හිඳෙනකං මැටි කළ දහ අටකුත් හමාරක් ඔහු එක දිගට වතුර
බීවේය.

අවසානයේදී හාමුදුරුවෝ මෙසේ ඇසූහ.

'බඩගිනි ඇති නේද...?'

ඔහු යළිත් හිස වැනුවේය. හාමුදුරුවෝ එදා උදේ උන්වහන්සේට ලැබුණු හීල් දානය එහෙම පිටින්ම ඔහු ඉදිරියේ ගෙනැවිත් තැබූහ. ඊළඟට විටින් විට පන්සලට ලැබුණු රස කැවිලි ආදියත් ගෙනැවිත් තැබූහ. ඇහිපිය හෙළන පරක්කුවෙන් ඒ සියල්ල අහවර විය. කෑම සියල්ල අහවර වූ තැන ඔහු තවත් වතුර මැටි කළ තුනක් බීවේය. අවසානයේදී ඔහු මෙසේ කීවේය.

'දැං ඇති හාන්දුරුවනේ...'

'හොඳයි... ටිකක් එළියට ගිහිං හුළං වදින්ඩ ඉන්ඩ...'

ලොකු හාමුදුරුවෝ ඔහුට නැගිටින්න උදව් කරන්න ඉස්සරහට පැමිණියහ. සුදු බණ්ඩා හාමුදුරුවන්ගේ අත් උදව් ප්‍රතික්ෂේප කළේය.

'මට පුළුවං හාන්දුරුවනේ...'

ඔහු තනිවම ඇඳෙන් නැගිට්ටේය. හාමුදුරුවන්ගේ පරණ අඳනකඩයකින් ඔහුගේ විළි වැසී තිබුණේය. සිරිම් ලකුණක්වත් සොයාගන්ඩ බැරි විදිහට තට්ටමේ තුවාල සුව වී තිබුණේය.

'පුදුම නින්දක් ගියේ හාමුදුරුවනේ... මගෙ හිතේ මං පැය දහයක් දොළහක් එක දිගට නිදාගන්ඩ ඇති...'

පැය දහයක් දොළහක් නොව ඔහු ඒ වන විට දවසට පැය හැට බැගින් වූ සිංහල පැය හාරදහස් එකසිය හතළිහක් එක දිගට නිදාගෙන තිබුණේය. ඒත් ඊයේ රාත්‍රියේ නිදාගෙන අද උදේ හරි සැහැල්ලුවෙන් නැගිට්ටා වගේ ඔහු ලොකු හාමුදුරුවන්ගේ පරණ අඳනකඩය පිටින්ම ආවාස ගෙයින් එළියට බැස්සේය.

විනාඩි කීපයක් ගල්පොත්ත උඩ එහාට මෙහාට ගිය ඔහු ඊළඟ මොහොතේ පන්සලේ ඇතුළ ගෙට ගොස් උදැල්ලක් සහ වල් පිහියක් රැගෙන එළියට බැස්සේය.

මිනිහෙකුගේ හෙවණැල්ල දෙපතුල යට පිහිටන මහ දවල් ඉර මුදුන් වන විට ඔහු මුළු පන්සලම උදැලු ගා තිබුණේය. වල් පැළෑටි සුද්ධ කර තිබුණේය. හවස් වරුවේ හාමුදුරුවන් පැයක් හමාරක් සැතපුණු වේලේ පන්සලේ කිලිටි රෙදි සියල්ලම සෝදා ආවාස ගෙයත් ඇතුළ ගෙයත් සාරසුබාවට සුද්ධ පවිත්‍ර කර තිබුණේය.

පසුව ඉර ගල වැටෙන ගොම්මන් වේලාවේ බුදු ගෙයත්, බෝ මළුවත් වෙන කවරදාකවත් නැති කලඑළියට පිළිසකර කළේය.

කොයි කෙසේ හෝ එදා රාත්තිරිය වෙන විට අවුරුදු තිහ හතළිහක් තිස්සේ කවර කලෙකවත් ලොකු හාමුදුරුවන්ට දැකගන්න බැරි වුණු විදිහේ පිළිවෙළක් ඇති වාස භූමියක් බවට පන්සල පත්ව තිබුණේය.

එසේම තමාගේ හිතේ මනාපෙට පන්සලේ රාජකාරියක් ඉටු කළ ඒ මොහොතේ පටන් සුදු බණ්ඩා නිරායාසයෙන්ම ගමේ පන්සලේ ඇබිත්ත කොලුවා බවට පරිවර්තනය වී සිටියේය.

රාත්තිරියේ සැතපෙන්ට පැයක් හමාරක් තියෙද්දී ලොකු හාමුදුරුවෝ තම සයනය ළඟට ඔහු කැඳවූහ.

'දැන් උඹේ වයස කීයද ?...'

ඇබිත්ත කොලුවා නිහඬව මොහොතක් කල්පනා කළේය. පසුව මෙසේ කීවේය.

'මං දන්නේ නෑ අපේ හාන්දුරුවනේ... ඒත් කුඩම්මා කියල තියන විදිහට අවුරුදු දහතුනක් දාහතරක් වෙන්ඩ ඕන...'

'අකුරු කියන්න ලියන්ට පුළුවන්ද...?'

'බෑ...'

'උඹ ඉන්න මේ භූමි පළාත අයිති රටේ රජ්ජුරුවො කව්ද කියල උඹ දන්නවාද...?'

'නෑ... අපේ හාන්දුරුවනේ...'

'මේ අවුරුද්ද මොකක්ද...?'

The Reader's Place

'දන්නේ නෑ... හාන්දුරුවනේ...'

'දන්නේ නෑ... හාන්දුරුවනේ...'

ඇබිත්ත කොලුවා මැටි පොළොවේ හිඳගෙන කිසු කලෙකවත් කවරෙකුවත් ඔහුගෙන් නොඅසන ලද මේ අරුම පුදුම ප්‍රශ්න මාලාව ගැන හාංකවිසියක හැඟීමක්වත් නැතිව එක සීරුවට වචන ගිලිහෙන ලොකු හාන්දුරුවන්ගේ ශ්‍රී මුඛය දිහා ඇසිපිය නොහෙළා බලාගෙන සිටියේය.

'...හෙට ඉඳන් උඹ අකුරු සාස්තරේ ඉගෙන ගන්ඩ ඕන... බණ පොත් වහපොත් කරන්ඩ ඕන...'

සුදු බණ්ඩා එක්වරම මැද්දට පැන්නේය.

'ඒත් මහණ වෙන්ඩ මගෙ කැමැත්තක් නෑ හාන්දුරුවනේ... මං ඔබ වහන්සේට උවටැන් කරගෙන ඉන්නං...'

'බණ ඉගෙන ගන්ඩ ඕන මහණ වෙන්ඩම නෙමෙයිනෙ බොල... ජීවත් වෙන්ඩත් ඒව ඉගෙන ගන්න එක වටිනවා...'

'හොඳයි අපේ හාන්දුරුවනේ...'

'ඊළඟට රට තොට ගැන දැන ගන්ඩ ඕන.. අදට මං එක කාරණාවක් විතරක් කියන්නං... උඹ මං ජීවත් වෙන මේ හැම භූමියක්ම අයිති වෙන්නේ රාජසිංහ රජ්ජුරුවන්ට...'

'මං අහල තියෙනවා හාන්දුරුවනේ... දවසක් අපේ අපුච්චා කිව්ව ඔය ඇත්ත ගැන...'

ඔහු එසේ උත්තර දුන්නේ තමාත් යමක් කමක් දන්නා බව පෙන්වන ආඩම්බරකමක් ඇතිවය.

'හ්ම්... එහෙමද... වෙන මොනාද කිව්වේ උඹලෑ අපුච්චා....'

'මුකුත් නෑ... දවසක් මං කුඩම්මා කියපු වැඩක් නොකළම උන්දෑ මට කිව්ව රාජසිංහ දෙයියන්ගේ අලියට මාව පාගන්න දානව කියලා...'

'කව්ද බොල උන්දෑට දෙයියෝ කියන්නේ... මේ සිංහලේ කන්ඩ ආපු බෙබද්දෙක් කොහොමද දෙයියෙක් වෙන්නේ...'

ලොකු හාමුදුරුවෝ ඇඳෙන් නැඟිට මහ හයියෙන් පය පොළොවේ ගසා සුදු බණ්ඩා දිහා කෝපයෙන් ඇස් රතු කරගෙන බැලූහ. සුදු බණ්ඩා එක්වරම පිටුපසට විසිවී ගිය අතර පසුව දෙ අත් දොහොත් මුඳුනේ තබාගෙන මෙසේ කීවේය.

'මට සමාවෙන්ඩ හාන්දුරුවනේ... මං හිතන දෙයක් නෙවි මං අහල තියෙන දෙයක් ඔය කිව්වේ...'

'ගිහිං බුදිය ගනිං... හෙට උදේම නැඟිටින්ඩ ඕන අකුරු ඉගෙන ගන්ඩ...'

හාමුදුරුවෝ ඒ ආවේගය පිටින්ම ඔහු එතනින් පිට කළහ. මේ කිසිම කතා ලතාවක හාංකවිසියක් නොදන සිටි සුදු බණ්ඩා දැත් බැඳගෙන වෙව්ලමින් උන්වහන්සේගේ කුටියෙන් පිට වුණේය.

එදා නින්ද යන තෙක් කෙතරම් කල්පනා කළත් ලොකු හාමුදුරුවෝ කී දේවල අග මුල පාදාගන්ට ඔහුට බැරි විය.

හරියටම මධ්‍යම රාත්‍රිය ඔන්න මෙන්න තියෙද්දී ඇබිත්ත කොලුවාගේ ඇහැ පිය වුණේය. ඒත් ඒ ටික වේලාවකටය. කෙටි හෝ දීර්ඝ ලෙස ගිණිය නොහැකි ඒ නින්දට පසු ඔහු ඇඳෙන් නැඟිට්ටේය. පසුව එරමිණිය ගොතාගෙන ඇඳ උඩ තවත් මොහොතක් ගත කළේය. ඉක්බිතිව කුටියෙන් එළියට විත් කළුවරේම පිළිකන්න පැත්තට ගොස් දවස් හැත්තෑවක කුස ගින්න නිවෙන්න බිවු වතුර කළගෙඩිවල ප්‍රතිඵලය ලෙස පිරුණ මුත්‍රාශයේ බර සැහැල්ලු වන්ට මුත්‍රා කළේය. ගල් පොත්ත උඩ සිට ඒ මුත්‍රා වතුර එක සීරුවට දොළක් මෙන් පහළට ගලාගෙන යන අයුරු ඔහු හද එළියෙන් දුටුවේය. සිංහල හෝරා දෙකකට විතර පසු අවසන් මුත්‍රා බින්දු කීපයත් පිටවූ පසුව ඔහු ඇඟ සොලවමින් ඔළුව ගසා දමා ප්‍රීතිමත් බවක් පළ කළේය.

ඒ හා සමඟම එක් වරම ඔහුගේ හිත තිගැස්සුණු ඉවකින් පරල වී වටපිට බැලුවේය. පුන් පෝය පසු වී තිබුණු ඒ රාත්‍රියේ අටවක අඩ සඳ තිබුණේ අවරගිර අහසේය. එහි මලානික එළිය අවට පැතිරුණ අඳුර සහමුලින්ම දමනය කරන්න අත් උදව් සැපයුවේ නැත. එහෙත් ළා අඳුරක පරිසරය ගිල්වමින් අටවක සඳ අවරගිර අහසේ බැස යමින් තිබියදී ඊට ප්‍රතිවිරුද්ධ දිසාවේ ගල් පොත්ත උඩ බෝධි වෘක්ෂය පැත්තෙන් පැතිරෙන ආලෝකය කුමක්ද?

සිංහල පැය දෙකකට ආසන්න මුත්‍රා බර සැහැල්ලු කරගන්න එළියට බහින විටත් ඔහුට මේ ආලෝකය මතකය. ඔහු හිතුවේ

The Reader's Place

ඒ පැත්තෙන් හඳ මෝදු වෙනවා කියාය. එහෙත් දොළක අසිරිය මවමින් මුතු වතුර ගල්පොත්ත දිගේ පහළට ගලා යන විට අවරගි ර අහසේ බැස යන අටවක සඳේ රූපය ඒ ජල ධාරාව මත වැතිරී ඇති සැටි ඔහු දුටුවේය. ඒ සමඟම උතුර දකුණ ගැන ගතිච්චියක් නැති ඔහුට හඳ බැස යන විට ඉර අනිත් පැත්තෙන් පායා ගෙන එනවාදැයි සිතිණි. එහෙත් තවමත් මධ්‍යම රාත්‍රිය පහු වුණා විතරක් බැවින් ඒකට වෙලාව නොවන බව ඔහුට වැටහුණේය. එසේ නම් බෝධි වෘක්ෂය පැත්තෙන් මතු වෙන ආලෝකය කුමක්ද ? අද මේ අරුම පුදුම දවසේ හඳවල් දෙකක් පායන්න උනත් බැරි කමක් නැතැයි පසුව ඔහුට හිතුණේය. ඒ සිතුවිලි කවරක් වුණත් පඬු පැහැ අඳනකඩය ඇඟට හිර කරගෙන ඔහු ආලෝකය පැතිරෙන ගල් පොත්ත ඉහත්තාවට කළුවරේම නඟින්ඩ ගත්තේය.

ගල් පඩිපෙළ නඟින්න නඟින්න බෝධි වෘක්ෂය අරා පැතිරෙන ආලෝකය පැහැදිලිව ඔහුට පෙනිණ. කවදත් කලබලයක් නැති ඔහු හෙමිහෙමීට අඩි තිබ්බේය. ගල් පඩිපෙළට නොරිදෙන නොදැනෙන තරම් සීරුවෙන් ඔහු පා සීරු මාරු කළේය. අවසානයේ කෙටි ගමනකින් ඉක්බිතිව ඔහු බෝධි වෘක්ෂය ඉදිරිපස සිටියේය.

ඒ මොහොතේ ඔහු දුටු දර්ශනය ඔහුගේ සම නහර ඇට ලේ විනිවිද ගොස් කේශනාලිකා තුළින්ද ඇතුළට තෙරපී මොහොතකට - එකම එක මොහොතකට - ඔහුගේ හුස්ම ගැනීම නතර කර දැම්මේය.

ලොකු හාමුදුරුවෝ බෝධි වෘක්ෂයට පිටුපා පද්මාසනයෙන් සිටියහ. උන්වහන්සේගේ ශරීරය තිබුණේ බෝ මළුව උඩ වැලි කැට ස්පර්ශ කරමින් නොවේ. බෝ මළුවට බඹ දෙක තුනක් ඉහළිනි. සැබවින්ම හිස් අවකාශයේ ඒ උත්තුංග ශරීරය පාවෙමින් තිබුණේය. උන්වහන්සේගේ හිසට ඉහළින් කිරි පැහැ ආලෝකයක් විසිරී පැතිරී තිබුණේය. බෝධි වෘක්ෂයේ ඉහළ අතු රිකිලි මත බෝ දළු තෙක්ම ඒ ආලෝකය පැතිරී තිබුණේය. ඇස් අඩවන්ව සිටි උන්වහන්සේගේ තිරුවත් බෙල්ලේ බල නහර දෙක බෝධි වෘක්ෂයට හොඳටම ඇතින් සිටි ඔහුට පැහැදිලිව පෙනුණේය.

මොහොතකට ඔහුගේ හෘද ස්පන්දනය නතර වූ බැව් සත්තකින්ම ඇත්තය. ඉන් ඉක්බිතිව සිහි එළවා යළි තමාගේ දෑතින්ම දෑස් පිහිදා ඒ දර්ශනය ඔහු නැවත නැරඹුවේය. වෙනසක් නැත. සියල්ල පෙර පරිදිමය. ඔහුගේ ඇසේ දෝෂයක් නැත. එහෙත් තවමත් ඔහුට සිහි එළවාගත නොහැකිය. ලොකු හාමුදුරුවන් තමා නොදුටු බව ඉතා පැහැදිලිය. ඔහු සිටින්නේ බෝධි වෘක්ෂයට සෑහෙන තරම් ඈතිනි. ආවාස ගෙට ගොස් මේ සියල්ල නැවත මෙනෙහි කරන්නට ඔහුට උවමනා විය. ගල් පඩිපෙළ නැංගාටත් වඩා පරිස්සමට ඔහු ආපසු යන්න හැරුණේය. ඔහු හැරුණා විතරය; ලොකු හාමුදුරුවන්ගේ හඬ ඔහුට ඈතින් ඇසිණි.

'මොකෝ මේ පාන්දර ජාමේ...'

ලොකු හාමුදුරුවෝ අඩවන් වූ දෑස් සෙමින් විවෘත කළහ. ඒ සමඟම අර කිරි පැහැ ආලෝකය කෙමෙන් නැති වී යන සැටි ඔහුට පෙනිණ. එහෙත් තවමත් උන්වහන්සේ පොළොවෙන් බඹ දෙක තුනක් උඩ පද්මාසනය මතය.

'මොකෝ නින්ද යන්නෙ නැද්ද...?'

ඇබිත්ත කොලුවාට වචන ගළපාගන්න වෙලාවක් ගිය තැන උන්වහන්සේ නැවත එසේ විචාළෝය. එයට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේදැයි ඔහුට හැඟීමක් තිබුණේ නැත. එහෙත් එයට පිළිතුරු වෙනුවට ඔහු මෙසේ කීවේය.

'හාන්දුරුවනේ මං බණ පොත් ඉගෙන ගන්ඩ කැමතියි...'

'දැන්ම...?'

'එහෙමයි...'

උන්වහන්සේ ඈත සිට හරි කෙළින් ඇබිත්ත කොලුවාගේ ඇස් දිහා බලාගෙන සිටියහ. ඒ ඇස්වලට ගමන් කරන ස්නායු තන්තුවල ඇති සිතිවිලි ධාරාව තම ස්මරණ ශක්තියෙන් තේරුම් ගත් උන්වහන්සේ පසුව මෙසේ වදාළහ.

'ගල් පඩිපෙළ බැහැල යන්ඩ මගේ ලැගුම් ගෙට... මං එන්නම්...'

'එහෙමයි...'

ඇබිත්ත කොලුවා හෙමිහෙමින් එහෙත් පැමිණියාට වඩා ඉක්මනින් ගල් පඩිපෙළ බැස්සේය. ටික වේලාවකට පසු ඔහු ලොකු හාමුදුරුවන්ගේ ලැගුම් ගේ ඉදිරිපස විය. එතැන සිට ඔහු ඉහළ බෝධි මළුව දෙස නැවත බැලුවේය. දූත් අර ආලෝකය නැත. දූත් දූත් ලොකු හාමුදුරුවන් තමාට පිටුපසින් පඩිපෙළ බැහැගෙන ඇවිත් ලැගුම් ගෙයි දොර විවෘත කරන තෙක් ඔහු නොඉවසිලිමත්ව බලා සිටියේය. ලොකු හාමුදුරුවන් ගල් පඩි පෙළ බැස්සේ නැත. ඔහු පසුපසින් ආවේත් නැත. එහෙත් ඔහුට හිතන්න කාලයක් නොතබාම ලොකු හාමුදුරුවන්ගේ හඬ ලැගුම් ගේ ඇතුළින් ඇසිණ.

'එන්ඩ ඇතුළට...'

ඔහු කුටියේ දොර ඇර ඇතුළට යන විට ලොකු හාමුදුරුවෝ පොත් ගුල තුළ පුස්කොළ පොත් තෝරමින් සිටියහ.

ප්‍රශ්න බුරුත්තක් ඔහුගේ හිත වටා එහා මෙහා වුණත් ඔහු ඒ කිසිවක් වචනවලට පෙරළුවේ නැත.

'ධර්මය ඉගෙන ගන්නව කියන්නෙ ලෝකය ඉගෙන ගන්න එක... ජීවත් වෙන්න තේරුම් ගන්න එක... ඔක්කෝටම කලින් අපි සිංහල හෝඩියෙන් පටන් ගන්ඩ ඕන...'

එදා ඒ පාන්දර ජාමයේ ඒ අසවල් වේලාවේ හාමුදුරුවෝ අටවක අඩ සඳේ එළියෙන් වැලි පීල්ලේ ලියමින් ඇබිත්ත කොලුවාට හෝඩිය උගන්නන්න පටන් ගත්හ.

ඉරිමා උදයේ ආරච්චි ගෙදරින් පන්සලට හීල් දානය රැගෙන එන විට ඇබිත්ත කොලුවා සිංහල හෝඩිය උගෙන අවසන්ය. උගැන් වූ පාඩම නැවත ආවර්ජනය කරමින් දෙදෙනා එකට හීල් දානය භුක්ති විඳීමෙන් අනතුරුව හාමුදුරුවෝ නැවත ඇබිත්ත කොලුවාත් කැටුව පොත් ගුල තුළට ගියහ.

'මෙතන පිළිවෙලට පටන් ගන්න ඕන තැන ඉඳන් ඉස්සරහට මං පුස්කොළ පොත් අහුරල තියනවා... එකකට පස්සේ එකක් අරගෙන කියවල ආපහු මෙතනින් තියන්ඩ.... හොඳා අපි මෙතැනින් පටන් ගමු...'

හාමුදුරුවෝ 'සකස් කඩය' ඇබිත්ත කොලුවා අතට දෙන ගමන් එසේ කීහ. ,

ඇබිත්ත කොලුවා එකත්පස්ව හිඳ හාමුදුරුවන්ට වැඳ 'සකස් කඩය' රැගෙන ඔහුගේ කුටියට වැදුණේය. ඒ උදෑසන සිට සතියෙන් සතිය වගේ හාමුදුරුවන්ගේ පොත් ගුලේ පුස්කොළ පොත් ඔහුගේ කුටියට ගියේය.

සකස් කඩයෙන් ඉක්බිතිව බුද්ධ ගජ්ජය, නාමාෂ්ට ශතකය, ගණදෙවි හැල්ල ආදි අක්ෂර ශික්ෂාදි වර්ගයේ අනෙක් පුස්කොළ පොත් ඔහු කියෙව්වේය. පසුව සිදත් සඟරාව, සියබස්ලකර, දම්පියා අටුවා ගැටපදය වැනි ව්‍යාකරණාදි වර්ගයේ පුස්කොළ පොත් ඔහුගේ අවධානයට ලක් විය. ඉක්බිතිව කාව්‍යශේඛරය, කව් සිළුමිණ, මයුර සන්දේශය ඈ පද්‍ය වර්ගයේ පුස්කොළ පොතුත්, බුත්සරණ, දළදා සිරිත, ප්‍රේත වස්තු වර්ණනාව ආදි ගද්‍ය වර්ගයේ පුස්කොළ පොතුත් ඔහුගේ පරිශීලනයට ලක්විය. අවසානයේ අරිෂ්ට ශතකය, වරයෝගසාරය, වෛජයන්තය යන වෛද්‍යාදි වර්ගයේ පුස්කොළ පොත් ඔහුගේ ඇසුරට පත් වුණේය.

කොයි කෙසේ හෝ මාස පහකුත් දවස් විසි පහක් ඉක්ම ගිය තැන ලොකු හාමුදුරුවන්ගේ සයනය ළඟ ඇබිත්ත කොලුවා පෙනී සිටියේය.

'හාන්දුරුවනේ පොත් ගුලේ පුස්කොළ පොත් ඔක්කොම කියවල ඉවරයි....'

හාමුදුරුවෝ විමතියක් පළ නොකළහ. ඒ වෙනුවට සිනාසී මෙසේ උත්තර දුන්හ.

'මං මහනුවර මල්වතු විහාරෙට පයිණ්ඩයක් ඇරියා පුස්කොළ පොත් ටිකක් එවන්ඩ කියලා. ඒ එනකං මේ ටික ආයෙමත් නැවත කියවන්ඩ...'

'හොඳමයි හාන්දුරුවනේ...'

ඇබිත්ත කොලුවා හාමුදුරුවන්ගේ පොත් ගුලේ තිබූ ගණනින් එකසිය අනූවක් වූ පුස්කොළ පොත් අග සිට මුලට නැවත කියවන්න පටන් ගත්තේ එසේය.

The Reader's Place



02

එදා මහ දවල් පුංචි රාළ සුදු බණ්ඩාගේ කන් කෙටියෙන් අල්ලාගෙන බොරලු පාර දිගේ ඇදගෙන පන්සලට රැගෙන ආ දවසේ සිට ඔහු ඔහුගේ බිරින්දෑ ගෝමරී හෙවත් සුදු බණ්ඩාගේ කුඩම්මා සමඟ වචනයක්වත් කතා කළේ නැත.

ගෝමරී බලාපොරොත්තු තියාගෙන හිටියේ එදා තමාගේ මළගම සිදු කරවාගන්නටය. එසේත් නැතිනම් ඇට කටු කුඩුවෙන්ට ශරීර කූඩුව තළාගන්නටය. එහෙත් ගෝමරීගේ ඒ බලාපොරොත්තු එකක්වත් ඒ විදිහට ඉෂ්ට වුණේ නැත.

පුංචි රාළ පන්සලේ සිට කෙළින්ම පැමිණියේ ගෙදරටය. ඒ වෙනකොටත් ගෝමරී ගෙදර ඇවිත් සිටියේ නැත. හති මුනින් දාගෙන පන්සලට ගිය තකහනියෙම ගෙදර පැමිණි පුංචි රාළ කෙළින්ම උයන ගෙට වැදී ඊට කලින් දවසේ උගුල්ලා ගොඩ ගසා තිබූ තරව වැඩුණු මයියොක්කා අල හත අටක්ම අත් දෙකට ගත්තේය. පසුව ගේ ඉස්සරහට ඇවිත් බිම හිප්ප තියාගෙන ඒවා පොතු පිටින්ම බරු ගහමින් අමු අමුවේම කන්න පටන් ගත්තේය. කෑම අහවර කළ පුංචි රාළ ඇඟේ තැවරුණු දූලි ගසා බසා දමා හුන් තැනින් නැඟිට්ටේය. ගණනින් හතක් වූ දරු කැලැත්ත කටවල් බලියාගෙන ඔහු දිහා බලා සිටිද්දී උන් එකෙක්වත් තුට්ටුවකට මායිම් නොකොට දෙකන්සය පුරා බේරෙන දාඩිය සූරමින් එළියට බැස්සේය. කෙළින්ම හේනට ගියේය.

ඉර අවරට ගිහින් හෝරා දෙකකට විතර පසු වැව් ඉහත්තෑවේ සිට ගෝමරී ගෙදර ආවේ බියෙනුත් සීතලෙනුත් කට කට ගා ගැහෙමින්ය. දැන් සිද්ධ වුණු දේ සිද්ධ වී හමාරය. ඈ වැව් ඉහත්තෑවේ සිංහල පැය තුන හතරක් ප්‍රමාද වූයේ මරණය වෙනුවෙන් තම හිත හදාගන්ටය. ඒ වුණාට සිද්ධ වුණේ කිකලෙකවත් සිද්ධ වී නැති තරමට සීතලෙන් ගැහි ගැහී වෙව්ල වෙව්ලා වැව් තාවුල්ල උඩ ළත වෙන්නටය. ඒ පැය තුන හතරට ඇට දහ වතාවක්ම මුත්‍රා ගිහින් තිබුණේය. තන මත්තක් වැහෙන්නට හැඳගෙන උන් දිය රෙද්ද මුත්‍රා දියෙන් තව තවත් තෙත් වුණේය. අන්තිමට ඈ වෙවුල වෙවුලා ගැහෙන්නට වූයේ වතුරේ හීතලට නොව තමන්ගේ මුත්‍රාවල හීතල තමන්ටම විඳ දරා ගන්ට බැරුවය. මේ තාවර විල්ලේ තේරුමක් නැති බව හැඳිනගත් ඈ අන්තිමේ දිය රෙද්ද පිටින්ම ගෙදර ආවාය.

ගෝමරී වැට ඉනි මායිමෙන් කඩුල්ල පනින විට ගෙයි මිදුලේ සිටි ඇගේ වැඩිමහල් පුතු සේදරා ඇය වෙත දුවගෙන ආවේය.

'කෝ සුදු බණ්ඩෙ අයියා...'

වැව් තාවුල්ලේ ඉඳන්ම රැගෙන ආ කළගෙඩිය වම් උකුලෙන් දකුණු උකුළට මාරු කරමින් ඈ සේදරා දිහා සෘජුව බලා හිඳ ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරු දෙනු වෙනුවට ප්‍රශ්නයට ප්‍රශ්නයක් නැඟුවාය.

'කෝ අප්පුච්චා...'

'ගියා...'

'කොහෙද...?'

ගෝමරී වැට කඩුල්ල පැන මිදුලට සේන්දු වෙද්දිත් සේදරා කඩුල්ල ළඟම තාවර වෙවී ඇත මෑත බලමින් නැවත ඇගෙන් මෙසේ ඇසුවේය.

'කෝ සුදු බණ්ඩේ අයියා...'

එයට පිළිතුරු වෙනුවට ගෝමරී මෙසේ ඔහුට අණ කළාය.

'මේ කලේ ගෙනිහිං තියහං පිළිකන්නෙත්...'

සේදරා සුදු බණ්ඩා ගැන විමසූ අන්තිම වතාව මෙය විය.

The Reader's Place

ඉන් පසු කිසිම දිනක ඔහු සුදු බණ්ඩා ගැන කිසිවක්ම තම දෙමව්පියන්ගෙන් විමසුවේ නැත.

අවුරුදු දොළහ පසු කර සිටි සේදරා පුෂ්ටිමත්ව වැඩී හුන් සුදු බණ්ඩාට බාල වුණේ දැ අවුරුද්දකින් පමණි. සුදු බණ්ඩාට වයසට වඩා වැඩුණු පුෂ්ටිමත් ශරීරයක් හිමි වුණද සේදරාට තිබුණේ කෙසඟ සිරුරකි. එහෙත් අන් කාටත් වඩා තීක්ෂණ ඇස් දෙකකුත් පිරුණු කම්මුල් දෙකකුත් ඔහුට තිබුණේය. කොයිකවර විදියකට හෝ සුදු බණ්ඩා නැති වූ මේ පැය ගණන අතරතුර ඔහු හදිසියේම තරුණ වී සිටියේය. මේ කලේ ගෙනිහිං පිළිකන්නෙත් තියන්න යැයි ගෝමරී ඔහුට වැඩක් කරන්නට අණ කළේ ප්‍රථම වතාවටය. ඔහු වචනයක්වත් පිට නොකර එය කළේය. එපමණක්ද නොව සුදු බණ්ඩා ගෝමරීට අත් උදව් වූයේ යම් සේද සේදරා ඒ වගකීම එදා ඒ මොහොතේ සිට තම කර පිට පටවාගත්තේය. ඔහුට අවුරුදු තුනකින් බාල ටිකිරි ඔහුගේ මේ හැසිරීම ගැන මවිතයට පත්වෙද්දී සේදරා තම මවට-ගෝමරීට තව තවත් කිට්ටු වුණේය.

එදා හේනට ගිය දවසේ සිට පුංචි රාළ පුරා මාසයකටත් වැඩිය ගෙදර පස් පෑගුවේ නැත. එහෙත් හැම දවස් හතර පහකට සැරයක්ම සේදරා ටිකිරිත් කැටුව හේනට ගියේය. සරුවට වැඩුණු අල බතල, මුං කව්පි, එළවළු මල්ලක් දෙකක් ගෙදර අරගෙන ආවේය. ඒ නිසා ගෝමරීලා ගෙදර පුංචි රාළ නොසිටියා කියා අඩුවක් පාඩුවක් දැනුණේ නැත.

එහෙත් සුදු බණ්ඩා පන්සලේ නතර වී මාස එකමාරකට විතර පසුව පුංචි රාළට ගෙදර එන්න සිද්ධ වූ කාරණාවක් සිද්ධ වුණේය.

එදා මහ පාන්දර වෛතාලයෙන්ම සේදරා හේනට දුවගෙන ගියේය. ඒ යනකොටත් පුංචි රාළ හේනේ පැල උඩ ගොරව ගොරවා නිදාගෙන හිටියේය. ඉණිමඟ නැඟගෙන සේදරා උස ගහේ මැද සවි ශක්තියට ඉදි කර තිබූ පැලට ගොඩ වී තවමත් නිදාගෙන හිඳින අප්පුච්චා දිහා බලාගෙන සිටියේය. මොනම හේතුවකටවත් උපන්දා සිට කිකලෙකවත් ඔහු නිදියන

අප්පුච්චා ඇහැරුවා නැත. උන්දැගේ කේන්තිය ගැන දන්නා නිසාම සේදරාගේ හිතේ පුංචි රාළ අවදි කරන්න කැමැත්තක් තිබුණේ නැත. ඒ නිසා සද්ද නොකර පැයක් හමාරක් ඔහු කකුල් දෙක පහළට දමාගෙන ගහ උඩ පැලට වී ඇත මෙහා දිහා ඔහේ බලාගෙන හිටියේය.

ඉර එළිය පොළොව බදාගන්න තතනන විට පුංචි රාළ ඇහැ ඇරියේය. සේදරා ඉස්පාසුවක් නැතුව පුංචි රාළ දිහාට හැරුණේය.

'අප්පුච්චා මං ආවේ...'

'අර ලබු කට්ටට පොකුණෙන් වතුර ටිකක් අරං වරෙං...'

සේදරාට හරි හරියට වචන පෙළ ගස්සා ගන්ට පුළුවන් වුණේ නැත. පුංචි රාළ ඉස්සර වුණේය.

සේදරා ලබු කට්ට රැගෙන ඉණිමග බැස පොකුණට ගොස් වතුර අරගෙන ආවේය. පුංචි රාළ ලබු කට්ට කටේ තියා වතුර බීගෙන බීගෙන ගොස් හති ඇරියේය. සේදරා ඒ කෙටි ඉස්පාසුවේ යළි තමා ආ කාරණය කියන්ට වුණේය.

'අප්පුච්චා මං ආවේ..'

'අර පල්ලෙහා මස් වගයක් පුච්චලා ඇති අරං වරෙං...'

සේදරා යළි ඉණිමග බැස්සේය. කරු දෙකක ගසා පුච්චා තිබුණ තඩි මීමින්නෙකුගේ යැයි අනුමාන කළ හැකි මස් ගාතයක් රැගෙන යළි ඉහළ නැංගේය. යළි උඩ සිට පුංචි රාළගේ හඬ ඇසුණේය.

'පුච්චපු අල වගයකුත් ඇති...'

සේදරා යළි පහළට ගොස් ගිනි අඟුරු ඇත් මෑත් කොට පිලිස්සී තිබූ අල කැබලි කීපයක් එකතු කරගෙන ඉණිමග නැංගේය. පැල උඩදී ඒ සියල්ල සිය පියා ඉදිරිපස තබා පසෙකට වුණේය. පසෙකට වී යළි කටහඬ අවදි කළේය.

'අප්පුච්චා...'

'ඔහොම ඉඳගෙන කාල හිටහං...'

ඉනික්බිතිව දෙදෙනාම මසුයි අලයි භුක්ති විඳින්නට ගත්හ. සේදරා ඉක්මනින් කා අහවර වී තම පියා සැහැල්ලු වෙන තෙක් බලා සිටියේය. අවසානයේ පුංචි රාළ අත කට පිහදමා යළි ලබු

කට්ට කටේ තියාගෙන ගොඩ ගොඩ ගා වතුර බිව්වේය. රාම තෙල් ඇර ඔළුව දෙපසට ගසා යළි තොල කට පිහදාගත්තේය. සේදරා තමන්ගේ වේලාව පැමිණ ඇති බැව් හඳුනාගත්තේය.

'අප්පුච්චෙ..... මං...'

'අර බුලත් පයිය ගනිං....'

සේදරා පැලේ කොනකට වෙන්ඩ තිබූ බුලත් පයිය රැගෙන සිය අප්පුච්චා අතට දුන්නේය. ඉනික්බිතිව පැය භාගයක් විතර හරිම සාරසුබාවට පුංචි රාළ විටක් ඒදුවේය. හොඳට කට රතු කරගෙන එය තලු මර මර රස බැලුවේය. කොලුවා දිහාවත් නොබැලුවේය. කොලුවා තම අප්පුච්චා දිහාම බලාගෙන හිටියත් ඒ ගැන තුට්ටුවකටවත් මායිම් නොකළේය. පැයකට විතර පසු ඔහු හුන් තැනින් නැගිට්ටේය. ඉණකඩය බඳ වටා පටලවා පැල කෙළවරට ඇවිත් රතුම රතු පාට ලොකු කෙළ ගුලියක් පැල උඩ සිට පහළට ගැසුවේය. දබරැඟිල්ලෙන් හුණු ඩිංගක් මුවේ රඳවා තොල කට පිහදාගත්තේය. අවසානයේ හොඳට උගුර පාදා සේදරා දිහා බැලුවේය.

'හ්ම්... ඉතිං කියහං...'

'වල්ලී ගෙට වුණා කියල අම්ම කියන්ටය කිව්වා...'

පුංචිරාළ ඒ වචන ගණනකටවත් නොගත්තේය. පුරුදු විදිහට බුලත් විටට තව දුං කොළ කෑල්ලක් ඒදුවේය. ඉන් පසු යළි පැලේ ඉඳගන්න ගමන් සේදරා දිහා නොබලාම මෙසේ කීවේය.

'උඹ පලයං ගෙදර...'

සේදරා හති හතික ඉණිමග බැස යළි ගෙදර දිව්වේය.

එදා හැන්දෑ යාමේ පුරා මාස එකහමාරක පමණ විරාමයකට පසු අතකට පුරා බඩු පුරවාගෙන පුංචි රාළ ගෙදර ආවේය.

වැට කඩුල්ල මෑත් කරගෙන පුංචි රාළගේ යෝධ අඩි මිදුලේ වැලි පොළොව ස්පර්ශ කරනවාත් සමගම ගෝමරී ඔහුගේ දෑසින් වහන් වෙන්ට පිළිකන්නට දිව්වාය. ඒ ක්ෂණයෙන්ම ඊට ප්‍රතිවිරුද්ධව සේදරා, ටිකිරි පුඹුඹ දරු කැලත පුංචි රාළ පිළිග න්නට ඉදිරියට දිවගෙන ආවෝය. වෙන කවරදාටත් වඩා ප්‍රීති

ප්‍රමෝදයෙන් බැබළුණු තම පියාගේ මුහුණ ඔවුන්ට ගෙනාවේ තෘප්තකර හැඟීමකි. වෙනදා පුංචි රාළ හෙළන රළු බැල්මකට පවා හැඳගෙන සිටින රෙදි කඩමාල්ල තෙමාගන්නා මේ රංචුව මේ වෙලේ හිටියේ තම අප්පුච්චාගේ මේ අසාමාන්‍ය ප්‍රීතිය තම තමන්ට හැකි පමණින් වෙන වෙනම විඳගනිමිනි.

පුංචි රාළ රැගෙන ආ කරත්ත මලු කීපය ඉස්තෝප්පුවේ කොනකින් බිම තැබුවේය. ටිකිරි තමාට බාලයින් වූ රතාත්, පුංචාත් මැණිකාත් කැටුව වහා දුවගෙන ආවේ ඒවා ළිහා බලන්ටය.

'හා...හා... මං කියනකං එකෙක්වත් ඕවට අත තියන්නෙත් නෑ...'

හදිසියේ පාත් දල්ලට පිච්චුණාක් මෙන් ටිකිරි තම දෑත මැත් කරගත්තේය. කොපමණ ප්‍රීති ප්‍රමෝදයෙන් උතුරා ගියත් එක මොහොතක ඒ අණ දීම ඔහු සැබවින්ම නාහෙට නාහන පුංචි රාළ නම් වූ තම අප්පුච්චා බව ඒ පුංචි හිත්වලට ඒ ඇසිල්ලේදීම තේරුම් කරදුන්නේය.

ඊළඟ ඇසිල්ලේදී පුංචි රාළ පිල ළඟ බිම හිප්ප තියා ගත්තේය. බුලත් පයිය ඉනෙන් අතට ගෙන විටක් ඒදන අතරතුරේ මෙසේ ඇසුවේය.

'....කෝ වල්ලී...'

කිසිවෙක් කිසිවක් නොකියා එකිනෙකාගේ මුහුණු බලාගත්හ.

මොහොතක් ගෙවී ගියේය. බුලත් විට කටට ඇතුළු කරගෙන හුණු ඩිංගිත්තක් මැදගිල්ලෙන් ඉස්සරහා යටි ඇන්දේ දතක තවරා කෙළ පිඬක් මිදුල පුරා විසුරුවා පුංචි රාළ යළි මෙසේ ඇසුවේය.

'...මං ඇහුවේ බොල... කෝ වල්ලි කියලා...'

එවිට සියල්ලන්ටම වඩා වගකීම් කරට ගත් සියල්ලන්ටම වඩා වයසින් මුහුකුරා ගිය සේදරා ඉදිරියට පැමිණියේය.

'ගෙයි ඇතුළේ...'

'ඉතින් බොල මොකද ඔක්කොම එළියට වෙලා කරන්නේ...'

'අම්ම කිව්වා මැණිකටයි එතනටයි ඇර වෙන කාටවත් ඇතුළ් ගෙට අඩියක් තියන්ඩ එපා කියලා...'

'කවුද බොල කිව්වෙ...'

පුංචි රාළ හිතාගන්න බැරි නිමේෂයකදී එක් වරම හිටි තැනම හිටගත්තේය. ඒ ක්ෂණයෙන්ම ඇතුළ් ගෙට ඇතුළු වී මහ හයියෙන් මෙසේ කෑ ගැසුවේය.

'...ව...ල්...ලී...'

මොහොතක විරාමයකට පසුව අඳුරේ ගිලුණු ඇතුළ ගේ ඇතුළෙන් හීන් කෙඳිරියක් වන් හඬකින් මෙසේ පිළිතුරු ලැබුණේය.

'අ...ප්...පුච්චා...'

'මොකෝ උඹ කළුවරේ කරන්නේ...'

එවර පුංචි රාළගේ හඬ ප්‍රබෝධවත් විය. ප්‍රීතිමත් විය. ළෙංගතු විය. ඒ හඬින්ම ඔහු නැවත මෙසේ කීවේය.

'...වරෙං... එළියට...'

වල්ලී සෙමෙන් අඩි තියමින් එළියට ආවාය. ඉර අඳුරේ ගිලෙන්න තටමන මේ ගොම්මන් වේලාවේ රත්තරන් පාටට ලස්සනම ලස්සන තම අප්පුච්චාගේ ප්‍රීතිමත් මුහුණ අඩ අඳුර අතරින් වල්ලී දුටුවාය. ඒ මුහුණ ඒ තරම් ලස්සනට ඈ කවරදාකවත් දැක තිබුණේ නැත. ඒ මුහුණ ඒ තරම් ප්‍රීතිමත්ව ඈ කවරදාකවත් දැක තිබුණේ නැත. එමෙන්ම ඒ සිරුර ඒ තරම් තේජස්ව ඈ කවරදාකවත් දැක තිබුණේ නැත. වල්ලී සැබවින්ම සිනාසුණාය.

'ඇත්තටම උඹ මේ මාසෙට දෙකට ලොකුම ලොකු වෙලානේ...'

තම අප්පුච්චාගේ හඬ ඒ තරම් ප්‍රබෝධමත්ව ඈ කවමදාකවත් අසා තිබුණේ නැත. එමෙන්ම තම අප්පුච්චාගේ ඒ හඬ ඒ තරම් ළෙංගතුව ඈ කවමදාකවත් අසා තිබුණේත් නැත.

පුංචි රාළ තම දකුණත වල්ලී දෙසට දිගු කළේය. ඈ එය ආදරෙන් පිළිගෙන ඔහු වෙතට ආවාය.

තම අප්පුච්චාගේ අතේ එල්ලීගෙන වල්ලී ඉදිරියට එද්දී සේදරාත්, ටිකිරිත්, රතාත්, පුංචාත් කියන කොලුවන් හතර දෙනා කටවල් කන් දෙක හරියට වෙන්ට පළල් කරගෙන ඇස් ගෙඩි මුහුණෙන් එළියට එන තරමට ලොකු කරගෙන ඇහි පිල්ලන්

නැර බලාගෙන සිටියේ මේ එළියට එන්නේ කලින් දවසේ ගෙට ගොස් එළියට නොපැමිණි වල්ලීම දූයි සහසුද්දෙන්ම සැක හැ දන ගන්නටය.

ඇත්තෙන්ම ඇතුළු ගෙයි සිට එළියට ආවේ මෙතුවක් කල් ඔවුන් සමග මේ ගෙදර හතර කෙළවරේ දුව පැන ගිය වල්ලි නොවේ. ඔවුන් සමග හරි හරියට ගස් බඩගාමින් ඔට්ටු ඇල්ලූ වල්ලි නොවේ. නැතිනම් මාරාවේශයෙන් කඩා පැනගෙන රණ්ඩු ඇල්ලූ වල්ලීද නොවේ.

උරහිස් පුරා එක සීරුවට කඩා හැලුණු කෙස් වැටිය මුහුණට වැටෙන්නට නොදී අතින් වළකමින් කිසියම් පුහුණු කළ ලයකට අනුව දෙපා සීරුමාරු කරමින් ඈ සිය අප්පුච්චා සමඟ ගේ ඉදිරිපසට ආවාය.

'...සේදරා... වතුර කළ ගෙඩිය අරං වරෙං...'

පුංචි රාළ පිල ළඟ සිට කෑ ගැසුවේය. ඒ සමගම මීට වික වේලාවකට කලින් තමන් රැගෙන ආ කරත්ත මලු කීපය තැන්පත් කළ තැනට ගොස් ඉන් එකක කට ඇර යම් කිසිවක් සොයා විමසා එළියට ගෙන අතේ ගුළි කරගත්තේය. ඉක්බිතිව ඒ ඉර බැසගෙන යන වේලාවේ වල්ලීද කැටුව එළියට බැස්සේය. ගඟ ගමන් ආපසු හැරී මෙසේද කීවේය.

'මං එනකං... උඹල ඔහොමම ඉන්ඩ ඕන...'

රත්තරන් පාට ඉර රැස් වැටී දිය මත දිගේලි වී තිබුණේය. රත්තරන් පාට ඉර රැස් වැටී දිය මත දිගේලි වී තිබුණේය.

මේ තරම් ලස්සනට ආකාසය රනින් බැබළුණු දිනයක් වල්ලි දක තිබුණේ නැත. වතුරේ දියවෙන ඒ රන් පැහැය තම සිරුර පුරා දවටා උරාගන්න ඇයට ඕනෑ විය. ඈ දියට බැස්සාය. ඇඳගෙන හුන් රෙද්ද පිටින්ම දියට බැස්සාය.

'අප්පුච්චත් එන්ඩ නාන්ඩ...'

'බෑ මං ගොඩ ඉන්නං...'

'මං ඇඳුම් ගලවන්ඩද...?'

'... උඹේ කැමැත්තක්...'

වල්ලි ඇඳගෙන හුන් රෙද්ද ගැලෙව්වාය. අමුම අමු නිර්වස්තරෙන් වතුරට බැස්සාය. ඇත්තටම මෙය ඇයට

ආගන්තුක දෙයක් නොවේ. මීට පෙර බොහෝ අවස්ථාවලදී ඈ හෙලුකොට්ටෙන් වැවට බැස තිබුණාය. එහෙත් අද ඈ එසේ කරන්ට මත්තෙන් තම පියාගෙන් ඒ ගැන විමසුවාය. එහෙත් ගොඩට වී ඒ දිහා බලා සිටි පුංචි රාළට මීට පෙර හෙලුකොට්ටෙන් දියට පැන නෑ වල්ලීත් මේ අද හවස අමු නිර්වස්තරෙන් දියට පැන නාන වල්ලීත් අතර සැබෑ වෙනසක් පෙනුණේය.

දියේ ගිලී එක්වරම උඩට ආ එක් මොහොතකදී වල්ලි තිගැස්සුණාය. පුංචි රාළ ඈ අසලම සිටියේය.

'මං බය වෙච්ච තරමක්... ඇයි නාන්නේ නැ කියලනෙ අප්පුච්චා කිව්වේ...'

'මං උඹට බඩුවක් ගෙනාවා...'

'මොකක්ද...?'

'ඇඟේ ගාන සබන් කෑටයක්...'

පුංචි රාළ අපරිමිත සතුටකින් තම දෝත පුරා සඟවාගත් සබන් කෑටය ඇයට පෑවේය.

'හරිම සුවඳයි...'

'තම්බි මුදලාලිගෙන් මං අද දවල් ගත්තේ...'

'කිරිම කිරි පාටයි...'

'මං ගාන්නද උඹේ ඇඟේ...'

'හා...'

වල්ලී දෙවරක් නොසිතා එක්වරම කැමැත්ත පළ කළාය. පුංචි රාළ ඉණ තෙක් වතුරේ ගිලුණ ඇගේ ඇඟ පුරා හරිම සාරසුබාවට සබන් ගෑවේය. මුලින්ම ඔහු ඇගේ හිසකෙස් පුරා සබන් ගෑවේය. දූලි වැකුණ කෙස් රොද සබන් පුසුඹෙන් මත්ව පණ ගැහෙද්දී ඊට සාපේක්ෂව ඈ ශාරීරිකව තව තවත් පණ ලැබුවාය. සමේ ගිලී ගත් කුණු දූලි සබන් පුසුඹට බියව සේදී ඉපිලී යද්දී ඈ බාල විය හරිමින් තරුණ වියට එළඹෙමින් සිටියාය.

'ඇස් වහගන්ඩ... මං මූණේ ගාන්නයි යන්නේ...'

වල්ලී ඇස් පියාගත්තාය. ඉතා සීරුවෙන් පුංචි රාළගේ ඇඟිලි තුඩු වල්ලීගේ කම්මුල් පුරා දිව්වේය. ඉතා අරපරිස්සමින් පුංචි රාළගේ ඇඟිලි තුඩු වල්ලීගේ දෙතොල්වල ගෑවී නොගෑවී

The Reader's Place

ගියේය. ඊළඟට ඔහුගේ ඇඟිලි තුඩු ඇගේ බෙල්ල පුරා සෙමෙන් සක්මන් කළේය.

'ඇස් අරින්න එපා දූන්ම...'

වල්ලි හූමිටි තිබ්බාය. පුංචි රාළගේ ඇඟිලි තුඩු ඇගේ සියුම් බෙල්ලෙන් බෑරී පහළට ඇවිත් යන්තම් ඉල්පෙන ඇගේ නාඹර තන පුඩු මත්තේ එහාට මෙහාට ගියේය. වල්ලී දීර්ඝ හුස්මක් ඉහළට ගත්තාය. ඇස් ඇරිනු වෙනුවට ඇ තවත් ඇස් තද කරගත්තාය. සිහින් හඬින් කෙඳිරි ගෑවෙද්දී ඇය සිය අප්පුච්චා දෝතින්ම බදාගෙන දියේ ගිලුණාය.

හොඳටම අඳුර හතර වට හක්කලං කරන විට පුංචි රාළ වල්ලී සමඟ ගෙදර ආවේය. වල්ලී අලුත්ම අලුත් රෙද්දක් සමඟ හැට්ටයක් හැඳ සිටියාය.

'කොහෙන්ද මේක...?'

පුංචා ඒ රෙද්ද අතින් අත ගාමින් පුංචි රාළ කළ ගෙඩිය පැත්තකින් තියන්න ඇත් මෑත් වෙද්දී තම අක්කණ්ඩියගෙන් විමසුවේය.

'අප්පුච්චා... තම්බි මුදලාලිගෙන් අරගෙන...'

පුංචි රාළ කළ ගෙඩිය මිදුලේ කොනක තියා පිල ළඟට ළං වුණේය...

'හා... දූන් ඔක්කොමල මෙහාට ආව නං හොඳයි...'

ඊළඟ නිමේෂයේදී දරුවන් හත් දෙනාම එකා මත එකා පෙරළාගෙන පුංචි රාළට කිට්ටු වුණෝය. පුංචි රාළ කිසිම හදිසියක් නැතුව තමන් ගෙනා කරත්ත මලු එකින් එක ලිහුවේය. එක් එක්කෙනාට වෙන වෙනම එක එක උසට මහතට සරිලන රෙදි, හැට්ට, ඉණකඩ ඔහු ගෙනා බඩු අතර තිබුණේය. ඔහු එකින් එක ඇඳුම එක් එක්කෙනාගේ ඇඟවල්වලට තබා ප්‍රමාණය කිරා මැන බැලුවේය. ඇඳුම් බෙදාදීමෙන් පසුව ඊළඟියේ මනිබඩු බෙදා දීමයි. වෙනම කඩ මාල්ලක ඔතා හරිම විසිතුරු මාල, වළලු, තෝඩු, අරුමෝසම් පිළිවෙළකට අසුරා තිබුණේය.

'තම්බි මුදලාලිගෙන් මේව ගන්ඩ සෑහෙන කුරහන්, එළවළු මං හිලව්වට දුන්නා...'

ඒවා එකිනෙකා අතර බෙදමින් පුංචි රාළ ආඩම්බරයෙන් කීවේය. හොඳම මාල වළලු තෝඩු දෙන්නට තීන්දු වුණේ වල්ලීටය. අනෙක්වා පස් හැවිරිදි මැණිකාත් දෙහැවිරිදි එතනාත් අතර බෙදී ගියේය. අරුමෝසම් මනිබඩු බෙදාදීම අහවර වන විට කන කර මාල වළලු පැලඳි වල්ලී එකොළොස් හැවිරිදි විය පහු කර හද්‍ර යෞවනයේ තරුණියක වී සිටියාය.

ඒ රාත්‍රිය මේ ගෙදර එකම එක අයෙකුට හැර අනෙක් සියල්ලන්ටම සතුට ඉහවහා ගිය දවසක් වුණේය. සියල්ලන් කිසි කලෙකවත් අත් නොවිඳි මේ සතුට සමරද්දී ගෝමරී පිළිකන්නට වී කඳුළු සලමින් සිටියාය. පුංචි රාළ ඒ හවස් යාමයේ ගත කළ එකම එක මොහොතකවත් ගෝමරී ගැන විමසුවේ නැත. ඇය කොහේදැයි දරුවකුගෙන් අසා බැලුවේ නැත. අත කට පුරවාගෙන ගෙනා බඩු මුට්ටුවල ගෝමරීට එක තඹ දොයිතුවක දෙයක්වත් තිබුණේද නැත. එක හුණු ඩිංගක දෙයක්වත් වෙන් කෙරුණේ ද නැත.

පුංචි රාළ වල්ලී සමඟ වැවට යන්න පිටත් වූ පසු ගෝමරී සියල්ලන්ටම ඇති තරමට කන්ට කෑම පිසුවාය. පුංචි රාළ හේනෙන් ගෙනා අඩුවැඩියද එකතු කොට වෙනදාටත් වඩා රසට කෑම පිසුවාය. ඉක්බිතිව යළිත් පිළිකන්නට වැදී ඔහුගේ දෑස් වලින් වහන් වෙන්ට පරිස්සම් වෙමින් සැඟවී සිටියාය. හැමෝම රසමසවුළෙන් සප්පායම් වී සාද කතා ලතා පවත්වද්දී ගෝමරී බඩගින්නේම පිළිකන්නේ හිප්ප තියාගෙන සිටියාය. සේදරා ඇයට කෑම බෙදාගෙන ඇය සිටි තැනට පැමිණි මොහොතේ උලලේනියක මෙන් ඉකි ගැසූ ඇ කෑම බෙදාගෙන ආ මඩක්කුව ඔහුගේ මුහුණටම දමා ගැසුවාය. මහ රෑ මහ නින්දෙන් පුංචි රාළ රාම තෙල් අරිද්දී ගෝමරී පොළොවේ පස් පහුරු ගාමින් මුළු රෑම නිදි වැරුවාය.

සැබවින්ම ගෝමරීට වස මූසල වුණ අනෙක් සියල්ලන්ටම මහත් ප්‍රීතිමත් වුණ ඒ රාත්‍රිය ගෙවී තවත් දවසක් උදා වුණේය. උදේ පාන්දරම පුංචි රාළ හේනට යන්න ලකලෑහැස්ති වුණේය. ඒ අතරතුර සිත් සැනසිල්ලේ බුලත් විටක් ඒදන්ඩ පටන් ගත්තේය.

The Reader's Place

ගියේය. ඊළඟට ඔහුගේ ඇඟිලි තුඩු ඇගේ බෙල්ල පුරා සෙමෙන් සක්මන් කළේය.

'ඇස් අරින්න එපා දූන්ම...'

'ඇස් අරින්න එපා දූන්ම...' පුංචි රාළගේ ඇඟිලි තුඩු ඇගේ

වල්ලි හුමිටි තිබ්බාය. පුංචි රාළගේ ඇඟිලි තුඩු ඇගේ සියුම් බෙල්ලෙන් බේරී පහළට ඇවිත් යන්තම් ඉල්පෙන ඇගේ නාඹර තන පුඩු මත්තේ එහාට මෙහාට ගියේය. වල්ලි දීර්ඝ හුස්මක් ඉහළට ගත්තාය. ඇස් අරිනු වෙනුවට ඈ තවත් ඇස් තද කරගත්තාය. සිහින් හඬින් කෙඳිරි ගෑවෙද්දී ඇය සිය අප්පුච්චා දෝතින්ම බදාගෙන දියේ ගිලුණාය.

හොඳටම අඳුර හතර වට හක්කලං කරන විට පුංචි රාළ වල්ලි සමඟ ගෙදර ආවේය. වල්ලි අලුත්ම අලුත් රෙද්දක් සමඟ හැට්ටයක් හැඳ සිටියාය.

'කොහෙන්ද මේක...?'

පුංචා ඒ රෙද්ද අතින් අත ගාමින් පුංචි රාළ කළ ගෙඩිය පැත්තකින් තියන්න ඇත් මැත් වෙද්දී තම අක්කණ්ඩියගෙන් විමසුවේය.

'අප්පුච්චා... තම්බි මුදලාලිගෙන් අරගෙන...'

පුංචි රාළ කළ ගෙඩිය [illegible]

ළං වුණේය...

'හා... දැන් ඔක්කොමල මෙහාට ආව නං හොඳයි...'

ඊළඟ නිමේෂයෙහි දරුවන් හත් දෙනාම එකා මත එකා පෙරළාගෙන පුංචි රාළට කිට්ටු වුණේය. පුංචි රාළ කිසිම හදිසියක් නැතුව තමන් ගෙනා කරත්ත මලු එකින් එක ලිහුවේය. එක් එක්කෙනාට වෙන වෙනම එක එක උසට මහතට සරිලන රෙදි, හැට්ට, ඉණකඩ මලු ගෙනා බඩු අතර තිබුණේය. ඔහු එකින් එක ඇඳුම එක් එක්කෙනාගේ ඇඟවල්වලට තබා ප්‍රමාණය කිරා මැන බැලුවේය. ඇඳුම් බෙදාදීමෙන් පසුව එළඹියේ මනිබඩු බෙදා දීමයි. වෙනම කඩ මාල්ලක ඔතා හරිම විසිතුරු මාල, වළලු, තෝඩු, අරුමෝසම් පිළිවෙළකට අසුරා තිබුණේය.

'තම්බි මුදලාලිගෙන් මේව ගන්ඩ සෑහෙන කුරහන්, එළවළු මං හිලව්වට දුන්නා...'

ඒවා එකිනෙකා අතර බෙදමින් පුංචි රාළ ආඩම්බරයෙන් කීවේය. හොඳම මාල වළලු තෝඩු දෙන්නට තීන්දු වුණේ වල්ලිටය. අනෙක්වා පස් හැවිරිදි මැණිකාත් දෙහැවිරිදි එතනාත් අතර බෙදී ගියේය. අරුමෝසම් මනිබඩු බෙදාදීම අහවර වන විට කන කර මාල වළලු පැළඳි වල්ලි එකොළොස් හැවිරිදි විය පනු කර හඳ යෞවනයේ තරුණියක වී සිටියාය.

ඒ රාත්‍රිය මේ ගෙදර එකම එක අයෙකුට හැර අනෙක් සියල්ලන්ටම සතුට ඉහවහා ගිය දවසක් වුණේය. සියල්ලන් කිසි කලෙකවත් අත් නොවිඳි මේ සතුට සමරද්දී ගෝමරී පිළිකන්නට වී කඳුළු සලමින් සිටියාය. පුංචි රාළ ඒ හවස් යාමයේ ගත කළ එකම එක මොහොතකවත් ගෝමරී ගැන විමසුවේ නැත. ඇය කොහේදැයි දරුවකුගෙන් අසා බැලුවේ නැත. අත කට පුරවාගෙන ගෙනා බඩු මුට්ටුවල ගෝමරීට එක තඹ දොයිතුවක දෙයක්වත් තිබුණේද නැත. එක හුණු වීංගක දෙයක්වත් වෙන් කෙරුණේ ද නැත.

පුංචි රාළ වල්ලි සමඟ වැවට යන්න පිටත් වූ පසු ගෝමරී සියල්ලන්ට [illegible] කන්ට කෑම පිසුවාය. පුංචි රාළ හේනෙන් ගෙනා අඩුවැඩියද එකතු කොට වෙනදාටත් වඩා රසට කෑම පිසුවාය. ඉක්බිතිව යළිත් පිළිකන්නට වැදී ඔහුගේ දෑස් වලින් වසන් වෙන්ට පරිස්සම් වෙමින් සැඟවී සිටියාය. නැමෝම රසමසවුළෙන් සප්පායම් වී සාද කතා ලතා පවත්වද්දී ගෝමරී බඩගින්නේම පිළිකන්නේ හිප්ප තියාගෙන සිටියාය. සේදරා ඇයට කෑම බෙදාගෙන ඇය සිටි තැනට පැමිණි මොහොතේ උලලේනියක මෙන් ඉකි ගැසූ ඈ කෑම බෙදාගෙන ආ මඩක්කුව ඔහුගේ මුහුණටම දමා ගැසුවාය. මහ රෑ මහ නින්දෙන් පුංචි රාළ රාම තෙල් අරිද්දී ගෝමරී පොළොවේ පස් පහුරු ගාමින් මුළු රෑම නිදි වැරුවාය.

සැබවින්ම ගෝමරීට වස මූසල වුණ අනෙක් සියල්ලන්ටම මහත් ප්‍රීතිමත් වුණ ඒ රාත්‍රිය ගෙවී තවත් දවසක් උදා වුණේය. උදේ පාන්දරම පුංචි රාළ හේනට යන්න ලකලෑහැස්ති වුණේය. ඒ අතරතුර සිත් සැනසිල්ලේ බුලත් විටක් ඊදන්ඩ පටන් ගත්තේය

The Reader's Place

සද්දයක් බද්දයක් නැතිව පුරා පැයකට ආසන්න කාලයක් තිස්සෙ
හැමදාමත් වගේ හරිම සාරසුබාවට බුලත් විට කැවෙය. ඉක්බිති
හුන් තැනින් නැගී සේදරාට කතා කළේය.

'මෙහෙ වරෙං... මං යනව ගේනට...'

පසුව වල් කොටන කැත්ත කරට අරගෙන බුලත් කෙළ
පිඩක් මිදුලේ ඈතට ගසා මෙසේද ඊට එකතු කළේය.

'මගේ අත් උදව්වට වල්ලිව එක් කරගෙන ගියා කියහං...'

ගේ ඉදිරිපස සිට ඇසුණු පුංචි රාළගේ ඒ හඬ සමඟ
ඔහුගේත් වල්ලිගේත් පා ගැටෙන හඬ මිදුලේ ඈතට ඇදී මැකී
යද්දී ගෝමරී පස් අහුරක් කටේ දමාගෙන බරු බරු ගා හපමින්
දැන් පොළොවේ ගසමින් විලාප තියන්නට වූවාය. ඒත් ඒ විලාප
හඬ ඈත යන පුංචි රාළටවත්, වල්ලිටවත් ඇසුණේ නැත.

එහෙත් වල්ලිට අවුරුදු හයක් බාල වූ මැණිකා ගෝමරීගේ
මේ සියලු විස්සෝප සැඟවී බලා සිටියාය. මේ කිසිවක අඟ
මුලක් හරියට තේරුම් බේරුම් ගන්ට බැරිව හිටියත් මොකක් හෝ
විත්තැහියක් සිද්ද වී ඇති බව ඈ සිය ඉවෙන් හඳුනාගත්තාය.
පුංචි රාළ වල්ලී සමඟ පිටව ගිය විගස පිළිකන්නෙන් මැද
ගෝමරී මිදුලට ගිය විට මැණිකා ගෝමරී ඒ රැය මුළුල්ලේම හිස
තියා හිඳගත් තැන වාඩිගත්තාය. පසුව ගෝමරී සිය දිගු ඇඟිලි
තුඩුවලින් පහුරු ගෑ පස් අහුරක් ගෙන කටේ දමාගත්තේ ඇත්තටම
අම්මාට කන්නට තරම් ඒවා රසදැයි කියා තමාටම ප්‍රත්‍යක්ෂ කර
දැන ගන්නටය.

The Reader's Place

03

සුදු බණ්ඩා ගමේ පන්සලේ ඇබිත්ත කොලුවා වී දෙවන වතාවටත් හාමුදුරුවන්ගේ පොත් ගුලේ පුස්කොළ පොත් අග සිට මුලට වනපොත් කරන්ඩ ගත් පළමු දවසේ ගෝමරී ඇගේ තිව්හතේ දරුවකු ප්‍රසූත කළාය.

සේදරා පාන්දරම දුවගෙන ඇවිත් සුදු බණ්ඩාට කතා කළේ අම්මට හොඳටම අමාරු බව කියන්නටය. කියවමින් සිටි පුස්කොළ පොත පසෙක තියා ඇඳගෙන සිටි අඳනකඩය පිටින්ම සුදු බණ්ඩා සේදරා සමඟ ගෙදර දිව්වේය.

මීට මාස ගණනකට ඉහත දවසක පුංචි රාළ සුදු බණ්ඩාව වැව් ඉහත්තාවේ සිට පන්සලට පාර දිගේ ඇදගෙන ආ දවසේ සිට කිසිම දවසක සුදු බණ්ඩා ගෙදර ගොස් තිබුණේ නැත. ඒ මාස ගණනාවෙන් මාස තුනකට ආසන්න කාලයක් ඔහු සිහි මූර්ඡාවෙන් සිටියේය. ඉන් පසුව එළඹුණු මාස කීපය ඔහු අකුරු ලියන්ට කියන්ටත්, බණ පොත් වනපොත් කරන්ටත් ගත කර තිබූ බැවින් වෙන අමතර කිසිම දේකට ඔහුගේ අවධානය යොමු වුණේ නැත. සැබවින්ම පන්සලේ ඇබිත්ත කොලුවා බවට පරිවර්තනය වී සිටි ඔහු එදා ඒ පන්සලට පැමිණි තීරණාත්මක දිනය සමඟ සිය අප්පුච්චාත්, කුඩම්මාත්, සහෝදර සහෝදරියනුත් තාවකාලිකව

The Reader's Place

අමතක කරදමා තිබුණේය. [illegible] මාසයකට පසු මෙසේ ගෙදර යන එක ඔහුට සැබවින්ම ආගන්තුක දෙයක් වුණේය.

එහෙත් සේදරා පාන්දරම දුවගෙන ඇවිත් ගෝමරීට අමාරු බව කියද්දී තමා සිතින් කයින් ඇලුම් කළ ඒ ගැහැනිය තොදන්නා ඇය අමතක කර මෙතුවක් කල් සිටියේ කෙසේදැයි ඔහුට සිතාගන්නට බැරි වුණේය. තමා සිතා මතාම බරපතළ වරදක් කළ බව ඔහුගේ ඇතුළු සිත ඔහුට සීමා රහිතව දෙස් දෙවොල් තියද්දී ඒ වරදෙන් ගැලවෙන්නට බැරිව ඔහු සේදරා පසු පස්සෙන් ගෙදර දිව්වේය.

සුදු බණ්ඩා ගෙදර යන විට ගෝමරී ඇතුළු කාමරයේ පොඩිනා නමැති වින්නඹුව සමඟ තනි වී සිටියාය. ගෝමරීගේ කෙඳිරිලි සහිත වේදනාභරිත හඬ ඇතුළු කාමරයේ බිත්ති පසාරු කරගෙන එළියට ඇදී ආවේය. එය සුදු බණ්ඩාගේ හදවත පසාරු කරගෙන යටටම කිමිදුණේය. ගෝමරීට අමාරු විත්තිය මිසක් ගෝමරී දරුවකු වදන්ට ඉන්න විත්තිය සේදරා සුදු බණ්ඩාට කියා තිබුණේ නැත. එබැවින් ගෙයි පිල ළඟ නැවතුණු සුදු බණ්ඩා එක්වරම යන්න උත්සාහ කළේ ඇතුළු ගෙටය. එහෙත් සේදරා එය වැළකුවේය.

'ඇයි...?'

සුදු බණ්ඩා නොසන්සුන්ව ප්‍රශ්න කළේය.

'...මට කුඩම්මව බලන්ඩ ඕන...'

'... තව ටිකක් ඉන්ඩ...'

සේදරා ඔහුව අස්වැසුවේය. ඒ අතර ඊළඟ නිමේෂයේදී ගෝමරීගේ විලාපය දෙබෑ කරගෙන අලුත උපන් දරුවෙකුගේ හඬ ඇතුළු ගේ තුළින් ඇසුණේය. ඒ සමඟ ගෝමරීගේ හඬ සිහින් කෙඳිරියක් බවට පත් වුණේය.

'...සුදු බණ්ඩේ අයියා ඉන්නව මෙතන...'

සේදරා ඇතුළු කාමරයට දැනුම් දුන්නේය.

'තව ඩිංගිත්තක් අපට ඕන...'

වින්නඹු අම්මාගේ පිළිතුරු හඬ ඇතුළු කාමරයෙන් ඇසිණි.

සිතිවිලි රහිත නොසන්සුන්දායක කෙටි කාලයක් ගෙවී ගියේය.

'...එන්න ඇතුළට...'

පොඩිනාගේ හඬ ඇතුළු ගේ ඇතුළේ ඈත කොනකින් ඇසිණ.

'මලයා ඉස්සෙල්ලාම යන්ඩ ඇතුළට...'

සුදු බණ්ඩා සේදරාට කීවේය. එහෙත් සේදරා එය එකහෙළාම ප්‍රතික්ෂේප කළේය.

'නෑ අයියා යන්ඩ. මං පස්සේ එන්නම්...'

සුදු බණ්ඩා නොදන්නා අද්භූත ගුහාවකට ඇතුළු වන්නාක් මෙන් කුටිය තුළට වැදුණේය. එහි අඳුරට හුරු වෙන්න ඔහුට ටික වේලාවක් ගත විය. එහෙත් ඒ ටික වේලාව ගෙවී යත්ම අඳුරු ඇඳක් මත ප්‍රීතිමත් දෙනෙතින් යුක්තව සිටින ගෝමරීත්, මේ දැන් කැපූ පෙකණිවැලෙන් වැස්සෙන ලේ බිඳු සමඟ දඟලන කුඩා පිරිමි දරුවකුගේ දීප්තිමත් මුහුණත් ඔහුට දකගත හැකි විය. දරුවාගේ සුළඟිල්ල අල්ලාගෙන සිටි ගෝමරී සුදු බණ්ඩා දිහාට අත දිගු කරමින් මෙසේ කීවාය.

'මේ තමයි පුතේ උඹේ අප්පච්චා...'

සුදු බණ්ඩාට එක් වරම සිය සියොලඟම සීතල වතුර දැනුණේය. සිය සිරුර වත්තන් කරගන්ට බැරි වූ හෙයින් ඔහු ඒ මේ අත ලේ වැකුණු ඇඳේ කොනක ඉඳ ගත්තේය.

'දරුවා උස්සන්ඩ බැරි තරං බරයි... මූ ඔය බඩේ කොහොම හිටියද කියල මට හිතාගන්ඩ බෑ...'

ඇගේ පතේ මහත දෙහෙත අනුව වයස අවුරුදු හතළිහකට වඩා වැඩිය ලංසු තියන්න බැරි පොඩිනා එසේ කීවේ සිය ශරීරයෙන් පිටවූ විමතිය ඇස්වලින් එළියට පනින්න ඉඩ හරිමිනි.

ශරීරයට කොහෙත්ම උහුලන්න බැරි රවුම් තට්ටම් යුගලකුත් ලොකු පියයුරු දෙකකුත් සහිත පොඩිනා කවරදා කොහොම වින්නඹුකම් කරන්ට පටන් ගත්තාදැයි කියන්න පුළුවන් මතකයක් තිබූ අයකු ගමේ සිටියේ නැත. සමහරු කීවේ ඇ උපන්දා සිටම වින්නඹුකම් කරන බවය. මේ රාජකාරිය දෙවියන්ගෙන් ලත් දේවාශිර්වාදයක් යැයි විශ්වාස කළ ඈ හැම ගැහැනියකගේ ම

The Reader's Place

ගැබ සැහැල්ලු කරන්න මත්තොට ... භාෂාවකින් ස්තෝත්‍ර
ගණනාවක් කීම පුරුද්දක් ලෙස කළාය. එසේම මෙය දේව
රාජකාරියක් ලෙස ඇ කෙතරම් භක්තියකින් විශ්වාස කළාද
කියතොත් විත්නඹුකම් කරන්නියක කිසිදා පුරුෂයකු සමග නිදා
නොගත යුතු බව තරව විශ්වාස කළාය. පුරුෂයකුගෙන් එළෙ
කිලිටි වීම මළ දරුවන්ගේ පෙර නිමිත්තක් බව ඇ ඇදහුවාය. ඒ
නිසාම මේ අවුරුදු හතළිහක පමණ ජීවිත කාලය තුළ ඇ කිසිදු
පුරුෂයෙකු සමග සංවාසයේ නොයෙදුණාය. මිනිහෙක් එක්ක
නිදාගන්න පිනක් නැතැයි ඇට විසුළු කළ ගමේ අම්මණ්ඩියන්ට
ඇ නිතරම දුන්නේ මෙවැනි පිළිතුරකි.

'යකෝ... උඹල ඔන්නං පිරිමියෙක් දෙන්නෙක්ගෙ විතරද්
අහවල් එක අතගාල ඇති... දනගනිව් මං මිනිස්සු සිය ගාණකගේ
අහවල් එක අතගාල තියෙනව උන් ඉපදෙන කොට...'

ගෝමරීගේ යෝනි මාර්ගයෙන් එළියට ගලා ගිය ලේවලින්
පැල්ලම් හැදුණු ඇඳ මත ඉඳගෙන සිටි සුදු බණ්ඩා තවමත් සිටියේ
පියවි සිහියෙන් නොවේ. පොඩිනාගේ වදන් ඔහුට ඇසුණේ
සෙංකඩගල රජ වාසලේ සිට ඇහෙන තරම් ඈතිනි. සුදු බණ්ඩා
ඇඳ උඩ සිටිද්දීම පොඩිනා දරුවා ළඟට වී පෙකණිවැල සුද්ද
කර උණු වතුරෙන් සෝදා පුංචි වපරයක් ඇති වම් ඇහැ අඩවන්
කර දරුවාගේ පුරුෂ දේහය නිවැරදිව පිහිටා ඇත්දැයි සැක හැර
දැන ගන්නට ඇඟ පුරා අතගා බැලුවාය. තට්ටම් දෙක උස්සා
පුරුෂ ලිංගය ස්පර්ශ කරනවාත් සමග දරුවා පොඩිනාගේ වපර
ඇස් දෙස කෙළින් බලා මනමාල සිනාවක් පෑවේය.

'යකෝ මූට උපන් ගමන්ම ඇසුත් පේන්ඩ අරන්ද...'

ගෝමරී සිනාසුණාය. සුදු බණ්ඩා සිනාසුණේ නිවැරදිව
අවට සිදුවූ සියල්ල දැන හැඳිනගෙන නොවේ. යන්තම් ගෝමරීට
ප්‍රතිචාර දක්වන්නටය.

'...හ්ම්... මට දාඩියයි. මං එළියට ගිහින් එන්නම්...'

"පොඩිනා ඇතුළු ගෙයින් එළියට බහින්ඩ හැදුවා විතරය.
දරුවා යටි ගිරියෙන් බෙරිහන් දෙන්ඩ ගත්තේය. ඒ බෙරිහන් හඬ
කෙතරම් අසාමාන්‍ය විද යත් ගෙයි මැටි බිත්තිවලින් සර සර ගා

වැලි කැට කඩා හැලෙන්න ගත්තේය. වහලේ ලී පරාල දෙදරන්ඩ
ගත්තේය. පොඩිනා යළි මේ පෝරිසාදයා දෙසට හැරුණාය.

'මූට බඩගිනි ඇති... උඹේ තනේ කටේ ගහපං...'

ගෝමරී තන මත්තක් වැහෙන්න ඇඳගෙන සිටි රෙද්ද
කඩා දරුවන් හත් දෙනෙකුට කිරි පෙවූ ඒ තන පුඩුව මේ අලුත
උපන් බිලිඳාගේ කටේ තැබුවාය. එහෙත් මිට මෙලවූ කුඩා
අතින් ගෝමරීගේ තන පුඩුව තල්ලු කර දරුවා අනෙක් ඇලයට
හැරුණේය. ඒ සමග යළි බෙරිහන් දෙන්නට වුණේය.

'අනේ පොඩිනා... උඹ ටිකක් පරක් කරපං මූව...'

බැරිම තැන ගෝමරී පොඩිනාට ආයාචනා කළාය.

'හ්ම්... අම්මල පුතාල කතා කරගනිල්ලකො මං මේකව
එළියට අරං යන්නං...'

පොඩිනා දරුවා වඩාගෙන එළියට ගියාය. ගෝමරී සුදු
බණ්ඩා සමග ඇතුළු ගෙයි අඩ අඳුර තුළ තනි වූවාය. අඩ අඳුර
යන්තම් දෙබෑ කරගෙන ඇඳ ඉහද්දර කැකුණ තෙල් පානෙන්
ගලා ආ කහ පාට එළියෙන් ගෝමරී සුදු බණ්ඩාගේ පළල් නළල්
තලය පහළින් තාරුකා මෙන් දිලෙන ඔහුගේ ඇස් යුගල සිහින් ස්පර්ශ
කළාය. ඒ සමග පිරුණු දෙකම්මුල් ඇඟිලි තුඩුවලින් හැබැහින්
ස්පර්ශ කරමින් මෙසේ කීවාය.

'මං ඉස්සර මගේ කොල්ලෙක්ට වගේ උඹට රෙදි ඇන්දුවද
කියලවත් මට හිතාගන්න බෑ... ඒ තරමට උඹ ලොකුයි...'

සුදු බණ්ඩා යන්තම් සිනාසුණේය. පහතට නැමී ආදරෙන්
ඇගේ හිස අත ගෑවේය. ඇ යළි මෙසේ කීවාය.

'කොහොමත් බඩින් නොවැදුවට මං උඹේ අම්මා...'

සුදු බණ්ඩා තවමත් නිශ්ශබ්දය. වයසට වඩා මහලු වූ ඇගේ
ශෝකී මුහුණ පැහැදිලි කළ නොහැකි හැඟීම් සමුදායක් ඔහුගේ
හිතේ සටහන් කළේය.

'සැක හියා ගන්ඩ ඕන නෑ... ඒ උඹේ දරුවා...'

මෙවර ඇ කෙරෙහි ඔද වැඩී ගිය ලෙංගතුකම ඔහුට දරාග
න්නට බැරි විය. ඔහු ඇ වෙත නැමී ඇගේ දෙතොල් සුමිඳ මිදී
ලෙස සිපගත්තේය.

The Reader's Place

ඇ ගෙල පහත හරවා ... ඔහු ඇඳ සිටි ලොකු හාමුදුරුවන්ගේ පරණ අඳනකඩය දෙස සිනාසී බැලුවාය.

'මං හිතුවේ උඹ මහණ වෙයි කියලා...'

'නෑ... මං මහණ වෙන්නේ නෑ...'

එවර ප්‍රථම වරට හෙතෙම ගෝමරීට පිළිතුරු දුන්නේය. ළ හාම ගෝමරී තවත් සිනාසී මෙසේ කීවාය.

'මොකෝ පොඩි හාන්දුරුවන්ට ළමයෙක් හිටිය කියලා මක් වෙනවද... බුදු හාමුදුරුවන්ටත් රාහුල කියල පුතෙක් හිටියේ...'

ඒ සිනාවෙන්ම ගෝමරී ඉහළට එසවී ඔහුව බදාගෙන තම පපුවට තුරුළු කරගත්තාය. ඇගේ සිරුරේ නිරුවත වැසුණු ලේ ඉහිණු රෙද්ද විසිවී ඇඳ පාමුලට වැටෙද්දී ඇය ඔහු සමඟ මීට ටික වේලාවකට කලින් විළිරුදාවෙන් දඟලූ ඇඳ මත වට දෙක තුනක් පෙරලෙමින් රාගයත් ප්‍රේමයත් මුසුවූ ළෙංගතු බවකින් ඔහුගේ මුහුණ සිපගත්තාය. නිරුවත් වුණු ඇගේ යටි බඩේ තැවරුණු තවමත් නොවේළුණු අමු ලේ ඔහුගේ අඳනකඩය පුරා තැවරිණි. අවසානයේ හොඳටම හති වැටී ඔහුව අත හැර පපුව හිර කරන හති හඬ අස්සෙන් මෙසේ කීවාය.

'...මේ මගේ අන්තිම දරුවා... ආයෙ මට මිනිහෙක් එක්ක බුදියගන්ඩ සත්තියක් නෑ... මට මහන්සියි. ඊටත් වැඩිය වයසයි දැන් මං හොඳටම...'

තවමත් තිස්වෙනි විය නොඉක්මවූ ඒ 'මහලු' කය දෙස ඔහු බලා සිටියේ කිව නොහැකි විස්සෝපයෙනි. ඒ විස්සෝපය තුළ වචන තුළට ගොනු කළ නොහැකි ආදරයක් සැඟවී දළුලමින් තිබිණි. සැබවින්ම ඇ ඔහුගේ මව යැයි එවේලේ ඔහුට සිතිණි.

ගෝමරී ඇගේ අලුත උපන් දරුවාට 'බිංදු' යැයි නම් තිබ්බාය.

බිංදු ඉපදුණේ පුංචි රාළ වල්ලී සමඟ හේනට ගොස් හය මාසයකට විතර පසුවය. ඒ හය මාසයට එකම එක වතාවක්වත් පුංචි රාළ ගෙදර පස් පෑගුවේ නැත. එහෙත් සේදරාත් ටිකිරිත්

සතියට සැරයක් දෙකක් පුංචි රාළත් වල්ලීත් බලන්න ගියහ. ඒ එන විට අතකට පිරෙන්න බව භෝග ගෙන ඒම කවර අවස්ථාවකවත් මඟ හැරුණේ නැත. කයින් ගැහැනියක් වුවත් සිතින් පිරිමියෙකු වූ වල්ලී හරි හරියට පුංචි රාළ සමඟ හේනේ වැඩ කළාය. ඉඩ පාඩු ඇති වේලාවට පුංචි රාළ සමඟ දඩයමේ ද ගියාය. පුංචි සංදියේ පුංචි රාළට 'අප්පුච්චා' යැයි ඇය වැහැරුවද පසුව එය ඇ කෙරෙන් මඟ හැරී ගියේය. ඒ වෙනුවට 'උඹ' කියන වචනය ඒ තැන ගත්තේය.

'උඹ කෑවද...?'

'මොකද උඹ කරන්නේ...?'

'උඹට මහන්සියි වගේ...

යනාදි විදිහට ඇගේ භාෂා ව්‍යවහාරය වෙනස් විය. වල්ලී යන විට පුංචි රාළ හේනේ පැල හදාගෙන හිටියේ ගහක් උඩය. එය තාවකාලික පැලක් පමණක් වූ අතර වල්ලීගේ සම්පූර්ණ මහන්සියේ ප්‍රතිඵලයක් ලෙස හේනේ කොනක බොහොම කල එළියක් ඇති ගෙයක් ඉදි කරන්න පුංචි රාළට හැකි විය. ඒ තිවසේ ආහක් වැඩ තිබුණත් ඇ දවසට හතර වතාවක්ම ඒ ගෙදර අස්පස් කළාය. පිරිසිදු කළාය. ඔහු මුව්වු අතනින් මෙතනට මෙතනින් අතනට සීරු මාරු කළාය.

සැබවින්ම ඇ ඇගේ සහෝදර සහෝදරියන්ට ආදරය කළාය. දවස් හතරකට විතර සැරයක් ඇගේ ගෙදර එන සේදරාත්, ටිකිරිත් උදේ පාන්දර පැමිණි පසු ආපසු තික්මෙන්නේ හොඳටම ඇඳිරි වැටුණු පසුවය. අයිය මලෝ දෙන්නාටම හොඳට බත බුලතින් සංග්‍රහ කර පිල් කඩ උඩට වී ඇති පදම් කැකිරි පළමින් ගමේ ඔපාදූප කතා කීමෙන් ඇය පුදුම ප්‍රීතියක් භුක්ති වින්දාය. ඉඳහිට පැමිණියත් ඇ ඇගේ සහෝදරියන් වූ මැණිකාටත් එතනාටත් සැබවින්ම ආදරය කළාය. සති දෙක තුනකට වතාවක් ගමට එන තම්බි මුදලාලිගෙන් පුංචි රාළ හුවමාරු කරගන්නා වෙවාරන්න අරුමෝසම් බඩුවලින් කොටහක් ඇ ඒ දෙදෙනාට වෙන් කළාය.

මේ සියලු දෙනා සමඟ ඇ කෙතරම් ළෙංගතු වුවද ඇගේ හිත කෝපයෙන් පරල කළ එක් තැනැත්තියක් වූවාය. ඒ ඇගේ

The Reader's Place

මව ගෝමරිය. තමා ගෝ... ඇති තමා සම...
එකට වසන පුංචි රාළ ගෝමරී සමඟ එක ගෙදර පවුල් කෑ බවත්
එහි ප්‍රතිඵලයක් ලෙස තමා ඉපදුණු බවත් කියන තිත්ත ඇත්ත
ඇයට වහ කදුරු විය. මීට මාස ගණනාවකට පෙර ඈ පුංචි රාළ
සමඟ ගෙදරින් පැමිණි අලුතම ඈ ඇගේ සිතින් ගෝමරී මැ...
දුම්මාය. කිසිම දවසක ඇගේ කිසිම සහෝදරයෙකුගෙන් ගෝමරී
ගැන නොවිමසුවාය.

ඈ ඇගේ සිතින් කෙතරම් දරුණු ලෙස ගෝමරී මැ...
දුමුවාදැයි කියතොත් ඇයට හීනෙන් මියගිය ගෝමරී පෙනුණේය,
තමාගේ මව වූ ගෝමරී මියගිය බවත්, තමාගේ සහෝදර
සහෝදරියන් සමඟ මහ ගෙදර සිටින ගෝමරී තමා නොහඳුනන
බවත්, සමහර විට ඇය ගෝමරීගේ අවතාරයක් විය හැකි බවත් ඈ
ගම්මුන් කීප දෙනෙකුටම පවසා තිබිණි. තමන්ගේ මේ ප්‍රකාශයේ
සත්‍යය ඈ තමන් විසින් කෙතරම් ඇදහුයේද යත් තමාට තමාගේ
මියගිය මව ගෝමරී ආරූඪ වන බව ඇය ඇගේ සහෝදරයන්
සමඟ ප්‍රකාශ කළාය. කිසිවෙකුට එය අසත්‍යයක් යැයි එක හෙළා
ප්‍රකාශ කළ හැකි වුවද කාලයාගේ ඇවෑමෙන් එය කළ නොහැකි
තැනට වැඩ සිද්ධ වුණේය. එනම් ඇය මියගියා යැයි ඈ තරයේ
විශ්වාස කළ තම මව ගෝමරීගේ ආරූඪයෙන් සාස්තර කියන්නත්
පේන කියන්නත් පටන් ගත්තාය.

මුලදී මුලදී මෙය මහා විහිළුවක් ලෙස ගම්මුන් සැලකුවත්
එක්තරා දිනක ගමේ ආරච්චිල තැනට සිද්ධ වූ සිද්ධියකින් සියල්ල
කණපිට පෙරළුනේය.

වයස අවුරුදු හැත්තෑවක් පමණ වූ ගමේ ආරච්චිලගේ මව
හදිසියේ මියගියාය. ලොකු අසනීපයක් නොතිබුණත් සෑහෙන ආයු
වළඳා තිබුණ බැවින් එය සාමාන්‍ය මරණයක් විය. මේ ගමේ ශ්‍රී
වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ට වග කියන ප්‍රධාන නිල දරුවා වූ
ආරච්චිලගේ වලව්වේ සිදුවූ මේ මරණය කාටත් වැදගත් ආරංචියක්
වුණේය. මරණය දවසේ පන්සලේ ලොකු හාමුදුරුවෝ පාංශකූලය
සඳහා වැඩමවා පිං පෙත් දී ඉටුවිය යුතු සියලු චාරිත්‍ර ඉටුකර
දේහය කැලේ වළ දමා සියල්ලෝ ගෙවල්වලට ගියහ.

මරණයකින් පසු දවස් හතක් ගෙදර පාළුවට නොඇරිය
යුතු බැවින් හවස් වෙගෙන එද්දී වැඩිහිටියෝ වෙස්සන්තරේ
කියවන්නත්, තරුණයෝ සුදු කෙළින්නත් ඉටාගෙන මළ ගෙදරට
සේන්දු වූහ. මේ අතර පැමිණෙන අයට සංග්‍රහ කරන්නට බුලත්
පුවක් මදි වූයෙන් ආරච්චිල සිය පුතා පොඩි නිලමේ පුංචි රාළගේ
හේනට පිටත් කළේය. ඇඳිරි වැටීගෙන එද්දී හෙතෙම පුංචි රාළගේ
හේනට ගියේය. පුංචි රාළ සමඟ හේනේ කෙළවරටම ගොස් බුලත්
පුවක් ඇති තරම් සරි කරගෙන ඔහුගේ ගෙදර මිදුල මැදින් ආපසු
එද්දී ඔවුන්ට වල්ලීගේ කටහඬ ඇසිණි.

'ඒයි ඉලන්දාරියා මෙහෙ වර....'

ආරච්චිලගේ පුතා පොඩි නිලමේ එක වරම ගැස්සුණේය.
අනික තමාගේ පියා ගමේ ප්‍රධානියා වී සිටිද්දී ඔහුගේ පුතා වන
මට මෙසේ කතා කරන්නට තරම් මේ ගෑනිට ශක්තියක් ආවේ
කොහෙන්දැයි ඔහුට හිතාගන්න බැරි විය. එහෙත් පුංචි රාළ එක
වරම ඔහුව අස්වැසුවේය.

'කලබල වෙන්ට එපා අද කෙම්මුර දවස... ඕකිට ඕකිගේ
අම්මා ගෝමරී වැහෙනවා හැම කෙම්මුර දවසෙම හෝරා කීපයක්
හවසට.... නිකං අපි යං ළඟට.... මොකද මූන්නැහෙට කතා
කරන්නේ කියල බලන්ඩ...'

පොඩි නිලමේ විමතියෙන් වුවත් අකැමැත්තෙන් පුංචි රාළ
සමඟ වල්ලී ළඟට ළං වුණේය.

'යකෝ බොලාගේ මහ එකී අද පොළොවේ වැළලුවා
නේද...?'

ආරච්චිලගේ පුතා විමතියෙන් 'ඔව්' යැයි කීවේය.

'... ඒකි මැරිල නෑ බොල... තොපි මොකටද පණ පිටින්
ගෑනියෙක් වළ දාල තියෙන්නේ.'

පුංචි රාළගේ ඇස් ගෙඩි උඩ ඉන්ද වුණේය. පොඩි නිලමේට
හදිසියේ මුත්‍රා බර හැදුණේය. එහෙත් ඒ අපහසුතාවය මැඩගෙන
ඔහු ඇගෙන් මෙලෙස ඇසුවේය.

'කොහොමද කියන්නේ අත්තම්මා මැරුණේ නැහැ කියලා...'

'යකෝ... ඒ ගෑනි හුස්ම ගන්නවා කියලා මයෙ ගෝමරී
අම්මා කියනවා....'

The Reader's Place

'තනිකරම බොරු... ඔක වෙන්ඩ බෑ....'

'මං මොකටද බොල බොරු කරන්නේ... තොගේ අත්තම්මා තොට හැබැහින් දකින්ට ඕන නම් ලොකු කරමලක් තියෙන කුකුළෙකුත් අරං තොගෙ අප්පට එන්න කියාපිය...'

විශ්වාසයත් අවිශ්වාසයත් අතර මොහොතක් ගත කළ තරුණයා අත පුරා කඩාගත් බුලත් පුවක් ටික එතනම අතහැර ගෙදර බලා දිව්වේය. වැඩි වේලාවක් යන්නට මත්තෙන් ඔහු තම පියා සහ තවත් මිනිසුන් තුන් හතර දෙනෙකු සමඟ පුංචි රාළගේ ගෙදරට දුවගෙන ආවේය.

ඇත්තටම ආරච්චිලට මේ ගැන කිසිම උනන්දුවක්වත්, උවමනාවක්වත් තිබුණේ නැත. එහෙත් තම පුතා කිහිප සැරයක්ම මේ ගැන බල කරද්දී ඔහු ඒ වදේට වල්ලී බැහැ දකින්න එකඟ විය. ඒත් ඒ කිසිම විශ්වාසයක් ඇතිව නම් නොවේ. වල්ලී ආවේගය පිටින්ම ඔවුන් රැගෙන ආ ඒ තඩි කුකුළාගේ බෙල්ල එක වරම කඩා බින්දාය. ඉක්බිතිව දෝරේ ගලාගෙන උගේ බෙල්ලෙන් බේරුණ ලේ පොල් කට්ටකට එකතු කළාය. පසුව මෙලෝ ව්‍යවහාරයේ නැති අමුතුම බාසාවකින් ඒ ලේ ගොටුව මැතිරුවාය. වියරුවෙන් මෙන් ටික වේලාවක් ඔළුව සොලවා සොලවා මතුරා අවසානයේ ඒ ලේ ගොටුව ආරච්චිලගේ අතට දුන්නාය.

'පල... ඉක්මනට ගිහිං ඒ මහ ඇත්තිගේ මිනී වළ හාරපං... හාරල මිනිය උඩට ගනිං.... ඊට පස්සේ මේ ලේ ගොටුව ඒ ඇත්තිගෙ කටට හලපං.... පසුව ටිකක් තද කරලා හුස්ම වැටෙනවද බලපං...'

සියල්ලෝ මුහුණට මුහුණ බලාගත්හ. මියගිය තැනැත්තිය කොහොමටත් මියගොස් ඇති බැවින්, මේ නාඩගම කළා කියා නැති වන්නට දෙයක් නැති බැවින් අවසානයේ ඔවුහු ලේ ගොටුවත් රැගෙන මිනී වළ ළඟට ගියහ. වල්ලී ආවේගයෙන් කියපු විදිහට සියල්ල ඒ විදිහටම කළහ. ලේ ගොටුවේ ලේ වඩී දෙක පෙවෙද්දී මියගිය ආරච්චිලගේ මව කට දෙකොනින් කුකුළ ලේ පෙරාගෙන හොඳටම කහිමින් මිනී වළෙන් නැඟිට කෙළින් හිටගත්තාය.

මේ සිද්ධියෙන් පසු වල්ලී ගමේ සුවිශේෂ චරිතයක් වූවාය. වචනයෙන් විස්තර කළ නොහැකි බය පක්ෂපාතකමක් ගම්මුන්ගෙන් ඇයට පළ වුණේය. ඇ ඇගේ නිවසේ වෙනම කාමරයක් දේවාලයක් මෙන් වෙන් කළාය. සතියේ කෙම්මුර දවස් දෙකේ හවස් වරුවේ සිට මධ්‍යම රාත්‍රිය තෙක් පේන, නිමිති, සාස්තර, අහන්ට රුචි වූ ගැමියන්ගෙන් ඇගේ නිවස පිරී ගියේය.

වල්ලී මෙලෙස මියගිය ගෝමරීගෙන් පේන කියද්දී දරාගන්ට බැරි ලොකුම දුක්ඛ දෝමනස්සය සිද්ධ වුණේ පණ පිටින් සිටි ගෝමරීටය. ගම්මු ඇය දිහා බැලුවේ අවතාරයක් ගාණටය. හැන්දෑ වරුවේ ඇ වැවෙන් නාගෙන ගෙදර එන වේලාවේ ඇය දුටු ගමේ කීප දෙනෙක්ම සිහි මූර්ජා වී තිබුණෝය. ඉර මුදුන් වන වේලාවෙත් ඉර ගල වැටෙන හැන්දෑ වේලාවෙත් ඇගේ නිවස අද්දරින් කිසිවකු යන්ට බිය විය. ඒ සමයං දෙවේලාවේ නොවුණත් ඇ මහමඟ දුටු කවුරුන්වත් ඇ සමඟ මූණට මූණ මූණ ගැසී කතා කළේ නැත.

ගමේ හැමෝම පිට පාරෙන් තමා මඟ හැර යන බව ගෝමරී තේරුම ගත්තාය. කිසිවකු තමන් සමඟ මූණට මුලිච්චි වන්ට කැමති නැති බව ඇය තේරුම් ගත්තාය. ඒ නිසා ඇය ඇගේම හුදෙකලා ලෝකයක තනි වූවාය. තමාට තමාවම දැනෙන නොදැනෙන තරමට අවතාරයක්ම වූවාය.

මේ අතර ගෝමරීලෑ ගෙදර තවත් විපර්යාස කීපයක්ම සිදු විය.

පන්සලේ ඇබිත්ත කොලුවා හෙවත් සුදු බණ්ඩාට දාව ගෝමරීගේ කුස තුළ පිළිසිඳගත් බිංදු වෙනුවෙන් ගෝමරීට කිරි එරුණේ නැත. එහෙත් පුදුමය වුණේ විත්තඹුකම් කළ පොඩිනාට ගෝමරී වෙනුවට බිංදු වෙනුවෙන් කිරි එරීමය. ඉපදෙන විටත් අත් දෙකෙන් උස්සාගන්න බැරි බරින් යුතු මේ පෝරිසාදයාට දවසට තන කිරි නැළි හත අටක්ම උවමනා විය. එහෙත් කිසිම අඩුවක් පාඩුවක් නැතුව පොඩිනාගේ තන බුරුලුවල බිංදු වෙනුවෙන් කිරි එරුණේය.

The Reader's Place

ගෝමරී බිංදූ බිහි කළා හැර ඔහුව අතපත ගෑමටවත් බිංදූ ඇයට ඉඩ හලේ නැත. කිසියම් මොහොතක පොඩිනා නැතිව බිංදූ හා ගෝමරී තනිවී නම් දරුවා කළේ මහ හඬින් බෙරිහන් දෙන එකය. මෙසේ තුන් දවසක් බෙරිහන් දීමේ ප්‍රතිඵලයක් ලෙස ගෙදර ඉදිරිපස පිල ළඟ බිත්තිය දෙදරා කඩා වැටුණේය. තවත් දවසක උයන ගෙයි දුම් මැස්ස හැළි වළං සමඟම කඩා වැටුණේය. මේ සිද්ධි දෙකෙන් ඉක්බිතිව ගෝමරී දරුවා බලාගැනීමේ සම්පූර්ණ වගකීම පොඩිනාට පැවරුවාය.

පොඩිනාගේ තඩි පියයුරු අතර තෙරපී කිරි උරන එක තරම් මෙලෝ සැපතක් බිංදූට තිබුණේ නැත. තන බුරුලු දෝතින්ම බදාගෙන ඇගේ පුෂ්ටිමත් ඇඟට කිටි කිටියේ හිරවී කකුල් කෙටි දෙකෙන් ඇගේ යටි බඩ හරියත් කලවා දෙපසත් දූනෙන නොදූනෙන ගාණට කිතිකවමින් මේ පෝරිසාදයා කිරි බොන විට මෙතෙක් ජීවිතයේ නොලද පරමානන්දය මේ යැයි හැඟීමක් පොඩිනාට ඇති විය. දරුවා සෙල්ලං කළේත් පොඩිනා එක්ක විතරය. ඇගේ මුළු ඇඟම ඔහුට සෙල්ලං පිට්ටනියක් විය. මහ රාත්තිරියේ පොඩිනා උඩුබැලි අතට නිදියන විට බිංදූ නිදා ගත්තේ ඇගේ බඩ උඩ පියයුරු අතරය. නැතිනම් ඇගේ කලවා අතර උණුසුම සොයමින්ය. දූඩි සීතල තිබුණු දවසක අහම්බෙන් පොඩිනා මුනින්තලා වී නිදාගත්තාය. එදා දරුවා නිදාගෙන තිබුණේ ඇගේ වටකුරු නිතඹ උඩය.

බිංදූට මාස දෙක පිරෙන විට ඇවිදින්න පටන් ගත්තේය. හොඳට කතා කරන්න පටන් ගත්තේය. කිසිම දවසක අම්මා අප්පුච්චා කියන වචන මේ දරුවා පාවිච්චි කළේ නැත. ඒ දෙකම වෙනුවට භාවිතා කළේ 'පොඩිනා' කියන එක විතරය. බිංදූට 'අයියලා, අක්කලා' හිටියේ නැත. ඒ වෙනුවට සේදරා, ටිකිරි, රනා, මැණිකා, පුංචා, එතනා කියන නම්වලින් ඔහු ඔවුන්ව ඇමතුවේය.

බිංදූ කිරි බොන විදිහට ගෙදර හැමෝම හිතුවේ පොඩිනාට මාසයකට හමාරකට වඩා මෙය කරන්ට බැරි බවය. මාස දෙක යන විට පොඩිනා ඇට කටු ගොඩක් වේ යැයි කවුරුත් අනාවැකි පළ කළහ. එහෙත් පොඩිනාගේ තන බුරුල්ලෙන් බිංදූ කිරි උරා බොන්ට බොන්ට පොඩිනා තව තවත් පුෂ්ටිමත් වුණාය. ඇය කිරි එරෙන්ට කියා අනුභව කළ අමුතු ආහාරයක් නැත. එහෙත් අවුරුදු හතළිස් ගණනක් තිස්සේ බිංදූ වෙනුවෙන් සිය මුළු සිරුර පුරාම එක් රැස් කළ රුධිරය ඇය කිරට හරවා ඔහුට පෙව්වාය.

බිංදූ ඇගේ කිරි උරා බොන තරමට ඇය කිරි බරින් වැඩුණාය. කිරි පැහැයෙන් බැබළුණාය. හිටියට වඩා ලස්සන වෙන්ඩ ගත්තාය. කිරි බරින් පියයුරු පහළට කඩා වැටෙනවා වෙනුවට අවුරුදු දහඅටේ නෑම්බියකගේ තරමට තන පුඩු ඉහළට ඉල්පුණේය. වටකුරු නිතඹ තව තවත් ආරමින් හැඩ වැඩ වුණේය. පළල් තොල් තාරුණ්‍යයේ කාමුක බවකින් ලෙලදෙන්ට ගත්තේය.

සැබවින්ම බිංදූ ඇගේ කිරි උරා බොන වේගයේ තරමට ඈ මැදිවියේ සිට තාරුණ්‍යයට ළඟා වෙමින් සිටියාය.

කුඩා බිංදූගේ ශරීරය වැඩුණේ අසාමාන්‍ය වේගයකිනි. ඒ වේගයට වඩා දෙගුණයක වේගයකින් ඔහුගේ පුරුෂ නිමිත්ත වැඩුණේය. සිය ගණනක් දරුවන්ගේ පුරුෂ නිමිති අතගා ස්පර්ශ කර ඇති පොඩිනා මේ තරම් කුඩා දරුවකුගේ මේ තරම් අසාමාන්‍ය පුරුෂ නිමිත්තක් දැක තිබුණේ නැත. දවසක් පවුලේ බාලම දුරිවිය වන එතනා අහම්බයෙන් බිංදූගේ නිරුවත දැක බියවී සිහි මූර්ඡා වූවාය. ඇයව පියවි සිහියට ගන්නට ඇය දුටුවේ සිහිනයක් බවත්, සිහිනෙන් නපුරු විසකරු සතෙකු දැක ඇති බවත්, ඇයට ඒත්තු ගන්වන්නට පොඩිනාට බොහෝ මහන්සි වන්නට සිදු විය. එතනා අවසානයේ පොඩිනාගේ කීමට එය සිහිනයක් බව විශ්වාස කළත් යළි කිසිම දවසක බිංදූ අසලට කිට්ටු නොවුණාය.

මේ සිද්ධියෙන් පසු බිංදූට අවුරුද්ද පිරෙන්න කිට්ටු වන විට ඔහුට ඔහුගේ පිරිමියා වැහෙන්න රෙදි පොට්ටනියක්ම අන්දවන්න පොඩිනාට සිදුවිය.

වල්ලි ගෝමරීගේ ආරූඪයෙන් පේන කියන්න පටන් ගන්නා විට බිංදූගේ වයස අවුරුදු එකහමාර පිරුණා විතරය. වල්ලිගේ ආරූඪය නිසා ගෝමරී මළ බවත්, මේ හැබැහින් සැරිසරන්නේ ගෝමරීගේ අවතාරය බවත් විශ්වාස කළ ගම්මුන්ගේ ඕපාදූප

The Reader's Place

වලින් ගෝමරීගේ දරුවන් කලබලයට පත් නොවුණාමත් නො
දවසක් කැකුණ තෙල් පහනේ ආලෝකයට මුවා වූ ගෝමරී
හෙවණැල්ල දැක ටිකිරි කෑ ගැසුවේය. තවත් දවසක කට්ට කළු
අමාවක රැක ගෝමරී පිළිකන්නේ හිප්ප තියාගෙන හිඳ සිටින
දැක සේදරා මරළතෝනි දුන්නේය. තවත් දවසක මහ දවල් ගෝම
මිදුලේ කොහොඹ ගහ යට හැල හොල්මනක් නැතිව හිටගෙන
ඉන්නවා දැක පුංචා සිහි මූර්ජා වුණේය.

අවුරුදු නවයක් පමණ වයසැති වූ පුංචා සිය අක්කලා
නංගිලා සමඟ හැංගි මුත්තං සෙල්ලම් කරමින් සිටියදී හැංගෙන්න
තීරණය කළේ ලොකු කොහොඹ ගහේ බෙනය තුළය. එතැනට
හැංගෙන්න ගිය විට පුංචා දුටුවේ කිසිම හැල හොල්මනක් නැතිව
උසට උසේ කොහොඹ ගහ යට හිටගෙන හිටි සිය මවය. දුර
ඈත අරමුණක් වෙත, බාග විට මේ භවයෙනුත් ඈත අරමුණක්
වෙත දිගා වී තිබුණ ගෝමරීගේ ලේ කඳුළක් නැති එහෙත් ගිනියම්
රතු පාට දෑස් දුටු පුංචා වචනයකුදු නොදොඩා සිහිසුන්ව බිම
වැටුණේය.

ඊට හෝරාවකට විතර පසු ටිකිරි සිය මලයා කොහොඹ
ගහ යටින් සොයාගන්නා විට පුංචා ඒ බිම වැටුණු ඉරියව්වෙන්
බියවුණු ඇස් ඇරගෙනම සිටියේය. ඊට බඹ දෙක තුනක් ඔබ්බෙන්
ගෝමරී මේ ගැන කිසිම හැල හොල්මනක් නැතිව අර දුර ඈත
බලාගෙන සිටි බැල්මෙන්ම හිටගෙන හිටියාය. එහෙත් ඈ සිය
පය පාමුල බිම වැටී සිටි පුංචා නොදුටුවාය. ටිකිරි සිය මලයා
දැක මහ හඬින් කෑ ගැසූ විටය, ගෝමරී සිය ආරම්මණයෙන් මිදී
අවට බලන්නට වූයේ. ඈ පියවි සිහියට එන විට ටිකිරි, පුංචා කර
පින්නාගෙන ගෙයි පිලට ගෙන යමින් සිටියේය.

ගෙයි පිල උඩ පුරා දවස් හතක්ම පුංචා සිහි මූර්ජා වූ
ඉරියව්වෙන් සිටියේය. ඒ දවස් හතම ඔහු හිටියේ අර කොහොඹ
ගහ යටදී සොයාගන්නා විට සිටි පරිදි බිය වූ ඇස් ඇරගෙනය.
ගෙදර සියල්ලෝම ඔහු පියවි සිහියට ගන්ට අනේක විධ දේවල්
කළහ. මුහුණට වතුර ඉස්සහ. යකඩ පතුරකින් පූට්ටු දත කට
අරින්ට උත්සාහ කළහ. හිසට හිස කුඩිච්චි දැම්මාහ. මුනින් අතට

පෙරළා තට්ටමට තරමක් වැරෙන් ගැසූහ. වෙද රාළගෙන් බෙහෙත්
වතුරක් ගෙනවිත් නාභියට වත් කර බැලූහ. කට්ටඩි රාළගෙන් කහ
නූල් මතුරා අතේ කරේ බැන්දාහ. ඒත් මේ එකකින්වත් පුංචා පියවි
සිහියට පැමිණියේ නැත. ඔහු අර බිය වූ ඇස් ඇරගෙනම සිටියේය.

එහෙත් ඔහුගේ පපුවට කන තියා හොඳට බැලූ විට
ඔහුගේ හෘදය වස්තුව නිරෝගීව ජව සම්පන්නව වැඩ කරන
හැටි ඇහුණේය. තුන් වන දවස වන විට ඔහුගේ හෘදය වස්තුව
කෙතරම් නිරෝගීව ක්‍රියාත්මක වීද යත් පපුවට කන නොතියා
ඔහු ළඟ හිටගත හිටි විට පවා පපුවේ 'ඩිග් ඩිග්' හඬ ඇසුණේය.

අට වන දවසේ සේදරා තීරණයක් ගත්තේය. එදා කෙම්මුර
දවසක් වූ බැවින් හැන්දෑවේ කළුවර වැටීගෙන එන විට, ලී දඬු
එකට ගටා පදම් කළ රිටි ගසේ පොත්තෙන් සවි ඇතිව සකස්
කළ ලී මැස්සක පුංචා බාවා ටිකිරිත් සමඟ දෙපැත්තෙන් කර
තියාගෙන ඔහු වල්ලී ළඟට රැගෙන ගියේය.

ලී මැස්ස මත බාවා සිටි පුංචා දුටු වහාම ආවේශයෙන් සිටි
වල්ලී වගක් නිච්චියක් නැතිව සේදරාට බැණගෙන බැණගෙන
ගියාය.

'මෙච්චර හරියක් වෙනකම් තොපිට පිස්සුද බොල අවතාර
ගේ ඇතුළේ දාගෙන ඇහ කන පියාගෙන ඉන්ඩ... මේක දේව
කෝපයක්... තොපි සේරගෙම පව් මේ අසරණයා පිටින් ගිහිං...
දෙයියෝ සන්සුන් වෙනකං මට මුකුත් කරන්න බෑ. ඒ හින්ද මූ
මේ විදිහටම ඉඳියි... මූ ඇස් අරියිද නැද්ද, ඒ කොයි කාලයක්ද
කියල මට කියන්ඩ බෑ... හැබැයි ඔක්කොටම කලින් අවතාර
ගෙයින් දොට්ට දාල හිටපිය...'

වල්ලී කළේ පුංචාගේ ඇරුණු ඇස් ආවේශයෙන්ම බිමට
නැමී වැසූ එක විතරය. ගිය විදිහටම ලී මැස්ස මත පුංචා
ඔසවාගෙන ටිකිරිත් සේදරාත් ගෙදර පැමිණියහ.

එක දිගට අතොරක් නැතිව පුංචාගේ පපුවේ ඩිග් ඩිග් හඬ
ඇසෙද්දී සේදරා එදා රාත්‍රිය නොනිදාම පහන් කළේය. පාන්දර ඉර
පායාගෙන එන විට ඔහු තීරණයකට එළඹ සිටියේය. වේලාසනින්ම
ටිකිරිත් රතාත් සමඟ ගෙදරින් පිටත් වුණු සේදරා මැණිකාටත්

The Reader's Place

එතනාටත් තමුන් එනකං ගෙදර බලාගන්ට අණ කර කැළයට වැදුණේය. මහ දවල් වන විට ලී දඬු, ඉනි, වැල්, වරපට කැළෙන් කපාගෙන ආ ඔවුහු ගමේ තවත් කීප දෙනෙකු හවුල් කරගෙන සිය ගෙදරට ටිකක් එහායින් තවත් ගෙවල් දෙකක් හදන්ඩ පටන් ගත්හ. එක දිගට එක මහන්සියෙන් දිවා රෑ නොබලා වැඩ කළ ඔවුහු දහ දවසක් යන විට තම ගෙදරට කිට්ටුව තවත් ගෙවල් දෙකක් සාදා නිම කළහ.

පසුව උදව්වට පැමිණි ගමේ මිනිසුන් ආපසු පිටත් කර එකොළොස්වනදා රාත්‍රියේ පවුලේ සියල්ලන්ම එකට රැස් කර ඔවුන් අමතා සේදරා මෙසේ කතා කළේය.

'බොලා ඔක්කොම දන්නව මට මේ තීරණේ ගන්ඩ සිද්ධ වුණේ ඇයි කියලා... හෙට ඉඳන් අපේ අම්ම මේ අලුත හදපු ගෙවල් දෙකෙන් එකකට යනවා. අනිකට පොඩිනාත් බිංදූත් යනවා... මේ ගෙදර අපි ඉන්නවා... උඹලා ඔක්කොම තේරුම් ගන්ඩ ඕන... කවුරු මොනවා කිව්වත් අපි ඔක්කොම එළියට ආවේ අපේ අම්මගේ බඩවැල කඩාගෙන... මොනවා වුණත් ඒ මගේ අම්මා... බොලාගෙත් අම්මා... ඒ වුණත් මට මේ තීරණේ ගන්ඩ සිද්ධ වෙනවා...'

එක් වරම උගුරේ යමක් සිරවූ කලෙක මෙන් සේදරා කහින්න ගත්තේය. ඒ සමඟ ඇස් දෙකට උනා ආ කඳුළු බිඳු කීපයක් දකුණතින් පිස දමා නාසයේ හොට්ටු හූරා අහක බලාගත්තේය. සියලු දෙනාම ඔහු දෙස අවධානයෙන් සිටිද්දී ඔහු සැබවින්ම අහක බලා සිටියේය. ඒ සමඟ දැඩි නිහඬතාවයක් ඇති විය. ඒ නිහඬතාවය අතරින් මේ රැස්වීම ගැන වගක් නිච්චියක්වත් නැති පුංචාගේ හදවතේ ඩිග් ඩිග් හඬ කන් පසාරු කරමින් ඇසුණේය. ඔහු තවමත් පෙර පරිදිම ලී මැස්ස උඩ වැතිරී සිටියේය. මේ අස්වාභාවික සහ වේදනාත්මක නිහඬතාවය එක් වරම පලුදු කර දමන ලද්දේ දූන් අවුරුදු අටක් පමණ වයසැති වූ මැණිකා විසිනි.

'අම්ම තනියෙම යන්නේ නෑ... මං අම්මත් එක්ක අලුත් ගෙදරට යනවා....'

ගෝමරී සිටියේ ඉතා පැහැදිලි සිහියෙනි. කවුරු මොනවා කිවත් සිද්ධ වූ සියල්ල හේතුඵල සහිතව ඈ තේරුම් ගෙන සිටියාය. මේ සියල්ලේ නිමිත්ත තමා බව ඈ හඳුනාගෙන සිටියාය. එය එසේ වූයේ කෙසේද යන්නට ඇයට පිළිතුරු නොතිබුණේය. කෙසේ වුවත් ඈ අවසානයේ තම දයාබර දරුවන් අමතා මෙසේ කීවාය.

'උඹල මං ගැන වද වෙන්ඩ උවමනා නෑ. උඹලා කිසිම කෙනෙකුට වදයක් වෙන්ඩත් මං කැමති නෑ..... මැණිකා කැමති නං මා ළඟ හිටියාවේ... හැබැයි පුංචා මං ළඟ තියාගන්ඩ උඹලා මට අවසර දෙන්ඩ ඕන...'

කිසිවකු ඊට එරෙහි වූයේ නැත. ඒ අනුව ඊට දවස් දෙකකට පසුව කොහොඹ ගහ ළඟ වත්ත පල්ලමේ ගෙදරට ගෝමරීත්, මැණිකාත් කවදා කොහොම මේ සිහි මූර්ඡාවෙන් අවදි වේ දැයි කාටවත් හරි වැටහීමක් නැති පුංචා ලී මැස්ස මත තබාගෙන රැගෙන ගියහ.

තවමත් පොඩිනාගේ කිරි බුරුල්ල අත් නොහැර සිටි අවුරුදු හත අටක විතර වැඩුණු සිරුරක් තිබුණත් යන්තම් අවුරුදු දෙක ඉක්මවූ බිංදූ පොඩිනාත් සමඟ අනෙක් නිවසේ පදිංචියට ගියේය.

ඒ සමඟ අවුරුදු ගාණක අනේක විධ සිද්ධි සමුදායන් සමඟ දුක සතුට පිරිපත දරාගෙන සිටි පරණ නිවහනේ සේදරාත්, විකිරිත් රතා සහ එතනාත් තනි වූහ.

The Reader's Place

The Reader's Place

04

තමාට දාව ගෝමරී බිහි කළ දරුවා බලන්න ගිය දවසේ සිට පුරා මාසයක්ම සුදු බණ්ඩාට හෙවත් ඇබිත්ත කොලුවාට හරි හමන් විදිහට නින්ද ගියේ නැත. ඒ සමඟ තම සිත තුළ පිළිසිඳ ගත් හැඟීම ප්‍රීතියක්ද, ශෝකයක්ද කියා වෙන් කරගැනීම ඔහුට අසීරු විය.

එහෙත් ඒ සිද්ධියෙන් එක් සිතිවිල්ලක් ඔහු තුළ සහසුද්දෙන්ම තහවුරු විය. විටෙක තමාට කුඩම්මා වූත්, විටෙක තමාට අම්මා වූත්, තවත් විටෙක සරාගී ගැහැනියක වූත් ගෝමරී තමාගේ පුරුෂ ධාතු තුළින් මේ දරුවා බිහි කළ විට සැබැවින්ම ඈ තමාගේ අම්මා විය යුතු යැයි ඔහුට සිතිණි. ඒ තරම් දාරක ස්නේහයෙන් කැකෑරෙන මාතෘ ප්‍රේමයක් එදා ඒ කළුවර තිඹිරි ගෙදරදී ගෝමරී දුටු විට ඔහුට ඇති විය. එදා ඈ කෙරෙන් තික්ම ආපසු පැමිණ කල් ගතවත්ම ඒ හැඟීම තවත් දළුලා ඔහු තුළ වැඩිණ. තවත් කල් යත්ම තමාද තම දරුවා මෙන්ම ඇගේ කුස තුළින් ඊට පෙර දවසක ඒ තිඹිරි ගෙදරදීම උත්පත්තිය ලබන්නට ඇතැයි ඔහුට සිතුණේය. පුදුමයකට මෙන් ඒ සිතිවිල්ල ඔහුට පුදුම ආස්වාදයක් ගෙන ආවේය.

කෙසේ වෙතත් මේ සියලු සිතිවිලි අතරින් විශ්වාස කළ යුතු වූත්, පැහැදිලි යථාර්ථමය වූත් සත්‍යය වූයේ වයස අවුරුදු පහළොව වන විට සුදු බණ්ඩා පියෙකු බවට පත්වීමය.

The Reader's Place

සත්‍යය ... දව ඔහුගෙන් හාරා අවුස්සා දැන විමසාගන්න බියවිය. ඒ නිසාම බිංදු ඔහුගේ පුතාද, නැතිද කියන කාරණය කිසිම විටෙකවත් ගමේ ඇත්තන්ට මාතෘකාවක් නොවීය. ගැමියන් සමඟ අවශ්‍ය වෙලාවට අවශ්‍ය දේ කතා කළා මිස කොහොමටත් ඔහු නුවුවමනා ලෙස ඔවුන් සමඟ වචනයක්වත් නාස්ති නොකළේය. එහෙත් ලොකු හාමුදුරුවන්ගෙ න් ගමට සිදු විය යුතු සියලු කළමනා කළමණාකරණය කරනු ලද්දේ ඔහුය. කොහොමටත් ගැමියන්ට ලොකු හාමුදුරුවන් සමඟ වැඩි පයුරුපාසානයක් නොවීය. උන්වහන්සේගේ සමවත් සුවයට බාධා කරන්ට කාටවත් කැමැත්තකුදු නොවීය. එහෙයින් පන්සල මැදි විය යුතු ගමේ සියලු කළමනා ගම්මුන් දැනුම් දුන්නේ ඇබිත්ත කොලුවාටය. ලොකු හාමුදුරුවන් තරමට නොවුණත් ඒ කිට්ටුවට වන බයපස්සපාතකමක් ගම්මුන් තුළ ඇබිත්ත කොලුවා පිළිබඳව විය.

හැබැයි මේ බයපස්සපාතකම සුදු බණ්ඩා පන්සලට පැමිණි දා පටන් ඒ විදිහටම තිබුණා යැයි කීවොත් බොරුය. පුංචි රාළ සුදු බණ්ඩා කන් කෙටියෙන් අල්ලා බොරලු පාර දිගේ ඇදගෙන ඇවිත් පන්සලට පංගනාතු කළ මුල් දවස්වල ගැමියන් ඔහුට කතා කළේ 'කොලුවා' කියාය. එහෙත් සංසාරේ පතාගෙන ආ විදිහට පන්සලට තින්දු වූ මේ කොලුවාට කොලුවා යැයි අමතන විට කිසියම් පුංචි ගෞරව සම්ප්‍රයුක්ත බවක් ගම්මුන්ගේ ස්වරය තුළ තිබිණි.

'මේ කොලුවෝ... හාන්දුරුවන්ට මතක් කරනවද හෙට අපේ ගෙදර දානෙ විත්තිය...'

'අනේ කොලුවෝ අපේ කිරි අම්මා නැති වුණා... හෙට මිනිය අහක් කරනවා... හාන්දුරුවන්ට කියන්ඩ හෙට හවස පාන්සකුලෙට වඩින්න කියලා...'

'අපේ ගෑනි බර හැල්ලු කරන්ඩ කලින් වරු පිරිතක් කියන එක හොඳා කියලා හිතුවා. පුළුවන්නං කොලුවෝ හාන්දුරුවන්ට මතක් කරනවද හෙට උදේ ගෙදරට වඩින්න...'

මේ විදිහට ඇබිත්ත කොලුවා පන්සලට පැමිණි දා සිට ලොකු හාමුදුරුවනුත් ගම්වැසියනුත් අතර අතරමැදියා වුණේය. ගෝමරී දරුවා බිහි කළ පසු ඒ ගැන මේ කොලුවාගෙන් විමසන්ට පවා ගම්මුන් අදිමදි කළේ ඒ තරම් බාල වයසක අප්පුච්චෙකු වූ කොලුවෙකු ගැන ගම්මුන් ඊට කලින් අසා නොතිබූ නිසාය. ගමේ ගොඩේ කඩේ පිලේ ඒ ගැන ඕපාදූප කොපමණ හුවමාරු වුණත් පන්සල් මායිමෙන් ඇතුළට ඒවා අරගෙන ගියේ නැත. ඒ වගේම ගෝමරීට තිබුණු අමනුස්ස බය නිසා ගෝමරීලෑ ගෙවල් මායිමෙන් ඇතුළට මේ ඕපාදූප දුවගෙන ගියෙත් නැත.

ඇබිත්ත කොලුවා පිළිබඳ ගම්මුන් තුළ තිබූ මේ පුංචි ගෞරවය තරමක් ලොකු මහත් වූ එක්තරා සිද්ධියක් ඒ අතර සිද්ධ වුණේය.

වල්ලී ගෝමරීගේ ආවේශයෙන් පරල වී ගමේ ආරච්චිලගේ මව මිනී වළෙන් ගොඩ ගැනීමේ ආශ්චර්යය නිමිත්තෙන් හැන්දෑ ජාමයේ සිට එළිවෙන ජාමය වන තෙක් සර්ව රාත්‍රික පරිත්‍රාණ සජ්ජායනාවක් කරන්ට ආරච්චිලට උවමනා විය. ලොකු හාමුදුරුවන් සමඟ ඒ ගැන කතිකා කරගැනීමෙන් ඉක්බිතිව පුර පසළොස්වක පොහෝ දවසක් ඒ සඳහා යොදා ගැනිණි. ලොකු හාමුදුරුවන්ට තනිපංගලේ රෑය පහන් වන තුරු මේ රාජකාරිය කළ නොහැකි නිසා ගමේ ගිහි පිරිත් සඳහා දක්ෂ හය හත් දෙනෙකුගෙ න් සමන්විත වැඩිහිටි පිරිසක්ද ඒ සඳහා සූදානම් වූහ.

පිරිසේ නඩේ ගුරා වූ කිරිහාමි උපාසක රාළ සැබවින්ම දක්ෂයෙක් විය. උප්පත්තියෙන්ම කකුලේ කොරයක් සහිත වූ බැවින් ඇවිදින විට ස්වාභාවිකවම දණ හිස පොළොවට බර කර ඇවිදින හෙතෙම පිරිත් සජ්ජායනාවේදී කළ වචන උච්චාරණය කාගේත් අවධානය දිනාගත්තක් විය. ලොකු හාමුදුරුවන්ට පසුව ඔහු තරම් පාළි වචන සකසුරුවමට උච්චාරණය කළ අයෙක් අහල ගම් හතකවත් නොවීය. ඒ නිසා කිරිහාමි උපාසක රාළ ප්‍රමුඛ මේ නඩයට ගිහි පිරිත් සඳහා ලොකු ඉල්ලුමක් තිබිණි. අවුරුදු ගණනාවකට පසු ගමේ කෙරෙන මේ පිංකම දැක බලා

The Reader's Place

...න්ට ගම්මුන්ගේ උනන්දුව දෙගුණ තෙගුණ වී තිබුණේ ... තවගේ දක්ෂතා තමන්ගේ දරුවන්ට පෙන්නන්ඩ මේක ... අවස්ථාවක් වූ නිසාය.

ගමේ ප්‍රධානියාගේම උවමනාවට කෙරෙන්නක් වූ ... ගොක් කොළවලින් හැඩ කළ පිරිත් මණ්ඩපයක් තනවා ... කළමනා ලක ලෑස්ති කර නියමිත දවසේ හවස් ජාමය වන ... ගමේ ගම්මු සියල්ලෝම පන්සලට එක් රැස් වී සිටියහ. ලොකු හාමුදුරුවෝ සියල්ලන්ම පංච ශීලයේ පිහිටුවා ගිහි පිරිත් කියන්න පැමිණි වැඩිහිටියන් මුලන්විට කා රාජකාරියට සූදානම් වෙන ... අවසාන වශයෙන් පිරිස අමතා මෙසේ වදාළහ.

'අද මේ හැමෝටම විශේෂ දවසක්... හුඟ කාලෙකට පස්සේ මහ රෑ එළිවෙනකම්ම පිරිත් අහන්ඩ මේ ඇත්තෝ මේ එක් රැස් වෙලා ඉන්නේ. ඒ නිසා මේ ඇත්තන්ට තවත් විශේෂ දෙයක් අද මං කියන්ට කල්පනා කළා. වෙනද මහ පිරිත පටන් ගත්තේ මම... ඒත් අද මං ඒ සම්ප්‍රදාය වෙනස් කරනවා. තමුන්නෙහෙලා හිතයි අද මහ පිරිත කියන්නේ අපේ වැඩිහිටි ගිහි ඇත්තෝද කියලා... නෑ... බාග වෙලාවට අද උන්නැහෙලට මේ පිරිතට මැදිහත් වෙන්ඩ උවමනා වෙන එකකුත් නෑ... අද පිරිත් සජ්ජායනය කරන්නේ තමුන්නැහෙල කවුරුත් දන්නා ඇබිත්ත ළමයා තනිවම... මේ පන්සලට ඇවිත් අවුරුදු තුනක් කිට්ටු වුණාට අවුරුද්ද හමාර යන කොට මං කියවපු සියලු පුස්කොළ පොත් මේ ළමයා වනපොත් කරල ඉවරයි... අද තමුන්නාන්සේලාට මේ ළමයගෙ වග විත්ති දැන ගන්ට හැකි වේවි...'

ලොකු හාමුදුරුවෝ එසේ වදාරා හුන් තැනින් නැඟිට ඉවතට ගියහ. ඉක්බිතිව ගිහි පිරිත් කියන්න පැමිණි නඩය එකිනෙකාගේ මුහුණු බලාගෙන විශ්මයට පත් වෙද්දී ඇබිත්ත කොලුවා සුපුරුදු පරිදි හාමුදුරුවන්ගේ පරණ අඳනකඩයට උඩින් සුදු පිරුවට හැඳගෙන ආසනයේ හිඳ ගත්තේය.

ඒ රාත්‍රියේ පුන් සඳ මෝදු වෙද්දී ඔහු මහ පිරිත පටන් ගත්තේය. පසුව එකින් එක පිරිත් සජ්ජායනා කරන්නට ගත්තේය. ගමේ වැඩිහිටියෝ පිරුවානා පොත් වහන්සේ ළඟ තියාගෙන

The Reader's Place

මේ ඉලන්දාරියාගේ වැරදි හොයන්ඩ පත්තිරු පෙරළ පෙරළා උත්සාහ කළහ. වචන උච්චාරණයේ දෝෂ හොයන්ඩ වහරන හැම වචනයකටම හොඳට සවන් දී උන්හ. ගමේ එකම වැසියෙකුවත් එළිවෙනකම් දොට්ට පිලට යන්ටවත් නැඟිට්ටේ නැත. තම තමුන් හිඳගෙන හිටි පන් පැදුරු මත පැය ගාණක් මෙසේ එකම විදිහට ඉන්ඩ පුළුවන් විත්තියක් එදා වෙන තෙක් කිසිම කෙනෙක් දැන සිටියේ නැත. වෙනදා ඕපා දූප පිරුණු මේ පිරිත් මණ්ඩපයේ එදා සාදුකාරය විනා වෙන කිසිදු හාවක් හූවක් ඇසුණේ නැත.

කොටින්ම වැඩිහිටි ගිහි පිරිත් නඩය පිරුවානා පොත් වහන්සේ පෙරළාගෙන මේ ඇබිත්ත කොලුවාගේ වැරදි සොයමින් රැය පහන් කරද්දී ඇබිත්ත කොලුවා එක් පත්තිරුවක්වත් නොබලා නොපෙරළා සහතික ලෙසම මතක ස්මෘතියේ ආනුභාවයෙන් එක වතුර බිඳකුදු කටේ නොතියා කිසිම මහන්සියක් නැතිව පාන්දර ජාමය වන විට සම්පූර්ණ පිරුවානා පොත් වහන්සේම සජ්ජායනා කර නිම කළේය.

වැඩිහිටි නඩයේ නඩේ ගුරා වූ කිරිහාමි උපාසක රාළ ආටානාටියෙන් පසු පිරිතේ අවසන සමාප්ති සජ්ජායනාව නිම වූ වහාම මහ හඬින් සාදුකාර දී සියල්ලන්ටම පළමුවෙන් මුළු රෑ පුරා හිඳ සිටි පන් පැදුරෙන් නැඟිට්ටේය. නැඟිට පුරවාගත් වතුර මඩක්කුවක් රැගෙන ඇබිත්ත කොලුවා ළඟට ඇවිදගෙන ගියේය. ඒ හාම සියල්ලෝ හුන් තැන්වලම හිඳගෙන කසු කුසු ගාන්නටත්, තොල් මතුරන්නටත් සාධුකාර දෙන්නටත් පටන් ගත්හ. හොඳටම කෝප වූ කිරිහාමි උපාසක රාළ පිටුපස හැරී රැස්වූවන් අමතා මෙසේ කෑ ගැසුවේය.

'...බොලව්... මෙච්චර වෙලා... සද්දයක් නැතිව හිටපු විදිහට තව ඇබින්දක් හිටපල්ලා...මං මේ වතුර ඩිංග පිළිගන්නන කං... ඇබිත්ත ළමයට...'

ඒ සමඟම කිරිහාමි උපාසක රාළගේ මුණුබුරෙක් ඇතින් නැඟිට මෙසේ කීවේය.

'කිරි අත්තගේ කකුලේ කොරේ හොඳ වෙලානේ...'

සියල්ලෝ නැවත සාධුකාර දුන්හ. උපාසක රාළ ගෙල නමා පහතට හැරී තමුන්ගේ දකුණු කකුල දිහා බැලුවේය. පෙරදා හවස

ගන්ට ගම්මුන්ගේ උනන්දුව දෙගුණ තෙගුණ වී තිබුණේ මූ නඩයේ දක්ෂතා තමන්ගේ දරුවන්ට පෙන්නන්ඩ මෙක හොඳ අවස්ථාවක් වූ නිසාය.

ගමේ ප්‍රධානියාගේම උවමනාවට කෙරෙන්නක් වූ මැවින් ගොක් කොළවලින් හැඩ කළ පිරිත් මණ්ඩපයක් තනවා සියලු කළමනා ලක ලෑස්ති කර නියමිත දවසේ හවස් ජාමය වන විට ගමේ ගම්මු සියල්ලෝම පන්සලට එක් රැස් වී සිටියහ. ලොකු හාමුදුරුවෝ සියල්ලන්ම පංච ශීලයේ පිහිටුවා ගිහි පිරිත් කියන්න පැමිණි වැඩිහිටියන් මුලින්විට කා රාජකාරියට සූදානම් වෙන අතර අවසාන වශයෙන් පිරිස අමතා මෙසේ වදාළහ.

'අද මේ හැමෝටම විශේෂ දවසක්... හුඟ කාලෙකට පස්සේ මහ රෑ එළිවෙනකම්ම පිරිත් අහන්ඩ මේ ඇත්තෝ මේ එක් රැස් වෙලා ඉන්නේ. ඒ නිසා මේ ඇත්තන්ට තවත් විශේෂ දෙයක් අද මං කියන්ට කල්පනා කළා. වෙනද මහ පිරිත පටන් ගන්නේ මම... ඒත් අද මං ඒ සම්ප්‍රදාය වෙනස් කරනවා. තමුන්නෙහෙලා හිතයි අද මහ පිරිත කියන්නේ අපේ වැඩිහිටි ගිහි ඇත්තෝද කියලා... නෑ... බාග වෙලාවට අද උන්නැහෙලට මේ පිරිතට මැදිහත් වෙන්ඩ උවමනා වෙන එකකුත් නෑ... අද පිරිත් සජ්ජායනය කරන්නේ තමුන්නැහෙල කවුරුත් දන්නා ඇබිත්ත ළමයා තනිවම... මේ පන්සලට ඇවිත් අවුරුදු තුනක් කිට්ටු වුණාට අවුරුද්ද හමාර යන කොට මං කියවපු සියලු පුස්කොළ පොත් මේ ළමයා වනපොත් කරල ඉවරයි... අද තමුන්නාන්සේලාට මේ ළමයගෙ වග වින්ති දැන ගන්ට හැකි වේවි...'

ලොකු හාමුදුරුවෝ එසේ වදාරා හුන් තැනින් නැගිට ඉවතට ගියහ. ඉක්බිතිව ගිහි පිරිත් කියන්න පැමිණි නඩය එකිනෙකාගේ මුහුණු බලාගෙන විශ්මයට පත් වෙද්දී ඇබිත්ත කොලුවා සුපුරුදු පරිදි හාමුදුරුවන්ගේ පරණ අඳනකඩයට උඩින් සුදු පිරුවට හැඳගෙන ආසනයේ හිඳ ගත්තේය.

ඒ රාත්‍රියේ පුන් සඳ මෝදු වෙද්දී ඔහු මහ පිරිත පටන් ගත්තේය. පසුව එකින් එක පිරිත් සජ්ජායනා කරන්නට ගත්තේය. ගමේ වැඩිහිටියෝ පිරුවානා පොත් වහන්සේ ළඟ තියාගෙන

මේ ඉලන්දාරියාගේ වැරදි හොයන්ට පත්තිරු පෙරළ පෙරළා උත්සාහ කළහ. වචන උච්චාරණයේ දෝෂ හොයන්ට වතරන හැම වචනයකටම හොඳට සවන් දී උන්හ. ගමේ එකම වැසියෙකුවත් එළිවෙනකම් දොට්ට පිලට යන්ටවත් නැගිට්ටේ නැත. තම තමුන් හිඳගෙන සිටි පන් පැදුරු මත පැය ගාණක් මෙසේ එකම විදිහට ඉන්ඩ පුළුවන් චිත්තියක් එදා වෙන තෙක් කිසිම කෙනෙක් දැන සිටියේ නැත. වෙනදා ඕපා දූප පිරුණු මේ පිරිත් මණ්ඩපයේ එදා සාදුකාරය විනා වෙන කිසිදු හාවක් හූවක් ඇසුණේ නැත.

කොටින්ම වැඩිහිටි ගිහි පිරිත් නඩය පිරුවානා පොත් වහන්සේ පෙරළාගෙන මේ ඇබිත්ත කොලුවාගේ වැරදි සොයමින් රෑය පහන් කරද්දී ඇබිත්ත කොලුවා එක් පත්තිරුවක්වත් නොබලා නොපෙරළා සහතික ලෙසම මතක ස්මෘතියේ ආනුභාවයෙන් එක වතුර බිඳකුදු කටේ නොතියා කිසිම මහන්සියක් නැතිව පාන්දර ජාමය වන විට සම්පූර්ණ පිරුවානා පොත් වහන්සේම සජ්ජායනා කර නිම කළේය.

වැඩිහිටි නඩයේ නඩේ ගුරා වූ කිරිහාමි උපාසක රාළ ආටානාටියෙන් පසු පිරිතේ අවසන සමාප්ති සජ්ජායනාව නිම වූ වහාම මහ හඬින් සාදුකාර දී සියල්ලන්ටම පළමුවෙන් මුළු රෑ පුරා හිඳ සිටි පන් පැදුරෙන් නැගිට්ටේය. නැගිට පුරවාගත් වතුර මඩක්කුවක් රැගෙන ඇබිත්ත කොලුවා ළඟට ඇවිදගෙන ගියේය. ඒ හාම සියල්ලෝ හුන් තැන්වලම හිඳගෙන කසු කුසු ගාන්නටත්, තොල් මතුරන්නටත් සාධුකාර දෙන්නටත් පටන් ගත්හ. හොඳටම කෝප වූ කිරිහාමි උපාසක රාළ පිටුපස හැරී රැස්වූවන් අමතා මෙසේ කෑ ගැසුවේය.

'...බොලව්... මෙච්චර වෙලා... සද්දයක් නැතිව හිටපු විදිහට තව ඇබින්දක් හිටපල්ලා...මං මේ වතුර ඩිංග පිළිගන්නන කං... ඇබිත්ත ළමයට...'

ඒ සමඟම කිරිහාමි උපාසක රාළගේ මුණුබුරෙක් ඇතින් නැගිට මෙසේ කීවේය.

'කිරි අත්තගේ කකුලේ කොරේ හොඳ වෙලානේ...'

සියල්ලෝ නැවත සාධුකාර දුන්හ. උපාසක රාළ ගෙල නමා පහතට හැරී තමුන්ගේ දකුණු කකුල දිහා බැලුවේය. පෙරදා හවස

The Reader's Place

බණ අසන්නට ඉඳගන්නා විට ඇද වී කොර වී තිබුණු කකුල මෙ උදෑසන හුන් තැනින් නැගිටින විට කෙළින් වී හොඳ වී තිබුණේය. පිරිත් පිංකමෙන් පසු බොහෝ දේ වෙනස් වන්නට විය. ඒ සමග තවත් බොහෝ දේ වෙනස් වී ද තිබිණි. ගමේ වැඩිහිටියෙකු වූ වැළඩ අප්පු දීර්ඝ කාලයක් තිස්සේ පැවති කන් නොඇසීමේ පීඩාවෙන් තමා මිදී ඇති බව දැන ගත්තේ, එදා දවල් තමාගේ දරුවන් දවල් කෑමට මහ හඬින් කතා කරන විට එය ඉවසා ගන්ට බැරුව, මොකද යකෝ මට මෙච්චර හයියෙන් කෑ ගහන්නේ යැයි උන්ට පෙරළා බෙරිහන් දෙන විටය. එසේම උත්පත්තියේ සිටම ඇස් නොපෙනුණ ඉලන්දාරියෙකුට මේ පිරිත් සජ්ජායනාවෙන් පසු හොඳට ඇස් පෙනීම පහළ වී ඇති බව ගම්මුන් දැන ගත්තේ ඊට සතියකට පසු මේ ඉලන්දාරියා ගමට ලුණු, කරවල, මතිබඩු ගේන තම්බි මුදලාලිගේ මුදල් පසුම්බිය හොරකම් කර හසු වූ විටය.

පිරිත් සජ්ජායනාවෙන් පසු ඇබිත්ත කොලුවා කෙරෙහි ගම්මුන් තුළ පැවති බයපස්සපාතකම දෙගුණ තෙගුණ වූ බව අමුතුවෙන් කිව යුතු නොවේ. එතෙක් ගම්මුන්ට 'කොලුවෙකු' වූ හෙතෙම එදායින් පසු ගම්මුන්ගේ ගෞරවය දිනාගත් වෙනකෙකු හෙවත් 'මුන්නැහේ' බවට පත් විය.

'මුන්නැහේට කියන්ඩ... හාමුදුරුවන්ට මතක් කරනවැයි හෙට අපේ ගෙදර දානෙ වින්තිය...'

'අනේ අප්පුච්චේ මුන්නැහේට කියන්ඩ අපේ කිරි අම්මා නැති වුණා... හෙට මිනිය අහක් කරනවා.. හාමුදුරුවන්ට මතක් කරනවැයි... පාන්සකුලෙට වඩින්ට....'

'ආයිබොවන්ඩ.... අපේ ගෑනි බර හැල්ලු කරන්ඩ කලියෙන් වරු පිරිතක් කියන්ඩ පුළුවන් නම් හොඳා... මුන්නැහෙට පුළුවන්නං අපේ හාමුදුරුවන්ට කියන්ට හෙට උදේ අපේ ගෙදරට වඩින්ට කියලා...'

මේ විදිහට ගම්මුන්ගේ ගෞරවය සහ අවධානය ඇබිත්ත කොලුවා වෙත යොමු වෙද්දී බොහෝ අයට ප්‍රශ්නයක් වූයේ ඔහු මහණ නොවන එක ගැනය. දවසක පැය ගාණක් තාවර වෙවී සිටි කිරිහාමි උපාසක රාළ ඔහුගෙන් ඒ ගැන මෙසේ ඇසුවේය.

'මුන්නැහෙගෙන් මෙහෙම අහනවට මා එක්ක අමනාප වෙයිද දන්නෑ... ලොකු හාමුදුරුවන්ටත් දැන් ටිකක් වයස එකේ මොකෝ වෙන්නෙ මහණ වෙන්ඩ කල්පනා කළොත් එහෙම....'

'අනේ උපාසක උන්නැහේ මහණ වෙන්ඩ මගෙ කැමැත්තක් නෑ... අනික ලොකු හාමුදුරුවන්ට කිට්ටු වෙන්ඩ මට ගොඩක් කල් යයි. අනෙක යහපත් පිළිවෙත් පුරන්ට සිවුරක් ඕනය කියලා නියමයක් නෑනේ.... අනික මං දන්නවා මගේ ළඟ තාම ගිහි ගෙයි කෙලෙස් තියෙනවා කියලා...'

එදායින් පසු කිසිවෙකුත් ඔහුගෙන් ඒ ගැන අහන්ඩ ගියේ නැත.

මේ සියලු කරුණු කාරණා මෙසේ සිදුවෙමින් තිබියදී මේ ඇබිත්ත කොලුවා දවසින් දවස ඥානයෙන් මුහුකුරා යමින් සිටියේය. කෙතරම් පන්සලේ සිටියත් අවුරුදු තුන පිරුණු පුතෙකුගේ අප්පුච්චා වූ ඔහුට ඔහුගේ පුතු නොබලා සිටිය නොහැකි විය. සතියකට දවසක් ඔහු කොහොමත් එකම ගෙවල් මණ්ඩියක වූ ගෝමරිත් තම සහෝදර සහෝදරියනුත්, පොඩිනා හා බිංදුත් බලන්න නොකඩවා ගියේය. සමහර දවසක ඔහු මුළු දවසක්ම බිංදු සමඟ සෙල්ලං කළේය. ඔහුට තමන් දන්නා බණ කතන්දර කියා දුන්නේය. කිසිම දවසක අම්මා, අප්පුච්චා යන වදන් වහරා නැති බිංදු ඔහුට කතා කළේ 'හාන්දුරුවෝ' කියාය.

'මොකෝ හාන්දුරුවො ටික දවසකින් ආවේ නැත්තේ..'

ඔහු එක දිගට සතියක් විතර නොදුටු විට බිංදු පොඩිනාගෙන් අසයි.

'හාන්දුරුවෝ එනවද මාත් එක්ක සෙල්ලං කරන්ඩ...'

සුදු බණ්ඩා ගෙදර ආ විට බිංදුට ඕනෑ කළේ ඔහුත් සමඟ සෙල්ලං කරන්නටය.

බිංදුගේ මේ ආමන්ත්‍රණය කොහොම පටන් ගත්තාදැයි කියන්න බැරිය. ඇබිත්ත කොලුවා අර ප්‍රසිද්ධ පිරිත් සජ්ජායනය පන්සලේ කරන්නත් කලින් බිංදු ඔහුට කීවේ හාන්දුරුවෝ කියාය. එදා එළිවෙනකම් පන්සලේ පොඩිනාත් සමඟ සිටි බිංදු පොඩිනාගේ තන පුඩුවලින් කිරි උරා බොමින් 'හාන්දුරුවන්ගේ' ගීතවත් පිරිත් සජ්ජායනාව අසා සිටියේය.

The Reader's Place

ඔහුට සිය දරුවාගේ පෝෂණය වෙනුවෙන් යමක් කරන්න කෙතරම් උවමනා වීද යත් ඔහු සිය වතාවක්ම පන්සලට ලැබෙන ආහාර බිංදුට රැගෙන ගියේය. එහෙත් ඔහු කෙතරම් රසවත් කෑම ගෙනාවත් බිංදු පොඩිනාගේ තන කිරි හැර කිසිත් නොබිව්වේ නොකෑවේය. ඒ වගේම පොඩිනාත් කෑම ගැන එතරම් [illegible] නොවුණාය. දේව හාස්කමකින් වගේ ඈ කෑවත් නොකෑවත් හැමදාමත් ඇයට බිංදු වෙනුවෙන් ඇති තරම් කිරි එරුණේය. ඒ නිසා අන්තිමට ඔහු බිංදුගේ ගෙදරට කෑම ගෙන යන එක අත්හැර දැමුවේය.

තම ඥානයෙන් කෙතරම් දේවල් තේරුම් ගත්තත් ඇබිත්ත කොලුවාට තේරුම් ගන්න බැරි වූ එක් දෙයක් තිබුණේය. ඒ ලොකු හාමුදුරුවන්වය. උන්වහන්සේ ගැන තේරුම් ගන්ට තේරුම් ගන්ට තම සිතිවිලි කෙළවරක් නැති අනන්ත චක්‍රාවාටය දක්වා දිගහැරෙන බව ඔහු තේරුම් ගත්තේය. ගමේ කිසිවෙකු නොදැන සිටියත් උන්වහන්සේ කිසියම් ධ්‍යානයක, මාර්ග ඵලයක සිටින බව ඔහු සහසුද්දෙන්ම දැනගෙන සිටියේය. කිසිවෙකුට එය දන්වන්ට පෙන්වන්ට උන්වහන්සේට කිසි විටෙක උවමනා නොවුණත් තම ඇබිත්ත කොලුවාගෙන් එය සඟවාගන්ට බැරි බව උන්වහන්සේ දැනගෙන සිටියහ.

නිතර කතා නොකළත් ඇතැම් විට උන්වහන්සේ කියා ඇති තොරතුරු කාරණා අනුව උන්වහන්සේගේ වයස සීයකට වැඩි විය යුතු බව ඔහු අනුමාන කළේය. එහෙත් මෙතුවක් කාලයක් වයස පිළිබඳ අංශු මාත්‍රයක අදහසක්වත් පළ නොකළ උන්වහන්සේගේ සිරුර දූන් අවුරුද්දකට ආසන්න කාලයක සිට හිටි හැටියේ වයසට යන්ට පටන් ගත්තේ කෙසේදැයි ඔහුට කෙසේවත් තේරුම් ගන්න බැරි විය.

දවසක් බෝධි වෘක්ෂය පාමුල උන්වහන්සේ ධ්‍යාන සුවයෙන් වැඩ සිටි වේලාවක ඇබිත්ත කොලුවා ඈතට වී උන්වහන්සේ දෙස බලා සිටියේය. ප්‍රතාපවත් ඒ මුහුණේ තැනින් තැන මතු වුණු රැලි රේඛා හෙතෙම නිරීක්ෂණය කළේය. නළල රැලි වැටී ඇති

The Reader's Place

බවත්, පිරුණු කම්මුල් වෙනදාට වඩා ගිලී යමින් පවතින බවත් ඔහු හැඳින්නේය. උන්වහන්සේ පිළිබඳ අනේක සිතිවිලි අතර පොර බදමින් සිටි හෙතෙම උඩු යටිකුරු වුණේ හදිසියේ ඇසින් උන්වහන්සේගේ කටහඬ ඇසීමත් සමඟය.

'මොකද ඔය ළමයා මං ගැන මෙතරම් සැලකිලිමත් වෙන්නේ..'

උන්වහන්සේ ඔහුගේ හිත කියවමින් එසේ විචාළහ. තවමත් උන්වහන්සේ ඇස් වසාගෙනය. එහෙත් උන්වහන්සේගේ ඇබිත්ත කොලුවා උන්වහන්සේ දෙසටම ඇස් ඇරගෙනය.

'ඔබ වහන්සේ දන්නව මං හිතන්නේ මොනවද කියලා...'

ඇබිත්ත කොලුවා පිළිතුරු දුන්නේය. උන්වහන්සේ ලොකු හුස්මක් ඉහළට ගත්හ. පසුව හෙමින් පහළට හෙළමින් ඇස් පියාගෙනම මෙසේ පිළිතුරු දුන්හ.

'බුදු හාමුදුරුවො කියල තියෙන්නේ හැමදේම අනිත්‍යයි කියලා...'

'ඒක ඔබ වහන්සේ මට කියා දීල ගොඩක් කල්... ඒත් ඒකම නෙමෙයි මෙතන තියෙන ප්‍රශ්නේ...'

උන්වහන්සේ මොහොතක් නිහඬව සිටියහ. ඉන් පසුව මෙසේ පිළිතුරු දුන්හ.

'හිත සතුටුයි නම් මිනිස්සුන්ගේ වයස පේන්නේ නෑ... ඒත් හිත අසතුටු වෙන කොට වයස පේන්න ගන්නවා...'

තමා බලාපොරොත්තු වුණු පිළිතුරක් ලද කලෙක මෙන් ඇබිත්ත කොලුවා වහා ඊළඟ ප්‍රශ්නය ඇසුවේය.

'මං දන්නව ඔබ වහන්සේගේ ආත්මයෙන් සතුට කියන හැඟීම අත් හැරල ගොඩක් කල් විත්තිය...'

'ඒත් මේක මගේ සතුට පිළිබඳ ප්‍රශ්නයක් නෙමෙයි...'

'...එහෙනං...'

'... මේක මුළු සිංහලේම, මුළු රටේම සතුට පිළිබඳ ප්‍රශ්නයක්...'

'...ඒ කිව්වේ අපේ හාමුදුරුවනේ...'

'මේ බේබදු රජ්ජුරුවෝ මුළු සිංහලේම වනසන විත්තිය

මං තේරුම් අරගෙන හිටියි... එත් ලබන්ට තියෙන අනාගතය ද...
වඩා දරුණුයි...'

'මට පැහැදිලි මදි හාමුදුරුවනේ...'

'මටත් තව පැහැදිලි මදියි ඒ ගැන තේරුම් ගන්න.... ත...
ටික දවසකින් මං තේරුම් කරන්නම් ඔය ළමයට ඒ ගැන...'

මේ සිද්ධිය සිද්ධ වී හරියටම සතියකට පසු අටසිය දහ... අවුරුද්දේ ඉල් මාසයේ දවසක ඉරිමා උදයේ දෙමට කුරකින් ද... මදින අතරතුර උන්වහන්සේ තම ඇබිත්ත කොලුවාට මෙලෙ... විධානය කළහ.

'හවසට හොඳ ආසන දෙකක් හරිගැස්සුවොත් හොඳයි... මගේ ඇඳ ළඟ...'

ලොකු හාමුදුරුවෝ විධානය කළ විදිහට ඇබිත්ත කොලුව... එදා හැන්දෑවේ උන්වහන්සේගේ ලැගුම් ගෙයි ඇඳ ළඟ ආසන... දෙකක් ලැහැස්ති කළේය.

එහෙත් ඔහුගේ හිතට කිසි එකලාසයක් තිබුණේ නැත. ගත... කිසි සැහැල්ලුවක් තිබුණේද නැත. ගතවූ අවුරුදු හතරකට පහක... ආසන්න කාලය තුළ තමා නොදන කිසිම අමුත්තෙකු මේ භූමි... පස් පාගා තිබුණේ නැත. එහෙව් එකේ මේ පැමිණෙන අමුත්... ගැන කල් තියා උන්වහන්සේ තමන්ට නොකීවේ ඇයි...? ඔහුගේ... ජීවිතය නැවත ලබාදුන්නේ උන්වහන්සේය. ඔහුට ජීවිතයේ අරුත... පසක් කරදුන්නේ උන්වහන්සේය. එසේම මනසට එහා තියෙන... ලෝකය ඔහුට පසක් කරදුන්නේද උන්වහන්සේය. එහෙයින්... ඔහුගේ හේතු ප්‍රත්‍යයද උප්පත්ති කාරකයද වූයේ උන්වහන්සේය... එබඳු වූ යෝධ ආත්ම කාරකයක් පිළිබඳ ඔහුගේ ආත්මය සිසාර... කැකෑරුණ ගෞරවය හා බහුමානය මෙලොව ඇති වචනවලින් පැහැදිලි කළ හැකි නොවීය.

එතකුදු වුවත් උන්වහන්සේ අරභයා තමා තුළ වූ විශ්වාසය සහ ගෞරවය පිළිබඳව උන්වහන්සේට සැකයක් පහළ වීද?.. ඔව්... එසේ නොවිණි නම් මේ අමුත්තා ගැන කල් තියා තමාට කිව යුතුය.

මේ කල්පනා කරණ කොටගෙන ඔහුගේ හිතට කිසි එකලාසයක් තිබුණේ නැත.

ඔහු ඉබාගාතේ බලාගෙන හිටියේය. එදා දවසම ඔහු වතුර පොදක්වත් කටේ තිබ්බේ නැත. සැන්දෑ හිරු එළිය පැළ දිග අහසේ මලානික රතු පාට සායම් කරද්දී ඔහු හැඟීම් රහිතව ලොකු හාමුදුරුවන්ගේ කුටිය දිහාත් ඒ තුළ වූ හිස් ආසන යුගල දිහාත් බලා සිටියේය. ඇඳිරි වැටුණේය. කිසිවෙකුත් ආවේ නැත. තවත් කළුවර වුණේය. කිසිවෙකුත් ආවේ නැත. මධ්‍යම රාත්‍රිය එළඹුණේය. තවමත් ආගන්තුක ආසනය හිස්ය. එහෙත් අනෙක් ආසනයේ ලොකු හාමුදුරුවෝ වැඩ සිටියහ. පශ්චිම යාමය එළඹුණේය. ඒ වෙලෙත් ලොකු හාමුදුරුවන් එක් ආසනයක වැඩ සිටිද්දී අනෙක් ආසනය හිස්ව තිබුණේය.

මෙසේ පුරා දෙමාසයක් ගෙවී ගියේය. හැමදාම මධ්‍යම රාත්‍රියට ආසන්න වෙද්දී ලොකු හාමුදුරුවෝ එක් ආසනයක හිඳ ගත්හ. පැයෙන් පැය රාත්‍රිය ගෙවෙද්දී උන්වහන්සේ නෙත් පියා ධ්‍යාන සෙයියාවෙන් ඒ මත හිඳගෙන සිටියහ. ඊත් ඒ දෙමාසය පුරාම පහුවදා අරුණළු වැටෙන තෙක් උන්වහන්සේ ඉදිරිපස ආසනය හිස්ව තිබුණේය.

පුරා දෙමාසයක් ආගන්තුකයෙකුගේ ආගමනය අපේක්ෂාවෙන් සිටි ඇබිත්ත කොලුවා හොඳටම වෙහෙස වී සිටියේය. ඔහුගේ හිතේ කිසිම සාමයක් නොවීය. හොඳටම ව්‍යාකුල වූ ඔහු ඒ කාලය පුරාම ඇහිපිල්ලන්වත් ගසා නිකමටවත් ඇහැ පියවා තිබුණේ නැත. අනෙක් අතට හරියමං විදිහට ආහාර තියා වතුර බිඳකුදු සප්පායම් වුණේ නැත. හේතු ප්‍රත්‍ය රහිතව ඔහු දවල් කාලයේ පන්සල් භූමිය පුරා කෙතරම් සක්මන් කළාද කීවොත් පියවරෙන් පියවර ඔහුගේ පියවර සටහන් පන්සල් භූමිය පුරා විය.

ලොකු හාමුදුරුවෝද ඒ දෙමාසය පුරාම කිසිම ආහාරයක් නොගත්හ. කුටියෙන් එළියටවත් නොබැස්සාහ. මුළු දහවලම තම සයනයේ සැතපෙන උන්වහන්සේ රාත්‍රියේ සයනයෙන් නැඟිට ඇබිත්ත කොලුවා උන්වහන්සේ වෙනුවෙන් සකස් කළ ආසනයේ හිඳ සිටියහ. පසුවදා පාන්දර එළිය වැටෙනකම් ඒ මත නෙත් පියා ධ්‍යාන සුවයෙන් හිඳ සිටින උන්වහන්සේ හිරු රැස් පොළොව සිප ගන්නා විට පෙරළා සයනයට වැදී සැතපුණහ. එහෙත්

The Reader's Place

උන්වහන්සේ ඉදිරිපස ආසනය කිසිවකුගේ පහසක් නොලැබූ හිස්වම තිබුණේය.

අටසිය දාහතර අවුරුද්දේ දුරුතු මාසයේ දවසක උදෑ ඉර එළිය වැටෙද්දී තමන්ගේ ඇහි පිල්ලන්වල බර ඇබිත්ත කොලුවාට හොඳටම තදින් දැනුණේය. ඒ සමගම ඔහු පියැවි සිහියට පැමිණියේය. පුරා දෙමාසයක්ම තමා නොපැමිණෙන ආගන්තුකයෙකු පිළිබඳ අපේක්ෂාවෙන් කාලය කා දමා ඇති බව ඔහු හැදින්නේය. මෙය තම හිත පරීක්ෂා කරන්නට ලොකු හාමුදුරුවන් දුන් තවත් එක් අභ්‍යාසයක් බව ඔහු තේරුම් ගනිමින් සිටියේය. එබැවින් උදේ පාන්දරම ඔහු වැවට ගොස් හොඳට නා කියා ගත්තේය. පසුව ආවාස ගෙයි පිළිණු වෙමින් තිබූ ආහාර සියල්ල එළියට විසි කොට ලොකු කල්දේරමකට හාල් සේරු දහයක්ම ළිප තියා පොල් ගෙඩි විස්සක තිහක පොල්කිරි එයට මිශ්‍රකර ලොකු කිරිබතක් හැදුවේය. මඩක්කුවකට බත් ගුලි කීපයක හාමුදුරුවන්ගේ කොටහ වෙන් කර අර සියල්ලම දංකුඩ සමඟම අනුභව කළේය.

පසුව තම කුටියේ ඇඳ උඩට වැටී ගොරව ගොරවා නින්දට වැටුණේය.

The Reader's Place

දීර්ඝ නින්දකට පසු හෙතෙම නැගිට්ටේ ඊට දවස් හතකට පසු හැන්දෑ වරුවේය. හිස ගසා බසා දමා වටපිට බැලූ ඔහු තමා කෙතරම් කාලයක් නිදාගෙන සිටියාදැයි හඳුනාගත්තේ පෙරදිගින් මෝදු වී ආ හඳේ පිරුණු නොපිරුණු බව තක්සේරු කිරීමෙන්ය. ඔහු ඇඳෙන් නැගිට ඇලි මැලි කඩා දමා ලොකු ඇනුමක් ඇර ලොකු හාමුදුරුවන්ගේ ලැගුම් ගේ පැත්තට ගියේය. කළුවර අහමුළු තැන් හොයමින් බඩ ගා යමින් සිටි ඒ වේලාවේ උන්වහන්සේ සුපුරුදු පරිදි සැතපී සිටි සේක. සයනයේ පසෙක තමන් මීට දවස් හතකට ඉස්සර උන්වහන්සේ වෙනුවෙන් වෙන් කළ දානය ඒ විදිහටම තිබුණේය. අනෙක් පස ආසන යුගලය පෙර පරිදි ඒ විදිහටම තිබුණේය. කාමරය අස්පස් කළ හෙතෙම මූණකට හෝදාගෙන පිරිසිදු වී හාමුදුරුවන්ගේ කුටිය පෙනෙන නොපෙනෙන මානයේ පළක් බැඳ භාවනා කරන්නට ගත්තේය.

දවස් හතකට පසු උදා වූ මේ දිනයේ ඔහුගේ හිතේ පුදුමාකාර සාමයක් ඇති වී තිබුණේය. හිත ව්‍යාකූලත්වයෙන් බැහැරව නිවී සැනහී තිබුණේය. තව දුරටත් ආගන්තුකයා සොයාගන්නා උවමනාවක් ඔහුට කිසිසේත් නොවීය. එය ලොකු හාමුදුරුවන් තමා පරීක්ෂා කරන්නට කළ එක්තරා අභ්‍යාසයක් බව ඔහු පැහැදිලිව තේරුම් ගෙන සිටියේය. එබැවින් කුතුහලයෙන් සහ ආශාවෙන් විනිර්මුක්ත වූ ඔහුගේ සිත දීප්තිමත් දියමන්තියක් මෙන් විනිවිද පෙනෙන සුළු වූ අතර එය මුදු මොළොක් බවින් ද අනූන විය. තමා කෙරෙන් තමා එළියට ඇද ඉවත් කළ හෙතෙම නෙත් පියා සියලු පසේ බුදුවරුන් වහන්සේලා පරම ප්‍රීතිය සතුට උදා කරගත් ඒ අත්‍යාත්මිකර භාවනාවේ නිමග්නව සිටියේය.

මධ්‍යම රාත්‍රිය එළඹුණේය. මෙලොවින් බොහෝ ඈත, ඈත විශ්වය තුළ අහිංසක මිනිසුන්ගේ උපත්, විපත් සැප, දුක, සතුට, ප්‍රීතිය සමඟ සැරිසරමින් සිටි ඔහු ඒ අතර තවත් එක් සංසිද්ධියක් ලෙස ලොකු හාමුදුරුවෝ සයනයෙන් මෑත්ව ආසනයේ හිඳ ගන්නා අයුරු මනසින් දුටුවේය.

තවත් හෝරාවක් ගත වී ගියේය. එක් වරම උල්කාපාතයක් පොළොවට කඩා පාත් වූවාක් මෙන් හාත්පස ආලෝකමත් වී යළි අඳුරු විය. වැලි පොළොව මත පා තියා නොතියා ඇවිදින කෙනෙකුගේ සක්මන් සටහනක් ඒ සමඟ ඔහුට ඇසුණේය. ඔහු තදින් දෑස් පියාගත්තේය.

කිසිවෙක් හිස් ආසනය වෙත ගමන් කරන හඬ ඊළඟට ඔහුට ඇසුණේය. ඔහු තවත් තදින් දෑස් පියාගත්තේය.

එවිට ඔහු එය දුටුවේය.

එය වූ කලී කාම, රූප, අරූප, ලෝකවල සිට හඹා ආවා වූද, සුර අසුරයන්ගේ හුස්ම පණ නල සමඟ මුසුව ආවා වූද, සුඛාවතී ලෝකයෙහි අමිතාභ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපතුල් සමීපයෙහි හටගත් පද්මයක් මෙන් හැඩ ලතා ඇත්තා වූද, දස දිග් භාගයෙහි බෝධි සත්වවරයන් වහන්සේලාගේ පුණ්‍ය ශක්තිය එක් පිඬකට ගත්තා වූද, සතර දිග් භාගයෙහි ජ්වලිතවූ ආලෝක සමාලෝකයෙන් පැහැසරව ඇත්තා වූද, යථාවේද මායාවේද

ඒකායන සම්මිශ්‍රණයක ප්‍රතිඵලයක් වූ දේවතාවුන් වහන්සේ නමක් වූහ.

ලොකු හාමුදුරුවන් අභිමුව දණ නමා පාද නමස්කාරය කළ දේවතාවුන් වහන්සේ ඉක්බිතිව එකත්පසව ඉදිරිපස අසුනේ හිඳ ගත්හ.

දෙදෙනාගේ සාද කතා ලතා පටන් ගත්තේ ඉන් පසුවය. එහෙත් මේ ප්‍රිය සම්භාෂණය පැවතියේ දෙදෙනෙකු අතර හුවමාරු වූ වචන හරහා නොවේ. දෙදෙනා දෙදෙනාට මුහුණලා ධ්‍යාන සමාධියෙන් වැඩ සිටි අතර දෙදෙනා අදහස් හුවමාරු කරගත්තේ දෙදෙනාගේ විඥානය හරහාය. එබැවින් ඒ කිසිවක් දැන හඳුනාගන්ට තියා අනුමාන කරන්ට තරම්වත් ඔහුගේ විඥාන ධාරිතාව පොහොසත් වූයේ නැත.

එහෙත් මධ්‍යම රාත්‍රියේ සිට පශ්චිම යාමය දක්වාම අඛණ්ඩව දිග හැරුණ මේ ප්‍රිය සම්භාෂණය ඔහුගේ සිත ප්‍රීතියෙන්ද, පුදුමයෙන්ද, අවිශ්වාසයෙන්ද, විශ්වාසයෙන්ද, එක විට එක වර පුරවාලීය.

උදෑසන හිරු රැස් ඇතින් පොළොවට වැටෙන්නට ආසන්න වන විට දෙදෙනාගේ ප්‍රිය සම්භාෂණය අවසන් විය. දේවාතාවුන් වහන්සේ පෙරළා ගියහ. ඒ සමඟම පසුගිය දින කීපයේ පසක් කර නොගත් තවත් සත්‍යයක් ඒ වෙලේ ඔහු සිය මනසින් තේරුම් බේරුම් කරගත්තේය. එනම් දේවතාවුන් වහන්සේ සමඟ ලොකු හාමුදුරුවන් ද පෙරළා නික්ම ගිය බව ඔහු දුටුවේය. ලොකු හාමුදුරුවන්ගේ ජීවමාන කය පමණක් සයනය මත වැතිරී තිබුණේය. එය හුස්ම ගත්තේය. එහාට මෙහාට පෙරළුණේය. එහෙත් උන්වහන්සේගේ අප්‍රමාණ බල සපිරි චෛතසිකය ඒ කාය පුංජය සමඟ ගතවුණ කාලය පුරා දහවල් වරුවේ නොතිබුණ බව ඔහු දුටුවේය.

එහෙයින් දවල් වරුවේ ලොකු හාමුදුරුවන් දූක වැඳ පුදා ගන්ට පැමිණි ගමේ හැමෝටම ඇබිත්ත කොලුවා පවසා තිබුණේ උන්වහන්සේ ටිකක් අසනීපෙන් සිටින බවය.

The Reader's Place

ලොකු හාමුදුරුවන්ගේ මේ අසාමාන්‍ය දින චර්යාව වැඩි කලක් පැවතුණේ නැත. ඉන් සිව් මසකට පසු එක්තරා දිනක හැන්දෑවේ උන්වහන්සේ ඇබිත්ත කොලුවා අමතා මෙසේ විධාන කළහ.

'අර ආසන දෙක අයින් කළා නං මගේ ඇඳ ළඟින්...'

හැරෙන පමාවෙන්ම හෙතෙම ආසන දෙක උන්වහන්සේගේ කුටියෙන් ඉවත් කළේය.

සියල්ල යහපත් ලෙස අවසාන වූවාය යන හැඟීම ඔහුගේ සිත සුවපත් කළේය. එසේම පසුගිය කාලය පුරා උන්වහන්සේ දේවතාවුන් වහන්සේ සමඟ පැවැත්වූ ප්‍රිය සම්භාෂණය කරණ කොටගෙන උන්වහන්සේගේ සතුට නැවත දළුලා වැඩී ඇති බව හෙතෙම අනුමාන කළේය. එය එසේ නම් සැබවින්ම උන්වහන්සේ නිරෝගී වනු ඇත. තවත් තරුණ වනු ඇත. මේ අදහස් අතර තාවර වෙවී උන්වහන්සේගේ කුටිය පිරිසිදු කරන අතරතුර ලොකු හාමුදුරුවෝ ඇබිත්ත කොලුවාට මෙසේ කීහ.

'තව පැයකින් හමාරකින් බෝ මළුව ළඟදි මාව මුණ ගැහෙන්ඩ....'

පැයක් ඇතුළත මුළු පන්සලම සුද්ධ පවිත්‍ර කර නා කියාගෙන පිරිසිදු වී ඇබිත්ත කොලුවා බෝ මළුව උඩට ගමන් කළේය. උන්වහන්සේ සුපුරුදු පරිදි බෝ මළුව උඩ භාවනානුයෝගී ව සිටි සේක. ඇබිත්ත කොලුවා මඳක් ඈත් වී උන්වහන්සේ දෙස බලා සිටියේය.

ඔහුට ඔහුගේ ඇස් විශ්වාස කරන්ට බැරි විය. උන්වහන්සේ සැබවින්ම රූපශ්‍රීයෙන් ආඪ්‍යව, සියොලඟින් නොකඩවා විහිදෙන රශ්මි කදම්බයෙන් සන්නද්ධව, පිරිපුන් දෙතොල් කම්මුල් සහිතව අතිශය නිරෝගීව, තාරුණ්‍යයට පත්ව බෝ මැඩ යට බැබළෙමින් සිටියහ. කිලිපොළා යන සතුට වත්තන් කරගන්ට බැරිව හෙතෙම හාමුදුරුවන් දිහාම ඇස් නතර කරගෙන සිටියේය.

'එන්ඩ මෙහාට...'

හාමුදුරුවෝ භාවනානුයෝගීව සිටි ඉරියව්වෙන් ඇස් නොඇරම ඔහුට කතා කළහ.

'ඉඳගන්ඩ මගේ ඉස්සරහින්...'

ඔහු උන්වහන්සේට පියවර කීපයක් ඉදිරියෙන් මුහුණ මුහුණලා ඉඳ ගත්තේය.

'....භාවනා කරන්ඩ මා එක්ක...'

අවුරුදු හතරක පහක මේ අතීතය තුළ උන්වහන්සේ ඇබිත්ත කොලුවාට තමා සමඟ භාවනා කරන්න යැයි ආරාධනා කළ පළමු වතාව මේකය. එබැවින්ම ඔහුට එය අදහාගන්නට බැරි වුණේය. ඊටත් වඩා මේ වෙලාවේ ඔහු උන්වහන්සේගේ නිරෝගී රූපශ්‍රීයෙන් මන්මත්ව සිහි එළවාගන්ට බැරිව සිටියේය. එහෙයින් උන්වහන්සේට ඔහුට මෙසේ විධානය කරන්නට සිදු විය.

'දැං ඇස් දෙක පියාගන්ඩ...'

ඇබිත්ත කොලුවා ඇස් දෙක පියාගත්තේය. එහෙත් වෙනදා තනිව භාවනා කරන විට මෙන් ඔහුගේ සිත සන්සුන් නැත. අනේක සිතිවිලි ඔහුගේ සිත පුරා උඩට පහළට ගමන් කළේය. මෙසේ සිංහල පැයක් ගත වී ගියේය. එලෙසම තවත් පැයක් ගත වී ගියේය. වෙනදා එක දිගට දවස් ගණන් භාවනා කර පුරුදු ඔහුට මේ කාලය කෙනෙකුගේ ජීවිත කාලය තරම්ම දිගු විය. එහෙත් උන්වහන්සේගේ විධානයට මිස, ඇස් නොඇරීමට ඔහු තීරණය කර තිබුණේය. පුරා පැය දෙකකට පසු මුළු ජීවිත කාලයක්ම ඔහු බලාපොරොත්තුවෙන් තත්පරව සිටියා වගේ හැඟුණ උන්වහන්සේගේ ඒ විධානය ඔහුට ඈත අවකාශයකින් වගේ ඇසුණේය.

'දැං ඇස් අරින්ඩ...'

ඔහු ඇස් ඇරියේය. ඒ සමගම ඇස් අදහාගත නොහැකිව සිහි මූර්ඡා වී කපා හෙළූ ගහක් වගේ වැලි මළුව උඩ ඇදගෙන වැටුණේය. ඔහුට සිහි එළවාගන්ට තවත් වේලාවක් ගත විය. අනතුරුව ගෙවුණ තවත් හෝරාවකට විතර පසු ඔහු හුන් තැනින් කෙලින් වී යළි වැලි මළුව මත හිඳගත්තේය. හිඳගෙන යළි උන්වහන්සේ දෙස අවධානය යොමු කළේය. සැබවින්ම ඔහු දුටුවේ කුමක්ද ?

මීට සිංහල පැය දෙකකට පමණ පෙර නිරෝගීව පුෂ්ටිමත්ව කාන්ති විහිදමින් තිබුණ ඒ සිරුර මේ දන් සැබවින්ම මහලු වී තිබුණේය. ඇස් ගිලී කම්මුල් වළ ගැසී තිබුණේය. සම රැලි වැටී මුළු සිරුරම කේඩෑරි වී තිබුණේය. පිරිපුන් දෙතොල් මැලවී සුදු මැලිවී තිබුණේය. මුහුණ පුරා වළගොඩැලි මතු වී ඉදුණු රැවුල් ගස් තැනින් තැන දිගේලි වී තිබුණේය. සැබවින්ම බලා සිටිය නොහැකි තරම් ඒ සිරුර භයංකාරව, මුසලව ජරපත්ව තිබුණේය. ඉවසා සිටින්ට බැරි තැන ඔහු කෑ ගැසුවේය.

'හාමුදුරුවනේ මට දරාගන්ඩ අමාරුයි...'

'ඒත් ඔය ළමයා තේරුම් ගන්ඩ ඕන... මේක තමයි ඇත්ත...'

'ඒත් ඔබ වහන්සේට එහෙම වෙන්ඩ විදිහක් නෑ....'

'බුදු හාමුදුරුවන්ටත් ඕනකම තිබුණ නං, තව කාලයක් පිරිනිවන් නොපා ඉන්ඩ තිබුණ.... ඒත් උන්වහන්සේ එහෙම කළේ නෑ...'

'ඒ වුණාට බුදු හාමුදුරුවන්ට හොඳ සංඝ පරම්පරාවක් හිටිය.... උන්වහන්සේ නැති වුණත් ඉදිරියට අරගෙන යන්න....'

ඇබිත්ත කොලුවාගේ ඒ වචන කීපය සැබවින්ම උන්වහන්සේගේ හදවත තුවාල කළේය. ඒ තුවාල වේදනාව දරාගෙන මොහොතක් නිසොල්මන් වී සිට යළි උන්වහන්සේ මෙසේ වදාළහ.

'මේ කාලෙ ඒ වගේ නෙමෙයි.... අවංකව සිවුරු දරන උන්නාන්සේලා හොයාගන්න අමාරුයි... මගේ ජීවිත කාලය පුරාම ඒකට උත්සාහ කළා... ඒත් මට ඒක සම්පූර්ණ කරගන්න බැරි වුණා. කරන්න දෙයක් නෑ... මේක තමයි මගේ ඉරණම... ඔය ළමය දන්නවද අද දවස කවද්ද කියලා....'

නොසිතූ වෙලාවක උන්වහන්සේ ඇසූ ප්‍රශ්නයෙන් ඔහු තිගැස්සුණේය. එහෙත් වහා ප්‍රකෘතියට පත්ව ඊට පිළිතුරු දෙන්න ඔහුට පිළිවන් වුණේය.

'අද දහසය වෙනිදා.... එක්දහස් අටසිය දාහතරේ වෙසක් මාසෙ දහසය වෙනිදා...,'

'ඔව්... හෙට දාහත් වෙනිදා...'

The Reader's Place

The Reader's Place



The Reader's Place

05

උ් බියකරු උදෑසන මහනුවර මහ වාසලේ වධකයන් විසින් ඇහැලේපොල මහ අදිකාරම්ගේ දෙවු පුත් මද්දුම බණ්ඩාරගේ හිස කඳින් වෙන් කෙරුණු මොහොතේ ලොකු හාමුදුරුවන්ගේ අවසන් හුස්ම 'හෝස්' ගා විශ්ව අවකාශයට එක් වුණේය.

උන්වහන්සේ අවසන් මොහොතේ ඇස් ඇර ඉහළ අවකාශය දෙස ප්‍රීතිමත් බැල්මකින් බලා සිටි අතර කා සමඟ හෝ සංඥා සහිත භාෂාවකින් කථා කළ බව ඇබිත්ත කොලුවා දුටුවේය. සැණෙකින් සිරුරේ ප්‍රාණය නිරුද්ධ වුණත් තව වේලාවක් උන්වහන්සේගේ ඇස් අර සංඥා භාෂාවෙන් තවදුරටත් අදහස් හුවමාරු කරගත්තේය. අවසානයේ ඒ ඇස් ඇබිත්ත කොලුවා දෙසට හැරී නිසල විය. ඔහු තම දෑත් දිගු කර ඒ ඇරුණු ඇස් සදහටම වසන්නට උත්සාහ කළ මොහොතේ මහලුව රැලි වැටුණු උන්වහන්සේගේ බෙල්ලේ රැලි රේඛා අතරින් රුධිරය කාන්දු වන අයුරු දුටුවේය.

දෝතින්ම උන්වහන්සේගේ නිශ්චල ගෙල තද කරමින් කැපුම් තුවාලයෙන් උතුරන රුධිරය නවතාලන්නට ඔහු උත්සාහ කළේය. එහෙත් ඒ රුධිරය කෙතරම් ගොජ දමමින් ඒ නිසල සිරුරෙන් පිටතට කාන්දු වුණාද කීවොත් ඇබිත්ත කොලුවාගේ

The Reader's Place

ඇඟිලි තුඩු අතරින් රුධිරය බේරෙන්නට පටන් ගත්තේය. ඔහු වහා ආවාස ගෙට ගොස් ලොකු බරණියක් ගෙනැවිත් හාමුදුරුවන්ගේ සිරුර කෙළින් කර බෙල්ලෙන් උනන රුධිරය එයට වැටෙන්න ඉඩ හැරියේය. පසුව හාමුදුරුවන්ගේ පරණ අඳනකඩ කීපයක්ම ගෙනැවිත් එකින් එක මත එකින් එක ඔතමින් ගලනා රුධිරය යම් තරමකට පාලනය කරන්නට උත්සාහ කළේය. හදිසියේම එක වර රුධිරය ගැලීම නතර වූ අතර ඒ වන විට බරණියක් පිරෙන්න රුධිරය උන්වහන්සේගේ සිරුරෙන් පිට වී තිබුණේය.

බරණියේ කට වසා ඇතුළු ගෙයි කෙළවරින් තැන්පත් කළ හෙතෙම රුධිරය තැවරුණ රෙදි කැබලි සියල්ලම ඉවත් කර සිරුර හොඳින් නාවා පිරිසිදු කළේය. පසුව උන්වහන්සේ නිතර පෙරවූ පඬු වර්ණ සිවුරෙන් දේහය හොඳින් ආවරණය කර හිසේ සිට දෙපතුලට සියුම්ව නිරීක්ෂණය කළ නමුත් රුධිරය ගලා ගිය කැපුම් පහර උන්වහන්සේගේ බෙල්ලේ රැලි රේඛා අතරින් කොහොමටවත් ඔහුට සොයාගන්න බැරි විය. ඉක්බිතිව හත් වරක් සිරුර පැදකුණු කර ගෞරවාචාර දක්වා කුටියෙන් නික්මී සාංචාර කුලුන අසලට පැමිණි ඔහු සිය සිරුර අරක් ගත් සාංකාවත් වේදනාවත් සැහැල්ලු වනතෙක් පුරා පැයක්ම සිය මුළු වෙර යොදා සාංචාර හඬ නංවන්න පටන් ගත්තේය.

The Reader's Place

රාජසිංහ රජ්ජුරුවන් විසින් ඇහැලේපොල මහ අදිකාරම්ගේ බිරිඳත් දරුවන් හතර දෙනාත් ඔහුගේ නැගණියත් ඇගේ දියණියත් අමු අමුවේ ඝාතනය කළ ප්‍රවෘත්තියත්, ලොකු හාමුදුරුවන්ගේ හදිසි අපවත් වීමත් ගම්මුන් දැනගත්තේ එක මොහොතේය. හවස් වන විට මුළු ගමම පන්සලට එක් රොක් වී සිටියහ.

ගමේ ආරච්චිලත්, කිරිහාමි උපාසක රාළත් ආදාහන උත්සවයේ මූලිකත්වය ගත්හ. එහෙත් ඔවුන් දෙදෙනා සියල්ල කළේ සුදු බණ්ඩා හෙවත් ඇබිත්ත කොලුවාගෙන් හැම දෙයක්ම කලින් විමසා ඔහුගේ කැමැත්ත අකැමැත්ත අනුවය.

එදා හවස ගමේ එක ගෙදරකවත් පහන් පත්තු වුණේ නැත. ඒකට හේතුව අසනීප වූ කෙනෙකු හැර එක ගෙදරකවත් කවුරුත්වත් නොසිටි නිසාය. මුළු ගමම සිටියේ පන්සලේය.

ඒ රාත්‍රියේ මුළු ගමම කළුවර වුණත් ඇස් ඇති කෙනෙකුට ඇස් අදහාගන්ට බැරි විදිහට පන්සල් භූමිය පහන් එළියෙන් ඒකාලෝක වී තිබුණේය. කිසිවෙක් කිසිවෙකු සමඟ අදහස් හුවමාරු කර නොගත්තාහ. ජීවමානව සිටියාට වඩා ලොකු හාමුදුරුවන්ගේ ප්‍රාණ නිරුද්ධ සිරුර හදිසියේ මහලු වූයේ කෙසේදැයි බොහෝ දෙනෙකුට ප්‍රශ්නයක් වූ නමුත් හැමෝම ඒ ප්‍රශ්නය තම හිතේ දරා සිටියා විනා අනෙකා සමඟ හුවමාරු කරගත්තේ නැත. එහෙත් කිව නොහැකි බොහෝ අදහස් හැම මුහුණකම පතුලේ ගිලී තිබුණේය.

පසුවදා හවස් වරුවේ හරිම වාම් විදිහට ලොකු හාමුදුරුවන්ගේ ආදාහන කටයුතු සිද්ධ කෙරිණ. චිතකයේ ගිනි ඇවිළී නිවී ගිය පසු අවට පැතිරුණ අඳුර දෙබෑ කරගෙන මීට කලින් දවසක ඇබිත්ත කොලුවා දුටු පරිදි පන්සලේ බෝධි වෘක්ෂය අසලින් ෂඩ් වර්ණ ආලෝකයක් පැතිරුණේය. ගම්මුන්ගේ සාධුකාර හඬ සමඟ ඒ ආලෝකය පුරා පැයක් එක දිගට එකම විදිහට තිබුණේය.

අසනීපයෙන් සිටියෙකු හැර ගමේ සියල්ලන්ම පාහේ ලොකු හාමුදුරුවන්ගේ ආදාහනයට සහභාගි වුණත් ගෝමරී එයට පැමිණියේ නැත. කොටින්ම ගෝමරී සිය මහගෙදර අතහැර අලුත් නිවසට මැණිකාත්, පුංචාත් සමඟ පැමිණ දැන් අවුරුදු දෙකක් විතර ගත වුණත් එදා මෙදා තුර ඈ ගෙයින් එළියට අඩියක් තිබ්බේ නැත. ඉඳහිට ඇගේ දරුවෙක් ඈ බලන්න ආවා ගියත් ඇය ඒ වෙනුවෙන්වත් කුටියෙන් එළියට බැස්සේ නැත. අවට ලෝකය ඈ සිය කල්පනාවෙන් සහමුලින් මුලිනුපුටා දමා තිබුණාය.

එහෙත් ඇගේ මුළු ලෝකයම වූයේ මේ වන විට එකොළොස්වන වියේ පසු වූ පුංචාය. මීට අවුරුදු දෙකකට විතර ඉස්සර පුංචා මේ නිවසට රැගෙන එන විට ඔහු හොවාගෙන ආ ලී මැස්ස ඔහුට හොඳටම සෑහී තිබිණි. එහෙත් මාසය දෙක තුන යන විට එය එසේ නොවන බව ගෝමරී තේරුම් ගත්තාය. සිහි මූර්ඡාවෙන් සිටියත් ඔහු ටිකෙන් ටික උස යමින් සිටියේය. කණුමැල්ල ගහකින් දිග ඉන්නක් කපාගෙන ආ ඇය හැම දවසකම උදේ හවස ඔහුගේ හිසේ සිට දෙපතුල දක්වා දිග හෙවත් උස මැන්නාය.

ඒ හැම දවසකම සිය නියපොත්තෙන් ඉන්න මත සටහ... තැබුවාය. සිව් මාසයක් ගත වන විට එන්න එන්නම ඒ සට... දික් වන බව ගෝමරී තේරුම් ගත්තාය. ඒ අනුව තව ටික දවසකින් මේ ලී මැස්ස ඔහුට තරම් නොවන බව තේරුම් ගත් ඈ ගමේ ... රාළ කැඳවා රියන් හයක් විතර දිග ඇඳක් කරවූවාය. පසුව ඒ ... අසලින්ම එළන ලද පන් පැදුරක නිදාගන්නට ඈ පුරුදු වූණා...

ඈගේ දවස සැබැවින්ම කාර්ය බහුල විය. උදෑසන අවදිවන ඈ මුලින්ම කරන්නේ ඔහුගේ ඇඳ පසෙකින් වාඩි ... ඔහුගේ තොල් නිකට නාසය පිරිමැදීමය. දරුවෙකුගේ මූණ අම්මා කෙනෙකු කුඩා කළ සිටම පිරිමැද අරපරිස්සමට සක... කළ යුතු බව ගෝමරී සිය මවගෙන් වැඩිවියට පත් වූ කාලයේ උගෙන සිටියාය. පැය භාගයක විතර වන මේ සාත්තුවෙන් පසු ... ඊළඟට කරන්නේ ඔහුගේ උස මනින එකය. කණුමැල්ල ඉන්නෙ... දෙතුන් වතාවක්ම හිසේ සිට දෙපතුල දක්වාම මැන ඈ ඉන්... සටහන් තබා ගනියි. මෙය ටිකක් කාලය යන වැඩකි. මන්දයත් ඒ සෑම මැනීමක්ම ඊට කලින් දවස සමගත් ඊට කලින් සති... සමගත්, ඊට කලින් මාසය සමගත්, බොහෝවිට ඊට කලින් ... සමගත් සන්සන්දනය කිරීමට සිදුවන නිසාය.

ඊට පසු ඈ ඔහුගේ වැඩෙන නියපොතු කටින් හපා ඉවත් කරයි. එය කලාත්මක වැඩකි. එකදු ඇඳ කුඩයක් නැතිව ... කරන්නට ඈ සමත්ය. ඊළඟට සම්පූර්ණයෙන්ම ඔහු නිරුවත් කොට සෑම දිනකම මැණිකා විසින් ගෙයි පිළිකන්නේ ළඳ... කල්දේරමක උතුරවන බෙහෙත් දියරෙන් හිස සේදීමත්, ඇඟ සේදීමත් සිදු වෙයි. පිරිසිදු රෙදි කැබැල්ලකට බෙහෙත් වතුර පොඟවා ගන්නා ඇය එයින් ඔහුගේ හිසත් ඇඟත් තෙත මාත්තු කරමින් ඉතා අර පරිස්සමෙන් දෝවනය කරයි. ඇඟ සෝදා පිරිසිදු කිරීමෙන් පසු ඈගේ නිරීක්ෂණ කාලය එළඹෙයි. ඔහු අඩ නිරුවත්තරෙන් උඩුබැලි අතට වැතිර සිටිද්දී ඈ ඔහුගේ රෝම කූපයක් ගානේ ඔහුගේ ශරීරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කරයි. පපුව මැද මෝදු වන මවිල් ගහක් නැතිනම් පුරුෂ නිමිත්ත අසලින් මතු වන මවිල් ගහක් දකීම ඈගේ දවසේ සතුට උපරිමයට ළං කරයි.

The Reader's Place

ඔහුගේ සිරුරේ මේ හැම විපර්යාසයක්ම සටහන් කළ හම් කඩක් ඈ නඩත්තු කළාය. එහි දින වකවානු නිවැරදිව සටහන් තබන්නට ඈ අපමණ වෙහෙසක් ගත්තාය. මේ මිහිමත තිබෙන කිසිම රටක භාවිතා නොවුණු, කිසිවෙකු නොදත් එහෙත් ඇය පමණක්ම දත් සංකේත භාෂාවක් ඈ මේ සටහන් සඳහා භාවිතා කළාය. එහි ඉලක්කම් පවා සටහන් කර තිබුණේ කවුරුත්වත් නොදන්නා ඉරි කැලි වැනි සංකේත හරහාය.

ඉන් ඉක්බිතිව පුරුෂ නිමිත්තේ දිග පළල මනින වේලාව එළඹෙයි. ඒ සඳහා ඈ කොහොඹ ගසේ දණ්ඩක් උපයෝගි කර ගත්තාය. උස මනින ආකාරයෙන්ම ඈ කොහොඹ දණ්ඩේ නැතින් තැන සටහන් තබා තිබුණාය. විෂ උරාගන්නට කොහොඹ ගහට ඇති විශේෂ ශක්තිය නිසාම ඈ ඔහුගේ පුරුෂ නිමිත්තේ දිග පළල මනින්න භාවිතා කළ කොහොඹ දණ්ඩට අමතරව ඔහුගේ තට්ටම වැහෙන්න කොහොඹ කොළ අතුරා තැබුවාය. මේ සියලු කළමනා අහවර වන විට මධ්‍යාහ්නය පසු වී ඉර අවරට ගොස් ඉවරය. ඈ ඈගේ කුටියෙන් එළියට එන්නේ මේ සියලු වත් පිළිවෙත් අවසන් කර ඔහුට පිරිසිදු ඇඳුමක් අලුතෙන් ඇන්දවූවාට පසුවය.

එහෙත් මේ සියලු දේ පරයා ගෝමරීත් පුංචාත් අතර අසාමාන්‍ය බැඳීමට හේතු වුණ තවත් සුවිශේෂ කරුණක් තිබුණේය. එනම් පුංචාගේ හදවතින් නැගුණ ඩිග් ඩිග් ශබ්දයයි. ඇයට කිසි විටෙක ඔහුගේ හදවත් ශබ්දය නොඇසා සිටින්න බැරි විය. වරක් මොකක්දෝ හදිසියකට මහගෙදර මායිමට ගිය වේලාවක ඈ ක්ලාන්ත වී වැටුණාය. ඈගේ දරුවෝ ඈ කර තියාගෙන ඈගේ ගෙදර කිට්ටුවට එන විට පුංචාගේ හදවත් ශබ්දය ඇතුළු කාමරයේ සිට ඇසෙන්නට වූයෙන් ඈ ඔවුන්ගේ කර මතින් බැස වන කඳුරු කින්න කුළුහරුපෙන් ඔවුන්ට බණිමින්, මොන එහෙකට මං කර තියාගෙන ආවාදැයි අසමින් හොඳ සිහියෙන් එතැන් සිට ඇවිදගෙන ගෙට ගොඩ වුණාය.

දොට්ට පිලට ගියත් ඇයට පුංචාගේ හදවත් ශබ්දය ඇසිය යුතු විය. එබැවින් ඈ එළිබහින්න එළියට ගියේ ඔහුගේ හදවතේ ඩිග් ඩිග් හඬ ඇසෙන දුරට විතරය.

මෙහි සම්පූර්ණ ප්‍රතිපක්ෂය වූයේ මැණිකාය. ඇගේ බඩවැල කඩාගෙන එළියට ආ දා පටන් ඇගේ දරුවන් අතරින් ඇයට වඩාත්ම ආදරය දක්වූයේ මැණිකාය. ඒ නිසා අනෙක් දරුවන් ඈ තනිකර සිටිද්දී ඇගේ තනි නොතනියට ඈ සමඟ මේ නිවසට එන්නට තරම් දනුම් තේරුම්කමක් සහ ළෙංගතුකමක් අවුරුදු අටක කුඩා දරුවකුව සිටිද්දී පවා ඇයට තිබිණි. අවුරුදු දෙකක් පුරා නොකඩවා මැණිකා ඈ වෙනුවෙන් යුතුකම් කළත් ඇයට කොහෙත්ම දරාගන්ට බැරි වුණේ සිහි මූර්ඡාවෙන් සිටි පුංචාගේ හදවතින් නැඟුණ 'ඩිග් ඩිග්' හඬය. දවස් කීපයකම මහ රාත්තිරියේ ඈ නපුරු සිහින දක භූ තියාගෙන නැගිට්ටාය. එක් දවසක් ඈ තෙල් මතුරන්නට ආ කට්ටඩි රාළට ප්‍රකාශ කළේ මහ සොහොන් යකා තමාගේ කැවුත්ත එළියට ඇද ලේ පෙරාගෙන කන්නට හැදුවත් එහි කිසි වටිනාකමක් නැති බව දුන එහි ශබ්දය අසා ඉන්නට තම කන ළඟින් තබා ආපසු ගිය බවය.

නූල් මතුරා තුන් හතර වරක් හරි නොගිය තැන කට්ටඩි රාළ ඇයට ගෙදර සිටින හැම වෙලාවකම කන්වලට ඇබ ගසා සිටින්නට නියම කළේය.

මේ නිසා ඇය තම මව ගෝමරී සමඟ පවා කතා බහ කළේ හස්ත මුද්‍රාවෙනි. දෙදෙනාටම එය මහත් සහනයක් වූ අතර වචනවලට වඩා ඉවෙන් දෙදෙනා දෙදෙනාට උවමනා දේ හුවමාරු කරගත්හ. මුලින් මුලින් ගෙදරින් බැහැරට යන විට මේ ඇබ ගලවන්නට පුරුදු වුණත් පසුව එය තනිකරම තේරුමක් නැති වැඩක් බව ඈ හඳුනාගත්තාය. මිනිසුන්ගේ කෑ කෝ ගැසීම, බැණ අඬගෑම්, එකිනෙකා අමතන නීරස වචන පමණක් නොව පරිසරයේ සියලු ශබ්ද පවා ඇයට තිත්ත විය. ඒ සියල්ල හිතේ සාමය කෙලෙසන අනවශ්‍ය දේ බව ඈ ඇගේ පුංචි මොළෙන් හඳුනාගත්තාය.

අවසානයේ සදහටම ඈ කනේ ඇබ ගසා සිටින්නට පුරුදු වූ අතර සදාතනික නිහඬතාවයට ප්‍රේම කරමින් සදාතනික බිහිරි භාවයට පත් වූවාය. එයින් ඇය කොතරම් ප්‍රීතියක් භුක්ති වින්දාද කියතොත් කන් ඇසීමෙන් තමා කුඩා කාලයේ දරුණු

දේව සාපයකට ලක්ව සිටි බවත් හදිසියේ පුංචාගේ වෙස් ගෙන පැමිණි දේව ආශිර්වාදයකින් තමා ඒ සාපයෙන් ගලවාගත් බවත් ඈ තිරව විශ්වාස කළාය.

සේදරා තම මව ගෝමරී වෙනුවෙන් වෙනම නිවසක් හදන්ට ගත් තීරණයේ අතුරු ප්‍රතිඵලය වූයේ පොඩිනා හා බිංදු සඳහාද වෙනම නිවසක් තැනීමය. කොහොමටත් බිංදු උපන් දා සිටම පවුලේ කිසිවෙකුට සමාන නොවීය. ඔහුගේ ඇවතුම් පැවතුම් තනිකරම වෙනස් විය. මහගෙදර සිටියදී පොඩිනා එහා මෙහා වුණු විටෙක ගෙයි ඉස්සරහ පිල ළඟ මැටි බිත්තිය කඩාගෙන වැටෙන තරමට හයියෙන් බිංදු බෙරිහන් දුන් දවසේ සිට සේදරා බිංදු පිළිබඳව සිටියේ කෝපයෙනි. ඊළඟට තවත් දවසක උයන ගෙයි දුම් මැස්ස බිංදුගේ හඬට 'බරාස්' ගා කඩා වැටුණු විට බිංදු පිළිබඳව කිසියම් තීරණයක් ගත යුතු යැයි සේදරා කල්පනා කළේය.

එහෙත් එතනා බිංදුගේ පුරුෂ නිමිත්තට බිය වී සිහි මූර්ඡා වූ දිනයේ සේදරා බිංදු පිළිබඳව තීරණයක් ගත්තේය. ඔහුට ප්‍රශ්නය වුණේ එය කෙසේ ක්‍රියාත්මක කළ යුතුද යන්නයි. අවසානයේ තම මව පිළිබඳව තීරණයක් ගත යුතු තැනට ඔහු පත් වූ විට බිංදු වෙනුවෙන් ගත් තීරණය ක්‍රියාත්මක කරන්නට ඔහු එය මාවතක් කරගත්තේය.

ලොකු හාමුදුරුවන් අපවත් වන විට බිංදු සිව්වැනි වියට එළඹ සිටියේය. එහෙත් උපන්දා සිට මේ සිව් වසර පුරාම දවසට තුන් වරක් බැගින් නොකඩවා පොඩිනාගේ කිරි බුරුලු උරා බී තන කිරෙන්ම පෝෂණය වී සිටි බැවින් ඔහුගේ පෙනුම දොළොස්විය ඉක්ම විය. උපන්දා සිටම බිංදුට ලොකුම ලොකු ප්‍රශ්නයක් තිබුණේය. එනම් ඇඟ මැද්දැවෙන් මේ එළියට එල්ලෙන මස් වැදැල්ල කුමක්ද යන්නය. දවසක් මර හඬ තියා කෑ ගාගෙ වත්ත පිටියේ සිට ගෙදර දුවගෙන ආ දිනෙක පොඩිනා බිංදුගෙ න් එසේ කෑ ගසන්නට හේතු විමසුවාය. මුකුත්ම නොකියා ද දෙකෙන්ම රහසග තද කරගෙන සිටි බැවින් අන්තිමේදී පොඩි

The Reader's Place

රෙදි පොට්ටනියේ රෙදි එකින් එක ඉවත් කර ඔහු නිරුවත් කළාය. එවිට හොඳටම තුවාල වී ලේ වැක්කෙරෙමින් තිබූ ඔහුගේ පුරුෂ නිමිත්ත ඇය දුටුවාය.

'මං මේ ලොකු කුරුමිණියව ගලකින් තැළුවා...'

කල්පනා කරන්න අමතර කාලයක් නොවූ බැවින් පොඩිනා වහා කැළයට ගොස් අතට අහුවෙන බෙහෙත් ගස් හත අටක් උඟුල්ලා ගෙනැවිත් තම තන කිරෙන් මිශ්‍ර කර මැල්ලුමක් හැදුවාය. පසුව බිංදුගේ අත පය හතර ඇඳේ බැඳ රහස් ප්‍රදේශයේ එය තවරා පාන්කඩ රෙදිවලින් හොඳින් වෙළුවාය. හදිසියේ කළ මේ ගොඩ වෙදකමෙන් ඉක්බිතිව පහුවදා වෙද රාළ ගෙන්වන්න ඈ තීරණය කර තිබුණත් පසු දින උදේ වෙළුම් පටි ගලවන විට හිතාගන්න බැරි තරමට තුවාල සුව වී තිබුණේය. පසුව දෙවන දිනටත් ඈ කලින් දින ප්‍රතිකර්මයම කළාය. දින පහක් ගතවෙන විට බිංදුගේ රහස් ප්‍රදේශයේ තුවාල හොඳටම හොඳ වී තිබුණේය.

එපමණක් නොව ඒ ගොඩ වෙදකමෙන් පසුව ඔහුගේ පුරුෂ නිමිත්ත තවත් හැඩි දැඩි වී තිබුණේය.

ඒ දවස් පහ තුළ කතන්දර කියන පරිද්දෙන් මේ මස් වැදැල්ල හැම පිරිමියෙකුටම තියෙන බවත්, එය කපා දැමුවොත් මිනිහා මැරෙන බවත්, ඒ නිසා මින් ඉදිරියට එය කිසිම දවසක තුවාල කර නොගත යුතු බවත් පොඩිනා ඔහුට තේරුම් කරදුන්නාය.

'...ඒ වුණාට එතනට තිබුණේ මේ වගේ එකක් නෙමෙයි...'

පොඩිනාගේ සියලු කතා අවසානයේ බිංදු තම හිත තුළ කැකෑරෙමින් තිබූ ඊළඟ ලොකුම ප්‍රශ්නය එසේ එළියට දැම්මේය.

'යකෝ... මිනිස්සුයි ගෑනුයි වෙනස්... මං ඒක උඹට පස්සේ කියල දෙන්නං...'

පොඩිනා බැරිම තැන මහ හඬින් බෙරිහන් දුන්නාය.

එතනා බිංදුගේ පුරුෂ නිමිත්ත දැක සිහි මුර්ඡාවූ දිනයේ සිට ඇය ඔහුට බිය වූවාය. ඒ නිසා යළි කිසි දිනයක ඇය ඔහු සමඟ සෙල්ලම් නොකළාය. කොහොමටත් කිසිවෙකුට දෙවෙනි නොවූ කුඩා බිංදුද එදා සිට එතනා ප්‍රතික්ෂේප කළේය. එහි ප්‍රතිඵලය වූයේ බිංදු ඔහුට වඩා හය වසරකින් පමණ වැඩිමහලු වූ මැණිකා සමඟ ළෙංගතු වීමය.

මැණිකා ඇසුරු කරන්නට ගත් දවසේ සිට බිංදු කෙමෙන් වෙනස් වන්නට විය. නරක, දඩබ්බර, මුරණ්ඩු, නිතර බෙරිහන් දෙන ළමයෙකු වූ බිංදු කෙමෙන් නිශ්චල ගති පැවතුම් ඇති ළමයෙකු බවට පරිවර්තනය වුණේය. එයට හේතුව වුණේ කනේ ඇබ ගසාගත් දිනයේ සිට මැණිකා හස්ත මුද්‍රාවෙන් කතා කරන්නට වූ පුරුද්ද කෙමෙන් බිංදුටද ආරෝපණය වීමය. කෙමෙන් තමාගේ අසාමාන්‍ය මස් වැදැල්ල පිළිබඳ ප්‍රශ්නයත්, පිරිමි ගෑනු වෙනස් වන්නේ ඇයි කියන ප්‍රශ්නයත් බිංදුගේ සිතින් මැකී ගිය අතර ඉතා ඉක්මනින් හස්ත මුද්‍රා භාෂාව දෙදෙනාගේ නව භාෂාව බවට පත් වුණේය. කල් ගතවත්ම දෙදෙනා කෙතරම් ඒ භාෂාවේ නිපුණ වීද කියතොත් එක් අයකුගේ සිතේ සිතුවිලි පවා සියුම් හස්ත මුද්‍රාවකින් තේරුම් ගන්නට දෙදෙනාට හැකි විය.

පොඩිනා තව තවත් තරුණ වෙමින් සිටියාය. බිංදු වෙනුවෙන් අවුරුදු හතරක් තිස්සේ එක ඔසෙට කිරට හැරුණ ඇගේ රුධිරය කොහෙන් ඉනුවාදැයි ඈ දැන සිටියේ නැත. ඈට තිබුණ ලොකුම ප්‍රශ්නය වැරදිලාවත් දවසේ තුන් වේලෙන් එක වේලක් හෝ බිංදු කිරි නොබී හිටියොත් එය ඉවසා දරා සිටින එකය. එවැනි වේලාවක කිරි බරින් පිරුණු ලොකු පියයුරු අතින් පොඩිකර ඈ බිංදු අමතන්නීය.

'මෙහෙ වරෙං... මයෙ කිරි කොටේ... ඔහොම බඩගින්නෙ ඉඳල හරියනවද....? ඔය සෙල්ලං නතර කරල මේ තන බුරුල්ල කටේ ගහගනිං...'

ඈ හොඳින් හෝ නරකින් හෝ එවැනි වේලාවක බිංදු ළඟට ඇදගෙන සිය තන බුරුල්ල ඔහුගේ කටේ එබුවාය.

එහෙත් අලුත් ගෙදරට ඇවිත් අවුරුද්දක් ඉක්ම ගොස් එළඹුණු මැදින් මාසයේ දවසක ඈ හොඳටම වියරු වැටුණු සිද්ධියක් වුණේය. බිංදු හදිසියේ අසනීප වුණේය. කොලුවා පරීක්ෂා කර බැලූ වෙද රාළ කිව්වේ නිකං කැළෑ උණක් බවත්, බය වෙන්ට කාරියක් නැති බවත්ය. දවස් හතරක් පහක් එක දිගට පොවන්න කසාය වට්ටෝරුවක් ඔහු ලියා දුන්නේය. තන කිරි විතරක් පුරුදු වී සිටි නිසා වෙද රාළගේ කසාය බිංදුගේ උගුරෙන් පහ

The Reader's Place

ගියේ නැත. ඒ නිසා ඒ කසාය තම තන කිරි සමඟ මිශ්‍ර කර බිංදුට පොවන්න පොඩිනාට සිදු විය. කසාය වඩි හතර පෙවෙන විට කොලුවා යහපත් අතට හැරෙන්න පටන් ගත්තේය. දවස් පහ ගතවෙන විට ඔහු සැහෙන සුවයක් ලබා තිබුණේය.

එහෙත් පොඩිනාට තිබූ ප්‍රශ්නය වුණේ බිංදුගේ අසනීපය නොවේ. ඒ අසනීපය නිසා එක දිගට නව දවසක් බිංදු වෙනදා මෙන් පොඩිනාගේ කිරි නොබී සිටි එකය. දවස් දෙකක් කිරි බරින් පිරෙන පියයුරු අතින් පොඩි කරමින් ඇ ඉවසා සිටියාය. තුන්වන දවසත් ඇ ඉවසුවාය. හතරවන දවසේ හොඳටම වියරු වැටුණ ඇ අන්තිමට මැණිකාට කියා මඩක්කු දෙකක් ගෙන්වාගෙන සිය දෙඅතින් කිරි බුරුලු තෙරපමින් මඩක්කුවලට කිරි එකතු කළාය. 'කීස් කීස්' ගාමින් එක දිගට තන බුරුලුවලින් පිටවුණ කිරි මැණිකා මඩක්කුවලින් බරණිවලට එකතු කළාය. මෙසේ ඒ නම දවස ඇතුළත බරණි දාහතක කිරි ඔවුහු එකතු කළෝය. පසුව ගමේ හැම ගෙදරකටම කිරි මඩක්කුව බැගින් මැණිකා පිටත් කළාය.

අන්තිමට තවත් කිරි බරණිවල ඉතිරි වූයෙන් ඒවා ගමේ සියලු බල්ලන් බළලුන් එක් රැස් කරලා උන්ට ඇති තරං බොන්ට කිරි දානයක් දුන්නාය. එපමණක් නොව මේ හැම දවසකම මැණිකා සිය මවට නාගන්නටත්, පුංචා නාවන්නටත් ඇති තරම කිරි ගෙදරට පිටත් කර හැරියාය.

ගෝමරීගේ කුසින් බිංදු එළියට ගත් දා පටන් පොඩිනා වැදුම්ගෙයි විත්තමූකම් කෙරිල්ල අත් හැරියාය. ගමේ මිනිසුන් ඒකට ඒ තරම් මනාප නොවුණත් බිංදුගේ කළමනා කරන්න ගත් දා සිට ඇට වෙන දෙයක් කරන්න වේලාවක් තිබුණේ නැත. මිනිහෙකු සමඟ ඇඳක් ඉඳුල් නොකළ තවමත් පිරිසිදු කන්‍යාවක් වූ පොඩිනා ඇත්තටම බිංදුට විත්තමූකම් කරන්න මත්තෙන් තරුණයන් දෙදෙනෙකුටම යම් තරමක කැමැත්තෙන් සිටියාය. අවුරුදු හතළිහ පිරුණු මේ තලතුනා ගැහැනියට මුලින් ඔවුන්ගේ වැඩි කැමැත්තක් නොතිබුණේය. එහෙත් බිංදු වෙනුවෙන් ඇගේ තන පුඩුවල කිරි එරෙන්න පටන් ගත් දා සිට ඇ දවසින් දවස තරුණ වෙන්නට පටන් ගත් බැවින් ඔවුහු පොඩිනාගේ ගෙදර අවට නිතර නිතර කැරකෙන්න පටන් ගත්තෝය.

පොඩිනා බිංදුට කිරි දෙන වේලාවට ඔවුහු එකිනෙකාට හොරෙන් පොඩිනාගේ ගෙදරට සේන්දු වූ අතර ඇ සමඟ විවිධ මාතෘකා ඔස්සේ කතා කරන්නත් සූදානම් වී ආවෝය. මේ දෙදෙනාගෙන් පොඩිනාගේ හිත වඩාත් ඇද බැඳ ගත්තේ මුතු බණ්ඩාය. පයුරුපාසනයට බිංදු හැර කිසිම මිනිස් පුළුටක් නොසිටි බැවින් එක අතකට ඇයට මෙය තරමක අස්වැසිල්ලක් වුණේය. මෙසේ දවසක් මුතු බණ්ඩා සමඟ කතා බහ කරමින් සිටි වේලාවක ඔහු බිංදුගේ පුරුෂ නිමිත්ත අහම්බෙන් දැක සිය විමතිය පළ කළේය.

'...අම්මෝ පොඩි වුණාට මූගේ පිරිමියගෙ ලොකු....'

'මං බෙහෙත් කළා ලොකු වෙන්න...'

පොඩිනා එයට එසේ පිළිතුරු දුන්නේ වැඩිය නොහිතා කටට ආපු පළියටය. එහෙත් මුතු බණ්ඩාට එය නිකම් පිළිතුරක් නොවීය.

'අනේ නිකා ඉඳහං... බොරු කියන්නේ නැතුව..'

'බොරු මොකටද... උඹටත් ඕන්නං මං හදල දෙන්නං... හැබැයි කාටවත් කියන්න තහනම්..'

අවසානයේ පොඩිනා බිංදුගේ රහස් ප්‍රදේශයේ තැවරූ බෙහෙත් මැල්ලුම නැවත සකසා මුතු බණ්ඩාට දුන්නාය.

ඊට සති තුනකට පසු දවසක ඔහු ඇයට එහි ප්‍රතිඵල මෙසේ දැනුම් දුන්නේය.

'ඔහේ දිව්‍ය අවුසදයක් හදල තියෙන්නේ.. දෙයියම්පල්ල බලන් ඉන්නකොට පිරිමිය ලොකු වෙනවා ඒක තැවරුවම...'

මුතු බණ්ඩාගේ මේ ප්‍රකාශයෙන් තවත් සතියකට විතර පසු ඔහුත් සමඟ මාරුවෙන් මාරුවට එකිනෙකාට හොරෙන් ඇ බලන්නට ආ අනෙක් තරුණයා ඇ සමඟ නොයෙක් විස්තර කතා කරමින් සිට යන්නට සැරසී හොර ගල් අහුලමින් වාගේ මෙසේ කීවේය.

'....වරදවා හිතන්ඩ එපා... මුතු බණ්ඩා මට කීවා බෙහෙත් අවුසදයක් ගැන. මං කාටවත් කියන්නේ නෑ... තියේ නං මටත් ඩිංගිත්තක් දෙන්ඩ ගාල බලන්ඩ...'

The Reader's Place

බිංදුට කිරි පොවන අතරතුරේ ටිකක් කල්පනා කළ පොඩිනා අවසානයේ මෙසේ පිළිතුරු දුන්නාය.

'...උඹලට කියන්ඩ... ඔය වට්ටෝරුව මහ පුරාණ එකක් ... ලොකු වියදමක් යනව මට ඕක හදන්ඩ... උඹල හින්ද මං තඹ සල්ලි දහයකට ඒකෙන් ඩිංගිත්තක් දෙන්නං...'

කියන පරක්කුවෙන් තරුණයා තම ඉණ අතගා තඹ සල්ලි කීපයක් ඇගේ අත උඩ තිබ්බේය.

ගමින් ගම කතාවෙන වාං දුම්මා වාගේ සල්ලි උතුරන මහා වෙළඳාමක ආරම්භය සිද්ධ වුණේ එසේය. මුලින් එකා දෙන්නා හොරෙන් වාගේ මේ 'පිරිමියා ලොකු වෙන රහස් බේත' ගන්ට හොර ගල් ඇහුලුවත් පස්සෙ පස්සේ ඒ ලැජ්ජා බය අභිබවා කාගෙ කාගෙත් උවමනාව ඉදිරියට ආවේය.

මෙය ගන්න ආ සමහරෙකු තවත් කෙනෙකුට කීවේ, මං මේ බලන්ඩ ආවේ මොකක්ද ඔය දිව්‍ය අවුසදේ කියලා මිසක් ගන්ඩ ආවා නොවේ කියාය. තවත් කෙනෙකු ගන්නම ගන්න සල්ලිත් ලෑහැස්ති කරගෙන පැමිණියත් එතැන සිටියෙකුට කීවේ කොච්චර කිව්වත් මට නං ඔය බේත ගැන විශ්වාසයක් නැති බවය. එහෙත් ඔහු කෙතරම් ඒ ගැන විශ්වාසය තබා තිබුණාද යන්න ඔහු එසේ කී ස්වරය තුළම තිබුණේය.

තවත් සමහරෙකු පොඩිනාගේ මූණට, 'මට නං ඕව උවමනා නෑ.. මගේ යාළුවෙක් ඕක ගාල බලන්ට ඕන කියනවා,' යැයි කීවත් වෙන කාටවත් වඩා ඔහුට එය උවමනා බව පොඩිනා හොඳින්ම දැන ගත්තාය.

බොහෝ දෙනෙකුගේ අදහස වුණේ අවුරුදු විස්සකටත් වැඩිය වින්නඹුකම් කොට සිය ගණන් මිනිසුන්ගේ රහස් තැන් අත ගෑ පොඩිනාට මේ බෙහෙත් වට්ටෝරුව දෙවියන් සිහිනෙන් කියා දුන් එකක් බවය. ඒ නිසා මේ 'දිව්‍ය' ඖෂධය අවිශ්වාස කළ අයෙක් සොයාගැනීම කළුනික සොයනවාට වඩා අමාරු විය. අනෙක් අතට මැල්ලුම් තවරා දවස් දෙක තුන යන විට එහි ප්‍රතිඵල ඇස් පනා පිට පේන්න ගත් බැවින් කටින් කට ගමින් ගම මේ ඖෂධයේ බලවත්කම පැතිරෙන්න පටන් ගත්තේය.

කෙසේ වෙතත් මාසය කිට්ටු වන විට හැම උදෑසනකම හතළිහක පනහක පිරිමි පෝලිමක් පොඩිනාගේ ගේ ඉදිරිපිට පෙළ ගැහෙන්න පටන් ගත්තේය. ඒ සමග කොතෙක් කාර්ය බහුල වුණත් දවසට තුන් වේලක් බිංදුට කිරි පෙවීම ඇයට කොහෙත්ම අත් හළ හැකි දෙයක් නොවූ බැවින් මේ සියලු වැඩ කළමනාකරණය කිරීමේ අර්බුදයකට ඈ මුහුණ පෑවාය.

ඈ කැලේට ගොස් බෙහෙත් ගස් උගුල්ලාගත යුතු විය. පසුව සියල්ල සුද්ධ කර කිරුම් බරට සකස් කරගත යුතු විය. ඊළඟට සිය තන බුරුල්ලෙන් තන කිරි වෙනම දොවා ගත යුතු විය. ඊටත් පසුව එය නිවැරදිව මිශ්‍ර කර පදමට සකස් කරගත යුතු විය. බෙහෙත් හැදීමේ මේ කටයුත්තට අමතරව ඈ මේ එන මිනිසුන් ආන්බාත් කළ යුතු විය. ඔවුන්ගේ මුදල් ගණන් කර නිවැරදිව බාරගත යුතු විය. නැතිනම් හුවමාරුවට ගෙනෙන අනේකවිධ බඩුබාහිරාදිය කිරාමැන බාරගෙන ඊට සරිලන පරිදි බේත් ලබා දිය යුතු විය. ඒ සියල්ලම කරන අතරතුරේ බිංදුගේ රාජකාරිය ද කළ යුතු විය.

The Reader's Place

දවසක් හැන්දෑවරුවේ පොඩිනා, මැණිකා අතේ මහ ගෙදර සිටි රතාට පණිවිඩයක් යැව්වාය.

මහගෙදර වැඩිමලා වූ දානත් වියැති සේදරාටත්, ඔහුට බාල දානතර වියැති ටිසිරිටත් බාල කොලුවා වූයේ දොළොස් හැවිරිදි රතාය. පවුලේ කාටත් වඩා නිස්සද්ද චරිතයක් වූ රතාගේ ගති ස්වභාවය මේ විදිහ යැයි හරියටම කිව හැකි කිසිවෙකු නොවීය. වෙලාවකට පූස් පැටියෙකු වාගේ හරිම අහිංසකයෙකු වූ ඔහු වෙලාවකට මාරාවේශ වූ වලහෙක් වුණේය. තවත් වෙලාවක හරිම උපාසකයෙක් වූ ඔහු තවත් වෙලාවක පුදුම කපටියෙක් වුණේය. තවත් විටක කාගෙත් පුරතලා වූ ඔහු තවත් විටෙක කාගෙත් තරුමයා වුණේය. එහෙත් ඔහු අහිංසකයෙකු වූ විට තම සහෝදරයන්ගේ ඇගේ දවටී පුරතල් වෙන්න ගියේ නැත. එසේම මාරාවේශ වූ විට ඇගට කඩාගෙන පනින්නවත් පන බැණගන්න ගියේවත් නැත. මේ නිසා ඔහු මොන වගේ එකෙක්ද කියන එක වෙන කවුරුන්වත් තියා ඔහුවත් හරියට දැනගෙන හිටියේ නැත.

බාග විට ගෝමරීට ඇගේ දරුවන්ගෙන් වැඩිපුරම ආදරේ කළේ රනා විය හැකිය. පුංචා සිහි මුර්ජා වීමේ ප්‍රතිඵලයක් විදිහට ගෝමරීට තම නිවස අතහැර අලුත් නිවසට යන්න සිදු වූ විට රනා තම සහෝදර සහෝදරයන් ඉදිරිපිට කඳුළක්වත් හෙළුවේ නැත. එහෙත් ඊට පහුවදා ගෙදරින් අතුරුදන් වූ රනා දවස් දෙකකට පසු කැලෑවේ සියඹලා ගහක් යට වැටී සිටියදී සොයාගන්නා විට වල් පිහියෙන් නහර දෙකක් කැපෙන්න අත කපාගෙන සිටි අතර විසි තිස් වතාවක් සියඹලා ගහේ ඔළුව හප්පාගැනීම නිසා ඇග පුරා ලේ පෙරාගෙන අවසිහියෙන් සිටියේය. තුවාල සම්පූර්ණයෙන් සුව වූ පසු දවස් දෙකකට සැරයක් ගෝමරී බලන්න ඇගේ ගෙදරට යන එක ඔහු පුරුද්දක් කරගත්තේය.

ඔහු හැමදාම ගෝමරී බලන්න ගියෙත් ආවෙත් හැන්දෑවේ එකම වේලාවකය. ඒ හැම දවසකම හොඳ බුලත් විටක් ඒදගෙන ගෙයි පිල උඩ ඉඳගෙන මිදුල හරහා වටේටම බුලත් කෙළ ගසමින් හෝරාවක් විතර ඇගේ ගෙදර ගත කළත් කවදාවත් ඈ සමග වචනයක්වත් කතා කළේ නැත. එසේම ඒ හැම දවසකම ඒ හෝරාව ගෙවී ගිය පසු පිල උඩින් නැගිට එකම එක වරක් ඇගේ මූණ බලා 'යන්නං' වත් නොකියා ඔහු ආපහු යන්න එළියට බැස්සේය.

පවුලේ සියලු දෙනාම ඔවුන්ගේ අප්පුච්චා වූ පුංචි රාළ කෙරෙහි උපන් ගෙයි බියක් දක්වූවත් ඔහුට බිය නොවූ එකම දරුවා රනාය. සතියකට සැරයක් හැම සෙනසුරාදාවකම ඔහු සිය අප්පුච්චා බලන්න ගියේය. සෙනසුරාදා වල්ලී ශාස්ත්‍ර කියන දවසක් වූ බැවින් පුංචි රාළ එදාට හිටියේ හේනේ ගහ උඩ පැලේය. එදාට ගෝමරී බලන්න යන දවසක් වුණොත් ඒ ගෙදර ගොස් රනා කෙළින්ම පුංචි රාළගේ පැලට ගියේය. පුංචි රාළ වල්ලී සමග ගෙයින් පිටමං වුණු දා සිට රනා මේ පුරුද්ද එකම සතියකවත් අත් හැරියේ නැත.

කොහොමටත් පුංචි රාළ හැම සෙනසුරාදාකම රනා වෙනුවෙන් තුමක් හෝ කෑමක් ලෑස්ති කර තිබුණේය. එය මයියොක්කා අල බතල හෝ හාවෙකු මීමෙකු මුවෙකු ගේ පිලිස්සූ මසක් හෝ විය.

The Reader's Place

මස් පලහා කන්න රනා කැමැත්තෙන් සිටි බව කිසිම දවසක නොකීවත් පුංචි රාළ එය දන සිටියේය. ඒ නිසා සෙනසුරාදාට දඩයමේ ගොස් කෙසේ හෝ මොනම මසක් හෝ ලෑස්ති කිරීම පුංචි රාළ පුරුද්දක් කරගත්තේය. ඒ වගේම රනාද හැම සෙනසුරාදාකම පුංචි රාළ වැඩිපුර කන්න කැමති මොනා හෝ පැණි රහ කෑම ජාතියක්, හකුරු මුලක්, අතිරහ මල්ලක්, කැවුම් මුලක් වැනි දෙයක් පැලට ගෙන යෑම පුරුද්දක් කරගෙන සිටියේය.

ඒ නිසා දෙදෙනාම දෙදෙනා බලාපොරොත්තුවෙන් සිටියහ. පුංචි රාළ රනා ගෙනෙන පැණි රහ කෑම කන්නත්, රනා පුංචි රාළ පලහන මස් කන්නත් බලාපොරොත්තුවෙන් සිටියේය. ගෝමරීගේ ගෙදරදී වගේම රනා පුංචි රාළගේ පැලේදීද කතා කළේ නැත. එහෙත් ලබු කට්ටට වතුර ගෙන ඒම, මස් පලහන්න උදව් කිරීම, පුංචි රාළට බුලත් විටක් ලෑස්ති කරදීම වැනි පුංචි රාළගේ සියලුම කළමනා වචනයකුදු කතා නොකර ඉටු කළේ රනාය. පුංචි රාළත් වැඩි කතා බහකට ගියේ නැත. එහෙත් මධ්‍යම රාත්‍රියට ආසන්නව රනා පෙරළා යා යුතු කාලය එන විට පුංචි රාළ මෙවැනි වචනයක් කීවේය.

'හෙට අනිද්දට සේදරාටයි විකිරිටයි ඇවිල්ල යන්න කිච්ච නං... එකතු කරපු මුං කවිපි ටිකක් තියෙනවා දෙන්ඩ...'

පුංචි රාළ කවදාවත් කද බැඳගෙන ගෙදර ගෙනියන්න මුකුත් රනාට පංගනාතු කළේ නැත. කිච්චත් නොකිච්චත් ඒ කිසිවක් රනා ගෙදර ගෙන ගියෙත් නැත. දෙදෙනාම සිටි එකගතාවය වුණේ එය ඉටු කළ යුතු වූයේ සේදරා හා විකිරි විසින් බවයි. ඒ වාගේ ම පුංචි රාළ කියන පණිවිඩයක් රනා කවදාවත් ගෙදර ගිහින් සේදරාටත්, විකිරිටත් කීවේත් නැත. ඒ වගේම එය රනාගෙන් පුංචි රාළ කවදාවත් බලාපොරොත්තු වුණේද නැත.

පොඩිනා, මැණිකා අතේ රනාට ගෙදර එන්න පණිවුඩ යැවූ විට ඒ කුමටදැයි රනා ඉවෙන් මෙන් දන සිටියේය. එහෙත් පොඩිනා බිංදුගේ කටේ කිරි බුරුල්ල ගසා කිරි පොවන ගමන් රනාව පිල උඩ වාඩි කරවා බුලත් විටක් කන්න පිළිගන්වා තාරුණ්‍යයට එළඹෙමින් සිටි මේ පෝරිසාදයට සියලු දේ ඉතා අරපරිස්සමට පැහැදිලි කර දුන්නාය.

'අනික් හැමෝටම වඩා මං උඹ විශ්වාස කරලයි මේ ටික කියන්ඩ හිතුවේ... මට මේ එන මිනිස්සු ආංබාං කරන්ඩ අමාරුයි. අනික ඔය තඹ සල්ලි රිදී කාසි එක්ක ගනුදෙනු එහෙම මට එච්චර තේරුමකුත් නෑ... බෙත් හදන එකත් දූත් ඉස්සර වගේ තනිපංගලේ කරල පිරිමහන්ඩ අමාරුයි. ඉස්සරහට අපට නැහැම්, බෙත් අඹරන්ඩ වෙනවා... හෙට ඉඳන් උඹ මේ වැඩ ටික ලකපහට කරන්ඩ බාර ගන්ඩ ඕන...'

රතා සියල්ල හොඳින් අසා සිටියේය.

පසුව 'හා' හෝ 'බෑ' නොකියා කට පුරවාගත් බුලත් විට, කෙළ පහරකුත් එක්ක මිදුලට විසිකර යන්න නැඟිට්ටේය. ඒ සමඟ මොහොතකට මිදුලේ නැවතී පොඩිනා දෙස හැරී මෙසේ කීවේය.

'කැළෑවෙන් ගේන්ඩ ඕන බෙත් පැළෑටි ටික ලෑස්ති කරල තියන්ඩ...'

පසුවදා සිට රතා වැඩ බාරගත්තේය. උක්කුවා, ගුණයා, බණ්ඩියා නම් වූ ඔහුගේ ගමේ යාළුවන් තිදෙනෙකු ඔහු වැඩට හැදෙව්වේය. උක්කුවාගේ රාජකාරිය වූයේ දවස් තුනකට සැරයක් කැළයට ගිහින් බෙත් වට්ටෝරුව හොයාගෙන එන එකය. පසුව ඔහු ගුණයා සමඟ එක්ව ඒ හැමකකින්ම කලං එකසිය විස්ස බැගින් වූ ගොඩවල් ගසා සියල්ල එකට අඹරා ගනියි. මෙසේ අඹරා ගන්නා බෙහෙත් මැල්ලුම පොඩිනාගේ තන කිරි සමඟ නිවැරදිව මිශ්‍ර කිරීමේ වගකීම පැවරුණේ මැණිකාටය. ඇය හැම දවසකම පොඩිනාගේ කිරි බුරුලුවලින් තන කිරි මේ සඳහා වෙන් කරගත්තාය.

බණ්ඩියාගේ රාජකාරිය වුණේ පෝලිමේ එන සෙනඟ පිළිවෙළක් කිරීමය. ඔවුන්ගේ උවමනා එපාකම් රතාට දන්වීමත් සාර්ථක අසාර්ථක ප්‍රතිඵල පොඩිනාට දන්වීමත් ඔහුගේ රාජකාරී අතර විය. එකිනෙකා දෙන තඹ සල්ලි හෝ රිදී කාසි වටිනාකම් අනුව අහවල් ප්‍රමාණයක බෙත් ප්‍රමාණයක් දිය යුතු යැයි තීරණය කළේ රතාය. නැතහොත් ගැනුම්කරුවන් කඳ බැඳගෙන එන වී, කුරහන්, තල, මෙනේරි, හකුරු, මී පැණි, එළවළු වැනි ද්‍රව්‍යවලට කෙතරම් බෙත් ප්‍රමාණයක් හිලව්වට දිය යුතු දැයි තීරණය කළේද රතාය.

දවසක් තමා හුවමාරුවට දුන් මී පැණිවලට ලබාගත් බෙත් ප්‍රමාණවත් නොවන බව එහා ගමින් ආ මිනිහෙක් බණ්ඩියාට පැමිණිලි කළේය. බණ්ඩියා කෙතරම් හොඳින් මෙතන වැරැද්දක් වී නැති බව තේරුම් කරදෙන්න හැදුවත් ඔහු පිළිගත්තේ නැත. ටික වෙලාවකින් හෙතෙම ලවක් දෙවක් නැතිව අනිවාරයේ බණ්ඩියාට බණින්න ගත්තේය. ගේ ඇතුළේ සිට සියල්ල අසා සිටි රතා එක් වරම එළියට ආවේය. කිසිම වග විභාගයක් නැතිව රතා සිය පිටි අල්ලෙන් මිනිසාගේ කන්පෙට කෙතරම් වේගයෙන් පහර දුන්නාද කිවොත් ඔහු පියවර තුනක් ඉහළට එස වී පියවර දහයක් ඈතට විසි වී වැටුණේය. එදා පටන් කිසිවෙකු කිසි විටක රතා සමඟ හෝ ඔහුගේ ගෝල බාලයන් සමඟ ලබාගත් බෙත් පිළිබඳව තර්ක කරන්න ආවේ නැත.

වෙළෙඳාම කෙතරම් දියුණු වූවාද කිවහොත් පොඩිනාගේ ගෙදර තඹ සල්ලිවලිනුත් රිදී කාසිවලිනුත් පිරෙන්නට විය. ගෙදර වියදමට අවශ්‍ය අඩුවැඩිය වෙන් කළ පොඩිනා සති දෙකකට වරක් රතා සමඟ මහා රාත්තිරියේ කැළේට වැදී ලොකු වළවල් හාරා මුට්ටිවල තඹ සල්ලි පුරවා කැළේ හැංගුවාය. එසේම මාස දෙකකට වරක් රිදී කාසි පිරවූ මුට්ටිය බැගින් මේ විදිහටම කැළේ හංගන්න එන්න ඔවුන්ට සිදු විය.

රිදී, තඹ සල්ලි සිය අත්වලින් අතගෑමෙන් පොඩිනා කෙතරම් වින්දනයක් ලැබුවේද යත් බෙත් හුවමාරුවෙන් ගෙදර ගොඩ ගැහෙන වී, කුරහන්, හකුරු, මී පැණි, එළවළු පවා ඈ අබ්දුල් තම්බි මුදලාලිට අඩු ලංසුවට දී පෙරළා රිදී, තඹ කාසි ලබාගත්තාය. ඒවා මුට්ටිවල ඇහිරීමෙන් සහ පොළොවේ වැළලූ මුට්ටි ගණන් තබාගැනීමෙන් ඈ අප්‍රමාණ ප්‍රීතියක් භුක්ති වින්දාය.

රහස් බෙත් වෙළෙඳාම මෙසේ දියුණුවට පත් වෙමින් පැවති තෙවෙනි මාසයේ දවසක හවස් වරුවේ සේදරාත් ටිකිරිත් පොඩිනාගේ ගෙදරට ගොඩ වූහ.

'අපි ආවේ මේ ගේ කිට්ටුවෙන් කඩ පිලක් දාන්ඩද කියල අහන්ඩ... මොකද දුර බැහැරින් ආපු කීප දෙනෙක්ම කිව්වා බෙලි මල් ටිකක් බොන්ඩ, බුලත් විටක් ගන්ඩ තැනක් ළඟ පාත තිබුණ නං හොඳා කියලා....'

The Reader's Place

පොඩිනා පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියාය. ඊට හේතු තමාගේ වෙළඳාම තමන්ගේම එකෙක් අගය කිරීම නිසාද නැත්නම් තමන්ගේම එකෙක් උපකාරයක් ඉල්ලා තමන්ගේ දෙපතුල් ළඟ කුමු එකදැයි කියා වෙන් කරගන්න ඇයට බැරි විය. කොයි හෙ වෙතත් ඇ මෙසේ කීවාය.

'මොකටද බං ඕකට මගෙන් අවසර ගන්නේ... මට තාගෙ මගෙට ආවනං මං උඹට කලින්ම කියනව ඕක ගෙනා කියලා... තව සුනංගු කරන්ඩ ඕනෑ නෑ... හෙටම පටන් ගනිං...'

මෙසේ කියා ඇ ඇතුළ ගෙට ගොස් තඹ සල්ලි මල්ලක් රැගෙන ඇවිත් ලෙඩ නැතිව සේදරාගේ අතට දුන්නාය.

'මේ ටික අරගනිං වියදමට... තව ඕන්නං මට කියපං...'

මුළු ගමේම අවධානය දිනාගත් කඩ පිල පොඩිනාගේ පිහිටුවෙන් සේදරා ආරම්භ කළේ එසේය.

The Reader's Place



06

ලොකු හාමුදුරුවන් ගේ අපවත් වීමෙන් පසු ඇබිත්ත කොලුවා හෙවත් සුදු බණ්ඩා පන්සලේ තනි වුණේය. ලොකු හාමුදුරුවන් පන්සලේ වැඩ සිටි කාලයේ ඔහු වැඩිපුර හිටියේ තනියෙන් වුණත් ඒ කිසිම කාලෙක මේ තරම් තනියක් ඔහුට දැනී තිබුණේ නැත.

එහෙත් ලොකු හාමුදුරුවන් ගේ අපවත්වීම ලොකු වෙනසක් පන්සලේ සිද්ධ කළේ නැත. ගම්මු පුරුදු විදිහටම මල් පහන් පූජා කරන්න, බෝධි පූජා තියන්න පන්සලට පැමිණියහ. මීට ඉහත දවසක ඇබිත්ත කොලුවාගේ පිරිත් සජ්ජායනාව සියලු ගම්වැසියන් විසින් අසා තිබූ බැවින් පන්සලේ හැම පූජාවකම මූලිකත්වය ඔහුට පැවරිණ. එසේම දානමානවලද ලොකු වෙනසක් පන්සලේ සිදු වුණේ නැත. පන්සලේ හිටියේ එක් ගිහියෙකු වුණත් හැම මාසෙකම දන් සිට්ටුව පරණ පුරුදු විදිහට කෙරීගෙන ගියේය.

මේ සාමාන්‍ය චර්යා රටාව ගමේ ආරච්චිලගේ මව දෙවන වරටත් මියගිය දිනය දක්වා මාස කීපයක් අවුල් වියවුල් රහිතව ගෙවී ගියේය. සතියේ මැද බදාදා දවසක ආරච්චිලගේ මව දෙවන වරටත් මියගියාය. පළමුවර මරණයෙන් ඉක්බිතිව වල්ලි මිනී වළෙන් ඇයව ගොඩ ගත් බැවින් මෙවර ඇගේ මරණය සිදු

The Reader's Place

වූ විට ආරච්චිල කෙළින්ම සිය පුතා පොඩි නිලමෙ වල්ලි...
පිටත් කළේය. ඔහු පැය ගණනක් සුනංගු වී වල්ලිගෙන් ද...
ඇවිත් තිබුණේ මෙවර ඇය සහසුද්දෙන්ම මියගොස් ඇති...
එහෙයින් හිත හදාගෙන මරණයේ කටයුතු කරන්න ආ...
සූදානම් වුණේය.

අවමංගල උත්සවයේ සියලු කටයුතු ලක ලෑස්ති...
ආපසු හැරී නැවත විමසා බැලූ විට එක් අඩුපාඩුවක් ආරච්චිල...
හිත චංචල කළේය. එබැවින් අවසන් කටයුතු සූදානම් කර...
දවසට කලින්දා හවස ඔහු ගමේ තවත් කිප දෙනෙක් ස...
පන්සලට ගියේය.

පරණ පුරුද්දට ලොකු හාමුදුරුවන්ගේ පරණ අදහස...
හැඳ උඩුකය නිරුවත්ව සිටි ඇබිත්ත කොලුවා ආරච්චිල සහ...
ආවාස ගෙට කැඳවා ඉඳගන්න සැලැස්සුවේය.

'මට ආරංචියි මරණෙ ගැන. හෙට උදේ මං කොහොම...
එන්නයි හිටියේ...'

ඇබිත්ත කොලුවා ඔවුන්ට අසුන් පනවමින් කීවේය.

'ඒක තමා මං මතක් කරන්නත් එක්ක ආවේ. ඒත් තව...
පරහක් තියෙනවා...'

'....ඒ මොකක්ද ...?'

'හෙට අම්මගේ පාංශකූලෙ දෙන්න ඕන...'

ආරච්චිල ලොකු ප්‍රශ්නාර්ථයක් සහිතව එසේ කිවද ඇබිත්ත කොලුවා ඉතා සැහැල්ලුවෙන් ඊට පිළිතුරු දුන්නේය.

'ආ... මේ ඇත්තො හිතුවද මම ඒක අමතක කළා කියලා... මං අද දවල්ම එහා ගමේ පන්සලට පයිණ්ඩයක් ඇරියා උන්නාන්සේලා දෙනමකට හෙට හවස පාංශකූලෙට වැඩම කරන්ඩය කියලා.....'

'... නෑ... මං ඒකට කැමති නෑ...''

'ඒ කිව්වේ...?'

'අපේ ගමේ මරණෙකට වඩින්න ඕන අපේ ගමේ උන්නාන්සෙ කෙනෙක්..'

ආරච්චිල සෘජුව ඔහුගේ මූණට එබුණේය.

'ඉතිං... මෙ ඇත්තො දන්නවනේ... අපේ පන්සලේ හාමුදුරු නමක් නැති විත්තිය...'

'කමක් නෑ... ඔහේ වඩින්ඩ...'

'මම....?'

'ඔව්...'

මෙවර ඇබිත්ත කොලුවාගේ මෙතෙක් තිබූ සැහැල්ලුව ඉරිතලා ගියේය. ඔහු සියලු දෙනා දෙස මාරුවෙන් මාරුවට බලමින් ඉතා පැහැදිලිව මෙසේ තේරුම් කරදෙන්න උත්සාහ කළේය.

'මං උන්නාන්සේ කෙනෙක් නෙමෙයි... ඇරත් මං එහෙම වෙන්ඩ කැමතිත් නෑ... ඊටත් වඩා මට එහෙම වෙන්ඩ සුදුසු කමකුත් නෑ...'

'නෑ... ඔහේට ඒකට තියෙන සුදුසුකම ඕනවටත් වැඩියි...' ආරච්චිල අවධාරණයෙන් කීවේය.

'ඒ වුණාට කාටවත් හිතුණ පළියට මහණ වෙන්ඩ බෑ... ඇරත් උපසම්පදා කටයුතු කරන්ඩ හාමුදුරු නමක් ඉන්ඩම ඕන...'

'නෑ... හැමදාම එහෙම වෙන්ඩ ඕන නෑ.... උන්නාන්සෙ කෙනෙක් වෙන්ඩ ඔහේට තියෙන සුදුසුකම් සමහර උන්නාන්සේලා ළඟවත් ඇතිය කියල මං හිතන්නේ නෑ...'

'ඒ වුණාට එහෙම වෙන්ඩ මං කැමති නැත්නම්...'

ඔහු එවර සෘජු ලෙස ආරච්චිලගේ මුහුණ දෙස බැලුවේය. ආරච්චිල ඒ ඇස් මග හැර බිම බලාගත්තේය. එවිට මේ පිරිස අතර එතෙක් වේලා නිශ්ශබ්දව සිටි කිරිහාමි උපාසක රාළ හුන් තැනින් නැගිට්ටේය.

'මේක ආරච්චිල ඇත්තන්ගෙ ඉල්ලීමක් විතරක් නෙමෙයි. මුළු ගමේම ඉල්ලීමක්... අපේ ගමේ පාංශකූලෙට අපේ ගමේම උන්නාන්සේ කෙනෙක් වඩින්ඩ ඕන... ඒකට සුදුසුකම් තියෙන වෙන කෙනෙක් මේ සිංහලේම ඇතියි කියල අපි හිතන්නේ නෑ...'

උපාසක රාළ එසේ කීවේ තමාගේ කොර කකුල ආශ්චර්යයකින් වගේ එදා පිරිත් සජ්ජායනාව දවසේ හොඳටම හොඳ වූයේ 'නුඹ නිසාය' කියා පෙන්වන්නට වගේ ආවාස ගෙයි

The Reader's Place

එහාට මෙහාට ඇවිදිමින්ය. ඇබිත්ත කොලුවා මොහොතක් නිශ්ශබ්දව සිටියේය. එය මහා කාලාන්තරයක් වගේ අනෙක් සියලු දෙනාටම හැඟුණේය. අවසානයේ ඔහු මෙසේ කීවේය.

'හොඳා... සිවුරක් දරාන මං පාංශකූලෙට එන්නම්... ගමේ යුතුකමුත් ඉෂ්ට කරන්නම්... හැබැයි මං උන්නාන්සේ කෙනෙක් නෙමෙයි. ඒ වෙලාවට එහෙම වුණාට මං පරණ ගිහි මිනිහා තමයි... මෙච්චරයි. මං කැමති විදිහට මට ජීවත් වෙන්ඩ ඕන... ඒකට ඇඟිලි ගහන්නේ නැහැයි කියලා මේ හැමෝම පොරොන්දු වෙන්ඩත් ඕන...'

සියලු දෙනා තුළ ඇතිවූ සතුට නිම් හිම් නැතිවිය. කිසිවෙකුට කිසිවක් කියන්න වචන මතක් වූයේ නැත. එහෙත් ආරච්චිල පන්සලෙන් එළියට බහින ගමන් මෙසේ කීවේය.

'හෙට ගමේ හැමෝම බලාගෙන ඉන්නවා... මුත්තාගේ පාංශකූලෙට වඩිනකං...'

පහුවදා වෛතාලයෙන්ම ඇබිත්ත කොලුවා ඇහැරුණේය. පසුව ඒ මහ පාන්දර බෝධි වෘක්ෂය අසලට ගොස් ඉර එළිය බිමට වැටෙනකම් සුපුරුදු පරිදි භාවනා කළේය. ඊළඟට පන්සලේ ළිඳ ළඟට ගොස් ලොකු හාමුදුරුවන්ගේ දැලි පිහියෙන් කතුරෙන් හිස කෙස්ස කපා දැම්මේය. හොඳට නා කියාගෙන අහවර වී ලොකු හාමුදුරුවන්ගේ ලැගුම් ගෙට ගියේය. බොහොම අර පරිස්සමට උන්වහන්සේ තැන්පත් කර තිබූ පඬුවන් සිවුරක් රැගෙන අඳනකඩය උඩින් පොරවාගත්තේය.

මෙසේ ලක ලැහැස්ති වූ හෙතෙම එදා හවස ආරච්චිලගේ වලව්වේ පාංශකූලයට යන විට ඇබිත්ත කොලුවා වෙනුවට ඇබිත්ත උන්නාන්සේ බවට පරිවර්තනය වී සිටියේය.

ඇත්තටම ගමේ කවුරුත් එදා සිට ඔහුට කියන්න ගත්තේ ඇබිත්ත උන්නාන්සේ කියාය. ඒ නම කවුරුන් කොහොම වහරනු ලැබුවේද කියා කවුරුන්වත් දැන සිටියේ නැත. එහෙත් ඇබිත්ත කොලුවාට එය, තම පරණ නම සුදු බණ්ඩා වගේ නැත්නම් උක්කුවා, ගුණයා, සුරලා වගේ තවත් එක් නමක් විතරක් වුණේය. ඔහු ගමේ අයට පැහැදිලි කර දුන්නේත්, ඇබිත්ත උන්නාන්සේ යනු උන්නාන්සේ කෙනෙක් නොව තවත් එක් ගිහි නමක් බවය.

කෙසේ වෙතත් ඔහුට නම් දෙකක් ලැබී තිබුණේය. මඟුලක මරණයකදී නැත්නම් පන්සලේ පුද පූජාවකදී ඔහු ඇබිත්ත උන්නාන්සේ වුණේය. අනෙක් හැම වේලාවකම ඔහු සිවුර ගලවා දමා පුරුදු අඳනකඩය විතරක් ඇඳගෙන හිටි පරණ සුදු බණ්ඩා හෙවත් ඇබිත්ත කොලුවා වුණේය. වෙනසකට තිබුණේ හිස බූ ගා තිබූ එක විතරය.

මේ ද්විත්ව චරිතය වේලාවකට ඔහුට හරිම ප්‍රීතිදායක වුණේය. ගම්වැසියන් ඇබිත්ත උන්නාන්සේගෙන් ප්‍රතිඵලයක් ලබන විට ඒ ප්‍රීතිය ඔහු තුළ උතුරා ගියේය. එසේම මේ ද්විත්ව චරිතය වෙලාවකට ඔහුට හරිම හිසරදයක් වුණේය. ඔහුට ඕන වේලාවට සුදු බණ්ඩා හෙවත් ඇබිත්ත කොලුවා වෙන්න බැරි වෙන විට ඔහුට තමා ගැනම කේන්තියක් ඇති වුණේය.

හැකි හැම විටම මේ ද්විත්ව චරිතය ඒ විදිහටම පවත්වාගෙන යන්න ඔහු උත්සාහ කළේය. ආරච්චිලගේ මවගේ මරණයෙන් මාස දෙකකට විතර පසු තවත් වැඩිහිටියෙකුගේ මරණයක් ගමේ සිද්ධ වුණේය. පන්සලේ දායකයෙක් වූ එදෝතිස් උපාසකගේ මේ මරණය සිද්ධ වුණු දවසේ උදේ ඔහු ඒ මළගෙදර ගියේ පුරුදු විදිහට අඳනකඩය ඇඳගෙන ඊට උඩින් සළුවක් කරේ දාගෙන ඇබිත්ත කොලුවා විදිහටය. ඔහු එදා සවස පාංශකූලෙට ගියේ අඳනකඩය උඩින් සිවුරක් දාගෙන ඇබිත්ත උන්නාන්සේ විදියටය.

එහෙත් ටිකෙන් ටික මිනිසුන්ට ඇබිත්ත කොලුවා අමතක වුණේය. සුදු බණ්ඩාද අමතක වුණේය. ඇබිත්ත උන්නාන්සේ කියන අලුත් මිනිහා හෝ අලුත් උන්නාන්සේ විතරක් ඔවුන්ගේ මතකයේ ඉතිරි වුණේය.

ඇබිත්ත කොලුවා ඇබිත්ත උන්නාන්සේ වුණත් ඔහුගේ චර්යා රටාවේ කිසිම වෙනසක් නොවීය. ඔහු මහ පාන්දරම අවදි වුණේය. ඉර එළිය වැටෙනකං උඩ බෝ මළුවේ පද්මාසනයෙන් හිඳගෙන එක දිගට සිංහල පැය දෙකක් භාවනා කළේය. පසුව හීල් දානය තිබුණොත් හොඳට කෑවේය. ඊටත් පසුව තවත් පැ දෙකක් විතර පන්සල් මිදුල අතුගා වල් ගලවා සුද්ද බුද්ද කරන්න වෙන් කළේය. පසුව නා කියාගෙන ඇවිත් හිතුණොත් දවල්ට

The Reader's Place

හොඳට කෑවේය. නැත්නම් හොඳට නිදාගත්තේය. ඉන් [illegible] තවත් පැ දෙකක් පොත් ගුලේ පුස්කොළ පොත් බලන්න [illegible] කළේය. ඊළඟට ඉර අවරට යන හැන්දෑවේ එක්කෝ [illegible] බලන්න හෝ බිංදු බලන්න හෝ ගියේය. නැත්නම් ගමේ [illegible] රවුමක් ගැහුවේය. එහෙමත් නැත්නම් වැව් තාවුල්ලට වී [illegible] දිහා බලාගෙන හිටියේය. ඇඳිරි වැටී මිනිස්සු පන්සල් එනවිට [illegible] ආපහු ඇවිත් ඔවුන්ට පුද පූජා තියන්න සෙත් සාන්ති කරන්න [illegible] උදව් කළේය.

රෑ කෑමට එක්කෝ කුරහන් සේරු දෙක කුනක තලප, [illegible] හොද්දක් එක්ක ගිල දැම්මේය. නැත්නම් හාල් සේරුවක විතර [illegible] හැළියක් එළවළු මාළු පිණි එක්ක දෙසා බෑවේය. බැරි වෙලාවක [illegible] හැළියේ බත් ඉතුරු වුණොත් හීලෙට දිය බතක් කන්න හැළියට වතුර එකතු කර වසා තැබුවේය. කොහොමටත් ඔහු දවසේ වැඩි අවධානයකින් කන්න වෙන් කළ කෑම වේල ඒකය. දවල් බත් [illegible] ඉතිරි නොවුණ ගොඩක් දවසට ඔහු රෑට කෑම තමාම උයාගත්තේය. රෑ කෑම කා අවසන් වී ඔහු තව සිංහල පැයක් විතර රෑ අහස දිහා ඔහේ බලාගෙන හිටියේය. ඊට පසු සිය කුටියට වැදී [illegible] රාත්‍රිය ඉක්මවන තෙක් ඔහු කළේ පන්හිඳක් [illegible] පුස්කොළ පොත් නැවත පිටපත් කළ එකය.

ඔහු පන්සලට පැමිණි මුල් අවුරුද්දේ සමහර දවසක එක දිගට මුළු දවසම බණ පොත් කියවන්නත්, සමහර දවසක මුළු දවසම දහඩිය වගුරුවාගෙන පන්සල සුද්ද බුද්ද කරන්නත්, තවත් දවසක සිහියක් පතක් නැතිව මුළු දවසම බුදියන්නත් කාලය ගත කර තිබූ නමුත් දෙවන අවුරුද්දේ සිට ඔහු මෙවැනි කාල සටහනකට අනුගත වුණේය. ඒ කාල සටහන ඇබිත්ත කොල්ලා ඇබිත්ත උන්නාන්සේ වුණා කියා ඇබින්දකුදු වෙනස් වුණේ නැත.

එහෙත් ඔහුගේ මේ කාල සටහන තරමක් එහා මෙහා කළ ඊටත් වඩා මුළු ගමම චංචල වුණ එක්තරා සිද්ධියක් ඊට මාස කීපයකට පසු තවම් මහේ එක දවසක සිද්ධ වුණේය.

පෝය දවසට ගමටම ඇහෙන්න පන්සලේ බෙර ගැහුවේ සුරඹාය. ලොකු හාමුදුරුවන් හිටි කාලයේ ඉඳන්ම පන්සලත් එක්ක ලොකු ඇයි හොඳයියක් තිබුණේ සුරඹාටත් වඩා සුරඹාගේ පියාටය. නමින් සුරඹාම වූ සුරඹාගේ පියාට ගම්මුන් වැඩිමනත් කිව්වේ සුරඹා ගුරුන්නාන්සේ කියාය. පන්සලේ බෙර ගැහිල්ලට අමතරව ගමේ තොවිල් පවිල්වල, හදි හූනියම් බන්ධනවල ගමේ සුප්‍රසිද්ධ පුංචි ගුරු කට්ටඩි රාළගේ උදව්වට බෙර ගහන්න ගියේ සුරඹා ගුරුන්නාන්සේය.

දවසක් හූනියමක තීන්දුවක් කපන්න ගිය වෙලාවක කවදාවත් නැතිව පොඩි රා වඩියකින් සප්පායම් වී සිටි බැවින් සුරඹා ගුරුන්නාන්සේට බෙර පද වැරදුණේය. ඒ වෙලාවේ පුංචි ගුරු කට්ටඩි රාළ කපමින් සිටි තීන්දුව ආපිට කැරකී ආවේය. ගුරු කට්ටඩි රාළට හානියක් නොවුණත් මන්ත්‍ර බලයේ හාස්කමට එයින් කට්ටඩි රාළට හානියක් නොවුණත් සුරඹා ගුරුන්නාන්සේ ගසමින් සිටි බෙරයේ බෙර හම කඩාගෙන සුරඹා ගුරුන්නාන්සේ ගසමින් සිටි බෙරයේ බෙර හම කඩාගෙන ඔහුගේ අත බෙර කඳ ඇතුළට ගියේය. එතැන සිටි දහ දොළොස් දෙනාම එක් වී වැරෙන් ඇද බෙර කඳෙන් අත එළියට ගන්න [illegible] නැත. බැරිම තැන බෙර හම කපා [illegible] කළත. එහෙත් අලි හමක් තරමට අත එළියට ගන්න [illegible] තියුණු ආයුධයකින් වුණත් කපා ගහව තිබුණු බෙර හම කොතරම් තියුණු ආයුධයකින් වුණත් කපා දමන්න බැරි විය.

අවසානයේ ඔවුන් තීරණය කළේ පොරවක් ගෙන බෙර කඳ කපා අත එළියට ගන්නය. තුන් වෙනි වතාවට පොරෝ පහර බෙර කඳට වදින විට බෙර කඳත් එක්ක සුරඹා ගුරුන්නාන්සේගේ අත මැණික් කටුව ළඟින් දෙකට කැපී වෙන් වුණේය. ඔහු මරණයට පත් වුණේ කැපී ගිය අතින් එක සිරුවට ඒ වෙලේ ගලා ගිය ලේ ධාරාව ඔහුගේ සිරුරට උහුලාගන්න බැරි තරම් වූ නිසාය.

සුරඹා ගුරුන්නාන්සේගේ මරණය සිද්ධ වූ දවසේ නමින් හා පුරා කියා ගෙදර ගෙනා ගෑනු පරාණයත් එක්ක මංගල රාත්‍රිය ගත කරමින් සිටි ඔහුගේ ලොකු පුතා වූ සුරඹා සිය අප්පච්චාගේ මරණයෙන් පසු බෙරය අතට ගත්තේය. එහෙත් පන්සලේ හැර ඔහු කවදාවත් අප්පච්චා වගේ තොවිල් පවිල්වල බෙර ගහන්න ගියේ නැත.

The Reader's Place

එදා ඉර මුදුන් වෙන්න හෝරාවක් විතර තිබියදී සුරඹා තනහනියෙම පන්සලට යන විට ඇබිත්ත උන්නාන්සේ තෑ... නියාගෙන ඇවිත් අදනකඩය පිටින්ම නිදාගන්න ලෑස්ති වෙමින් සිටියේය.

'මොකෝ සුරඹා හදිස්සියෙම...'

'නෑ එහෙම හදිස්සියක්මත් නෙමෙයි...'

ඇබිත්ත උන්නාන්සේ සුරඹා ආවාස ගෙට කැඳවා ඉඳ...න්න ලෑස්ති කළේය.

'...ඉතිං කිව්වනං...'

තවමත් මද තිපුළු තරුණ විය නොඉක්ම වූ සුරඹා මොන... ගැහී හිටියේ කොහෙන් වචන පටන් ගන්නද කියා නොදැන... ඇබිත්ත උන්නාන්සේ ඔහුගේ කලබලයත්, බියත්, ලැජ්ජාවත් එක වර එකට හඳුනාගත්තේය. ඒ නිසා මෙසේ විචාළේය.

'මං වතුර ටිකක් ගේන්නද බොන්න...'

'එපා... මට තිබහ නෑ... මං ආවේ... මං ආවේ...'

යළිත් ඔහු මහන්සියක් නැතිව හතිලන්න ගත්තේය. ඇබිත්ත උන්නාන්සේ ඔහුට නිදහසේ හතිලන්න ඉඩ දී... ඔහු එපා කීවත් ඒ අතර ආවාස ගෙට ගොස් ... වතුර ටිකක් අරගෙන ආවේය. වතුර ටික එක හුස්මට බීගෙන බීගෙන ගිය සුරඹා තරමක් සන්සුන් වුණේය. ඔහු වචන එකතු කරන්න ගත්තේ ඊට පසුවය.

'...මේ දෙවෙනි දරුව හාන්දුරුවනේ... පළමුවෙනි දරුවා මාස හය යන කොට අපි දන්නෙත් නැතිව බඩෙන් සුද්ද වෙලා ගියා. ඊට පස්සේ අවුරුදු තුනකටත් වැඩිය බලාගෙන හිටියා. අම්මොච්චියේ දැන් මාස හතයි... මේ තාක් කල් මං බයේ හිටියේ මුල් සැරේ වගේ බඩ සුද්ද වෙලා යයි කියලා... ඊත් ඊයේ වෙද රාළ එක්කන් ආව... උන්දෑ ගැනි බලල කිව්වා... දැන් ඉතිං අනතුරු කාලේ ඉවරයි... වින්නඹු අම්මට තව ටික දොහකින් ලෑස්ති වෙන්න කියාපං කියලා... අනේ බුදු හාන්දුරුවනේ... ඔබ වහන්සේට හැකිනං අපේ ගෙදරට වඩින්න ගැනිගේ බඩේ ඉන්න දරුව වෙනුවෙන් වරු තුනේ පිරිතක් කියන්න...'

ඇබිත්ත උන්නාන්සේ සිනාසී මෙසේ පිළිතුරු දුන්නේය.

'අප්පොච්චියේ ඔක මහ වැඩක්යෑ... මං හෙටම එන්නං උඹලෑ ගෙදර... වරු තුනට මං වරු හතක පිරිතක් කියන්නං...'

සුරඹා ගෙදර ගියේ පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිය හදවත අත් දෙකෙන්ම තද කරගෙනය.

ඇබිත්ත උන්නාන්සේ පොරොන්දු වූ පරිදිම සුරඹාගේ ගෙදර ගියේය. සුරඹාගේ බිරින්දෑ වූ සොබනීට වරු හතක්ම එක දිගට පිරිත් කීවේය. කළ ගෙඩියක් තරම් වූ ලොකු බඩගෙඩිය වත්තන් කරගෙන ඇ වරු හතම හරිම ආසාවෙන් පිරිත් ඇසුවාය. එහෙත් ඒ ආසාව යටින් මොකක්දෝ දුක් කන්දරාවක් ඇගේ හිතේ එහා මෙහා හක්කලං කරන අයුරු ඔහු දුටුවේය. ඇ වරු හතම හරිම ඔනෑකමින් පිරිත් අසා සිටියද ඇබිත්ත උන්නාන්සේගේ වචන ඇගේ සවන් හරහා ඔහේ පාවී ගියා මිස ඒ එකක්වත් ඇගේ හිත ඇතුළට කිඳා බැස්සේ නැත. හැම වරුවකම පිරිත් අහවර වන විට ඇ නැගී සිටියේ තිගැස්මකිනි. පිරිත් කියට පටන් ගත්තාද එය කියට ඉවර කළාද කියා කිසිම හැඟීමක් ඇයට නොතිබුණ බව ඔහු තේරුම් ගත්තේය.

වරු හතම අවසන් වුණු දවසේ ඇබිත්ත උන්නාන්සේ සොබනීට ආශිර්වාද කර එළියට බහින ගමන් සුරඹාට මෙසේ කීවේය.

'හෙට හවහට පන්සලට ඇවිත් යන්ඩ එන්ඩ....'

පහුවදා හවස සුරඹා පන්සලට ආවේය. ඇබිත්ත උන්නාන්සේ එවේලේ හිටියේ නිකම්ම නිකම් අදනකඩය විතරක් ඇඳගෙන ගම් ගොඩේ ඇවිදින්න යන්න ලෑස්ති වෙමින්ය.

'අපි යං වැව් තාවුල්ල පැත්තට...'

අදනකඩය උඩින් සළුවක් කරේ දාගෙන හාමුදුරු වේශය සම්පූර්ණයෙන්ම අතහැර ඔහු සුරඹා ඉදිරියෙන් වැලි පාර දිගේ වැව් තාවුල්ල දිහාට ඇවිදගෙන ගියේය. එසේ යන ගමන් සුරඹාගෙන් මෙසේ ප්‍රශ්න කළේය.

'සුරඹට සහෝදරයෝ කී දෙනෙක් ඉන්නවද...?'

'දෙන්නයි...'

'දෙන්නම ගෙදර...?'

'නෑ...නෑ... එක්කෙනෙක් බදුල්ලේ මාමලෑ ගෙදර. අනිත් කෙනා සෙංකඩගල නිලමේ කෙනෙක් ගාව වැඩ...'

'දෙන්නම ගෙදරින් පිට වුණේ ගෙදර ඉන්න අකමැති නිසා නේද...?'

සුරඹාට මේ අහන ප්‍රශ්නවල අගක් මුලක් තේරුම් නැත.

'අනේ මන්ද...' ඔහු උත්තර දුන්නේ ඒ නොතේරුම්කම තේරුම් ගන්න උත්සාහ කරමින්ය.

'කවුද ගෙදර ඉන්නේ...'

'අම්මයි... හීන් අම්මයි, මාමයි මගේ ගෑනි සොබනියි...'

'හීන් අම්ම කිව්වේ අම්මගේ නංගි... මාම කිව්වේ එයාගේ කසාද මිනිහ...?'

'එහෙමයි...'

'උඹලෑ අම්මයි හීන් අම්මයි එක්ක ඉන්න 'බෑරුව තමයි උඹේ සහෝදරයෝ දෙන්න මේ ගම අත ඇරලා ගියේ...'

සුරඹා අන්දමන්දව කිසිවක් නොකියා ඇබිත්ත උන්නාන්සේ දිහා බලා සිටියේය.

'සුරඹලෑ අම්ම හරි [illegible]යි නේද...'

'ඔව් එහෙමු නම් තමා...'

'ඊටත් වඩා තප්පුරු උඹලෑ 'හීන් අම්මා...! උන්දෑ කියන විදිහට තමා උඹලෑ අම්මගේ වැඩ...'

සුරඹා සියල්ල සාවධානයෙන් අසමින් ඇබිත්ත උන්නාන්සේ පිටුපසින් ඇවිදගෙන ගියේය. ඒ වන විට ඔවුහු වැලි පාර පසු කර වැව් තාවුල්ල උඩටම ඇවිත් සිටියහ. බෑහැගෙන යන ඉර එළියට හැඩ වුණු වැව් වතුර රැළි නගමින් එහා මෙහා පෙරළෙන හැටි දෙදෙනා නිශ්ශබ්දව ටිකක් වෙලා බලා සිටියහ. සුරඹාගෙන් පිළිතුරක් නැති කල අන්තිමට නිශ්ශබ්දතාවය බිඳින ලද්දේ ඇබිත්ත උන්නාන්සේ විසින්මය.

'උඹේ ගෑනි සොබනි ඔය ගෙදර ඉන්නේ කැමැත්තකින් නෙමෙයි. උඹලෑ අම්මයි හීන් අම්මයි සොබනිට දහ වද දෙනවා... එයාගෙන් යමරෙට වැඩ ගන්නවා... තම තමන්ගේ හිත සුද්ද කරගන්න ඒගොල්ලෝ ඒකට කියන්නේ... දරුවෙක් වදන්න ඉන්න ගෑනියෙක් දාඩිය දාන්ඩ වැඩ කරන්ඩ ඕන කියලා.. ඒත් හැමදේකම පිළිවෙළක් විදිහක් තියෙනවා. මේක හරියට තරහ පිරිමහ ගැනිල්ලක් වගේ. අනික කොච්චරවත් ඒ දෙන්න සොබනිට බෑණ අඬගහගන්න ගමන් ඉන්නේ... උඹේ පළවෙනි දරුව නැතිවෙච්ච එකටත් ඒ දෙන්න වග කියන්න ඕන...'

'කව්ද...'

එවර සුරඹාගේ ඇස්වල විමතිය ඇස්ගෙඩිවලින් එළියට පැන්නේය.

'උඹලෑ අම්මයි ... හීන් අම්මයි...'

'නෑ ඒක කොහෙත්ම වෙන්ඩ බෑ... සොබනි පරිස්සම් වුණේ නෑ හරියට... ඒකයි ඒකට හේතුව....'

'මං කියන්නේ මට පේන දේ... උඹ කියන්නේ අම්මයි හීන් අම්මයි උඹට කියපු දේ ...විශ්වාස කරන නොකරන එක උඹේ වැඩක්...හැබැයි එකක් මට සහසුද්දෙන්ම කියන්ඩ පුලුවන්....'

'ඒ මොකක්ද ...'

සුරඹා කල්පනාහරිත ඇබිත්ත උන්නාන්සේගේ මූණට කල්පනා රහිතව එබුණේය.

'[illegible] හැමදේම කරන්න අමාරුයි. ඒ හින්ද සොබනිගේ බඩේ ඉන්න දරුව[illegible]ම අම්මටයි හීන් අම්මටයි තීන්දු කරලා අත පිහදාගන්නේ නැතුව තමන් ඒ ගැන වැඩිපුර හිතන්ඩ ඕන...'

දෙදෙනා අතර මේ කතාව සිද්ධ වී දෙමාසයක් ගත වුණේ නැත. එක්තරා දවසක උදේ වරුවේ බෝ මැඩ භාවනාව අහවර කර ගල් පඩිපෙළ බහින අතර සොබනී දරුවා බිහි කරන්න විළිරුදාවෙන් දඟලන බවට ඇබිත්ත උන්නාන්සේට පණිවිඩ ලැබුණේය. දවල් වරුවේ තා කියාගෙන නිදාගන්න ලැහැස්ති වන විට ඔහු යළිත් සොබනීගේ විස්තර ආරංචි කර බැලුවේය. ලැබුණ පණිවිඩේ හැටියට ඇ තවමත් විළිරුදාවෙන් දඟලමින් සිටියාය. හැන්දෑවේ පොඩිනාගේ ගෙදරට ගොඩ වී එන ගමන් යළිත් වරක් ඔහු සොබනිගේ විස්තර ආරංචි කර බැලුවේය. තවමත් ඇ විළිරුදාවෙන් දඟලමින් සිටියාය. රෑ කෑම කා අහවර වුණාට පසුවත් ඔහු ඇගේ විස්තර ආරංචි කර බැලුවේය. ඒ වේලෙත් ඇ විළිරුදාවෙන් දඟලමින් සිටියාය.

The Reader's Place

මධ්‍යම රාත්‍රිය පසු වී නිදාගන්න ඔන්න මෙන්න කියා ලෑස්ති වන විට ඇබිත්ත උන්නාන්සේට සුරඹාගේ ගේ පැත්තෙන් මහා සද්දයක් ඇහුණේය. ඔහු එක තැනම ගල් ගැහී සාවධානව වික වේලාවක් කන් දීගෙන සිටියේය. වික වේලාවක් යන විට ඒ මහා සද්දය මහා විලාපයක් බවට පෙරළුණේය. ඔහු තවත් සාවධානව කන් දීගෙන සිටියේය. එවිට ඒ මහා විලාපය සාපලත් ළතෝනියක් බවට පෙරළුණේය. ඇබිත්ත උන්නාන්සේ හෙමි හෙමින් කුටියෙන් එළියට ඇවිත් වටපිටාවට ඇස් යොමු කළේය. එවිට ඝන කළුවරේ ලොකු කණාමැදිරි එළි වගේ හුළු අතු එකින් එක සුරඹාගේ ගේ පැත්තට ඇදෙනවා ඔහු දක්කේය.

ඒ සමගම රැයේ රැහැයි හඬ දෙබෑ කරමින් සුරඹාගේ මවගේ ළතෝනි හඬ පැහැදිලිව ඇහෙන්න ගත්තේය.

'සැක්කර හාන්දුරුවනේ... මේ මොන මෙහෙණ හතක් ගහලද අපට... මේ පරට්ටි අපේ ලේ උරා බොන්න ආපු යකින්නියක්... කොපමණ ලේ ගොටු දුන්නත් මේ යකින්නිගේ ලේ පිපාසේ යන්නේ නෑ... මුලින්ම මගේ මිනිහ මරා ගත්තා... එතකොට මෙකි මේ ගෙට ඇවිත් දවසයි... ඔන්න බිලි ගත්ත [illegible] හැටි... මුලින්ම මගේ මිනිහ... ඊළඟට මගේ පළවෙනි මුණුබුරා... අපෝ... උඹට මේ ලෝකේ දකින්ඩවත් ඉඩ දුන්නේ නෑ... බඩේදීම උගේ ලේ උරා බීවා... ඊළඟට දෙවෙනි මුණුබුරා... එළියට අරන් පෙකනිවැල කපනකොටම බිලි ගත්තා... මේ සොහොන් කාලි එවපු අවතාරයක් ... ගමටම ගහපු දේව සාපයක්... තවත් යහනින් හිටියොත් මේ යකින්නි තවත් පරාණ බිලි ගනියි...'

ඒ සමගම වගේ මහා විලාප හඬක් ඇහුණේය. ඇගේ ළතෝනි හඬ පරයමින් ගමේ මිනිසුන් කෑ ගහන, විලාප දෙන හඬවල් ඇසෙන්න ගත්තේය. මිනිසුන් එහාට මෙහාට දුවන, හදිසි කලබල හඬවල් ඒ සමග මුහු වෙන්න ගත්තේය. ඇබිත්ත උන්නාන්සේ හිටි තැන හිටි විදිහටම හිටගෙන මොහොතක් කල්පනා කළේය. පසුව යළි කුටිය ඇතුළට ගොස් අඳනකඩය උඩින් දෙපට සිවුර දමාගෙන ඝන කළුවරේම එළියට බැස අඩියට දෙකට සුරඹාගේ ගේ දිහාට දුවන්න ගත්තේය.

හුළු අතු පත්තු කරගෙන හිස්වලට අත් ගසාගෙන, බය බිරාන්තව ඇස් ඇරගෙන සිටි මුළු ගමෙන් බාගෙටත් වැඩි සෙනග පිරගෙන ඇබිත්ත උන්නාන්සේ සුරඹාගේ ගේ ඉදිරිපිටට යන විට හීනෙකින්වත් නොහිතපු ඒ බියකරු දර්ශනය ඔහුට දකින්න ලැබුණේය.

ගෙදර ඉදිරිපස ලොකු සියඹලා ගහේ උස අත්තක ගැට ගැසූ වර පටක එල්ලී සුරඹා සිය දිවි නසාගෙන සිටියේය. වර පටට හිරවූ ඔහුගේ පුෂ්ටිමත් ගෙල දෙසත්, නිදහසේ එහා මෙහා වැනුණු අප්‍රාණික දෙපා දෙසත් එක වර එකට බැලූ ඔහුට මෙය සිද්ධ වී වැඩි වේලාවක් නැති බව හැඟුණේය. සිප දෙනෙකු ඒ අසුරු සැණින් සියඹලා ගහට නැග ඔහු පරීක්ෂා කර තිබුණත් සියල්ල සිදු වී හමාර වී තිබුණේය.

'කවුරුවත් දක්කේ නෑ හාන්දුරුවනේ... අර ගැති පොළොවෙ හැපි හැපී සාප කර කර හිටියේ... ඔක්කොම බලා හිටියේ ඒ දිහා... කවුද හිතන්නේ ඔය අව් අස්සේ අර මිනිහ බෙල්ලට තොණ්ඩුව දාගන සියඹලා ගහෙන් බිමට පනී කියලා...'

සිද්ධිය ඇසින් දුටු ගමේ වැඩිහිටියෙකු උන්නාන්සේට සිද්ධිය විස්තර කළේ එසේය.

'එක සැරේ මිනී දෙකයි... එකක් ගේ ඇතුළේ, එකක් ගේ ඉස්සරහ...'

තවත් කෙනෙක් එසේ කීවේය. ඒ අතර වැදූම් ගෙයින් එළියට එන ගමන් උන්නාන්සේ දුටු වින්නඹු අම්මා මෙසේ කීවාය.

'මං මොනා කියල කරන්නද හාන්දුරුවනේ... දරුව එළියට එනු කොට මළ කඳක්... මයේ හිතේ මියැදිල දවස් ගාණක් වෙනවා කුස ඇතුළේම... දේව සාපයක්ම තමා මේක...'

එය අසා සිටි තවත් වැඩිහිටියෙක් එය එකහෙළා අනුමත කළේය.

'හැබෑව... මේක දේව සාපයක්... දැන් මිනී කීයක්ද ? අපොයි අහිංසක සුරඹටත් ඒ සාපෙන් ගැලවෙන්ඩ බැරි වුණා... මේ සාපේ මේ ගමේ තව ජීවිත කීයක් බිලි ගනීද කියල කව්ද දන්නේ...'

The Reader's Place

ඒ වන විට සියඹලා ගහේ එල්ලී තිබුණ සුරඹාගේ
සිරුර ගමේ තරුණයන් විසින් බිමට බාගෙන තිබුණේය.
නැති බව තේරුම් ගත්තත් ගමේ වෙද රාළ ඔහුගේ සිරුර
ගොස් වර පොටට හිර වූ බෙල්ලේ දකුණු පසට සිය
මැදගිල්ලත්, දබරැගිල්ලත් තබා මොහොතක් නිසොල්මන්ව
මෙසේ කීවේය.

'මට කරන්ඩ පුළුවන් කිසිම දෙයක් ඉතිරි වෙලා නෑ.'

ඒ සමගම සිය පුතුගේ දේහය බදාගත් සුරඹාගේ මව
විලාප තියන්න ගත්තාය. මෙවර ඇගේ වචන පෙර මෙන් පැහැදිලි
වූයේ නැත. ඒ වචන එකිනෙකට එකක් නොගැළපී එක එඩ
පෙරළී ගියා මිස ඇ පොළොවේ අත් ගසා පස් දූලි අහසට
කරමින් කියූ කිසි දෙයක් කාටවත් තේරුණේ නැත.

මේ අතර තවත් දෙයක් සිදු වුණේය. සුරඹාගේ හීන් අම්මා
වැදුම් ගෙයි ඇතුළේ සිටි සොබනී එළියට තල්ලු කළාය.
හැඳ සිටි රෙද්ද මළ දරු ප්‍රසූතියෙන් ගලා ගිය ලෙයින් තැවරී
තිබුණේය. ඇගේ ඇස් ඉදිමී දොඹ ගෙඩි වගේ රතු වී තිබුණේය.
තොල් පට පැලී ලේ ගලමින් තිබුණේය. මුහුණ පුරා කෙස් විසිරී
කැරලි ගැසී තිබුණේය. සුරඹාගේ හීන් අම්මා තල්ලු කළ
සැරට ඇ පියවර කීපයක් උඩින් මිදුලට විසි වී උඩුබැලි අතට
වැටුණාය. ඒ සමගම ඇ නැගිටින්න තැත් කරන අතර සුරඹාගේ
හීන් අම්මා බිමට නැමී පොළොව සූරාගත් ගල් බොරලු මිට
මොළවා වියරුවෙන් ඇ දෙසට විසි කරමින් කෑ ගහන්නට වූවාය.

'මෙන්න සොහොන් කාලි අවතාරේ... බලාපියව් මේ තමයි
සොහොන් කාලි අවතාරේ... එක සැරේ මිනී දෙකයි.. ඊළඟට
තෝ කව්ද බොල බිල්ලට ගන්නේ... කියාපිය... කාගේ ලේද තෝ
බොන්න හදන්නේ...' .

හීන් අම්මා එක දිගට පොළොව හූරමින් ඇයට එක දිගට
ගල් බොරලු දමා ගසන්නට වූවාය. මේ වියරු දර්ශනය තවත්
උත්සන්න වූයේ එතෙක් වේලා සිය පුතුගේ මිනිය අසල විලාප
දුන් සුරඹාගේ මවද ඊට එකතු වූ පසුවය. දෙදෙනා දෙපැත්තෙන්
සිට අතට අහුවන හැම දෙයින්ම සොබනීට දමා ගසන්නට වූහ.

විලාප තියන්නට වූහ. සාප කරන්නට වූහ. විසිවන ගල් මුල්වලට
තුවාලි වුණ සොබනීගේ සිරුරෙන් සීමාවක් නැතිව ලේ ගලා
හැලෙන්නට වුණේය. ඇ එහා මෙහා විසිවුණු මිදුලේ හතර කොන
ලේ පැහැ වුණේය. රැස්ව සිටි සියල්ලන්ම වචනයකුදු නොදොඩා
කිසිම අනවසර මැදිහත්වීමක් නොකර ප්‍රීතියෙන් හෝ ශෝකයෙන්
හෝ යුතුව මේ වියරු දර්ශනය නරඹමින් සිටිද්දී සොබනී එක්
වරම ලේ පෙරාගෙන සිහිසුන්ව බිම ඇදගෙන වැටුණාය.

ඒ සමගම දෙව්, මිනිස්, සුර, අසුර, යක්ෂ, නා ලෝක
කලම්බාගෙන සුවාසු දහසක් යොදුන් වූ සප්ත මහා සාගරය
අළලවාගෙන මහමෙර ඇතුළු සප්තකුල පර්වතයන් මුලිනුපුටා
හමන යුගාන්ත වාතයක් පරිද්දෙන් භවාග්‍රයේ සිට රසාතලය
කෙළවර තෙක්ම වූ අනන්තාපරියන්ත ජීව අජීව සියලු හඬවල්
කීතු කීතු කර දමමින් ඇබිත්ත උන්නාන්සේගේ කටහඬ ඇසුණේය.

'නවත්තපියව්... ඔය කරුමක්කාර සෙල්ලම... තොපි
හදන්නේ තවත් මිනියක් මෙතනට එකතු කරන්නද...? ආයෙම
එකෙක් එක දූලි කැටයක් විසි කරනව එහෙම නෙමෙයි...මේ
කෙල්ලව...'

ගහක කොළයක් බිම වැටෙන හඬ වුවත් ඇහෙන තරමට
සියල්ලෝම නිශ්ශබ්ද වූහ. මේ කිසිවෙකු මේ තරම් බර සාරෙට
මීට කලින් ඇබිත්ත උන්නාන්සේගේ හඬ අසා තිබුණේ නැත. ඇස්
ගෙඩි එළියට පැන කටවල් අයාගත් ගමන් සියල්ලෝම මේ සත
කළුවරේ උසට උසේ දිලිසෙන ඒ සද්දන්ත පංචස්කන්ධය දිහා
බලා සිටියහ. ඇබිත්ත උන්නාන්සේ ඉදිරියට ගියේය. සුරඹාගේ
අම්මාත්, හීන් අම්මාත් මිදුලේ වැටී සිටි තැනට ඉදිරියටම ගියේය.
ඒ දෙදෙනාම සියොලඟ පුරා දූලි ගාගෙන මහ හඬින් නැගෙන
හති හඬ හදවත තුළම තෙරපාගෙන ඇබින්දකුදු සද්දයක් නැතිව
උන්වහන්සේගේ රත්ව ගිය යවට වන් ඇස් දිහා එක එල්ලේ බලා
සිටිනු බැරිව බිම බලාගත්හ. ඇබිත්ත උන්නාන්සේගේ දකුණතේ
දබරැගිල්ල හීයක වේගයෙන් ඒ දෙදෙනා දෙසට දික් විය.

'තොපි දෙන්න මොන කාලකණ්ණිද බොලව්... තොපි
දන්නවද තොපි මැරිල ගොඩක් කල් විත්තිය. මෙතන මිනිස්ද

The Reader's Place

කිලි ගන්නේ වෙන කවුරුවත් නෙමෙයි පණ පිටින් වළේ හිටි... දැනටමත් මැරිච්ච තොපි දෙන්නා... උඹලට ඇහුණද...'

ඔහු මහ සෙනඟ දිහාට හැරුණේය.

'සුරඹා ගුරුන්නාසේගේ මරණයට කාටවත් වග කිය... බෑ... ඒක උන්දෑගේ කරුමෙ... ඒත් මැරිච්ච කිරි සප්පයො දෙන්... මේ සුරඹාගේ මරණෙටයි වග කියන්ඩ ඕන මුන් දෙන්නා...'

සියල්ලෝම මුහුණට මුහුණ බලාගත්හ. මෙහෙම කත... කාගේවත් කටින් පිටවෙන්න පුළුවන්යැයි කියන හැඟීමක් කා... තිබුණේ නැත.

'මුන් දෙන්නා මේ සොබනිට දහ වද දුන්න... දහ බැණු... බැන්නා... මේ ගෑනි බඩින් ඉද්දි අනේක වැඩ රාජකාරි පංගො... කළා. බඩ දරු ගෑනියෙකුට මේ තරම් දහ දුක් උහුලන්න අමාරු... හැම දේකටම සීමාවක් තියෙනවා. ඒ හින්දා ඒ කිරි සප්... මැරුණේ මුන් දෙන්නගේ නපුරුකමට... අර කොල්ල මැරුණ... මේ හැම දුකක්ම උහුලගෙන බලාගෙන ඉන්න බැරිව......'

ඒ සමගම ගෑනු දෙන්නා යළි යටිගිරියෙන් මරහඬ තලන්... පටන් ගත්හ. එකා පරයා එකා බිම පෙරළි පෙරළී වියරුවෙ... වෙව්ලමින් කෑ ගහන්න ගත්හ. සුරඹාගේ අම්මා කියූ කිසි දෙය... පැහැදිලි වුණේ නැත. එහෙත් හීන් අම්මා කියූ හැම දෙයක්... පැහැදිලිව ඇහුණේය.

'අනේ සිවුරන් දෙයියනේ... මේ බඩින් දරුවො වදපු ම... ගෑනු දෙන්නට මේ උන්නාන්සේ මෙහෙම කියන්නේ ඇයි....? අප... කිසි වරදක් නෑ.. මේ ඔක්කොම මේ පරට්ටිගේ කාලකණ්ණිකම... අහිංසක අපට මෙහෙම චෝදනා කරනවට මේ උන්නාන්සේ... හෙණ ගහන්ඩ ඕන...'

ඉන් ඉක්බිතිව මෙහෙම දෙයක් සිදු විය.

ඇබිත්ත උන්නාන්සේ ගෑනු දෙදෙනාට නුදුරුව සෙනඟ... ඉදිරියෙන් එක වරම බිම ඉඳගත්තේය. එරමිණිය ගොතාගත්තේය. ඇස් දෙක පියාගත්තේය. දැත් එකිනෙක පටලවා පද්මාසනයෙන් වැඩ හිඳ මේ ගෑනු දෙන්නාගේ සාපලත් හඬවල් ඇතින් ඇසෙ... ඇහෙද්දී එකම එක මොහොතක්... ඔව්... එකම එක මොහොතක්...

භාවනා කළේය. ඒ මොහොත ගත වත්ම අහස ගුගුරන්න පටන් ගත්තේය. විදුලි කොටන්න පටන් ගත්තේය. එක වැහි බිඳකුදු බිම වැටෙන්නේ නැතිව ඈත භවාග්‍රයේ කෙළවර සිට හියක වේගයෙන් හමා ආ මහා හෙණ දෙකක් මහා හඬ නංවමින් විදුලි සැර විහිදුවමින් ගැනු දෙන්නාගේ ඇඟට වැදුණේය.

යළි පුදුමාකාර නිහඬතාවයක් ඇති විය.

එය මේ සක්වළ එතෙක් මෙතෙක් ඇති වුණා වූ අදහාගත නොහැකි නිහඬතාවය විය යුතුය. සෙනඟ අතර සිටි සමහරෙක් ක්ලාන්ත වී බිම වැටුණාහ. තවත් සමහරෙක් ඉබේටම බිම ඉන්ද වුණාහ. තවත් අයෙක් සද්ද නොනගා දොහොත් මුඳුන් දී හිටිවනම සිටියහ. කිසිවෙකුට කිසිවක්ම හිතාගන්න බැරි විය. ඇබිත්ත උන්නාන්සේ තවමත් පද්මාසනයේ වැඩ සිටියේය. තවත් මොහොතක් ඒ විදිහටම ගත විය. හෙණ පහර වැදී බිම වැටී සිටි ගැනු දෙන්නා ආයාසයෙන් නැගිටින්න උත්සාහ ගත්හ. එහෙත් යළි කෙහෙල් කඳන් වාගේ බිම ඇදගෙන වැටුණහ. ඊළඟට ඔවුහු බිම දිගාවී වැලි දූලි තම සිරුරුවලට දමා ගසාගනිමින් ආයාසයෙන් බඩ ගාගෙන වගේ ඇබිත්ත උන්නාන්සේ පද්මාසනයෙන් වැඩ සිටි තැනට ළං වූහ. දොහොත් මුඳුන් දී සාධු සාධු සාධු යැයි කියමින් ඇබිත්ත උන්නාන්සේ ළඟ වැඳ වැටුණහ. ඒ සමඟ යළි වෙව්ලමින් බිම දිගා වුණහ.

මෙයින් ඉක්බිතිව රැස්ව සිටි මහ සෙනඟින් නැඟුණා වූ සාධුකාර හඬ සක්වළ එතෙරටම පැතිර ගොස් මහමේරු පර්වතය පවා දෙදරුම් කෑවේය.

තවත් මොහොතක් එලෙසම සිට ඇබිත්ත උන්නාන්සේ පද්මාසනයෙන් මිදී හුන් තැනින් නැගිට්ටේය. පිරිස එකත්පස්ව ඔහු ළඟට කිට්ටු වෙන්නවත් බය පක්සපාතව ඇත් මැත් වුණේය. සුරඹාගේ මවත්, හීන් අම්මාත් කිසිම වග නිච්චියක් නැතිව කට කට ගා වෙව්ලමින් පස් අහුරු දෙක බැගින් අත්වල ගුළි කරගෙන කටින් සෙම වගුරවමින් සිටියහ. හරියටම ඔවුන් දෙදෙනාගේ නළලට මඳක් උඩින් තරමක් ලොකු පිලිස්සී ගිය කළු පැල්ලම් දෙකක් තිබුණේය. ඈත සිට කාට වුවත් මඳ කළුවරේ වුණත් එය

The Reader's Place

පැහැදිලිව දකගත හැ... සොබනී සිහිසුන්ව වැටී සිටියාය. මේ සිද්ධ වුණු කිසිවක හැඟීමක් දැනීමක් නැති සිරුර පුරා වූ තුවාලවලින් ලේ ගලා හැලෙද්දී ඇ සිහිසුන්ව වැ... සිටියාය. ඊටත් මඳක් එහායින් සුරඹාගේ මළකඳ තිබුණේය. ... දණ්ඩ කැඩී දිව තරමක් එළියට පැන තිබූ ඒ මළකඳෙහි තවමත් ඇස් ඇරී තිබුණේය.

ඒ සමඟම සුරඹාගේ ගෙතුළ සිට කිසිවෙක් එළියට පැමිණියහ. සියල්ලන්ගේම අවධානය ඒ දෙසට යොමු වුණේය. විත්තාඹු අම්මා ලේ වැකුණු මස් වැදල්ලක් වන් මියගිය දරුවා සිය පපුවට තුරුලු කරගෙන රැගෙන ආවාය. පෙකණිවැල කපා ... විට ශේෂ වූ කොටසක් තවමත් ඔහුගේ නාභියෙන් එල්ලෙමින් තිබුණේය. ඉදිරිපස දිගා වී තිබුණ සිරුර හතර දිහාම එක වර බලා විත්තාඹු අම්මා පපුවට තුරුලු කරගෙන ආ මළ දරුවා සොබනී වැතිර සිටි ළඟින් තබා ඈත් වුණාය.

සියල්ලන්ම තුෂ්ණිම්භූතව මේ සිරුරු දිහා බලාගෙන හුල්ලද්දී ඇබිත්ත උන්නාන්සේගේ ඒ තියුණු කටහඬ නැවත ගිගුම් දුන්නේය.

'... ඉර නැඟින්න තව දෙහෝරාවයි තියෙන්නේ... ඒ දෙහෝරාව ගත වෙන්න කලින් මිනී දෙක කැළේ ගහන්න ඕන. මං දන්නම් මෙතන ඉඳගෙන පාංශකූලෙ දෙනවා...'

ඊළඟට ඔහු ගමේ පුංචි ගුරු කට්ටඩි රාළට කතා කළේය.

'ගුරුන්නාන්සේ මේ ගෙදර සුද්ධ පවිත්‍ර කරලා සුරඹාගේ ඥාතීන් එක්ක කතා බහ කරල මේ ගෑනු දෙන්න ගැන බලාගන්ඩ ඕන...'

ඊට පස්සේ කතා කළේ වෙද රාළටය.

'සොබනී ගෙනියන්ඩ ඕන පන්සලට... මං පාංශකූලේ දීලා ඉවර වෙනකං... බෙහෙත් හේත් ලෑස්ති කරගන්ඩ...'

ඒ සියලු අණදීම්වලින් ඉක්බිතිව මේ සියලු සිදුවීම් දෙස ඇස් අදහගන්න බැරිව බලා සිටි ගමේ ආරච්චිල දෙසට ඇබිත්ත උන්නාන්සේ හැරුණේය.

The Reader's Place

'ආරච්චිල උන්නැහේ තවත් කල් අරගෙන මේ ඉලව්ව විභාග කරන්ඩ ගත්තොත් මේ ප්‍රශ්න තවත් දික් ගැහෙනවා. ඒ හින්දා මේ මිනිය මෙහෙමම කැළේ ගහන එක හොඳයි කියලයි මගේ අදහස... ඉහළින් නියෝග ආවොත් මේ ගැන පරීක්ෂණය කළා කියල කියන්ඩ...'

ඉන් අනතුරුව මෙවැනි සිය දිවි නසා ගැනීමක් සඳහා එය සිදුවූ ගමෙන් රජ්ජුරුවන්ට ගෙවිය යුතු වූ රිදී පනහක දඩ මුදල ගෙනියන්න පන්සලට එන ලෙස ඇබිත්ත උන්නාන්සේ ආරච්චිලට කීවේය. ආරච්චිල එය ප්‍රතික්ෂේප කළ අතර ඒ ගැන තමා බලා ගන්නම් යැයි පෙරළා පිළිතුරු දුන්නේය.

කෙමෙන් කෙමෙන් සිංහල පැ තිහක රාත්‍රී කාලය ගෙවී යමින් තවත් සිංහල පැ තිහක දවල් කාලය එළඹෙන්නට මඟ බලාගෙන ඉර උදා වෙන්නට තතනන අතර ඇබිත්ත උන්නාන්සේ ගමේ සියලු දෙනා හා එක්ව මියගිය සුරඹාටත්, මෙලොව එළිය දකින්නට කලින් මෙලොව හැර ගිය නමක් නැති නාඳුනන දරුවාටත් පාංශකූලය දුන්නේය. පසුව ගම්මු මිනී දෙකම එකම ලී මැස්සක තබා කැළේට ගෙන ගොස් වළ දැම්මාහ.

කට්ටඩි රාළ සුරඹාගේ ඥාතීන් සමඟ එක්ව ගෑනු දෙන්නා ගෙට ගෙන ඇවිත් ඔවුන් වෙනුවෙන් වෙනම යාතිකාවක් කරන්න පටන් ගත්තේය.

මේ සියල්ල මෙසේ සිද්ධ වෙද්දී ඇබිත්ත උන්නාන්සේ ලේ තැටි ගැසී විරූප වී මස් වැදල්ලක් තරමට භයංකාර වූ සොබනී සිය උරහිසට රැගෙන සිය පඬුවන් සිවුර ඇගේ ලෙයින් තවත් පඬුවන් පාට වන විත්තිය ගාණකටවත් නොගෙන වෙදරාළත් එක්ක පන්සල දෙසට ගමන් කරමින් සිටියේය.



The Reader's Place

The Reader's Place

07

ඇබිත්ත උන්නාන්සේගේ උර මතින් සොබනී පන්සලට ආවේ එක්දහස් අටසිය පහළොව අවුරුද්දේ නවම් මහේ පහළොස්වනදා අලුත් දවසක අලුත් ඉරක් නැග ආ මහ පාන්දරය. එදා හවස් වන විට අවුරුදු දෙදහස් තුන්සියක සිංහලේ රාජ්‍ය උරුමය ඉංග්‍රීසි හමුදාව මහනුවර අල්ලාගැනීමත් සමග එංගලන්තයේ තුන්වන ජෝර්ජ් රාජෝත්තමයාණන්ට හින්දු වෙමින් තිබුණේය. ඒ වන විට පලාගොස් සැඟවී සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඊට දවස් තුනකට පසුව මහනුවර ගල්ලැහැවත්තේ දී අල්ලාගන්නා ලද බව ගම්මුන්ට ආරංචි විය.

ඇබිත්ත උන්නාන්සේ සිය ජීවිතයේ දීර්ඝතම රාත්‍රිය ගත කර තිබුණේ එදාය. මරණ දෙකක්, හෙණ ගැසූ ගැහැනු දෙදෙනෙකු, සිහි මූර්ජා වූ ගැහැනියක සමග ගත වූ ඒ රාත්‍රිය සමග සිංහලේ අන්තිම රජ්ජුරුවන්ගේ රාජ්‍ය පාලනය අවසන් වූ අතර උදා වන අලුත් පාලනය ගැන හිතාගන්නවත් බැරි මානසික තත්ත්වයක ඔහු සිටියේය.

එදා උදෑසන ඇබිත්ත උන්නාන්සේ වෙද රාළත් කැටුව සොබනී කර මතින් රැගෙන කෙළින්ම ගියේ පන්සලේ සිය කුටියටය. ඇඳ මතින් ඇගේ සිහිසුන් සිරුර හොවා ඔහු වෙද

රාළට වෙදකම් කරන්න ඉඩ හැරලය. ඒ අතර තමාගේ සිංහ
අඩුවැඩිය එකතු කරගෙන ලොකු හාමුදුරුවන් වැඩ සිටි ලැගු
ගෙට මාරු වුණේය.

සොබනී සැබවින්ම මරණාසන්නව සිටියාය. වැදුම් සෑ
තුළ මළ දරු උපත සිද්ධ වන විට ඇගේ සිරුරෙන් දිවැන්
ලේ කන්දරාවක් පිටවී තිබුණේය. එපමණක්ද නොව ඊට කලින්
දවසේ මහ පාන්දර සිට ඊට පසු දවසේ මධ්‍යම රාත්‍රිය වෙන
තෙක්ම ඈ විළිරුදාවෙන් දඟලා තිබුණාය. දවසකට ආසන්න
විළිරුදා කාලය ඇගේ සිරුරේ ජවය සම්පූර්ණයෙන්ම විනාශ කර
තිබුණේය. ඒ තීරණාත්මක දවස තුළ ඈ කෙතරම් දහඩිය, කඳුළු
ලේ වැගිරුවාදැයි දත සිටියේ වින්නඹු අම්මා විතරය.

සත්‍ය වශයෙන්ම පළවෙනි දරුවාට මෙන්ම මේ දරුවාට
කිසියම් අකරතැබ්බයක් සිදු වී නම් සිය දිවි හානි කරගැනීමට ද
සූදානම් වී සිටියාය. වින්නඹු අම්මා දරුවාගේ පෙකණිවැල කපන
අතර දරුවා හුස්ම ගන්නේ නැති වින්තිය කියන විට සොබනී
සිය හිස තිබූ කොට්ටය යටින් නියඟලා අලයක් අතට ගත්තාය.
යන්තම් ඇගේ දත් නියඟලා අලයේ වදින විට වින්නඹු අම්මා
දරුවා එහෙමම ඇඳ මත තියා සොබනී ඉදිරියට පැන ඇගේ
පයින් ගසා නියඟලා අලය ඈතට විසි කළාය. ඒත් නියඟලා විෂ
ඇගේ ශරීරගත වී තිබුණේය.

පසුව සුරඹාගේ අම්මාත්, හීන් අම්මාත් එක්ව ගෙයින් මිදුලට
තල්ලු කර ගල් බොරලු ගසා මරන්නට තැත් කළේ මෙසේ ඒ වන
විටත් බාගෙට මැරී සිටි සොබනීය.

වෙද රාළගේ රාජකාරිය බරපතළ විය. ඔහුට එකවර කාරණා
කීපයකට ප්‍රතිකාර කරන්න සිද්ධ විය. එක පැත්තකින් ඇගේ
සිරුරේ ලේ හිඟකමටත්, අනෙක් පැත්තෙන් ශරීරගත වූ නියඟලා
විසටත්, තවත් පැත්තකින් සිරුර පුරා ගල් බොරලු පාරවල් වැදුණ
ලොකු තුවාලවලටත් ඔහුට එකවර ප්‍රතිකාර කරන්න සිද්ධ විය.

'මගේ අත් ගුණේට වැඩිය මේ දූරිවිගේ වාසනාව තිබුණොත්
හොඳ පැත්තට හීන්දුවක් වෙයි. නැත්තං ඇබිත්ත උන්නාන්සේගේ
වචනෙට මිසක් අත ගහන්න පුළුවන් කාරණයක් නෙමෙයි මේක...'

මුල් හෝරාව ඇතුළත ඇය ඉහේ සිට දෙපතුල වෙනතක්ම
පරීක්ෂා කර බැලූ වෙද රාළ කීවේ එසේය. බලාපොරොත්තු
තියාගත හැකි එකම කාරණාව වුණේ සිහි මූර්ඡාවී සිටියත් යන්තම්
ඇගේ නාඩි වැටෙන එක විතරය. එහෙත් ඔහු උත්සාහය අත
හැරියේ නැත. අනෙක් අතට ඇබිත්ත උන්නාන්සේ උත්සාහය
අත් හරින්න ඉඩ දුන්නේත් නැත.

'ජීවිතේම දුක් විඳපු ගෑනියෙක් මේ... මැරෙන්න කලින්
පොඩි සතුටක් භුක්ති විඳින්න පොඩි හරි වාසනාවක් මැට
තියෙන්න ඕනා...'

ඇබිත්ත උන්නාන්සේ සිටි ආස්ථානය ඒකය. සියලු රාජකාරී
වෙද රාළට තනිවම කරන්න බැරි වූ බැවින් පොඩිනාගේ ගෙදර
රහස් බෙත් වෙළෙඳාම කරමින් සිටි ගුණයා ඇගේ අවසර ඇතිව
තාවකාලිකව පන්සලට කැඳවාගන්නට ඔවුන්ට සිදු විය. ඒ අතර
විටින් විට පන්සලට ඇවිත් පොඩිනාත් රතාත් අත් උදව් දුන්හ.

දවස් හතරක් ඇතුළත ඇගේ ශරීරගත වී තිබූ නියඟලා විෂ
ඉවත් කරන්නට වෙද රාළ සමත් විය. එහෙත් බරපතළම කාරණය
වූ ලේ ඌනතාවය තරමක සාමාන්‍ය තත්ත්වයට ගන්නට තව
දවස් පහක් මහන්සි වෙන්නට වෙද රාළට සිදු විය. මේ කාරණා
දෙකම තරමක් දුරට නිරාකරණය කරගෙන යන විට ඊළඟ ලොකුම
ප්‍රශ්නය වුණේ ඇගේ තුවාල පැසවන්ට පටන් ගැනීමය. මුළු
සිරුරම තුවාලවලින් පිරුණ වණයක් වී තිබූ බැවිනුත්, එසේම
සියලු තුවාල එදා ගෑනු දෙදෙනා විසි කළ සාපලත් දූලිවලින්
අපවිත්‍ර වී තිබූ බැවිනුත්, තත්ත්වය ඉතාම බරපතළ විය.

අත් උදව්වට පැමිණි දවසක ඇබිත්ත උන්නාන්සේ සිය
දරුවාගේ කිරි අම්මා වූ පොඩිනා සමඟ ඒ ගැන කතා කළේය.
පොඩිනා සොබනීගේ සිරුර දෙස මොහොතක් බලා සිට තීරණයක්
ගත්තාය.

'මට දවස් තුනක් දෙන්ඩ... මොනා හරි කරන්ඩ පුළුවන්ද
බලන්ඩ...'

ඉක්බිතිව ඈ අත් උදව්වට සිටි ගුණයා ගෙදර යැව්වාය.
ගෙදර සිටි මැණිකා සමඟ බිංදු පන්සලට කැඳවාගත්තාය. මෙ

The Reader's Place

රාළ මාමා ගෙදර යවා ලොකු බෙහෙත් ඔරුවක් ගෙන්වා ගත්තාය. පසුව මැණිකාගේද සහයෝගය ඇතිව ඒ බෙහෙත් ඔරුව කට මුලට එනකම්ම සිය තන කිරෙන් පිරෙව්වාය. පුරා දවස් තුනක් එක දිගට නොකඩවා සොබනී ඒ බෙහෙත් ඔරුවේ ගිල්වා තැබුවාය. දවස් තුනකට පසු සොබනී ඒ බෙහෙත් ඔරුවෙන් ගොඩ ගත්තා විට තුවාල තිබුණ තැන්වල ඉතිරි වී තිබුණේ කැළැල් විතරය.

මැදින් මාසේ දෙවෙනිදා එනම් ඒ මූසල සිද්ධියෙන් දවස් පහළොවකට පසු සොබනී ඇස් ඇරියාය. මේ දීර්ඝ නින්දෙන් පසු ඇස් අරින විට ඈ මුලින්ම දුටුවේ පොඩිනාය. ඈ මැටි බිත්ති දෙදරන තරම් මහා හයියෙන් කෑ ගැසුවාය.

'අනේ මාව මරන්න එපා.... දෙයියෝ මං කියන ඕන දෙයක් කරන්නම්... මං අරූට මොකුත් කළේ නෑ... ඌ නිකම්ම මැරුණා... නෑ... නෑ... එහෙම නෙවෙයි ඌ උගේ බෙල්ල ඌම මිරික ගත්ත... ඔව්... මං හොඳටම දැක්ක... ඌ බෙල්ල මිරිකගන්න ගමන් මං දිහා බලල හිනා වුණා... මාත් හිනා වුණා...'

ඊළඟට ඈ ඇඬිල්ලත්, කෑ ගැහිල්ලත් පැත්තක තියා මහ හඬින් හිනා වෙන්න ගත්තාය. කොච්චර හයියෙන් හිනා වුණාද කියතොත් ඇගේ ඇස්වලින් විතරක් නොව බලා ඉන්න අයගේ ඇස්වලිනුත් කඳුළු එන තරම් හයියෙන් ඈ හිනා වුණාය.

'ඔව්... මාත් හිනා වුණා... අපි දෙන්න හිනා වෙවී පැය ගාණක් හිටියා... ඊට පස්සෙ තමයි එයා හිනා වෙවී බෙල්ල මිරිකා ගත්තේ... එයා මටත් කිව්ව මගේ බෙල්ල මට මිරිකගන්න කියල මෙන්න මේ විදිහට...'

ඈ සිය දෑත් ගෙල වටා යවා තද කරන්නට වූවාය. පොඩිනා වහා ඉදිරියට පැන මරු විකල්ලෙන් දඟලමින් සිටි ඇගේ කම්මුලට වැරෙන් පහරක් ගසා දෑත් දෙපසට කළාය. ඈ යළි සිහි නැතිවූවාය.

පැය දෙකකට විතර පසු ඇට යළි සිහි එන විට පොඩිනා ගෙදර ගොස් සිටි අතර ඇගේ ඇඳ ළඟ හිටියේ උඩු කයට මුකුත් නැතිව අඳනකඩය විතරක් ඇඳගෙන සිටි ඇබිත්ත උන්නාන්සේත් වෙද රාළත් විතරය.

එවර එක වර ඈ කෑ නොගැසුවාය. ඇස් ලොකු කර වටපිට බලමින් ඈ කිසිවක් සෙවුවාය.

'අම්මයි හීන් අම්මයි උයන ගෙට ගියාද...?'

'නැහැ මෙහේ ඒ කවුරුවත් නෑ...' ඇබිත්ත උන්නාන්සේ කීවේය.

'බොරු කියන්නෙ... ඒ ගොල්ලෝ දැන් එයි...'

ඈ සිය ඇඟිලි තුඩුවලින් දෑස් වසාගෙන මුනින් තලා වුණාය.

'මං නෑයි කියන්න ඒගොල්ලන්ට...'

සොබනී ඒ විදිහට තවත් පැයක් සිටියාය. එවර ඈ දෑස් ඇර උඩුබැලි අතට පෙරළෙන විට ඇඳ ළඟ හිටියේ ඇබිත්ත උන්නාන්සේ විතරය. වෙද රාළ දවස් පහළොවකට පසු ගෙදර ගොස් සිටියේය. සොබනී ඇබිත්ත උන්නාන්සේ දිහා ඇස් පුංචි කර බලා මෙසේ ඇසුවාය.

'කෝ ඒ ගොල්ලෝ...'

'මෙහේ ඒ කවුරුවත් නෑ...'

'එතකොට කෝ මගේ මිනිහා...'

'උඹලට තව මහන්සියි... මොනා හරි කාල බීල ඉන්ඩ... ඊට පස්සෙ මං විස්තර කියන්නම්...'

'මට තිබහයි...'

ඈ කීවාය. පොඩිනා හදිස්සියකට කියා වෙන් කර තබා තිබූ තන කිරි නැළි පහක් ඈ එක හුස්මට බීවාය. පසුව ඈ යළිත් නින්දට වැටුණාය. ඈ යළි නැගිට්ටේ පහුවදා එළිය වැටෙන පාන්දරය. ඒ වෙලේ ඇබිත්ත උන්නාන්සේ හිටියේ බෝධි වෘක්ෂය ළඟ භාවනා කරමිනි. භාවනාවේ අවසන් කාලය පසු කරමින් නෙත් පියාගෙන සිටි ඔහු සොබනී තමා ඉදිරියේ හිටගෙන සිටිනවා මනසින් දුටුවේය.

'ඔහොම ඉඳගන්ඩ...'

ඔහු කීවේය. ඈ ඉඳගත්තාය.

'එරමිණිය ගොතා ගන්ඩ...'

ඈ එරමිණිය ගොතාගත්තාය.

'ඇස් දෙක පියාගන්ඩ...'

ඈ දෑස් දෙක පියාගත්තාය.

The Reader's Place

'දූත් එක හුස්මෙන් හුස්ම ඉහළට පහළට අරගෙන හාවෙනා කරන්ඩ පටන් ගන්ඩ....'

'මට බෑ...' ඈ කීවාය.

'ඇස් දෙක පියාගත්තම මට අරුං දෙන්න යකින්නියෝ විදිහට පේනවා....'

සැබවින්ම එදා සිදු වූ බොහෝ දේ ඈ දැන සිටියේ නැත. ඈ අන්තිමට නිවැරදිව දැන සිටියේ සිය කුසින් මළ දරුවෙකු බිහි වූ බවත්, එය දැක වියරු වැටී ඈ නියඟලා අලය කෑ බවත් පමණය. එහෙත් විටින් විට මතකය පැමිණ නැවත ගිය අතරතුර ඈ සැබෑවත් සිහිනයත් අතර බොහෝ දේ දැක තිබුණාය. ඒ හැම එකකම සිටියේ සුරඹාගේ අම්මාත්, හීන් අම්මාත් විතරය. විටෙක ඔවුන් දෙදෙනා ඈගේ බෙල්ල මිරිකා තිබුණේය. තවත් විටෙක ඔවුන් දෙදෙනා ඈගේ රහසඟ සහ තන පුඩු පිහියකින් කපා බල්ලන්ට කන්න දමා තිබුණේය. තවත් වේලාවක ඔවුන් දෙදෙනා ඈයට ගල් බොරළුවලින් පහර දී තිබුණේය.

එහෙත් ඈ සුරඹාට සිද්ධ වූ කිසිවක් දැන නොසිටියාය.

එබැවින් ඇබිත්ත උන්නාන්සේට සුරඹාට සිද්ධ වූ දේත්, ඊට පසු පන්සලට පැමිණි සැටිත් පැය ගණනක් තිස්සේ ඇයට පැහැදිලි කරන්නට සිදු විය. සියල්ල අසා සිටි ඈ අන්තිමේ පුදුම නිහඬතාවයකට පත් වූවාය. ඇබිත්ත උන්නාන්සේ ඉන් පසුව තමන්ගේ දවසේ සුපුරුදු වැඩ කටයුතුවල යෙදුණ අතර සොබනී මුළු දවසම කඳුළත්, සිනහවත්, ප්‍රීතියත්, ශෝකයත් නැති හැඟීම් රහිත හැඟීමක දැවටී බෝධි වෘක්ෂය අසල ගත කළාය.

එදා උදේ පාන්දර සුරඹාගේ සිරුර කැළේ වළලන විට ඔහුගේ ළඟම ඥාතීන් ළඟ හිටියේ නැත. ඔහුගේ මවත්, හීන් අම්මාත් හිටියේ මෙලෝ සිහියක් පතක් නැතිවය. ඔහුගේ බිරිඳ සොබනී සිහි මූර්ඡා වී සිටියේ ඔහු මියගියාද කියාවත් නොදැනය. පොළොවට මිහිදන් වන මොහොතේ ඔහුගේ ළඟ සිටි එකම ඥාතියා ඔහුගේ මියගිය පුතු විතරය. එහෙත් එහි ඛේදනීය බව කෙතරම්ද යත් සුරඹා කවම කවදාවත් සිය පුතා නොදුටු අතර

ඔහුගේ පුතා ද කවම කවදාවත් සිය අප්පුච්චා දැක තිබුණේ නැත. උනුනුන් නොදුටු මේ දෙදෙනා සංසාර කාලයක් උනුනුන් හොඳට දන්නා විදිහට එකට හිඳ එකට මියගොස් එකට මිහිදන් වී තිබුණේය.

ගමේ තරුණ පිරිස මෙසේ සුරඹාත්, නමක් නැති නාඳුනන දරුවාත් මිහිදන් කරන විට ගමේ කට්ටඩි රාළ සුරඹාගේ මවත් හීන් අම්මාත් ඔවුන්ගේ ගෙතුළට ගෙනැවිත් යාතිකා කරන්නට පටන් ගත්තේය. හීන් අම්මාගේ ස්වාමි පුරුෂයා වූ හේතුහාමි ඔහුට අවශ්‍ය කළමනා ලක ලෑහැස්ති කරදුන්නේය.

වරු දෙකක් එක දිගට යාතිකා කළ පසු යන්තම් හිටගන්න පුළුවන් විදිහට ගෑනු දෙන්නා ගොඩ ගත්ත කට්ටඩි රාළට හැකි විය. එහෙත් සොබනීට ගහන්න වැලි අහුරක් ගත් සුරඹලෑ අම්මාගේ දකුණත ඒ මිට මොළවාගත් විදිහටම ගල් වී තිබුණේය. එසේම හීන් අම්මාගේ වම් අත ඒ විදිහටම ගල් වී තිබුණේය. කට්ටඩි රාළ තෙල් ගා මන්තර කියා කෙතරම් උත්සාහ කළත් ඒ මිට මොළවාගත් අත්වල තිබුණ වැලි කැටයක්වත් ඔහුට ඉවත් කරන්නට බැරි විය.

එහෙත් පුදුමය වුණේ දෙදෙනා කොයි කවර තැනක හිඳගෙන හිටියත්, ඇවිදගෙන ගියත් ඒ මිට මොළවාගත් අත්වලින් වැලි කැට එකින් එක බිම වැටීමය. එහෙත් කෙතරම් වැටුණත් ඒ මිට මොළවාගත් අතට, වැටෙන පමාවෙන් වැලි කැට ඉනුවේය. ඒ අනුව මේ දෙදෙනා කොහේ ගියත් වැලි කැට වැටුණ පාර දිගේ ගොස් ඔවුන් සොයාගත හැකි විය. ඒ වගේම මේ දෙදෙනා කොතනක හෝ ඉඳගෙන හිටියොත් එතැන මේ දෙදෙනා කෙතරම් වේලා ඉඳගෙන සිටියාද යන්න ගොඩ ගැසී තිබුණ වැලි ප්‍රමාණයෙන් කිව හැකි විය.

වරක් එක්තරා හවස් වරුවක හීන් අම්මා හදිසියේ නිවසින් අතුරුදහන් වූ අතර පහුවදා හේතුහාමි විසින් ඇය හොයාගත්තේ ඇගේ වමතින් වැටුණ වැලි කැට දිගේ ගොස් සුරඹා වැළලූ මිනීවළ ළඟදීය. මිනී වළ උඩ වැලි ගොඩක් ගොඩ ගැසී තිබූ අතර ඈ එදා මුළු රෑම එතන ගත කර ඇති බව හේතුහාමි තේරුම් ගත්තේය.

දෙදෙනාගේ නළලට මදක් ඉහළින් තිබූ පිළිස්සුම් තුවාලය කවදාවත් මැකී ගියේ නැත. එහෙත් සතියට දෙවරක් හැම කෙම්බුර දවසකම ඒ තුවාලයෙන් සැරව ගලාගෙන ගියේය. කට්ටඩි රාළ කෙතරම් පිළියම් කළත් එය හරි ගියේ නැත. අන්තිමට හේතුහාමිට ගෑනු දෙන්නාත් රැගෙන වල්ලී ළඟට යන්නට සිදු විය. වල්ලී තුවාලය පාරා එතුළ සිටි ඉහඳ පණුවන් එළියට ගත් අතර ඉන් පසුව සැරව ගැලීම නැවතී ගියේය. එදින සිට සතියට දෙවරක් සැරව ගැලීම නැවතුණ නමුත් මසකට වරක් කෙම්බුර දිනය ළඟා වන විට තුවාල පැසවා සැරව ගලන්නට වූයෙන් හැම මසකම ඉහඳ පණුවන් ඉවත් කරගන්න වල්ලී ළඟට යන්නට ඔවුන්ට සිදු විය.

සොබනී කෙමෙන් කෙමෙන් පන්සලට හුරුවෙමින් සිටියාය. ලොකු හාමුදුරුවන්ගේ තනියට ඇබිත්ත කොලුවා සිටියේය. එහෙත් ලොකු හාමුදුරුවන් අපවත් වුණු දා සිට ඇබිත්ත උන්නාන්සේගේ තනියට පන්සලේ කවුරුවත් හිටියේ නැත. සොබනී පියවි සිහියට පැමිණි දා සිට පන්සලේ පැවති ඒ අඩුව කෙමෙන් අඩු වන්නට වුණේය.

ක්‍රි. පූ. 247 දී දේවානම්පියතිස්ස රජු සිය බෑණනුවකු වූ අරිට්ඨ කුමරු, මිහිඳු මාහිමියන් රැගෙන ආ බුදු සසුනෙහි පැවිදි කළ තැන් පටන් කිසිම කලෙක ස්ත්‍රී පරාණයක් පන්සලක ඇබිත්ත කමට හෝ ආවතේවකමට හෝ සිටි බවට ආරංචියක් නැත. එහෙත් වෙල්ලස්සේ කැළෑබද ගමක අති පුරාණ පන්සලක එය සිද්ධ වී තිබුණේය.

ගමේ සමහර වැඩිහිටියන් කී විදිහට පන්සලේ ගැතියක් සිටීම මාගම් සෝලියකි. ඒ අනුව සොබනී පන්සලේ සිටීමත් ඔවුන් දුටුවේ මාගම් සෝලියක් විදිහටය. එනම් එසේ වූ විට ස්ත්‍රියක් සම්බන්ධ කොට උන්නාන්සේ කෙනෙකුට [illegible]යෙන්ම චෝදනා නැඟිය හැකි වන්නේය.

එහෙත් මේ පන්සලේ හිටියේ සැබවින්ම උන්නාන්සේ කෙනෙක් නොවූ ඇබිත්ත උන්නාන්සේය. එසේම මේ ඇබිත්ත උන්නාන්සේ එසේ මෙසේ උන්නාන්සේ කෙනෙක්ද නොවුණේය.

The Reader's Place

උපසම්පදා නොවුණත් උපසම්පදා උන්නාන්සේ කෙනෙකුට වඩා මේ ඇබිත්ත උන්නාන්සේ නම ගිහි තැන සීලවත් බවත්, බලවත් බවත් ගමමු සහසුද්දෙන්ම දැන සිටියහ. ඒ බලයත් සීලයත් කෙතරම්ද යන්න සුරඟා මියගිය දින ගැමියෝ ඇස් පනාපිටම දැක බලා තහවුරු කරගෙන තිබුණෝය.

එබැවින් මේ ඇබිත්ත උන්නාන්සේ අරබයා කටක් ඇර මාගම් සෝලියක් ගැන චෝදනා කරන්න පුළුවන් ජගතෙක් ගමේ සිටියේ නැත. එසේම ඒ ගැන ඇඟිල්ල දික් කරන්න පුළුවන් හෘද සාක්ෂියක් තිබූ කිසිවෙක් ගමේ සිටියේ ද නැත.

මන්දයත් සොබනී තම නැන්දම්මා විසින් ගල් ගසා මරන්නට තැත් කරද්දී, එසේම මුළු ගමම හා හූවක් නැතිව මේ අපරාධය දිහා බලා සිටිද්දී, ඇගේ පිළිසරණයට හිටියේ ඇබිත්ත උන්නාන්සේ විතරය. ඉතිං මුළු ගමම ඇයව පිටුවහල් කරනු ලැබූ විට ඇගේ එකම පිළිසරණ වූ පන්සලේ මිස ඇ වෙන කොහේ නවතින්නද ?

එබැවින් සොබනී පන්සලේ සිටීම ඇබිත්ත උන්නාන්සේට එරෙහි මාගම් සෝලියක් වුණත් නොවුණත් එය සැබවින්ම සාධාරණ බව ගමමුන්ට හිතන්නට සිද්ධ වී තිබුණේය.

සොබනී වැඩි කල් නොගොස්ම ඇබිත්ත උන්නාන්සේගේ දින චර්යාව තේරුම් ගත්තාය. සාමාන්‍යයෙන් උදේට බෙලි මල් වතුර ටිකක් බොන්න ඔහුට පුරුද්දක් නොතිබුණත්, උදේ පාන්දර බෝධි වෘක්ෂය ළඟ භාවනා කර නැවත ලැගුම් ගෙට එන විට එහි මඩක්කුවකට තැම්බූ බෙලි මල් වතුර ටිකක් තබන්න ඇ පුරුදු වුණාය. මුල් දවස් හතර පහ ඒ බෙලි මල් වතුර ඒ විදිහටම දවල් වෙනකං හිල් වෙමින් තිබුණේය. එහෙත් ඇ ඇගේ පුරුද්ද අත් නොහැරියාය. ඊළඟට සතිය දෙක යන විට මඩක්කුවේ බෙලි මල් වතුර ප්‍රමාණය යන්තමින් අඩු වුණ අතර මාසය දෙක යන විට බෙලි මල් වතුර තියන පරක්කුවෙන් නැවත හිස් මඩක්කුව ගන්න ඇයට සිදු විය.

ඇබිත්ත උන්නාන්සේ උදේ හීල හොඳට ගත්තත් දවල් කෑම වැඩිපුර තැකුවේ නැත. නා කියා ගෙන ඇවිත් නිදාගන්න එක

ඇය ගෙට මලුව පැත්තෙන් විය. සොබනී දවසක් අහම්බෙන් [illegible]
පලතුරු වලක් උන්නාන්සේ හා කියාගෙන එන විට ලැගුම් [illegible]
නමා තිබුණාය. එදා සිට දවල් කෑමට ලොකු පලතුරු [illegible]
තියන්න සොබනීට සිදු විය.

ඉස්සර පටන්ම ඒ කෑම ඇබිත්ත උන්නාන්සේගේ [illegible] ගෙනාවෙ වූ බැවින් ඔහු මොහොතේ විට කළේ ඒව සතියෙන් [illegible] ගෙන ඒමය. එහෙත් සොබනී පැමිණි දින සිට ඔහුගේ ඒ [illegible] නැවතිණ. ඈ කෑම ඒකම හරිම රසට ඔහුට උයා පිහා [illegible] මහය දෙන යන විට උන්නාන්සේගේ කැමති අකමැතිකම් [illegible] හොඳින් හඳුනාගත් බැවින් අද ඒව කලප තිබුණා නම් හොඳයි [illegible] ඔහු සිතන විට ඈ කලප උයා තිබුණාය. අද හොඳ රොටී [illegible] යැයි ඔහු සිතන විට ඈ රොටී පුච්චා තිබුණාය.

දෙදෙනා අතර කොහොමත් එතරම් කතා බහක් නොවීය. එයට හේතු වූයේ දෙදෙනා එකිනෙකා සමග කතා කරන්නට අකමැති වූ නිසා නොව දෙදෙනා වඩාත් හොඳින් එකිනෙකා තේරුම් ගත් බැවින් දෙදෙනාට කතා කරන්නට තරම් දෙයක් නැති වූ නිසාය.

දවසක් ඇබිත්ත උන්නාන්සේගේ අද [illegible] නියවිය යුතු යැයි සිතා වාඩි වෙන විට එය ඇඳ ළඟම තිබුණේය. තවත් දවසක අද සිවුර හෝදාගත යුතු යැයි සිතා ලැගුම් ගෙට යන විට ඇඳ උඩ ඒ සිවුර සෝදා නමා තිබුණේය.

අන්තිමට මේ පුංචි පන්සල තුළ දෙදෙනා නිතර මූණ ගැහුණේ නැති වුණත් දෙදෙනාම හිතා හිටියේ දෙදෙනා නිතර මුණ ගැහුණු බවය.

දිනක් පාන්දර නැගිට උදෑසන වැඩ කටයුතු හමාර කොට ටිකක් විවේක ගන්න සිය කුටියට ඇතුළු වන විට සොබනී උළුවස්ස ළඟ ගොඩ ගැසී තිබූ වැලි ගොඩක් දුටුවාය. තව ටිකක් පරීක්ෂා කරන විට එය පන්සල හරහා එක දිගට වැටී තම කුටිය ළඟින් නැවතුණු වැලි පාරක් බව ඇය තේරුම් ගත්තාය. පළමුවෙන් බියට පත් වූ ඈ ඊළඟ මොහොතේ කෝපයෙන් වියරු වැටුණාය

වැලි ගොඩ ළඟට ගිය ඈ මදක් එතැන නැවතී සිට [illegible] කල්පනා කොට බිත්තියට හේත්තු කර තිබූ අත් [illegible] කොට ගත්තාය. පසුව එක දිගට වැලි වැටී තිබූ වැලි [illegible] ඇවිදගෙන ගියාය. ඈ නතර වුණේ සිය පරණ ගෙදරය. [illegible] අම්මාත්, නිත් අම්මාත් ගෙයි පිලේ ඉඳගෙන සිටියහ. ඈ [illegible] මලුනු දෙදෙනා ඉඳගෙන සිටි නැතින් නැගිට බිත්ති [illegible] උත්සාහ කළෝය. ඒ අතර පුරඹිලා අම්මගේ [illegible] පිළිස්සුම් කුවාලය පැරී සැරව උතුරා ගලන්නට වූයේ [illegible] හදිස්සියට කළෙල වරිච්චි බිත්තියේ වැදුණ නිසාය.

සොබනී ගෙට ගොඩ වෙන්නේවත් නැතිව මේ ඉස්සරහ ඉඳගෙන නෑ ගැසුවාය.

'තවත් තොපි මොකටද යකෝ මගෙ පස්සෙන් එන්නේ... තොපෙයි මගෙයි ඇයි හොඳයිකං ඉවරයි... ආයෙ පස්සෙන් ඇවිත් අඬ වුණොත් පෙනි ගහල මරනවා...'

සොබනී වචන පිට කළේ ක්ෂේන්තියෙන් වෙව්ලමින්. ඒ වෙව්ලිල්ලට අතේ තිබුණ අත් පොරොව පවා හෙලවෙන්න ගත්තේය. මේ අතර වරිච්චි බිත්තියට මුවා වූ ගෑනු දෙන්නාගේ ඇස් දෙකක් තිබුණු [illegible] බිරාන්තකම පරයා නැගෙන සරදම් සිනාවක් ඈ දුටුවාය. ඈ [illegible] වියරු වැටුණාය.

'මං දන්නව තොපි දෙන්න මට තාම හිනාවෙන විත්තිය. මං කාලකණ්ණි විදිහට මැරිල යනකං... මව්... තොපි බලං ඉන්නෙ මං කව්ද කියලා...'

බලාගනිව් මම දවසක තොපිට පෙන්නනව මං කව්ද කියලා...'

ගෑනු දෙන්නා එසේ සිටියදී ඈ ආපහු හැරී එන ගමන් මිදුලේ සියඹලා ගහට දැන බදා පොරොවෙන් කෙටුවේ හිතේ පැසවන ක්ෂේන්තිය වැඩිකමටය. ඒත් ක්ෂේන්තිය සංසිඳුණේ නැත. ඈ ගියාට වඩා වේගයෙන් පන්සලට පැමිණියාය. කෙළින්ම ඈ ගියේ ඇබිත්ත උන්නාන්සේගේ ලැගුම් ගෙටය.

ඇබිත්ත උන්නාන්සේ එවේලේ හිටියේ නා කියාගෙන ඇවිත් දවල් නින්දට පෙර සොබනී තියා ගිය පලතුරු වට්ටිය හිස් කරමිනි. ඈ කුටියට ඇතුළු වුණාය. ඇතුළු වී උළුවස්ස ළඟ හිටගෙන හයියෙන් හතිලන්න වුණාය. ඇබිත්ත උන්නාන්සේ

ඇගේ සම්ප්‍රාප්තිය තුන් හිතකින්වත් මේ වෙලාවේ බලාපොරොත්තු වූයේ නැත. අනෙක ඇගේ අතේ තිබූ අත් පොරොවත්, ඇගේ ඇති අසාමාන්‍ය විලාසයත් ඔහු පුදුමයට පත් කළේය. ඇබිත්ත උන්නාන්සේ පුදුමයෙන් තම දකුණත දිහා බලන විටය, සොබනීට මතක් වුණේ තාමත් අත් පොරොව තම අතේ ඇති විත්තිය. ඇ අත් පොරොව බිම අත හැරියාය. එය මැටි පොළොවේ ගැටී බොල් හඬක් නගා නිහඬ විය. ඉන් ඉක්බිතිව තාමත් හතිලන ඇ දිහා බලාගෙන ඇබිත්ත උන්නාන්සේ මෙසේ ප්‍රශ්න කළේය.

'මොකද මේ...'

'උන් මට හිනාවෙනවා...' ඇ කීවාය.

'කවුද...?' ඇබිත්ත උන්නාන්සේ නැවත ප්‍රශ්න කළේය.

'...උන් ඔක්කොම...'

'ඔව්, ඉතින් කවුද කියන්න මට...'

'මුළු ගමම...'

'නෑ කවුරුවත් සොබනිට හිනාවෙන්ඩ විදිහක් නෑ... ඒ ඉස්සර... දැන් එහෙම වෙන්න විදිහක් නෑ...'

'අද මං දැක්ක මගෙ ඇස් දෙකින්ම...'

'මොකක්ද...'

'අර ගෑනු දෙන්න මට හිනාවෙනවා...'

එවර ඇ අත් දෙකෙන් මූණ වහගෙන ඉකි බිඳින්න ගත්තාය. ඊළඟට ඇගේ මුවින් පිටවූ වචන ඇහුණේ ඒ ඉකි බිඳිල්ලත් එක්ක එකට මුසු වීය.

'ඒ විදිහට පිටින් පෙන්නුවේ නැති වුණාට මුළු ගම හිනාවෙනවා ඇති මට...'

'සොබනි මොකටද ආයේ ඒ ගෙදරට ගියේ...'

'උන් දෙන්නගෙන් කවුරු හරි ඊයේ රෑ පන්සලට ඇවිත් ඉඳල තියෙනවා. මං ගිහින් කිව්ව ආයෙ මගෙ පස්සෙන් ආවොත් පෙති ගහනව කියලා...'

ඇ තවත් හයියෙන් ඉකි බිඳින්න ගත්තාය. ඇය අස්වසාලමින් ඔහු මෙසේ කීවේය.

'ආයේ ඒ ගෑනු දෙන්න සොබනිගෙ පස්සෙන් එන එකක් නෑ.'

'නැහැ... උන් මට හිනාවෙනවා මං මගේ ඇස් දෙකෙන්ම දැක්කා... උන් හිනාවෙන්නේ මගේ කාලකණ්ණිකමට, අම්ම කෙනෙක් වෙන්න බැරි අවාසනාවන්ත කමට...'

ඇබිත්ත උන්නාන්සේ දුක්මුසුව එහෙත් විස්මයෙන් ඇ දිහා බලාගෙන සිටියේය. නිහඬතාවය තුළ ඇගේ ඉකි බිඳුම විතරක් යන්තමින් ඇහුණේය. ඒ අතර ඇය ඔහුට මෙවැනි ප්‍රශ්නයක් යොමු කළේය.

'ඔය ඇත්තො මං ගැන හිතන්නෙත් ඒ විදිහට නේද ?...'

'නෑ... සොබනී අවාසනාවන්ත ගෑනියෙක් නෙමෙයි...'

'පුළුවන්ද මට ඒක ඔප්පු කරන්ඩ...'

'ඇත්තමයි මම එහෙම හිතන්නේ නෑ...'

'එහෙම කිව්වට ඒක ඔප්පු වෙන්නේ නෑ...'

'එහෙනං...?'

ඇබිත්ත උන්නාන්සේ තවත් විස්මයෙන් ඇ දිහා බැලුවේය.

සොබනී ඉකි බිඳුම නවත්තා මෙසේ කීවාය.

'මං කාලකන්නි ගෑනියෙක් නෙමෙයි කියල ගමට ඔප්පු කරන්න මං මගේ බඩින් දරුවෙක් වදන්න ඕන...'

ඇ කියාගෙන ගිය වාක්‍යය එක වර නවතා ඔහු දෙස සැප්ව බැලුවාය.

'ඔය ඇත්තට පුළුවන්ද මට ඒක ඔප්පු කරන්ඩ උදව් කරන්ඩ...'

ඒ සමග ඇති වූ නිහඬතාවය දෙදෙනාටම දරාගන්න බැරි විය. දෙදෙනාම දෙදෙනා දිහා ඇහිපිල්ලමක්වත් ගහන්නේ නැතිව බලාගෙන සිටියහ. දෙදෙනාම දෙදෙනාගේ හිත් කියවමින් සිටියහ. ඒත් දෙදෙනාටම අනෙකාගේ හිතේ සිතිවිලි පැහැදිලිව කියවන්න බැරි විය. ඒ තරමට, දෙදෙනාටම නොතේරෙන තරමට දෙදෙනාගේම සිතිවිලි සංකීර්ණ විය. අවසානයේදී තරමක දීර්ඝ විරාමයකට පසු ඇබිත්ත උන්නාන්සේ මෙතෙක් හිඳගෙන හුන් සයනයෙන් නැගී සිටියේය. මඳක් සොබනීට ළං වෙමින් මෙසේ කීවේය.

'මං උඹට කාලකණ්ණි ගෑනියෙක් විදිහට මැරෙන්න ඉඩ තියන්නේ නෑ...'

The Reader's Place

සොබනී සිය සිරුරටම තද වුණ රෙද්ද බුරුල් කළාය. උඩුකය වැසුණු හැට්ටය ගලවා දැම්මාය. අමු නිරුවතින් හැ... හොල්මනක් නැතිව හිටගෙන හිටියාය. තරමක් මඳ කළුවර වුණත් ඇබිත්ත උන්නාන්සේ ඇගේ සිරුර පුරා පැතිරුණු තුවාල කැළැල් දුටුවේය. ඇගේ හුස්ම වැදෙන තරමට ඇයට ළං වූ ඔහු හද තුළින්ම නැග ආ ආදරණීය බවකින් සුකුව ඒ තුවාල කැළැල් ස්පර්ශ කළේය. ඈ හැඟීම් හරිතව නෙත් පියාගෙන ඔහුට ඉඩ දුන්නාය. ඔහුගේ සියුම් ඇඟිලි තුඩු ඇගේ සිරුර පුරා හෙ... අරුටිස්සමකින් දිව ගියේය. ඈ තවත් නෙත් පියාගෙන ඔහුට ඉඩ දුන්නාය. ඔහුගේ හුස්ම ඇගේ හුස්ම සමඟ හැපී නොහැපී සිරුර පුරා උඩට පහළට ගියේය. ඈ එවරත් නෙත් පියාගෙන ඔහුට ඉඩ දුන්නාය. එහෙත් ඇගේ පියයුරු තුඩු ඔහුගේ බෙට ග්‍රාවයෙන් තෙත් වන විට ඈ නෙත් ඇර ඔහු බදා වැලඳගෙන ඔහුගේ දෙතොල් හපන්න පටන් ගත්තාය.

ඒ ආදරණීය සම්භෝගය පැයක් දෙකක් විතර එක දිගට තිබුණේය. දෙදෙනාම දෙදෙනාගේ සිරුරු අත හැර වෙන්වෙන්න බැරි තරමට ඒකාත්මික වී සිටියහ.

කිසිම හදිසියක් දෙදෙනාටම තිබුණේ නැත. මුළු විශ්ව කාලයම තම සම්භෝගය වෙනුවෙන් වෙන් කර ඇති බව දෙදෙනාටම හැඟුණේය. දෙදෙනාම තමාගේ සිරුර අනෙකාට ඇති තරම් විඳින්නට ඉඩ හරිමින් එහි ගිලී කිමිදෙන්න ඉඩ හරිමින් ඒ ඉඩ හැරීම තුළම පරමානන්දයට පත් වෙමින් සිටියහ. එසේම තමාගේ සිරුර අනෙකාගේ සිරුර තුළට ඇදී තෙරපී යන මොහොතේ එය නැවත තමාගේ කරගැනීමට වඩා අනෙකා තුළ තිබීමම හොඳ යැයි දෙදෙනාම සිතූහ.

...ර්ෂ ගණනාවකට ඉස්සර මිනිසා කොයි
...ව මත බිහි වුණත් එදා පටන් පිරිමියෙකු සහ
...ත් මිනිසෙකු බිහි කරන මිනිසාගේ ප්‍රාථමික
... සුඛානන්දයට පත් විය හැකි බවක් ඇබිත්ත
... දැන සිටියේ නැත. ඒ සුඛානන්දය ලිංගික
...ටම හැමෝටම එනම් හැම පිරිමියෙකුටම,

ගැහැනියකටම ළං කරගත නොහැකි බවත්, එය ආදරයේ දිව්‍යමය ප්‍රකාශනයක් හරහා පමණක් බිහි වන බවත් ඔහු හඳුනාගත්තේය. එනම් ඔවුන් දෙදෙනාගේ රමණයේ උපරිම අන්තයේදී දෙදෙනාගේ දිව්‍යමය ආදරයේ දිදුලන ආලෝක පුළිඟුවක් ඔහු දුටුවේය.

මිනිසා උපන්නේ ලිංගිකයෙන් බවත්, ඔහුගේ පැවැත්ම ලිංගික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බවත්, ඒ ලිංගික ක්‍රියාවලිය දෙදෙනෙකුගේ දිව්‍යමය ආදරයක පිළිබිඹුවක් වූ විට අසමසම සමාධියකට එළඹිය හැකි බවත් ඔහු තේරුම් ගත්තේය.

සැබැවින්ම ඔහු මෙතෙක් භාවනානුයෝගී ධ්‍යානයෙන් ළඟා වූ සමාධි සුවය සහ ඒ විශ්විය ශක්තිය, ආදරයේ දිව්‍යමය ප්‍රතික්‍රියාවක් හරහා සිදු වූ ලිංගික රමණය තුළින්ද ළඟා කරගනිමින් සිටියේය.

සිංහල හෝරා දෙකකට විතර පසු රමණයේ කෙළවර දෙදෙනා සම්පූර්ණ නිරුවතින් සයනය මත පද්මාසනයෙන් හිඳ ඔවුනොවුන් දෙස බලාගෙන එහෙත් නෙත් පියාගෙන භාවනානුයෝගීව සිටියහ. දෙදෙනාම දෙදෙනා ගැන ආදරයෙන් ... එහි දිග පළල අනෙකාගේ හිත් තුළ හඳුනාග... වෙළී සිටි අතර ... සිටියහ. ඒ ආදරය හැර සියල්ල ...න්න දෙදෙනාම ... හිස් බවත්, එයම ජීවිතය ජීවත් කරන බවත් එය හඳුනාගැනීමම වචනයෙන් විස්තර කළ නොහැකි සමාධි සුවයක් බවත් දෙදෙනා තේරුම් ගනිමින් සිටියහ.

ඒ සමාධි සුවය විඳිමින් තවත් හෝරා දෙකක් ඔවුහු පද්මාසනයෙන් සයනය මත නෙත් පියාගෙන සිටියහ. එහෙත් ඇත්තම කාරණය ඇබිත්ත උන්නාන්සේ සිටියේ සයනය මත නොවේ.

පද්මාසනාරූඪ වූ ඔහුගේ සිරුර සයනයෙන් මඳක් උඩ අවකාශයේ පාවෙමින් තිබුණේය. අතීතයේ දවසක ඇබිත්ත කොලුවා බෝධි වෘක්ෂය අසලදී ලොකු හාමුදුරුවන්ගේ සිරුර අවකාශයේ පාවෙමින් තිබෙනු දුටු විදියටම එවේලේ ඇබිත්ත උන්නාන්සේගේ සිරුර අවකාශයේ පාවෙමින් තිබුණේය. එහෙත් එය කිසිවෙකුත් දුටුවේ නැත. එවේලේ ඔහු ඉදිරියෙන් ඇස්

The Reader's Place

පියාගෙන සිටි සොබනී මනසින් එය දුටුවාය. ඈ එය හැබැහින් දුටුවේ නැත. ඒ නිසා ඇය එය විශ්වාස කළේ ද නැත.

මින් ඉක්බිතිව ඇබිත්ත උන්නාන්සේගේ දෛනික කාල සටහන තරමක් වෙනස් වුණේය. පන්සල සුද්ධ පවිත්‍ර කර හා කියාගෙන ඇවිත් පලතුරු වට්ටිය අහවරක් කර දවල් නිදාගැනීම සඳහා ගත කළ කාලය ඔහු සොබනී සමඟ ලිංගික රමණය වෙනුවෙන් හැම දවසකම වෙන් කළේය.

ඒ අනුව උදේ පාන්දර බෝ මැඬ යට ධ්‍යාන සමාධි සුවයත් දවල් වරුවේ කාමරයේ සයනය මත මෛථුන සමාධි සුවයත් ලෙස දවසට දෙවරක් භාවනානුයෝගීව සිටින්නට ඇබිත්ත උන්නාන්සේ පුරුදු වුණේය.

මේ වෙනසත් එක්කම ඔහුගේ මනස විශ්වීය අවකාශය තුළ සැරිසරන්නට වූ අතර ශරීරය පුලුන් රොදක් තරමට සැහැල්ලු වන්නට විය.

The Reader's Place

08

වල්ලී ගමනුන්ට හැකිවම බැරි කෙනෙක් වෙන්න වැඩි කාලයක් ගියේ නැත. ලොකු හාමුදුරුවෝ අපවත් වන විට සොළොස් විය සපුරා සිටි ඇය හාඹර තරුණියක්ව සිටියාය. විකිරිට වඩා දෑ අවුරුද්දකින් වැඩිමල් වූ ඇ සේදරාට වඩා අවුරුද්දක් බාල වූවාය. සුදු බණ්ඩාට හෙවත් ඇබිත්ත උන්නාන්සේට වඩා ඇය බාල වූයේ අවුරුදු තුනක් විතරය.

ඇ හිතන විදිහට පුංචි කාලයේ ඉඳන්ම ගෝමරීගේ හිතේ ඇ කෙරෙහි ලෙංගතුකමක් තිබුණේ නැත. එහෙත් ඇත්තම සිද්ධිය වුණේ දරුවන් හත් දෙනෙකුගේ මවක් වූ ගෝමරී ඒ දරුවන්ගේ කුඩා කාලයේදී උන් හදාගැනීමේ යම යුද්ධයකට පැටලී සිටි නිසා එකිනෙකා වෙනුවෙන් වෙන් වෙන්ව ආදරය කරන්න ඇයට ඉඩ පාඩුවක් නොතිබුණ එකය. එමෙන්ම වල්ලීට වඩා අවුරුදු හයක් බාල මැණිකාත්, ඇයට වඩා අවුරුදු නවයක් බාල එතනාත් පවුලේ බාලයන් වූ බැවින් වල්ලී යන්තම් දැනුම් තේරුම් ඇති වයසට එන විට සිය මව තමාට වඩා අනෙක් ගැහැනු දරුවන්ට ආදරය කරන බව ඇ හඳුනාගත්තාය. ඔවුන් දෙදෙනා ඇයට බාලයන් වූ නිසා සැබවින්ම එසේ කිරීමට ගෝමරීට සිදු වූ බැවින් වල්ලී එ තේරුම් ගත්තේ අම්මා තමාට බිඳක්වත් ආදරේ නැතය කිය ද්වේෂී හැඟීමෙනි.

The Reader's Place

ඒ නිසා ගෝමරි පිළිබඳ මෙම ද්වේෂී හැඟීම වල්ලි ළදරු කාලේ අරෙ සිටම වැඩි දියුණු කරගෙන ආවාය. එහෙත් වල්ලි වැඩිවියට පත්වන්න ළං වන විට ගෝමරි තමාගෙන් සිදු වූ අතපසු වීම තේරුම් ගනිමින් සිටියත් ඒ වන විට සැබැවින්ම ඇ ප්‍රමාද වී සිටියාය.

මේ නිසා අවුරුදු එකොළහේදී වැඩිවියට පත්වූ පසු සිය අප්පුච්චා වූ පුංචි රාළ ඔහු සමඟ හේනට යන්න ඇයට කතා කළ විට සිය අම්මාගේ මූණවත් බලන්නේ නැතිව ඇ ඔහුගේ අතේ එල්ලී හේනට ගියාය. ඇයට ඕනෑ වුණේ හිතට දැනෙන විදිහට කාගේ හෝ ආදරයක් ලබන්නය. ඇ සිතුවේ සිය අප්පුච්චා තුළ තමා සොයන මේ ආදරය ඇති බවය.

එහෙත් ජීවිතේටවත් කාටවත් ආදරය කරන්න වේලාවක් තිබුණේ නැති එසේම ඒ ගැන හැඟීමක්වත් තිබුණේ නැති පුංචි රාළ ඇයව වැඩිවියට පත් වූ පහුවදාම හේනට අරගෙන ගියේ ඇගේ සරාගී බවට වශීකෘත වූ නිසාය. අනෙක් අතට ගෝමරිගෙන් පළිගන්න ඔහුට හොඳටම උවමනා වූ නිසාය.

පුංචි රාළත් එක්ක හේනට ගොස් අවුරුද්ද හමාර යන විට ඔහු තුළ තමා සොයන ආදරය නැති බව ඇ තේරුම් ගත්තාය. ඔහුගේ වලස් රෝමවලින් පිරුණු හැඩි දැඩි කයට යට වන හැම වාරයකම ඇ ඔහුව ප්‍රතික්ෂේප නොකළාය. නමුත් ඇ හිටියේ දර කොටයක් ගාණටය. එහෙත් උපන්දා සිටම දරදඬු එකියක වූ ඇ මේ සියල්ල දරාගෙන සිටියාය. සිය අප්පුච්චා වූ පුංචි රාළ දමා යන්න ඇට කොහොමටවත් උවමනා වුණේ නැත. ඒ වෙනකොට මේ මහ පොළොවේ කවුරුන්වත් ආදරය නොකරපු වේලාවක ඇ වැඩිවියට පත් වුණු දවසේ පුංචි රාළ ඇ වෙනුවෙන් කළ සැලකිල්ලත්, එදා ඔහුගෙන් පළ වුණු ඒ පුංචි ආදරයත් ඇගේ හදවත පතුලේම තැන්පත්ව තිබුණේය. තවමත් ඇ එදා පුංචි රාළගෙන් ලත් කනකර මාල වළලු තෝඩු ආදී මනිබඩු සියල්ල පත් පෙට්ටියක අසුරා වසා ආරක්ෂිතව තබා තිබුණාය.

හැම රෑකම පුංචි රාළ ප්‍රතික්ෂේප නොකරන නොකරන වාරයක් පාසා, එසේම පුංචි රාළත් එක්ක ඇඳේ නිදිවදින වාරයක් වාරයක් පාසා ඇ සිය මවට ගෝමරිට තව තවත් ද්වේෂ කරන්නට ගත්තාය. එය පිස්සුවක් වන තරමට, ආවේගයක් ආවේගයක් වන තරමට තම හිත තුළ පැසවන තරම ඇයටම හිතාගන්න බැරි විය.

අවසානයේදී පණ පිටින් සිටි ගෝමරිගෙන් ඇ ආවේග වුණාය. මේ ආවේගය කෙතරම් ප්‍රබල වුණාද කිවොත් ගම්මු විශ්වාස කළේ ඇට කළ නොහැකි දෙයක් නැති බවය.

එහෙත් සුරබලෑ අම්මාත්, හීන් අම්මාත්, හේතුහාමි විසින් වල්ලි වෙත කැඳවාගෙන ආ විට ඇ කීවේ ධ්‍යාන සමාපත්ති බලයකින් සිද්ධ වූ දෙයක් ඇයට කෙසේවත් ආපසු හැරවිය නොහැකි බවය. ඒ අනුව ඒ ගෑනු දෙන්නාගේ මිට මොළවාගත් ගමන් ගල් ගැසුණු අත්වලට ඇයට මුකුත්ම කළ නොහැකි බව ඇ කීවාය. එහෙත් හෙණ ගහද්දී ඇති වූ පිලිස්සීම් තුවාලයෙන් සතියට දෙවරක් සැරව ගලද්දී ඇ එහි බෝවෙන ඉහඳ පණුවන් අයින් කර එය මාසයකට වතාවක් දක්වා අඩු කළාය. එහෙත් තමාට පණ පිටින් කුණු වූ ශරීර තුළ ඉහඳ පණුවන් බෝ වීම සදහටම වැළැක්විය නොහැකි බවත් ඇ ඔවුන්ට කීවාය.

The Reader's Place

මෙසේ දවසින් දවස ඇගේ බල පරාක්‍රමය වැඩිවෙද්දී ගමේ පුංචි ගුරු කට්ටඩි රාළට වැඩ අඩු වන්නට වූ අතර ඇයට තව තවත් වැඩ වැඩි වුණේය.

මුලදී මුලදී වල්ලි ඇත්තටම පුංචි රාළට බය වුණාය. හැඩපලු ගෙතුණ දිග කෙස් බූස්සයක් වවාගත්, වලස් නාම්බෙකු වගේ කට්ට කළු රෝම ඇඟ පුරා පුරවාගත් හතර රියනකටත් වඩා උස මේ හැඩි දැඩි මිනිහා ඇවිදින විට පොළොව හෙල්ලෙන බව ඇ විශ්වාස කළාය. කුඩා කල පුංචි රාළ ඈත සිට ගෙදර එන විට ඇ හඳුනා ගත්තේ පොළොවට කන තබා බැලීමෙන්ය.

මේ ඔක්කෝටම වැඩිය ඇ බය වුණේ ඔහුගේ වම් ඇහි බැමට උඩින් අත් පොරෝ පහරක් නිසා ඇති වූ තුවාල කැළලටය. පුංචි රාළ සිය මුල් බිරිඳ ඩිංගිරි හෙවත් සුදු බණ්ඩාගේ මව රැගෙන එන්න ගිය දවසේ ඇගේ පියාත් එක්ක සිද්ධ වූ බහින් බස් වීමක් දුර දිග ගොස් මේ අත් පොරෝ පහර වැදී තිබුණේය. පුංචි රාළ එවේලේ ඔහු බෙල්ලෙන් අල්ලා ළඟට ගෙන සිය ඉණේ තිබූ ව

පිහියෙන් ඔහුගේ වම් ඇස උගුල්ලා දැමූ අතර ඔහු ඔහුගේ ඉතිරි ජීවිත කාලයම ගත කර තිබුණේ දකුණු ඇස පමණක් ඇතිවය.

මේ ඉගිල්ලූ ඇස කට්ටඩියෙකු ලවා ජීවම් කර ඔවුන් පුංචි රාළගේ ගෙදර මායිමේ වළ දැමූ බවත් ඒ කොඩිවිනය පුංචි රාළට වැදෙනවා වෙනුවට ඔහුගේ බිරිඳ ඩිංගිරිට වැදී ඈ සුදු බණ්ඩා බිහි කළ වහාම අකාලයේ මියගිය බවත් ගම්මු විශ්වාස කළහ.

කෙසේ වෙතත් වල්ලී පුංචි රාළගේ මේ වම් ඇහැට උඩින් ඇති තුවාල කැළලට බිය වූවාය. හැම රෑකම පුංචි රාළ ඇගේ ඇඟ උඩ නැගී හති හලමින් උස් පහත් වන විට ඇගේ මූණට කෙළින්ම හමු වුණේ මේ තුවාල කැළැලය. ඔහු උස් වන විට පුංචියටත්, පහත් වන විට ලොකුවටත් පෙනුණ මේ තුවාල කැළැලට ඈ කෙතරම් බිය වුණාද කීවොත් ඈ අන්තිමේ ඔහු ඇඟ උඩ නගින විට ඇස් පියාගන්න පුරුදු වුණාය.

එහෙත් ටික කාලයක් ගත වන විට ඔහුගේ ඒ තුවාල කැළැල පිළිබඳ බිය පමණක් නොව ඔහු කෙරේ වූ බියද අඩු වන්නට විය. ඉන් පසු ඈ ක්‍රම ක්‍රමයෙන් ගෝමරීගේ ආවේශයෙන් සාත්තර කියන්නට වූ විට ඈ පුංචි රාළ කෙරේ බය වනු වෙනුවට පුංචි රාළ ඈ කෙරේ බය වන්න පටන් ගත්තේය.

The Reader's Place

මුලදී මුලදී වල්ලිගේ ආවේශය පුංචි රාළට තරමක විහිළුවක් වුණත් ගමේ ආරච්චිලගේ මියගිය මව, වල්ලී මිනී වළෙන් ගොඩ ගත් දා සිට මුළු ගමම වල්ලීට බය වුණා වාගේ පුංචි රාළත් ඇයට මුහුණ දෙන්න බය විය.

එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් ඈ සාත්තර කියන සතියේ කෙම්මුර දිනවලත් ඒ කෙම්මුර දිනට කලින් දවසේත් ඊට පහුවදාත් ඈ සමග බුදියන එක පුංචි රාළ මඟ හැරියේය. ඒ අනුව පුංචි රාළට හිතේ එකලාසයක් ඇතිව වල්ලීත් එක්ක සංවාසයේ යෙදෙන්න ඉතිරි වී තිබුණේ සඳුදා දවස විතරය.

මෙසේ පුංචි රාළ කෙරෙන් තරමක් ඈත් වන්නට පටන් ගත් විට වල්ලී තමා සාස්තර කීමෙන් උපයාගත් මුදල් වියදම් කර අලුතෙන් ගෙයක් හදන්න පටන් ගත්තාය. ඒ අලුත් ගෙදර ඈ ගෝමරීගේ ආවේශයෙන් සාස්තර කියන්න වෙනම දේවාලයක් හැදුවාය. විවිධ දේව රූප තිබූ ඒ දේවාලයේ දේව මණ්ඩලයේ හරි මැද නිතර වසා තැබූ මංජුසාවක් තිබුණේය. සාස්තර කියන්න මත්තෙන් ඈ කාටත් නොපෙනෙන්න ඒ මංජුසාව ඇර එයට දුම් ඇල්ලුවාය. ගම්මුන්ගේ කට කතා අනුව එහි තිබුණේ රිදී කාසි බර ගාණක් වටිනා දඹ රත්තරන්වලින් නිම වූ කාලි මෑණියන්ගේ ජීවම් කළ රූපයකි. එහෙත් ඇත්තටම එහි තිබුණේ එවැන්නක් නොවේ. එහි ඇත්තටම තිබුණේ වල්ලී මැණිකා ලවා ගෙදරින් හොරෙන් ගෙන්වාගත් ගෝමරීගේ හිසේ කෙස් ගස් තුනකි.

වල්ලී සිය තනි මහන්සියෙන් අලුත් ගෙදර හදා නිම වූ පසු පුංචි රාළ තවත් තනි වුණේය. ඔහුට හිතේ එකලාසයක් ඇතිව ඒ ගෙදර ගත කරන්න තිබුණේ සතියේ දවස් හතෙන් සඳුදා දවස විතරය. අනෙක් දවස්වල ඉදහිට ඔහු එහි නොසිටියා නොවේ. ඒත් ඒ එතරම් හිතේ පිරියකින් නොවේ. කොහොමටත් ඔහු ඈ සාස්තර කියන බදාදා සෙනසුරාදා කෙම්මුර දවස්වල ගෙදර හිටියේම නැත. මේ නිසා හේනේ පැල වඩා හොඳට හදාගන්න ඔහුට සිදු විය. ඒ අනුව සතියේ වැඩි දවසක් හේනේ පැලේ තනියමත්, සඳුදා දින සහ තවත් දිනයක් දෙකක් ගෙදර වල්ලී සමගත් ගත කරන්න ඔහු හුරු වුණේය.

මුලදී ගෙදර බඩුවක් මුට්ටුවක් එහා මෙහා වුණේත් පුංචි රාළට ඕන විදිහටය. වල්ලී ඇන්දේ පැලැන්දේත් පුංචි රාළට ඕන විදිහටය. ඈ උයා පිහා දුන්නේත් පුංචි රාළට ඕන විදිහටය. එහෙත් අවුරුදු තුන හතර යනවිට මේ පිළිවෙළ ටිකෙන් ටික වෙනස් වුණේය. වල්ලී කොහොමටත් තමාට වුවමනා විදිහට අලුත් ගේ හැදුවාය. පුංචි රාළගෙන් යම් උපදෙසක් දෙකක් ඒ සඳහා විමසුවා මිස ඈ ඒවා පවා ක්‍රියාත්මක කළේ තමාට උවමනා විදිහටය. තවත් පැත්තකින් පුංචි රාළ වැඩිපුර හේනේ පැලේ ගත කළේ වෙනකක් නිසා නොව මේ අලුත් ගෙදර තමාට නුහුරු නුපුරුදු තැනක් විදිහට දැනුණ නිසාය.

පහළොස් වන වියට, දහසය වන වියට එළඹෙන විට ඈ දකින කෙනෙක් දෙවරක් නොව හතර පස් වරක් හැරී බලන තරමේ රූ සපුවකට හිමිකම් කියමින් සිටියාය. අතේ ඕනෑ තරම්

සෙල්ලි නිමුණු නිසා වල්ලී සතියට දෙවරක් තම්බි මුදලාලිට ත... ගෙදරට එන්න නියම කර තිබුණාය. වරක් බදාදා දවසක ... වරුවේ අබ්දුල් තම්බි මුදලාලි මනිබඩු රැගෙන ආ වේලේ ... සිල්ක් රෙද්දක මිල ඈ විමසූ විට මුදලාලි කීවේ රිදී කාසි ... එය විකුණන බවය. වල්ලී වහා ආවේග වුණාය.

'යකෝ තෝ මේක මඩකලපුවෙන් ගත්තේ රිදී කාසි දෙකට... මහනුවර නිලමේ කෙනෙකුගේ අම්මණ්ඩිට විකුණුවේ රිදී කාසි තුනකට... එහා ගමේ ගමරාළගේ ගෑනිට තෝ විකුණුවේ රිදී කාසි තුනහමාරකට... තෝ මං කවුරු කියල හිතලද බොල රිදී කාසි හයක් කියන්නේ...'

අබ්දුල් මුදලාලි වල්ලීගේ මේ කතාව අසා මකතරු හයියෙන් වෙව්ලන්න ගත්තාදැයි කීවොත් ඉණේ තිබූ ඉණ පටියට යටින් හැඳ සිටි මඩකලපු සරම බිමට රූටා වැටුණ අතර සිය අත් දෙකම පාවිච්චි කර හෙලුව වහගන්න ඔහුට සිද්ධ වුණේය.

අන්තිමේදී රිදී කාසි තුනකට ඈ ඒ සිල්ක් රෙද්ද ගන්න මුදල් ඔහුට දෙන විට ඔහු එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ අතර ඈ එපා කියද්දී ඉතිරි මුදල විදිහට තව රිදී කාසි එකහමාරක් ඔහු ඈ අතට දුන්නේය. මේ විදිහට ඉන් පසු කිසිම දවසක තමා ගත් මුදලටවත්, ඇඳුම් හෝ මනිබඩු හෝ ඔහු වල්ලීට විකුණුවේ නැත. තමා ගත් මුදලටත් වඩා තඹ සල්ලියක් හෝ තඹ සල්ලි භාගයක් හෝ අඩුවෙන් ඔහු වල්ලීට ගණන් කීවේය.

මෙසේ කෙළවරක් නැතිව තම්බි මුදලාලිගෙන් ඇඳුම් මනිබඩු ගත් වල්ලී තමාගේ හිතේ හැටියට ඒවා අඳින්න පළඳින්න ගත්තාය. ඈ ලස්සනට අඳින්න අඳින්න ඈ සරාගී විදිහට ජේන්න ජේන්න පුංචි රාළ ඉරිසියාවෙන් උතුරන්න පටන් ගත්තේය. සාමාන්‍යයෙන් සඳුදා දවසේ පුංචි රාළ වල්ලීත් එක්ක ඇගේ ගෙදර සිටීම අනිවාර්ය වගේ වුණත් සඳුදා දවස් කීපයකම ඈ හැඳ සිටි විලාසය ඉවසා දරාගන්න බැරිව ඉරිසියාවෙන් පැලී ඔහු ගෙදර නොඉඳ හේනේ පැලේ තනිවම ගත කර තිබුණේය. එහෙත් ඉවසීමේ සීමාව කෙළවරට ගිය දවසක පුංචි රාළ වල්ලී හැඳ සිටි හැට්ටයක් දැක මෙසේ කීවේය.

'ඉය බලහං... ඉය හැව්වේ නැත... තන් දෙක එහෙම ඉතිරිලම එළියේ... ඔක ඇන්දට වඩා හොඳයි මුකුත් අඳින්නැතිව හෙලුවෙං හිටියනං... කිතු කිතු කරල ඉරා දාන්ඩ හිතෙනවා මට ඔක දක්කම...'

පුංචි රාළ හයියෙන් දත් මිටි කෑවේ එය කිතු කිතු කර ඉරා දමන්ට බැරි කමටය. හයියෙන් පාරක් දකුණතින් බිත්තියට ගැහුවේ වල්ලීට අත උස්සා ගහන්න බැරිකමටය. එහෙත් වල්ලී මුකුත්ම කීවේ නැත.

ඊට පහුවදා පුංචි රාළ ඇගේ නූල් පොටක්වත් නැතිව අමු නිරුවස්තරෙන් පාර දිගේ ගමේ වැව ළඟට ගොස් තිබුණේය. පාරේ ගිය කොලුවෙක් 'මාමා අමුඩ ලේන්සුවක්වත් නැතිව මොකෝ...' යැයි ඇසූ විටය, ඔහු දුටුවේ තමා ඉණකඩයක්වත් හැඳ නැති බව. තවත් දවසක ඔහු ඒ විදිහටම උපන් ඇඳුමෙන් සේදරාගේ කඩ පිලට ගොස් තිබුණේය. එහා ගමේ සිට පොඩිනාගෙන් රහස් බෙත රැගෙන යන්න ඇවිත් සිටි මිනිහෙක් පුංචි රාළ දැක 'මොකෝ... අර මිනිහ අර හෙලුවෙන්...' යැයි සේදරාගෙන් ඇසුවේය. සේදරා හෙලුවෙන් ඇවිදින තම අප්පුච්චා දුටුවේ එවිටය. ඔහු තමාගේ ඉණකඩයක් ගෙදරින් ගෙනවිත් සිය පියාට දී ඔහු පිටත් කළේය.

මේ විදිහට පුංචි රාළට තම ඇඳුම් අමතක වෙන්න ගත්තේය. බලෙන් මතක තියාගෙන ඔහු රෙදි ඇන්දත් ඊළඟ මොහොතේ තම ඉණේ රෙදි නැති විත්තිය ගමේ කවුරුත් හෝ ඔහුට පෙන්වා දෙන තෙක් ඔහු එය නොදත්තේය. තවත් සමහර දවසක වැවේ නාන්න ගිය ඔහු ගෙදර ආවේ ඇඳුම් වැව් ඉවුරේ දමා අමුඩ ලේන්සුවවත් නැතුවය. තවත් දවසක හොඳටම මතක තියාගෙන ඇඳුම් තිබ්බ තැන ඔහුට අමතක වුණේය.

අන්තිමේදී සති දෙකකට පසු පැමිණි සඳුදා දිනයේ ඔහු වල්ලී ළඟ පින්සෙණ්ඩු වුණේය.

'මං එදා උඹට හයියෙන් කෑ ගැහුව තමයි.. උඹ හෙලුවෙං හිටිය නං හොඳයි කිව්ව තමයි... ඒත් ඒ හිතල කිව්ව කතා නං නෙමෙයි...'

The Reader's Place

වල්ලී කළේ තම දේවාලයට ගොස් අර රහස් මංජුසාවට දී ඇල්ලූ එක විතරය. පුංචි රාළට වැලඳී තිබූ ඇදුම අමතක වී රෝගය පහුවදා සිට සුව වුණේය.

මේ සිද්ධියෙන් පසු පුංචි රාළ වල්ලීට කිසිවක් කියන්න පෙරටත් වඩා බිය විය. ඇ කෙතරම් සරාගී විදිහට ඇන්දත් පැලැන්දත් ඔහු ඉරිසියාව හිත තුළ පුපුරු ගහද්දී ඉවසා දරාගෙන සිටියේය. ඇ කෙතරම් මුරණ්ඩු විදිහට තනි මතේට වැඩ කළත් ඒ සියල්ල නොපෙනුණා නොඇසුණා වාගේ කරබාගෙන සිටියේය.

මෙහි ප්‍රතිඵලයක් විදිහට තවත් විශේෂ දෙයක් සිදු වුණේය. වල්ලී මෙසේ ඔහු කෙරෙන් ඈත් වන්න ඈත් වන්න ඔහු වෙනදාටත් වඩා උවමනාවකින් සිය මද්දුම දරුවා වූ රතා හැම සෙනසුරාදාවකම සිය හේනේ පැලට එනතෙක් මඟ බල ඉන්න පුරුදු වුණේය. බැරි වෙලාවත් ඔහු සූතංගු වුණොත් ඔහු එනවාදැයි බලන්න පැලෙන් බිමට බැස පාරේ මඟක් වෙනකම් ඔහු ඇවිදගෙන ගියේය. එක් දවසක් ඔහු මෙසේ පොඩිතාගේ ගෙදරටම ගොස් සිටියේය. එවේලේ රතා හිටියේ ඔහු බලන්න එන්න ගෙදරින් එළියට බහින්න ලෑස්ති වෙමින්ය. රතා [illegible] ඇතු ඉති දමා දවලන්නට [illegible] තේරුම් ගන්න බැරි විය. ඔහු රතා ගෙනත් දෙන කෑම කෙතරම් පෙරේතකමෙන් තලු ගගහා කෑවාද, කීවොත් කෑමෙන් පසු පුරුද්දක් වශයෙන් දකුණතේ දබරඇඟිල්ල ලෙවකෑමේ ප්‍රතිඵලයක් විදිහට අනෙක් ඇඟිලිවලට වඩා එය කෙට්ටු වෙන්න පටන් ගත්තේය.

මේ කවර දේ කොහොම සිද්ධ වුණත් වල්ලී, පුංචි රාළ සහමුලින්ම අත් හරින්න තරම් නපුරු නොවුණාය. සිය ජීවිතේ එකම එක දවසක් වුණත් ඔහු තමා වෙනුවෙන් පෑ ආදරයට ගරු කළ ඇ සඳුදා දිනය ඔහු වෙනුවෙන්ම වෙන් කර තිබුණාය. බැරි වෙලාවත් හිතේ කලකිරීමට හෝ පුංචි රාළ සඳුදා ගෙදර එන්න සූතංගු වුණොත් වල්ලී හේනේ පැලට ගොස් ඔහු පොඩි දරුවෙකු වගේ ගෙදර එක්කගෙන ආවාය. බලෙන්ම ඔහුට කන්න උයා පිහා රාත්තිරියට ඔහුට කැමති විදිහට සිය සිරුර පාවිච්චි කරන්න ඉඩ හැර නිසොල්මන්ව සිටියාය.

වල්ලීට ආරච්චිලගේ පුතා වූ පොඩි නිලමේ මුණ ගැහුණේ මය අතරය. ඇ මුලින්ම පොඩි නිලමේ දුටුවේ ආරච්චිලගේ මවගේ මළ ගෙදර දවසේ බුලත් පුවක් හොයන්න ඔහු සිය අප්පුච්චාගේ හේනට පැමිණි මොහොතේය.

ආපසු යන අතර වල්ලී, ගෝමරිගේ ආවේශයෙන් ඔහුට කතා කර අත්තම්මා මියගියේ නැති බව කී විට ඔහු එය කියටවත් විශ්වාස කළේ නැත. ඇත්තටම පොඩි නිලමේ එවේලේ හිතුවේ මේ ගෑනිට හොඳටම පිස්සු කියාය.

එහෙත් සිය අප්පුච්චාත් සමඟ යළි පැමිණි ඇ දුන් කුකුළු ලේ පොවා පොළොව යට වළලූ සිය මිත්තනිය ගොඩ ගත් කළ මේ ගෑනි මොන වගේ ගෑනියෙක් දැයි ඔහුට හිතාගන්න බැරි වුණේය.

ඒ නිසා ඒ සිද්ධිය සිද්ධ වී සති තුන හතරකට පසු සිකුරාදා දවසක පොඩි නිලමේ තනිවම වල්ලීගේ ගෙදර ගියේය.

ඒ වන විට වල්ලී සිය ගෙදර හොඳට හදා තිබුණේ නැත. [illegible] අටවාගත් පැලකය. ඇය සාත්තර කියමින් සිටියේ. [illegible] වන විට පුංචි රාළ විටක් ඒදමින් ගෙයි පිළේ [illegible] පොඩි නිලමේ [illegible] පැළියක සිටියේ නැත. උගුර මදක් පාදා සිටියේය. වල්ලී [illegible] සාදා ඔහු තමා ආ විත්තිය පුංචි රාළට ඇඟෙව්වේය.

'ආ පොඩි නිලමේ ඇත්තෙ එන්ඩ ඇතුළට...'

පුංචි රාළ පිලට පැදුරක් දමා ඔහුට ඉඳගන්න කැලැස්සුවේය.

'විටක් කනවද...' පුංචි රාළ ඉලත්තට්ටුව ඔහුට ඇල්ලුවේය.

'නැත්තං මං හදල දෙන්නද හොඳ විටක් රහට...'

පුංචි රාළ ඉලත්තට්ටුව යළි තමා ළඟට ගෙන එසේ ඇසුවේ වැඩි හොරවයටය.

'ආ... ඒක හොඳා...'

පුංචි රාළ පරිස්සමට විටක් ඒදන්න පටන් ගත්තේය. සියලු අඩුවැඩිය පදමට ඒදන්න ඔහු කොහොමත් දක්ෂය.

'යන්තං අර වයසක ඇත්ති ගොඩ ගියා නේද...'

'එහෙනං... මට නං තාම ඒක හීනයක් වගේ... හිතාගන්න බෑ...'

The Reader's Place

'එහෙම එව්ව තියෙනව... අපට හිතාගන්ඩවත් බැරි දේවල්...'

'සාත්තර කියන්නෙ පුංචි රාළගෙ ගැනිද...'

පොඩි නිලමෙ පුංචි රාළගේ මූණ දිහා කෙළින්ම බලාගෙන ප්‍රශ්න කළේය. පුංචි රාළ තමාගේ අවධානය තිබූ ඉලත්තට්ටුවෙන් ඇස් මෑත් කර ඔළුව උස්සා ඔහු දිහා බැලුවේය. යාන්තමින් ඔහු ගොත ගැහුවේය.

'එ...හෙ...එ...එහෙමයි ... ඉන්න මං කතා කරන්නං ඒකිට...'

ඔහු හයියෙන් ඇගේ නම කියා කෑගැහුවේය. වල්ලී උයන ගේ පැත්තේ සිට පිලට ආවාය.

'මෙං මේ ආරච්චිල ඇත්තොගේ පුතා පොඩි නිලමෙ ඇත්තො ඇවිත්...' ඔහු ඇයට පොඩි නිලමේ හඳුන්වා දුන්නේය.

'මට මතකයි...' ඇය රෙද්දෙන් අත පිහදාන ගමන් කීවාය.

'අත්තම්මා හොඳටම හොඳින් ඉන්නවා......'

ඔහු ඈ දිහා බලාගෙනම කීවේය.

'මං නං එදා හොඳටම බය වුණා... අත්තම්මා කට දෙපැත්තෙන් කුකුල් ලේ පෙරාගෙන මිනී වළෙන් නැඟිටිනකොට... මේ තාමත් මයේ මයිල් කෙළින් වෙනවා....'

පොඩි නිලමෙ සිය දකුණතේ දික් වූ මවිල් ගස් ඔවුන් දෙන්නාටම පෙන්නුවේය. වල්ලී යන්තමින් හිනා වුණාය.

'පොඩ්ඩක් බය වුණාට මොකද... ඒ ඇත්ති දූන් පණ පිටින්නේ...'

'ඇත්තට කොහොමද ඒක කිව්වේ...'

පොඩි නිලමේ ඇත්තටම මේ ගෙදරට ආවේ මේ ප්‍රශ්නය අහන්නය. වල්ලී තවත් හිනා වී ඔහු දිහා බැලුවාය. ඔහු බලා හිටියේ හිනා වෙනකොට වළ ගැහෙන ඇගේ කම්මුල් දිහාය. ඒ අතර පුංචි රාළ දුන් බුලත් විට ඔහු කටේ දමා හපන්න ගත්තේය.

'ඒක කියන්න මට තේරෙන්නේ නෑ...' වල්ලී පිළිතුරු දුන්නාය.

'නිකං හිතුණ හින්දා ඔහේ කිව්වා... එහෙමද...?'

'දන්නේ නෑ...'

'මොනාද පේන්නේ ආවේශ වුණාම...' ඔහු යළිත් ප්‍රශ්න කළේය.

'ඔක්කොම... හැමදේම...'

පොඩි නිලමෙ විමතියෙන් ඇහි බැම රැලිගන්වා ගත්තේය.

'ඔක්කෝම... හැමදේම...?'

ඔහු යළිත් ඇගේ වචන නැවත ප්‍රතිරාවය කළේය. ඇ හිස සැලුවාය. එක තැන කැරකෙන බඹර වළල්ලක් වගේ ඔහු තමා වටාම කැරකැවෙමින් සිටියේය. ඒ නිසා කිසිවක්ම පැහැදිලිව තේරුම් ගන්න ඔහුට බැරි විය. හැමදේම ඔහුට පෙනුණේ දිග ඇදී පැතලි වී විවිධ හැඩතල විදිහටය. එවිට පුංචි රාළ මැදිහත් වී එයට අලගු තැබුවේය.

'මං කිව්වේ... එහෙම එව්ව තියෙනවා...'

පොඩි නිලමේ දෙපැත්තට හිස සොලවා කරකැවිල්ල මගහැර යළි ප්‍රකෘති තත්වයට පත්ව මෙසේ ඇසුවේය.

'හරි මං ගැනත් ඔක්කොම කියන්ඩ පුළුවන්ද ...'

'දූන් බෑ... කෙම්මුර දවසක එන්ඩ...'

එදා පොඩි නිලමේ මේ උත්තරයත් රැගෙන වල්ලීගෙනුත්, පුංචි රාළගෙනුත් සමුගෙන පෙරළා ගෙදර ගියේය. ඊට සතියකට පසු කෙම්මුර දවසක හවස් වරුවේ ඔහු වල්ලීගේ නිවසට විතර නැවත ආවේය.

පැය කීපයක් පෝලිමේ තාවර වෙච් අන්තිමයා විදිහට ඔහු ඇතුළට ගිය විට වල්ලී ඔහුට මෙසේ කීවාය.

'අද මට මහන්සියි. වෙන දවසක එන්ඩ...'

ඔහු ආපසු හැරී ගෙදර ගියේය. තවත් මාස කීපයකට පසු ඔහු නැවත වල්ලීගේ දේවාලයට ගියේය. ඒ එන විට සාස්තර අහන්න පැමිණි මිනිසුන් එකා දෙන්නා වල්ලී නැවත හරවා යවමින් සිටියාය.

'මොකෝ අද සාස්තර කියන්නේ නැද්ද...'

'නෑ...'

'ඇයි...'

'අද මං පිරිසිදු නෑ. එහෙම දවසට මං සාස්තර කියන්නේ නෑ. ...'

The Reader's Place

පොඩි නිලමේ නැවත ආපසු හැරී තරහෙන් පුපුරමින් ගෙදර ගියේය. ආයෙමත් ඒ ගෙදරට අඩිය තියන්නේ නැයි ඔහු තමාටම ගිවිසගෙන හිටියත් මාස කීපයක ඇවෑමෙන් ඔහු අතින් ඒ ගිවිසුම කැඩුණේය. එදා හවස ඔහු වල්ලීගේ දේවාලයට ගියේ හැමෝටම වෙලාසනින්ය. ඒ නිසා දවසේ පළමුවෙනියා විදිහට ඔහුට දේවාලය ඇතුළට යන්න පුළුවන් වුණේය. මාස ගාණක් අනිවාරෙන් කල් ගත වීමේ කේන්තිය ඔහු හිතින් පලවා හැරියේය. ඒ වෙනුවට තමා ගැන තමා නොදන්නා දේ මේ ගැහැනිය කියන්නේ කොහොමදැයි තම සිතින්ම ප්‍රශ්න කරමින් මේ අලුත් අත්දැකීම විඳින්න ලැස්ති වෙමින් සිටියේය.

වල්ලී තම රහස් මංජුසාව විවෘත කර දුම් අල්ලා යළි වැසුවාය. ඉන්පසු නොදන්නා භාෂාවකින් ස්තෝත්‍ර ගණනාවක් කියා වහා ආවේශයට පත් වූවාය. පොඩි නිලමේ දත් දත් කියවෙන තමාගේ විස්තර කථනයට ඇහුම්කන් දෙන්න නොඉවසිල්ලෙන් සිටියේය. ඒ අතරම මේ ගෑනි මං ගැන මොන කුණුහරුපයක් කියයිද කියා බයටත් සන්ත්‍රාසයටත් පත්ව සිටියේය.

වල්ලී ස්තෝත්‍ර කීමෙන් පසුව ටික වේලාවක් කිසිවෙක් සමඟ හෙමිනුත් එක වරම උස් හඬිනුත් සිනාවෙමින් විශ්චිය භාෂාවකින් සංවාදයේ යෙදුණාය. ඒ සංවාදයේ කෙළවර ඈ පොඩි නිලමේ දිහාට කෙළින්ම හැරුණාය.

'ආ... ආරච්චිලගේ පුතා... මයේ අම්ම කියනවා උඹෙ හිතේ සැක සංකා වැඩියි... ඒ නිසා උඹ ගැන අද මුකුත්ම කියන්ඩ බෑ කියලා.. වෙන දවසක එන්ඩ කියනව...'

පොඩි නිලමේ තවත් මොහොතක්වත් එතැන නොරැඳුණේය. මේ ගෑනි ඉදිරියේ කට ඉස්සර කරගැනීම මහ විනාශයක් බව ගම්මුන්ගේ කටවල්වලින් ඔහු ඕනෑවටත් වඩා අසා තිබූ නිසා වචනයක්වත් නොකියන්න කට පරිස්සම් කරගෙන එළියට බැස්සේය. ඔහුට තිබුණේ තමා තුළ පැසවන තමා ගැනම කෝපයකි. මේ කොහෙවත් ඉන්න ගෑනියෙක් ඉදිරියේ එක දිගට දවස් ගණනාවක්ම හැල්ලු වීම ඔහුට දරාගන්න බැරි වුණේය. තමාගේත් ගමේ ආරච්චිල වූ තම අප්පුච්චාගේත් තත්ත්වයත් එක්ක බලන විට මෑ මොන තරම් හොරිකඩ ගෑනියෙක්දැයි ඔහු හිතුවේය.

ගොම්මන් කළුවරේ තනියම එන ගමන් දත්මිටි කාගෙන තමාගේම කෙස්ස තම අතින් හයියෙන් ඇද කෑ ගසා ඔහු තම කේන්තිය පිට කරගන්න උත්සාහ කළේය. තමාගේ ගිවිසුම තමා විසින්ම කඩ කරගැනීම ඔහුට කොහෙත්ම ඉහිලුම් නොදුන්නේය. එහෙත් යළි කවමදාවත් තමා ගැන විස්තර අහන්න ඈගේ දේවාලයට නොයන බව තමාටම දිවුරා පොරොන්දු වෙමින් ඔහු ගෙදර ගියේය.

ඊට මාස ගණනාවකට පසු 'මිනී වළෙන් උපන් අත්තම්මා' යැයි අහල ගම්වලත් ප්‍රසිද්ධියට පත් පොඩි නිලමේගේ අත්තම්මා නැවත මියගියාය.

ආරච්චිල සිය මව කලින් වතාවේ මියගිය විට සැක නොකළ නමුත් මෙවර ඈ මියගිය විට ඔහු කෙතරම් ඒ ගැන සැක කළාද කිවොත් ඔහු ඒ හුස්ම ගිය මිනිය දෙපැත්තෙන් දෙදෙනෙකු ලවා කර තියා නැඟිට්ටවාගෙන පැය කීපයක් මිදුලේ ඇවිදින්න සැලැස්සුවේය. එසේ ඇවිද්දවන්න උත්සාහ කළ දෙදෙනා මිනිය කෙළින් කර හිටවා අවස්ථා තුනකදී දෙපැත්තට වී මිනිය ඇවිදිනවාදැයි පරීක්ෂා කළ අතර ඒ හැම අවස්ථාකවකදීම මිනිය පොළොවේ ඇද වැටී තුවාල වී තිබුණේය. ඒත් ආරච්චිල සිය මවගේ මරණය විශ්වාස කළේ නැත. ඔහු වල්ලී මුණ ගැසී ඒ ගැන සහතික ලෙසම ඉස්තීර කරගන්න සැරසුණේය.

එහෙත් එවේලේ මරණය ආරංචි වී බොහෝ ගම් වැසියන් නිවසට පැමිණෙන්න වූයෙන් ඔහු ඒ රාජකාරිය සිය පුතාට පංගාත්තු කළේය.

'උඹ ගිහින් වල්ලීගෙන් මේ ගැන හරියටම දැන ගෙන වරෙන්...'

'මට බෑ...' පොඩි නිලමේ කීවේය.

'ඇයි...'

'ඒ ගෑනි මහ බොරුකාරියක්... මට විශ්වාස නෑ ඒ ගෑනිව...'

'යකෝ උඹේ කට ඉස්සර කරගන්න එපා... පණ්ඩිතකං නැතිව මං කිව්ව දේ කරහං...'

The Reader's Place

[illegible] වල්ලීගේ ගෙදර [illegible] මගේ අප්පුච්චාගේ [illegible]

ඒ [illegible] වල්ලීගේ ගෙදර [illegible] ගැන. ගෙයි හිටපු සියලුම දෙනා ඇතුළට ගොස් [illegible] බලා සිටියේය. අවසිතට මහු ඉසිරී වූ විට එක වරක් [illegible] යන්නේ නැතිව මඳ වෙලාවක් එළියේ බලා සිට දේවාලේ [illegible] ඇහෙන්න මෙසේ ඇසුවේය.

'අදට සාස්තර කියල ඉවරද දන්නේ නෑ...'

'නෑ විතරං ඇතුළට...'

ඇතුළේ සිට වල්ලී කතා කළාය. මහු මුලින් ගනකුත් [illegible] සල්ලි පසක පඬුරුත් රැගෙන දේවාලේ ඇතුළට ගියේය.

'ආ... උඹ අපෙනු ආව එකෙනං...'

වල්ලී ආවේශයෙන් එලෙස කීවේ මහු දිහා බ[illegible] නොවේ. කෙළින්ම මහුට සම්පූර්[illegible] මිදුලේ ඉදිරිපිට තැලූ කැපුණ පොල් පහන දිහා බලාගෙන. ඒ පහනේ ආලෝකයට මහුට පිටුපා සිටි ඇගේ මුහුණ රත්තරන් පාටින් යන්තමින් මහුට පෙනුණේය. ඇගේ පිට දිගේ උනා දුඹුරු වරලස අසිකරුව විසිරී තිබුණේය. ඇ හැඳ සිටි හැට්ටයත් රෙද්දත් අතර ලොකු ඉඩක් නොවැසී තිබූ අතර මහු පිටුපසින් හිඳ බලන විට රෙද්දට ඇගේ නිතඹ වැසී නොවැසී වගේ තිබුණේය. වල්ලීගේ ප්‍රශ්නය මහුට තේරුණේ තමා සමච්චලයට ලක් කළ විදිහටය. ඒ නිසා මහු මදක් නිහඬව සිට මෙසේ උත්තර දුන්නේය.

'නෑ... මං අද ආවේ මං ගැන මුකුත් දැනගන්ඩ නෙවි...'

වල්ලී මහු දෙසට හැරුණාය. එවිට පාන් එළියට දිලිසෙන ඇගේ දීප්තිමත් ඇස් දෙක මහුට කෙළින්ම පෙනුණේය. ඒ එක්කම රෙද්දත් හැට්ටයත් අතර ඉඩ ප්‍රමාණයේ හැඩට පිහිටා තිබූ ඇගේ නාභිය සරාගී විදිහට මහුට පෙනුණේය. ඇ මෙසේ කීවාය.

'හිම්... මං දන්නව ඒක... ඒත් උඹ දැනගන්න ආපු කාරණේ ගැන උඹට දන්නෙ කියන්නේ නෑ... ඊට කලින් කියන්න ඕන දේවල් තියෙනවා...'

ඇ දුම්මල කබල අතට ගත්තාය. වටයක් කැරකැවී උඩ ගැන ඇගේ දෙවු මණ්ඩලයට දුම් අල්ලා මහු දිහාට හැරී මහු වටා වටයක් ගොස් දුම් ඇල්ලුවාය. පසුව දුම්මල කබල පැත්තක තිබ්බාය.

මහු මේ සිද්ධ වෙන කිසිවක තේරුමක් නැතිව පුදුමසහගතව ඇගේ දිලිසෙන වරලස දිහාත්, පිරුණු දෙකම්මුල් දිහාත්, උඩ පනින පිට පොළවෙන ඇගේ පියයුරු දිහාත් බලා සිටියේය.

දුම් කබල පැත්තක තියා වල්ලී මහු ඉදිරියට ආවාය. ආවේශයෙන් මහුගේ ඇඟට පැන මහු හැඳ සිටි ඉණකඩය ගලවා පැත්තකට විසි කළාය. මහු ඈ ඉදිරියේ අමු නිරුවතින් බලා සිටිද්දී ඈ ඒ ආවේශයෙන්ම තම හැට්ටය ඉරා විසි කළාය. රෙද්ද ගලවා බිමට දැමුවාය. කෙහෙරැලි අපිළිවෙළට විසිරී ඇගේ උල් පියයුරු සරාගී ලෙස පාන් එළියෙන් පේන්න ගත්තේය. ඈ නිරුවතින් [illegible] ඒ ආවේශයෙන්ම ඒ ආවේශයෙන්ම නිරුවත් මහු [illegible]. මෙසේ බිම පෙරළාගෙන [illegible] ඈ කොතරම් ආවේගයකින් මහු සිඹින්න පටන් ගත්තාද කිවොත් ඇගේ දත් වැදී මහුගේ තොල් පැළී ලේ ගලන්න පටන් ගත්තේය. වල්ලී ඒ ලේ ඇගේ දිවෙන් ලෙවකමින් මහුගේ මුළු ඇඟම හිසේ සිට පාදාන්තය දක්වා කෙළවලින් තෙත් කළාය.

මෙතෙක් ඇගේ වියරුවට ඉඩ දී බලා සිටි මහු ඊළඟ මොහොතේ මහා ක්‍රියාත්මකව ඇය අතින් ඇලයට පෙරළා ගත්තේය. ඇගේ වියරුව තරමටම වියරුවෙන් මේ නාඹර මද කිපුණු වියේ සිටි තරුණයා මෙතෙක් කල් ගැහැනියක් ඉදිරිපිට ඉෂ්ට සිද්ධ කරගන්න බැරිව සිටි සිය සියලු හැඟීම් වල්ලී ඉදිරිපිට මුදා හැරියේය. ඒ අතර එතෙක් කල් සිය කය පාවිච්චි කළ පුංචි රාළ ඉදිරිපිට දර කොටයක් විදිහට උඩ බලාගෙන සිටි වල්ලී සිය ගැහැනු ජීවිතයේ මෙතෙක් කල් හිර කරගෙන සිටි සියලු ආවේග යත් මහුගේ කය ඉදිරිපිට මුදා හැරියාය.

The Reader's Place

ඔවුහු හිම පෙරළී පෙරළී එකිනෙකා සිප වැලඳ ගත්හ. වල්ලි එක ඇලයකට ඔහු පෙරළාගන්නා විට පොඩි නිලමේ අනෙක් ඇලයට ඇය පෙරළාගත්තේය. මේ වියරුවේ තරමට දෙදෙනාගේ දත් නියපොතු සාරවල් වැදී ඔවුන්ගේ සිරුරේ තැන තැන තුවාල වී ලේ ගලන්නට වූයෙන් ඒ ලේ ඔවුන්ගේ කෙළවලින් ඔවුන්ගේ මුළු සිරුර පුරාම තැවරී ගියේය. අවසානයේ දෙදෙනා මාරුවෙන් මාරුවට එකා මත එකා නැගී මැටි පොළොවේ පෙරළී පෙරළී ඒ සම්භෝගයේ සුරතාන්තය ඒ වියරුවෙන්ම විඳ ගත්හ.

සත්‍ය වශයෙන්ම පුංචි රාළ සමඟ සිය දහස් වාරයක් නිදිවැදී ඇති නමුත් ජීවිතයේ ප්‍රථම වරට මිනිහෙක් එක්ක නිදිවැදුණු බව ඇයට දැනුණේ එදාය. එසේම ජීවිතයේ කිසිම දවසක ගැහැනියගේ නිරුවත් සිරුර සිය සිරුරේ දවටෙන විට දැනෙන ප්‍රහර්ෂය විඳ නැති පොඩි නිලමේ එක වර ගෑනු සීයක් එක්ක විතර තමා නිදිවැදුණු බව තේරුම් ගත්තේ එදාය.

හරියටම සිංහල හෝරාවකට වඩා දිග නොවුණු මේ රති සෙල්ලම නිමා වෙන විට වැටුණු තැන්වලින් නැගිටගන්න බැරි තරමට දෙදෙනා හති වැටී සිටියහ. පොඩි නිලමේ පියවි සිහියට පත්ව තමා තවමත් නිරුවතින් බව දැන [illegible] බලමින් තම ඇඳුම් හොයද්දී වල්ලි තමාගේ මහන්සිය තුට්ටුවකටවත් මායිම් නොකර අර ආවේගයෙන්ම නැගිට ඔහුවත් නැගිට්ටවා ඔහු ඉදිරියේ නිරුවතින් හිටගෙන මෙසේ කීවාය.

'උඹ ඇහුව නේද මගෙන් උඹේ අනාගතේ මොකක්ද කියලා... දැනගනින් මේක තමා උඹේ අනාගතය...'

'ඒ කිව්වේ...'

ඔහුට ඇ කී දේ එක වර වැටහුණේ නැත. ඇඳුම් හෙවිල්ල පැත්තක තියා ඔහු තමන් මෙතෙක් වේලා සැතපුණු ඒ නිරුවත් ශරීරය දිහා නැවත බැලුවේය.

'ඒ කිව්වේ උඹේ අනාගතේ තමයි මම...'

ඔහු ඉදිරියට පැන ඇ යළිත් වැරෙන් බදාගත්තේය. ඇගේ නිරුවත් තන පුඩු ඔහුගේ යන්තම් මවිල් පිරුණු පපුවේ වැදී තෙරපෙද්දී ඇ තරමම ආවේගයකින් පරල වී ඔහු මෙසේ කීවේය.

'දෙයි හාමුදුරුවන්පල්ල මට උඹ හැර වෙන ගැනියෙක් ගැන හිතා ගන්නවත් බෑ...මට උඹවම ඇත...'

ඔහු වල්ලි පපුවට තද කරගෙන ඇගේ දෙතොල් උරා බීවේය. ඇගේ කම්මුල් සිප ගත්තේය.

'මට හෙම්බෙක් වගේ උඹේ ඇඟ උඩම වස්ස වෙලා ඉන්ඩ ඕන... නැත්නම් කුරුම්බියෙක් වගේ උඹේ ඇඟ ඇතුළටම යන්ඩ ඕන...'

එකිනෙකට කිසිම සම්බන්ධයක් නැති වචන ගොඩ ගොඩ ඔහු ඇ ඉදිරිපිට වැමෑරුවේය. ඒ හැම එකකින්ම තමා තුළ ඇ කෙරේ ඇති ආසාව කැමැත්ත පෙන්නන්න ඔහු උත්සාහ කළේය. අන්තිමට ඒක පිස්සුවක් වන තරමට දිග්ගැස්සුණු විට ඇ සිය දෑතකින් ඔහුව යන්තමින් තල්ලු කර ඔහු ඈතට කළාය. පසුව මෙසේ කීවාය.

'දැන් ආපු කාරණේ උඹට මතක නැ නේද...'

සත්‍ය වශයෙන්ම ඔහු ආපු කාරණාව ඔහුට මතක් වුණේ ඇ එසේ කියන විටය. තම අත්තම්මා ඇත්තට හෝ බොරුවට [illegible] ගොස් සිටියදී ගෙදර හැමෝම ඒ ගැන කනස්සලෙන් පසුවෙද්දී තමා මෙතෙක් [illegible] ගොඩ වෙන්නවත් අකමැති වූ ගැහැනියක් සමග නැතිනම් දවසක් තමා හිතූ විදිහට තමුන්ට කොහොමවත් නොගැළපෙන හොරිකඩ ගැනියක් සමග ඔහු නිදිවැදී සිටියේය. එපමණක් නොව ඒ ගැහැණිය තරම් සරාගී, හැඟිම්බර හුරුබුහුටි වෙන කිසිම ගැහැනියක් ගැන හිතාගන්නවත් බැරිව ඔහු ඇගේ කය මත සිය ආත්මයෙන්ම ඇලී ගැලී සිටියේය.

'උඹේ අත්තම්ම ගෙනාව ආයුෂ ඉවරයි. උන්දට ආයෙමත් හුස්ම පිඹින්ඩ බෑ...'

ඇ කීවාය. ඉන්පසු ඇ මෙසේද ඊට එකතු කළාය.

'උඹ එනකං විස්තර දැනගන්ඩ උඹලෑ ගෙදර හැමෝම බලාගෙන ඉන්නව...'

තමා ඉක්මනින් යා යුතු බව ඔහු තේරුම් ගත්තේය. එබැවින් පැත්තකට විසි වී තිබුණ තමන් හැඳගෙන ආ ඉණකඩය ඔහු අතට ගත්තේය. එහෙත් එය ආපහු අඳින්න පුළුවන්කමක් තිබුණේ නැත.

The Reader's Place

එය ඉරී වැරහැලි වී තිබුණේය. වල්ලී ගෙතුළට ගොස් පුංචි රාළගේ ඉණකඩයක් ඔහුට ගෙනවිත් දුන්නාය. ඔහු වහා එය හැඳ තවමත් නිරුවතින් සිටි ඈ දිහා නැවත කෑදර බැල්මක් හෙළා පිටව ගියේය.

ගෙදර හැමෝම කලබලෙන් හිටි නිසා පොඩි නිලමේගේ වෙනස කවුරුවත් හරියට තේරුම් ගත්තේ නැත. එහෙත් ගෙදර පැමිණි වහාම ඔහු සිය ඉණකඩය මාරු කළේය. එසේ ඇඳුම් මාරු කර එළියට ඇවිත් ඔහු වල්ලීගේ පිළිතුර සිය අප්පුච්චාට දැනුම් දුන්නේය. පිරිස අතර මුහු වෙද්දී සිය පිපිරුණු උඩුතොල යටිතොලින් වහගන්න ඔහු උත්සහ කළේය. එසේම වල්ලීගේ නියපොතු පාරවල් ඔහුගේ පිටෙත් පපුවෙත් ඇඳී තිබූ නිසා සති දෙකක් යනකං ඔහු ගෙදරදී සළුවකින් දෙවුර වසාගෙන සිටි අතර ඒ සති දෙක පුරාම වතුර නාන්න ළිඳට හෝ වැවට ගියේ නැත.

වල්ලීත්, පොඩි නිලමේත් අතර ගොඩ නැඟුණ මේ හාදකම දෙදෙනාට දෙදෙනා නැතිව බැරි වන තරමට ගොඩ නැඟුණේය. පොඩි නිලමේ ඇගේ ඉහේ සිට පාදාන්තය දක්වා රෝම කූපයක් ගානේ ආසාවෙන් පෙරේතකමෙන් ඔද වැඩී සිටි අතර වල්ලී ඔහුගේ සෙනෙහසට අත්ව ඒව සම්පත්තකමට [illegible] එදා මුල් දවසේ වල්ලී ආවේශයෙන් සිටි වෙලාවේ වගේ ඔවුන් හැමදාම එක් වුණේ වල්ලීගේ දේවාලය තුළය. සඳුදා දිනත් බදාදා සෙනසුරාදා කෙම්මුර දිනත් මග හැර අනෙක් දවස් හතරේම පොඩි නිලමේ වල්ලී සොයා ගියේය. ඒ දේවාලය තුළ ඔවුන්ගේ ක්ලේශ ආශා සන්තර්පණය කර ගන්න ඕනෑ තරම් ඉඩකඩ ඔවුන්ට තිබුණේය.

එහෙත් ඔවුන් දෙදෙනාටම ඕනෑ වුණේ පළමු දවසේ වගේ වියරු ආවේශයෙන් එකිනෙකාගේ සිරුරු පිළිබඳ කෑදර පෙරේතකමින් බිම පෙරළී පෙරළී එකිනෙකා මත නැඟී හපා විකා ගනිමින් රමණයේ යෙදෙන්නටය. එක් වන හැම දිනකම හතර පස් වතාවක් දෙදෙනා සුරතාන්තයට පත් වූ අතර ඒ හැම විටකම දෙදෙනා එකිනෙකා හපා විකා ලේ හලාගත්හ. දෙදෙනාගෙන් කිසිවෙක් එකිනෙකාට පරදින්න අකමැති වූ අතර වල්ලීට උවමනා කළේ ඔහුගේ සිරුරට යට නොවී ඔහුගේ සිරුර මත නැඟී සුරතාන්තයට එළඹෙන්නටය. එසේම පොඩි නිලමේට උවමනා කළේද එයමය. එබැවින් දෙදෙනාගේම සුරතාන්ත ආසන්න රමණ ජවනිකාව අතිශයින්ම වියරු විය.

මෙසේ දෙදෙනා කෙතරම් එකිනෙකා හපා විකා ලේ හලා ගන්නා පුරුදු වී සිටියාද කිවහොත් දිනක් දෙදෙනාගේම දිවට එකිනෙකාගේ ලේ රහ නොදැනුණු විට ඔවුන් දෙදෙනාම සිතා සිටියේ තමන් එදා රමණයේ නොයෙදුණු බවය.

දෙදෙනාගේ මේ උමතු ප්‍රේමය ගමට දැනගන්න වැඩි කලක් ගියේ නැත. මන්ද යත් දෙදෙනා විසින් ගමටම දැන ගන්න පුළුවන් විදිහට ඒ ගැන ඕනෑ තරම් සාක්ෂි සපයා තිබූ නිසාය.

දිනක් පොඩි නිලමේගේ අම්මා බිසෝ මැණිකා හදිසියේ හිතන්නේවත් නැති වෙලාවක ඔහුගේ කුටියට එන විට පොඩි නිලමේ උඩුකය නිරුවතින් සිටියේය. ඔහු වහා සළුවක් ගෙන දෙවුර වසාගන්න උත්සාහ කළත්, ඒකට වේලාව තිබුණේ නැත. බිසෝ මැණිකා ඔහුගේ පපුව පුරා තිබුණු නියපොතු පාරවල් දැකලා ඈට එක පාරට කෑ ගැහුණාය.

'සුවරිත් දෙයියනේ... මොකද යකෝ උඹව බරු ගැහුවේ...'

'දවසක් කැලේ පාරෙන් යනකොට වලහෙක් පැන්නා...'

ඔහු කටට ආ පළියට කීවේය. එහෙත් බිසෝ මැණිකා එතරම් මෝඩ ගැනියක් නොවුණාය. ඈ ඔහු ළඟට ළං වී ඒ සීරුම් පාරවල් දිහා හොඳට ඇස් යොමු කළාය. පසුව ඈ ඔහුට අනෙක් පැත්තට හැරෙන්න කීවාය.

'යකෝ... පිටත් හූරලනේ......'

ඈ දබර ඇඟිල්ල දික් කර ඔහුට තර්ජනය කළාය.

'මට ඇත්ත කියහං... මේ වලස්සු බරු ගහපුව නෙමෙයි... මේව මිනිස් නියපොතු... කව්ද උඹව හීරුවේ...'

'පල්ලෙහා ගෙදර උක්කුවා.. අපි පොඩි රණ්ඩුවක් ඇල්ලුවා..'

අන්තිමට එසේ කියාගන්න පොඩි නිලමේට පුළුවන් වුණේය. එහෙත් බිසෝ මැණිකා ඔහුට වඩා ඇට්ටර ගැහැනියක් වුණාය. ඈ මෙසේ ඔහුට තර්ජනය කළාය.

The Reader's Place

'හරි මං දන්ම කතා කරනවා උක්කුවට... හැබැයි ඒක බොරු වුණොත් මං දන්ම අප්පුච්චට කතා කරලා ඔක්කොම විස්තරේ කියනවා... තේරුණාද...'

පොඩි නිලමෙ ඊට වඩා බොරු කරන්න ගියේ නැත. ඊට වඩා තර්ක කරන්න ගියෙත් නැත. අප්පුච්චා මේ විස්තර දැන ගත්තොත් වෙන හරිය ඔහු හොඳටම දැනගෙන සිටියේය. ඒ නිසා ඔහු සිය මවට ඇත්තම ඇත්ත කීවේය. ඈ සාවධානව නිවී සැනසිල්ලේ අසා සිටියාය. එහෙත් පොඩි නිලමෙගේ කතාව ඉවර වෙන විට ඇගේ නිවී සැනසිල්ල ඈ ළඟ රැඳී තිබුණේ නැත.

'මොකක්ද බොල තෝ මේ කරගත්ත විනාසේ...'

ඈ සිය පුතණ්ඩියාගේ ඇඟට කඩා පැන්නාය.

'උඹ දන්නේ නැද්ද.. අප්පුච්ච එහා ගමේ ආරච්චිලගේ දුව උඹට කතා කරලා තියෙන විත්තිය.. මේ ඊයේ පෙරේදත් උන්දැ ගියා ඒ ගැන කතා කරල ඉවරයක් කරන්න... ඇත්තට මොකක්ද උඹ මේ නටන්න හදන නාඩගම...'

පොඩි නිලමෙ ලොකු උත්තර දෙන්න ගියේ නැත.

'එන විදිහක් බලමු...' ඔහු කීවේය.

The Reader's Place

පුංචි රාළ මේ විස්තර පිටින් දැනගන්නකම් වල්ලි කල් මැරුවේ නැත. ඈ දවසක් පුංචි රාළ ගෙදර ආ වේලාවක තමා සහ පොඩි නිලමේ අතර තියෙන ඇයි හොඳයිය මුල සිට අගටම පැහැදිලිව කීවාය. සියල්ල පැහැදිලි කර අවසානයේ මෙවැනි කොටසක් ද ඈ එයට එකතු කළාය.

'මං පොඩි නිලමෙට කැමති බව ඇත්ත... ඒත් උඹලට තියෙන කැමැත්ත ඒකෙන් නැති වෙන්නෙ නෑ. සඳුදට මගේ ගෙදර පස් පායන්නවත් එපා කියල මං ඒ ඇත්තට කියල තියෙන්නේ.. ඒ හින්දා සඳුදා දවස මං වෙන් කරල තියෙන්නෙ උඹල වෙනුවෙන් විතරයි...'

පුංචි රාළ ඈ කී සියල්ල සාවධානව අසා සිටියේය. පසුව ඉලක්කට්ටුව අරගෙන පුරුදු විදිහට හොඳට කල් අරගෙන බුලත් විටක් ඒදන්න ගත්තේය. පැයක විතර ඒ සූදානමින් පසු ඔහු හරිම නිදහසේ ඒ බුලත් විට කන්න පටන් ගත්තේය. විටින් විට කට පුංචි කර රතුපාට බුලත් කෙළ පාරක් මිදුලට ගසා දුඹුරු පාට පසුබිමක ඉහුණ රතු මල් තියෙන රෙද්දක හැඩ බලනවා වගේ ඔහු ඒ දිහා බලා සිටියේය.

වල්ලි සෑහෙන වේලාවක් පිල් කණ්ඩිය උඩ ඉඳගෙන තාවර වෙච් හිටියේ පුංචි රාළ මොනයම්ම හෝ උත්තරයක් දෙයි කියන බලාපොරොත්තු තියාගෙනය. එහෙත් ඔහු කිසිවක් නොකීවේය. අන්තිමේ ඈ පිල උඩින් නැඟිට උයන ගේ පැත්තට ගියාය.

පුංචි රාළ වප් පිහිය ඉනේ ගහගෙන නැඟිට්ටේය. ඉලක්කට්ටුවෙන් තව හුණු ඩිංගක් කටේ තවරාගෙන කට පුංචි කර තවත් ලොකු බුලත් කෙළ පාරක් මිදුලට විද්දේය. පසුව බිම තිබූ අත් පොරොව කරේ රඳවාගෙන එළියට බැස්සේය.

වල්ලි ආපහු පිලට එන විට පුංචි රාළ හිටියේ නැත. ඔහු හේනට යන්නට ඇතැයි සිතා ඈ ඇගේ පුරුදු වැඩපළවල යෙදුණාය. සති අන්තයේ සෙනසුරාදා පුරුදු විදිහට සාස්තර කියා ඉරිදා හවස පොඩි නිලමේත් එක්ක ගත කර සඳුදා ඈ පුංචි රාළ එනතෙක් ඔහු කැමති කෑම උයාගෙන බලා සිටියාය. හැන්දෑ වෙනකම්ම ඔහු නොපැමිණි බැවින් ඈ කළුවර වැටෙන්න කලින් හේනේ පැලට ගියාය. පැල උඩට නැඟ හොඳට සෝදිසි කළ නමුත් දවස් ගාණකින් ඔහු මෙහේ ඇවිත් නැති විත්තිය ඈට තේරුණේය.

ආපහු ගෙදර ඇවිත් ඈ සේදරා මුණ ගැහෙන්න ඔහුගේ තව පිලට ගියාය. සේදරා කීවේ දවස් ගාණකින් ඔහු අප්පුච්චා දැක්කේ නැති බවය. ඊට පසු ඈ පොඩිනාගේ රහස් බේත් ගබඩාවට ගොස් රනා මුණ ගැසුණාය. ඔහු ඇයට කීවේ සිකුරාදා රාත්තිරියේ අප්පුච්චා හීනෙන් පෙනී 'මං දුර ගමනක් යනවා ඒ හින්දා හේනට එන්ඩ එපා' යැයි ඔහුට කී බවත්, ඒ නිසා ඔහු එහි නොගිය බවත්ය.

මෙසේ ගමේ හැමතැනම සෝදිසි කළ නමුත් පුංචි රාළ ආගිය තැනක් හොයාගන්න වල්ලිට පුළුවන් වුණේ නැත.

The Reader's Place

09

ඇබිත්ත උන්නාන්සේ මරණාසන්නව සිටි සොබනී සිය උර මත හොවාගෙන පන්සලට රැගෙන ආවේ අවුරුදු දෙදහස් තුන්සියයක සිංහලේ රාජ්‍ය උරුමය ඉංග්‍රීසි හමුදාව විසින් අත්පත් කරගත් දවසේය. ඇයට යළි සිහිය ආවේ එංගලන්තයේ මහ රජුගේ ප්‍රතිරාජයා විදියට සේනාධිපති රොබට් බ්‍රවුන්රිග්ද සිංහලේ වැසියන් වෙනුවෙන් ඇහැලේපොල මහ නිලමේද, මොල්ලිගොඩ මහ අදිකාරම් ද, දිසාපතිවරුද අත්සන් තියා සිංහල රාජ්‍යයේ අනාගත පාලනය ඉංග්‍රීසින්ට බාරදුන් දවසේය.

කොයි කෙසේ වුවත් ඊළඟ අවුරුද්දේ වප් මාසයේදී ඉංග්‍රීසින්ගේ පාලනය ගැන සිංහලේ වැසියන් හොඳටම නොසතුටට පත් වෙමින් සිටියදී ඇබිත්ත උන්නාන්සේ හොඳටම සතුටට පත් වුණු දෙයක් සිද්ධ වුණේය.

මෙතෙක් කල් මුළු ගමම සාපයක් ලෙස සැලකූ පිරිමි ප්‍රාණ බිලිගන්නා යක්ෂ අවතාරයක් යැයි කියූ නොඑසේ නම් මිනිස් ප්‍රාණයක් වදන්න පිං නැති කාලකණ්ණියක ලෙස හංවඩු ගැසූ සොබනී තිවුන් දරුවන් බිහි කළාය.

මේ ප්‍රවෘත්තිය අසා සුරඹලා අම්මාත්, හීන් අම්මාත් කෙතරම් සන්ත්‍රාසයට පත් වුණාද කීවොත් දෙදෙනා ගෙදර බරාඳය මැද

The Reader's Place

එක් වරම එකට සිහි නැතිව වැටුණාහ. අන්තිමේ පස් දවසකට පසු වල්ලි ඔවුන්ගේ ගෙදරට ඇවිත් කහ දියර ඉස ඔවුන් සිහි ගන්වන විට ඔවුන් සිටියේ වැලි කන්දකට යටවී හුස්ම ගන්නවත් බැරුවය. සිහි නැති වුණත් දෙදෙනා එකම තැන එකට වැටී සිටි බැවින් දෙදෙනාගේ අත්වලින් වැටුණු වැලිවලට ඔවුන් යට වී සිටියහ. ඒ පස් දවස පුරා ඒ වැලි කන්ද බරාඳය මැද කෙතරම් උසට පිඩ තිබුණාද යත් හේතුහාමිට තව මිනිසුන් දෙතුන් දෙනෙකු යොදවා උදලුවලින් වැලි අයින් කරන්න සිදුවිය.

සොබනී මොහොතකින් වැඩිමල් වූ ගැහැනු දරුවාට සපුමලී ලෙසත් ඇයට බාල පිරිමි දරුවාට හීන් සුරඹා ලෙසත් නම් තිබ්බාය. නිවුන් දරුවන් වුවත් ඔවුන් අතර කිසිම සමානකමක් තිබුණේ නැත. ගැහැනු දරුවා කට්ට කළු වූ අතර පිරිමි දරුවා සුදු විය. ගැහැනු දරුවා සිහින් කෙසඟ වුවත් පිරිමි දරුවා සුදුම විය. එසේම සපුමලී සිනාසෙන විට හීන් සුරඹා ඇඬුවේය. හීන් සුරඹා නිදාගන්න විට සපුමලී ඇහැරී සිටියාය. සපුමලී වම් ඇලයට හැරෙන විට හීන් සුරඹා දකුණු ඇලයට හැරුණේය. හීන් සුරඹා උඩ බලාගෙන කෑ ගහන විට සපුමලී බිම බලාගෙන නිශ්ශබ්දව සිටියාය.

ඒ විදිහට ඔවුහු එකිනෙකට වෙනස් වෙනම ලෝක දෙකකින් පැමිණ වැරැදීමකින් එකම වේලාවට එකම මව් කුස ප්‍රාදූර්භූත වූවෝ වූහ.

නිවුන් දරුවන්ගේ උත්පත්තිය පන්සලේ වෙනම පසුබිමක් ඇති කළේය. ඉස්සර බෝ ගහේ සෙලවෙන බෝ කොළයක සිලි සිලිය භාවනාවක නිමිත්තක් වුණත් දැන් මේ දරුවන්ගේ සෝෂාව එයට බාධා කළේය. කොහොමටත් පන්සලේ නිහඬ බවට මෙහි පැමිණි දවසේ සිටම ඇබිත්ත කොලුවා ආදරය කළ අතර ගම්මුන් ඔහු ඇබිත්ත උන්නාන්සේ බවට නාම මාත්‍රිකව පරිවර්තනය කළ පසු වුණත් සිද්ධ වුණේ ඔහුගේ මේ ආදරය වැඩි වුණ එක විතරය. එබැවින් මේ දරුවන්ගේ සෝෂාව සැබවින්ම මේ ශුද්ධ භූමියට ආවේණික නිහඬ බවට බාධාවක් විත්තිය ඇබිත්ත උන්නාන්සේ දවසෙන් දෙකෙන් තේරුම් ගත්තේය.

එබැවින් ඔහු පන්සලේ දායකයන්ගේ ආධාරය ඇතිව පන්සලට මඳක් පල්ලමට වෙන්න වෙනම කුඩා නිවසක් සොබනී වෙනුවෙන් ඉදි කළේය. පසුව සේදරාගේ ගෙදර මේ වන විට නවතා විය සපුරා සිටී පුංචිම පුංචි කාලයේ ඔක්කේ තියාගෙන තමා විසින් නැළවූ පවුලේ බඩ පිස්සිය වූ එතනාට කතා කළ ඇබිත්ත උන්නාන්සේ ඈ සොබනීගේ තනි නොතනියට ඉන්න කැමති කරගත්තේය. ඒ සමඟ පන්සලේ ලැගුම් ගෙයි සිටින අතර දවසට දෙවරක් සොබනීත් තම නිවුන් දරුවනුත් බලන්න යන්න ඇබිත්ත උන්නාන්සේ තම දින චර්යාව සකස් කරගත්තේය. මේ කාලය තුළ සොබනී සමඟ සිදු කළ මෛථුන සමාධි භාවනාව ඇගේ මේ දරු උත්පත්තිය කරණ කොටගෙන නතර කරන්නට සිදු වූ නිසා තමන්ගේ දින චර්යාව උවමනා විදිහට එහා මෙහා කරගන්න තරම් අමතර කාලයක් ඔහුට ඉතිරිව තිබුණේය.

සත්‍ය වශයෙන්ම සුරඹලෑ අම්මාත්, හීන් අම්මාත් වගේ ගමේ ගම් වැසියන්ද සොබනීගේ මේ නිවුන් දරු උපත ගැන කතා කළේ විස්මයෙනි. මෙතුවක් කල් එක දරුවෙකුවත් සිය බඩින් වදන්න පිං නොලද මේ ගැහැනිය එක වර නිවුන් දරුවන් බිහි කිරීම ගම්මුන්ට ආශ්චර්යයක්ම විය. සමහරු එය පිළිගත්තේවත් විශ්වාස කළේවත් නැත. සමහරු මෙය අර්ථකථනය කළේ සොබනීගේ ආශ්චර්යයකට වඩා ඇබිත්ත උන්නාන්සේගේ ආශ්චර්යයක් විදිහටය. ඔවුන් කීවේ ඇබිත්ත උන්නාන්සේ නොහිටින්න සොබනීට දරුපල ලබන්න බැරි බවය.

තවත් සමහරෙක් කීවේ මේ ඇගේ කුසින් බිහි වූ දරුවන් නොව ඇබිත්ත උන්නාන්සේ විසින් කිසියම් අදිසි බලයකින් මවන ලද දරුවන් බවය. එයට සාක්ෂි ලෙස ඔවුන් ඉදිරිපත් කර තිබුණේ නිවුන් දරුවන් වුවත් ඔවුන් අතර කිසිම සමානකමක් නැත්තේ ඒ නිසා බවය. මේ සිතිවිල්ල නිසාම මේ දරුවන් පිළිබඳව ඔවුන් තුළ තිබුණේ බියකි. මව් කුසින් නොව කිසියම් දේව බලයකින් සුර අසුර ලෝකයක සිට මහ පොළොවට සම්ප්‍රාප්ත වූ දේව දරුවන් විදිහට ඔවුහු මේ දරුවන් අර්ථකථනය කළහ. ඒ සමඟම මේ දරුවන් බලා කියාගන්න සොබනී තුළද කිසියම් දේව බැල්මක්

'ඔන්න ආයෙමත් ඔබ වහන්සේ මට වැරදියට කතා කරනවා...'

'නෑ... මං එහෙම කිව්වේ මගේ හිතට එකඟව... ඔබ වහන්සේ උපසම්පදා වෙච්ච හාමුදුරු නමකටත් වැඩිය බුදු බණ දන්නව... ඔබ වහන්සේ ළඟ උපසම්පදා වෙච්ච හාමුදුරු නමකටත් වැඩිය ධ්‍යාන සමාපත්ති තියෙනවා... ඒ විතරක් නෙමෙයි ඔබ වහන්සේ උපසම්පදා වෙච්ච හාමුදුරු නමකටත් වැඩිය මේ මිනිස්සු බුද්ධ ශාසනේ පිහිටුවල තියෙනවා......'

ඉක්බිතිව මඳ නිහඬතාවයක් ඇති විය. ඇබිත්ත උන්නාන්සේට කතා කරගන්න වචන අමතක වුණා පමණක් නොව එක වරම ලොකු විමතියක්ද හට ගත්තේය. ඒ විමතිය කෙසේ හෝ අවසානයේ වචනවලට පෙරළන්න ඔහුට පුළුවන් වුණේය.

'ඔබ වහන්සේ කොහොමද මං ගැන මෙච්චර දන්නේ...'

'මං පල්ලේගම හාමුදුරුවො... මගේ ගුරු වුණේ මේ පන්සලේ ලොකු හාමුදුරුවො... උන්වහන්සේ තමයි මං උපසම්පදා කළෙත්. අවුරුදු දහයකටත් වැඩිය මං උන්වහන්සේ ළඟ මේ පන්සලේ හිටිය... ඒත් මං උන්වහන්සේගෙ කීම පිට මල්වතු විහාරයට ගියා...'

'උන්වහන්සේගේ කීම පිට...?'

ඇබිත්ත උන්නාන්සේ විමතිය පළ කරමින් නළල රැලි ගැන්වූයේය.

'ඒත් මං ගමේ මිනිස්සුන්ගෙන් අහල තිබුණේ ඔබ වහන්සේ උන් හිටි ගමන් පන්සලෙන් අතුරුදන් වුණා කියලා...'

'නෑ... ලොකු හාමුදුරුවො තමයි මට මල්වතු විහාරයට යන්න කිව්වේ.. මීට අවුරුදු අට නමයකට විතර ඉස්සර...'

'ඇයි ඒ...'

'ලොකු හාමුදුරුවො අනාගතේ දැක්ක... අද මේ සිද්ධ වෙන දේ උන්වහන්සේ ඒ විදිහටම දැක්ක කියල මට හිතෙනවා...'

'එහෙමයි... මාත් ඒක විශ්වාස කරනවා...'

ඇබිත්ත උන්නාන්සේ සිය අත්දැකීම් මත පිහිටා එය එකහෙළා අනුමත කළේය.

'ඒ කාලේ රාජසිංහ රජ්ජුරුවො පිරිහෙන්න පටන් ගන්න කාලේ.. රජ්ජුරුවො දෙවෙනි කසාදෙ කරගන්න අවුරුදු කීපයකට ඉස්සර... පිළිමතලව්වේ අදිකාරම්ගෙ හිස ගසා දමන්නත් ඉස්සර.... ලොකු හාමුදුරුවෝ මට කිව්ව මේ ගමේ කළමනා ටික මං බලාග න්නම්. ඊට වැඩිය මේ යන විදිහට ගියොත් අපිට ඉන්න හිටින්න රටක් නැති වෙනව... ඊට ඉස්සර මේ සිංහලේ වෙනුවෙන් කරන්න තියෙන යුතුකම කරන්න මට මල්වතු විහාරයට යන්නය කියලා... පස්සෙ උන්වහන්සේ මොරතොට නායක හාමුදුරුවන්ට තල් පතකුත් එක්ක මං එහාට පිටත් කළා...'

පල්ලේගම හාමුදුරුවෝ කතාව මඳකට නතර කර ලොකු හුස්මක් ගත්හ. ඊට පසු යළිත් මෙසේ වදාරන්නට වූහ.

'මම එහේ හිටියත් මෙහේ විස්තර හැම දෙයක්ම ලොකු හාමුදුරුවන්ගෙන් දැන ගත්තා... අපවත් වෙන්න සති කිහිපයකට කලින් උන්වහන්සේ මට ලියලා එව්වා... මගේ කාලය අවසන් වීගෙන එනවා කියලා... එතකොට මං ආපිට උත්තරයක් ලියල එව්වා මෙහේ වෙන හාමුදුරු නමකුත් නැති එකේ මං එහෙනං එන්නද කියලා.. උන්වහන්සේ මට ආපහු ලිව්ව... මෙහේ ඉදිරි කටයුතු කරදරයක් නැතිව ඉස්සරහට සිද්ධ වෙනවා... ඊට වඩා පල්ලේගමට ලොකු රාජකාරියක් ඉස්සරහට තියෙනව ඒක ඔහේ ඉඳගෙන කරන්ඩය කියලා... ඒ කියන්නේ ලොකු හාමුදුරුවො වේලාසනම දැනගෙන ඉඳල තියෙනවා එයා ළඟ ඉන්න ඇබිත්ත කොලුවා උපසම්පදා නොවුණට ඉස්සරහට හාමුදුරු නමකටත් වැඩිය මේ ගමේ මිනිස්සුන්ව රැක බලාගෙන සාසනේ ඉස්සරහට අරගෙන යනවා කියලා...'

ඇබිත්ත උන්නාන්සේ සියල්ල සාවධානව අසා සිටියේය. ඉක්බිතිව බොහෝ ප්‍රීතියට පත්ව මෙසේ කීවේය.

'දැන් ඔබ වහන්සේ ආපහු යන්ඩ හිතන්ඩ එපා.. ඔබ වහන්සේ මෙහෙම නතර වෙන්ඩ ඕන.. මේ පන්සලේම ඉඳගෙන පුළුවන් ඔබ වහන්සේගේ ඔය සියලු යුතුකම් රාජකාරි ඉෂ්ට කරන්ඩ. ගමේ මිනිස්සුත් පුදුම සතුටු වෙයි ඔබ වහන්සේ නැවත වැඩියයි කිව්වම...'

'බෑ... ඒක කොහොමටවත් කරන්ඩ බෑ.. ඉස්සරටත් වඩා තීරණාත්මක වැඩ කොටසක් තියෙනවා මට කරන්ඩ. ඒක මේ පන්සලේ ඉඳගෙන කොහොමටවත් කරන්ඩ බෑ...'

'ඇයි ඒ...'

ඇබිත්ත උන්නාන්සේ ප්‍රශ්න කළේය. එහෙත් එයට පිළිතුරු දෙනු වෙනුවට පල්ලේගම හාමුදුරුවෝ මෙසේ කීහ.

'මං පස්සේ ඒක කියන්නං... දැන් මහන්සියි... මූණ කට ටිකක් හෝදගන්ඩ ඕනෑ...'

'හොඳමයි... ළිඳ තියෙන්නේ අර පැත්තේ...'

ඇබිත්ත උන්නාන්සේ අත දික් කර දිසාව පෙන්නුවේය. එහෙත් පල්ලේගම හාමුදුරුවෝ මෙසේ පිළිතුරු දුන්හ.

'මං දන්නවා... මං කිව්වේ අවුරුදු දහයකටත් වැඩිය මං මෙහේ හිටිය කියලා. මේ භූමියේ වැලි කැටයක් ගානේ මට තාම මතකයි....'

ඇබිත්ත උන්නාන්සේට ඇත්තටම ලැජ්ජා හිතුණේය. එය වළක්වාගෙන ඔහු මෙසේ කීවේය.

'හොඳයි ඔබ වහන්සේ මූණ කට සෝදගෙන එන්ඩ... මම ගිලන්පස ටිකක් ලෑස්ති කරන්නං...'

පල්ලේගම හාමුදුරුවෝ ළිඳ ළඟට ගොස් මූණ කට හෝදාගෙන පැමිණියහ. ඇබිත්ත උන්නාන්සේ සිය පරණ ලැගුම් ගෙය හාමුදුරුවන්ට ලෑස්ති කළේය. ඉක්බිතිව හාමුදුරුවන්ට ගිලන්පස පිළිගන්වන ගමන් මෙසේ කීවේය.

'මටත් බොහෝ දේවල් ආරංචියි... ගිවිසුම පැත්තක තියල ඉංග්‍රීසි ආණ්ඩුව ඒගොල්ලන්ට උවමනා විදිහට හැම දෙයක් ගැනම තීන්දු තීරණ ගන්නවය කියලා...'

'ඔව් ඒක ඇත්ත.... මේක හරියට අපි ඉස්සරත් කළා වගේ ඉඟුරු දීල මිරිස් ගත්ත වගේ වැඩක්... මේ රටේ මිනිස්සුන්ට ගිය අවුරුද්දේ ඉඳන් රජෙකුත් නැති වුණා... දැන් රටත් නැති වෙගෙන යන්නේ... රාජසිංහ රජ්ජුරුවො අන්තිම කාලේ කළේ... සැක කරපු හැම මිනිහෙක්ම පෙති ගහපු එක. දැන් මේ ගොල්ලො කරන්න හදන්නෙත් ඒක...'

The Reader's Place

පල්ලේගම හාමුදුරුවෝ ගිලන්පස උගුරක් බී හිතට ආ ආවේගය සමහන් කරගත්හ.

'දැන් ඔබ වහන්සේලාගේ අරමුණ මොකක්ද...'

කෙටි නිහඬතාවයකට පසු ඇබිත්ත උන්නාන්සේ එසේ ප්‍රශ්න කළේය.

'මේ ඉංග්‍රීසි ආණ්ඩුව පරද්දන්න ඕන... ඒකට කලින් මේ රටේ සිංහාසනය උරුම රජ කෙනෙක් අපි හොයාගන්න ඕන. නැත්තං රටේ මිනිස්සු එක අරමුණකට එකතු කරගන්න අමාරුයි.......'

'...එහෙම රජ්ජුරු කෙනෙක් ඉන්නවද දැන්...'

'මල්වතු විහාරයේ ඉගෙන ගන්න ඉහගම හාමුදුරුවෝ ඒකට මහන්සි වෙනවා... එක්කො සියම් රටෙන් රජ කුමාරයෙක් ගෙන්න ගන්න... නැත්තං මීගමුවේ හිරේ ඉන්න රාජසිංහ රජ්ජුරුවන්ගේ ඥාති කුමාරයා එතනින් නිදහස් කරගෙන එයාව සිංහාසනයේ තියන්න... ඒත් ඒ දෙකම වැරදුණා... අපේ මිනිස්සුමයි, අපේ මිනිස්සුන්ට විරුද්ධව ඉංග්‍රීසින්ට කේලම් කියන්නේ. එක්නැලිගොඩ නිලමෙ ඉංග්‍රීසින්ට තොරතුරු දීල එකට වැඩ කරපු ඉහගම හාමුදුරුවොයි, තව උන්නාන්සේලා දෙනමකුයි මීට මාස කීපයකට කලින් පහුගිය ඇහැළ මාසේ ඉංග්‍රීසින්ට අල්ලල දුන්නා. ඒත් ඉහගම හාමුදුරුවො එතනින් පැන ගත්ත... තාම උන්නාන්සේ ගැන ආරංචියක් නෑ...... මං උන්නාන්සේට උදව් කරනවා ඉංග්‍රීසි මේ රටෙන් එළවල දාන්ඩ...'

ඇබිත්ත උන්නාන්සේ ඉතා සාවධානව පල්ලේගම හාමුදුරුවන්ගේ මේ ආවේගශීලි කතාව අසා සිටියේය.

'දැන් ඔබ වහන්සේ කොහෙද වඩින්නේ...'

'කතරගමට...'

'මේ හදිස්සියේම...?'

'ඔව් කතරගම දේවාලෙට පුද පඬුරු ඔප්පු කරල ඉංග්‍රීසි ආණ්ඩුව නැති භංගස්ථාන වෙලා රජ කෙනෙක් පහළ වේවා කියල යාතිකා කරන්ඩ...'

එදා රෑ මධ්‍යම රාත්‍රිය පහුවන තෙක්ම දෙදෙනා බොහෝ විස්තර කතා බහ කළහ. පසුව පල්ලේගම හාමුදුරුවෝ නින්දට

ගියහ. පහුවදා මහ පාන්දරින් උදෑසන භාවනා කරන්න ඇබිත්ත උන්නාන්සේ ඇහැරෙන විටත් පල්ලේගම හාමුදුරුවෝ කතරගමට පිටත් වී සිටියහ.

මෙතෙක් කල් ඇඳුම් පැලඳුම්, මනිබඩු රැගෙන ගමට ආ ගිය අබ්දුල් තම්බි මුදලාලි ගමේ කඩ පිලක් කරන්න පටන් ගත්තේ මේ කාලයේදීය.

කකුල් කෙටි ගෙවෙනකං මනිබඩු පෙට්ටිය හිස මත තියාගෙන තැන තැන ඇවිදිමින් දීර්ඝ කාලයක් ගත කළ අබ්දුල් මුදලාලි එක තැන ඉඳගෙන කළ හැකි ව්‍යාපාරයක් ගැන හිතුවේ බොහෝ කලක සිටය. එහෙත් එයට හරි වේලාවක් ආවේ සේදරා සමඟ කතා කළාට පසුවය. පොඩිනාගේ ගෙදරට රහස් බේත ගන්න එන පිරිස වෙනුවෙන් පටන් ගත් කඩ පිල මීට වඩා පිළිවෙළකට කිරීමේ කැමැත්ත සේදරාගේ හිතේ තිබුණේ කලක සිටය. දිනක් අබ්දුල් මුදලාලි කඩ පිලට ආ දවසක මේ ගැන සේදරා ඔහු සමඟ කතා කළේ නිකමට වගේය.

'කකුල් කෙඩෙත්තුව හැදෙනකං ඔය හැම තැනම බාල් ගාන්නේ නැතුව එක තැන ඉඳං යමක් කරන්න ගත්තනං මොකෝ...'

'හොඳ තැනකුත් තියෙන්න එපායැ සේදරා මලය ඒකට...'

'මෙතන ගැන මොකෝ හිතන්නේ... ගමේ මිනිස්සුන්ටත් දැන් මෙතන පුරුදුයි. ඊටත් වඩා පොඩිනාගේ රහස් බේත ගන්න පිට ගං වලින් මිනිස්සු කොච්චර කියල මෙතනට එනවද...'

'ඉතිං සේදරා මලය මේ කඩ පිල හොඳට කරනවනේ...'

'අපි දෙන්නම එකතු වෙලා පටන් ගමු මීට වඩා ටිකක් ලොකුවට...'

අබ්දුල් මුදලාලි ඒ කතාවෙන් කෙතරම් ප්‍රමෝදයට පත් වූයේද යත් බොමින් සිටි රණවරා වතුර ඉස්මොල්ලේ ගොස් කැස්ස හැදුණේය. ටික වේලාවකට පසු පියවි තත්ත්වයට පත්ව ඔහු සේදරාට මෙසේ කියන විට ප්‍රීති ප්‍රමෝදයේ කඳුළු ඔහුගේ ඇස්වල දිදුලමින් තිබුණේය.

'අල්ලා දෙයියන්පල්ලා... මං මෙච්චර කල් ගං සිය ගාණකට ගියා. ඒත් සේදරා මලයො උඹ තරං මොළේ තියෙන මිනිහෙක් මට එක ගමකින්වත් හම්බ වුණේ නෑ...'

සේදරා හිනා වුණේය.

අබ්දුල් මුදලාලි රණවරා මණ්ඩි ටික එළියට විසි කර කට පිහිදගෙන ඔහු ළඟටම ඇවිත් වටපිට බලා කවුරුවත් ළඟපාත නැති විත්තිය දැන හොරෙන් වගේ ඔහුගේ කනට කර මෙසේ කීවේය.

'මලයො උඹ කාටවත් දැනගන්ඩ තියන්ඩ එපා ... මගේ වෙළඳාමට ඉංග්‍රීසි මහත්තුරු උදව් කරනවා... ඒ ගොල්ලන්ට කියල මට ඕන දෙයක් කරගත්තහැකි...'

ඊට සතියකට විතර පසු අබ්දුල් මුදලාලි තවත් අත් උදව් කරුවන් දෙදෙනෙක් සමඟ ගොන් කරත්තයක් පිරෙන්න බඩු මුට්ටු රැගෙන ආවේය. මුදලාලි තනිකරම තමුන්ගේ සල්ලි වියදම් කර පරණ කඩ පිල කඩා අලුතින් එය ලොකුවට හැදුවේය. ඒ සඳහා අවශ්‍ය පෙදරේරුවන් පවා ඔහු මඩකලපුවේ සිට කරත්තයක නංවා රැගෙන ආවේය. එසේ වැඩ නිම කළ විට එය ගමේ අනෙක් ගෙවල්වලට වඩා වෙනස් අමුතුම පන්නයේ ගෙයක් නැත්නම් කඩ පිලක් බවට පත්ව තිබුණේය.

ඒ වන විට මහගෙදර සේදරා හැර වෙන කවුරුවත් හිටියේ නැත. එතනා සොබනීගේ ගෙදර අත් උදව්වට ගොස් සිටියාය. පුංචි රාළ හිටි හැටියේ අතුරුදන් වීමත් සමඟ ටිකිරි පුංචි රාළගේ හේනේ පැලට කැමැත්තෙන්ම ගොස් සිටියේය. මෙසේ මාස කීපයක් තිස්සේ තනි පංගලමේ ජීවිතයක් ගත කළ සේදරා ඇත්තටම අබ්දුල් මුදලාලිට මෙවැනි යෝජනාවක් කරන්න පෙලඹුණෙත් ඔහුගේ මේ තනිකම නිසාය.

'සේදරා මලය අර හොල්මන් ගෙදර තනියෙම ඉන්ඩ ඕන නෑ.. අපි මේ කඩේටම අල්ලලා කාමර කෑලි දෙක තුනක් හදාගමු... එතකොට අපි දෙන්නටම ඒකෙ ඉන්ඩ පුළුවනි....'

ඒ අනුව අබ්දුල් මුදලාලි ඒ කඩ පිලටම අල්ලා තවත් අමතර කාමර කෑලි තුනක් හැදුවේය. ආරච්චිල වලව්වේ හැරුණු විට

The Reader's Place

මේ ගමේ කිසිම ගෙදරක 'කාමර' කියා දෙයක් නොතිබූ බැවින් මඩකලපුවේ සිට පැමිණි පෙදරේරුවන්ගේ උපදෙස් ඇතිව හොඳට උළුවහු තියා දෙරවල් දමා ඒ 'කාමර' කෑලි තුන ලකපහට හදන්න අබ්දුල් මුදලාලි මහන්සි වුණේය.

ඒ සමග පුංචි රාළ ගෑනු දෙන්නෙක් සමග ජීවත් වූ. ඒ ගෑනු දෙන්නා වරින් වර ළමයි නව දෙනෙකු වැදූ. ජීවිතයේ අනේක පිරිපත සමග කඳුළත් සිනාවත් එකට කැටයම් වූ. කලක් සශ්‍රීකත්වයේ මුදුනේ පැවති මහගෙදර මිනිස් වාසයක් නැති මහ සොහොන් පාළුවට පත් වුණේය.

සේදරාගේත්, අබ්දුල් මුදලාලිගේත් මේ හවුල් වෙළඳාම සතිය දෙක යන විට බලා ඉද්දී වගේ දියුණු වෙන්න පටන් ගත්තේය. ගමේ මිනිසුන් අතර පමණක් නොව රහස් බේත ගන්න පැමිණි අහල ගම්වල මිනිසුන් අතරත්, මාසයක් ගත වෙන විට ඈත ගම් වලත් ප්‍රසිද්ධ වෙන්න පටන් ගත්තේය. අබ්දුල් මුදලාලි වෛවර්ණ ඇඳුම් පැළඳුම් මනිබඩු, කොළඹිනුත් මඩකලපුවෙනුත් සිය අත් උදව්කරුවන් ලවා ගෙන්වාගත් අතර මාසයකට වතාවක් ලොකු ගොන් කරත්තයක් පිරවූ අරුමෝසම් තොගයක් ගමට ආවේය.

වෙළෙඳාම කෙතරම් ඉක්මනින් දියුණු වූයේ ද යත් මුලදී මාසයකට වතාවක් පැමිණි මේ ගොන් කරත්තයට, ඊළඟට සති තුනකට වතාවක් ලෙසත්, අවසානයේ පහළොස් දවසකට වතාවක් ලෙසත් ගමට එන්න සිදු විය.

ව්‍යාපාරයේ අදහස සේදරාගේ වුණත්, ව්‍යාපාරය සඳහා පාවිච්චි කළේ සේදරාගේ භූමිය වුණත් මේ ගමේත් අහළ ගම් වලත් එය ප්‍රසිද්ධ වුණේ 'තම්බිගේ කඩේ' කියාය.

'මේං බලන්ඩ මේ රෙද්ද හොඳද කියල... තම්බිගෙ කඩෙන් මං ගත්තේ...'

'හොඳ මාල පොටක් ගන්ඩ නං ඉතිං තම්බිගෙ කඩේටම යන්ඩ ඕන...'

'මං ගොඩක් කඩවලින් බැලුව ඒත් තම්බිගේ කඩේ වගේ නං ඒ එකක්වත් නෑ...'

මේ විදිහට මාස දෙක පිරෙන විට මිනිස්සු 'තම්බිගෙ කඩේ' වර්ණනා කරන්න පටන් ගත්හ. හොඳට ලාබ තියාගෙන අබ්දුල් මුදලාලි කාට බඩු විකුණුවත් ඔහු වල්ලීට බඩු විකුණුවේ පරණ පුරුදු විදිහට ගත් මුදලට වඩා තඹ සල්ලියක් හෝ අඩුවෙන්ය. ඒ වගේම කඩේ කොච්චර ප්‍රසිද්ධ වුණත් වල්ලී පණිවිඩයක් එවූ විට ඔහු පරණ විදිහටම කරේ කද තියාගෙන වල්ලීගේ ගෙදරට ගියේය. ඈට උවමනා දේ ඔහු කොහෙත් හෝ ගෙනත් දුන්නේය. එහෙත් ගනුදෙනුව හමාර කර වල්ලීගේ ගෙදරින් පිට වන විට ඔහු මෙසේ කියන්න පුරුදු වී සිටියේය.

'අනේ උඹ කාටවත් හේම කියන්ඩ එපා... මේ ගාණට මං උඹට මෙව දුන්නය කියලා...'

ඒ විදිහටම වල්ලී ඒ මිල ගණන් කාටවත් කීවේ නැත. එහෙත් තමන් මිලදී ගත් දේ කඩ පිලේ විකිණෙන මිලත්, තමා මිලදී ගත් මිලත් සන්සන්දනය කළ විට මේ මිනිහා කෙතරම් ලාභයක් උපයනවාදැයි ඈ දැන සිටියාය. සේදරාවත් නොදැන සිටි මේ රහස දැනගෙන සිටි ගමේ එකම තැනැත්තී ඈ වූ අතර බාග වෙලාවට අබ්දුල් මුදලාලිටත් වඩා ඔහු ඉපැයූ ලාභය වල්ලී දැනගෙන සිටියාය.

ඇත්තටම අබ්දුල් මුදලාලිටත් වඩා වෙළෙඳාම දියුණු වීමෙන් සන්තෝෂ වුණේ සේදරාය. කඩේ වැඩි වාසි මුදලාලිට වුණත් ඔහු සේදරාට ලෝභ නැතිව වියදම් කළේය. ඔහු කැමති කැමති දේ ගෙනත් දුන්නේය. හැම සතියකම තඹ සල්ලි සීයක් දෙසීයක් ඔහු සේදරාගේ අතට දුන්නේය. එය ඔහුගේ ලාභයෙන් දහයෙන් පංගුවක් වගේ වුණත් සේදරාට ලොකුම ලොකු මුදලක් වුණේය.

කඩේ පටන් ගෙන මාස දෙකකට විතර පසු දවසක රාත්‍රියේ කඩේ වසා දමා සේදරා නිදාගන්න ලෑස්ති වන විට එහා කාමරේ සිටි අබ්දුල් මුදලාලි ඔහුට කතා කළේය.

'ඩිංගක් ආව නං මගේ කාමරේ පැත්තට...'

සේදරා, මුදලාලිගේ කාමරේට ගියේය. එහි ඇඳ උඩ බෝතලයක් තබා තිබුණේය. තවත් වීදුරු දෙකක් තිබුණේය. මුදලාලි වීදුරු දෙක පිරෙන්න එහි තිබුණ වතුර ඒවාට දැම්මේය. ඊට පසු එක වීදුරුවක් සේදරාට දික් කළේය.

The Reader's Place

'ඉඳගමුකෝ මගේ ඇඳ උඩින්...'

සේදරා ඉඳගත්තේය.

'මේක බීල බලහංකෝ මලය කොහොමද කියලා...'

සේදරා එය නහයට ළං කළේය. එයින් ආ සැර වාෂ්ප නාසය දිගේ ඉහළට ගොස් ඔහුගේ ඇස් කෙවෙන්න පටන් ගත්තේය.

'සැවල් එකක්ද මේ...'

'බීල බලහංකෝ මං කිව්වට... මං උඹට වස දෙනවැ...'

සේදරා එක හුස්මට එය කටේ හලාගත්තේය. ඒ සමගම තදින් කහින්නත්, ගොරොත්තෙ අදින්නත් පටන් ගත්තේය. එක වෙලාවකින් ඒක හරි ගියේය.

'කොහොමද ...' මුදලාලි ඇසුවේය.

'මොකා ද මේ...'

'කොහොමද කියහංකෝ...'

'අනේ මන්ද මගෙ ඉහ මොළේටම ඒ සැර ගියා...'

තමා අතේ තිබූ වීදුරුව එක වර කටේ හලාගත් මුදලාලි කට ඇඹුල් කර පුරුදුකාරයෙක් වගේ කට පිහදාගෙන සේදරාගේ කන ළඟට තම මුව ළං කර රහසින් වගේ මෙසේ කීවේය.

'මේක මට සුදු මහත්තුරුන්ගෙන් හම්බ වෙච්ච බඩුවක්... අරක්කු කියල මේවට කියන්නේ... අපි උඹල බොන කිතුල් රා වගේ නෙමෙයි මේවා...'

සේදරා කට ඇරගෙන මුදලාලිගේ විස්තර අසා සිටියේය. ඉංග්‍රීසි ආණ්ඩුව සිංහලේ පාලනය කරන්න පටන් ගත්තාට පසුව තැන තැන යන්තමින් පැතිරුණු මේ බීම ගැන සේදරා කතින් කොනින් අසා තිබුණේය. එහෙත් එය මේ වගේ සුවඳ ඇති, ඉහ මොළේටම සැර කාන්දු වෙන මෙවැනි බීමක් වින්තිය ඔහු දන සිටියේ නැත.

'මං මේ මලයට දෙන්ඩමයි සුදු මහත්තුරුන්ට කියලා තකහනියෙම ගෙන්න ගත්තේ...'

ඔහුට ඇත්තටම සිය මිත්‍රයා ගැන පුදුමාකාර ළෙංගතුකමක් ඇති වුණේය. මේ මිනිහා කෙතරම් හිත හොඳ කළගුණ සලකන රට තොට ගැන දන්න මිනිහෙක්දැයි ඔහුට සිතුණේය.

'උඹලා අල්ලා දෙයියංපල්ල අබ්දුල්... මට උඹ වගේ එක මිනිහෙක් මේ ගමේ හම්බුවෙලා නෑ... දෙයියම්පල්ල උඹ වගේ හදවතින් එළියට ඇදල දෙන එකෙක් නෑ මේ ගමේ... දාපං මට තව වීදුරුවක්...'

දෙදෙනා එක දිගට බොන්න පටන් ගත්හ. ඇත්තම වශයෙන් සිද්ධ වුණේ එය නොවේ. අබ්දුල් වීදුරු දෙකක් ගෙන තිබියදී සේදරා බෝතලේ ඉතිරි හරියටම වග කීවේය. බොන්න පටන් අරගෙන පැයකට පසුව තමාට කුමක් වුණාදැයි සේදරා දන සිටියේ නැත. වෙන කවරදාකවත් නැති විදිහට තමා ගොඩක් දේ කතා කළ බව ඔහුට මතක තිබුණත් ඒ කතා කළේ මොනවාදැයි ඔහුට මතක තිබුණේ නැත. සම්පූර්ණ සිහි නැති වෙන්න මත්තෙන් තමා අබ්දුල් බදාගෙන සිටි බවත් එසේ සිටිමින් ඔහුගේ මුහුණ ලෙවකෑ බවත් විතරක් ඔහුට මතක තිබුණේය.

පහුවදා හොඳටම එළිය වැටී සේදරා නැගිට්ටේ අබ්දුල්ගේ කාමරේ සිටය. අබ්දුල් පාන්දරම නැගිට කඩේ අස් පස් කර ඇඳුම් පැළඳුම් මතිබඩු තියෙන කැල්ලත් ඇර තිබුණේය. තවමත් හොඳුම ඇස් ඇරගන්න බැරි වුණත් සේදරා හොඳ පියවි සිහියෙන් සිටියේය. ඒ නිසා ගත වුණු රාත්‍රිය පිළිබඳව ඔහුගේ හිතේ තිබුණේ ලැජ්ජාවකි. ඔහු අබ්දුල් දිහාවත් හරියට ඇස් ඇර බැලුවේ නැත. මොන එහෙකට තමා මේ දහජරාවක් කටේ ගැහුවාදැයි ඔහුට සිතුණේය. තමාට පොඩි වැරැද්දක් සිදු වී ඇති බවත්, එය ලේසියෙන්ම මඟ හැර ගත හැකි බවත් ඔහු තේරුම් ගත්තේය.

කොයි කවර විදිහට මෙනෙහි කළත් පෙරදා රාත්‍රියේ ආරම්භය මිස එතනින් එහාට කිසිවක් නිවැරදිව එක දිගට ඔහුගේ මතකයට නැඟුණේ නැත. යම් යම් සිදුවීම් ඔහුගේ මතකයේ තිබුණත් ඒවා ඇත්තටම පෙරදා රාත්‍රියේ සිදු වූ දේද නැත්නම් රාත්‍රී නින්දෙන් ඔහු සිහිනයෙන් දුටු දේද කියා වෙන් කරගන්න ඔහුට බැරි විය. කොයි කෙසේ වෙතත් අවසානයේ ඔහු පෙරදා රාත්‍රියේ නිදාගත් අබ්දුල්ගේ ඇඳෙන් නැඟිට්ටේ ආයෙමත් මොනම හේතුවක් නිසාවත් මේ බීම කටේ නොතියන බව තමාවම පොරොන්දු කර ගනිමින්ය.

The Reader's Place

එහෙත් දවස ගෙවී හවස් වන විට ඔහුට මඳ අපහසුවක් දැනුණේය. එහෙත් එය තේරුම් ගන්න කාලය වෙන් නොකර ඔහු දිගටම වැඩ කළේය. හවස කඩේ වසා දමා නා කියාගෙන ඇවිත් කාමරේ ටිකක් ගිමන් අරින විට අර හවස දැනුණ අපහසුව ඔහුට වඩාත් තදින් දැනෙන්න ගත්තේය. ඇඳේ වට කීපයක් එහාට මෙහාට පෙරළී අවසානයේ ඔහු අබ්දුල්ගේ කාමරයට මළුව දැම්මේය. අබ්දුල් දවසේ වියදම් සටහන් කරමින් සිටියේය.

'අබ්දුල්... ඊයේ බීම ඔක්කොම ඉවරද...'

අබ්දුල් කරමින් සිටි වැඩේ නවත්තා ගෙල හරවා ඔහු දිහා බලා සිනාසුණේය.

'නෑ... නෑ... මං ළඟ තව බෝතල් කීපයක්ම තියෙනවා...'

ඉන් පසු දෙදෙනා යළිත් බොන්න පටන් ගත්හ. ජීවිතයේ කිසිම දවසක මේ තරම් අමා සුවයක් ලබා නැති විත්තිය සේදරාට වැටහෙන්න පටන් ගත්තේය. අරක්කු සැරෙන් ඉහ මොළ රත් වෙන්න රත් වෙන්න ඔහුගේ ජීවිතය ප්‍රබෝධමත් වෙන්න පටන් ගත්තේය. මෙතෙක් කල් ජීවිතයේ අවුරුදු දහ අටකට වඩා ගත කර තිබුණ නමුත් ඇත්තටම මෙතෙක් කල් ජීවත් වුණාද කියා ඔහුවම තේරුම් ගන්න බැරි විය. ඔහු තේරුම් ගත්තේ එකම එක දෙයකි. එනම් ඔහු ජීවත් වෙන්න පටන් ගත්තේ මේ දැං මොහොතකට කලින් බවය.

'උඹ දෙයියෙක් අබ්දුල්... උඹ දෙයියෙක්...'

ඔහු සිය දහස් වාරයක් පුනරුච්චාරණය කළේය. එසේ කියමින් ඔහු නොනවත්වාම අබ්දුල් සිප ගත්තේය.

'අබ්දුල්... මේ බීම ගමේ මිනිස්සුන්ටත් විකුණුවොත් මොකද වෙන්නේ...'

පහුවදා තවත් බෝතලයක් හිස් කරන ගමන් සේදරා අබ්දුල්ගෙන් ඇසුවේය.

'කිව්වම මොකෝ මාත් හිතාගෙන හිටිය ඔය ගැන. ඒත් හරි පරිස්සමෙන් කරන්ඩ ඕන වැඩක් මේක. ඉංග්‍රිසි මහත්තුරු මේව බෙදාහැරියට ප්‍රසිද්ධියේ විකුණනවට කැමති නෑ...'

ඊට දවස් තුනකට පසුව ආ කරත්තයෙන් මනිබඩුත් සමඟ අරක්කු බෝතල් තොගයක් අබ්දුල් ගෙන්වා ගත්තේය. බඩු අසුරා තියෙන කාමරේ පසෙකින් ඔහු ඒවා මණී බඩු අස්සේම සඟවා තැබුවේය. එදා දවල් වැඩ කරන අතරේ අබ්දුල් සේදරාට මෙසේ කීවේය.

'හවසට අපිත් එක්ක එකතු වෙන්න මලයගේ යාළුවෝ දෙන්නෙක් දෙනෙකුට කඩේට එන්ඩ කියන්ඩ...'

එදා හවස අබ්දුල්ගේ කාමරයට එන්න සේදරා ඔහුගේ මිතුරන් වූ ජෝතියාටත්, රන් හොටීටත් කතා කළේය. පහුවදා ජෝතියාත් රන් හොටීත් ඔවුන්ගේ යාළුවන් වූ සුවඳාටත්, බාලයාටත් කතා කළෝය. ඊළඟ දවසේ ඔවුහු දෙදෙන ඔවුන්ගේ තවත් යාළුවන් දෙදෙනෙකුට කතා කළෝය. මේ විදිහට සතියක් ගත වෙන විට හැමදාම හවස් වරුවේ විස්සක තිහක තරුණයෝ පිරිසක් අබ්දුල්ගේ කාමරේ ළඟ හක්කලං කරන්න පටන් ගත්තෝය. හැන්දෑවේ ඉතා නිස්සද්දව කාටත් හොරෙන් වගේ සිද්ධ වෙන මේ හමු වීම රාත්‍රී වන විට කාටත් ඇහෙන මහා ඝෝෂාවක් බවට පරිවර්තනය වුණේය.

සති දෙකක් ගත වන විට ඔවුන්ට මේ අලුත් බීම නැතුව බැරි වුණේය. ඉන් පසු අබ්දුල් මෙවැනි උපක්‍රමයක් යෙදුවේය.

'මලය කියන්ඩ අද මං නෑයි කියලා... නැත්තං මුං රොත්තම මගේ කාමරේ පැළ පැදියම් වෙන්ඩ ගන්නවා...'

මෙසේ දවස් කීපයක්ම අබ්දුල් ඔවුන් මුණ ගැසීම මඟ හැරියේය. තව දවස් කීපයක් යන විට සේදරාගේ යාළුවන්ට මේ හමු වීම අමතක වුණත් මේ බීම අමතක කරන්න බැරි විය. ඔවුහු වරින් වර අබ්දුල්ට වද කර සල්ලි දී, නැත්තං හුවමාරුවට වී, කුරහන්, අල, බතල, එළවළු වැනි දෙයක් දී රට බීම ගන්න කඩේට පැමිණියහ. අබ්දුල් හවස් වරුවේ පැයක කාලයක් තම ගබඩා කාමරය ඒ සඳහා වෙන් කළ අතර ඒ වෙලාවට පමණක් එතැනට එන ලෙස ඔවුන්ට නියම කළේය. එහෙත් දවස් තුනක් යන විට මේ පැයක කාලය කොහොමවත් මදි වූ බැවින් එක දිගට නොව වෙන වෙනම පැය බැගින් දවසකට පැය තුනක් වෙන් කරන්න අබ්දුල්ට සිදු විය.

The Reader's Place

මෙසේ තව මාසයක් යන විට මනිබඩුවලට වේගයෙන් මේ බීම අවසන් වූ බැවින් එතෙක් කල් දවස් පහළොවකට වතාවක් ගමට ආ ගොන් කරත්තය ඊට පසු දොළොස් දවසකට වතාවක් ලෙසත් අවසානයේ දහ දවසකට වතාවක් ලෙසත් ගමට එන්න සිදු විය. එපමණක් නොව හුවමාරුවට ගත් වී, කුරහන්, තල, මෙනේරි, හකුරු, මී පැණි වැනි ද්‍රව්‍ය තොග පිටින් කඩේ පිරෙන්නට වූ අතර ඒවා මඩකලපුවට පටවන්න සමහර දවසට එකවර ගොන් කරත්ත දෙකකට පවා එන්න කියන්න අබ්දුල්ට සිදු විය. මේ කරත්තයේ බැඳි ගොනා කෙතරම් මේ ගමනට පුරුදු වී සිටියේද යත් මඩකලපුවෙන් පිටත් වූ පසු කිසිම අණ දීමක් නැතිව පාර හොයාගෙන මේ ගමට එන්න ඌ පුරුදු වී සිටියේය.

ඒ වන විට සේදරා අබ්දුල් සමඟ හැම රාත්තිරියකම බෝතලයක් හිස් කරන්න පුරුදු වී සිටියේය. දිනක් අබ්දුල් නොහිටි දවසක ඔහුට අරක්කු බොන්න නොලැබුණු අතර එදා මුළු රෑම ඔහුට නින්ද ගිහින් තිබුණේ නැත. එපමණක් නොව එදා මධ්‍යම රාත්‍රියේදී ඔහුට සහලවා උණ ගත්තේය. මධ්‍යම රාත්‍රිය පහු වෙන විට ඔහු මේ උණෙන් කිටි කිටි ගා ගැහෙන්න වූ අතර අන්තිමේදී කළුවරේම ගඩබා කාමරය අවුස්සා බෝතලයක ඉතිරි වුණු අරක්කු ඩිංගක් කටේ හළාගැනීමෙන් පසුව ඒ ගැහිල්ලත්, උණ ගතියත් පහව ගොස් තිබුණේය.

හැම දවසකම ඔවුන් දෙදෙනාගේ සාදයට දඩ මසක් වැරදුණේ නැත. මීමින්නෙකු, හාවෙකු මුවෙකු, ඌරෙකු නැත්තං ගං කුකුළෙකුවත් හැමදාම ඔවුන් වෙනුවෙන් හට්ටියක තැම්බී සිටියේය. මේ දඩමස් සැපයීමේ වගකීම බාරව සිටියේ ටිකිරිය. හේනේ පැලේ බොහොම අල්පේච්ඡ ජීවිතයක් ගත කරමින් සිටි ටිකිරි හැම දවසකම මොනම හෝ මසක් සිය වැඩිමල් සහෝදරයාට ගෙනැවිත් දුන්නේය.

ගැනියෙකුටත් වඩා රහට උයන්න පිහන්න සමර්ථව සිටි ටිකිරි සමහර දවසක ඒ මස් පලහා ඔහුට එව්වේය. තවත් දවසක ව්‍යංජනයක් විදිහට සාදා එව්වේය. ටිකිරි කොයි කොහොම විදිහට මස් එව්වත් සේදරා එක කටු කෑල්ලක්වත් පහුවදාට ඉතිරි

The Reader's Place

කළේ නැත. ටිකිරිගේ මේ සංග්‍රහයට අබ්දුල් නොමසුරුව පෙරළා සංග්‍රහ කළේය. ඔහුට ඇති තරම් මුදල් දුන්නේය. ඔහුට උවමනා අඩුවැඩිය කඩෙන් ගෙන යන්න කීවේය. මාසෙකට වතාවක් හොඳ ඉණකඩයක්, උකුරු සළුවක් ටිකිරිට ගෙනැවිත් දුන්නේය.

අබ්දුල්ගේ මේ සියලු සංග්‍රවලට වඩා ටිකිරිගේ සිත් ගත්තේ දිනක් අබ්දුල් මඩකලපුවෙන් ඔහුට ගෙනත් දුන් තුවක්කුවයි. තුවක්කුව අබ්දුල්ගෙන් අරගත් දවසේ ටිකිරි හැසිරුණේ රටක් රාජ්‍යයක් ලබාගත්තාටත් වඩා සතුටිනි.

'මොකෝ බං උඹට හැමදාම කියල, සත්තු මරන්න පොරවයි කෙටේරියයි පාවිච්චි කරන්න පුළුවනෑ...'

තුවක්කුව ඔහුට දෙමින් අබ්දුල් එසේ කීවේය.

'හැබැයි උඹ මේක ප්‍රසිද්ධියේ පාවිච්චි කරන්න එහෙම එපා. මං හොරෙන් මඩකලපුවෙන් ගෙන්න ගත්තෙ. සුදු මහත්තුරු දැනගත්තොත් උඹයි මායි දෙන්නම වෙඩි තියල කම්මුතු කරයි...'

'නෑ.. මං උඹව අමාරුවේ දාන්නේ නෑ... මුදලාලි ...'

ටිකිරි සහතික වුණේය.

මෙතෙක් කල් හේන් ගොවියෙකු වූ ටිකිරි අබ්දුල්ගෙන් තුවක්කුව ලද දවසේ සිට වෙඩික්කාරයෙක් වුණේය. ඔහු හේන් ගොවිතැන අත් හැරියේය. එහෙත් හේනේ පැලේ ඉඳගෙන දඩයම් කරන්න පටන් ගත්තේය. මුලදී තම සහෝදරයාට විතරක් මීමින්නෙකු, ඌරෙකු, මුවෙකු මරා ගාතයක් දෙකක් යැවූ ටිකිරි ඉන් පසු මුළු ගමටම දඩමස් සම්පාදනය කරන්නා වුණේය.

වැඩිකල් නොගොසින්ම සේදරා බත්, කුරහන් කන එක අත් හැරියේය. වේල් තුනටම මස් කන්න පටන් ගත්තේය. දිනපතා අරක්කු බීම ඔහුගේ බඩජාරිකම කෙතරම් ඉහළ දැමුවේද යත් දවසක් ටිකිරි එවන ලද මස් හට්ටි දෙක මදි වී ඔහු මහ රෑ වෙරි මරගාතේ ටිකිරිගේ පැලට ගොස් දුමේ ගසා තිබූ අමු මස් ගාත් පිටින් අරගෙන ඇවිත් කෑවේය. කොහොමත් සේදරාගේ මස් කෑමේ තරමට ටිකිරිට උයන්න පිහන්න පුළුවන් වුණේ නැත. දවසට මස් හට්ටි දෙක තුනක් එව්වත් සේදරාට එය කොහොමවත් සෑහුණේ නැත. අනෙක් අතට ටිකිරිගේ පැලට ගොස් අමු මස්

කෑ දවසේ සිට මස්වල අමු ලේ රහට සේදරා හොඳටම වහ වැටුණේය. උයන පිහන මස්වල මේ ලේ රහ නැති බැවින් ඔහුට එය කොහොමටවත් හරි ගියේ නැත.

එබැවින් එදා සිට සේදරා අමු මස් කන්න පටන් ගත්තේය. එය කෙතරම් ඔහුගේ මන දොළ පිරවූයේද යත් කොතනක හරි ලේ රතු පාට දුටුවොත් ඔහු පුරුද්දට වගේ තොලකට ලෙවකන්න පටන් ගත්තේය. එබැවින් අබ්දූල්ට මනිබඩු කඩේ රතු පාට රෙදි, රතු පාට මාල, වළලු ඔහුගේ ඇස නොගැටෙන්න තබාගන්න සිදුවිය.

අරක්කු සහ මස් අතර ගැළපීම සේදරා කෙතරම් වෙනස් කළාද යත් මීට මාස කීපයකට කලින් සිහින් කෙසඟ මිනිහෙකු වූ ඔහු බලා ඉද්දීම ඌරු තඩියෙක් වගේ මහත් වෙන්න ගත්තේය. ඔවුන් සිටි කඩේ ගෙදර උළුවහු ඔහුට හැරෙන්ඩවත් මදි වූ බැවින් වඩුවෙක් කැඳවා ඒවා නැවත සාදවන්න අබ්දූල්ට සිදු විය. දවසක් මහ දවල් ඔහු සිය මව ගෝමරී බලන්න ඇගේ ගෙදරට ගිය වේලාවේ ඇ ක්ලාන්ත වී වැටුණාය. ඇ හිතුවේ හිටපු රාජසිංහ රජ්ජුරුවන්ගේ සෙන්පතියෙක් පුංචා උස්සගෙන යන්න ආවා කියාය. ඇත්තටම ඇගේ ලොකු පුතා ඇයට හීනෙන්වත් හිතන්න බැරි විදිහට ලොකු වී සිටි බැවින් ඇයව අඳුරගන්න බැරි විය.

මඩකලපුවේ සිට ගමට බඩු රැගෙන ආ කරත්තය සමඟ අබ්දූල්ගේ අත් උදව්කරුවන් දෙදෙනෙක් සෑම දවස් දහයකට සැරයක්ම ගමට පැමිණියහ. ඔවුහු හවස් වන විට ගමට ළඟා වී රැගෙන එන බඩු සියල්ල කඩේ පිටුපස ගබඩා කාමරයේ තැන්පත් කර ඊට පසුවදා උදේ පාන්දරම පිටත් වූහ. එහෙත් එක දවසක පිරිමි අත් උදව්කරුවන් දෙදෙනෙකු වෙනුවට එක් පිරිමියෙක් සහ එක් ගැහැනියක් අත් උදව්කරුවන් විදිහට පැමිණියහ. පසුවදා උදෑසන කරත්තයත් සමඟ පිරිමි අත් උදව්කරුවා පිටත් වූ අතර ගැහැනිය පිටත් වූයේ නැත. මේ සිදු වීම සේදරා විමතියට පත් කළේය.

අබ්දූල් මුදලාලි ඔහුගේ ඒ විමතිය දීර්ඝ වේලාවක් රඳවා තබාගන්න ඉඩ දුන්නේ නැත. කරත්තය ගුරු පාර දිගේ නොපෙනී ගිය විගස අබ්දූල් සේදරාට ඇයව හඳුන්වාදුන්නේය.

The Reader's Place

'මේ එළිසබෙත්... එයා දවස් කීපයක් මෙහේ ඉන්නවා අපේ වැඩවලට උදව් වෙන්ඩ...'

එළිසබෙත් මේ යෝධ මිනිහා දිහා උවමනාවෙන් බැලුවාය. ඇත්තටම ඇ එසේ බැලුවේ මෙපමණ යෝධ මිනිහෙක් ඇ මීට කලින් දැක නොතිබුණ නිසාය. එහෙත් සේදරා ඔළුව වනා ඇ දෙස බලා අහක බලාගත්තා විනා ඇයව තුට්ටුවකටවත් මායිම් කළේ නැත.

සිහින් සරාගී සිරුරකින් හෙබි එළිසබෙත් දිගැති ඇස් ඇත්තියක වූවාය. නාසය විද කරාබුවක් දමා සිටි ඇගේ දෙතොල් තමන්ට වඩා ලොකු විය. එක් වරම ඇගේ මුහුණ දුටු ගමන් අවධානයට ලක් වුණේ ඒ ලොකු දෙතොල් සහ දකුණු කනට පහළින් තිබූ කළු පැහැති කැළලය. කොහොමටත් එහෙමට ලස්සනක් ඇයගේ මුහුණේ තිබුණේ නැත. මූණේ හරි මැද තිබුණු තරමක් වක ගැසුණු නහය ඇගේ අවලස්සන පෙනුම තව ටිකක් වැඩි කළේය. ඇයට තිබුණේ කල්පනාහරිත මුදු පෙනුමකි.

ඇ අත් දෙකම පිරෙන්න වළලු දමාගෙන සිටියාය. ඇ නොදුටුවත් ඇ කොතැනක සිටින්නේද යන්න ඇගේ නිතර සෙලවෙන වළලුවලින් දැනගත හැකි විය. ඇ මොන ජාතියකට අයිතිදැයි කියන්න කාටවත් පුළුවන් වුණේ නැත. අබ්දූල් විටෙක ඇ සමඟ සිංහලෙන් කතා කළේය. තවත් විටෙක දෙමළෙන් කතා කළේය. ඒ හැර අරාබි භාෂාවෙන්ද ඔහු ඇය හා කතා කළේය. ඒ කොයි භාෂාවකින් කතා කළත් ඇ හොඳ පුරුදුකාරියක් වගේ හරි පහසුවෙන් ඒ හැම භාෂාවකින්ම පෙරළා උත්තර දුන්නාය.

එදා මුළු දවල් වරුවේම හුස්ම ගන්නවත් ඉඩක් පාඩුවක් නැතිව වගේ ඇ අබ්දූල්ගේ වැඩවලට උදව් කළාය. හැන්දෑවේ වැඩ අහවර වූ පසු අබ්දූල් සේදරා සමඟ කතා කර ඇයට ගබඩා කාමරයේ නිදන්න ලෑස්ති කරදුන්නේය.

කළුවර වැටෙන විට සේදරා අබ්දූල් සමඟ සුපුරුදු පරිදි සජ්ජායං වෙන්න පටන් ගත්තේය. ටිකිරි එවූ ලොකු ඌරු ගාතයක් ඔහු පසෙකින් තිබුණේය. සේදරා අමු මස් කන්න පටන් ගත් දවසේ සිට අබ්දූල් මස් කෑම නතර කර තිබුණේය. ඔහු අල බතල මයියොක්කා වැනි යමක් රෑට තම්බාගත්තේය.

සේදරා තරමකට වෙරි වන විට අබ්දුල් ගබඩා කාමරේ සිටි එළිසබෙත්ට එළියට කතා කළේය. ඈ රතු රෙද්දක් සමඟ සුදු හැට්ටයක් ඇඳගෙන ඔවුන් සිටි තැනට ලැසි ගමනින් ආවාය. රතු රෙද්ද දුටු මතින් සේදරා තොල කට ලෙව කන්න පටන් ගත්තේය. දවාලේ මහ මුඩුම මුඩු ගැහැනියක් විදිහට දුටු ඈය මෙවේලේ ඔහුට පෙනුණේ සුර දූතියක් විදිහටය. ඔහු ඇහිපිල්ලක් ගහන්නේවත් නැතිව වහා බමන මතින් වැනි වැනී හදිසියේ ප්‍රාදූර්භූත වූ මේ ස්ත්‍රී පරාණය දිහා බලාගෙන හිටියේය. අබ්දුල් කතා කළේය.

'සේදරා... මං උඹ නිසාමයි මේ ගැනි මඩකලපුවේ ඉඳන් ගෙන්නගත්තේ.. දැන් උඹට ඕන දෙයක් කරගනිං...'

ඉක්බිතිව අබ්දුල් මුදලාලි තව එක අරක්කු වඩියක් උගුරට හලාගෙන නිදාගන්ඩ ගියේය.

අමු මස් ගාතයක් කමින් වෙරිමතින් වැනි වැනී සිටි මේ යෝධ මිනිහා දිහා එළිසබෙත් බලාගෙන හිටියේ සිය දිගටි ඇස් තවත් දික් කරමිනි. මොහොතක් ළත වෙවී ඔහු දිහා බලාගෙන සිටි ඈ ඊළඟ නිමේෂයේදී ඔහු ළඟින් ඉඳගත්තාය. පසුව අබ්දුල් මුදලාලිගේ හිස් වීදුරුව ගෙන එය පිරෙන්න අරක්කු වත් කර ගත්තාය. එය එක හුස්මට බීගෙන බීගෙන ගියාය. පසුව තවත් වීදුරුවක් පුරවාගත්තාය. එයත් බීගෙන බීගෙන ගියාය. ඉක්බිතිව කාරා කෙළ ගසා කට පිහදාගෙන ඔහුගේ ඔඩොක්කුවට පැන්නාය.

කිසිම දවසක ගැහැනු සිරුරක ස්පර්ශය නොලද සේදරාගේ සිරුර එක් වරම ගිනි ගත්තේය. ඔහුට වෙරි හිඳුණා වගේ දැනුණේය. ඒ නිසා ඔහු වීදුරුව පැත්තකට විසි කර අරක්කු බෝතලය කටේ තියා බීගෙන බීගෙන ගියේය. පසුව සිය යෝධ සිරුර මත තෙරපුණ ඒ සිහින් සරාගී සිරුර අත් දෙකම එක් කර බදා වැළඳ ගත්තේය. ඇගේ ඇටකටු කිටි කිටි ගා ඔහුගේ යෝධ සිරුරට පොඩි වෙද්දී ඔහු බමන මතින් මෙසේ කෙඳිරි ගාමින් සිටියේය.

'උඹ දෙයියෙක් අබ්දුල්... උඹ දෙයියෙක්...'

එදා සිට සේදරාට අරක්කු බෝතලයත්, මස් ගාතයත් සමඟ ගැනියෙකු නැතිව බැරි විය. අබ්දුල් මුදලාලි හැම දවස් දහයකට වතාවක් ගමට එන ගොන් කරත්තයෙන් අලුත් ගැනියෙක් සේදරාට ගෙනත් දුන්නේය.

මෙසේ සිව් මසක් ගිය තැන සේදරා එකිනෙකාට වෙනස් ගැනු දොළොස් දෙනෙකු සමඟ නිදිවැදී තිබුණේය. දවල්ට මේ හැම ගැහැනියක්ම මහා කැත මුස්පේන්තු, මුඩු ගැහැනු විදිහට ඔහුට පෙනුණේය. ඇත්තටම ඒ වෙලාවට ඔහු හිතුවේ මේ ගැනිත් එක්ක නිදිවදින මිනිහා මොකාද කියාය. එහෙත් හැම රෑකම ඔහුට මේ ගැනු සුර දූතියන් වගේ පෙනුණේය. ඔවුනට සම කළ හැකි වෙන කිසිම ගැහැනියක් ඔහු මේ මඟුල් සක්වළ තුළ නොදුටුවේය. ඔහුගේ යෝධ සිරුරට ඒ හැම ගැහැනියකගේම ඇටකටු පොඩි වන විට නැගෙන කිටි කිටි හඬ නැවත නැවත අහන්න ඔහුට උවමනා වුණේය. බමන මත වැඩි වෙන තරමට ඔහුට ඒ හඬ වඩා හොඳින් ඇහුණේය. ඒ නිසා ඔහු වැඩි වැඩියෙන් බීවේය. ඒ එක්කම හැම දවසකම මධ්‍යම රාත්‍රිය පහු වෙනතෙක් දහ දොළොස් වතාවක් ඒ ඇටකටු පොඩි වෙන හඬ අහන්න ඒ ගැනිගේ ඇඟ උඩ තැංගේය.

මෙසේ සිව් මසක් ගිය තැන සේදරාට මේ ගැනු සෙල්ලම ඇති වුණේය. අබ්දුල් ගෙනත් දුන් දහතුන්වැන්නාගේ අහින්වත් අල්ලන්නේ නැතිව ඔහු ඇයව ආපහු පිටත් කළේය. දහතරවැන්නා ඇත්තටම ලස්සන වුණත් සේදරා ඈ දිහාවත් නොබලා ප්‍රතික්ෂේප කළේය. ඊළඟ කරත්තයෙන් දාහතරවැන්නා පිටත් කළ දා හැන්දෑවේ සේදරා අබ්දුල්ට මෙසේ කීවේය.

'අබ්දුල් මුං එකෙකුටවත් මං කැමති නෑ... මුං එක්ක නිදි වදින කොට මටම මං ගැන අප්පිරියා හිතෙනවා. උඹට පුළුවන් නං අර පළවෙනි ගෑනි එළිසබෙත්ට ආපහු එන්න කියහං...'

ඊට දවස් දහයකට පසු පැමිණි කරත්තයෙන් එළිසබෙත් ආපහු ගමට ආවාය. එහෙත් තවත් දවස් දහයකට පසුව ආපහු පැමිණි කරත්තයෙන් ඈ පෙරළා ගියේ නැත.

'මං කැමතියි ඒකිට.. ඒකි කැමතිනං.. මාත් එක්ක ඉන්ඩ කියන්ඩ...' සේදරා අබ්දුල්ට කීවේය.

ඔහු තරමට තම ඇටකටු ඒ යෝධ සිරුරට කිටි කිටි ගා පොඩි වනු දැකීම ජීවිතයේ පරම සුවය යැයි තේරුම් ගත් එළිසබෙත් නම් නගර සෝභනිය සේදරා නම් මත්ලෝලී සල්ලාලයාගේ ඇඹෑණිය බවට පත් වූයේ එසේය.

The Reader's Place



The Reader's Place

10

ඉංග්‍රීසි පාලනයට විරුද්ධව රටේ හැම තැනම කැරැල්ලක සේයා මතුවෙද්දී ආරච්චිල නොසන්සුන් වෙමින් සිටියේය. ඔහුට අණ දුන් ඔහුගේ ඉහළ නිලමක්කාරයන් වූ අතුකෝරාළලාත්, කෝරාළලාත්, එතතින් එහා දිසාවේ හෙවත් රටේ මහත්තයාත් එළිපිට ඉංග්‍රීසි ආණ්ඩුවට පක්ෂ විදිහට වැඩ කළත් හදවතින් මේ කැරැල්ලේ නියමුවන්ට සහයෝගය දෙමින් සිටියහ. ආරච්චිලත් ඒ පිළිවෙතම අනුගමනය කළ අතර ඔහුට මඳ සහනයකට තිබුණේ වෙල්ලස්සේ කැළෑ මායිමේ හැංගුණු මේ ගම ලෝකයට ලොකුවට අනාවරණය නොවීමය.

The Reader's Place

එහෙත් ආරච්චිල නොසන්සුන් වෙමින් සිටියේ ඉංග්‍රීසි ආණ්ඩුවට එරෙහිව රටේ ගොඩ නැඟෙන මේ කැරැල්ල නිසාම නොවේ. ඔහු ඔහුගේ හිතෙන් තවත් ලොකු කැරැල්ලක පැටලී සිටියේය. මාස ගාණක් මෙසේ තම හිත සමඟ නොනැවතුණු අරගලයක යෙදුණු ඔහු අවසානයේදී අටසිය දාහත අවුරුද්දේ නිකිණි මාසයේ තම පුතු වූ පොඩි නිලමේට එහා ගමේ ආරච්චිලගේ දුව වූ කරලිනාව ගේන්න තීන්දු කළේය.

මේ පෞද්ගලික කැරැල්ලේ තමන්ගේ ප්‍රධාන සතුරා වූ වල්ලිට මුහුණ දීමට ආරච්චිල සැබවින්ම බිය වුණේය. ඔහු ඇගේ

පුළුවන්කාරකම දැන සිටියේය. තමන්ගේ මව මිනී වළෙන් ගොඩගත් තැන් පටන් ඇ පිළිබඳව ගමේ අතන මෙතන හුවමාරු වූ හැම කතාවක්ම ඔහු අසා තිබුණේය. එහෙත් මේ ගමේ තීන්දු තීරණ ගන්නා ප්‍රධානියා වූ තමාට ඇ අභියෝග කරන්නේ කෙසේද? අනෙක මෙවැනි දෙවියන් ආවේශ වෙන නෝන්ජල් හොරිකඩ ගෑනියෙකුට තම ආරච්චිල පරම්පරාවේ ඊළඟ දරුවා වදන්න බාර දිය හැකිද? එය එසේ වුවහොත් තම කිරි අත්තාගේ සිට මුතුන් මිත්තන් හැමෝම සිය මිනී වළවල් මතින් නැඟිට තමාට සාප කරන වින්තිය ඔහු සහසුද්දෙන්ම දැන සිටියේය.

ඇත්තටම සිය කිරි අත්තා ඔහු හීනෙන් දැක තිබුණේය. වල්ලීගේත් පොඩි නිලමේගේත් විවාහයට කිරි අත්තා පැමිණි අතර ඔහු ඒ දෙපළට ආශිර්වාද කර යන්න ගියේය. මඟුල් දවස දා රෑම වල්ලී පොඩි නිලමේට දාව දරුවෙක් වැදුවාය. පරම්පරාවේ සියල්ලෝම කෙතරම් ප්‍රීතියට පත් විද යත් සිය මිනී වළවල්වලින් නැඟිට දරුවා බලන්න වලව්වට පැමිණියහ. ඔවුන් පැමිණෙන විට වල්ලී සිය කුසින් වැදූ ඌරු පැටියෙකු හුරතල් කරමින් සිටියාය.

සියල්ලෝ විස්මයට පත්ව එකිනෙකාගේ මූණු බලද්දී වල්ලී ඌරු පැටියා වඩාගෙන ඉස්සරහට ඇවිත් සියල්ලන්ටම කිව්වේ මේ ඊශ්වරයා පරදා මලය රජු ලංකාවට ගෙන්වීමේ වගකීම බාරගත් රාහු අසුරේන්ද්‍රයා බවය. එසේම ඒ රාහු අසුරේන්ද්‍රයා විෂ්ණු දෙවියන්ගේ දස අවතාරවලින් එකක් වන දියෙන්, ගින්නෙන්, ආයුධයෙන් සහ හීයෙන් නොනස්නා බලයක් ඇති ඌරු අවතාරයට පත්ව සිටින බව ඇ හෙළි කළාය. එවිට සියල්ලන්ම ප්‍රීති ප්‍රමෝදයට පත්ව අත්පුඩි ගසන්නට පටන් ගත් අතර ඒ හඬට කලබල වී ඌරු පැටියා වල්ලීගේ ඇකයෙන් එළියට පැන්නේය. ඉන් පසු රාහු අසුරයා මලය රජුගේ නන්දන උයන විනාශ කළ විදිහට හතර අත දෙවනත් කරමින් විශාල ගස් පෙරළා පස් හාරා බිත්ති කඩා බිඳ දමා වහලවල් බිමට සමතලා කරදමා මුළු වලව්වම විනාශ කර දැම්මේය. ඉක්බිතිව පස් හාරා මතු වුණ මඩ වගුර යට කිරි අත්තා ඇතුළු සියලු මුතුන් මිත්තන් නැවත වළලා දමා යළි වල්ලීගේ ඇකයට පැන හුරතල් වෙන්න ගත්තේය.

මේ භයානක හීනයෙන් පසුව සිය ආරච්චි පරම්පරාව සිය පුතණ්ඩියාගෙන් අවසන් වනු දකීමට අකැමැති වූ ආරච්චිල ඔහු වල්ලිට නොදෙන්න ඒකමතිකව තීරණය කළේය.

ඔහු වහා එහා ගමේ ආරච්චිලගේ ගෙදරට ගොස් මඟුලට දින වකවානු තීන්දු කරගත්තේය.

සිය පියා මේ කතා බහ සඳහා එහා ගමට ගිය දවසේ පොඩි නිලමේ වල්ලීගේ ගෙදරට ගියේය.

ඇගේ ගෙදර එහා මෙහා තාවර වෙච්ච බොරු කතා කිය කියා නියමිත කාරණයට බහින්න පොඩි නිලමේ කල් යල් බලන විට වල්ලී කිසිම කලබලයක් කේන්තියක් නැතිව මෙසේ කීවාය.

'මං දන්නව ඔක්කොම...'

'දැන් ඉතිං අපි මොකද කරන්නේ...'

'මුකුත් නෑ...'

වල්ලී සිනාසෙමින් කීවාය.

'මුකුත් නෑ...?'

'ඔව්...! මුකුත් නෑ...'

'ඒ කියන්නේ මට ඒ ගෑනි ගෙදරට ගේන්ඩ කියලද කියන්නේ...'

'ඔව්...'

ඇගේ ඒ හරි කෙළින් තනි උත්තරෙන් ඔහු පුදුමයට පත් වුණේය.

'ඒ කියන්නේ උඹ මට ආදරේ කළේ බොරුවට... මේ ගෙදර මෙච්චර දවස් මාත් එක්ක නිදිවැදුණේ කිසිම හැඟීමක් නැතිව...'

ඇ කිසිවක්ම නොකියා නිශ්ශබ්දව සිටියාය. එහෙත් ඔහු දිගටම කතා කළේය.

'මයේ අප්පුච්ච අද අර මිනිස්සුත් එක්ක කතා කරල තීරණයක් ගන්නවා... ලබන සතියේ බාග වෙලාවට මට ඒ ගෑනි අපේ ගෙදරට ගේන්ඩ වෙනවා. ඇහැටවත් හරියට නොදකපු ගෑනියෙක් එක්ක මට නිදිවදින්ඩ බෑ...'

ඒ දීර්ඝ පැහැදිලි කිරීම අවසානයේ ඔහු මෙසේද එයට එකතු කළේය.

The Reader's Place

'අපි වෙන ගමකට පැනල යං... මේ කැරැල්ලේ උණුසුම අස්සේ අප්පුච්චට උනත් අපි හොයාගන්න පුළුවන් වෙන එකක් නෑ...'

ඈ එකහෙළාම එයට විරුද්ධ වුණාය.

'මේ ගම මං ඉපදිච්ච ගම... සුද්දො ඇවිත් පෙති ගැහුවත් මං මැරෙන්නේ මෙතන... මට මේ ගම දාල යන්ඩ බෑ. ඔයා ඒ ගැනිව ගෙදරට ගේන්ඩ...'

තව වචනයක්වත් නොකියා පොඩි නිලමෙ යන්න ගියේය. ඔහු කැළෑ පාර දිගේ ඈතට නොපෙනී යන තෙක්ම ඈ කිසිම හැඟීමක් නැතිව ඔහු දිහා බලා සිටියාය.

ඊට දෙසතියකට පසු පොඩි නිලමේ එහා ගමේ ආරච්චිලගේ දුව කරලිනා ගෙදරට කැන්දගෙන ආවේය.

එය අහල ගම් හතකටම දැනුම් දුන් ලොකු මඟුලක් විය. කැරැල්ලේ උණුසුම ඌව වෙල්ලස්ස සිසාරා පැතිර යද්දී වුවත් ආරච්චිලගේ ඉහළ නිලමක්කාරයන් වූ කෝරාළලා දිසාවේලා බැහැයි නොකියා මඟුලට පැමිණියහ. අනෙක් අතට ආරච්චි වසම් දෙකක මඟුලක් වූ නිසා සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වය හොඳටම වැඩි විය. ගම් දෙකේම ගැමියන්ට මෙය කාලෙකින් දැක ගත නොහැකි මහ විශාල මඟුලක් වූ බැවින් බොහෝ ගැමියන් මඟුල් ගෙදරට ආවේ තම පොඩි ඇයොන්ට ලොකු මඟුලක් පෙන්වන්න උන් ඔක්කෙ ගහගෙනය. ඇඟිල්ල දික් කර කර ඔවුහු තම පොඩිවුන්ට මඟුල් ගෙදර ගොක්කොළ ඇතුළු අරුමෝසම් සැරසිලි පෙන්වූහ.

ආරච්චිලට තම ඉහළ නිලමක්කාරයන්ගෙන් කෙතරම් තෑගි බෝග ලැබුණත් වඩා වටිනාම තෑග්ග ලබාදුන්නේ අබ්දුල් මුදලාලි විසිනි. ඔහු මඟුල් ගෙදරට පැමිණි සියලුම අමුත්තන් වෙනුවෙන් කරත්තයක් පිරෙන්න අරක්කු බෝතල් පටවා යැව්වේය.

මඟුල් ගෙදර මද්‍යසාරවල කිසිම අඩුවක් තිබුණේ නැත. සමහරු මඟුල් ගෙදරදී අරක්කු කටේ තිබ්බෙ ප්‍රථම වතාවටය. හොඳට රා බී පුරුදු සමහරෙක් ඒ විදිහටම අරක්කු බොන්න ගොස් පැය බාගෙ යන විට බිම වැටී නන් දොඩවමින් සිටියහ.

අබ්දුල් මුදලාලිගේ කඩෙන් හොර අරක්කු බී පුරුදු සමහරු මඟුල් ගෙදරදී බීවේද කාටත් හොරා හොර රහසේය.

එහෙත් මේ කිසිවකුට සේදරාගේ බීමත් එක්ක අලගු තියන්නවත් පුළුවන්කමක් තිබ්බෙ නැත. සේදරා වෙනම අමු මස් ගාත් කීපයක් තමුන් වෙනුවෙන් ටිකිරිට කියා ගෙන්වාගෙන තිබුණේය. කළුවර වැටෙන විට හැම දෙනාගේම අවධානය අමු මස් කමින් සීමා රහිතව අරක්කු බොන මේ යෝධ මිනිසා වෙත යොමු විය. එවේලේ තමුන් සමඟ තරගෙට බොන්න පුළුවන් අයට ඔහු තමා ළඟට ආරාධනා කළේය. ඔහුගේ තරම දන්නා කිසිවෙක් ගමෙන් ඉදිරිපත් නොවුණු නමුත් අවට ගම් කීපයක සිව් දෙනෙක් ඔහුගේ අභියෝගය බාරගෙන තරගයට අවතීර්ණ වූහ.

සිව් දෙනා මුලින්ම එක අරක්කු බෝතලය බැගින් බොන්න පටන් ගත්හ. ඒ පළමුවෙනි වටය අවසන් වෙන්නත් මත්තෙන් එක තරගකරුවෙක් ඉවතට විසි වුණේය. ඉතිරි තිදෙනා තව බෝතල් දෙකක් අවසන් වෙන තුරු එකට තරග කළෝය. ඉන් පසු තවත් එකෙක් ඉවතට ගියේය. අන්තිමට ඉතිරි වුණේ සේදරාත් එහා ගමේ ලමින්දුවාත්ය. සේදරා වගේ හොඳ හැඩි දැඩි මිනිහෙකු වූ ලමින්දුවා පරාජය බාරගන්න කිසිසේත් කැමති නොවූ අතර ඒ නිසා බෝතල් අටක්ම ඉවර වෙන තුරු තරගය දිගට ඇදුණේය. නමවෙනි බෝතලය ආරම්භයේදීම ලමින්දුවා ඇදගෙන වැටුණු අතර ඔහු පියවි සිහියට පත් වෙන විට බෝතල් තුනකට වඩා අරක්කු ආපහු වමනය කර තිබුණේය. අන්තිමට කිසිම අභියෝගයක් නැතිව සේදරා ජයග්‍රහණය කළේය.

බෝතල් නමයෙන් නොනැවතුණු ඔහු එදා සාදය අවසන් වන විට බෝතල් දහතුනකුත් තව තුන් කාලක අරක්කු සිය යෝධ ශරීරය තුළට අවශෝෂණය කරගෙන තිබුණේය.

හොඳටම වෙරි වන විට ඔහු එළිසබෙත්ට ළඟට කතා කළේය. ඇගේ ඇඳුම් ගලවා දමමින් ඔහු ලෑස්ති වුණේ ඈ සමඟ නිදිවදින්නය. හොඳටම වෙරි මතින් සිටි ඔහුට මේ කොහෙද කොතැනද කියා තිච්චියක් තිබුණේ නැත. මෙතැන මහ සෙනඟක් සිටි බවට හැඟීමක්වත් ඔහුට තිබුණේ නැත. ඔහුට උවමනා වූ

The Reader's Place

එකම කාරණය එළිසබෙත්ගේ ඇඟ උඩ නැඟ ඔහුගේ යෝධ ශරීරයේ බරට ඇගේ ඇට කටු පොඩි වෙන හඬ අහන එක විතරය. තත්ත්වයේ තරම තේරුම් ගත් විගස අබ්දුල් වහා ඔහු කුදලාගෙන කරත්තයට පටවන්න උත්සාහ කළේය. තුන් හතර දෙනෙකු එක් වුණත් ඔවුන්ට සේදරා උස්සන්න පුළුවන් වුණේ නැත. අන්තිමට මඟුල් ගෙදර සිටි තරුණයන් විසි දෙනෙකුගේ උත්සාහයෙන් ඔහුව කරත්තයට පටවන්න අබ්දුල් මුදලාලිට හැකි විය.

කරත්තයේ උඩුබැලි අතට වැතිරී ගෙදර යන ගමන් ඔහු මෙසේ මුමුණණ හඬ ඇසුණේය.

'උඹ දෙයියෙක් අබ්දුල්... උඹ දෙයියෙක්...'

මධ්‍යම රාත්‍රිය ආරම්භයේ සියල්ලන්ම නික්ම ගිය පසු වලව්වේ අයිතිකාරයෝ සැනසුම් සුසුම් හෙළූහ. ආරච්චිල සිය බිරිඳ බිසෝ මැණිකා දිහා බලා කීවේ මෙවැනි මහා සෙනඟක් සිටි මේ තරම් මිනිසුන් විනෝද වුණ මඟුලකට තමන් උපන්තේකට නොගිය බව බොහෝ කෝරාළවරුන් දිසාවේවරුන් තමන්ට කී බවය. එසේ බොහෝ අය වර්ණනා කළ මේ මංගල්‍යය, තමාගේ ගෙදර, තමාගේ අණසක පිට තමන්ගේ මිනිසුන් ඉදිරිපිට පවත්වන්නට ලැබීම තරම් සතුටක් මේ දෙමහල්ලන්ට තිබුණේ නැත.

දෙන්නා දෙමහල්ලන්ගේ මේ අපරිමිත සතුටේ නිමිත්ත වූ පොඩි නිලමේත් කරලිනාත් ඒ වන විට හොඳටම තෙහෙට්ටු වී සිටියහ. ආරච්චිලත් බිසෝ මැණිකාත් තව සාද කතා ලතා පවත්වමින් එකිනෙකාගේ සතුට හුවමාරු කරගනිද්දී පොඩි නිලමේත්, කරලිනාත් ඇතුළු ගෙට ගියහ.

දෙදෙනා දෙදෙනාගේ අතින්වත් හරියට අල්ලා නොතිබුණ නිසා දෙදෙනාට දෙදෙනා ගැනම දැනුණේ ආගන්තුක හැඟීමකි. දෙදෙනා දෙදෙනාම දිහා බලා සිනාසුණු අතර අනෙකා සමඟ කුමක් කතා කළ යුතු දැයි දෙදෙනාටම හැඟීමක් තිබුණේ නැත.

එහෙත් අවසානයේ ගැහැනු නුවණ වඩා තීක්ෂණ නිසාත්, මුළු දවසම කිසිම විවේකයක් නැතිව තෙහෙට්ටුවෙන් සිටි නිසාත් ඔහුට මෙසේ කියන්නට ඇයට පිළිවන් විය.

'නිදාගන්න කල[illegible] යොදාගත්ත නං හොඳා...'

'දන් හුඟක් රෑ වෙලා වතුරත් හොඳටම සීතල ඇති...'

'කමක් නෑ... අපි දෙන්නම යං ළිඳ ළඟට...'

ඇ සිනාසී ඔහුට ආරාධනා කළාය. හිතුවාට වඩා ඇ ප්‍රියමනාප බව පොඩි නිලමේට හැඟුණේය.

දෙදෙනා මඟුල් ඇඳුම් ගලවා දමා සැහැල්ලු ඇඳුම් හැඳ හුළු අත්තක් පත්තු කරගෙන ළිඳ ළඟට ගියහ. ඇ ළිං පඩියට බහින අතර ඔහු ගොඩට වී හුළු අත්ත ඇ දිහාට අල්ලාගෙන සිටියේය. තන මත්තක් වැහෙන්න දිය රෙද්දක් හැඳ සිටි ඇගේ සැබෑ රූපය ඔහු දුටුවේ එවිටය. ඇ එහෙමට ලස්සන නොවුණත් ඔහු ඇගේ රූපයේ ලස්සන තැන් හොයන්න ඒ කළුවරේ හුළු අතු එළියෙන් උත්සාහ කරමින් සිටියේය.

'කරලිනා බය නැද්ද කළුවරට...'

ටික වේලාවක් දෙබසක් නැතිව ගත වුණ නිසා ඔහු එසේ ඇසුවේය. එයට උත්තර දෙන්න ඇ ඔහු දෙස හැරී බලන විට ඇගේ වපරය හොඳට පැහැදිලි වුණත් ඇගේ තොල් ලස්සන බව ඔහු හිතුවේය. ඇ සිනාසෙමින් උත්තර දුන්නාය.

'නෑ.. මං බය මහ දවල්ට...'

'ඇයි දවල්ට බය...'

'ඇඟ කළු වෙනවට...'

දෙදෙනාම සිනාසුණහ. ඒ දෙදෙනාම එකවර හයියෙන් හිනාවුණ පළමු වතාවයි. එසේ හිනාවෙන අතර කොහොමටත් කළු වූ ඇයට තවත් කළු වෙන්න දෙයක් ඉතිරි වී නැති විත්තිය ඔහු තේරුම් ගත්තේය. එහෙත් ඒ කළු පැහැයෙහි අමුතු සරාගී කාමුක බවක් ඔහුට දැනුණේය.

ඇ අපහසුවෙන් ළිඳෙන් වතුර අදින විත්තිය තේරුම් ගත් ඔහු හුළු අත්ත ගස් කරුවක ගසා ළිං පඩියට බැස්සේය.

'ඉන්න මං වතුර අරන් දෙන්නං...'

ඇ 'හා' හෝ 'එපා' හෝ කියන දෙකම කීවේ නැත. ඒ වෙනුවට නිහඬව ඔහුට ඒකට ඉඩ හළේය. ඇ වතුර ඇඟට වත්කරගන්නා විට ඔහු ළඟ ඉඳගෙන ඒ දෙස බලා සිටියේ...

The Reader's Place

ඇඟ දිගේ බේරෙන වතුරට දිය රෙද්ද කිටි කිටියේ ඇඟට ඇලුණු අතර ඇගේ ළා තන පුඩු වතුරේ සැරෙන් බෙරී උඩ බලා ඉන්න දඟලන අයුරු ඔහු දුටුවේය. ඇඟ අතුල්ලන්න බිමට නැමෙන විට ඇගේ පිරුණ නිතඹ තෙත රෙද්දේ ඇලුණ විට පෙනුණේ නිරුවතින් හිටියා වගේය. එක් වරම ඈ පය ලිස්සා වැටෙන්න ගියාය. ඔහු වහා සිය දකුණත දික් කර ඈ අල්ලාගත්තේය. ඈ ඇදී ඇවිත් ඔහුගේ ඇගේ වෙළුණාය. එවිට ඇගේ සිරුර පුරා විසිරුණ සීතල වතුර ඔහුගේ ඇගේ තැවරුණේය. ඔහුට සීතල දැනිණි. ඒ සීතල පරයා ඔහුගේ සියොලඟම ගිනියම් වෙමින් යන බව ඔහුට දැනුණේය. ඔහු වහා ඈය පපුවට තද කරගත්තේය. ඈය පූස් පැටවෙකු වාගේ ඔහුට ඉඩ දී ඔහුගේ පපුවට හිර වී සිටියාය. ඈ තවත් තද වී ඔහුගේ සිරුරට තෙරපෙන විට තමාගේ සිරුර මෙන්ම ඇගේ සිරුරද ගිනියම් වී ඇති බව ඔහුට දැනුණේය.

'අපි යං ඇතුළට...' ඔහු කීවේය.

ඇඟ ඇතුළේ බුරා බුරා දළුලන ගින්න සීතල වතුරට සිහිල් වේ යැයි බියෙන් ඉන් පසු දෙදෙනාම යන්තම් වතුර දෙක තුනක් විතරක් ඇඟට දාගෙන ඇතුළු ගෙට ගියහ.

යන්තම් සොළොස් විය ලැබූ නොඉඳුල් කන්‍යාවියකගේ ප්‍රථම රාත්‍රිය එලෙස එළඹ තිබුණේය. කරලිනා තවමත් පිස නොදැමූ තෙත වතුර බිඳු ඇගේ තියෙද්දී ඇඳට ගොඩ වුණාය. හිතේ දළුලන ගින්න යන්තම් හෝ සිහිල් කරගෙන ඔහුගෙන් වසන් කරගන්න සාම්ප්‍රදායික පතිනියක සේ ඈයට ඕනෑ වූ නිසා ඈය ඇගේ තෙත වතුර බිඳු පිස නොදැමුවාය. එහෙත් පොඩි තිලමේට සිය ඇඟ ඇතුළේ දළුලන ගින්න යන්තමවත් සිහිල් කරගැනීමේ උවමනාවක් නොතිබූ නිසා ඔහු හොඳට ඇඟ පිහදාගත්තේය.

ඈය ඇඳ විට්ටමට හේත්තු වී ඔහු දිහා බලා සිටියාය. පාන් එළියට ඇගේ මුහුණ හොඳට පේන විදිහට ඔහු ඇඳේ අනෙක් කෙළවරින් ඉඳගත්තේය. ඇඳේ දෙකෙළවර සිටි දෙදෙනා පියවරින් පියවර එකිනෙකාට ළං වූහ.

එහෙත් එක් වරම ඇඟ සලිත වී ගිය විදුලියක් පරිද්දෙන් මේ තමා ඉදිරිපිට සිටින්නේ මීට මොහොතකට කලින් ළිඳ ළඟදී

තමා වැළඳගත් ගැහැනිය නොව පුළුපු ගඳ ගහන යකිනියක යැයි ඔහුට සිතුණේය. ඔහු නැවතුණේය. හිස දෙපැත්තට සැලුවේය. මේ එක් වරම හිතට ආ මනස්ගාතය මොකක්දැයි ඔහු මොහොතකට ඇස් පියාගෙන හිතුවේය. මේ ගැහැනියගේ සිරුර අරභයා තමාගේ සිරුර මීට ටික වේලාවකට පෙර ගිනියම් වී තිබූ බවත්, එය සත්‍ය වශයෙන්ම සත්‍යයක් බවත් ඔහු තේරුම්ගන්න උත්සහ කළේය.

ඔහු යළිත් ඇස් ඇරියේය. එවිට ඇගේ මුවේ දික් වුණු දත් දෙකක් සමග ඇස් රතු වී ඇති බව ඔහු දුටුවේය. එපමණක් නොව දරුණු පුළුටු ගඳක් ඇගෙන් වහනය වූ අතර ඒ කුයිලය ඉවසා ගන්න බැරුව ඔහු නහය වසාගත්තේය. එවිට ඇඟ සලිත කරගෙන වගේ ඈ ඔහුගෙන් ඈත් වෙනු ඔහුට දැනුණේය. ඒ සමගම ඈ දොඹ ගෙඩි වන් ඇස් පියාගන්නවා ඔහු දැක්කේය. යළි හිස දෙපැත්තට සලා මෙය කමකට නැති හිතේ මනස්ගාතයක් බව ඔහු නැවත වරක් තම හිතට තදින් දැනුම් දෙන විට ඇගේ කට හඬ විශ්වයේ ඈත කෙළවරකින් වගේ ඔහුට ඇහුණේය.

'මට බයයි... මට ඔය ඇත්තො යකෙක් වගේ පේනවා...'

ඔහු තිගැස්සී ඈ දිහා බැලුවේය. ඈ පිළිබඳව තමාගේ හිතට ආ සිතිවිලි ඈ කියන්නේ කොහොමද?

'මොකක්ද කිව්වේ...' ඔහු නැවත ඇසුවේය.

'ඔය ඇත්තො යකෙක් වගේ මට පේනවා......'

ඈ ඇත්තටම බියෙන් සැලුණාය. ඔහු එය දුටුවේ ඈ ඇත්තටම ඇස් යක්ෂණියක් ඇඟ සලිත කරන විදිහටය. ඈ ඇත්තටම ඇස් අදහාගත නොහැකිව සිටියාය. එය ඔහු දුටුවේ යක්ෂණියක් සිය දොඹ ගෙඩි වන් ඇස් නටවන විදිහටය. අනෙක් අතට ඔහු ඈ තුළ දකින මේ දර්ශනය මේ විදිහටම ස්ත්‍රී පුරුෂ බව විතරක් මාරු වී ඈ ඔහු තුළද දකිමින් සිටියාය.

'කරලිනා... මටත් උඹව පේන්නේ ඒ විදිහට...'

'බොරු... ඒක අමූලික බොරු... මං අහිංසක ගෑනියෙක්... ඒත් මං ඉස්සරහ ඉන්නෙ යකෙක්... දත් දික් වෙලා, නියපොතු දික් වෙලා... ඇස් රතු වෙලා... වසම වස ගඳයි....'

The Reader's Place

ඈ එසේ කියමින් පස්සෙන් පස්සට ගොස් ඇඳෙන් බිමට වැටුණාය. ඈ මේ කියන සියල්ල ඔහු ඈ කෙරේ දුටු බවත්, ඒ සියල්ල ඔහුට ඈ කෙරෙන් දැනුණු බව සත්‍යයක් වුණත්, යක්ෂණියක් වගේ ඈ එය කී විදිහට ඔහුට හොඳටම කේන්ති ගියේය. ඔහු වියරුවෙන් කැරකී අඩි පොළොවේ ගසා ඈගේ කෙස් වහල්ලෙන් අල්ලා ඈතට විසි කළේය.

'පට්ට පඳුරු වේසී... තෝ ඔහොමද බොල කතා කරන්නේ තොගෙ මිනිහට... තෝ මං කවුරු කියලද බොල හිතං ඉන්නේ...'

ඈ විසි වී බිම වැටුණු තැනින් නැගිට පියවර දෙක තුනක් ඉස්සරහට ඇවිත් ඔහුගේ කම්මුලට ගැසුවාය. කාමරේ බඩු මුට්ටු පෙරළගෙන ඔහු විසි වී බිම වැටෙන අතර ඈ මෙසේ කීවාය.

'තෝ යකෙක් බොල.. තෝ මට යකින්නි කියන්නේ තොට පිස්සු වැහිලද...?'

ඊළඟ ක්ෂණයේදී කරලිනා ඇඳ උඩට නැංගාය.

'ඇහුණද බොට... තෝ යකෙක් උණාට මං තොට යටත් වෙන ගෑනියෙක් නොවෙයි...'

'කට වහපිය යකින්නි....'

ඔහු වැටුණු තැනින් නැගිට ඇඳ උඩ සිටි ඈගේ ඇඟ උඩට පැන්නේය. ඉක්බිතිව යක්ෂාවේශයෙන් උනුනුන් මරාගත් කාලයක් ගත විය.

මේ භයානක පොර බැදිල්ලේදී එකිනෙකා තුළ තිබුණු ජවය කෙතරම්ද යත් වරක් පොඩි නිලමේ බඩ පිනුමක් ගසා ඈගේ බොටුව වෙත කඩා පැන්න විට ඈ ඉහළට පැන ඔහුගේ යටි බඩට පයින් ගැසුවාය. දෙදෙනාම අනෙකා හැඳ සිටි ඇඳුම් කීතු කීතු කරමින් පොර බදාගත් අතර අවසානයේ දෙදෙනාගේම නිරුවත එකිනෙකාට පේන තැනට පත් වූ විට එය ජුගුප්සාවෙන් බැහැර කරමින් දෙදෙනාම දෙදෙනාගේ නිරුවත් සිරුරුවලට කෙළ ගසාගත්හ. අන්තිමට දෙදෙනා උනුනුන් කෙරෙන් ඈත් වුණේ දෙදෙනාගේම පුළුටු ගඳ දෙදෙනාටම දරාගන්න බැරුවය.

ඒ වන විට ඔවුන් ලේ පෙරාගෙන හති දමමින් සිටි අතර ඔවුන්ගේ මංගල රාත්‍රිය වෙනුවෙන් වෙන් කළ සයනය යකුන් නැටූ සොහොන් පිට්ටනියක් වගේ හැඩි වී තිබුණේය.

වටපිටාවේ උෂ්ණයත්, ඈගේ පුළුටු ගඳත් දරාගන්න බැරි වූයෙන් පොඩි නිලමේ ඉරුණු ඉණකඩය ගලවා වෙනත් ඉණකඩයක් ඇඳගෙන එළියට ගියේය. ඒ වන විට මධ්‍යම රාත්‍රිය පසු වෙමින් තිබුණේය. එදා හඳ එළිය හොඳට තිබුණු රාත්‍රියක් වූ බැවින් ඔහු මිදුලට ගොස් වන බූටෑව එළි කර තිබූ ඉසව්වේ හිප්ප තියාගත්තේය. ගත වුණු කෙටි කාලයේ සිදු වූ සියල්ල ඔහුට මැවී පෙනෙන්නට වූ අතර ඒ කිසිවක් ඔහුට අදහාගන්න පුළුවන් වුණේ නැත.

තමාට ඈ යකිනියක යැයි පෙනුණේ කෙසේද? ඈයට තමා යකෙක් සේ පෙනුණේ කෙසේද? නැතිනම් ඇත්තටම ඈය යකිනියක්ද ? එහෙම නම් තමාත් ඇත්තටම යකෙක් ද? ආයෙමත් ඔහුගේ හිත හොඳටම අවුල් වුණේය. එහෙත් මීට සිංහල පැයකට දෙකකට කලින් ළිඳ ළඟදී තමා ස්පර්ශ කළ කාන්තාව කෙරෙහි තමාගේ ඇඟ කාමයෙන් ගිනිගත්තේ කෙසේද? එසේම ඊට ටික වේලාවකට පසු ඒ ප්‍රහර්ෂය දුන් තැනැත්තිය කෙරෙහි තමාගේ හිත කෝපයෙන් ගිනිගත්තේ කෙසේද? ඈ යකිනියක ලෙස පෙනුණේ කෙසේද? එතකොට ළිඳ ළඟදී වගේම ගත වූ දවස පුරාම මහා සෙනඟක් මැද තමාගේ අතිනත ගෙන තමාගේ උරහිසේ හැප්පි හැප්පී සිටියේ යකිනියක්ද?

පොඩි නිලමේ තම දෙඅතින්ම ඔළුවට ගසාගත්තේය. තමාට පිස්සු හැදීගෙන එනවා යැයි ඔහුට හිතුණේය. එසේ හිතමින් පිටුපස හැරී බලන විට කරලිනා ඔහු පිටුපසින් හිටගෙන හිටියාය.

පැහැදිලි හඳ එළියට ඈගේ මුහුණ හරිම ලස්සනට ඔහුට පෙනුණේය. මෙතෙක් හැඳ සිටි රෙද්ද වෙනුවට අලුත් දුහුල් රෙද්දක් ඇඳ සිටි ඈගේ සිරුරෙන් සරාගී බව උතුරා ගියේය. කළු පාට ඈගේ හම හඳ එළියට තෙල් පාටින් දිස්න දුන්නේය.

'ඇතුළ ගේ හරි මූසලයි......' ඈ කීවාය.

ඔහු එකහෙළා එය අනුමත කළේය.

'ඔව් මටත් පිස්සු හැදෙනවා ඒක ඇතුළට ගියාම...'

සැබවින්ම ඒ වෙලේ ඔහුට ඈ හරිම හුරුබුහුටි කාමුක ගැහැනියක විදිහට පෙනුණේය. තමා මීට ටික වේලාවකට ඉස්සර

The Reader's Place

The Reader's Place

පොඩි නිලමේ කිසිවක් නොකීවේය. ඔහු බිම බලාගත්තේය. ඒ වන විට පුපුරන ආවේගය පාලනය කරගෙන සිටි ආරච්චිල සිය ලේලියන් මිදූලේ ඉන්න විත්තිය පියවි සිහියෙන් දුටුවේය.

'උඹල මොනාද මේ පාන්දර ජාමේ මේ එළියේ කරන්නේ...'

එයට උත්තර නොදී පොඩි නිලමේ ටිකක් වෙලා හිටියේය. එහෙත් ආරච්චිල නැවත ඒ ප්‍රශ්නය ඇසූ විට ඔහු මෙසේ උත්තර දුන්නේය.

'අපි දෙගොල්ලන්ටම එකම දේ වෙලා තියෙන්නේ...'

'මොකක්... මොකක්ද උඹ කිව්වේ...'

ඉක්බිතිව පොඩි නිලමේ සිදු වූ දේ කෙටියෙන් සිය අප්පුච්චාට පැහැදිලි කළේය. ආරච්චිල සියල්ල සාවධානවත්, පුදුමයෙනුත් අසා සිටියේය. පසුව කිසි පිළිතුරක් නොදී මිදුලේ එහාට මෙහාට ඇවිද්දේය. එක් වරම එය නතර කළ ඔහු ඊළඟට සිය අන්තේවාසික පිනාට නම කියා අඬ ගැසුවේය.

සාමාන්‍යයෙන් වෙනදා එසේ අඬ ගසන විට ඒ අඬ ගසන පුද්ගලයා නැතත් වලව්වේ සිටින සේවකයන් කවුරු හෝ ඔහු වෙත පැමිණීම සිරිතය. එහෙත් අද මේ වලව්වට අධිපති ආරච්චිල දෙතුන් වරක් තම සේවකයා ඇමතුවත් කවුරුවත් ආවේ නැත. මේ මිනිසුන් හොඳට නිදාගන්නා මහ පාන්දර ජාමය බව ඇත්තය. එහෙත් වෙනදා මහ පාන්දර වුණත් මේ අඬ ගැමට කවුරුන් හෝ පැමිණ තිබුණේය. අන්තිමට පොඩි නිලමේ සිදු වී ඇති දේ මෙසේ අනුමාන කළේය.

'මං බලාගෙන මුං ඔක්කොම ඊයේ රාත්තිරි වෙනකම් එක දිගට රට කීම බොනව... දැන් එකෙකුටවත් නැඟිටගන්න සිහියක් පතක් නැතිව ඇති....'

එය හරියටම හරි විය. සේවකයෝ සියල්ලෝම උයනගෙයි පැත්තේ විසිරුණු හිස් බෝතල් උඩ එකා මත එකා වැටී නිදාගෙන සිටියහ. සමහරු කටේ බෝතල් තියාගත් විදිහටම නිදාගෙන සිටියහ. තවත් සමහරු තම හිතමිතුරන් සමඟ හීනෙන් කැරැල්ලේ තොරතුරු කතා කරමින් සිටියහ. ඒ අතර තවත් අයෙකුට මුළුතැන්ගෙයි බිත්තියට හේත්තු වී දෙපයින් හිටගෙන

ඉඳිද්දී නින්ද ගොස් තිබුණේය. බිසෝ මැණිකාගේ අත් උදව්කාර බවලත් තිප දෙනා මේ බේබදු නඩයේ කන්කරච්චලය ඉවසා ගන්න බැරුව උයන ගෙයි දොර අගුලු දමා කන්වල ඇබ ගසා නිදාගෙන සිටියහ.

ආරච්චිලට මේ මිනිසුන් ඇහැරවන්න ළිඳෙන් වතුර අදින්න සිදු වූ අතර උයන ගෙයි දොර වසා ගෙන නිදා සිටි බවලත් උදවිය ඇහැරවන්න දොර කඩා දමන්න සිදු විය. කෙසේ හෝ අවසානයේ වටින් පිටින් එළිය වැටෙද්දී පිනාව කට්ටඩි රාළගේ ගෙදරට යවන්න ආරච්චිලට පිළිවන් විය.

පණිවිඩය ලද සැණින් පිනාත් සමඟ කට්ටඩි රාළ වලව්වට දුවගෙන ආවේය. පොඩි නිලමේත්, ආරච්චිලත් සිද්ධිය සැකෙවින් ඔහුට විස්තර කළහ. සියල්ල අසා සිටි පුංචි ගුරු කට්ටඩි රාළ සිය නළල රැලි ගන්වමින් මෙසේ කීවේය.

'බරපතළ හූනියමක් මේ කරල තියෙන්නේ... ඕකට කියන්නේ කලව බන්ධනේ කියලා. ගෑනියෙකුයි මිනිහෙකුයි ඉලක්ක කරගෙන ඕක කළාට පස්සේ තීන්දුව කපන කං උන් දෙන්නට කවමදාවත් නිදි ඇඳේදි එකතු වෙන්න බෑ. හූනියමේදි දෙන්නට බඳින්නේ යක්කු දෙන්නෙක්... ඒ හින්ද දෙන්නට මේ දෙන්නට යක්කු විදිහට. ඔය කියන විදිහට මෙතන දෙන්නව පේන්නේ හූනියං දෙකක් වෙන වෙනම කරලා තියෙනවා...'

'මං දන්නව මේ වැඩේ කළේ කව්ද කියලා.. උඹට බැරිද මේ තීන්දුව කපන්ඩ...'

කට්ටඩි රාළ එක් වරම දෙවුර හැකිළුවේය.

'බෑ ආයිබොවන්ඩ... කලව බන්ධනේ කපන්න පුළුවන් ඒ වැඩේ කරපු මනුස්සයට විතරයි. අනික හාමුන්නාන්සේ ඔය කියන විදිහට මේක මේ සුළුවට කරපු දෙයක් නෙමෙයි. බොහොම සකසුරුවමට කාටවත් ඇහිලි ගහන්න බැරි විදිහට කරපු එකක්....'

ආරච්චිල ටිකක් වෙලා නිසොල්මන්ව කල්පනා කළේය. ඔහු හොඳටම අසරණ වී ඇති විත්තිය ඔහුගේ මුහුණේ ඉරියව්වලින් පෙනුණේය. තව කලබල වීමෙන් තව අතුරු ප්‍රතිඵල ඇති විය හැකි බව ඔහුට වැටහුණේය. අවසානයේ ඔහු මෙවැනි ඉල්ලීමක් කට්ටඩි රාළට කළේය.

The Reader's Place

'උඹ වල්ලී හම්බ වෙලා බලපං මේක ගොඩින් විසඳගන්න පුළුවන්ද කියලා...'

කට්ටඩි රාළ වල්ලිගේ ගෙදරට ගියේය. ඈ මේ උදෑසන සැබවින්ම කවුරුන් හෝ අපේක්ෂාවෙන් සිටියාය. එහෙත් ඈ කිසිවක්ම නොදන්නා විදිහට කට්ටඩි රාළ පිළිගත්තාය.

'මොකෝ මාමේ මේ උදේ පාන්දරම...'

'ආයේ උඹ නොදන්නා විදිහට කතා කරන්නේ...උඹ දන්නවනේ කාරණාව...'

'මොකෝ උඹලෑ ගෙදර කාට හරි කරදරයක්ද ...'

වල්ලී වචන පිට කළේ ඇඟට පතට දූනෙන්නේ නැති විදිහටය.

'මගේ ගෙදර කාරණාවක් නෙවෙයි බං...'

'ඉතිං උඹේ ගෙදර කාරණාවක් නෙවෙයි නං උඹ ඇවිත් මොකටද... ඒ කාරණාව තියෙන මනුස්සය එන්න එපැයි...'

කට්ටඩි රාළ ලොකු හුස්මක් ඉහළට ගත්තේය.

'ඒකත් එහෙමද ...'

'උඹ දන්නවනේ... මට උඹ වෙනුවෙන් ඕන දෙයක් කරන්ඩ පුළුවන්.. මොකද උඹ මගේ ගුරුන්නාන්සේ වගේ... ඒත් මේකට උඹ අත දාන්ඩ එපා. මගේ තරම නොදන වැඩ කරන අයට මං මගේ තරම පෙන්නන්ඩ ඕනෑ...'

ඇගේ තියුණු තීව්‍ර වචන ඔහු නිසොල්මනේ අසා සිටියේය. අවසානයේ ආයෙමත් ලොකු හුස්මක් අරගෙන ආයාචනාත්මකව මෙසේ කීවේය.

'කෙල්ලේ ... මේ සැරේට ඒ ඇත්තට සමාව දියං...'

'බෑ... මං උන්දැගෙ අම්ම මිනී වළෙන් නැඟිට්ටවල දුන්නා... ඒ කෙළෙහිගුණේවත් නෑ උන්දෑ ළඟ...'

'එහෙනං උඹ මොනාද මට ගිහින් කියන්ඩ කියන්නේ...'

'මහ මනුස්සයට මගෙ ළඟට එන්ඩ කියාපං...'

'කාටද ආරච්චිට...?'

'ඔව් ආරච්චිට...'

කට්ටඩි රාළ පණිවිඩය අරගෙන ආපහු වලව්වට ගියේය.

නවත් සිංහල පැයක් ගත වෙන්න මත්තෙන් මේ ගමේ සියලු වැසියන්ගේ නිල ලත් භාරකරු වූ, ඉංග්‍රීසි ආණ්ඩුවට වග කියන මේ ගමේ ඒජන්ත තැන වූ, ගමේ ආරච්චිල සාස්තර කියන ගමේ නිකම්ම නිකම් නෝන්ජල් ගෑනියක වූ වල්ලිගේ දෙපා ළඟට ඇගේ අණ පිළිගෙන පැමිණ සිටියේය.

'වල්ලී... මේක දික් ගස්සන්නේ නැතිව ගොඩිං බේරල දියං....'

ආරච්චිල කතා කළේ ඇගේ දෙපා ළඟට ආවත්, තාමත් තම අභිමානය හිතේ තියා ගනිමිනි.

'මට ඕන වුණේ ඇත්ත තේරුම් කරල දෙන්න...'

'මොකද්ද ඇත්ත..' ආරච්චිල පෙරළා ප්‍රශ්න කළේය.

'හැම මිනිහෙක්ගෙම නළලේ කොටපු තීන්දුවක් තියෙනවා... ඒක සක්කරයටවත් වෙනස් කරන්ඩ බෑ...'

'කාගේ තීන්දුව ගැනද උඹ ඔය කියන්නේ...'

'පොඩි තිලමෙගෙ...'

ආරච්චිල ඇහි පිල්ලන්වත් ගහන්නැතුව වල්ලී දිහාම බලා සිටියේය. ඈ දිගටම කියාගෙන ගියාය.

'මට තීන්දු කපල මේකෙන් නිදහස් කරන්ඩ පුළුවනි... ඒත් තේරුමක් වෙන්නේ නෑ... එයා ඉපදෙන කොටම එයාගේ තීන්දුව එයාගේ නළලෙ කොටල ඉවරයි....'

'මොකක්ද එයාගේ තීන්දුව...'

'එයාට කරලිනා තියා වෙන කිසිම ගෑනියෙක් එක්ක නිදි වදින්න බෑ.. එයාගේ අනාගතේ මම. මගේ අම්ම මට කිව්ව විදිහට එයාගේ නළලේ කොටල තියෙන්නේ එහෙම...'

තව මොහොතක්වත් තත්පර නොවී ආරච්චිල වල්ලිගේ ගෙදරින් පිටත් වුණේය.

ඔහු නොපෙනී යනකම් සිටි වල්ලී උදැල්ලකුත් අරගෙන එළියට බැස්සාය. විකිරි ඉන්නා හේනත් පහු කළ ඈ තවත් ටිකක් කැළෑව ඇතුළට ගියාය. අවසානයේ වතුර පිරුණු මඩ ගොහොරුවක් ළඟ නැවතුණාය. පසුව උදැල්ලෙන් යම් සීමාවක් සලකුණු කළ ඈ හැඳ සිටි ඇඳුම පිටින්ම මඩ ගොහොරුවේ

The Reader's Place

යටට ගිලුණාය. මුළු ශරීරය සමඟ ඇගේ හිසත් මඩ ගොහොරුවේ ගිලී වතුර බුබුළු උඩට නැංගේය. ටික වේලාවක් ගොහොරුවේ අතුරුදහන් වූ ඇ අන්තිමට ගොඩට ආවේ හයියෙන් හති දමමින් මැටියෙන් පිලිස්සූ කුඩා මිනිස් රූප හතරක් අත් දෙකෙන් අරගෙනය.

සිරුර පුරා තැවරුණු මඩ වතුර කෙහෙරැලි දිගේ බිංදුවෙන් බිංදුව බිමට වැටෙද්දී ඇ ගොඩට ඇවිත් බිම ඉඳගෙන අර මැටි මිනිස් රූපවල සන්ධිවලට ගැසූ විස කටු එකින් එක ඉවත් කළාය. රූප හතරේම කටු ඉවත් කර නැවත එය හරියට සිදු වී ඇති දැයි ඇ දෙවරක්ම පරීක්‍ෂා කළාය. ඉන් පසුව දෙබර, බඹර වැනි ඉටි පස් වර්ගයක් යොදා හුඹස් මැටිත් සමඟ අනා සකස් කළ ඒ මිනිස් මැටි රූප බිම දමා කකුලෙන් පොඩි කර දැමුවාය. අවසානයේ පොඩි වුණ මැටි කැබලි මඩ ගොහොරුවට විසි කර උදුල්ලත් අතට අරගෙන තවමත් මඩ වතුර කෙහෙරැලි දිගේ බිමට බේරෙමින් වැටෙද්දී ආපසු ගෙදර ගියාය.

වල්ලී ගෙදර යන විට අහල ගං හතකට අණ බෙර ගසා සිංහලේ ඉහළ නිලමක්කාරයන් කැඳවා මහ සෙනඟ රැස් කර සිදු කළ මහා මංගල්‍යය එක රැයින් නිමා කර, ඉපදෙන කොට නළලේ කොටා තිබූ විදිහට සිය සංසාරගත ප්‍රේමවන්තිය සොයා පොඩි නිලමේ නැවත පැමිණ සිටියේය.



11

පොඩි නිලමේ වල්ලීගේ ගෙදර බිත්ත බැස මාසයක් ගත වෙන්නත් මත්තෙන් එනම් අටසිය දාහත අවුරුද්දේ බිනර මාසයේ දවසක පල්ලේගම හාමුදුරුවෝ නැවත ගමේ පන්සලට වැඩියහ.

The Reader's Place

මේ වන විට ඉංග්‍රීසින්ට විරුද්ධ කැරැල්ලේ උණුසුම හොඳටම ඇවිළෙමින් තිබුණේය. පල්ලේගම හාමුදුරුවන්ගේ මේ දෙවැනි පැමිණීම සිදු වූයේ පළමු පැමිණීමෙන් අට මසක ඇවෑමෙන් නිසා උන්වහන්සේට ඇබිත්ත උන්නාන්සේට කියන්න මහා පතරංග ජාතකේටත් වඩා විස්තර තිබුණේය.

'ඉහගම උන්නාන්සේ දන් සිවුරු ඇරල..... ඉංග්‍රීසි ආණ්ඩුව එයා අල්ලන්න පස්සෙන් පන්නන හින්දා එයා සත් කෝරලේට ගිහින් ගැමියෙක් විදිහට ජීවත් වෙලා තියෙනවා... උන්නාන්සේ තමයි ඔය රජකුමාට උරුමකම් තියෙන කෙනා හොයාගත්තය කියලා කියන්නේ...'

'මටත් ආරංචියි ඔය රජ්ජුරුවො ගැන... මොකද්ද එයාගේ රාජ පරම්පරාව...'

ඇබිත්ත උන්නාන්සේ පෙරළා ප්‍රශ්න කළේය.

'වඩුග රාජ පරම්පරාවට අයිතියි කියලා කියන්නේ... නම දොරේ සාමි... ඒ වුණාට වීරවික්‍රම ශ්‍රී කීර්ති කියන රාජ නාමයෙන් තමයි එයා පෙනී හිටින්නේ...'

කතාව මදකට නතර කළ පල්ලේගම හාමුදුරුවෝ වටපිට බලා කවුරුන්වත් නැති විත්තිය සහසුද්දෙන්ම සහතික කරගෙන ඇබිත්ත උන්නාන්සේට තව ටිකක් කිට්ටු වී රහසින් වගේ අද කතාවට මේ ටිකත් එකතු කළෝය.

'ඒ වුණාට එයාට ඇති රාජ පරම්පරාවක් නෑයි කියලයි සමහරු කියන්නේ. ඉහගම උන්නාන්සේ හිටිය සත්කෝරලේ විල්බාව පැත්තෙ හීරළුවෙක් කියලයි කියන්නේ. කිවුලේගෙදර මොහොට්ටාල තමයි එයාගේ සිවුරු ගලවලා මේ රාජ නාමය ආරූඪ කරගන්න බල කරල තියෙන්නේ. ..'

පල්ලේගම හාමුදුරුවෝ ආයෙත් වටපිට බැලූහ. ඊළඟට තවත් පහත් ස්වරයෙන් මේ ටිකත් කීහ.

'එයා විතරක් නෙමේ... රාජ නාමය ආරූඪ කරගත්ත තව දෙතුන් දෙනෙක්ම ඉන්නව කියලා ආරංචියි. එහෙම කරල තියෙන්නෙ ඉංග්‍රීසි ආණ්ඩුවේ අවධානය එක තැනකට යොමු නොවී එහා මෙහා වෙන්ඩලු...'

පල්ලේගම හාමුදුරුවෝ රහසින් මෙන් කී සියල්ල අසා සිටි ඇබිත්ත උන්නාන්සේ සාමාන්‍ය ස්වරයෙන් ඊට මෙසේ පිළිතුරු දුන්නේය.

The Reader's Place

'රජ්ජුරුවො විදිහට ඉන්න මනුස්සය ඇත්ත වුණත් බොරු වුණත් කමක් නෑ... අවශ්‍ය කරන්නේ මේ ඉංග්‍රීසි ආණ්ඩුව පෙරළන්න ඔක්කොම එකතු වෙන එකයි...'

'මමත් හිතන්නේ එහෙම තමා... ඒත් සාමාන්‍ය මිනිස්සුන්ගෙ කැමැත්ත දිනාගන්න රාජ පරම්පරාවක උරුමය තියෙන කෙනෙක් ඉන්ඩ ඕන...'

ඇබිත්ත උන්නාන්සේ එය අනුමත කරන්නට හිස සැලුවේය. ඒ සමඟම ඉතා සෙනෙහෙබර ලෙස පල්ලේගම හාමුදුරුවන් දිහා බලාගෙන නිහඬව සිට මෙසේ කීවේය.

'ඔබ වහන්සේත් පරිස්සමින් කටයුතු කරන්න. ඉංග්‍රීසි ආණ්ඩුව හැම චීවරධාරියෙක් ගැනම ඇහැ ගහගෙන ඉන්නේ...'

'මං දන්නවා ඒක. ඒගොල්ලන්ට ඉවසන්ඩ බැරි මේ උන්නාන්සේලා ටික තමයි. ඒ හින්දා ඩොයිලි උන්නැහේ ඒගොල්ලන්ගේ වරපුරුෂ වැඩවලටත් පොතුහැර උන්නාන්සේ වගේ උන්නාන්සේලා පාවිච්චි කරන්ඩ පටන් අරගෙන...'

'ඔබ වහන්සේ කියන්ඩ මගෙන් මොනාද කෙරෙන්ඩ ඕන කියලා...'

පල්ලේගම හාමුදුරුවෝ සෙනෙහෙවන්ත ලෙස සිනාසුණහ.

'උදව්වක් ඕන වුණොත් මං කියන්නං... හැබැයි ඔක්කොටම වැඩිය වටින්නේ මේ ගම ආරක්ෂා කරගෙන ඉන්න එක...'

'ඒකත් දැන් හිතන තරම් ලේසි නෑ... සුද්දා බෝ කරපු රට අරක්කුවලට මෙහේ මිනිස්සුත් වහ වැටිලා තියෙන්නේ...'

දෙදෙනා තව බොහෝ දේ කතා බහ කළහ. එදා එළිවෙනකම් දෙදෙනා නිදාගත්තේ නැත. පාන්දර වටින් ගොඩින් එළිය වැටෙන විට පල්ලේගම හාමුදුරුවෝ ඇබිත්ත උන්නාන්සේගෙන් සමුගෙන නික්ම ගියහ.

ඊට තවත් දෙමසකට පසු ඉල් මාසයේ දවසක හසුන්පත් කීපයක් රැගෙන යන ගමන් පල්ලේගම හාමුදුරුවෝ නැවත පන්සලට වැඩියහ.

දැඩි වෙහෙසකාරී බවක් උන්වහන්සේගෙන් පළ වුවත් එය මැඩ ගෙන මතු වූ තෘප්තකර හැඟීමක් ඒ වෙහෙස හා මුහුව තිබුණේය.

'කැප්පෙටිපොළ මහ දිසාවෙත් අලුපොතදි අපිත් එක්ක එකතු වුණා...'

උන්වහන්සේ කතා කළේ සැබවින්ම උද්‍යෝගයෙනි. එසේම කැප්පෙටිපොළ මහ දිසාවේගේ එකතු වීම නිසා මේ කැරැල්ල වඩාත් ප්‍රාණවත් වී ඇති බවටත්, අනිවාර්යයෙන්ම ඉංග්‍රීසින් ආණ්ඩු මට්ටු කර මේ හීම පාලනය පෙරළා දමන බවටත් උන්වහන්සේ සහතික වූහ.

'ඉංග්‍රීසින්ට තිබුණෙ මඩිගේ ප්‍රධානියා විදිහට හජ්ජි මුහන්දිරම් පත් නොකර ඉන්ඩ. එහෙනං එයා මැරෙන්නෙ නෑ... ඒක එහෙම වුණේ නැත්තං බදුල්ලේ උප දිසාපති විල්සන් උන්නැහෙයි, එයාගේ තෝල්ක මුදලියි අපේ මිනිස්සු අතින් මැරෙන්නෙත් නෑ...'

එසේ කියන විට උන්වහන්සේ තුළ තිබුණේ කනගාටුවක්ද, ප්‍රීතියක්ද, වෛරයක්ද නැතිනම් උපේක්ෂාවක්ද යන්න පැහැදිලි කළ නොහැකි විය. එහෙත් අත ඇති හසුන්පත් මොනවාදැයි ප්‍රශ්න කළ විට උන්වහන්සේ පිළිතුරු දුන්නේ එය කැප්පෙටිපොළ විසින් තමාට නියම කළ රාජකාරියක් බවය.

'කැප්පෙටිපොළ දිසාවෙමයි, මේ හසුන්පත් මගේ අතට දීල කීවේ සෙංකඩගලට ගිහිං මෙව ඇහැලේපොලටයි, මොල්ලිගොඩටයි දෙන්න කියලා...'

ඒ රාජකාරිය තමා වගකීමෙන් හා ආඩම්බරයෙන් බාරගත් බව උන්වහන්සේගේ මුහුණෙන් පෙනෙන්න තිබුණේය. වෙනදා තරම් කතා බහ නොකළත් කතා කළ ටික හරි ස්ථිරසාරව සහ උද්‍යෝගිමත්ව කතා කළ උන්වහන්සේ එළිවෙන්න පෙරාතුව පශ්චිම යාමය එළඹෙත්ම තම රාජකාරිය ඉටු කරනු පිණිස නික්ම ගොස් තිබුණේය.

ඊට සතියකට පසු දිනෙක ඇබිත්ත උන්නාන්සේ උදේ වරුවේ පන්සල අතු පතු ගාමින් සිටින අතර මේ වන විට සොළොස්වන වියට එළඹ, සිය පියාගේ තරුණ කල රූපයේ අච්චුවක් වන තරමට හැඩපලු කොණ්ඩය දිගට වවා ඇඟ පුරා මවිල් පුරෝගෙන සිටි රනා පන්සලට ඇවිත් සිටියේය. ඔහු ඇවිත් සිටියේ තනිවම නොවේ. ඔහු මෙන්ම හැඩිදැඩි තවත් තරුණයන් දහ හත් දෙනෙකු සමඟය. එක පැත්තකින් සිය සොහොයුරෙකු වූ ඇබිත්ත උන්නාන්සේ ඉදිරිපිට සිය කරේ තිබූ අත් පොරොව පහතට හෙළා ඔහු එකිනෙකා හඳුන්වා දුන්නේය.

'මේ බින්දුවා, අරුමා, සූටියා, හේතුවා...'

ඇබිත්ත උන්නාන්සේ ඔහුගේ පැහැදිලි කිරීම අතරමඟ නතර කළේය.

'රනා... මේ අහපං... මේක මහ විසාල පවුල් කන්දරාවක් ඉන්න මහා විසාල ගමක් නෙමෙයිනේ... උඹ මට මුන් එක එකා හඳුන්නල දෙන්ඩ ඕන නෑ... මං මුන්ව දන්නවා. කියපං කාරණේ මොකක්ද කියලා...'

'අපි ඔක්කොටම කැරැල්ලට බැඳෙන්ඩ ඕන...'

ඇබිත්ත උන්නාන්සේ ඇස් පිල්ලන් ගහන්නෙවත් නැතිව රනා දිහා බලා සිටියේය. පසුව එක එකා දිහා වෙන වෙනම බලා උන්ගේ තරම තම සිතින් පරීක්ෂා කර මෙසේ කීවේය.

'මට හරි සතුටුයි උඹලා ගැන... මේ වෙලාව අපි අපි ගැන හිතනවට වඩා රට ගැන හිතන්ඩ ඕන වෙලාවක්... ඒ වුණාට උඹලගෙ ගෙවල්වලින් මනාපද උඹල යන එකට...'

දහ දෙනෙක් ඔව් යැයි කියන්නට හිස සැලූහ. එසේම තවත් අටදෙනෙක් නැහැ යයි කියූහ.

'හොඳා... අද හවසට උඹලෑ අප්පුච්චලට මාව හම්බවෙන්ඩ කියාපං...'

නැහැයි කියූ අට දෙනාට ඔහු එසේ කීවේය. ඒ සමඟ රනා දිහා උවමනාවෙන් බැලුවේය.

'අම්මා ගෝමරිට කිව්වද උඹ යනවයි කියලා...'

'උන්දෑ කිසිම දෙයක් කියන්නේ නෑ... අඩුම ගානේ මං දිහා බැලුවෙවත් නෑ...'

'පොඩිනා මොකද කියන්නේ...'

ඔහු එසේ ඇසුවේ රනා දන් අවුරුදු දෙක තුනක කාලයක පටන් ඉන්නේ පොඩිනා ළඟ නිසාය.

'එයාගේ අකමැත්තක් නෑ...'

ඉක්බිතිව ලොකු හුස්මක් ගත් ඇබිත්ත උන්නාන්සේ පල්ලේගම හාමුදුරුවන්ට කෙටි පයිණ්ඩයක් ලියුවේය. පසුව සියලු දෙනාට මොහොතක් නවතින්න ඉඟි කර පන්සල ඇතුළට ගියේය.

ඇබිත්ත උන්නාන්සේ එළියට ආවේ සිය දෝතින්ම ගත් කඩු පතක්ද රැගෙනය.

'මේක ලේවලින් පණ පොවපු සෙන්පති කඩුවක්. ඉෂ්ඨ ඵල විපාක දෙන අශ්ව සලකුණක් මේකෙ කොටලා තියෙනවා. දේව ගණයට අයත් අස්විද නැකතේ මේ කඩුව හදල තියෙන්නේ..,'

ඇබිත්ත උන්නාන්සේ රනා අතට කඩුව දුන්නේය.

'උඹ ඉපදිල තියෙන්නේ රාක්ෂ ගණයේ ඉන්ද්‍ර නැකතේ... ඒ හින්ද උඹට මේ ආයුදේ හොඳට ගැළපෙනවා. ලොකු හාමුදුරුවො මට කියල තියෙනවා සුදුසු වෙලාව ආවම සුදුසු මිනිහට මේක

දෙන්නාය කියලා. මං හිතන්නේ මේක සුදුසු වේලාව කියලා. උඹේ උප්පත්ති නැකත අනුව මේ ආයුදේ දරන්න උඹ සුදුසුයි...'

රනා ආයුධය අතට ගෙන උඩ සිට පහළට එය හොඳින් නිරීක්ෂණය කළේය.

'මතක තියා ගනින්... කඩුව කොපුවෙන් එළියට ඇදල ප්‍රයෝජනයක් නොගෙන ආපහු ඇතුළට දාන එක අශුභයි. ඒ වගේම කඩුව මත තමන්ගේ ඡායාව බලන එකත් අශුභයි. පරම්පරා ගාණක රණ ශූර ලේ උඹේ ඇඟේ තියෙනවා... ඒ හින්දා ආයුදේ අතට ගත්තම අමුතු පුහුණුවක් නැති වුණත් හරඹ පෙන්නන විදිහ උඹේ ලේ උඹට කියල දෙයි...'

ඒ විදිහට අවුරුදු ගාණක් තිස්සේ ලොකු හාමුදුරුවන්ගේ සයනය ළඟ ඉහළ බිත්තියේ රඳවා තිබූ පුරාණ කඩුව දැරීමේ වාසනාව රනා උදා කරගත්තේය. ඉක්බිතිව ඇබිත්ත උන්නාන්සේ පල්ලේගම හාමුදුරුවන්ට ලියා දුන් පයිණ්ඩයත් රැගෙන සියල්ලෝම පන්සලේ ගල් පඩිපෙළ බැහැගෙන නොපෙනී ගියහ.

රනාගේ නික්ම යාම පොඩිනාට තදින්ම දැනුණේය. එහෙත් ඈ රනාගේ පිටත්ව යෑමට අවසර දුන්නේ ඒ වන විට අටවෙනි වියට පා තබා සිටි බිංදු වයසින් කෙසේ වෙතත් උස මහතින් අවුරුදු පහළොවක දහ අටක පෙනුමෙන් යුක්ත වූ නිසාය. උස මහත වගේම ඔහුගේ දැනුමත් අවුරුදු දහ අටකට කිට්ටු තැනක තිබුණේය.

වරක් ගනුදෙනුකරුවෙකුට තඹ සල්ලි විස්සක් රනා විසින් වැඩිපුර දෙන ලද අතර එය නිවැරදි කරන ලද්දේ බිංදු මැදිහත් වී එය නැවත ගණනය කිරීමෙන් පසුවය. තඹ සල්ලි හැට හතර රිදී එකක් බවත්, සල්ලි හතර තුට්ටු එකක් බවත්, තුට්ටු හතර රිදී එකක් බවත්, බිංදු ඉගෙන ගෙන තිබුණේ පොඩිනා මේ රහස් බේත් හදන්න පටන් ගත් මුල් කාලයේදීමය.

එසේම සමහර ගනුදෙනුකරුවන් බොරු රිදී කාසි ද රහස් බේත් අරගෙන යන්න උත්සාහ කළ අවස්ථා තිබුණේය. එවැනි සැකයක් ඇති වූ විට බිංදු කළේ රිදී කාසිය ගින්නෙහි ලා රත් කොට නැවත සේදීමය. එය නැවත පිරිසිදු සුදු පැහැය නොගතහොත් එය වලංගු කාසියක් නොවන බව බිංදු දැනගෙන සිටියේය.

දවසින් දවස දියුණු වූ පොඩිනාගේ පිරිමියා ලොකුවෙන රහස් බේත් වෙළෙඳාම කෙතරම් ජනප්‍රිය වූ සල්ලි උල්පතක් විද යත් එය ගමේ ගැමියන් සහ අනෙක් ගම්වල ගම්වැසියන් අනුකරණය කරන්න පටන් ගත්තේ වරක් දෙවරක් නොවේ.

එක අවස්ථාවක පොඩිනාත් සමඟ බහින් බස් වී රනාගේ අත් උදව්කාරයෙකු වූ උක්කුවා අත් උදව් දීම අත්හැර දමා යන්න ගියේය. කැළේට ගොස් බෙහෙත් වට්ටෝරුව එකතු කිරීම මාස ගාණක් එක දිගට කළ උක්කුවා පොඩිනා හැර යැමෙන් පසු ඔහුගේ ගෙදර මේ වෙළෙඳාම පටන් ගත්තේය. එහෙත් සති දෙකකට වැඩිය ඔහුට එය කරන්න බැරි විය. උක්කුවාගේ බේත්වල ප්‍රතිඵල රහිත බව දැන ගනුදෙනුකරුවෝ ඔහුගෙන් බේත් ගන්න එක නතර කළහ.

තවත් වරෙක එහා ගමක දක්ෂ වෙද රාළ කෙනෙක් පොඩිනාගේ බේත්වල සුවඳ සිය ආඝ්‍රාණයෙන් විශ්ලේෂණය කර ඒ මුල් වූ බෙහෙත් වට්ටෝරුව සොයාගත්තේය. ඉන් පසුව ඔහු එය හදන්න පටන් ගත්තේය. එහෙත් පස් දවසක් ඇතුළත ඔහුට එය නවත්වන්න සිදු වුණේ එහි ප්‍රතිඵලයක් නැති වූ නිසාය.

තවත් අවස්ථාවක තවත් උදව්කාරයෙකු වූ ගුණයා උත්හිටි ගමන් අතුරුදන් වුණේය. පසුව ආරංචි කර බලන විට බේත් ගන්න පැමිණි මුස්ලිම් වෙළෙන්දෙක් ගුණයාට වැඩිපුර මුදල් දෙන බව කියා ඔහු මඩකලපුවට කැටුව ගොස් තිබුණේය. මඩකලපුවේදී ගුණයා අර මුස්ලිම් වෙළෙන්දා සමඟ මේ බේත් වෙළඳාම නැවත පටන් ගත්තේය. සෑහෙන මුදලක් වියදම් කර මහා පුරාජේරුවට පටන් ගත් මේ වෙළඳාමේ ප්‍රධාන ගනුදෙනුකරුවන් වූයේ ඉංග්‍රීසින්ය. පුරා දවස් දහයක් මෙහි ඇති ප්‍රතිඵල වර්ණනා කරමින් මුස්ලිම් වෙළෙන්දා ඉංග්‍රීසින්ට බේත් විකුණන්නට සමත් වුණත් එකොළොස්වෙනි දවසේ ඉංග්‍රීසි හමුදා රෙජිමේන්තුවක් පැමිණ ඔහුගේ කඩය කුඩු කර ගිනි තබා තිබුණේය.

The Reader's Place

අන්තිමට ඉණෙට ඇඳි සරමත් බැනියමත් පමණක් ඉතිරි වූ මුස්ලිම් වෙළෙන්දා යාළුවෙකුගෙන් ණයක් ඉල්ලාගෙන ආපසු අරාබියට නැව් නැංගේය. අසරණ වූ ගුණයා ආගිය අතක් නැති වූ අතර වරක් අබ්දුල් මුදලාලි මඩකලපුවට ගොස් ඇවිත් කියා තිබුණේ ඔහු මහ පාරේ හිඟමන් යදිමින් සිටිනවා තමා දුටු බවය.

මෙසේ අවස්ථා කීපයකදී පොඩිනාගේ රහස් බේත් හොරෙන් හදන්න සමහරු උත්සාහ කළත් එය හරි නොගිය හේතුව පොඩිනා පවා දැනගත්තේ පසුවය.

දිනක් ගනුදෙනුකරුවන් සඳහා සූදානම් කර තිබූ සියලු බේත් නිමා වූ අතර අවසාන ගැනුම්කරුවන් දෙදෙනාට බේත් අවසන් වූ බව දන්වන්න රනාට සිදු විය. එහෙත් ඔවුන් දෙදෙනා බොහෝ ඈත සිට පැමිණියවුන් බැවින් ඔවුන්ගේ එකම ඉල්ලීම වුණේ තමන්ව හිස් අතින් නොයවා කෙසේ හෝ තමන්ට බේත් ලබා දෙන ලෙසයි. පොඩිනාද මැදිහත් වී ඔවුන්ට තත්ත්වය කෙතරම් පැහැදිලිව තේරුම් කරන්න හැදුවත් ඔවුන් එය පිළිගත්තේ නැත. අන්තිමට හැන්දෑ වී කළුවර වැටෙමින් තිබුණත් ඔවුන් කීවේ බේත් හදන්න පුළුවන් නම් තව පැයක් දෙකක් වුණත් තමන්ට බලා සිටිය හැකි බවයි.

ඔවුන්ගේ මේ කන්දොස්කිරියාව ඉවසන්න බැරිම තැන පොඩිනා කළේ මිදුලෙන් තණකොළ ගස් ටිකක් උගුල්ලා එය සිය තන කිරෙන් අඹරා ඔවුන්ට දීමයි. තමන් නිවැරදි බෙහෙත් වට්ටෝරුව සහිත බේත් ඔවුන්ට නොදුන් නිසා ඔවුන්ගෙන් මුදල් ගැනීම පවා පොඩිනා ප්‍රතික්ෂේප කළාය. ඒ සමඟම සතියකට පසු නැවත පැමිණ රහස් බේත ලබාගන්නා ලෙස පොඩිනා ඔවුන්ට දැනුම් දුන්නාය.

සතියකට පසු පැමිණි ඔවුන් ප්‍රකාශ කළේ තමන් බේතෙන් උපරිම ප්‍රතිඵල ලබාගත් බවයි. පොඩිනා එවේලේ සැබවින්ම පුදුමයට පත් වුවත් අන්තිමට උක්කුවාගේ සහ ගුණයාගේ සිද්ධීන්ද තේරුම් ගැනීමෙන් පසුව මේ රහස් බේතේ රහස ඇත්තේ බෙහෙත් වට්ටෝරුවේ නොව තමාගේ තන කිරෙහි බව ඈ හඳුනාගත්තාය.

ඒ අනුව ඈ සමහර දවසක උඳුපියලිය තන කිරෙන් අඹරා රහස් බේත හදා ගත් අතර තවත් දවසක නිදිකුම්බා තන කිරෙන් අඹරා එය හදාගත්තාය. එහෙත් ප්‍රතිඵලවල වෙනසක් වුණේ නැත. අන්තිමට ඈ අතට අහුවන ඕනෑම කොළ ජාතියකින් රහස් බේත හදන්නට පුරුදු වූ අතර සමහර දවසක ඈ ගෙදර තිබූ පුස්කොළ පොත් ලියන්න ගන්නා තල් කොළ තන කිරෙන් අඹරාද එය හැදුවාය. මේ නිසා කේන්ති ගිය වෙලාවක තමා ළඟ වැඩ කළ අත් උදව්කරුවන්ට බය නැතිව මෙසේ කියන්න ඇයට පුළුවන් විය.

'තොපි පුළුවන් නම් මගෙ ළඟින් ගිහින් බේත් හදන තැනක් දාසියව්කො බලන්න... ගුණයට කළා වගේ මං හැම එකාවම බල්ලො බළල්ලු වගේ හිඟා කන්න පාරට ඇදල දානවා...'

සති දෙකකට වරක් තඹ සල්ලි මුට්ටිය බැගිනුත් මාස දෙකකට වරක් රිදී කාසි මුට්ටිය බැගිනුත් ලෙස පොඩිනා තඹ සල්ලි සහ රිදී කාසි කෙතරම් මුට්ටි ගාණක් කැලේ වළ දම්මාද කිවොත් අන්තිමට ඈ එසේ වළ දමන තැන් මතක තියාගන්න එකත්, ඒවා ගණන් තියාගන්න එකත් අත් හැරියාය. සමහර දිනෙක ඈ රිදී කාසි වළලන්න පොළොව හාරන විට තඹ සල්ලි මුට්ටි මතු වුණේය. තඹ සල්ලි මුට්ටි වළලන්න පොළොව හාරන විට රිදී කාසි මුට්ටි මතු වුණේය. මෙය ඇයට කෙතරම් වදයක් විද යත් අන්තිමට ඈ පොළොව හාරන්න මත්තෙන් තමාට තඹ සල්ලි මුට්ටි, රිදී කාසි මුට්ටි හමු නොවේවායි කැළෑ දෙවියන්ට යාතිකාවක් කරන්න පුරුදු වුණාය. බැරි වෙලාවත් එවැනි යාතිකාවකින් පසුවත් එවැනි මුට්ටියක් හමුවිණි නම් ඈ කළේ ඒ කාසි අහුරු අහුරු පිටින් අරගෙන හිතුණ හිතුණ පැත්තට විසි කරන එකය.

අන්තිමට ඈ කෙතරම් මේ විනෝදාංශයට ඇබ්බැහි වූයේද යත් හැම සිකුරාදා දවසකම හවස් වරුවේ තඹ සල්ලි මුට්ටි බාගයක් තම මිදුලේ සිට පාරට විසි කිරීම පුරුද්දක් කරගත්තාය. මේ සල්ලි වරුසාව බලා කියාගන්න ගමේ දෙමව්පියන් නොපැමිණියත් ඔවුහු හැම සිකුරාදා හවසකම තම දරුවන් වෙන කිසිම වැඩකට නොයවා පොඩිනාගේ ගෙදර ළඟට යවන්න වග බලාගත්හ.

මේ අතර පොඩිනා ලොකුම ලොකු ගෙයක් හදන්න පටන් ගත්තාය. අබ්දුල් මුදලාලිගේ උපදෙස් ඇතිව ඇ සියලු අමුද්‍රව්‍ය මඩකලපුවේ සිට ගෙන්වාගත්තාය. පෙදරේරුවන් විසිදෙනෙක් විතර ගේ ඉදි කිරීමේ කාර්යයට පැමිණි අතර ඇ ඔවුන්ට මුදල් ගෙවූවේ හිතූ හිතූ විදිහටය.

හැම සතියකම ඇ එම පෙදරේරුවන් විසි දෙනා මිදුලේ පෝලිම් ගැස්ස වූ අතර තඹ සල්ලි මුට්ටියක් ගෙන ගෙදර පිල්කඩ ළඟ සිට ඔවුන්ට විසි කළාය. තම ශරීර ශක්තිය අනුව එකිනෙකා සමඟ පොරකමින් ඔවුහු සල්ලි ඇහිඳගත්තෝය. එසේම එහි ප්‍රමාණයේ සීමාවක් තිබුණේ නැත. සමහර සතියක එක් අයෙකු වැඩි ආදායමක් ලැබූ අතර ඊළඟ සතියේ තවත් අයෙක් ඒ තැනට හිමිකම් කීවේය. මේ නිසා ශක්ති සම්පන්න නැති කෙට්ටු හීන්දෑරි පෙදරේරුවන් සිව් දෙනෙක්ම අනෙක් අය සමඟ සල්ලි ඇහිඳගන්න පොරකන්න බැරුව ඉවත් වී ගෙදර ගියහ. මෙසේ අන්තිමට ඉතිරි වුණේ හොඳ ශක්ති සම්පන්න පෙදරේරුවන් පමණි. ඔවුන්ගෙන් කෙසඟ හීන්දෑරි අයට වඩා දෙතුන් ගුණයක් වැඩ ගන්න පොඩිනාට හැකි විය.

මෙසේ සල්ලි විසි කළ දවසක මේ තඹ සල්ලි කීපයක් ගේ හදන්න ඇනූ පදම් කළ මැටි ගොඩක් අස්සේ සැඟවුණේය. අන්තිමට එක් පෙදරේරුවෙක් බිත්තියක් බැඳීමට ඒ මැටි පාවිච්චි කළේය. පොඩිනා දවල් වරුවේ ගනුදෙනුකරුවන් අතරතුර ලැබූ ඉස්පාසුවක හදන ගේ පැත්තට ගිය විට මැටි බිත්තියක් මැද යන්තමට දිලිසෙන තඹ කාසියක් දුටුවාය. ඇ එතන කඩන්නට ඔවුන්ට නියම කළ නමුත් තඹ කාසි කීපයක් එකතුවී බැඳුණු බිත්තිය ලේසියෙන් කඩන්න ඔවුන්ට බැරි විය. වහාම සියලු පෙදරේරුවන් කැඳවූ ඇ මෙතෙක් බැඳ ඇති සියලු බිත්ති නැවත කඩන්න නියම කළාය. ඉන්පසු මැටි කුඩ පහට තඹ සල්ලි සහ රිදී කාසි කුඩය බැගින් මිශ්‍ර කර නැවත එය බඳින ලෙස ඔවුන්ට දැනුම් දුන්නාය.

ඇ ගමේ වෙනම ඉලන්දාරියෙක් කැඳවා මැටි පදම් කර මිශ්‍ර කරන විට ඔවුන් ඒ සල්ලි හොරකම් කරනවාද බලන්න යෙදවූවාය.

The Reader's Place

...සක් උදෑසන එක් පෙදරේරුවෙක් අතක් තුවාල කරගෙන සිටින ...ට ඒ ගැන විමසා බැලූ පොඩිනා ඔහු පෙරදා රාත්‍රියේ මැද ...වූ බිත්තියකින් සල්ලි ගන්න ගොස් එය සිදු වී ඇති බව දැන ගත්තාය. එවෙලේම ඔහු ගෙදර පිටත් කළ ඇය ආයෙමත් තවත් එකෙක් එසේ කර අහු වුණොත් ඒ අහු වුණු එකාගේ පමණක් නොව උගේ පරම්පරාවේම අත් වල්ලීට කියා වැළමිට ළඟින් කඩා බිඳ දමන බව දිවුරා කීවාය.

ඉන්පසු කිසිවෙකු එසේ කරන්න බිය වූ අතර පෝලිම ගසා සල්ලි විසි කරන අවස්ථාවේ හැර අනෙක් වෙලාවක තඹ සල්ලියක් හෝ බිම වැටී හමු වුණොත් එය ඇගේ අතට දෙන්නට තරම් ඔවුහු අවංක වූහ.

මෙසේ තඹ සල්ලි සහ රිදී කාසි මුට්ටි ගණනින් බිත්තිවලට හිර වී නිම වෙන මේ ගෙදර ගැන මුළු ගමම අවධානයෙන් සිටියත් කුළුගෙඩි පහරවල් ගසා තියා නියපොත්තකින්වත් සිදුරු කර ඒ කාසි ගන්න ගමේ හැමෝම බිය වූහ.

මේ විදිහට ඇ සල්ලි විසි කරන්න තම සිත සහ ගත පාවිච්චි කළ විදිහේම උනන්දුවකින් සල්ලි හොරකම් කරන හොරුන් අල්ලන්නත් උනන්දු වුණාය. ඇ හිතූ හිතූ විදිහට අහුරු අහුරු පිටින් අරගෙන සල්ලි විසි කළාය. එහෙත් එක තඹ දොයිතුවක් හොරකම් කරනවා දකින්න කැමති නොවූවාය.

'මට පෙන්නන්න බැරි මේ හොර හැත්ත. යමක් ඕනනං ඇවිල්ල මූණට මූණ මුලිච්චි වෙලා ඉල්ලන්ඩ බැරි මොකෝ...'

ඇ නිතර කියන්න පුරුදු වී සිටියාය. එහෙත් ඇගේ මූණට මුලිච්චි වී ඇගෙන් යමක් ඉල්ලන්න ගම්මු බය වූහ. නැත්තං ලැජ්ජා වූහ. ඒ වගේම ඇ කිසිම කෙනෙකුට පිනට හෝ පසුව සල්ලි දෙන පොරොන්දුවට රහස් බේත නොදුන්නාය. නියමිත මුදල නියමිත පරිදි හැම දෙනාගෙන්ම ගත්තාය. එසේම වී, කුරහන්, අල, බතල, හකුරු, මී පැණි වගේ දෙයක හුවමාරුවට ඇ රහස් බේත දුන්නේත් ඒවායේ වටිනාකම නිවැරදිව තක්සේරු කිරීමෙන් අනතුරුවය.

රනාගේ උදව් පිට මේ සියලුම දේවල් ඇ කළමනාකරණය කරගෙන කළත් ඇ කිසිම කිසි හේතුවක් මත බිංදුට එකම එක

වේලාවවත් කිරි නොදී සිටියේ නැත. ඈ ඇගේ සියලුම වැඩ රාජකාරි අතර ඒ සඳහා ඉඩකඩ වෙන් කරගත්තාය. එසේම බිංදු ද නොපමණ කද මහත් වී උස ගියත් පොඩිනාගේ තන කිරි නැවෙන කිසිවක්ම කටේ තිබිණේ නැත. දවසේ ඕනෑම වෙලාවක පොඩිනාගේ තන මුරුල්ල කටේ ගහගෙන ඇගේ ඇඟ උඩ නැඟී ඇඟිල්ලි ඇඟිල්ලි රමණයේ කිසියම් ඉරියව්වක් මතකයට නංවමින් කිරි බීමට ඔහු පුරුදු වී සිටියේය.

එසේම බිංදු පොඩිනාගේ තන පුඩු උරන්න උරන්න පොඩිනා තරුණ වියට පත් වෙමින් සිටි බැවින් කිරි නොබොන වෙලාවක සමහරු දෙදෙනා හඳුනාගත්තේ අක්කා සහ මල්ලි ලෙසය. තවත් සමහරු ගෑනියි මිනිහයි විදිහට දෙදෙනා හඳුනාගෙන අවස්ථාද තිබිණ.

ඇත්තම කිව්වොත් දෙදෙනා අතර ඒ වගේ සම්බන්ධකමක් නොතිබුණාමත් නොවේ. පොඩිනා තම ජීවිතයේ උපරිම සුරතාන්තය ලැබුවේ බිංදුගේ දෙතොල් තම තන පුඩු අතර දවටි හිරවෙන විටය. ඔහු දෙඅත්වලින් තන පුඩු මිරිකමින් වද දෙන විටය. එසේම රෙද්ද එහා මෙහා කරමින් ඇඟ උඩ ඇඟිල්ලි ඇඟිල්ලි ඔහුගේ ලොකු පුරුෂ නිමිත්ත සිය තඟන කලවා අතර දවටෙන විටය. එවැනි බොහෝ වෙලාවක ඈ නිරායාසයෙන් කෙඳිරි ගෑ අතර බිංදු කිට් කිට්යේ ඇඟට තද කරගෙන ඈ ඔහුගේ දෙවුර විකා තිබුණාය. මෙවැනි දත් පාරවල් බිංදුගේ දෙවුර පුරාම තිබූ මුත් පොඩිනා හැම දවසකම ඒවායේ තන කිරි ආලේප කර වේලෙන්නට ඉඩ හැරියාය.

කිරි බොන වෙලාවට පොඩිනා සමඟ තිබුණු මේ සම්බන්ධතාවය හැර බිංදු වඩාත්ම ඇලුම් කළේ මැණිකා සමඟ වූ සමාගමයයි. කනේ ඇබ ගසාගත් දිනයේ පටන් හස්ත මුද්‍රාවෙන් කතා කරමින් ප්‍රසිද්ධියේම බිහිරි බවට පත් වූ මැණිකා මේ වන විට දහහතරවෙනි වියට එළඹ සිටියාය.

මීට මාස කීපයකට පෙරාතුව වැඩි වියට පත් වූ වෙලාවේදී පොඩිනා ඇගේ ව්‍යාපාරයේ නැතුවම බැරි අත් උදව්කාරිනියක වූ

වෙනුවෙන් මුළු ගමටම ආරාධනා කර ලොකු කොටහළු ගත්තාය. ඈ වෙනුවෙන් මඩකලපුවෙන් ඉස්තරම්ම රෙදිපිළි බර ගාණක් වියදම් කර, පොඩිනා අබ්දුල් මුදලාලිට කියා ගත්තාය. ඉන් පසු අබ්දුල් මුදලාලි කොටහළු ගෙදර එන අරක්කු සම්පාදනය කරන්න දැයි පොඩිනාගෙන් විමසූ ඈ කුණුහරුපෙන් බැන ඔහුව එළවාගත්තාය.

අරක්කු වෙනුවට කොටහළු මඟුල් ගෙදරට පැමිණි සියලුම ආරාධිතයන්ට ඈ සිය තන කිරි වීදුරුව බැගින් ලබාදුන්නාය. එසේම ආරාධිතයන් රැගෙන පැමිණි සියලුම තෑගි ප්‍රතික්ෂේප කළ ඈ පැමිණි හැම කෙනෙකුටම රිදී කාසිය බැගින් දුන්නාය. මේ ගැන ආරංචි වී කොටහළු මඟුලට නොයන්න හිටි සමහරු අන්තිමට ඇගේ ගෙදරට පැමිණ හොඳට කා බී ඈ දුන් රිදී කාසියත් රැගෙන ගෙදර ගියහ.

වැඩි වියට පත් වීමෙන් අනතුරුව මැණිකාගේ ශරීරයේ සිදු වෙමින් පැවති වෙනස්කම් දෙස බිංදු වඩාත් අවධානයෙන් බලා සිටියේය. බලා ඉද්දී වගේ ඇගේ ළැම ඉස්සෙමින් පියයුරු මතු වන අයුරු ඔහු විස්මයට පත් කළේය. සමහර දවසක ඔහු කාටත් හොරෙන් ඇයට උඩුකය නිරුවත් කරන්න යැයි කියා ඇගේ කුඩා පියයුරු දෙස මුළු දවසම බලා සිටියේ එය වැඩෙන හැටි සිය ඇස් දෙකෙන්ම බලාගැනීමේ ආශාව නිසාය.

මේ කාලය වන විට බිංදුත් මැණිකාත් ඔවුන් බොහෝ කල් කතා කළ හස්ත මුද්‍රා භාෂාව අත්හැර තිබුණෝය. ඒ වෙනුවට ඔවුහු අක්ෂි මුද්‍රා භාෂාව හෙවත් ඇස්වලින් කතා කිරීමේ භාෂාව පුහුණු කරමින් සිටියෝය. සමහර දවසක දෙදෙනා මූණට මූණ බලාගෙන ඇසට ඇස බලාගෙන පැය ගණන් නිහඬව සිටියහ. තවත් සමහර දවසක අමු නිරුවතින් දෙදෙනා දෙදෙනාගේ සිරුරු දිහා බලාගෙන පැය ගණන් නිහඬව ගත කළහ. එහෙත් එකිනෙකාගේ සිරුරු යන්තමටවත් ස්පර්ශ නොකළහ. පැ ගණන් එසේ නේත්‍රාරම්මණයෙන් සිටියත් ඒ කාලයේ දෙදෙනා කෙතරම් එකිනෙකා සමඟ කතා බහ කළේ දැයි දන සිටියේ ඒ දෙදෙනාම පමණි.

මේ නිහඬ කතා බහට දෙදෙනා කෙතරම් ඇබ්බැහි වූවාද කියතොත් මිනිසුන් වචන පාවිච්චි කරන්නේ මොන හේතුවකටදැයි කියා තේරුම් ගන්න දෙදෙනාටම බැරි විය. දෙදෙනාගෙන් කා හෝ අනෙකාට යමක් කියන්න ඕනෑ වූ විට දෙදෙනාම කළේ අනෙකාගේ මූණ බැලීම පමණි. ඒ බැල්මෙන්ම අනෙකා කියන දේ තේරුම් ගන්න දෙදෙනාටම පුළුවන්කම තිබුණේය.

මේ නිසා මැණිකාත් බිංදුත් අතර වූ මේ සමාගමය, ඔවුන්ගේ සිරුරු අභිබවා ඔවුන්ගේ හැඟීම් අභිබවා ඔවුන්ගේ ගැහැනු පිරිමි බවත්, වයසත් අභිබවා ඉහළට විහිදුණු ආශ්චර්යමත් විරාගික සමාගමයක් වුණේය.

කෙසේ වෙතත් කතේ ඇබ ගසාගත් දිනයේ සිට බිංදු හැර අනෙක් අය සමග හස්ත මුද්‍රා භාෂාවෙන් කතා කිරීමට පුරුදු වී සිටි මැණිකා බිංදු කරණ කොටගෙන අක්ෂි මුද්‍රා භාෂාවට වඩාත් ළං වත්ම ඇගේ ඇස් වඩ වඩාත් තීව්‍ර වන්න පටන් ගත්තේය. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සම්බන්ධ ඉන්ද්‍රියයන් අතරින් රූප ඉන්ද්‍රිය අති ප්‍රබල වන්න පටන් ගත්තේය. බඹ ගාණක් ඈත ගහක වැලක බිමක සිටින කාම්බෙයකු, කූඹියෙකු ඇ අති සමීප ලෙස දුටුවාය. යොදුන් ගාණක් ඈත ආකාසයේ ඇහැට නොපෙනී පියාසර කරන පක්ෂීන් ඇ සමීප රූප ලෙස දුටුවාය.

මේ අතර ඇ නිතර අත හෝදන්න පටන් ගත්තාය. විශේෂයෙන් රහස් බේත සඳහා බෙහෙත් පැළෑටි තෝරන විට අතේ ගෑවෙන පස් දූලි සෝදාගන්න ඇ පැය ගාණක් ගත කළාය. සති ගාණක්ම ඒ ගැන විමසිල්ලෙන් සිටි පොඩිනා දිනක් ඒ ගැන ඇගෙන් විමසූ විට ඇ පිළිතුරු දුන්නේ ඇගේ අතේ සතුන් සිටිනවා කියාය. ඇට විකාර මනස්ගාත පෙනෙන බව පොඩිනා තේරුම් කළත් මැණිකා තම අතේ තැන් තැන් පෙන්වමින් කීවේ ඒ ඒ තැන්වල සහතික ලෙසම සතුන් සිටින බවය. අන්තිමට පොඩිනාගේ අත් දෙකත් තම අතට ගත් මැණිකා ඇගේ අතේ තැන් තැන් පෙන්වමින් ඒ ඒ තැන්වලත් සතුන් සිටින බව කීවාය. එහෙත් ඒ කිසිම සතෙකු තියා සතෙකුගේ සලකුණක්වත් නොදුටු පොඩිනා ඇට යම් තරමක පිස්සුවක් හැදීගෙන එන බව පැවසුවාය.

'ඔහොම හෝදන්න ගත්තම උඹේ අත දියවෙයි. ඊළඟට උඹ කියයි මුළු ඇඟේම සත්තු කියලා. ඊළඟට මුළු ඇඟම හෝදන්න ගත්තම උඹ දියවෙලාම යයි.'

ඇත්තටම අන්තිමට සිද්ධ වුණේ ඒකය. අතෙන් පටන් ගත් මැණිකාගේ හේදිල්ල ඊළඟට ඇගේ මුළු ඇඟටම බෝ වුණේය. මේ අනුව ඇ දවසට දහදොළොස් වතාවක් ඇඟ හෝදන්න පුරුදු වුණාය.

නමුත් පොඩිනා කියූ විදිහට මැණිකාගේ මේ සතුන් දකීම විකාරයක් නොවීය. මනස්ගාතයක් නොවීය. සහතික ලෙසම පිස්සුවක්ද නොවීය. බාග වෙලාවට කුඩා ජීවීන් තම පියවි ඇසින් දුටු ලොව පළමු ගැහැනිය වන්නට ඇත්තේ ඇයය.

මැණිකාගේ මේ ඇස්වල තීව්‍රතාවය සැබවින්ම පුදුමාකාර විය. බිංදු හැර අනෙක් සියල්ලන්ම ඇ ඉදිරියට ආවේ ඇඳුමක් පැළැඳුමක් හැඳගෙන වුවත් ඇ ඒ සියල්ලන්ම සිය ඇසින් නිරුවත් කළාය. ඔවුන්ගේ සිරුරවල රෝම කූප, මවිල්, පුරුෂ ලිංග, ස්ත්‍රී යෝනි පමණක් නොව දද, කුෂ්ඨ, තුවාල කැළැල් පවා ඇ සිය ඇසින් දුටුවාය. එසේම ඒ ශරීරවල තැන් තැන්හි සැරිසරන සතුන් හෙවත් කුඩා ජීවීන්ද දුටුවාය.

ඒ විතරක් නොව ඒ මතුපිට සිරුරට හෙවත් සමට යටින් තිබෙන අස්ථිපංජරය පවා ඇය දුටුවාය. ඉන්ද්‍රියකින් ඉන්ද්‍රියකට මාරුවෙමින් ඔබ මොබ දුවන මිනිස් සිරුරේ රතු රුධිරයද ඇය දුටුවාය.

වරක් රහස් බේත මිලදී ගන්න නිතර නිතර ආ ගිය මැදිවියේ මිනිසකුගේ හදවත සාමාන්‍ය වේගයට වඩා වේගයෙන් ගැහෙන හැටි ඇ දුටුවාය. ඇ ඔහුට කීවේ ගෙදර යන්න කලින් වෙද රාළගෙ න් බෙහෙත් අරගෙන යන ලෙසයි. ඇත්ත වශයෙන්ම ඒ වන විටත් ඔහු තරමක ක්ලාන්ත ගතියකින් සහ දැඩි තෙහෙට්ටුවකින් සිටි අතර ඔහු වහාම වෙද රාළ සොයා ගියේය. පසුව දැනගන්න ලැබුණේ රහස් බේත දිගින් දිගටම පාවිච්චි කරමින් දවසට දහ දොළොස් සැරයක් ලිංගික කටයුතුවල යෙදීම ඔහුගේ වයසට ඔරොත්තු නොදීම නිසා ඔහුගේ හෘද ස්පන්දනය අසාමාන්‍ය ලෙස

The Reader's Place

[illegible] ඒ [illegible]. එහෙත් මෙහෙත් [illegible] වගේ [illegible] කරගැනීමෙන් [illegible] ජනප්‍රියතාව [illegible] පත් කරගත හැකි විය. තවත් වගේ [illegible] දක්ෂ කළා යැයි සැක කළ

[illegible] මියගිය ගමේ තරුණයෙකුගේ මළ දෙදර [illegible] සිරුරේ හිස ඇතුළේ තිබුණු වෙඩියක් දක ඔහු මියගොස් [illegible] [illegible] විනෙන් නොව හිස ඇතුළේ තිබූ ඒ වෙඩිය [illegible] හස්ත මුද්‍රා නාමයෙන් කීවාය. මිය ගිය තරුණයාගේ අප්පුච්චා [illegible] සිරුරේ ඔළුව අතගා මැලුවක් එවැනි වෙඩියක් නොගන්න බැරි වූ තැන ඇට දොස් තබමින් ඔහු ඈ එළවාගත්තේය. ඒ වෙඩිය තිබෙන්නේ හිසට පිටතින් නොව හිස ඇතුළේ බව ඈ තේරුම් කරදෙන්න හැදුවත් ඔහු එය පිළිගත්තේ නැත.

මේ විදිහට එක අතකින් ඇගේ මේ ඇසේ සිව්රතාව ඇයට මහ වදයක් වුණේය. තවත් අතකින් යම් ආශිර්වාදයක් ද වුණේය. ඒ කොයි හැටි වෙතත් සාමාන්‍ය ස්වභාවයෙන්ම තියෙන්ද ගැහැනියක වූ මැණිකා බැරිම වෙලාවක හැර අනෙක් හැම විටකම මේ අසාමාන්‍ය ස්වභාවය තමා තුළම හිර කරගෙන සිටියාය. [illegible] සමග ඈ වෙහෙසවූයේ ඇගේ සිත පමණි. ඇස [illegible] අතර වූ මේ ගනුදෙනුවට ඕනෑ විදිහට කටයුතු කරන්න ඉඩ හැර ඈ ඇගේ අනෙක් ඉන්ද්‍රියන් වෙහෙස කරන එක හැකි තරම් අවම කළාය. එහෙත් බිංදුගේ සමාගමයත් දවසට දහදොළොස් වතාවක් ඇග හෝදන පුරුද්දත් ඈ කිසිසේත් අත් නොහැරියාය.

ගම් වැසියන් බිංදු ගැන දන සිටියේ ඉපදුණ දා සිට පොඩිනාගේ තන කිරි පමණක් බොන වයසට වඩා වැඩුණු ඇගක් හා මොළයක් තියෙන පෝරිසාදයෙක් විදිහට පමණක්ම නොවේ. ඒ සියල්ලටම වඩා ගමේ සිටි අසාමාන්‍ය ශක්තිවන්තයා විදිහට ප්‍රසිද්ධව සිටියේත් මේ අටවැනි වියට එළඹ සිටි දරුවාය.

ඒ සිද්ධිය සිද්ධ වුණේ මීට මාස කීපයකට පෙර දවසකය. අනෝරා වැස්සකට පෙරාතුව තදින් හුළං හමා ගිය ඒ දවසේ සියල්ලන් බලා සිටිද්දී නිවස ඉදිරිපිට අහසේ බාගයක් තරමට උස ඇති මහත දෙහෙත තඩි කොහොඹ ගහ එහාට මෙහාට

[illegible] අලුත තනමින් සිටි [illegible] ඒ සමයම ඇඹිල්ලකින් [illegible] වැටෙන කොහොඹ ගසේ කඳට දාත් [illegible] ගත්තේය. කොහොඹ ගස අලුත බැඳි [illegible] වෙනුවට බිංදුගේ දැත් මත තබා [illegible] සෙමින් ඔහුට අයින් වෙන්න කිවත් අලුත් [illegible] පැමිණ ගසේ අතු ඉති සිඳ [illegible] බඳාගන්න බැරි ගසේ කඳ කපා [illegible] පුරා සිංහල දෙපැයක් ඔහු ඒ මහත දෙහෙත [illegible] රඳවාගෙන සිටියේය.

[illegible] සියල්ල අවසාන වී අත් දෙක පිහදාගෙන ගෙදරට [illegible] වීට රැස්ව සිටි සියල්ලන්ම ඔහුගේ මුළු සිරුරම ස්පර්ශ [illegible] විමසා බැලුවේ ඔහුගේ සිරුරේ බිඳුණු ඇටකටු ප්‍රමාණය [illegible] කර දැනගන්නය. එහෙත් ඔහුගේ එක රෝම කූපයකටවත් [illegible] අනතුරයක් සිද්ධ වී නොතිබුණේය.

මේ සිද්ධියෙන් පසු ගමේ ලොකු ගහක් පෙරළ ගන්න ඕන [illegible] ගම්මු බිංදු ළඟට ඇවිත් පිංසෙණ්ඩු වෙන්න පටන් ගත්හ. [illegible] තරම විශාල වුණත් උස වුණත් පිදුරු ගහක් එහා [illegible] කරන පරිද්දෙන් කීප වරක් සොලවා බිම දම්මේය. ඊළඟට [illegible] එහා මෙහා කරගන්න ඕනෑ වූ විට තැතිනම් මෙල්ල ලොකු ගලක් එහා මෙහා කරගන්න ඕනෑ වූ විට නැතිනම් මෙල්ල කරගන්න බැරි හරකෙක් දණ ගස්වාගන්න ඕනෑ වූ විට එසේත් නැතිනම් විස්සක තිහක ශක්තියෙන්වත් එහා මෙහා කරගන්න බැරි කරත්තයක් තල්ලු කරගන්න ඕනෑ වූ විට ගම්මු බිංදු සොයා ගෙන ආහ.

මේ අතර බිංදුගේ අසාමාන්‍ය ශක්තිය පිළිබඳ නොයෙක් කතා ගමේ පැතිරෙන්නට වූ අතර එයින් වඩාත් ජනප්‍රිය වූයේ දිනක් කැළෑ පාරකදී බිංදුගේ ඇගේ හැපුණ උස යෝධ අලියෙක් ගව්වක් විතර ඈතට විසි වී ගහක වැදී කකුලක් කඩාගත් ප්‍රවෘත්තියයි. ගමේ වෙද රාළ සහතික කර කීවේ ඒ අලියා තමන් උපන්නේකට දුටු සද්දන්තම අලියා බවත් ඌ කකුල කඩාගෙන ඇවිදගන්න බැරුව කෙඳිරි ගාමින් සිටියදී ඔහු බෙහෙත් පත්තුවක් බැඳ සුව කළ බවත්ය.

The Reader's Place

කෙසේ වෙතත් ගම වැසියන් බිංදුගෙන් ගත් මේ ප්‍රයෝජන නිසා ගමේ ගස් කැපීමෙන් සහ ගස් බිම දැමීමෙන් ජීවිකාව කරගත් දෙදෙනෙකුට පිට ගංවලට ගොස් වෙන රස්සා සොයාගන්ට සිදු විය.

පොඩිනාගේ රහස් බෙත් වෙළෙඳාමේ වැඩ කළ උක්කුවාත්, ගුණයාත් එහි රහ වැටී ඒ බෙහෙත් වට්ටෝරුව අරගෙන වෙනම ව්‍යාපාර පටන් ගන්න පිටත් වී ගිය තැන් පටන් පොඩිනා කිසිම කිසි අතරමැදියෙකු විශ්වාස නොකළාය. ඒ වගේම දීර්ඝ කාලයක් තිස්සේ ඈ ළඟ සිටි බණ්ඩියාත් ඈ ඕනවට වඩා විශ්වාස නොකළාය. ඇට ඕන තරම් යහමින් මුදල් තිබූ නිසා ඈ සිය ව්‍යාපාරයට පමණක් නොව සියලු ආවතේව වැඩවලට තව මිනිසුන් තුන් දෙනෙකුත් ගැහැනුන් දෙදෙනෙකුත් වැඩට ගත්තාය. ඈ පෙදරේරුවන් විසි දෙනෙක් යොදවා තඹ, රිදී කාසි බිත්තිවල ඔබ්බවා දැවැන්ත ගෙයක් හදන්න පටන් ගත්තේ මේ සියලු මිනිසුන්ට ඉඩ පාඩු ඇතිව ඉන්න පුළුවන් වන විදිහටය. එහෙත් ඒ සියලු මිනිසුන් අතරින් ඈ විශ්වාස කළේ රනාත්, මැණිකාත් පමණි. ඒ සමඟම දවසින් දවස මෝරමින් සිටි බිංදුවත් ඈ සිය ව්‍යාපාර කටයුතුවලට හවුල් කරගත්තාය.

පොඩිනා මැණිකා කෙරෙහි දක්වූ මේ විශ්වාසය නිසා කලින් ගෝමරී ළඟ සිටිමින් පොඩිනාගේ ගෙදරට යමින් එමින් සිටි මැණිකාට ගෝමරීගේ ගෙදර අතහැර පොඩිනාගේ ගෙදරම නවතින්න සිදු විය. අනෙක් අතට මැණිකා බිංදු සමඟ පැවති ළෙංගතුකම ගෝමරීගේ ගෙදර හැර යන්න ඇයට තවත් අනුබලයක් වුණේය.

මේ සියල්ලෙන්ම සිදු වූයේ හදවතේ ඩිග් ඩිග් ශබ්දය විතරක් ඇහෙන දනට අවුරුදු හයක විතර කාලයක් තිස්සේ සිහි මූර්ඡාවෙන් සිටින පුංචා සමඟ ගෝමරී ඒ කට්ට කළුවර ගෙදර තනිවීමය.

මේ වනවිට ගෝමරී තිස් පස්වන වියට එළඹ සිටියත් ඒ වගේ දෙගුණයකට ආසන්න පෙනුමක් ඈ කෙරෙන් දක්නට

...ණේය. යන්තම් විසි අට වන වියට එළඹෙන විට ඈ දරුවන් ...ව දෙනෙකු වැදූ මවක වී සිටියාය.

ඇගේ ලොකු පුතා සේදරා ගමේ කඩයක් කරන බෙබද්දෙකු සහ සල්ලාලයෙකු වී සිටියේය. ඇගේ ලොකු දුව වල්ලි දැනුම් තේරුම් ඇති වයසේ සිටම ඇයට සාප කළ අතර අන්තිමට ඈ මියගියා යයි සලකා ඒ මියගිය ඇගේ ආත්මයේ ආවේශයෙන් සාස්තර කියමින් සිටියාය. ඇගේ ඊළඟ පුතා විකිරි තුවක්කුවක් කර තියාගෙන දකින දකින සතා සිව්පාවා පසුපස පන්නන මස් වැද්දෙකු වී සිටියේය. විකිරිට බාලයා වූ රනා ලොකු හාමුදුරුවන්ගේ කඩුව අරගෙන කැරැල්ලට ගොස් සිටියේය. පොඩිනාගේ වෙළෙඳාමේ සේවිකාවක වූ මැණිකා කන් දෙක් ඇබ ගසාගත් බිහිරියක වී සිටියාය. පවුලේ බාලම කෙල්ල වූ එතනා සොබනීගේ දේව දරුවන්ගේ ආයම්මා වී සිටියාය. ඇබිත්ත උන්නාන්සේ හෙවත් සුදු බණ්ඩාට දාව ඈ බිහි කළ බිංදු මුළු ගමේම ශක්තිවන්තයා වී සිටියත් ඔහු තම වැදූ මව කව්ද කියාවත් නොදන්නා අමුතුම විදිහේ පෝරිසාදයෙකු වී සිටියේය.

ඒ විතරක් නොව අවුරුදු දාහතරක නාඹර කෙල්ල කාලයේදී හැඩි දැඩි වලස් අත් දෙකකින් ඈ උස්සාගෙන ඇවිත් අවුරුදු දාහතරකට ආසන්න කාලයක් ළමයින් හත් දෙනෙකු වදන්න ඇට වග කියූ පුංචි රාළ ඇගේ කුසින් ඈ වැදූ වල්ලි සමඟ ගොස් අන්තිමට ගමෙනුත් අතුරුදන් වී සිටියේය.

අවුරුදු දාහතරේ සිට අවුරුදු විසි නවය දක්වා ඈ වෙලාවක් අවේලාවක් නැතිව රැයක් දවාලක් නැතුව අනේක වාරයක් රමණයේ යෙදී ඇති නමුත් ඒ සියල්ලෙන්ම ඇගේ මතකයේ ඉතිරි වී තිබුණේ එවකට යන්තම් අවුරුදු දාහතරක කොලු ගැටයෙකු වූ සුදු බණ්ඩා සමඟ නිදිවැදුණු අවස්ථා කීපය විතරය. ඉතිරිව තිබුණු ඒ එකම මතකයත් සිය මිනිහා තම කුසින් වැදූ දියණිය සමඟ ගිය දවසේ සිට ඈ අමතක කර දැම්මාය. ඊළඟට වල්ලි ඇගේ ආවේශයෙන් සාත්තර කියන්න ඈ පණ පිටින් මරා දැමූ දවසේ සැබවින්ම ඈ පණ පිටින් මිය ගියාය.

The Reader's Place

එතැන් පටන් ඇගේ මතකය ක්‍රම ක්‍රමයෙන් බිඳ වැටෙන්නට වූ අතර අවසානයේ තමා මිනිසුන් සමග නිදිවැදුණ බව පමණක් නොව එහි ප්‍රතිඵලයක් විදිහට තම කුසින් දරුවන් බිහි කළාය කියන මතකයක් හෝ ඈ තුළ නොවිය.

ඉදහිට ඇගේ දරුවන් ඈ බලන්න ආ විට ඒ කව්ද කියාවත් ඈ හඳුනා නොගත්තාය. සමහර වේලාවට දරුවන් එසේ ආ විට ඈ ගෙයින් එළියටවත් නොබැස්සාය. අන්තිමට දරුවන්ටත් ගෝමරී තමන්ගේ අම්මාය කියන මතකය අමතක වෙන්න පටන් ගත්තේය.

එපමණක් නොව තමා සැබවින්ම ආසාවෙන් රමණයේ යෙදුණු සුදු බණ්ඩා හෙවත් ඇබිත්ත උන්නාන්සේද ඇයට ක්‍රම ක්‍රමයෙන් අඳුනගන්ඩ බැරි වුණේය. දවසක් ඇබිත්ත උන්නාන්සේ අඳනකඩය උඩින් සිවුරකුත් දාගෙන ගමනක් ගොස් එමින් ගමන් ඇගේ ගෙදරට ගොඩ වැදුණු විට ඈ අසා තිබුණේ 'ඔබ වහන්සේ කාව හම්බ වෙන්ඩ ආවා' දැයි කියාය.

මුලදී මුලදී ඈ තමාගේ ගෙදර තම කුසින් බිහි කළ මැණිකා සිටින බව දැන සිටියාය. එහෙත් කල් ගත වත්ම ඒ කව්ද කියා ඇට අඳුරගන්න බැරි විය. ඇට සම්පූර්ණයෙන්ම ඇගේ නම අමතක වූ අතර ඈ සිතා සිටියේ මැණිකා තමන්ට උදව් කරන්නට ආ පිට ගෙදරක කෙල්ලක් කියාය.

'අර කල්දේරමේ බෙහෙත් වතුර ටික රත් කරලා ඉක්මනට පලයං... උඹලෑ අම්ම උඹ එනකං බලාගෙන ඇති...'

ඈ කීප වතාවක්ම මැණිකාට එසේ කියා තිබුණාය. එහෙත් මැණිකා හිතුවේ සිය මව තමා පොඩිනා ළඟ නිතර ඉන්නා කේන්තියට එසේ කියන්නට ඇති බවය.

සියලුම මතකයන් ඈ කෙරෙන් අමතක වුණත් එකම එක මතකයක් පමණක් ඇගේ හිතේ ඉතිරි වී තිබුණේය. ඒ පුංචා කියන නමය. නිවසේ එහා මෙහා ඇවිදින ගමන් පන් පැදුරේ නිදාගන්නා ගමන් ඈ ඒ නම නිතර නිතර කියෙව්වාය. ඒ වගේම පුංචා තමාගේ පුතෙකු බව ඇගේ මතකයේ තිබුණේය. ඇත්තම කීවොත් තමාට සිටින එකම දරුවා පුංචා බවය, ඇගේ මතකයේ තිබුණේ. එහෙත් ඔහුගේ පියා කව්ද, ඔහු ඉපදුනේ කවදාද, ඔහුට කුමක් සිදු වීද කියන කිසිදු මතකයක් ඇට තිබුණේ නැත. ඈ දැන සිටියේ [illegible] හැමදාම මේ විදිහට ඉන්නා බවත්, තමා හැමදාම මහුව මේ [illegible] බලා කියාගන්නා බවත් පමණය.

මේ වන විට පුංචා පහළොස්වන වියට එළඹ තිබුණේය. හත්වෙනි වියේදී ගෝමරී දැක සිහි මූර්ජා වූ දිනයේ සිට ඔහු ඇස් ඇරියේ නැත. කතා කළේ නැත. කෑම කෑවේ නැත. වතුර බිඳක්වත් බීවේ නැත. එහෙත් ඔහුගේ හුස්ම හොඳට වැටුණේය. හදවත කෙතරම් ප්‍රාණවත්ව ලේ ගමනාගමනය සිදු කළාද යත් පපුවෙන් මතු වූ ඩිග් ඩිග් ශබ්දය බඹ ගාණක් ඈතට ඇහුණේය. ඔහුගේ නියපොතු වැවුණේය. කෙස්ස වැවුණේය. මවිල් ගස් මතු වුණේය. රැවුල් ගස් ආවේය. කෙතරම් වේගයකින් ඔහු උස ගියේද යත් ගෝමරීට ඔහුගේ උස මැනීම සඳහා භාවිත කළ කණුමැල්ල ඉනි සති තුනෙන් තුනට අලුත් කරන්න සිද්ධ වුණේය.

මෙසේ මුළු ලෝකයෙන්ම වසන් වී සිටි පුංචා මුළු ලෝකයටම හොරෙන් දවසින් දවස වැඩෙමින් සිටියේය. පුංචි රාළගේ පවුලේ සියල්ලන්ටමත්, මුළු ගමටමත් පුංචා කියා කොල්ලෙකු ගමේ සිටි බවක්වත් අමතක වී තිබුණේය. එහෙත් තම පවුලේ සියල්ලන්මත්, මුළු ගමමත් අමතක වූ ගෝමරීට පුංචා ගැන විතරක් මතකයේ තිබුණේය.

මැණිකා සහමුලින්ම ගෝමරීගේ ගෙදර අත හැර පොඩිනාගේ ගෙදර පදිංචියට ගිය විට පොඩිනා ලැයිසා නම් කාන්තාවක් ගෝමරීගේ අත් උදව්වට පත් කළාය. තරමක් උස, මිනිහෙකුගේ වාගේ පළල් උරහිස් ඇති, ආඩම්බර ගැහැනියක වූ ලැයිසාට ප්‍රධාන වශයෙන් කරන්නට තිබුණේ හැම උදෑසනකම ලොකු කල්දේරමකට බෙහෙත් වතුර උණු කරන එකය. ඊට අමතරව ගෝමරීට කන්න මොනා හෝ ලෑස්ති කිරීමත්, ඉදහිට දවසක පුංචාගේ උස මනින්න කණුමැල්ල ගහකින් ඉනි කපාගෙන ඒමත්, දවස් දෙක තුනකට සැරයක් කොහොඹ කොළ කඩා පුංචාගේ තට්ටම්වලට යටින් තැබීමත්, වැනි රාජකාරී අතළොස්සක් පමණි, ඇට කරන්නට තිබුණේ.

ලැයිසා පැමිණියේ ගෝමරීගේ අත් උදව්වට ඇගේ ආවතේවකම් කරන්නට වුවත් ගෝමරී හිතුවේ ඇය තමන් ඉන්නා ගෙදර අයිතිකාරිය නෙවත් තමාගේ ස්වාමි දුව බවය. ඒ නිසා ගෝමරී ලැයිසාට වචනයක්වත් කියන්න බිය වූ අතර ඇ ගෙදර ඇති තැනකින් ගෝමරී එහා මෙහා ගියේ සද්ද නොනැගෙන්න කකුල් බිම නොතියා ඇඟිලි තුඩුවලින් සීරු මාරු වෙමිනි.

සමහර දවසක ලැයිසා කරන්න වැඩක් නැති නිසා ගෙයි පිලේ පොඩි බංකුවක වාඩි වී පැ ගණන් නිදි කිරුවාය. පිලට යාබද කාමරයේ සිට එළියට යන්න නම් ඈ නිදි කිරූ තැනින්ම යා යුතුව තිබූ බැවින් එවැනි දවසක ගෝමරී දොට්ට පිලට යන්නවත් එළි නොබැස්සාය. මේ නිසා ඈ එවැනි දවසක සුළු දිය පහ කරන්න පරණ පොල්කටු ළඟ තබාගත්තාය. දවසක් මෙසේ මුත්‍රා පිරුණු පොල්කටු දහයක් ගෝමරී මොහොතකට එළියට ගිය වෙලාවක පුංචාගේ ඇඳ යටින් ලැයිසා සොයාගත් අතර ඒවා පරණ බෙහෙත් දියරයක් යැයි සිතා ඈ ලොකු බරණියකට වත් කළාය. මෙසේ හැම දවසකම පරණ පොල්කටුවල මේ බෙහෙත් දියරය ලැයිසාට හමු වූ අතර අර පරණ බරණිය මදි වී ඊට වඩා විශාල බරණියක් ඒ සඳහා වෙන් කරන්න ඇයට සිදු විය.

පැමිණි මුල් දවස්වල ලැයිසාට ගෝමරීගේ මේ සිතිවිලි විපර්යාසය ඇත්තටම තේරුණේ නැත. එහෙත් ලැයිසා මෙතන මොකක් හෝ පටලැවිල්ලක් තියෙන විත්තිය තේරුම් ගත්තේ ගෝමරී දවසක් ඇගෙන් මෙසේ ඇසූ දවසේය.

'මං මේ ඇතුළ ගේ පාවිච්චි කළාට කමක් නැද්ද මන්ද..අකමැතිනං මට ගෙයි පිලට වුණත් මාරුවෙන්න පුළුවනි...'

එදා සිට ලැයිසා සැබවින්ම ගෝමරීට අනුකම්පා කළාය. ඈ තමාට කිසිම කිසි වැඩක් නොකියන බවත් තමාට බිය වී මුලු ගැන් වී සිටින බවත් ඈ තේරුම් ගත්තාය. ඒ නිසා කිසිම විධානයක් නැතිව සියලු වැඩ කරන්න ඈ පුරුදු වුණාය.

මෙසේ ගෙදර වැඩ සියල්ල කිසිම අඩුපාඩුවක් නැතිව හැමදාම සිද්ධ වන විට ගෝමරී හිතුවේ ඒ සියල්ල සිද්ධ වෙන්නේ දේව හාස්කමකින් කියාය.

පුංචා නාවන්න ඇට වතුර උවමනා වන විට ගෙයි පිළිකන්නේ බෙහෙත් වතුර කල්දේරම ගින්දර උඩ පැසව පැසවා තිබුණේය. අලුත් කණුමැල්ල ඉන්නාක් ගැන හිතන විට එය ඇතුළ ගෙට ඇවිත් තිබුණේය. පුංචාගේ තට්ටම්වල රස්තයට කොහොඹ කොළ අස් කරන්න ඕනෑ යයි හිතන විට අලුත් කොහොඹ කොළ එතැනට ඇවිත් තිබුණේය. තමන්ගේ මුත්‍රා කුඩිලය ඉවසන්න බැරුව පුංචාගේ ඇඳ යට තිබෙන පරණ පොල් කටු අස් කළ යුතු යයි ඈ හිතන විට ඒවා ඇඳ යටින් අතුරුදන් වී තිබුණේය.

එසේම මේ සියල්ල සිදු වන්නේ අදෘශ්‍යමාන දේව හාස්කමකින් පමණක් නොව මේ ඇඳ මත සිහි මූර්ජා වී සිටින පුංචාගේ ඇති කිසියම් බලයකින් බව ඈ විශ්වාස කළාය. ඒ අනුව පුංචා වූ කලී මිනිස් ප්‍රාණියක් නොව දේව ප්‍රාණියක් බව ඈ ප්‍රත්‍යක්ෂ කරගත්තාය. එතැන් සිට ඈ හැම දවසකම හවස් වරුවේ ගිනි කබලකට පොල්කටු අඟුරු ලැස්ති කර දේව ස්තෝත්‍ර කියමින් පුංචාගේ ඇඳ වටේට දුම් අල්ලන්න පටන් ගත්තාය.

ඇගේ මේ දේව ප්‍රාණියාගේ බලය කෙතරම්ද යත් ඈ තමා විසින් ගිනි කබල ලැස්ති කළේ පළමුවන දවසේ විතරය. දෙවන දවසේ ඈ මේ වතාවත සඳහා සූදානම්ව ගිනි කබල ලැස්ති කරන්න එළියට අඩිය තියන විට ඇතුළ ගෙයි උළුවස්ස ළඟ ගිනි ගෙන දුවෙන පොල්කටු අඟුරු සමඟ ගිනි කබලත් දුම්මලත් ඈ වෙනුවෙන් ලැස්ති වී තිබුණේය.

පුංචා දේව ප්‍රාණියෙක් බව තේරුම් ගැනීමත් සමගම ඈ තවත් යථාර්ථයක් හඳුනාගත්තාය. එනම් ඇගේ ස්වාමි දුව ලැයිසා මේ ගෙදර ඇට ඔහේ ඉන්න ඉඩ හැර ඈට වචනයකින්වත් කිසි දොසක් නොකියා සිටින්නේ මේ දේව ප්‍රාණියාගේ බලය නිසා බව ඈ තේරුම් ගත්තාය. ඒ තේරුම් ගැනීමත් සමඟ ඈ තුළ ලැයිසා කෙරෙහි තිබූ ස්වාමි භක්තිය තව තවත් වැඩි වර්ධනය වුණේය. තමා තම ස්වාමි දූව වෙනුවෙන් කිසිම යුතුකමක් ඉටු නොකරන කමකට නැති සේවිකාවක බව හඟිමින් ගෝමරී තමාටම දොස් පවරාගත්තාය.

The Reader's Place

'අනේ මන්ද... මට ඇඳුම ටික හරි හෝදල දෙන්න වෙලාවක් නැති එකනේ වැරැද්ද ?...'

දවසක් ලැයිසා ගෙයි පිලේ සිය මිටි බංකුවේ ඉඳගෙන නිදි කිරමින් සිටින විට බෙහෙවින්ම බය පක්ෂපාතව ඇ එසේ කියා තිබුණාය.

තවත් දවසක පොඩිනා කුමක්දෝ අමතර වැඩක් පවරන්න ලැයිසා සොයා ගෙදරට ඇවිත් ඈ උයන ගෙයි වැඩ අහවර කර එනතෙක් ගෙයි පිලේ මිටි බංකුවේ ඉඳගන්න ලෑස්ති වූ විට ගෝමරී වහා එළියට පැමිණ පොඩිනාට තර්ජනය කළාය.

'ඔය මිටි බංකුවෙ ඉඳගන්නව එහෙම නෙවෙයි... වෙන ඕන තැනකින් ඉඳගන්ඩ...'

මෙසේ ගෝමරී තුළ ලැයිසා කෙරෙහි තිබූ ස්වාමි භක්තිය කෙතරම්ද යත් ඈ හම් කඩක ගල් පතුරකින් 'ලැයිසා' යනුවෙන් තමන් දන්නා එහෙත් කවුරුන්වත් නොදන්නා සංකේත භාෂාවකින් සටහන් කර එය ඇතුළු ගෙයි බිත්තියේ එල්ලා එතැන හැම දවසකම පහනක් පත්තු කර දුම් අල්ලා වන්දනාමාන කිරීම පුරුද්දක් කරගත්තාය.

ලැයිසාට තිබූ මේ බිය මුසු ගෞරවය නිසා ගෝමරී කෙමෙන් කෙමෙන් මේ ආගන්තුක ගෙදර ඇගේ කුටිය තුළටම කොටු වුණාය. ලැයිසා නම් ස්වාමි දුවට ගෞරව කළ හැකි එකම මඟ ඇට කරදර නොකර කුටියට වී සිටීම බව ඈ තේරුම් ගත්තාය.

දොට්ට පිලට යන්ට විතරක් එළියට පහළියට ගිය ඈ ඒ පුංචි කුටිය තුළ සිය එකම පුතු පුංචා සමඟ වෙනම ලෝකයක් හදාගත්තාය. පුංචාගේ පපුවෙන් නැඟුණු ඩිග් ඩිග් හඬට සමාන රිද්මයකින් ඇගේ පපුවද ගැහෙන බව හඳුනාගත් ඈ ඒ හඬ තමාගේම පපුවෙන් නැඟෙන්නක් බව විශ්වාස කළාය. ඒ අනුව පුංචාගේ කුටියෙන් මඳක් හෝ ඈතට යන විට ඒ හඬ අඩුවීම ඇට දැනුණේ තමාගේ හදවත නතර වී තමා මියෙන්නට යන්නාක් ලෙසය. ඒ නිසා ඈ පුංචාගේ පපුවේ ඩිග් ඩිග් හඬ ඇසෙන මානයෙන් පිටතට අඩියක්වත් නොතිබ්බාය. අනෙක් අතට පුංචා නම් වූ දේව ප්‍රාණියාගේ බලයෙන් ඇට උවමනා දේ ඈ සිතන විට පහළ වූ බැවින් එසේ බැහැර යෑමේ උවමනාවක්ද ඇට නොවීය.

මේ නිසා ඈ මියගියා යැයි විශ්වාස කළ ගම්මුන්ට කල් යත්ම ඇගේ ජීවමාන අවතාරයවත් දකින්න ලැබුණේ නැත.

මෙසේ ඉංග්‍රීසීන්ට විරුද්ධ කැරැල්ල හතර අතින් මතුව එද්දී ඒ කිසිවක වගක් නිච්චියක් නැතිව මුළු ගමම එකතු වී පණ පිටින් මරා දමන ලද මේ මිනිස් ප්‍රාණීහු දෙදෙන ලැයිසා නම් වූ ස්වාමි දුවගේ 'වලව්වේ' පුංචිම පුංචි කුටියක අතීතයක් නැති අනාගතයක් නැති වර්තමානයක තවමත් හුස්ම ගනිමින් සිටියහ.

The Reader's Place



The Reader's Place

12

කැරැල්ල බිහිසුණු ලෙස ඇවිළෙමින් තිබුණේය. මඩගෙ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදිහට හජ්ජි මුහන්දිරම් පත් කිරීමේ කේන්තිය සිංහලේ කැරලිකරුවන් ඔහුගේ ජීවිතයෙන් පිරිමසා ගෙන තිබුණේය. ඒ කලහය සමථයකට පත් කරන්නට පැමිණි බදුල්ලේ උප නානාපති විල්සන් මහතාත් ඔහුගේ තෝල්ක මුදලිත් කැරලිකරුවන් විසින් ඝාතනය කරන ලදහ.

අටසිය දහ අට අවුරුද්දේ නවම්, මැදින්, මාස වන විට කැරැල්ල තීරණාත්මක සන්ධිස්ථානයකට එළඹ තිබුණේය. සිංහලේ කැරලිකරුවන්ගේ ප්‍රහාර හමුවේ ඉංග්‍රීසින් උඩරට අත්හැර යන තැනට ළංවී සිටියත් එය එසේ සිදු වුණේ නැත. ඒ වෙනුවට සිදු වූයේ ඔවුන් ඉතා බිහිසුණු හා කෲර ලෙස කැරලිකරුවන් මර්දනය කරන්නට පෙලඹීමය.

ඉංග්‍රීසි හමුදාවේ ඒ යුදමය මර්දනයට අමතරව ඉංග්‍රීසිහු සිංහල රදලයන් සහ භික්ෂූන් චරපුරුෂයන් ලෙස යොදාගනිමින් කැරැල්ලට සම්බන්ධ ඉහළ සිංහල නිලමක්කාරයින් සීමාවක් නැතිව අත් අඩංගුවට ගත්හ. එසේම ඔවුන් බොහොමයකට මරණීය දණ්ඩනය පමුණුවමින් නැතිනම් දැඩි දඬුවම් පමුණුවමින්, කැරැල්ලට සම්බන්ධ වූවොත් දඬුවම බරපතළය කියන පණිවිඩය ඌව වෙල්ලස්සේ නිලමක්කාරයන්ට ක්‍රියාවෙන් ඔප්පු කොට පෙන්වමින් සිටියහ.

The Reader's Place

ඇබිත්ත උන්නාන්සේ නිදි වර්ජිත රාත්‍රීන් ගත කරමින් සිටියේය. ගමෙන් කැරැල්ලට සම්බන්ධ වුණු රතා ඇතුළු දහ අට දෙනාගේ කල්ලිය වරක් ඉංග්‍රීසි හමුදාවේ සෙබළුන් කඩු ගා දමූ බව ආරංචි වුණේය. තවත් ගමේ තරුණයෝ කැරැල්ලට සම්බන්ධ වනු පිණිස ඔහු සොයා පැමිණියහ. ඇබිත්ත උන්නාන්සේ ඔවුන් පල්ලේගම හාමුදුරුවන්ටත්, රතාටත් මුණ ගැස්වීමට කටයුතු කළේය.

ඒ අතර ඇබිත්ත උන්නාන්සේ ගම් වැසියන් සියල්ලන්ම පන්සලට රැස් කරවා හදිසියකදී ගතයුතු ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කළේය. හදිසියේ ඉංග්‍රීසි හමුදාවක් කඩා වැදුණොත් ඔවුන්ට පෙරළා ප්‍රතිප්‍රහාර දෙන්නට ගම්වැසියන්ට ශක්තියක් නොමැති බව බොහෝ දෙනාගේ මතය වූ බැවින් එවැනි වෙලාවක ගෙවල්වල සිටීම අවදානම් බව කතා බහ වුණේය. ඒ නිසා එවන් වේලාවක කැළෑව ඇතුළේ ආරක්ෂිත ස්ථානයකට පලා යන එක වඩා නුවණට හුරු බව ආරච්චිල අවධාරණය කළේය. ඒ වන විට වල්ලිගේ ගෙදර බිත්ත බැස සිටි පොඩි තිලමේ මේ ආරක්ෂිත ස්ථාන සකස් කිරීමේ වගකීම ගමේ තරුණයන් සිය දෙනෙක් සමඟ බාර ගත්තේය.

තම තුවක්කු කඳ කර තියාගෙන මේ රැස්වීමට පැමිණ සිටි විකිරි ඒ අදහසට සපුරාම විරුද්ධ වුණේය.

'පර ඉංග්‍රීසින්ට බයේ අපි මොකටද හැංගෙන්නේ... අපි පුළුවන් විදිහට උන්ව මකබාවන්න ඕන...'

එය එසේ හැංගීමක් නොවන බවත්, හුදෙක් ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයක් පමණක් වන බවත් ඔහුට කෙතරම් පැහැදිලි කළත් ඔහු එය පිළිගත්තේ නැත. විකිරිගේ අදහස අනුමත කළ තවත් තරුණයන් පිරිසක් එවේලේ එතැන සිටි නිසා අන්තිමට ඔවුන් සියලු දෙනාම එකතු කර ගම් ආරක්ෂා කිරීමේ සිසියම් වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඇබිත්ත උන්නාන්සේ විකිරිට පැවරුවේය. ප්‍රථමයෙන් වප් පිහියේ සිට තුවක්කුව දක්වා සතුරාට පහර දිය හැකි ආයුධ යම් ප්‍රමාණයක් එක් රැස් කළ යුතු බව විකිරිට සහයෝගය දුන් බණ්ඩියාගේ අදහස වූයෙන් ගමේ සියල්ලෝම

The Reader's Place

එක ආයුධය බැගින් මේ තරුණයන්ට පරිත්‍යාග කරන්නට ස්වෙච්ඡාවෙන්ම ඉදිරිපත් වූහ. සමහරු කැති පොරෝ පරිත්‍යාග කළ අතර තවත් සමහරු දුනු, මුගුරු පරිත්‍යාග කළහ. වෙද රාළ තමන්ගේ ගෙදර තිබූ ගල් තුවක්කුව ඔවුන්ට දුන්නේය. ආරච්චිල තමන් ළඟ ඇති කඩුව ගෙන යන්නට එන ලෙස විකිරිට කීවේය.

රැස්වීමේ සියලු කතා බස් සාවධානව අසා සිටි පොඩිනා මේ ඕනෑම හදිසි අවශ්‍යතාවයකට මුදල් ඕනෑ වුණොත් ගන්නට කියා එවේලේ ඈ ගෙනැවිත් තිබූ තඹ සල්ලි මුට්ටියක් ඇබිත්ත උන්නාන්සේ ඉදිරිපිට තැබුවාය. ඇබිත්ත උන්නාන්සේ ඒ තඹ සල්ලි මුට්ටිය එවේලේම කිරිහාමි උපාසක රාළට පවරා අවශ්‍ය වේලාවට අවශ්‍ය විදිහට වියදම් කරන්නට අවසර දුන්නේය.

ගම වටේ ආරක්ෂාව ගැන හේතුහාමි තවදුරටත් ප්‍රශ්න කළ අතර අවසානයේ සතුරා ගමට ඇතුළු විය හැකි යැයි අනුමාන කළ ස්ථානයන්හි බොරු වළවල් කපන්නට තීරණය වුණේය. ආරච්චිල එහි වගකීම ගමේම ශක්තිවන්තයා වූ බිංදූට පැවරුවේය.

රැස්වීම නිමවී ගම් වැසියන් පෙරළා තම නිවෙස්වලට යන අතරමඟ අබ්දුල් මුදලාලි පවසා තිබුණේ ඉංග්‍රීසින් බය කියන තරම් හිරිහැරයක් කරන නපුරු ජාතියක් නොවන බවය.

'ඉංග්‍රීසි මහත්තැන්ල හරි විනෝදයි. ඒගොල්ලො යුද්ධ කරන්නෙත් විනෝදෙට...'

ඔහු කීවේය. ඇත්තටම මුළු ගමේන්ම ඉංග්‍රීසි මිනිසුන් සමඟ කතා බහ කර තිබුණේත්, ඔවුන් සමඟ ගනුදෙනු කර තිබුණේත් අබ්දුල් මුදලාලි විතරය.

එදා රෑ අරක්කු බෝතලයක් හිස් කරන ගමන් ඔහු සේදරාට පවසා තිබුණේ මේ ගමට ඉංග්‍රීසි හමුදාව ආවත් තමන් ඉන්නකං අබමල් රේණුවක තරම්වත් බයක් ඇති කර නොගත යුතු බවය. අබ්දුල්ගේ සියලු කතා අසා හොඳටම වෙරිමතින් සේදරා කීවේ මේ වචන ටික විතරය.

'උඹ දෙයියෙක් අබ්දුල්... සුද්දටත් වැඩිය උඹ දෙයියෙක්...'

කැරැල්ලේ උණුසුමත් සමඟ පොඩිනාගේ ගෙදරට බෙහෙත් ගන්න පැමිණි මිනිස් සංඛ්‍යාව කෙමෙන් අඩුවෙමින් තිබුණේය. ඒ සමඟ ඇගේ ගෙදර තිබූ හිස් මුට්ටි, සල්ලිවලින් පිරෙන එක කෙමෙන් කෙමෙන් අඩු වුණේය. දවසකට ලොකු මුදලක් හොයන්න හා පුරුදු වූ පොඩිනාට මේ වෙනස දරාගන්න බැරි වූයෙන් ඇය හොඳටම විස්සෝපයට පත් වුණාය. මේ වන විට ඈ ඇගේ අලුත් ගෙදර සාදා නිම කර තිබූ නමුත් ඇගේ සේවකයන්ගේ පඩිනඩි සඳහා දිනපතා ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවූයෙන් අත්හිට ඈ මහ රෑ තනියම කැළේට ගොස් සල්ලි මුට්ටි වළදාපු තැන්වලින් සතියකට මුට්ටිය බැගින් ගොඩ ගන්න පටන් ගත්තාය.

කැරැල්ලේ බිහිසුණු බව පොඩිනාටත් වඩා බලපෑවේ අබ්දුල් මුදලාලිටත් සේදරාටත්ය. ඒ වන විට දවසකට අවම තරමේ අරක්කු බෝතලයක්වත් හිස් කරන්නට පුරුදු වී සිටි සේදරාට දිගටම එය පවත්වාගෙන යෑම සඳහා උදව් කිරීමට අමාරු තත්ත්වයකට අබ්දුල් මුදලාලි පත්වෙමින් සිටියේය. ඇත්තටම එතැන ලොකු සල්ලි ප්‍රශ්නයක් අබ්දුල්ට නොතිබුණේය. අවුරුදු ගාණක් විවිධ ව්‍යාපාර කරමින් එක් රැස් කළ මුදල් ඔහු ළඟ තරම් තිබුණේය. නමුත් ප්‍රශ්නය වුණේ කැරැල්ලේ බිහිසුණු බවත් සමඟ මඩකලපුවේ සිට අරක්කු බෝතල් කරත්තයක පටවා ගෙනෙන්න කිසිම කරත්තකාරයෙකු ඉදිරිපත් නොවීමය. ඒ වගේම කරත්තයක් එහා මෙහා යෑමේ කිසිම හැකියාවක් ක්‍රමයෙන් කැරැල්ල බිහිසුණු වත්ම තිබුණේ නැත.

ගබඩා කාමරයේ අසුරා තිබුණු බෝතල් එකින් එක අඩු වී අන්තිමට නැත්තටම නැති වූ විට සේදරා වියරු වැටෙන්න පටන් ගත්තේය. ඒ වියරුව වර්ධනය වුණේ එක්තරා ක්‍රමයකටය. මුලින්ම සවස් වන විට ඔහු කැළෑ උණ හැදුණ රෝගියෙක් වගේ වෙව්ලන්න පටන් ගත්තේය. ඊළඟට එසේ වෙව්ලමින් කුණුහරුප කියන්න පටන් ගත්තේය. තව ටිකක් රෑ වන විට ඔහු එළිසබෙත්ට කතා කළේය. පසුව වෙව්ලා වෙව්ලා එළිසබෙත් සමඟ රමණයේ යෙදෙන්න උත්සහ කළේය. එහෙත් ඉහමොළ රත්වෙන වෙරිමත නැතිව එළිසබෙත්ගේ ඇඟ උඩ නැඟ ඇගේ ඇට කටු පොඩි

තරා එක ඔහුට නොතේරුණ කළ නොහැක්කක් වූ බැවින් ඔහු අන්තිමට එළිසබෙත්ට ලවක් දෙවක් නැතිව පඩිසන්ත පටන් ගත්තේය. ඔහු වියරුවට පත්ව පොළොවේ ඇද පෙරළෙමින් ඔහු පෙරළි පෙරළී අඬමින් වැලපෙමින් හූ කියමින් අතට අහු වෙන දේ පොඩි කරමින් හෑ ගහන්නට වූයේ ඊට පසුවය.

නොකඩවා දවස් තුනක් අබ්දුල් මේ ක්‍රියාවලිය බලාගෙන හිටියේය. හතරවෙනි දවසේ ඒ වෙන කොට සේදරාගෙන් ඇති පැමට ගුටි කා සිටි එළිසබෙත් ඔහුට ළං වෙන එක අබ්දුල් නතර කළේය. පස්වන දවසේ ඔහු සේදරා උණ හැති වෙව්ලන්න කලින් ඔහුගේ කාමරයට දමා දොරගුලු දැම්මේය.

ඒතැන් පටන් හැමදාම හවස් වන විට අබ්දුල් සේදරාව කාමරේට දමා දොර වසා තැබුවේය. පසුව එය ක්‍රමයෙන් පුරුද්දක් බවට පත්වන විට හැම හවසකම තනිවම කාමරේට ගොස් සේදරා තමා විසින්ම දොර වසාගත්තේය. ඔහු එළියට ආවේ පසුවදා උදේ පාන්දර වියරුව සහමුලින්ම සමනය වූ පසුවය.

මේ වියරුවත් සමඟ සේදරාගේ අමු මස් කෑමේ පුරුද්ද ක්‍රමයෙන් ගිලිහී ගියේය.

එක පැත්තකින් කැරැල්ල නිසා තැන තැන ඇවිළෙන ගින්නටත්, නිතර නිතර ඇහෙන වෙඩි හඬටත් බිය වී වන සත්තු එළි පහළියට නොආවෝය. එබැවින් ඉස්සර එක වෙඩිල්ලෙන් සතුන් දෙතුන් දෙනා එළාගත් ටිකිරිට දඩයම් සොයාගන්න එක ලේසි පාසු නොවුණේය. ඒ නිසා මස් වැද්දෙකු වූ ටිකිරි තම රාජකාරිය කරගන්න බැරුව තව පැත්තකින් වියරු වැටී සිටියේය. ඔහුට ඉංග්‍රිසින් පිළිබඳව තිබුණු කේන්තියට හේතු වූයේ ඔවුන් මේ රටේ වැසියන් තළා පෙළා අත්තනෝමතික ලෙස පාලනය කිරීම නොවේ. ඔවුන් මේ කෙහෙල්මල් කැරැල්ල දිගටම පවත්වාගෙන යාම නිසා තමන්ට සතෙක්වත් එළාගන්න බැරි වුණ එකටය. කෙසේ වෙතත් මේ කැරැල්ල නිසා මස් වැද්දෙකු ලෙස හොඳටම අසරණ වී සිටි ටිකිරිට සේදරා වෙනුවෙන් දිගටම අමු මස් සම්පාදනය කරන්න හැකියාවක් තිබුණේ නැත.

The Reader's Place

ඒ නිසා මතක ඇති කාලයේ අමු මස් හැර වෙන කිසිත් නොකෑ සේදරා අන්තිමට මස් නැති තැන එය අත් හැර කිසිවක් නොකා වතුර විතරක් බී දවස ගත කරන්න පුරුදු වුණේය. මෙසින් සිද්ධ වුණු එකම දේ උළුවස්සකින් යන්න බැරි තරමට උස මහතට හිටි මේ තඩි මිනිහා බලා ඉඳිද්දී හැකිළෙන්න පටන් ගත් එකය.

කෙම්මුර දවස්වල වල්ලීගේ සාස්තර කීමටත් කැරැල්ලේ බිහිසුණු බව සැහෙන්න බලපෑම් කළේය. මේ වන විට මැතුම් සාස්තරයක් පේනයක් කියන්න, හූනියමක් තීන්දුවක් කපන්න ඈ පිටගම්වල පවා බෙහෙවින් ප්‍රසිද්ධියට පත්ව සිටියත් ඔවුන්ට මේ කැරැල්ල නිසා නිවාඩු පාඩුවේ ඈ ළඟට එන්නට හැකියාව තිබුණේ නැත.

අනෙක් අතට තම තමුන්ගේ පෞද්ගලික උවමනා එපාකම් වලට සාස්තර පේන අහන එකත්, පෞද්ගලික එදිරිවාදිකම්වලට හදි හූනියම් කරන එකත් යට ගොස් ඉංග්‍රීසින්ගේ මේ හිංසාකාරී පාලනයෙන් මිදීමේ පොදු අරමුණකට සියල්ලන්ම අවධානය යොමු කර තිබූ නිසා මිනිසුන්ට ඒ ගැන හිතන්න වෙලාවක් තිබුණේ නැත. ඒ අතර සමහරු ඈ ළඟට ඇවිත් විපරම් කර බැලූයේ ඉංග්‍රීසි හමුදාවෙන් තමන්ට අතවරයක් වෙන්න ඉඩකඩ තියෙනවාද නැද්ද කියන එකය. එහෙත් ඒ ගැන කාටවත් හරි උත්තරයක් සපයන්න ඈට පුළුවන් වුණේ නැත.

'ඉංග්‍රීසි කියන්නේ මිත්‍යා දෘෂ්ඨිකයෝ... උන්ගේ සාස්තරේ වෙනයි අපේ සාස්තරේ වෙනයි... උන්ගේ සාස්තරේට අපේ සාස්තරේ අහුවෙන්නෙත් නෑ... අපේ සාස්තරේට උන්ගේ සාස්තරේ අහුවෙන්නෙත් නෑ... ඒත් තව කාලයක් උන් මේ රටේ බිත්ත බැහැගෙන හිටියොත් මට උන් ගැනත් සාස්තර කිව්වැහැකි...'

එහෙත් සිංහලේ රට වැසියන් මෙවේලේ කැරලි ගසමින් සිටියේ ඉංග්‍රීසින්ගේ මේ බිත්ත බැසීම කෙළවරක් කරන්නට බැවින් මේ රටේ මහ පොළොව හඳුනා නොගත් ජාතියක් ගැන සාස්තර කියන්න ඈට පුළුවන්කමක් තිබ්බේ නැත.

මේ නිසා කොයි කවර විදිහෙන් වුණත් සිද්ධ වුණේ ඇගෙන් සාස්තර පේන අහන්න ආ පිරිස ක්‍රමයෙන් අඩු වුණ එක විතරය. මේ වන විට බොහොම සුකුමාර විදිහට අඳින්න පළඳින්න හැඩ වැඩ කරන්න ඇති පදම් වියදම් කරමින් සිටි වල්ලීට මේ අතට ලැබෙන ආදායම අඩු වීම ඉහිලුම් දුන්නේ නැත. මේ කම්පනයෙන් ඈ වියරු වැටෙන්න පටන් ගත්තාය. ඒ වියරුව ඈ කෙරෙන් විද්‍යාමාන වුණේ ගෝමරීගේ ආවේශයට ඈ නිරන්තරයෙන්ම ලක් වීමෙනි. සාමාන්‍යයෙන් ඇයට ගෝමරී ආවේශ වුණේ බදාදා සෙනසුරාදා කෙම්මුර දවස්වල වුණත් මෙසේ මුදල් අගහිඟකම් ඇතිවෙන්න ඈ සතියේ දවස් හතේම වරින් වර ආවේශ වන්න පටන් ගත්තාය. එහෙත් ඒ ආවේශයෙන් සාස්තර පේන අහන මිනිසුන් නොවූ නිසා ඇගේ වියරුව දෙගුණ තෙගුණ වුණේය.

එයින් සිද්ධ වූ එකම ප්‍රතිඵලය මේ ආවේශයෙන් ඈ පොඩි නිලමේ සමඟ දවසට විසි තිස් සැරයක් රමණයේ යෙදීමය. මේ අගහිඟකම් සමඟ ඔවුන් කෙතරම් වියරුවෙන් එකිනෙකා හපා විකා ලේ හලා ගනිමින් රමණයේ යෙදුණාද කීවොත් හැම උදෑසනකම දෙදෙනාට දෙදෙනාගේ තුවාලවලට ප්‍රතිකාර කරගැනීමට පැ දෙකකට වඩා ගත කරන්න සිද්ධ වුණේය.

වල්ලී උන් හිටි ගමන් ආවේශයට පත් වී නිතර නිතර පොඩි නිලමේ රමණයට හසු කරගත් අතර ඒ වෙලාවට මර හදිසියේ ඇඳුම් ගලවන්නට ගොස් ඔවුන්ගේ ඇඳුම් කීප විටක්ම ඉරී ගොස් තිබුණේය. ඒ නිසා ගේ ඇතුළේ ඉඳිද්දී දවසේ වැඩි හරියක් නිරුවතින් ඉන්න ඔවුහු පුරුදු වුණෝය. එවිට හිතුණ හිතුණ විදිහට ඔවුනොවුන් හපා විකාගෙන එකිනෙකාගේ ශරීර ඇතුළට කිමිද සුරතාන්තයට ළඟා වන්නට ඔවුන්ට බාධාවක් නොවුණේය. මේ දන් රමණයේ යෙදී ඊළඟ පැයේ ආයෙමත් එකිනෙකාගේ ඇඟ උඩ නැඟගෙන දඟලන්න ඔවුන්ට ශක්තිය ආවේ කොහෙන්ද කියා දෙදෙනාම දැන ගෙන හිටියේ නැත.

'මම ඉන්නේ මගෙ අම්ම වැහිලා... උඹ ඉන්නේ කඩවර දෙයියො වැහිලා... මගේ අම්ම කඩවර දෙයියන්ට යටත් වෙන්නෙත් නෑ... කඩවර දෙයියො මගේ අම්මට යටත් වෙන්නෙත් නෑ...'

The Reader's Place

නිතර සුරතාන්තයට පත්වෙද්දී ඔහුගේ ඇඟ එඩ එඩ පහළට යමින් ඈ එසේ කියන්නට පුරුදු වී සිටියාය.

ඇත්තම කීවොත් හරිහමන් කෑමක් බීමක් නැතිව අසාමාන්‍ය ජව ශක්තියකින් කළ මේ රමණ වියරුවෙන් දෙදෙනා මෙතරම් ප්‍රීති ප්‍රමෝදයට පත් විද යත් හැමදාම මේ ආවේශය තියෙන එක කොපමණ හොඳ දැයි දෙදෙනාම සිතන්නට වූහ. එහෙයින් කැරල්ල නිසා ඇති වූ මේ අගහිඟකම් සැබවින්ම දෙව ආශිර්වාදයක් බැව් අනුමාන කළ ඔවුහු දෙව ස්තෝත්‍ර කියමින් රහස් මංජුසාවට ලිඟු අල්ලමින් පැයෙන් පැය රමණයේ යෙදෙමින් එකිනෙකාගේ සිරුරු තුළට කිමිදෙමින් සිටියහ.

කැරල්ලත් සමඟ ගමේ වඩාත්ම අසීරුතාවයට පත් වූ පුද්ගලයා ගමේ ආරච්චිලය. ඔහු හිටියේ ඔහුටම නිරාකරණය කරගන්න බැරි තරම් ලෝක දෙකක අතරමංවය. නිල බලයෙන් ඔහු ඉංග්‍රීසි ආණ්ඩුවට වග කිව යුතු පුද්ගලයෙකු වූ නිසා කැරල්ලට එකඟ වීමේ හැකියාවක් ඔහුට තිබුණේ නැත. එහෙත් ඌව වෙල්ලස්සේ පුරවැසියෙකු විදිහට ඉංග්‍රීසි ආණ්ඩුව සිංහල නිලමක්කාරයින්ගේ බලය කප්පාදු කරන ආකාරය ඔහු හොඳාකාරවම අවබෝධ කරගෙන සිටි නිසාත්, ඔහු සැබවින්ම මේ රටේ පුරවැසියෙකු වූ නිසාත් කැරැල්ලට සහයෝගය නොදී ඉන්න ඔහුට බැරි විය. අනෙක් අතට කැරැල්ල පැතිරීමත් සමඟ ඉංග්‍රීසි ආණ්ඩුව කිසිම සිංහල නිලමක්කාරයෙකු ගැන කිසිම විශ්වාසයක් නොතැබූ අතර ඔහු සම්බන්ධයෙන්ද එහි වෙනසක් නොවීය.

මේ සියල්ලටමත් වඩා අහල ගං හතකටම අණ බෙර ගසා එහා ගමේ ආරච්චිලගේ දූව කරලිනා සමඟ සිය පුතා දීග කෑ මඟුල දවසක් ගත වෙන්නත් මත්තෙන් කෙළවර වීම ගැන ඔහු හිටියේ කිසිවෙකුට කෙළින් මූණ දෙන්න බැරි තරම් ලැජ්ජාවක් හිත යට හිර කරගෙනය. වෙන කරන්නට දෙයක් නොතිබුණ නිසා පොඩි නිලමේ වල්ලීගේ ගෙදර බින්න බැසීම ඔහු ඉවසා සිටියත්, එහා ගමේ ආරච්චිල තැන සිය නම්බුව ගැන ඔහුට වඩා තදින් කල්පනා කළ නිසා මඟුල කෙළවර වුණත් දීග දුන් දූව නැවත බාරගත්තේ නැත.

නම්බුව පැත්තකට කර තම ලේ උරුමය ගැන හිතා සිය දියණිය නැවත නිවසට ගෙන්න ගන්නැයි ඔහුගේ බිරින්දෑ ඔහුට ඇවිටිලි කළත් අන්තිමට ගෙදර බඩු මුට්ටු පොළොවේ ගසා ඔහු මෙසේ උත්තර දී තිබුණේය.

'මොන තව නිංගිරාවක්ද මේක... මට නිර්වස්තරෙන් පාරට බහින්ඩද කියන්නේ. ගෙයින් පිට දුන්නේ ආපහු ගෙට වද්දගන්න නෙමෙයි...'

මේ නිසා තම ගෙදර නොගොසින් පොඩි නිලමේ නැති වුණත් ඔහුගේ පියාගේ වලව්වේ නවතින්න කරලිනාට සිදු විය. ආරච්චිලගේ බිරිඳ බිසෝ මැණිකා තම එකම පුතු සාස්තර කියන නොහොබිනා ගෑනියෙකුගේ ගෙදර බින්න බැසීමේ දුක නැති කර ගත්තේ කරලිනාට සිය කුසින් උපන් දියණියකට මෙන් සැලකීමෙනි.

එහෙත් බිසෝ මැණිකාට තම දියණියකට මෙන් කරලිනාට සලකන්න වැඩි කාලයක් ඉඩ ලැබුණේ නැත.

වැඩිවියට පත් වුණු දා සිට නිරුවත් පිරිමියෙකුගේ ශරීරයකට යට වී ඔහුගේ ශරීර චලනයෙන් හා චුම්බනයෙන් මත් වන්නට පෙරුම් පුරමින් සිටි කරලිනා පොඩි නිලමේ සමඟ විවාහ වූ පළමු දවසේම ඒ සිහිනය සුන්නද්දූලි කරගත් නමුත් අන්තිමට පොඩි නිලමේගේ අප්පුච්චා හෙවත් ආරච්චිල සමඟ ඒ සිහිනය සැබෑ කරගන්නට සමර්ථ වූවාය.

මුලදි මුලදී කරලිනාගේ සැප දුක් බලන්න සිය සැමියා ඈ ළඟට ආගිය එක මෙතැනින් කෙළවර වේ යැයි බිසෝ මැණිකා හීනෙකින්වත් හිතුවේ නැත. එහෙත් අන්තිමට සිය පුතා සරණ පාවා ගත් දියණිය සමඟ සිය සැමියා නිදිවැදුණු විට වලව්වේ ප්‍රධාන ස්වාමි දූ හැටියට එය ඉවසා දරාගන්නත්, ගම්මුන්ගෙන් එය වසං කරගෙන තම පවුලේ නම්බුව ආරක්ෂා කරගන්නත් බිසෝ මැණිකාට සිද්ධ වුණේය.

මේ විදිහට ගමේ ආරච්චිල නිල ලත් සහ නිල නොලත් බිරින්දෑවරුන් දෙදෙනෙකුගේ ස්වාමිපුරුෂයා බවට පත් වුණේය.

පනස් හැවිරිදි විය පසු කලත් වලව්වේ වැඩ කරන පිනා පොඩිනාගේ ගෙදරට පිටත් කර ඇගේ රහස් බෙත කාටත් හොරෙන් ගෙන්වා ගෙන වයසට වඩා ඇඳ උඩදී තිරිහන් වෙන්න ආරච්චිලට පුළුවන්කම ලැබුණේය.

මුලදී මුලදී කරලිනාගේ ළඟට යන විට බිසෝ මැණිකා දත්මිටි කෑවත්, බිසෝ මැණිකාගේ ළඟට යන විට කරලිනා මූණ හතරැස් කරගත්තත් පසුව පවුලේ නම්බුවත්, තම තමන්ගේ අනාගතයත් ගැන හිතා දෙදෙනා අතර කෙතරම් සහයෝගීතාවයක් ඇති වීද යත් එකම කුටියේ එකට ඉඳගෙන ඔහු දෙදෙනා සමග එකටම නිදිවැදුණාට කම් නැතැයි කියන තැනට දෙදෙනාම පත්ව සිටියහ.

මේ අනුව කැරැල්ල ක්‍රමයෙන් බිහිසුණු වත්ම තමන්ගේ තිල රාජකාරී වගකීම අනුව ඉංග්‍රීසීන්ට සහයෝගය දෙනවාද නැත්නම් සිය හෘද සාක්ෂියේ අවංකභාවය අනුව කැරැල්ලට සහයෝගය දෙනවාද කියන උභතෝකෝටිකය තුළ සිරවී සිටි ආරච්චිලගේ මානසික පීඩනය වලව්වේ ඇඳ උඩදී කරලිනා විසිනුත්, බිසෝ මැණිකා විසිනුත් සමනය කරන ලද්දේය. එසේම ඔහු සිය හෘද සාක්ෂියට එකඟව රට වැසියාගේ පැත්ත අරගෙන කැරැල්ලට ප්‍රමුඛත්වය දුන්නා හා සමානවම ඇඳ උඩදී සිය හෘද සාක්ෂියට එකඟව යන්තම් සොළොස්විය ඉක්මවූ හොඳටම නාඹර කාමිනියක වූ කරලිනාට බිසෝ මැණිකාට වඩා ප්‍රමුඛත්වය දුන්නේය.

කැරැල්ලේ බිහිසුණු බව නිසා තරමක අසාමාන්‍ය ප්‍රතිඵල උදා වෙන ලද්දේ ගමේ දේව දරුවන්ගේ දේවාලයේ නිවුන් දරුවන් දෙදෙනාටය. ඇබිත්ත උන්නාන්සේට දාව සොබනී බිහි කළ සපුමලීත්, හීන් සුරඹාත් නම් වූ මේ නිවුන් දරුවන් දෙදෙනා එකිනෙකට වෙනස් ලෝක දෙකකින් වැරදීමකින් එකම වේලාවට එකම මව් කුසක ප්‍රාදූර්භූත වූවෝ වූ බැවින් සැබවින්ම එකිනෙකට වෙනස් දරුවෝ වූහ.

ඔවුන් දෙදෙනාට අවුරුද්ද සපිරුණු අටසිය දාහත අවුරුද්දේ වප් මාසයේ අන්තිම සතියේ දවසක මහ රෑ හරිම අසාමාන්‍ය

විදිහට හීන් සුරඹා නින්දෙන් නැඟිට මර හඬ දීදී හඬන්න පටන් ගත්තේය. ඒ සමඟම සපුමලී එවැනිම අසාමාන්‍ය විදිහට කැකිරි පළමින් හිනාවෙන්න ගත්තාය. මේ අසාමාන්‍ය ඇඬිල්ලත්, හිනාවිල්ලත් ඇසී ඇබිත්ත උන්නාන්සේ පමණක් නොව ගමේ තව කීප දෙනෙකුත් සොබනිගේ ගෙදරට පැමිණියහ. එහෙත් කවුරු කොහොම කුමක් කළත් හීන් සුරඹාගේ ඇඬිල්ලවත්, සපුමලීගේ හිනාවවත් නවත්තගන්න කාටවත් පුළුවන් වුණේ නැත.

පහුවදා එළිවෙනකම්ම ඔවුන් මේ සෙල්ලම නොනවත්වා එක දිගට කරගෙන ගිය අතර උදේ වන විට දෙදෙනාගේම උගුරු ඉදිමී ලේ පැහැ ගැන්වී තිබුණේය. පහුවදා දවල් වන විට ක්‍රම ක්‍රමයෙන් එය නතර වූ නමුත් ඉන් පසුව එදා මුළු දවසම හීන් සුරඹා නොකා නොබී මුලුගැන්වී සිටියේය. ඊට සම්පූර්ණ ප්‍රතිපක්ෂය වූ සපුමලී බෙහෙවින්ම විනෝදයෙන් කල් ගත කළ අතර ගත වුණු අවුරුද්දටම නොබිවූ කිරි ප්‍රමාණයක් එදා දවසේ සොබනිගේ තන පුඩුව උර උරා බීවාය.

එදා හවස් වන විට ඉංග්‍රීසි හමුදාව කිවුලේගෙදර ප්‍රදේශයේ මිනිසුන් මරා ගෙවල් ගිනි තියා දේපල විනාශ කර සුත්තද්දූලි කර ඇති බව ඇබිත්ත උන්නාන්සේට ආරංචි වුණේය.

මේ විදිහට ඊට දවස් කීපයකට පසුව ඉල් මාසයේ මුල් සතියේ දවසක රාත්‍රී යාමයේ දෙදෙනා පෙර පරිදිම අඬන්නත් හිනාවෙන්නත් වූහ. කලින්දා විදිහටම ඔවුන් එළිවෙනකම්ම හඬමින් සහ හිනාවෙමින් සිටි අතර පහුවදා හීන් සුරඹා මුලුගැන්වී නොකා නොබීත්, සපුමලී විනෝදයෙන් හොඳට කා බීත් කාලය ගත කළහ. එදා හවස ඉංග්‍රීසින් ඌසන්වෙල ගමට පහර දුන් බවත්, මිනිසුන් මරා ගෙවල් ගිනි තියා ගව, මහිෂ දේපල පැහැර ගත් බවත් ගම්මුන්ට ආරංචි වුණේය.

මෙසේ ඉංග්‍රීසින් ඌව වෙල්ලස්සේ කොතැනකට හෝ දරුණු ලෙස පහර දෙන විට ඊට කලින් දවසේ මේ ගමේ වැසියෝ සපුමලීගේ හිනාවෙනුත්, හීන් සුරඹාගේ ඇඬිල්ලෙනුත් එය කල් තියා දැනගෙන සිටියහ.

The Reader's Place

මුලදී මුලදී කිසියම් කාල පරතරයක් ඇතිව සිදු වූ මේ හිනාව සහ ඇඬිල්ල අටසිය දහ අට අවුරුද්දේ වෙසක් පොසොන් පසු වන විට නිතර නිතර සිද්ධ වෙන්න පටන් ගත්තේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් කුඩා ළමයින් දෙදෙනාගේ උගුරු දඬු එන්න එන්නම වණ වෙන්නට පටන් ගත් අතර එයට සමාන්තරව ගම්මුන්ගේ සිත් තුළ අරක්ගත් හිතියත් එන්න එන්නම වැඩි වන්නට පටන් ගත්තේය.

අටසිය දහ අට අවුරුද්දේ වප් මස විසිනව වෙනිදා මේ විදිහටම සපුමලීත්, හීන් සුරඹාත් හිනාවෙන්නත් අඬන්නත් පටන් ගත්හ.

මේ වන විට දෙවසර සපුරා සිටි මේ දරුවන් දෙදෙනා පැහැදිලි වෙනස්කම් සහිත වූහ. වසරේ වැඩි දවසක් අඬමින් සහ නොකා නොබී මුලුගැන්වී සිටි හීන් සුරඹා දර ඉපලක් ගානට කෙට්ටු වී සිටියේය. උපන්දා සිට සුදුම සුදු වූ ඔහු මේ අසාමාන්‍ය කෙට්ටු බව නිසා හොඳටම සුදුමැලි වී සිටියේය. එහෙත් වසරේ වැඩි දවසක් හොඳට හිනාවෙමින් හොඳට කා බී විනෝදයෙන් සිටි සපුමලී උපන් කාලයේ තිබූ කෙට්ටු කෙසඟ බව වෙනුවට හොඳට තරවී පුෂ්ටිමත්ව වැඩී සිටියාය. ඇගේ කට්ට කළු වූ සම මේ පුෂ්ටිමත් බව නිසා තෙල් බේරෙමින් පැහැපත්ව තිබුණේය.

ගමේ නැකැත් රාළ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබුණේ මේ සපුමලී පහුගිය ආත්මයේ ඉංග්‍රීසි හමුදාවේ මියගිය සොල්දාදුවෙක් බවත් ඒ නිසා සිංහලයන්ගේ විනාශය දැක ඇ පස්වනක් ප්‍රීතියෙන් සතුටට පත් වන බවත්ය. එහෙත් ගමේ බහුතර ගම්වැසියෝ නැකැත් රාළ මොනවා කීවත් මේ දේව දරුවන්ට විරුද්ධ වචනයක්වත් නොකියන්ඩ කට පරිස්සම් කරගත්හ.

'උන් දේව දරුවෝ... දෙවියන්ගේ කැමැත්තට වෙන වෙන දේව ලෝක දෙකකින් එක සැරේ මහ පොළොවට ආපු දේව දරුවො... නැත්තං උන් කොහොමද කියන්නේ සිංහලයො මරා දාල ගම් බිම් විනාශ කරන එව්ව, ඒව වෙන්ඩ ඉස්සර...'

බොහෝ ගැමියන් නැකැත් රාළගේ ඒ ප්‍රකාශයට ප්‍රතිචාර දක්වූයේ එසේය.

වප් මස විසි නව වෙනිදා රාත්‍රියේ හීන් සුරඹා අඬන්නත් සපුමලී හිනාවෙන්නත් පටන් ගත් විට ගම්වැසියෝ ඊට පසුවදා පුපුරුහු පරිදි සීරුවෙන් සිටියහ.

කැළෑව ඇතුළේ ආරක්ෂිත ස්ථානවලට පිරිසක් ගියහ. විකිරි තම කණ්ඩායම සමඟ අවි ආයුධ රැගෙන තැනින් තැනට මාරුවෙමින් නිරන්තර සෝදිසියෙන් සිටියේය. බිංදු තම කණ්ඩායම සමඟ ගමට ඇතුළු වන තැන්වල කැපූ බොරු වළවල් අසල සැඟවී සිටියේය. ඇබිත්ත උන්නාන්සේ සිවුරක් නැතිව අඳනකඩය විතරක් ඇඳගෙන ආරච්චිලත් සමඟ ගෙයින් ගෙට යමින් ගම වැසියන්ට නිතර සෙවිල්ලෙන් සිටින ලෙසත් යම් සැකයක් ඇති වුවහොත් අනෙක් අය දැනුවත් කරන ලෙසත් දැනුම් දුන්නේය. කිරිහාමි උපාසක රාළ හොඳට පේවී පිරිසිදු වී කරණීය මෙත්ත සූත්‍රය දහස් වරක් සජ්ජායනා කරමින් සිටියේය. කට්ටඩි රාළ ගමේ හතර මායිමේ වැළලූ ආරක්ෂා මුට්ටිවල බලය සක්‍රිය කරමින් නිරන්තරව ආරක්ෂා මන්ත්‍ර ජප කරමින් සිටියේය. නැකත් රාළ ගමේ ආරච්චිලගේ කේන්ද්‍රය අනුව ගමට යම් විපතක් සිද්ධ විය හැකිද නැද්ද යන්න පිළිබඳව හිරු සඳු ග්‍රහ පිහිටීම් අනුව ගණන් හදමින් සිටියේය.

කොහොමටත් දේව දරුවන්ගේ ඇඬිල්ලටත්, සිනාවිල්ලටත් පසුව එළඹෙන හැම දවසකම ගමේ සාමාන්‍ය සූදානම එසේ විය.

එහෙත් මෙවරද ගමට කිසි කරදරයක් නොවිය. නමුත් තිස් වෙනිදා හැන්දෑවේ ඉ බලාපොරොත්තු සුන්නද්දූලි කළ කනගාටුදායක ප්‍රවෘත්තිය ගම්මුන්ට ආරංචි වුණේය.

අටසිය පහළොවේ අත්සන් කරන ලද ගිවිසුමට පටහැණිව රට පුරා යුද නීතිය පනවමින් රට වැසියන් තළා පෙළා පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව ඇරඹුණු මේ කැරැල්ලේ අසහාය නායකයා වූ මොණරවිල කැප්පෙටිපොළ දිසාව නුවර කලාවියේදී ඉංග්‍රීසි සොල්දාදුවන් විසින් අත් අඩංගුවට ගෙන තිබුණේය.

ඇබිත්ත උන්නාන්සේ හොඳටම අකම්පාල වී සිටියේය. රට වැසියන් තුළ වූ අවසන් බලාපොරොත්තුව මෙසේ භේඛා වී යෑම ඔහුට දරාගන්න පුළුවන් වුණේ නැත. ගම් වැසියන් මේ

The Reader's Place

ආරංචියෙන් කෙතරම් අපේක්ෂා භංගත්වයට පත් වී ද යත් දවස් ගාණක් යනකම්ම ගමේ කිසිම ගෙදරක ලිපක් දැල්වුණේ නැත. ඉන් දවස් දහ නවයකට පසු ඉල් මහේ දහ අට වෙනිදා ඉංග්‍රීසි යුද්ධාධිකරණ මණ්ඩලයකින් වරදකරු කර කැප්පෙටිපොළ දිසාවගේ හිස ගසා දැමූ දවස වෙනකම්ම නොමැරී ජීවත් වෙන්න කුසට කිසියම් අහරක් අවැසි බව ගම්මුන්ට අමතක වී තිබුණේය.

එදා සිට ඇබිත්ත උන්නාන්සේ පන්සලෙන් එළියට බැස්සේ නැත. මොන කරදර ප්‍රශ්න තිබුණත් මහ පාන්දර නැඟිට බෝධි වෘක්ෂය ළඟ ධ්‍යාන සමාපත්තියට එළඹෙන තැන් සිට හෙතෙම පුරුදු පුහුණු කරගෙන තිබූ දවසේ දින චර්යාව ඔහු අතින් මඟ හැරී ගියේය. ඇබිත්ත උන්නාන්සේ කෑවේ බීවේ නැත. මූණ කට හේදුවේ නැත. දොට්ට පිලට ගියේ නැත. නිදාගත්තේ නැත. බණ භාවනා කළේද නැත. ආවාස ගෙයි ආසනයක ඉඳගෙන හිස් අවකාශය දිහා ඔහේ ඇස් ඇරගෙන කාටවත් තේරුම් ගන්න බැරි කල්පනාවක නිමග්න වී සිටියේය.

සමහර දවසක රෑට ලොකු හාමුදුරුවෝ පැමිණියහ. උන්වහන්සේ හොඳටම කෘෂ වී ගිලන් වී සිටියහ. කෙතරම් කෘෂ වී සිටියාද කිවහොත් හමට උඩින් ඇටකටු මතුව තිබුණේය. හැමවිට වාරුවෙන් ආවාස ගෙට ගොඩ වන විට ඇටකටු එකිනෙක ගැටී කට කට ශබ්දයක් මතු වුණේය. ලේ ගමන් කළ මතුපිට හමක් පමණක් නොව මස් කලඳක්වත් ඇටකටු වැසෙන්න නොතිබුණේය.

ජීවත්ව සිටි කාලයේදී වගේ තමන්ට සුපුරුදු හාන්සි පුටුවේ ඉඳගෙන බුලත් විටක් සප්පායම් වෙමින් උන්වහන්සේ මීට අවුරුදු ගාණකට ඉස්සර පුංචි රාළ කන් කෙටියෙන් බිම දිගේ ඇදගෙන ආ කොල්ලා දිහා අනුකම්පාවෙන් බලා සිටියහ. උන්වහන්සේගේ සිරුරේ හරිහමන් ජීවයක් තිබුණේ ඇස් දෙකේ විතරය. අනෙක් ඉන්ද්‍රියන් සියල්ල මැරී තිබුණේය. කිසිම සතුටක් හෝ දුකක් ඒ ඇස්වල නොතිබුණේය. එසේම කිසිම බලාපොරොත්තුවක් හෝ පශ්චාත්තාපයක්ද ඒ ඇස්වල නොතිබුණේය.

ඇබිත්ත උන්නාන්සේ ලොකු හාමුදුරුවෝ දිහා බලා සිටියේද හැඟීමක් නැතිවය. ලොකු හාමුදුරුවෝ ජීවත්ව සිටි

කාලයේ වචනයටත් වඩා ක්‍රියාවෙන් බොහෝ දේ කියා දී තිබුණ නිසා ඇබිත්ත උන්නාන්සේට ලොකු හාමුදුරුවන්ගෙන් අලුතෙන් අහන්නට දෙයක් ඉතිරි වී තිබුණේ නැත. එහෙත් ලොකු හාමුදුරුවෝ එසේ පැමිණි එක දවසක හැරමිටි වාරුවෙන් සිය ඇටකටු ගොඩ ආවාස ගෙයින් එළියට ගෙන ගල් පඩිපෙළ බැස අතුරුදන් වෙන ගමන් මෙසේ වදාරා තිබුණේය.

'මතක තියා ගන්ඩ... අපේ ශරීර කූඩුව වගේ ලෝකේ හැමදේම අනිත්‍යයි... ස්ථිරයි කියල කිසිම දෙයක් නෑ...'

ගමෙන් කැරැල්ලට ගිය රතා ඇතුළු දහ අට දෙනාගේ කල්ලිය ගැන ආරංචියක් තිබුණේ නැත. මුලදී මුලදී රතා ඇතුළු කණ්ඩායම සිංහලේ රජු යැයි පිළිගන්නා ලද විරවික්‍රම ශ්‍රී කීර්ති හෙවත් විල්බාවේ මුදියන්සේගේ ආරක්ෂක බල ඇණියේ කටයුතු කළහ. එහෙත් මඩුගල්ලේ නිලමේ විසින් දුම්බරදී ඔහු අත් අඩංගුවට ගෙන හංවැල්ලේ සිරකර සිටියදී අතුරුදන් වීමත් සමඟ රතා ඇතුළු පිරිසට කුමක් වීද යන්න පිළිබඳව ආරංචියක් නොවීය.

කැප්පෙටිපොළ දිසාවගේ හිස ගසා දැමීමෙන් පසුව සපුමලින් ගිනි පුරඹත් නැවත නැවත සිනාසෙන්නත් හඬන්නත් වූ නමුත් පෙර තරම් උද්යෝගයකින් ගම් වැසියන් පසුවදාට ලෑස්ති වූයේ නැත. පුරුද්දට වගේ සියල්ලන්ම තමාට පැවරූ හෝ තමා විසින්ම පවරා ගත් රාජකාරිවල යෙදුණත් එය සිද්ධ වුණේ උදාසීනත්වය මුසු විස්සෝප ගතියකින් යුක්තවය.

උපාසක රාළ හොඳට පේවී දහස් වරක් කරණීය මෙත්ත සූත්‍රය සජ්ඣායනා කරන්න සූදානම් වී ඉඳගත්තත්, ඔහුට හොඳට කටපාඩම් මේ පාලි පාඨ එක දිගට කියාගෙන යන විට අමතක වුණේය. කට්ටඩි රාළ ගමේ හතර කොන වැළලූ ආරක්ෂක මුට්ටි සක්‍රිය කරන්න ආරක්ෂක මන්ත්‍ර ජප කළත් ඔහුට නොදැනුවත්ව ඔහුගේ කටින් පිටවී තිබුණේ අණ වින අපල සක්‍රිය කරවන මන්ත්‍රය. නැකැත් රාළ ආරච්චිලගේ කේන්දරය අරගෙන අනාවැකි විමසා බැලුවත් හදිසියේ ඒ කේන්දරයේ ග්‍රහ පිහිටීම් වෙනස් වී තිබුණේය.

The Reader's Place

'ශරීරය වෙහෙස කරවන පාප ග්‍රහයෙක් හදිසියේ උච්ච වෙලා තියෙනවා...'

නැකැත් රාළ ආරච්චිලට එසේ කියා තිබුණේය. එහෙත් එය එතරම් සැලකිය යුතු දෙයක් නොවන බවත් ඒ සමගම ඔහු කීවේය.

'බාග වෙලාවට මේ කැරැල්ල හින්ද ඕනවට වඩා හිත කය වෙහෙසවන්න සිද්ධ වෙලා තියෙන්නේ මේ නිසා වෙන්ඩැති...'

නැකැත් රාළ එසේ කීවත් සැබවින්ම තම ශරීරය වෙහෙස කරවන ග්‍රහයෙක් හදිසියේ තමාට උච්ච වී ඇති බවත්, එහෙත් ඒ උච්ච වූ ග්‍රහයා තම ශරීරය සුබ ප්‍රහර්ශය කරා ගෙන යන සුබ ග්‍රහයෙක් මිස පාප ග්‍රහයෙක් නොවන විත්තියත් ආරච්චිල පමණක්ම දැනගෙන සිටියේය.

The Reader's Place

13

අටසිය දහ නමය අවුරුද්දේ දුරුතු මාසයේ දවස පතුමලින් ගින් පුරතාත් නොනවත්වා සිනාසී නැඟී රාත්‍රියට පසුව ඒ හැදූ මුසල දවස උදා වුණේය.

ඉංග්‍රීසින් ගමට ඇතුළු වුණේ කොහෙන්දැයි ගම්මුන්ට සිතා ගන්න බැරි වුණේය. ඔවුන්ට පාර පෙන්වූ ඔවුන් සමග පැමිණි ස්වදේශිකයන් ගමට ආරක්ෂිතවම ඇතුළු විය හැකි මාර්ග ඔස්සේ ඔවුන් කැඳවාගෙන ඇවිත් තිබුණේය. ඉංග්‍රීසි බල ඇණියට නායකත්වය දුන් මේජර්වරයාට අමතරව තවත් සිංහල ප්‍රධානියෙක් සහ වෙනත් ස්වදේශිකයන් දොළොස් දෙනෙක් සමග සියලුම පිරිස හැත්තෑවකට ආසන්න විය.

විවිධ ආයුධවලින් සන්නද්ධ වූ විසිපස් සිය තරුණ පිරිස සමග කැමල් කැංකුමණ් නැත. මුලින්ම පුහු විසාල දුර්ගෙන සිටි ඔහුගේ සගයෝ වටුළු අතර සහ උස ගස් අතර හැංගී ඉංග්‍රීසි සොල්දාදුවන්ට ගිනි විද්දෝය. එතැවර කොහෙන් ගී එතැන්දැයි තේරුම් ගන්න බැරිවූ ඉංග්‍රීසින් තත් දෙනෙකු ඉන් තුවාල ලබූ අතර ඉන් දෙදෙනෙක් මරාලුම්වට පත්වූහ. එමින් විසාල වැටුණු ඔවුන් කතර අතට තම තුවක්කුවලින් වෙඩි තියන්න පටන් ගත්ත. උස ගස්වල සැඟවී සිටි තරුණයන් එසා දෙන්නා පුහු වී සමග බිම වැටුණු අතර ඒ වැටුණු සිරුරුවලට ඉංග්‍රීසිහු තිත් තිත් නැතිව නැවත වෙඩි තැබූහ.

ඉන්පසු මුහුණට මුහුණ සටන සිදු විය. කඩු, කැති, පොරෝ, මුගුරු අරගෙන එක වර තරුණයන් විසි දෙනෙකු පමණ ඉංග්‍රීසි හමුදාව මැදට පැන්න අතර ඉංග්‍රීසින් එක පිට එක වෙඩි තියද්දී ඔවුන්ගෙන් සිව් දෙනෙකුගේ බෙලි කපා දමන්නට ඔවුන්ට හැකි විය. ඉක්බිතිව පස් දෙනෙකුගෙන් යුත් සිය තුවක්කු කණ්ඩායම සමඟ ටිකිරි පසුපසින් පසුපසට වෙඩි තියමින් කැළෑ පාරක් ඔස්සේ ඉදිරියට දුව ගියේය. ඉංග්‍රීසින් ඔවුන්ව ලුහුබඳිමින් පෙරළා ඔවුන්ට වෙඩි තබමින් ඉදිරියට දිව ගිය අතර බිංදු සකස් කර තිබූ බොරුවළවල්වල ඔවුන්ගෙන් තිදෙනෙක් ඇදගෙන වැටුණහ.

බොරුවළවල්වල ඇදගෙන වැටුණු තිදෙනා අත හැර අනෙක් කණ්ඩායම ඉදිරියට දිව ගිය අතර පඳුරු අතරින් මතුවූ බිංදු වහා ඒ වළවල්වලට පැන ඒ තිදෙනා මරා දැම්මේය.

ටිකිරි සමඟ තුවක්කු අතින් ගත් අනෙක් සිව් දෙනා ලේසියෙන්ම අඩපණ කර මරා දමන්නට ඉංග්‍රීසි සොල්දාදුවන්ට වැඩි වේලාවක් ගියේ නැත. එහෙත් අවසාන සටන්කරුවා වූ ටිකිරි ඉංග්‍රීසි සොල්දාදුවන් දෙදෙනකු මරාගෙන මැරුණේය.

ටිකිරි මරා දැමූ පසු කැති පොරෝ වප්පිහි වැනි සුළු ආයුධ අතින් ගත් තරුණයන් තව අට දෙනෙකු ඉතිරි වූ අතර ඔවුහු මරබියෙන් කැළෑ පාරවල් ඔස්සේ හති දම දමා දුවන්න ගත්හ. ඔවුන් පසුපස ඉංග්‍රීසි හමුදාව එක දිගට ලුහු බැන්දේය. අන්තිමට වැව් තාවුල්ලෙන් වැවට පැන වතුරේ පීනා එගොඩ වෙන්නට ඔවුන් උත්සහ කළත් වැව් තාවුල්ල උඩ සිට නිවැරදි ඉලක්ක ගත් ඉංග්‍රීසි සොල්දාදුවන් විසින් ඒ අට දෙනාම මරා දමන ලද්දේය. ඔවුන්ගේ සිරුරුවලින් රූරා හැලුණු රුධිරයෙන් වැව් වතුර එහෙම පිටින්ම රත් පැහැ වුණේය.

ඉන්පසුව ඉංග්‍රීසි හමුදාව ස්වදේශිකයන් පෙන්වූ මඟ ඔස්සේ කෙළින්ම ගියේ ආරච්චිල වලව්වටය. තමන්ගේ ගෑනු දෙන්නා අත් දෙකෙන් තුරුලු කරගෙන මර බයෙන් ගැහි ගැහී ආරච්චිල වලව්වේ බරාඳය මැද හිටගෙන හිටියේය.

'බය බෝයි හාන්දුරුවනේ... මං මේ ගමේ ආරච්චිල... තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට ගැතිකං කරන නිලමක්කාර වහලෙක්...'

ඉංග්‍රීසි මේජර්වරයා ඔහු සමඟ පැමිණි ස්වදේශිකයෙකුට කනට කර යමක් කීවේය. එය හොඳින් සාවධානව අසා හිස සෙලවූ ස්වදේශිකයා ඉන් පසුව එය සිංහලට පරිවර්තනය කර ආරච්චිලට මෙසේ කීවේය.

'ඉංග්‍රීසි හාන්දුරුවෝ තොට දැනගන්න තියම කරනවා... තෝ මේ ගමේ ආරච්චිල බව දැනගෙන මේ ගෙදරට පැමිණි විත්තිය...'

'අනේ තරහ අවසර... උන්නාන්සේට තේරුම් කරන්ඩ මං එක ජුංඩක්වත් එංගලන්තේ මහ රජ්ජුරුවන්ට විරුද්ධ වුණේ නැති විත්තිය...'

යළිත් මේජර්වරයා ස්වදේශිකයාගේ කනට කර යමක් කීවේය. ඔහු නැවත එය මෙසේ පරිවර්තනය කර කීවේය.

'උන්නාන්සේ විමසනවා... එහෙම නම් මේ ගමේ එවුවො මෙච්චර ආයුධ රැස් කරගෙන සංවිධානය වුණේ කොහොමද කියලා...'

'සැක්කර හාමුදුරුවොත් සාක්කි... මං මුන්ගේ ඔය එක බඩ කැඩුත්තුවක්වත් දැනං හිටියේ නෑ... උන් උන්ගේ හිතුවක්කාරකමට කරපුව ඔච්ච...'

එවර මේජර්වරයා පොළොවේ අඩි හප්පා මහ හඬින් ඉංග්‍රීසියෙන් ගිගිරුවේය. ස්වදේශිකයා එය පරිවර්තනය කළේද බියෙන් ගැහි ගැහීය.

'ඒ මුකුත් නොදන්නව නං තෝ මොකට මේ ගමේ ආරච්චි වෙලා ඉන්නවද කියලා... ඉංග්‍රීසි හාන්දුරුවො විමසනවා...'

මේජර්වරයා තුවක්කුව අතට ගත්තේය. ආරච්චිලගේ නළලට ඉලක්කය ඇල්ලුවේය. ඒ අතර ආරච්චිලගේ කලවා දිගේ බේරී ආ මුත්‍රා බිංදු කීපයක් පොළොව උඩට වැටුණේය. ඒ සමඟම සිය ගෑනු දෙන්නා තරව බදා ගනිමින් ඔහු මෙසේ කෑ ගැසුවේය.

'අනේ සීවරන් දෙයි හාමුදුරුවනේ... මේ ගෑනු දෙන්න ගැනවත් හිතල මේ ගැත්තාට අනුකම්පා කරන්ඩ...'

එවර මේජර්වරයා කිසිවක් නොකී නමුත් එතෙක් ඔහු කී දෑ මෙතෙක් සිංහලට පරිවර්තනය කළ ස්වදේශිකයා අර පෙර ස්වරයෙන්ම මෙසේ ඇසුවේය.

The Reader's Place

'පර නාකියා... මේ ගෑනු දෙන්නටම වග කියන්නේ තෝ...?'

'එහෙමයි...'

ඒ වචනයේ අවසාන අකුර ආරච්චිලගේ කටින් හඬගා පිටවුණේ නැත. ඊට ඉස්සර මේජර්වරයාගේ තුවක්කුව ඉස්සර වුණේය. බඳාගෙන සිටි ගෑනු දෙන්නාගේ ග්‍රහණය ඔහු අතින් ලිහිල් වුණේය. ඊට පසුව නළලෙන් ගොජ දමමින් මතු වූ රුධිරය එක සීරුවට මුහුණ පුරා පැතිරෙද්දී කෙහෙල් කඳක් වගේ පොළොවට කඩා පාත් වෙන අතරතුර අවසාන වරට ඔහුගේ කටින් මෙසේ පිට වුණේය.

'අනේ මගේ කරලිනා..'

ආරච්චිලට වෙඩි තියූ විගස මේජර්වරයා තව සිං දෙනෙක් සමඟ වහා එතනින් නික්මුණේය. එහෙත් තවත් ඉංග්‍රීසි සොල්දාදුවන් දෙදෙනෙකු එතැන ඉතිරි විය. ඔවුහු ආරච්චිලගේ මිය ගිය සිරුරත්, බිසෝ මැණිකාත් පසෙකට තල්ලු කළහ. ඉන් පසු කරලිනා බිම දිගේ ඇදගෙන ඇතුළු ගෙට ගියහ. සිද්ධ වූ දේ හිතාගන්නවත් බැරුව බිසෝ මැණිකා ඉකිබිඳිමින් හූල්ලද්දී කරලිනා ගිරිය යටින් කෑ ගහන හඬ ඇතුළු ගෙයින් ඇහුණේය. ඊට ටික වේලාවකට පසු පරම්පරා ගණනාවක ආරච්චිවරුන් බිහි කළ ඒ තේජවන්ත ආරච්චි වලව්ව ගිනි ගෙන දැවෙන අයුරු ගමේ ඈතට පෙනුණේය.

එයින් පසුව ඉංග්‍රීසි සොල්දාදුවන් ගොස් තිබුණේ කිරිහාමි උපාසක රාළගේ ගෙදරටය. ඔහුගේ ගෙදර නිවැසියන් ආරක්ෂාව පතා කැළෑවේ සකස් කළ ආරක්ෂිත ස්ථාන කරා ගොස් තිබුණු නමුත් උපාසක රාළ ගෙයි පිලේ වාඩි වී නවගුණ වැලක් ඇඟිලි තුඩුවලින් ස්පර්ශ කරමින් කරණීය මෙත්ත සූත්‍රය වරද්ද වරද්දා සජ්ජායනා කරමින් සිටියේය. ස්වදේශිකයන් කිසිවෙකුත් ඔහුගේ ගෙදරට නොගිය නිසා ඉංග්‍රීසි සොල්දාදුවන්ට තමන් විසින්ම මේ වයසක මහල්ලාගෙන් ප්‍රශ්න කරන්නට සිද්ධ වුණේය. එහෙත් ඔවුන් ඉංග්‍රීසියෙන් ඇසූ එක ප්‍රශ්නයක්වත් යන්තමටවත් තේරුම් නොගත් උපාසක රාළ ඇත්තටම තමන්ගේ ගෙදරට කවුරු ආවාද කියා ඔළුව උස්සාවත් බලන්නේ නැතිව දිගටම පාලි පාඨ සජ්ජායනා කරමින් සිටියේය.

අන්තිමට මේ වයසක මහල්ලා තමන්ට සාප කරනවා යැයි තේරුම් ගත් සොල්දාදුවෝ ඔහු නව ගුණවැල ගනිමින් කරණීය මෙත්ත සූත්‍රය මහත් කරුණාවෙන් සජ්ජායනා කරමින් සිටිද්දී ඔහුගේ ගෙට ගිනි තියා පිස්සු නාකියෙක් යැයි ඉංග්‍රීසියෙන් කියමින් හිනා වෙවී යන්නට ගියහ.

සුරඹා ගුරුන්නාන්සේගේ ගෙදරට ගිය ඉංග්‍රීසි සොල්දාදුවන්ට සුරඹලා අම්මාත්, හීන් අම්මාත් එකතු වී වැලි ගසා තිබුණේය. වැලි පාරවල් වැදී කේන්තියට පත්ව ඔවුන්ට වෙඩි තියන්න නළලට ඉලක්කය මානන විට ඔවුන්ගේ නළල් තලවලින් ඉහඳ පණුවන් එළියට පනින්නට ගත් බැවින් සොල්දාදුවෝ හොඳටම බියපත්ව ගෑනු දෙන්නා එළියට තල්ලු කර ගෙට ගිනි තැබූහ. ගෙට ඇවිලෙන ගින්න දරාගන්න බැරි වූ හේතුහාමි අතට හසුවූ ගල් මුගුරුවලින් ඔවුන්ට පහර දෙන්න වූ විට එක් සොල්දාදුවෙක් ඉදිරියට පැන තුවක්කු බඳෙන් ඔහුගේ ඔළුවට ගසා තිබුණේය. ඒ එක පහරින්ම හේතුහාමි බිම ඇදගෙන වැටුණු අතර සොල්දාදුවන් ගිය පසු ඔහුගේ සිරුර බදා වැලඳගෙන හඬන්නට වූ සුරඹලා අම්මාගේත්, හීන් අම්මාගේත් අත්වලින් කඩා හැලුණු වැලිවලට යට වී ඔහුගේ සිරුර සාමාන්‍ය පරිදි භූමදානය වී තිබුණේය.

ඉංග්‍රීසි සොල්දාදුවන් කවර දවසක කවර විදිහට පැමිණියත් තමාට අනතුරක් නැතැයි කියූ අබ්දුල් මුදලාලිගේ සහ සේදරාගේ කඩයට සොල්දාදුවන් පැමිණෙන විට සේදරා හිටියේ පරඬැලක් ගානට කෙට්ටු වී අඳුරගන්න බැරුවය. ඉස්සර දවසකට අඩුම තරමේ අරක්කු බෝතලයක්වත් බී දඩ මස් ගාත් තුන හතරකට වග කියූ කාලයේ ගෙදර උළුවස්සකින් හැරෙන්නවත් බැරි තරමට උස මහත් වී සිටි සේදරා සොල්දාදුවන් කටින් හුළං පිම්බ විට ඈතට විසි වී බිම ඇදගෙන වැටුණේය. එක සොල්දාදුවෙක් එක ඇඟිල්ලකින් පමණක් තල්ලු කර ඔහු එළියට විසි කළේය. මිදුලේ ඉවතට විසි වූ සේදරා ගල් මුල්වල හැපී තුවාල වූ විට අබ්දුල් මුදලාලි සොල්දාදුවන් ඉදිරියට පැමිණ ඉංග්‍රීසි බසින් ඔවුන්ට බැගෑපත් වුණේය. එවිට තවත් සොල්දාදුවෙක් ඉදිරියට පැමිණ හොඳ පැහැදිලි සිංහලෙන් ඔහුට මෙසේ කීවේය.

The Reader's Place

'...තෝ මේ ගමේ නෙමෙයිනං.. තොගෙ වෙළඳාමක් බලා න්නේ නැතිව තෝ මොකටද මුන්ගේ කැවුතු අස්සේ පිංගන්නේ..'

ඉන් ඉක්බිතිව අබ්දුල්ගේ මනිබඩු, රෙදිපිළි එකින් එක එළියට ඇද සොල්දාදුවෝ ඊට ගිනි තැබූහ. අබ්දුල් නැවත පිං සෙණ්ඩු වුණේය. සොල්දාදුවෝ නැවත ගිනි තැබූහ. අබ්දුල් නැවත නැවතත් පිංසෙණ්ඩු වුණේය. සොල්දාදුවෝ නැවත නැවතත් බඩු එළියට ඇද ගිනි තැබූහ. අන්තිමට අබ්දුල්ගේ මේ පිංසෙණ්ඩු වීම ඔවුන්ට කෙතරම් කන්දොස්කිරියාවක් වී ද යත් බැරිම තැන එක් සොල්දාදුවෙක් ඔහුගේ කට ඇතුළට තුවක්කුවේ කට ඔබා කොකා ගැස්සුවේය.

කඩේට ගිනි තබා සොල්දාදුවන් පිට වී ගිය පසුව කැලි කැලි වලට කැඩුණු සිරුරෙන් සේදරාට අබ්දුල්ගේ මතකය වෙනුවෙන් අහුලාගන්න පුළුවන් වුණේ බිඳී ගිය දත් වහල්ලේ දත් කීපයක් පමණය. ඇවිළෙන ගින්නට ඔහුගේ සිරුරේ කැබලි තල්ලු කර අහුලාගත් දත් කීපය සිය කෙට්ටු අත මත තියාගෙන ගිලුණු ඇස් තුළින් ගොඩ ගොඩ ගා කඳුළු කඩා හැලෙද්දී ඔහු මෙසේ මුමුණණු ඇසුණේය.

'අන්තිමට මාව බේරගන්න... උඹ උඹේ හොඳම යාළුවන්ගෙ න් මැරුම් කෑව... උඹ දෙයියෙක් අබ්දුල්... උඹ දෙයියෙක්...'

ඉංග්‍රීසි සොල්දාදුවන් වල්ලීගේ ගෙදරට කඩා වැදෙන විට ඈ හිටියේ අමු නිරුවතින් පොඩි නිලමේ සමඟ රමණයේ යෙදෙමින්ය. පැමිණි අමුත්තන් දක්කත් වල්ලීත් පොඩි නිලමේත් මොහොතකටවත් ඔවුන්ගේ රමණයට එය බාධාවක් කරගත්තේ නැත. ඔවුහු සුපුරුදු පරිදි එකිනෙකා කෙරෙහි වූ ආවේශයෙන් බිම පෙරළි පෙරළී එකිනෙකාගේ සිරුරු මත තෙරපි තෙරපී හපා විකා ගනිමින් රමණයේ යෙදෙමින් සිටියහ. මේජර්ගේ අණ පරිදි ගෙවල්වලට ගිනි තියා ඔවුන්ට විරුද්ධ වන මිනිසුන් මරා දමා එන්නට නියෝග ලැබ ඇගේ ගෙදරට පැමිණි සොල්දාදුවෝ සිව් දෙනා උපන්තේකට මේ විදිහට දැක නැති රමණ සෙල්ලම සිංහල පැය භාගයක් විතර කටවල් ඇරගෙන බලා සිටියහ.

වල්ලීත් පොඩි නිලමේත් සුරතාන්තයට පත්ව හොඳටම හති ඇර එකිනෙකාගේ සිරුරු මත වූ සිරුණු තැන් එකිනෙකාගේ ඛෙට ශ්‍රාවයෙන් සමනය කරගෙන නිවාඩු පාඩුවේ තම ඇඳුම් ඇඳගෙන අන්තිමට තම දොරකඩ සිටින සොල්දාදුවන් දිහා අවධානය යොමු කළහ.

'තොපි මොකද මෙතන...'

වල්ලී ඔවුන් දිහා බලා ප්‍රශ්න කළාය. ඉංග්‍රීසි සොල්දාදුවෝ සිව් දෙනා එකිනෙකාගේ මුහුණට මුහුණ බලාගත්හ. මෙතරම් ගරුසරු නැතිව මේ නෝන්ජල් ගැති ඔවුන්ට කතා කරාවි යැයි ඔවුන් කවුරුන්වත් නොසිතූ විත්තිය ඔවුන්ගේ මූණුවලින් පැහැදිලි විය. එහෙත් එතැන සිටි සොල්දාදුවෙක් එකෙකුගේ කනට කර ඉංග්‍රීසියෙන් යමක් කියා සිනාසී ඊට පසු කැඩිච්ච සිංහලෙන් මෙසේ කීවේය.

'අපි ආවෙ තොපි දෙන්න මරන්න... ඒත් තොපි අර කලින් කරපු සෙල්ලම නැවත කරල පෙන්වනවනම් අපිට පුළුවන් තොපි නිදහස් කරන්න...'

ඔහු වටා සිටි අනෙක් සොල්දාදුවෝ එය අනුමත කරමින් එකිනෙකා දිහා බලමින් සිනාසුණහ. වල්ලී කිසි හැඟීමක් නැතිව ඈ සමඟ කතා කළ සොල්දාදුවා ඉදිරියට ආවාය. ඔහු ඈ ළංවත්ම රෞද්‍ර වේශයක් ආරූඪ කරගෙන ඇගේ නළලට තුවක්කුව දික් කළේය. එය ගණනකටවත් නොගත් වල්ලී ඔහුට හොඳටම කිට්ටු වී මෙසේ කීවාය.

'තොපිට ඕන වෙලාවට අපි නිදිවදින්න ලැස්ති නෑ... ඒත්..'

වල්ලී ඔහුගේ තුවක්කු කඳ අතින් ඈත් කර තවත් ඔහුට කිට්ටු වුණාය.

'ඒත්... මං කැමතියි... තෝත් එක්ක බුදියගන්න...'

සිංහල හොඳට තේරුණ ඒ සොල්දාදුවාට එය අදහාගන්න බැරි වුණේය. ඔහු තුවක්කුව පාත් කර ඈ දෙස විමතියෙන් බලා නැවත තම සහෝදර සොල්දාදුවන් සමඟ ඈ කී දේ ඉංග්‍රීසියට පරිවර්තනය කර කියමින් ඔවුන් සමඟ සිනාසෙන්නට පටන් ගත්තේය. ඒ අතර පොඩි නිලමේ හොඳටම කම්පනයට පත්ව ඈ ළඟට ඇවිත් ඇගේ අතින් ඇද්දේය.

The Reader's Place

'වල්ලී උඹට පිස්සුද ...?'

වල්ලී පොඩි තිලමේගේ අත ගසා දමා ඔහු දිහා රවා බැලුවාය. ඉන් පසුව ඈ යළිත් අර සොල්දාදුවාගෙන් නැවත මෙසේ ඇසුවාය.

'මොකද ලැස්තිද...?'

ඔහු තම තුවක්කුව තමා ළඟ සිටි අනෙක් සොල්දාදුවාට භාර දී අත් දෙක පිහදා ගනිමින් ඇගේ ළඟටම ඇවිත් ඇගේ [illegible] මිරිකන ගමන් සිනාසෙමින් කැඩිච්ච ඉංග්‍රීසියෙන් මෙසේ කීවේය.

'ආ... මං ලැස්තියි...'

කිසිම ආයුධයක් නැති මේ නිරායුධ ගැමි ගැහැනියකට මොනා බය වෙනවාදැයි ඔහු හිතුවේය. ඒ එක්කම මේ [illegible] සම්පූර්ණ ඉංග්‍රීසි රෙජිමේන්තුවේම තමා තරම් [illegible] නොමැති විශ්වාසය ඔහු තේරුම් ගත්තේය. පොඩි තිලමේ [illegible] අනෙක් සොල්දාදුවන් තිදෙනා පිල ළඟ ඉඳිද්දී වල්ලී ඔහු සමඟ දේවාලය ඇතුළට ගියාය.

[illegible]

දේවාලය ඇතුළෙන් විශේෂ ශබ්දයක් නැතිව තවත් ටික වේලාවක් ගත වුණේය.

[illegible]

නිදාගන්න බැරි වුණ ඒ එකම එක මොහොත තුළ සොල්දාදුවන් දෙදෙනෙකු ලේ පෙරාගෙන එතැනම මැරී වැටුණු අතර කිරිවච්චි [illegible] නොවැදුණු අනෙක් සොල්දාදුවා [illegible]

[illegible]

The Reader's Place

ගැන්වී සිටි නමුත් සලුමලී නොහඬවාම සිනාසෙන්නට වූවාය. මේ දෙහැවිරිදි දූරිය විළි ලැජ්ජා නැතිව මේ හිනාවෙන්නේ ඉංග්‍රීසි ආණ්ඩුවටත් සොල්දාදුවන් වූ තමන්ටත් යැයි තේරුම් ගත් ඔවුන් දෙදෙනා හොඳටම වියරු වැටී සලුමලී උස්සා පොළොවේ ගැහුහ. ඒ ඇසිල්ලෙන් සොබනී හීන් පුරහාස් වඩාගෙන කැලේට පැන ගත් අතර වියරු වැටුණු සොල්දාදුවන් දෙදෙනාට මේ මව සහ පුතු සොයාගන්න ලැබුණේ නැත.

ඉංග්‍රීසි සොල්දාදුවන් ගමට පහර දෙන බව දැනගත් විගස පොඩිනා කැලේ සැඟවුණාය. පැය කීපයක් එක දිගට එකම තැනක හිප්ප තියාගෙන ළතැවී ළතැවී ඉන්න අතරතුර ඈට තම සහෝදර ගම් වැසියන්ගේ මරලතෝනි හඬ ඇසුණේය. ඈතින් බුර බුරා ගෙවල්වලින් ඉහළට නැගෙන රතු පැහැ ගිනි ජාලා නොපෙනුණත් කළු දූමාරය පෙනුණේය. ඈට ලොකුම විස්සෝපය තිබුණේ බිංදු ගැනය. දැන් වේල් දෙකක් එක දිගට ඔහුට කිරි දෙන්න බැරි වූ නිසා තන බුරුලුවලින් මතු වුණු කිරිවලින් ඇගේ හැට්ටය තෙමී තිබුණේය. එහෙත් අවුරුදු විස්සක විතර පෙනුමැති ශරීර ශක්තිවන්තයා වූ බිංදුට ඉංග්‍රීසි සොල්දාදුවන් හොරුවළවල් වෙත පන්නා මරා දැමීමේ වගකීම පැවරී තිබූ බැවින් ඈට අකමැත්තෙන් වුණත් හිත හදාගන්න සිදු වුණේය.

එහෙත් බිංදුට අමතරව විස්සෝප වෙන්න තවත් හේතුවක් ඇයට තිබුණේය. ඈ කට බැඳ අසුරා තැබූ රිදී කාසි මුට්ටියක් ගෙදර දමා ඇවිත් තිබුණේය. ගෙදර අගහිඟකම් තිබූ බැවින් කාසි මුට්ටි කැළෑවේ වළ දමා තිබූ තැනකින් ඈ මේ රිදී කාසි මුට්ටිය ගොඩගෙන තිබුණේ දෙදවසකට ඉහතදීය. හිතක් පපුවක් නැති ඉංග්‍රීසින්ට මේ රිදී කාසි මුට්ටිය භුක්ති විඳින්න ගෙදර දමා එන්නේ කුමටදැයි ඈ තමාගෙන්ම ප්‍රශ්න කළාය. ඒ සමගම ඉංග්‍රීසින් පිළිබඳ කේන්තියකින් හා රිදී කාසි මුට්ටිය පිළිබඳ පෙරේත හිතකින් ඈ එකවර පරල වුණාය. එහෙයින්ම ඈ කෙසේ හෝ ගෙදර යා යුතු බව ඉටා ගත්තාය.

පැය කීපයකට පසු මර ළතෝනි සද්ද අඩු වී ගම සාමකාමී වෙන් වටපිටාවේ ඇති වූ විට ඈ හිප්ප තියාගත් තැනින් නැගිට ගස්වලට මුවා වෙවී තම ගේ දිහාට ගැහුවාය. කෙසේ හෝ කිසි අනතුරක් නැතිව ඈට ගේ ළඟට එන්න පුළුවන් වුණේය. මැටි බිත්තියෙන් බැඳි ඇගේ පරණ ගෙට හෝ [illegible] ගඩොලයෙන් බැඳි ඇගේ අලුත් ගෙට හෝ ඉංග්‍රීසින් අත තියාවත් තිබුණේ නැත. එය දැකීමෙන් මහත් ප්‍රමෝදයට පත් ඈ එය හිත ඇතුළේ සිර කරගෙන වහා පරණ ගෙට රිංගා ඇඳක් යට සඟවා තිබූ රිදී කාසි මුට්ටිය කරට ගෙන බිත්තිවලට මුවා වෙවී එළියට බැස්සාය. පිළිකන්නෙන් ඈ එළියට බහින විටම විස්සක විතර සොල්දාදුවෝ පිරිසක් ඈ වට කරගත්හ.

තමා දැක තොල කට ලෙවකමින් සිනාවෙන්නට වූ සොල්දාදුවන් පිරිස දුටු විගස කුමක් කළ යුතු දැයි ඈට එකවර සිතාගන්නට බැරි වුණේය. එහෙත් ඈ ක්ෂණයකින් රිදී කාසි මුට්ටියේ කට ඇර රිදී කාසි අහුරු අහුරු පිටින් අරගෙන තමන් වටා සිටි සොල්දාදුවන්ට දමා ගසන්නට පටන් ගත්තාය. ඈ කොතරම් ආවේශයකින් එය කළත් සොල්දාදුවන්ට එය හොඳ විනෝදයක් වුණේය. ඈ විසි කළ රිදී කාසි ඔවුන්ගේ ඇඟේ පතේ මුහුණේ වැදී බිම වැටෙද්දී බිම පෙරළී පෙරළී සිනාවෙමින් ඔවුහු ඒවා සාක්කුවල පුරවාගත්හ. පොඩිනා මුට්ටියේ අන්තිම රිදී කාසියත් විසි කර අවසන් වූ විට ඔවුහු එක වර ඈ දිහාට තුවක්කු මානා ඉලක්කය ගත්හ.

ඒ ක්ෂණයෙන් අහසින් කඩා වැටුණු විදුලියක මෙන් බිංදු සොල්දාදුවන් ඉදිරියේ හිටගත්තේය. අත තිබුණු තුවක්කු ඔහු දිහාට දික් කරන්න තියා ඔවුන්ට තව එකදු සිතිවිල්ලක්වත් සිතන්න නොලැබුණු නිමේෂයක් තුළ බිංදු හිටි පියවරින් අහසට පැන වටේට කැරකී කැරකී අතින් සහ පයින් පහර දුන්නේය. සොල්දාදුවන් කීප දෙනෙකුගේ බෙලි ඔහු අතින් සිඳුණු අතර තවත් කීප දෙනෙකුගේ කොඳු නාරටි සහ කකුල් අතපයවල සන්ධි ඔහු අතින් කැඩී බිඳී ගොස් තිබුණේය. ඒ සමග තවත් කීප දෙනෙක් ඔහුගේ පහරවල් කාගෙන මර බයින් ඈතට දුවමින් සිටියහ.

The Reader's Place

නමුත් කවුරුන්වත් නොසිතූ මොහොතකදී කාගේ හෝ තුවක්කුවක් වැරදීමකින් එක වර පත්තු වුණේය. එය වැරදීමක් වුවත් ඒ මූනිස්සම තුවක්කු කටෙන් නික්ම මේ සියල්ල දිහා විස්මයෙන් බලාගෙන සිටි පොඩිනාගේ දකුණු තන පුඩුව පසාරු කරගෙන ඇතුළට ගියේය. පොඩිනා පපුව බදාගෙන බිම ඇදගෙන වැටුණාය. බිංදු වහා හැරී ඈ වෙතට දුවගෙන ආවේය. එහෙත් ඒ වන විටත් පොඩිනාගේ සිරුරෙන් ලේ ගලා යමින් තිබුණේය.

එහෙත් පුදුමය නම් ඇගේ සිරුරෙන් ගලා ගියේ ලේ නොවේ. දීර්ඝ කාලයක් තිස්සේ අපමණ මිනිසුන් සැනසූ, අපමණ මිනිස් ජීවිත සන්තුෂ්ඨියට පත් කළා වූ ඇගේ සම්පූර්ණ සිරුරේ තිබුණේ මව් කිරිය. ඇගේ සිරුරේ රතු පැහැ රුධිරය සර්ව සහතික ලෙසම මව් කිරිවලට හැරී කිරි පැහැ වී තිබුණේය. උපන්දා සිට මේ මොහොත දක්වාම ඇගේ තන පුඩුවලින් ගලා ආ කිරි මිස වෙන කිසිවක්ම කටේ නොතැබූ බිංදු මේ මොහොතේ වෙඩි බෙහෙත් මූනිස්සමට පසාරු වුණ ඇගේ දකුණු තන පුඩුව උඩින් එක හුස්මට ගලන කිරි දහරාව දිහා ඇස් අදහාගත නොහැකිව බලා සිටියේය. වහා ඈ වෙත නැමී සිය අත් බාහු යුගලට ඇගේ සිරුර වත්තන් කරගත් විට පොඩිනා සිය පියවෙන ඇස් අමාරුවෙන් ඇර ඔහු දිහා බලාගෙන මෙසේ කීවාය.

'උඹ නිසා මගේ පපුවේ කිරි එරුණට මට උඹව වදන්න බැරි වුණා... ඒත් ඊළඟ ආත්මේ උඹ මගේ බඩේම ඉපදෙන්න ඕන...'

පොඩිනා බිංදු දිහා බලාගෙන ඇස් ඇරගෙනම මියගියාය. ඇගේ සිරුරෙන් පිටතට ගැලූ මව් කිරි තැන තැන මැරී වැටුණ සොල්දාදුවන් අතරින් ගලා යන හැටි බිංදු බලා සිටියේය. ඒ සමග පණ අදිමින් සිටි සොල්දාදුවෙකුගේ මුව අද්දරින් ඇගේ මව් කිරි ගලාගිය අතර ඔහු බිම වැතිරී වැලි මුසු ඒ කිරි දිවෙන් රස කර බැලුවේය. මොහොතකින් නැවත ජීවයක් ලද ඒ සෙබළා වැතිරී සිටි තැනින් නැගිට දුවන්න පටන් ගත්තේය.

ඒ අතර නැවත තුවක්කු මානාගෙන ඈත සිට දිව එන සෙබළ සමූහය බිංදුගේ ඇස ගැටුණේය. ඔහු වහා පොඩිනාගේ මළ සිරුර සිය දෝතින්ම ගෙන හුන් තැනින් නැගිට කැළේ

ඇතුළට දුවන්න පටන් ගත්තේය. නොනැවතී බොහෝ ඈතට දුව ගිය බිංදු තමා අතින්ම කැපූ බොරු වළක් තුළ පොඩිනාගේ සිරුර මිහිදන් කර පස් දමා වසා නැවත කැලේ ඇතුළට යන්න හදන විට සිය නිවස ඇති පැත්තෙන් බුර බුරා ඉහළට නැගෙන කළු දුම් වලා දකින්නට ලැබුණේය.

ගමේ සිද්ධ වෙන මේ කිසි දෙයක වගක් නිච්චියක් නැතිව හිටි එකම කෙනා ගෝමරීය. ඉංග්‍රීසින් ගමට කඩා වැදුණු වෙලාවේ කිසිම වැඩකට නැති පුංචාගේ සිරුර අතහැර කැලේ ඇතුළට යන්න එන්නැයි ලැයිසා ඇයට කෙතරම් ඇවිටිලි කළත් මේ ගෙදර අතහැර යන්නේ කුමටදැයි ගෝමරීට තේරුම් ගන්න බැරි වුණේය. එහෙත් දිගින් දිගටම ලැයිසා ඇවිටිලි කරන කල ගෝමරී අන්තිමට මෙසේ කීවාය.

'කමක් නෑ... ස්වාමී දූ මං මේ ගෙදර ඉන්නවට අකමැති නං මං එළියට බහින්නං...'

ඒත් කාරණය එය නොවන බවත්, ඉංග්‍රීසි හමුදාව ගමට කඩා පැන මිනිසුන් මරා දමමින් ගෙවල් ගිනි තියන බවත්, තවත් මෙතැන ළතැවි ළතැවී හිටියොත් අපට සිදු වන්නේ ඒ සන්තැසියම බවත් ලැයිසා ඇයට පැහැදිලි කරදුන්නාය. එහෙත් ඉංග්‍රීසින් කියන්නේ කව්රුන්දැයි ඈ පුන පුනා ප්‍රශ්න කළ අතර ලැයිසා තමන් දන්නා වචනවලින් බොහෝ වේලාවක් පැහැදිලි කළ පසු එය තේරුම් ගත් බව අඟවා ගෝමරී මෙසේ කීවාය.

'ස්වාමී දූ කියන්නේ රාජසිංහ රජ්ජුරුවෝ ගමට වඩිනව කියලා වෙන්නැති... අනේ කොච්චර පිනක්ද ? මං ආසයි ඒ උත්තමයව හැබැහින් දකින්ඩ...'

ඇගේ මතකය රාජසිංහ රජ්ජුරුවන්ගෙන් මෙපිටට මැරී ඇති බව සහසුද්දෙන්ම තේරුම් ගත් ලැයිසා මේ මියගිය ප්‍රාණ දෙක ගේ ඇතුළේ දමා කැළේට දිව්වාය.

ලැයිසා කැළේට වැදී සිංහල පැයක් යන්නට මත්තෙන් ඉංග්‍රීසි හමුදාව ගෝමරීගේ ගෙට කඩා පැන්නේය. මළ සොහොන් පාළුවට ගිය මේ ගෙදර කවුරුන්වත් නොමැති වින්තිය එක වරම තේරුම් ගත් ඔවුහු ගිනි හුළු දල්වා ගෙට ගිනි තියන්න

The Readers Place

ලැස්ති වුණහ. ඒ සමගම රාජසිංහ රජ්ජුරුවන්ගේ සම්ප්‍රාප්තිය අපේක්ෂාවෙන් සිටි ගෝමරී ඉදිරියට ආවාය.

'කෝ රජ්ජුරුවො...'

එතැන සිටි ස්වදේශිකයෙක් එක් වරම ඈ දිහා බැලුවේය.

'ඒ උත්තමයා එංගලන්තේ...'

'අනේ වාසනාවන්. අපේ ආයුසත් අරගෙන ඒ උත්තමයා වැඩි කල් ජීවත් වෙන්ඩ ඕන...'

ඉංග්‍රීසි මේජර්වරයා ඈ කියන්නේ කුමක්දැයි ස්වදේශිකයාගෙන් විමසුවේය. ඔහු ඈ කියූ දේ ඉංග්‍රීසියට පරිවර්තනය කර මේජර්වරයාට පැවසුවේය.

ගෝමරී දොරකඩ ළඟ ඉඳන් ඇගේ හිතේ උත්තම තැනක හුන් රාජසිංහ රජ්ජුරුවන්ව සිහි කර දොහොත් මුඳුන් දී වඳින අතර තුර මේජර්වරයා තනිවම ගේ ඇතුළට ගියේය. මොහොතකින් ඔහු සිය අත් බාහු දෙක මත දිගට දිගේ වැඩුණු පුංචාගේ සිරුර රඳවාගෙන එළියට ආවේය. ගෝමරී කෑ ගැසුවාය. එහෙත් ඈ දෙස නිකමටවත් නොබැලූ මේජර්වරයා පුංචාගේ සිරුර කිසිම අනුකම්පාවක් නැතිව සිය මුළු වෙර යොදා එළියට විසි කළේය. බඹ හත අටක් උඩින් විසි වී පොළොව මත පතිත වුණු ඒ සිහි මුර්ජා වූ හැඩි දැඩි සිරුර ඉන් පසු පෙරළී ගොස් මිදුලේ ඈත නැවතුණේය.

ගෝමරී කෑ ගසාගෙන පුංචාගේ සිරුර වෙත දුවන්නට වූ අතරතුර ගිනි හුළු අතේ තියාගෙන සිටි පිරිස ගෙට ගිනි තියන්න පය ඉස්සර කළහ. මේජර්වරයා මිදුලේ ඈත නැවතුණ සිහිසුන් තරුණ සිරුර වෙත කෑ ගසමින් දුවන ගැහැනිය දෙස මොහොතක් බලා සිටියේය. ඊළඟ මොහොතේ ලොකු හුස්මක් ඉහළට ගත් මේජර්වරයා ගෙට ගිනි තියන්න සූදානම් වූ පිරිසට එය නතර කරන්නැයි කෑ ගසා සංඥා කළේය. ඉන්පසු ස්වදේශිකයා සමඟ මිදුලේ ඈතට ඇවිද තම දරුවාගේ සිරුර බදාගෙන හඬන ගැහැනිය ළඟ හිටගත් මේජර්වරයා ස්වදේශිකයාගේ කනට කර යමක් පැවසුවේය. එය හිස වනා අනුමත කළ ස්වදේශිකයා ගෝමරී දෙස හැරී මෙසේ කීවේය.

'ඉංග්‍රීසි හාන්දුරුවො තොට දනගන්න තියම කරනව... එංගලන්තයේ වැඩ වසන තුන්වෙනි ජෝර්ජ් මහ රජ්ජුරුවන් පිළිබඳව තොගේ හිතේ තියන ගෞරව සම්ප්‍රයුක්ත බය පක්ෂපාත කමට එතුමන් ගෞරව කරන බව. ඒ නිසා තොපටත්, තොපෙ දරුවාටත්, තොප වසන නිවසටත් හානියක් නොකරන බවට එතුමා ප්‍රතිඥා දෙනවා...'

සිය හිස නමා ගැහැනියට ආචාර කළ මේජර්වරයා සිය සේනාව සමඟ එතැනින් නික්මුණේය.

එහෙත් ඒ වන විට බ්‍රිතාන්‍යයේ අග්‍ර රාජයා වූ තුන්වැනි ජෝර්ජ් රජු රාජ්‍ය පාලනයේ අපොහොසත් මහල්ලෙකු බවට පත්ව රාජ්‍ය පාලන කටයුතු ඔහුගේ පුත්‍ර වේල්සයේ කුමාරයාට පවරා තිබූ බව මේජර්වරයා දැන සිටියේ නැත. එසේම ඒ වේල්සයේ ප්‍රතිරාජ කුමාරයා ප්‍රතිපත්ති විරහිත අශික්ෂිතයෙකු බවත් විනෝදාංශයක් විදිහට අනියම් භාර්යාවන් එක් රැස් කළ ජේත්තුකාර සල්ලාලයෙකු බවත් ඔහු මේ ගැහැනියට සමාව දුන්නේ එවන් ප්‍රතිපත්ති විරහිත සල්ලාලයෙකුගේ නාමයෙන් බවත් දැන සිටියේ නැත.

The Reader's Place

ගමට කඩා වැදුණු ඉංග්‍රීසි හමුදාව සිය මේජර්වරයා සමඟ ඔවුන්ට එරෙහි වන මිනිසුන් මරා දමමින් ගෙවල් දොරවල් ධන ධාන්‍ය, ගව මහිෂාදීන් ගිනිබත් කරමින් මෙසේ ගම පුරා හක්කලං කරන අතර එක් විශේෂ පුද්ගලයෙක් ඉංග්‍රීසි සොල්දාදුවන් හත් අට දෙනෙකු කැටුව එදා සන්ධ්‍යා යාමයේ කෙළින්ම ගමේ පන්සලට ගියේය.

හැඳ සිටි ඇඳුමෙන් සහ ගමන් ලීලාවෙන් උසස් සිංහල නිලමක්කාරයෙකුගේ ගති සොබා පළ කළ මේ පුද්ගලයා සිය පිරිස සමඟ තුවක්කු කඳ කරේ තියාගෙන පන්සලේ ගල් පඩිපෙළ නැඟ ආවාස ගෙට ඇතුළු වී සැබවින්ම කිසිවෙකු අපේක්ෂාවෙන් සිටි ඇබිත්ත උන්නාන්සේට මඳක් ඈතින් කිසිම ගරුසරුවක් නැතිව හිට ගත්තේය.

ඇබිත්ත උන්නාන්සේ හිටියේ සති ගාණක් තිස්සේ එක දිගට වාඩි වී හුන් ආසනය උඩය. කෙතරම් දවස් ගාණක් ඔහු එතන

ඒ විදිහට ඉඳගෙන හිටියාද කීවොත් ඔහුගේ කකුල් පොළොවට මුල් ඇද තිබුණේය. සුපුරුදු පරිදි උඩුකයට සිවුරක් නැතිව වීළි වැසෙන්නට හැඳ සිටි අඳනකඩය ශරීරයේ වෙළී යළි ගලවන්න බැරි තරමට සිරුරට ඇලී තිබුණේය.

ආවාස ගෙයි දොරකඩ උසට උසේ හිටගත් මිනිසාට ඇබිත්ත උන්නාන්සේ ආසනයේ ඒ විදිහටම ඉඳගෙන කතා කළේය.

'කව්ද ඔතන...'

'කව්ද කියල බලන්න තෝ ඔතනිං නැඟිට්ටනං හොඳයි...'

ඇබිත්ත උන්නාන්සේ යන්තමට කට කොනකින් හිනාවුණේය.

'ආ... ගරු සරු ඇතිව කතා කරන්නවත් දන්නේ නැති ඉංග්‍රීසින්ගේ බත් බැලයෙක්...'

මිනිසා තුවක්කු කඳ ඔහුට දික් කර වියරුවෙන් කෑ ගැසුවේය.

'මොකද්ද බොල තෝ කිව්වේ...'

'ඉංග්‍රීසින්ගේ සපත්තු ලෙවකන බත් බැලයෙක් කිව්වා...'

'තෝ දන්නවද බොල මං කව්ද කියලා...'

'මං සිංහල ලේ තියෙන කාලකණ්ණි අඳුනගන්න කැමති නෑ...'

ඔහු ඉදිරියට ඇවිත් ඇබිත්ත උන්නාන්සේගේ මුහුණට තුවක්කු බඳෙන් ගැසුවේය. ඒ සමඟම ඉංග්‍රීසි සොල්දාදුවෝ ඇතුළට ඇවිත් ඔහු වට කරගත්හ. එහෙත් ඔහු අතින් ඔවුන්ට මඳක් ඉවත් වන ලෙස සංඥා කළේය.

'දැනගනිව්... මං එක්නැලිගොඩ...'

'ආ... මං අහල තියෙනවා... ඉංග්‍රීසීන්ගේ හිත දිනාගන්න සිංහල ගම් වනසන සූදු කෙළින එක්නැලිගොඩ කියන මහ ලොකු නිලමේ ගැන.'

ඔහු යළිත් ඉදිරියට පැමිණ එවර ඇබිත්ත උන්නාන්සේගේ පපුවට තුවක්කු බඳෙන් ගැහුවේය. එවිට ඔහු මේ මිනිසා මේ පුටුවට ඇලී ඇති බව දුටුවේය. එසේම ඔහුගේ කකුල් පොළොවට මුල් ඇද ඇති බවද දුටුවේය. එයින් එක් වරම විමතියට පත් එක්නැලිගොඩ නිලමේ හිටි තැනම වටයක් කැරකී ඇබිත්ත උන්නාන්සේ ඉදිරිපිට හාන්සි පුටුවේ ඉඳගත්තේය.

'මං තෝ ගැන අහල තියෙනවා... පත්සල් ඇඳගෙන හැඩ තියාගන්න, ළමයි බමයි ඉන්න, මහ ලොකු හාමුදුරු නමක් කියලා...'

'මං හාමුදුරු නමක් නෙමෙයි...'

'යකෝ මේක මාගම් සෝලියක්...'

එක්නැලිගොඩ නිලමේ පොළොවේ අඩි හැප්පුවේය. එහෙත් ඇබිත්ත උන්නාන්සේ ඉතා තැන්පත්ව මෙසේ කීවේය.

'මං හාමුදුරු නමක් නොවන නිසා ඒක මාගම් සෝලියකුත් නෙමෙයි...'

'ඒත් මිනිස්සුන්ට කියල උන්නාන්සේ කියල කියව ගන්නවා...'

එක්නැලිගොඩ නිලමේ ඔහු දිහා අවඥාවෙන් බැලුවේය.

'ඇබිත්ත උන්නාන්සේ... ඒ මිනිස්සු මට දාපු නම... බණ්ඩා, උක්කුවා, ගුණයා වගේ ඒක තවත් එක ගිහි නමක් විතරයි...'

'ඒත් තමුන්ට ධ්‍යාන සමාපත්ති තියෙනවා කියල මේ අහල ගම්වල මිනිස්සු කියනවා...'

'ධ්‍යාන එල ලබන්න හාමුදුරු නමක් වෙන්න උවමනා නෑ... අරමුණයි, අවබෝධයයි, උත්සාහයයි විතරයි අවශ්‍ය...'

එක්නැලිගොඩ නිලමේ යළිත් පොළොවේ අඩි හැප්පුවේය.

'මට උඹෙන් බණ අහන්න උවමනා නෑ...'

'බණ කියන්න මට උවමනාවකුත් නෑ...'

එවර නිලමේ යළි ඉදිරියට නැමී ඔහුට පහර දුන්නේය. එහෙත් ඇබිත්ත උන්නාන්සේ එය ගණනකට නොගෙන හිනාවුණේය.

'තොගෙ හිනාව පැත්තකට කරගනින්... තොට විරුද්ධව බරපතළ චෝදනා තියෙනව... කැරැල්ලට තෝ නොසැහෙන්න උදව් කරල තියෙනවා. ඉහගම හාමුදුරුවන්ගේ ගෝලයෙක් වෙච්ච පල්ලේගම හාමුදුරුවොත් එක්ක තොගෙ ලොකු සම්බන්ධයක් තිබිල තියෙනවා. ඊළඟට ගමේ මිනිස්සු එකතු කරල පුරුදු පුහුණු කරල ආයුධ දීල උඹ කැරැල්ලට යවල තියෙනවා. ඉංග්‍රීසින්ට පහර දෙන්න ගමේ වෙනම කණ්ඩායමක් ලෑස්ති කරල තියෙනවා... මේ චෝදනා උඹ නැහැයි කියල කියනවද ...?'

The Reader's Place

'ඔය ඔක්කොම ඇත්ත... මේ ගමේ අහිංසක මිනිස්සු බලා කියාගන්න මං බැඳී හිටියෙ නැත්නං මං මේ කැරැල්ලට ඔයිට වැඩිය උදව් කරනවා...'

එවර හොඳටම වියරු වැටුණු නිලමේ තුවක්කුව උස්සා ඇබිත්ත උන්නාන්සේගේ ඔළුවට ගැනුවේය. ඔළුව පැළී ලේ ගලා යන්නට වූ විට ඔහු තවත් වියරුවෙන් හිනා වුණේය.

'කෝ උඹේ මහ ලොකු ධ්‍යාන සමාපත්ති...පුහ්... අම්මගෙ රෙද්ද...'

'මේ ලෝකේ මගේ යුතුකම් කොටස ඉවරයි. අනික් අතට අපි ඔක්කොටම උඹ ගැතිකම් කරන ඉංග්‍රීසින්ගෙන් මේ රට බේරගන්න බැරි වුණා. ඒ හින්දා තවත් මේ ලෝකේ ඉඳගෙන මගේ ශරීරෙ තඩිත්තු කරන්න මහන්සි වෙන එක තේරුමක් නෑ...'

'ආ... උඹ හදන්නේ මට කියල උඹේ පපුවට මේ තුවක්කුව පත්තු කරගන්න... ඒත් මං එච්චර පව්කාරයෙක් නෙමෙයි බොල. මුත් ඉන්නෙ ඒකට තමා...'

නිලමේ තමා අවට සිටගත් සොල්දාදුවන් පිරිස ඇඟිල්ල දික් කරමින් පෙන්නුවේය. ඒ සමග ආරූඪ කරගත් අනුකම්පාවකින් ඇබිත්ත උන්නාන්සේ දෙස බලා මෙසේ කීවේය.

'ඒත් මට දුක තොගෙන් පස්සේ මේ පන්සල ගරා වැටෙන එකට... මගේ පුතයි බෑණයි ඉංග්‍රීසි ආගමට හැරුණට මං තාම හොඳ බෞද්ධයෙක් බොල...'

'ඒකට දුක් වෙන්න උවමනා නෑ... මේ පන්සල කවදාවත් ගරා වැටෙන්නේ නෑ... මේකෙ අනාගතය බාරගන්න මනුස්සයා මගෙන් පස්සේ පන්සලට එයි...'

'ආ... තොට අනාගතේ කියන්ඩ පුළුවන් ආ... පුහ්... අම්මගෙ රෙද්ද...'

ඔහු වියරුවෙන් හිනා වුණේය. ඊට පසු හාන්සි පුටුවේ හොඳට හරි බරි ගැහී ඉඳගෙන ඇබිත්ත උන්නාන්සේට මෙසේ අභියෝග කළේය.

'පුළුවන්නං කියහංකො බලන්ඩ මගේ අනාගතේ ගැන...'

ඇබිත්ත උන්නාන්සේ ඔහු දිහා බලා අනුකම්පාවෙන් හිනාවුණේය. ඊට පසු මෙසේ කීවේය.

'උඹ කරල තියෙන පව් බොහොම බරපතළයි. කවදත් [illegible] උඹ මීටත් වැඩිය පව් එකතු කරනවා. ඒ හින්දා අවුරුදු ගණන්වත් ජීවත් වෙන්න උඹට ආයුෂ නෑ... ඉංග්‍රීසි ආණ්ඩුවෙන් [illegible] ගරු නාම්බු ගම් බිම් ලැබුවත් තව අවුරුදු තුනකින් උඹ පොළොවට පස් වෙනවා...'

ඇබිත්ත උන්නාන්සේගේ ඊතල වැනි වචන එක්නැලිගොඩ නිලමේට කොහොමටවත් අසා ඉන්න බැරි වුණේය. ඉංග්‍රීසි ආණ්ඩුවේ ගෞරව සම්ප්‍රයුක්ත නිලමේවරයෙකු වූ තමාට මේ කුඩුවක වටිනාකමක් නැති මිනිහා හෙට අනිද්දාට - තව අවුරුදු තුනක් යනකොට - මැරෙන බව කියා අභියෝග කරන්නේ කෙසේද ?

ඔහු පොළොවේ අඩි හප්පා වියරුවෙන් කෑ ගැහුවේය. අවට සිටි සොල්දාදුවන්ට ඉංග්‍රීසියෙන් බැණ වැදුණේය. ඒ සමගම මහා ශබ්දයක් නගා ඔහුගේ තුවක්කු කටෙන් මුනිස්සම් පිටවී එය ඇබිත්ත උන්නාන්සේගේ පපුව පසාරු කරගෙන ගියේය. සියල්ලෝ තුෂ්ණිම්භූතව සිදු වූ දේ අදහාගන්න බැරුව ඇබිත්ත උන්නාන්සේ දෙස බැලූහ. ඇබිත්ත උන්නාන්සේ පොළවට මුල් ඇද තිබූ කකුල් ඒ විදිහටම තියාගෙන ආසනය මත ඉඳගෙන සිටි ඉරියව්වෙන් ඒ විදිහටම ඉඳගෙන වෙඩි උණ්ඩය පපුව පසාරු කළ තැනින් එළියට ගලන රුධිරය අතින් තද කරගෙන එක්නැලිගොඩ නිලමේ දිහා අනුකම්පාවෙන් බලා මෙසේ කීවේය.

'මං සති ගාණක්ම මේ ආසනයෙන් නැගිට්ටේ නැතිව බලාගෙන හිටියේ නිලමේ එනකං... මේ සිංහලේ පාවා දුන්න සිංහලයෙක් අතින්ම මං මැරෙන්න ඕන... ඒකයි මගේ දෛවය... ඒ වගේම නිලමෙගෙ දෛවයත් වෙනස් කරන්න බැරි බව මතක තියාගන්න...'

ඊට මොහොතකට පසු සාමාන්‍ය පැවිද්දෙකුටත් වඩා සුවිශේෂ පැවිදි උත්තමයකු වූ, එහෙත් කිසිදාක පැවිද්දෙකු නොවූ, ගැහැනු දෙදෙනෙකු සමග රති සුව විඳ දරුවන් තිදෙනෙකුට පියෙක් වූ, ඇබිත්ත උන්නාන්සේ නම් වූ ගිහි තෙමේ අවසන් හුස්ම හෙළුවේය.

The Reader's Place

14

ඉංග්‍රීසින් ගමට පහරදී පලා ගිය පසු මුළු ගමම අමු සොහොනක් වී තිබුණේය. පහර දීමෙන් මියගියේ කව්ද මිය නොගියේ කව්ද කියා වෙන් වෙන්ව හොයන්න ගමේ කාටවත් නිදහසක් ඉඩ පාඩුවක් නොතිබුණා වගේම පහර දීමෙන් කී දෙනෙක් මියගියාද කියා ඉලක්කම් එකතු කරන්න පුළුවන් තත්ත්වයේ කවුරුන්වත් ගමේ ඉතිරි වී නොසිටියේය.

The Reader's Place

ගමේ ගිනිගෙන නොතිබුණු ගෙදරකට තිබුණේ ගෝමරීගේ ගෙදරත්, පොඩිනාගේ අලුත් ගෙදරත් විතරය. ගමේ සියලු ගෙවල් සුන්නද්දූලි කිරීමෙන් ඉක්බිතිව එදා හවස් ජාමයේ එක්නැලිගොඩ නිලමේ ගමේ පන්සලට ගොස් ඇබිත්ත උන්නාන්සේට වෙඩි තියා පන්සලේ ආවාසගෙට ගිනි තැබූ නමුත් ඒ විගස මහා අනෝරා වැස්සක් ඇද හැලී ගින්න නිවී ගියේය. ඒ වැස්ස කලින් වැස්සා නම් ගමේ ගෙවල් ගින්නෙන් බේරාගත හැකිව තිබිණි. එහෙත් ගමේ අවාසනාව ඊට ඉස්සර වී සිටි බැවින් එය එසේ සිදු නොවිය.

ඒ අනෝරා වැස්ස පුරා දෙමාසයක්ම එක දිගට වැස්සේය. ගෙවල් දොරවල් නොතිබූ බැවින් මේ අනෝරා වැස්සේ ගම්වැසියන් බොහොමයක් නැවතී සිටියේ පන්සලේය. නැත්නම් මියගිය පොඩිනාගේ අලුත් නිවසේය. ගෝමරීත්, පුංචාත් මිය

ගොස් බොහෝ කල් යැයි විශ්වාස කළ ගැමියන් ඒ ගෙදර ගෝමරීගේ අවතාරය සැරිසරන බවට ලැබී තිබූ ආරංචි අනුව ගෙදර නිරුපද්‍රිතව තිබුණත්, නවතින්න ගියේ නැත.

කෙතරම් වැස්සත් වැව මැදදී ඉංග්‍රීසින් විසින් මරා දමා තිබූ තරුණයන් අට දෙනාගේ මළ සිරුරුවලින් ගලා ගිය රුධිරය නිසා රතු පැහැ වී තිබුණු වැවේ වතුර සාමාන්‍ය තත්ත්වයට පත් වෙන්න සෑහෙන කාලයක් ගත වුණේය. ඒකට හේතු වුණේ අහසින් වැටුණු වැස්සේත් ඒ ලේ රතු පාට තිබූ නිසාය.

එසේම ඒ මළ සිරුරු නිසා මුළු වැවම කුණු ගඳ ගසමින් තිබුණේය. එපමණක් නොව අහසින් වැටුණු වැස්සේත් මේ කුණු ගඳ මිශ්‍රවී තිබුණේය. වැටෙන වැස්සේ ගඳ - සුවඳ ආඝ්‍රාණය කළ සමහරෙකු එය ප්‍රතික්ෂේප කළ නමුත්, එක දිගට දවස් කීපයක් කුණු වූ මළ සිරුරු කැබලි අහසේ සිට බිමට වැස්සත් සමඟ වැටුණු පසු ඔවුන්ට එය පිළිගන්නට සිද්ධ වුණේය.

මේ අනුව එක දිගට දවස් පහක් රතු පාට රුධිරය වැස්සක් වැටුණු අතර ඉන් පසු තව දවස් හතක් මළ සිරුරු කැබලි වැස්සක් ගමට වැටී තිබුණේය.

The Reader's Place

කෙසේ වුණත් අන්තිමට ඉංග්‍රීසි ප්‍රහාරයෙන් පසු ගමේ ඉතිරි වූ තරුණයන් පිරිස උදලු, කැති, පොරෝ අරගෙන වැව ළඟට ගොස් කිඹුලන් විසින් කා දමා තිබූ, රුධිරය ගලා ගිය මළ සිරුරු කැබලි ලොකු වළකට දමා වසා පැමිණි පසු ඒ රුධිරය වැස්සත්, මළ සිරුරු කැබලි වැස්සත් නැවතුණේය.

එහෙත් විදුලි කොටමින් වැටුණු අනෝරා වැස්ස එක දිගටම වැස්සේය.

ඉංග්‍රීසි හමුදාව පොඩිනාගේ පරණ ගෙදරට ගිනි තියා අලුත් ගෙදර නිරුපද්‍රිතව තබා ගියේ නැත. ඇත්තටම ඔවුහු සෑහෙන කාලයක් සහ ශ්‍රමයක් ඒ ගෙදර කඩා බිඳ දමන්නත් ගිනි තියන්නත් වැය කර තිබුණහ. එහෙත් ඒ කාලයත් ශ්‍රමයත් සම්පූර්ණයෙන්ම නාස්ති වී තිබුණේ පොඩිනාගේ අලුත් ගෙදර එක බිත්ති පොඩ්ඩකටවත් හානියක් සිදු වී නොතිබුණු නිසාය. ඉංග්‍රීසි හමුදාව ගෙදර බිත්ති අතර සැඟවී දිලිසුණු තඹ සල්ලිත්,

ඉදි නාසිත් දුටුවේ ගෙට ගිනි තියන්න ලෑස්ති වුණු විටය. ඒ නිසා ගෙට ගිනි තැබීම නතර කළ ඔවුහු ගමේ ගෙවල්වලින් ලොකු කුළු ගෙඩි හොයාගෙන ඇවිත් බිත්ති කුඩු කරන්නට පටන් ගත්හ. ඒත් ඒ කුළු ගෙඩි පහරවල් බිත්තිවල වැදී දවැන්ත දෙදරුම් හඬක් නැගූ නමුත් ඉන් එහා කිසිම අනතුරක් සිදු නොවුණේය.

ඉංග්‍රීසි සොල්දාදුවෝ පුරා සිංහල පැය තුනක් එක දිගට කුළු ගෙඩිවලින් ගෙට පහර දුන් නමුත් අන්තිමට සිදු වූයේ ඔවුන්ගේ අත් පැළී වණ වී ලේ ගලන්නට පටන් ගත් එක විතරය. අන්තිමට ලේ වැකුණු අත්වලින් කුළු ගෙඩි ප්‍රහාර ගෙට එල්ල කරන විට එක් සොල්දාදුවෙකුගේ අතින් කුළු ගෙඩියක් විසි වී එය තවත් සොල්දාදුවෙකුගේ හිසේ වැදී ඔහු මරුමුවට පත් වූ පසු මෙතැන භූතියම් කළ ස්ථානයකැයි සලකා ඔවුහු ගේ විනාශ කිරීම අතහැර දමා යන්නට ගියහ.

ගේ ඉදි කිරීමට සහභාගි වුණු ජීවතුන් අතර සිටි පෙදරේරු උන්නැහේ කෙනෙක් පසුව එහි රහස ගම්මුන්ට අනාවරණය කළේය.

'අපට පොඩිනාගෙ ගෙදර බිත්තිවලට මැටි අනන්න කිව්වේ වතුරවලින් නෙමෙයි එයාගේ තෑ කිරිවලින්...'

ඉංග්‍රීසීන් ඇබිත්ත උන්නාන්සේට වෙඩි තියා පලා ගිය පසු මුලින්ම පන්සලට දුවගෙන ආවේ මේ වන විට දොළොස්වන වියට එළඹ සිටි කැළේ හැංගී තම ජීවිතය බේරාගත් එතනාය. කුඩා කාලයේ ඔහු ඇ ඔක්කේ තියාගෙන නැළවූ අයුරු ඇට තවමත් මතක තිබුණේය. ඇ පන්සලට ඇවිත් වටපිට සෝදිසි කළ නමුත් ඇට ඔහුගේ සිරුර හොයාගන්න බැරි වුණේය. අන්තිමට ඇ ඒ වෙන විටත් කැළේ සැඟවී සිටි සොබනීට කතා කළාය. තම නිවුන් දරු දෙදෙනාගෙන් සපුමලී ඉංග්‍රීසි සොල්දාදුවන් විසින් උස්සා පොළොවේ ගසන අයුරු සියැසින්ම දක තිබූ ඇ ඒ වන විටත් හිටියේ හොඳටම කම්පනයට පත්වය. එහෙත් ඒ කම්පනය පරාජයට පත් කළ හොඳ ගැහැනු ඉවක් ඇට තිබුණු නිසා හීන් සුරඹාත් රැගෙන ඔවුන් මඟහැර පලා යන්නට ඇට පුළුවන්කම ලැබුණේය.

දන් යන්තම් ඇවිදින්නට තතනන තුන්වැනි වියට එළඹ සිටි හීන් සුරඹක්, සොබනීත් සමඟ එතනා යළිත් පන්සලේ කැළෑ තැනම ඇඹිත්ත උන්නාන්සේගේ සිරුර සෙවූ මුත් ඔවුනට එය සොයාගන්නට බැරි වුණේය. අන්තිමට එතනා මහු මරණයට පත්වෙන වේලාවේ වාඩි වී සිටි ආසනය ළඟට පැමිණියාය. එහි ලේ මිදී කැටි ගැසී තිබුණු නමුත් වෙන කිසිවක් නොතිබුණේය. එතනා ඒ ආසනය එතැනින් ඉවත් කරන්නට උත්සහ කළ නමුත් එය මැටි පොළොවට මුල් අල්ලා තිබූ බැවින් උස්සන්නවත් බැරි වුණේය. පසුව ඈ ඒ ආසනය තිබූ තැන හතර කොනකින් පොළොව සිදුරු කර ඉනි හිටවා පිරිත් නූල්වලින් එම ස්ථානය කොටු කළාය. ඒ කාර්යය ඉතා භක්තියකින් යුතුව නිම කළ ඈ අන්තිමට සොබනී දිහා බලා මෙසේ කීවාය.

'එයා එයාගේ සිරුරවත් අපිට වළලන්න ඉතිරි කරල නෑ...'

මහා අනෝරා වැස්ස වැටෙන වේලාවේ තවමත් ජීවතුන් අතර සිටි ආරච්චිල වලව්වේ බිසෝ මැණිකාත් කරලිනාත් හිටියේ ගිනිබත් වී කඩා වැටුණු වලව්වේ බිත්තක්කන යට හොඳටම තෙමී තෙමීය. පොඩිනාගේ අලුත් ගෙදර වැස්ස තුරල් වෙන තෙක් නැවතී සිටි දිවි ගලවාගත් ඔවුන්ගේ සේවකයන් වරින් වර වලව්වට ගොස් පොඩිනාගේ ගෙදරට එන ලෙස ඔවුන්ට ඇවිටිලි කළ නමුත් ඔවුන් තම වලව්ව අතහැර පැමිණියේ නැත. වලව්වේ බිත්තක්කන යට හොඳටම තෙමී තෙමී වෙව්ලමින් සිටි බිසෝ මැණිකා තමා කැඳවා යන්නට පැමිණි සේවකයන්ට පවසා තිබුණේ කවදාවත් හීනෙකින්වත් තමාට වරදක් නොකළ තම ස්වාමි පුරුෂයා වෙනුවෙන් තමා වලව්වේම තෙමී මියෙන බවත්, වලව්වේ හැර ගමේ වෙන කිසිම තැනක තමාට මේ තරම් සුව පහසු ලෙස සිටිය හැකි තැනක් නොමැති බවත්ය.

මුල් සති දෙකේ කරලිනා සමඟ බිත්තක්කන යට වැස්සට තෙමී තෙමී වෙව්ලමින් එක දිගට මොනවාදෝ මුමුණමින් සිටි බිසෝ මැණිකා තෙවන සතියේ මහ වැස්සෙම එළියට බැස පොඩි දරුවෙකු වගේ සෙල්ලම් කරන්න පටන් ගත්තාය. ඈ කොස් කොළ ඔරු වතුරේ පා කර යැවූ අතර කරලිනාට කෑ ගසා තෙමුණු තල්

කොළ ගෙන්වා ගෙන නැව් හදන්න පටන් ගත්තාය. හදන හදන නැව් වතුරේ ගිලී ගිය බැවින් ඈ හොඳටම කෝපයට පත් වූවාය. එහෙත් කෝපය යටපත් කරගෙන ඈ කරලිනාට බැනුම් දුන්නාය.

'ඇයි උඹල මට මෙහෙම කැනහිලිකම් කරන්නෙ... එංගලන්තෙ මහ රජ්ජුරුවෝ බලාගෙන ඉන්නව මං එනකං... මට උදව් කරපං මේ නැව හදාගෙන මුහුදු යන්න...'

ඈ කැඳවාගෙන යන්නට පැමිණි සේවකයන්ට විවිධ ලී පතුරු, තල් කොළ, යකඩ කෑලි ගෙන එන්නට අණ කළ බිසෝ මැණිකා වැස්සේ තෙමී තෙමී දිගටම මේ නැව හැදීමේ කාර්යය කරගෙන ගියාය.

'උඹලට තේරෙන්නේ නෑ... වැස්ස නතර වෙන්න කලින් මේක ඉවරයක් කරන්න ඕන... නැත්තං වතුර කොහේද තියෙන්නේ නැව් යන්න...'

තමාට අවැසි පරිදි තමාගේ කාර්යය කරගන්න බැරි වූ නිසා තෙවන සතිය වෙන විට ඈ වියරු වූ වැලහින්නියක බවට පත් වූවාය. විටෙක කරලිනාටත් සේවකයන්ටත් අතට අහුවෙන දෙයින් පහර දෙන්නට වූ ඈ තවත් විටෙක වැස්සේ තෙමී තෙමී පාරු කවි කියන්නට වූවාය.

අන්තිමට කරලිනා වැස්සේ තෙමී තෙමී පොඩිනාගේ ගෙදරට ඇවිත් එහි සිටි ගම්මුන්ට මේ ජරමරය පැහැදිලි කළ අතර ඔවුහු ලොකු වර පට රැගෙන වලව්වට ගොස් බිසෝ මැණිකා ඒ වර පටවලින් හිර කර බැඳ පොඩිනාගේ ගෙදරට රැගෙන ආවෝය. එහෙත් පොඩිනාගේ ගෙදරදීද ඈ පෙර පරිදිම ඇගේ නැව් හැදීල්ලත් එය නිමා කරගන්න බැරි වූ තැන එතන රැස්ව සිටි ගම්මුන්ට පහර දෙන්නත් පටන් ගත් විට ඇය සියල්ලන්ගෙන් හුදෙකලා කොට ඇතුළු ගෙට දමා සිර කරන්න ගම්මුන්ට සිදු විය. ගේ ඇතුළේ සිට ඈ දිගටම පාරු කවි කියමින් එංගලන්තයේ මහ රජ්ජුරුවන් සමඟ සංවාදයේ යෙදෙන හඬ පිටතට ඇසුණේය.

කෙසේ වුවත් බිසෝ මැණිකා කුඳලාගෙන පැමිණීමෙන් සිදු වූ ලොකුම සෙත වූයේ පුරා මාසයක් එක දිගට එකම ඇඳිවත පිටින් වැස්සට තෙමී තෙමී ඇගේ තනියට වලව්වේ සිටි කරලිනාට යන්තම් වහලක් යටට එන්නට පුළුවන්කම ලැබීමය.

The Reader's Place

ඉංග්‍රීසීන් ගමට පහර දුන් දවසේ ඉතා අවාසනාවන්ත ලෙස සිදු වූ පොඩිනාගේ මියයෑම හොඳටම බලපෑවේ බිංදුටය.

අවුරුදු දහයකට ආසන්න කාලයක් දවසේ තුන් වේලටම මව් කිරි හැර වෙන කිසිවක්ම කටේ නොතැබූ බිංදු පොඩිනාගේ මරණයෙන් පසුව හොඳටම අසරණ වුණේය. ඔහු බත් කුරහන් අල බතල ගැන කිසිවක් නොදැන සිටියේය. මව් කිරිවලට අමතරව වෙන කිසිම බීමක් අඩුම තරමේ වතුර ගැනවත් නොදැන සිටියේය.

පොඩිනා මිය ගොස් හතරවන දවසේ කත් දෙකේ ඇඹ ගසාගත් මැණිකා ඔහුට කුරහන් තලපයක් සාදා වතුර මඩක්කුවක් සමඟ ගෙනැවිත් තැබුවාය. ඔහු ඒ දිහා බැලුවේ වත් නැත. දෙවන දවසේ ඇ බත් පිඟානක් ගෙනැවිත් තැබුවාය. ඔහු එය නහයට ළං කර එයින් හමා ආ උෂ්ණය ඉවසා ගන්න බැරුව පැත්තකට කළේය. තෙවන දවසේ ඇ මයියොක්කා අල කීපයක් තම්බා ගෙනැවිත් තැබුවාය. ඔහු නහය වසාගෙන ඉන් බිඳක් හපන්නට වූ අතර ඒ සැණින් එක දිගට කැහැගෙන ගොස් ඊට පහුවදා මුළු දවසම වමනය දැම්මේය. ඔහු වතුර බිඳක් හෝ බොන්නට උත්සහ කළ නමුත් එය උගුරෙන් පහළට දමාගන්න ඔහුට බැරි වුණේය. බැරි වේලාවත් වතුර බිංදුවක්වත් උගුරෙන් පහළට ගියේ වී නම් ඒ සැණින් ඔහු වමනය දැම්මේය. එය වරක් දෙවරක් නොව ශරීරයේ සියලු බොකු බඩවැල් එළියට එන තරමට දවසක් දෙකක්ම සිදු වුණේය.

කිසිවක් කන්නට බොන්නට බැරුව කෙතරම් අහේතියෙන් බඩසායෙන් හිටියත් බිංදු තමාගේ ගෙදර රැස්වුණු සියලු දෙනාට අවශ්‍ය සියලු දේ හැකි පමණින් සම්පාදනය කළේය. පොඩිනා කීප වතාවක්ම කැළෑවේ තඹ, රිදී කාසි මුට්ටි වළලන්න යන විට බිංදුද කැඳවාගෙන ගොස් තිබූ බැවින් ඔහු අවස්ථා කීපයකදීම මහ වැස්සේ තනිවම කැළේට ගොස් ඒ මුට්ටි කීපයක් පොළොව හාරා අරගෙන ආවේය. එහෙත් ප්‍රශ්නය වුණේ ඒවා වියදම් කර ආහාර හෝ වෙන කිසිවක්ම ගන්නට තැනක් හෝ කඩයක් නොතිබුණු එකය. අන්තිමට ඔහු ගොඩ ගත් තඹ රිදී කාසිවලින් කිසි වැඩක් නොවූ අතර ඔහු ඒවා මුට්ටිවලින් ඉවත් කර

The Reader's Place

මුලේ කොනක ගොඩ ගැසුවේය. එහෙත් ගමේ කිසිවෙකු ඒවා හොරකම් කරන්න තියා අතපත ගාන්නවත් එතනට ගියේ නැත.

එක දිගට වැස්ස ඇද හැලෙමින් පැවති හයවන සතියේ බිංදු ගෙදර බරාඳයේ ඇදගෙන වැටුණේය. හොඳ සිහියෙන් ඔහු සිටි නමුත් වැටුණු තැනින් නැගිට්ටන්නට පුළුවන්කමක් ඔහුට නොතිබුණේය. පසුව ගම් වැසියෝ කීප දෙනෙක් එකතු වී ඔහු උස්සාගෙන ගොස් ඇතුළු ගෙයි ඇඳකින් තැබූහ. ඇඳ මත අසරණව දිගා වුණු ඔහු දිහා දීර්ඝ වේලාවක් දයානුකම්පාවෙන් බලා සිටි මැණිකා ඉක්බිතිව එළියට ගොස් එහි සිටි ගම් වැසියන්ට සිය හස්ත මුද්‍රා භාෂාවෙන් මෙසේ පැහැදිලි කළාය.

'මව් කිරි හැර වෙන කිසිම දේකට එයාගේ බඩවැල් පුරුදු නෑ...'

මව් කිරි දෙන කිසිවකු එතන නොසිටි නමුත් ගමේ පන්සලේ මව් කිරි දෙන අම්මාවරුන් දෙදෙනෙකු සිටිතැයි එතන සිටි කෙනෙකුගෙන් ප්‍රකාශ වූ බැවින් අන්තිමට පන්සලට කෙනෙකු යවා මහ වැස්සේම ලොකු මඩක්කුවකට තන කිරි ටිකක් ගෙන්වා ගන්න මැණිකා සමත් වූවාය.

ඒ තන කිරි ටික බිංදුගේ උගුරින් පහළට යවා ගන්න හැකි වූ විට මැණිකා අප්‍රමාණ සතුටට පත් වූවාය. එහෙත් ඒ සතුට ඇ ළඟ තිබුණේ ටික වේලාවක් පමණය. එළි බහින්න වහා ගෙයින් පිටතට ගිය බිංදු ඒ කිරි සියල්ල මලපහ කරන විට පිට කර තිබුණේය. මෙසේ වෙනත් අයගේ මව් කිරිවලිනුත් බිංදුගේ කුසගින්නට ප්‍රතිඵලයක් නොලැබුණ විට මැණිකා එළකිරි සොයාගෙන එන්නට මිනිසුන් පිටත් කර හැරියාය. ඉංග්‍රීසින් ගමේ එළිමහනේ සිටි සියලුම ගව මහිෂාදීන් මරා දමා තිබුණත් වැස්සේ තෙමී තෙමී මහ කැළේට ගොස් යන්තම් එළදෙනක් හොයාගෙන කිරි ටිකක් දොවාගෙන එන්න ඒ මිනිසුන්ට පුළුවන්කම ලැබුණේය.

එහෙත් එළකිරිවලිනුත් කලින් ප්‍රතිඵලයම අත් වුණේය. අන්තිමට මැණිකා ගමේ වෙද රාළ කැඳවූයේය. එහෙත් ඔහුට කිසිම බෙහෙතක් ඔහුගේ උගුරෙන් පහළට යවාගන්න පුළුවන් වූයේ නැත.

අවසාන බලාපොරොත්තුව විදිහට මැණිකා වල්ලි සොයා ගෙන එන්න මහ වැස්සේ මිනිසුන් පිටත් කළත් ඔවුන්ට ගමේ කොතනකින්වත් ඇ හොයාගන්න පුළුවන් වුණේ නැත. වල්ලි පොඩි නිලමේ සමඟ එක් වී සොල්දාදුවන් තිදෙනෙකු මරා දැමූ බව සියල්ලන්ම දන සිටියත් ඉන්පසු ඔවුන් දෙදෙනාට කුමක් වූයි කිසිවෙකු දන සිටියේ නැත.

සියලු බලාපොරොත්තු සුන් වූ මැණිකා අන්තිමට කිසිවෙකුට එතැනට නොඑන ලෙස අණ කර බිංදු සමඟ ඔහුගේ කුටියේ තනි වුණාය.

පසුව ඇ බිංදුගේ සියලු ඇඳුම් උනා දමා ඔහු සම්පූර්ණයෙන්ම නිරුවත් කළාය. හොඳටම අහේනියෙන් කොන්ද කෙළින් කර ගන්න බැරි තරමට හේ බා ගිය ඒ තේජවන්ත නිරුවත් සිරුර ඇ පරිස්සමට ඇඳේ දිගා කළාය. ඉක්බිතිව ඇ ඇගේ සියලු ඇඳුම් උනා දමා නිරුවත් වුණාය. මේ වන විට දහසයවන වියට පත් ව සිටි ඇගේ නව යොවුන් සිරුර දිහා ඔහු සිය මලානික ඇස් යොමා යන්තමින් සිනාසුණේය. මීට අවුරුදු කීපයකට පෙර ඇ වැඩිවියට පත් වූ දවස්වල ඇගේ ළැම උස්වන හැටි බලන්න දවස් ගණන් ඇගේ නිරුවත දිහා බලාගෙන හිටි හැටි ඔහුට මතක් වුණේය. එසේම අතීතයේ බොහෝ දවස්වල ඔවුන් එකිනෙකාගේ ඇස් දිහා එක එල්ලේ බලාගෙන නිරුවතින් හිටි හැටිද ඔහුට මතක් වුණේය.

ඒ විදිහට මේ වෙලාවේ ඔවුහු සහමුලින්ම නිරුවත් වී එහෙත් එකිනෙකාගේ කිසිදු ශරීර අවයවයක් ස්පර්ශ කරන්නේ නැතිව එකිනෙකාගේ ඇස් දිහා විතරක් බලාගෙන අක්ෂි මුද්‍රා භාවනාවේ හෙවත් ඇස්වලින් කතා කිරීමේ භාවනාවේ පරතෙරට කිමිදී සිටියහ. ක්‍රම ක්‍රමයෙන් බිංදුගේ ඇස් මලානික වුවත් ඔහු ඇ කෙරෙන් ඇස් ඉවතට නොගත්තේය. කිසිදු ශරීර අවයවයක් ස්පර්ශ කරන්නේ නැතිව ඇ ඇසින් ඔහු සමඟ රමණයේ යෙදුණු අතර ඔහු අතින්ද එය එපරිද්දෙන්ම සිදු වුණේය.

ඔවුහු ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන සියලු භාවයන් අමතක කර රූප භාවයේ භවාග්‍රයට කිමිදී සිටියහ. දවසකට දහ දොළොස් සැරයක්ම ඇඟ සෝදා ගැනීමේ පුරුද්දෙන් පරලව සිටි ඇ සම්පූර්ණ සතියක්ම එය අමතක කර ඔහු සමඟ මේ අක්ෂි මුද්‍රා භාවනාවේ ඇලී ගැලී සිටියාය. අටවන දවසේ ඔහුගේ ඇස් සෙලවෙන්නේ නැති බව ඇ හඳුනාගත්තාය. එසේම ඒවා යළි ඔහුගේ වෑයමෙන් පියවෙන්නේ නැති බවද ඇ හඳුනාගත්තාය.

මෙසේ එක දිගට ඇද හැලුණු අනෝරා වැස්ස පුරා දෙමසකට පසු නිමාවන විට දහවන වියට එළඹ සිටියත් ගමේම ශක්තිවන්තයා වූ බිංදු කුසගින්නෙන් හා සා පිපාසාවෙන් අහේනියට පත්ව ඇස් දෙක ඇරගෙනම මිය ගොස් තිබුණේය.

පුරා දෙමාසයක් වට වැස්ස සම්පූර්ණයෙන් තුරල් වූ පසු එළඹුණ අටසිය දහ නවය අවුරුද්දේ බක් මාසයේ මුල් සතියේ දවසක උසම උස මිනිහෙක් පන්සලේ ගල් පඩිපෙළ නගිමින් සිටියේය. සියලු ගෙවල් ගිනි තබා තිබූ බැවින් වැස්ස තුරල් වෙනකම් පන්සල් භූමියේ ලැගුම් ගත් ගම්වාසීන් ඒ වෙනකොටත් පන්සලේ සිටි අතර ඔවුන් කර උස්සා බලන්නට වූයේ ගල් පඩිපෙළ නැඟගෙන එන මේ නාඳුනනා මිනිසා කවුදැයි කියාය.

කිසියම් උදාරම් බවක් මිශ්‍ර වූ අසාමාන්‍ය පිරිසිදු බවක් ඔහු කෙරෙන් පළ වුණේය. ඒ වගේම අවුරුදු විස්සකට වඩා වැඩි වයසක් ඔහු කෙරෙන් පළවුණේ නැත. හැල හොල්මනක් නැතිව ආවාස ගෙට ඇතුළු වූ ඔහු කාගේවත් ආරාධනාවක් නැතිව එතනා පිරිත් නූල්වලින් කොටු කර තිබූ ඇබිත්ත උන්නාන්සේ අවසන් වරට හිඳ සිටි ආසනයට පසෙකින් වූ හාන්සි පුටුවේ සැප පහසුවට හරි බරි ගැහී ඉඳගත්තේය. විටක් හපමින් සිටි ගමේ වෙද රාළ යන්තමින් ඔහු සමඟ සිනාසී ඔහු ළඟින් ඉඳගත්තේය.

'මුන්නැහේ මේ ළඟ ගමකද...'

අමුත්තා එයට උත්තර නොදී මෙසේ කීවේය.

'විටක් කෑව නං හොඳා...'

වෙද රාළ ඔහුට ඉලත්තට්ටුව ළං කළේය. අමුත්තා හරිම හෙමිහිට සාරසුබාවට විටක් ඒදන්න ගත්තේය.

'සුද්දො අපේ ගම් ගිනි තියල යන්තං දෙමාසයක් පහු වුණා විතරයි... අනේ මන්ද කීයක් මළාද කියල අපි අපිවත් දන්නේ නෑ...'

The Reader's Place

වෙද රාළ අමුත්තා බුලත් විට ඒදන අතර කීවේය. ඔහු එය සාවධානව අසා සිටින බව පෙන්වූ නමුත් උත්තර නොදුන්නේය. වෙද රාළ දිගටම කියාගෙන ගියේය.

'අනෝරා වැස්ස ඊයේ පෙරේදා යන්තං තුරල් වුණා කියමුකො... පෙනේද අද ඉරේ සැර... මහ අමුතු කාලයක් ලබල තියෙන්නේ... අපි තාමත් ගෙවල් දොරවල් නැතිව මෙතන වැද්ගැහිල ඉන්නවා. කොහෙන් ආයෙමත් අපේ ජීවිත පටන් ගන්නද කියල අපි අපිටම තේරෙන්නේ නෑ....'

'ඔක්කොටම කලින් අපි ඉක්මනට ගෙවල් ටික හදන්ට ඕන...'

වෙද රාළ අමුත්තාගේ උත්තරයෙන් හොඳටම කලබල වුණේය. පිට ගමක මිනිහෙක් මේ ගමේ ගෙවල් ටික හදන්න මහන්සි වෙන්නේ මොකටද ? ඔහුට තේරුම් ගන්න බැරි වුණේය. ඒ සමග ඔහුට මෙහෙමත් සැක හිතුණේය. බාග වෙලාවට මේ මිනිහා ඉංග්‍රීසින් ගමේ ඔත්තු බලන්න එවූ සිංහල මිනිහෙක් වෙන්න බැරි නැත. ඒ සියලු සිතිවිලි යටපත් කරගෙන වෙද රාළ අමුත්තාගෙන් මෙසේ ඇසුවේය.

'ඇත්තටම... මුන්නැහේ කොයි ගමේද ?...'

අමුත්තා හිනා වුණේය. කට පිරෙන්න බුලත් විට කටේ දමාගෙන හපන්න පටන් ගත්තේය.

'දෙයියම්පල්ල.... මේ ගම ගැන කැක්කුමෙන් කතා කළාට මේ ඇත්තට බොහොම පිං... මිනිස්සු අසරණ වෙච්ච වෙලාවටයි උදව්වට වචනයක් හරි කියන්ඩ ඕන...'

මේ සියල්ල කියද්දීත් අමුත්තා උත්තර නැතිව රස කර කර බුලත් විට කන අතුරුව වෙද රාළ බලා හිටියේය. අන්තිමට ආයෙමත් ඔහු මෙසේ ඇසුවේය.

'මං හිතන්නේ මුන්නැහේ එහා ගමේ...'

'නෑ...'

'නැත්තං මඩුල්ල කිට්ටුව ගමක...'

'නෑ...'

'එහෙනං කොහෙද ?...'

'මේ ගමේ...'

'මේ ගමේ?...'

අමුත්තාගේ උත්තරය ප්‍රශ්නයක් කර ඔහුගෙන් පෙරළා ඇසූ වෙද රාළ පුදුමයෙන් ඔහු දිහා බලා නැවත මෙසේ කීවේය.

'මුන්නැහේ අපට කෝලිත්තං කරනව... මේ ගමේ හැම ජනාගේම කිරිපල්ලෙ ඉඳන් දන්නව මම. ඉතිං මම නොදන්න මේ වයසෙ ඉලන්දාරියෙක් මේ ගමේ ඉන්නෙ කොහොමද ?...'

අමුත්තා වෙදරාළ දිහා බලා නැවත හිනාවුණේය.

'මට මතකයි මං හින්නි එකා කාලේ වෙද රාළ මාමා මට වෙදකං කරල තියෙනවා....'

'කව්ද උඹ...?' වෙද රාළ විස්මයෙන් ප්‍රශ්න කළේය.

'මං පුංචා...'

'පුංචා කිව්වේ...'

'ගෝමරීගේ සිහි නැති වෙච්ච කොලුවා...'

වෙද රාළට ඇත්තටම සිහි නැති වුණා වගේ දැනුණේය. ඒ මොහොතේම අවට සිටි සියලු දෙනාට සිහි එළවාගන්න සෑහෙන වේලාවක් ගියේය. ඒ අතර එතන සිය සහෝදරයා අසලට සිට්ටු වී සැබවින්ම සැක හැර දැනගන්නට ඔහුගේ මුහුණ අත ගා බැලුවාය.

'මගෙ අප්පුච්චියේ... මේ ඇත්තටම උඹමද ?...'

එයට ප්‍රතිචාර දක්වූ පුංචා එතනා දිහා බැලුවේ ඒ විදිහටම විස්මයට පත්වය.

'අනේ එතනෝ... බලහං උඹ ලොකුවෙලා තියෙන තරං... කීයද උඹේ වයස දං...'

' මට දැන් දොළහ ඉවරයි. දහතුන ලැබුවේ...'

ඉන් ඉක්බිතිව පුංචාට තම කතාව ගම්මුන්ට විස්තර කරන්න සෑහෙන වේලාවක් ගියේය. ගෝමරී කොහොඹ ගහ ළඟ හිටගෙන සිටියදී ඔහුට සිහි මූර්ජා වූ තැන් පටන් හැම සිද්ධියක්ම හැම මොහොතක්ම ඔහුට මතක තිබුණේය. ඔහු වල්ලිගේ ගෙදරට උස්සාගෙන ගිය හැටිත්, ඉන් පසුව ගෝමරී සමග වෙනත් ගෙදරකට ගිය හැටිත්, අවුරුදු ගාණක්ම එකට විදිහට කිසිම වෙනසක් නැතිව ඈ ඔහුට සාත්තු කළ හැටිත් ඔහුට මතක තිබුණේය.

The Reader's Place

ඒ විතරක් නොව ගෝමරී ඔහුගේ පුරුෂ නිමිත්තේ දිග පළල සටහන් කළ ආකාරය පවා ඔහුගේ මතකයේ තිබුණේය. සමහර වෙලාවට දිග හා පළල මැන ඈ සෙමෙන් මුමුණන විට අහවල් අහවල් අවුරුද්දේ තමාගේ දිග පළල උස කොතෙක්දැයි ඔහු මතකයේ තියාගෙන තිබුණේය. ඒ සියල්ල සිද්ධ වෙද්දී සැබවින්ම ඔහු ඇස් පියාගෙන සිටියත් ඒ සියල්ල ඔහු ඔහුගේ ඇස් දෙකෙන්ම දක තිබුණේය.

අවසානයේ ඉංග්‍රීසි සොල්දාදුවන් පැමිණ ඔහුව ඇඳෙන් එළියට ගෙන බඹ ගාණක් ඈතට විසි කළ හැටිත්, එවිට මිදුලේ ඈතට පෙරළි පෙරළී ගොස් තමා පියවි සිහියට පත් වූ සැටිත් ඔහු විස්තර කරද්දී සියල්ලෝ විස්මයෙන් කට ඇරගෙන ඔහු දිහා බලා සිටියහ.

'ඉංග්‍රීසි හමුදාවට පින් සිද්ධ වෙන්නයි අන්තිමට මට සිහිය ආවේ......' ඔහු කීවේය.

සියල්ල විස්තර කර අවසානයේ ඔහු වෙද රාළ දිහා බලා මෙසේ ප්‍රශ්න කළේය.

'මේ මොන අවුරුද්දද...'

'අටසිය දහ නමේ බක් මාසේ...'

'ඒ කියන්නේ මට දන් ආහාර ලබල... අවුරුදු අටකට කිට්ටු වෙන්න මං අර ඇඳේ මගෙ අම්මගේ සාත්තු සප්පායම් ලබල තියෙනවා....'

ඔහුට ගෝමරී ගැන මතක් වී ඇස්වලට කඳුළු ඉනුවේය. එහෙත් එය එවැන්නකට සුදුසු තැනක් වේලාවක් නොවන බව තේරුම් ගත් පුංචා ඇස් දෙකේ කඳුළු පිහදාගෙන සියල්ලන් දිහා බලා නැවත මෙසේ කීවේය.

'මං එළියට බහින්නැතුව දෙමාසයක්ම ගෙදරට වෙලා හිටිය මේ වැස්ස තුරල් වෙනකං...'

'අවුරුදු අටකට කිට්ටු වෙනකං හිටිය එකේ ඔය මාස දෙක මොකක්ද ?...'

වෙද රාළ එහෙම කිව්වේ පුංචාත් සමඟ එකට හිනාවෙන ගමන්ය.

ඉන් ඉක්බිතිව ඒ මොහොතේ සිට පුංචා වැඩ කරන්න පටන් ගත්තේය. ඉක්මනින්ම කළ යුත්තේ ගෙවල් ගිනිබත් වූ ගම්වැසියන්ට හැකි ඉක්මනින් තාවකාලිකව හෝ ඉන්න හිටින්න තැනක් හදාගන්න උදව් කිරීම බව තේරුම් ගත් ඔහු වෙන වෙනම කණ්ඩායම් සංවිධානය කළේය. ඔහු පිරිසක් කැළේට යවා ලොකු ගස් කඳන් කපා ලී ඉරෙව්වේය. තවත් පිරිසකට පිදුරු, ඉලුක් [illegible] එකතු කරන්න බාර කළේය. එසේම තවත් පිරිසකට හොඳ මැටි පාගා පදම් කිරීමේ කාර්යය පැවරුවේය. කිසිවෙක් තනි තනිව තම නිවස සාදා නොගත් අතර සියල්ලෝම එකට එක්ව අත්තම් ක්‍රමයට වැඩ බෙදාගෙන එකිනෙකාගේ ගෙවල් හදාගන්න එකිනෙකාට උදව් කළහ.

මෙසේ සති දෙකක් ගත වෙන විට ඉංග්‍රීසි හමුදාව විසින් ගැමියන්ගේ සියලු සේසත සමඟ සම්පූර්ණයෙන් ගිනිබත් කළ අමාරුවෙන් හදා කියා ගත් ගෙවල් දොරවල් වෙනුවට තාවකාලිකව ඉන්න හිටින්න තැනක් ගමේ හැම කෙනෙකු වෙනුවෙන්ම සරිකර දෙන්න පුංචාට පුළුවන්කම ලැබුණේය.

පුරා දෙමාසයක් එක දිගට වට වැස්සෙන් ඉංග්‍රීසින් විසින් මරා දමා තැන තැන දමා තිබුණු මළ සිරුරු අඳුනාගන්න බැරි විදිහට කුණු වී තිබුණේය. ගවයන්, එළුවන්, කුකුළන්ගේ මළ සිරුරු පාරේ තැනින් තැන වෙල් ඉපනැල්ලේ තැනින් තැන වැටී කුණු වී තිබුණේය. මේ මළසිරුරු නිසා ගම පුරා පැතිරුණු දුගඳ දරාගන්න අපහසු වුණේය. කනේ ඇබ ගසාගෙන ඉතා සැහැල්ලුවෙන් සිටින මැණිකා දුටු කරලිනා මේ දුර්ගන්ධයෙන් බේරෙන්න නහයේ ඇබ ගසාගෙන කටින් හුස්ම ගන්නට පටන් ගත්තාය. මෙය පුරුද්දක් විදිහට බොහෝ පිරිසක් අතර ඉක්මනින් බෝ වූ අතර අන්තිමට එළිසබෙත්ගේ නහයේ හිර වුණු ඇබය බුරුල් කරන්න වෙද රාළ කැඳවන්නට පවා සිදු වුණේය.

මේ අතර මැණිකා නිරීක්ෂණය කළ තවත් විශේෂ දෙයක් තිබුණේය. එනම් ඇගේ සිරුරේ වෙනදාට වඩා සතුන් සිටින බවය. එය එපරිද්දෙන්ම වෙනත් මිනිසුන්ගේ සිරුරුවලත් ඈ දුටු අතර ඇගේ හස්ත මුද්‍රා භාෂාවෙන් ඔවුන්ට එය කෙතරම් පැහැදිලිව

The Reader's Place

තේරුම් කළත් පලක් නොවූ තැන ඈ ඇය ගැන පමණක් හිතා පොල් ලෙලිවලින් ඇඟ හම යනකං අතුල්ලන්න පටන් ගත්තාය. මෙසේ ඈ වෙනුවෙන් පොල්ලෙලි එකතු කරන්න වෙනම කෙනෙකුගේ සහය ලබාගන්න ඇට සිදු විය.

ගම් වැසියන්ගේ තාවකාලික ගෙවල් සාදන අතරතුර පුංචාගේ වැඩි අවධානය යොමු වුණේ මේ තැන තැන කුණු වූ මළ සිරුරු පිළිබඳවය. ඔහු ලොකු වළවල් කපා ඒවා කෙතරම් පොළොව අභ්‍යන්තරයට කිඳා බස්සවනු ලැබුවත් පැතිරුණ දුර්ගන්ධය සහමුලින්ම තුරන් කරන්න පුළුවන් වුණේ නැත.

ඊළඟට පැමිණියේ ආහාර ප්‍රශ්නයයි. ඉංග්‍රීසින් සියලු ගව මහිෂාදීන් සමඟ දකින දකින බව භෝගද විනාශ කර දමා තිබූ නිසා එය කොහෙන් පටන් ගත යුතු දැයි පුංචාට ප්‍රශ්නයක් වුණේය. අන්තිමට ඔහු ගමේ වැවෙන් එය පටන් ගන්න තීරණය කළේය. ඉංග්‍රීසි හමුදාවේ ප්‍රහාරයෙන් අනතුරුව ගමේ ඉතිරි වී සිටි තරුණයන් සමඟ, ඒ වන විට එක දිගට වට වැස්සෙන් ඇළ වේලි පුපුරා වතුර උතුරා ගලා ගිය ගමේ වැව ළඟට ගිය පුංචා එය පිළිසකර කරන්නට පටන් ගත්තේය. මුලින්ම ඔවුහු වතුර පාරේ සැරට පුපුරා ගිය වැවේ බැම්ම සකස් කළහ. ඊට පසු කඩා ගෙන ගොස් තිබූ සොරොව්ව නැවත පිළිසකර කළහ. අනතුරුව වැවේ සිට කුඹුරු බව බෝග කරා වතුර ගලා යන ඇළ වේලි නවීකරණය කළහ.

මුලින් මුලින් තරුණයන් ගිනි අව්වේ වේළි වේළී වැඩ කරන ආකාරය ගමේ වැඩිහිටියෝ බලා සිටියහ. පසුව ඔවුහුද උදැල්ලක් කුඩයක් අරගෙන තරුණයන් සමඟ වැඩට බැස්සෝය. එසේම තරුණයන්ද වැඩිහිටියන්ද ගිනි අව්වේ වේළි වේළී වැඩ කරන හැටි ගමේ ගෑනු බලා සිටියහ. පසුව ඔවුහුද කැත්තක්, පොරවක් නැත්නම් අඩුම ගණනේ වජ් පිහියක් හෝ අරගෙන තරුණයන් හා වැඩිහිටියන් සමඟ හරි හරියට වැඩට බැස්සෝය. අවසානයේ මුළු ගමම බාල තරුණ මහලු බේදයක් නැතිව, ඉංග්‍රීසින් විසින් සහමුලින්ම සුන්නද්දූලි කර දැමූ සිය ගම නැවත ගොඩ නැඟීමේ අසීරු කාර්යභාරය සාක්ෂාත් කරගනු පිණිස පුංචාගේ නායකත්වය යටතේ වැඩ කරමින් සිටියහ.

මූලික වැඩ කටයුතු අහවර වෙන විට බක් මාසය පසු වී තිබුණේය. බක් මස මුලදී ඇරඹෙන යල කන්නය අරමුණු කරගෙන වැව පිළිසකර කිරීමේ කටයුතු නිමා කරන්නට බැරි වුණත් අවසානයේ ගැමියෝ බිනර මාසයෙන් ඇරඹෙන මාස් කන්නයේදී ගොවිතැනක් බතක් කරගැනීමේ බලාපොරොත්තු ඇතිව කටයුතු කරමින් සිටියහ. කෙසේ නමුත් මාස් කන්නයට තව කල් තිබූ බැවිනුත්, එතෙක් කල් ඉවසා සිටීම කළ නොහැකි බැවිනුත් ඔවුහු ඉඩ පාඩු ඇති තැන්වල ඉරිඟු, වට්ටක්කා, මෑ, ලබු වැනි බවබෝග හදන්නත්, හේන් කොටා තල කුරහන් වපුරන්නත් කල්පනා කළහ.

එහෙත් කිසිම කලෙක මේ ගමේ නොවූ විරූ ලෙස ගොඩ නැගෙමින් තිබූ මේ උද්‍යෝගය සහ අනාගතය පිළිබඳ සුබවාදී බලාපොරොත්තුව ඒ විදිහටම පවත්වාගෙන යන්න ස්වභාව ධර්මය ඉඩ දුන්නේ නැත.

වෙසක් මස ආරම්භයේදී පරිසරය බෙහෙවින් ශුෂ්ක වෙන්න පටන් ගත්තේය. ඒ සමඟ හැමූ හුළඟ උහුලන්න බැරි තරමට ගිනියම් වී තිබුණේය. ස්වභාව ධර්මයේ සිදුවූ මේ වෙනස ගමේ වෙන කාටත් වඩා දරාගන්න අපහසු වුණේ සේදරාටය.

ඉංග්‍රීසින් පැමිණ අබ්දුල් මුදලාලි මරාදමා කඩය ගිනි තැබීමෙන් පසුව සේදරා එළිසබෙත් සමඟ ගිනිගත් කඩය ළඟ හුදෙකලා වුණේය. ඉන් ඉක්බිතිව පුරා දෙමාසයක් එක දිගට වැස්ස වහින විට ඔවුන් සැඟවී සිටියේ කඩය සරු කාලයේ අබ්දුල් මුදලාලි පාවිච්චි කළ ගොන් කරත්තය යටය. ඉංග්‍රීසින් විසින් කරත්තයේ ගොනා මරා දමා තිබූ නමුත් කරත්තයට හානියක් කර තිබුණේ නැත. දවසෙන් දෙකෙන් වැස්ස තුරල් වේ යැයි සේදරා එළිසබෙත් සමඟ කරත්තය යටට වී බලාපොරොත්තුවෙන් සිටි නමුත් එය එසේ සිද්ධ වුණේ නැත.

මේ වන විට බීමට අරක්කු නොතිබූ නිසාත් ඒ හේතු කොටගෙන අමු මස් කෑම අතහැර තිබූ නිසාත්, වතුර පමණක් බීමට පුරුදු වී සිටි සේදරා පරඬැලක් තරමට කෙට්ටු වී සිටියේය.

The Reader's Place

මතක ඇති කාලයක ඔහු එළිසබෙත් හා නිදිවැදී නොතිබුණේය. එහෙත් ඔහු හැම විටකම ගෙදර උළුවස්සෙන් එහා මෙහා යන්න බැරි කාලයේ හොඳටම වෙරි මතින් එළිසබෙත්ගේ ඇඟ උඩට නැඟ ඇගේ ඇටකටු පොඩිකරමින් දඟලූ හැටි මතක් කළේය. ඇත්තටම ඔහු ජීවත් වුණේ ඒ මතකය නිසාය.

සේදරා දවසින් දවස කෙට්ටු වූ නමුත් ඔහුගේ සවි ශක්තිය දගමෙකින්වත් අඩු වුණේ නැත. ඔහු මතක ඇති කාලයක එළිසබෙත් සමඟ රමණයේ නොයෙදුණේ ඔහුගේ සවි ශක්තිය පිළිබඳ ප්‍රශ්නයක් නිසා නොවේ. කෙට්ටු වුණාට ගැහැනියක හා රමණයේ යෙදෙන්නට ඕනවටත් වඩා ශක්තියක් ඔහු ළඟ තිබුණේය. එහෙත් ඔහුට ප්‍රශ්නයකට තිබුණේ අරක්කුවල වෙරිමත නැතිව ගැහැනියකගේ ඇඟ උඩට නඟින්න බැරි වීමය. ඔහුගේ රමණය කෙළින්ම වෙරිමත සමඟ සහසම්බන්ධ වී තිබුණේය. වෙරිමතක් නැතිව රමණයක් ගැන හිතාගන්නවත් ඔහුට බැරි වුණේය. එළිසබෙත් කෙතරම් ඔහු රමණයට පොලඹවාගන්න උත්සහ කළත් ඔහු ගස් බිල්ලෙක් වගේ ඇ දිහා බලාගෙන හැඟීමක් නැතිව ඇ සමඟ හිනාවුණේ ඒ නිසාය.

වරක් නිරුවතින් සිටි එළිසබෙත් දිහා ඔහු බලාගෙන හිටියේ පුදුමයට පත්වය. ඇගේ පියයුරු සහ රහස් තැන් පිහිටා තිබුණේ කුමකටදැයි ඔහුට හිතාගන්න බැරි විය.

දවස් දෙක තුනකින් තුරල් වේ යැයි බලාපොරොත්තු වූ වැස්ස නොකඩවා එක දිගට වහින්න වූ විට එළිසබෙත් සේදරාට පොඩිනාගේ ගෙදරට යන්නට බල කළාය. එහෙත් සේදරා කොහොමටවත් එයට එකඟ වූයේ නැත. තමා ගැන නොතකා පොඩිනාගේ ගෙදරට යන්නැයි සේදරා එළිසබෙත්ට බල කළ නමුත් මඩකලපුවේ නගර සෝභනියකව සිටි තමා ගරු නම්බු ඇති බිරිඳක් බවට පත් කළ මේ මිනිහා හැරයන්න ඇ කැමති වුණේ නැත.

එහෙත් පුරා සතියකින් පසුවත් වැස්ස තුරල් නොවූ විට එළිසබෙත් අන්තිමට පොඩිනාගේ ගෙදර යන්න තීරණය කළාය. එහෙත් ඒ නවතින්නට නොවේ. වැස්සේ තෙමි තෙමී දවල් වරුවේ

පොඩිනාගේ ගෙදරට ගිය ඇ එහෙත් මොනා හරි සප්පායම් වී තන්න තියෙන දෙයක් ඔහුටත් එක්ක අරගෙන පැ කීපයකට පසු ආපහු කරත්තය යටට ආවාය. එහෙත් ඇ ගෙනා කිසිවක් ඔහු තටෙ තිබ්බෙ නැත. ඒ වෙනුවට ඔහු කළේ කරත්තයෙන් එළියට නැමී වැටෙන වැහි වතුරට කට අල්ලා සිටීම පමණය. වැහි වතුර වලින් ඔහුගේ බඩ පිරුණු අතර ඇත්තටම ඔහුට බඩගින්නක් තිබුණේ නැත.

වැස්ස නිමා වූ පසුව පුංචා ගම්වැසියන් සමඟ එක්ව ඉංග්‍රීසින් විනාශ කළ ගම නැවත පිළිසකර කරන්නට පටන් ගත් විට සේදරා එහි ක්‍රියාශීලි සාමාජිකයෙක් වුණේය. ඔහු නොනවත්වා වැඩ කළේය. ගම්වැසියන් සමඟ කැළේට ගොස් ගස් කපාගෙන ආවේය. ගමේ හැමතැනම හක්කලං කොට පිදුරු, ඉලුක්, මානා එකතු කළේය. බිඳී ගිය වැව පිළිසකර කරන්න වතුරට බැස්සේය. පරඬැලක් වන් මේ කෙට්ටු මිනිහා වැඩ කරන හැටි ගමේ මිනිසුන් බලාගෙන හිටියේ කම්මුලට අත තියාගෙන කට ඇරගෙන පුදුමයට පත්වය. කෙනෙකුට ඔහු ඇඟිල්ලෙන් තල්ලු කළ හැකි වුණත් දිගටම වැඩ කරන්න පුළුවන් ශක්තියක් ඔහුට තිබුණේය. සැබවින්ම ඔහු නොකඩවා වැඩ කළේය. එහෙත් වතුර පමණක්ම බිවේය.

වෙසක් මාසයේ පරිසරය ශුෂ්ක වී ගිනියම් හුළඟ හමන්නට ගත්තේ ඒ අතරය. මේ හුළඟ කෙතරම් සැර වුණාද කීවොත් විටෙක ගස් වැල් අඹරවා දැම්මේය. තවත් විටෙක ගෙවල්වල වහලයේ අතුරා තිබූ පිදුරු, මානා බිම දැම්මේය. එසේම සේදරාගේ ඉරණම තීරණය කළේද මේ හුළඟය.

දිනක් එළිසබෙත් සමඟ වැවට නාන්න ගිය සේදරා වැව් තාවුල්ල උඩදී මේ ගිනියම් හුළඟේ ගහගෙන ගියේය. සැබවින්ම ඊට මොහොතකට පෙර ඔහු එළිසබෙත්ගේ හිස සිඹ ඇගෙන් සමුගෙන තිබුණේය. එපමණක්ද නොව ඇගේ උරහිසේ අත තියා ඔහු මෙසේද පවසා තිබුණේය.

'මං නැති වුණාට උඹ හොඳ සන්තෝසෙන් ඉන්ඩ ඕන...'

එළිසබෙත් ඔහු දිහා එක එල්ලේ බලාගෙන හිටියේ ඇත්තටම ඔහු මේ කියන්න හදන්නේ කුමක්ද කියා තේරුම් ගන්න

The Reader's Place

බැරුවය. අන්තිමට ඔහු ඇගේ දකුණත සිය වමතට ගෙන එය මත තම අතේ සඟවා ගත් යමක් රහසින් වගේ තැන්පත් කළේය.

'අබ්දුල් මුදලාලිවයි මාවයි මතක් වෙන්න මේක තියාගන්ඩ...'

ඈ සිය දකුණත දිග හැර බැලුවාය. එහි තිබුණේ එදා අබ්දුල් මුදලාලි මිය ගිය දවසේ සේදරා බිම තිබී අහුලාගත් ඔහුගේ දත් වහල්ලෙන් බිඳී ගිය දතකි.

'දන්ත ධාතුව වගේ මං හරි පරිස්සමිං මේක ආරස්සා කර ගත්තේ...'

ඔහු එසේ කියන විට අබ්දුල් කෙරෙහි ඔහු තුළ පැවති භක්ත්‍යාදරය ඔහුගේ මලානික ඇස්වලින් උතුරා යන හැටි එළිසබෙත් දුටුවාය.

ඉන් ඉක්බිතිව ඔහු අත් දෙක විහිදා හමා ආ හුළඟට අවනත වුණේය. සිද්ධ වෙන දේ තේරුම් ගන්න බැරුව එළිසබෙත් හොඳටම කම්පනයට පත්ව මොහොතක් ගල් ගැසී සිටියාය. එහෙත් සැබවින්ම ඔහු හුළඟ දිගේ ඉහළට එසවෙන අයුරු දුටු විගස ඈ ඔහු පසුපස ලුහු බඳින්න වූවාය. ඈ හති දම දමා ලුහු බැන්දාය. ඔහු ඈ දිහා බලා සෙනෙහසින් සිනාසුණේය. ඔහු පසුපස ලුහු බඳිමින් කෙතරම් හයියෙන් කෑ ගැහුවත් ඈට ඔහු අල්ලාගන්න පුළුවන් වුණේ නැත. වැවට නාන්න පැමිණි මිනිසුන් ඇගේ කෑගැහිල්ල ඇසී දුවගෙන වැව් තාවුල්ලට පැමිණියත් ඔවුන්ටත් ඔහු නවත්වන්න පුළුවන්කමක් තිබුණේ නැත. සේදරා කෙතරම් කැමැත්තකින් ඒ ගිනියම් හුළඟේ ඇතට පාවී ගියාද යත් ඔහු කුරුල්ලෙක් වගේ අත් විහිදුවමින් අත්තටු ගැහුවේය. ඔහු දිගින් දිගටම එළිසබෙත්ට අත වැනුවේය. ඈත හිස් අහසට යනතෙක්ම අත වැනුවේය.

වැව් තාවුල්ලට පැමිණි මිනිසුන් මීට පෙර දවසක සේදරා වැඩ කරන හැටි කම්මුලට අත තියාගෙන කටවල් ඇරගෙන බලා සිටියා වගේ ඔහු ගිනියම් හුළඟේ පුංචිම පුංචි තිතක් වී නොපෙනී යන තුරු ඔවුහු ඒ විදිහට අහසට ඇස් දික් කරගෙන බලා සිටියහ.

ඉංග්‍රීසින් ගමට පහර දී පලා ගිය පසු ආහාර ප්‍රශ්නය ගමේ ප්‍රධාන ප්‍රශ්නයක් වූ බැවින් එයට පිළියම් වශයෙන් වැව පිළිසකර කර ඇළ වේලි නැවත සකසා වවන ලද බව බෝග බොහොමයක්මත්, හේන්වල ඉහින ලද තල කුරහන් ඈ සියල්ලත්, වෙසක් මස ඇරඹි මේ ශුෂ්ක කාලගුණය නිසා විනාශ වී යමින් තිබුණේය.

ඔළුවේ අත ගහගෙන පුංචා රෑ දවල් කල්පනා කළේ මේ තත්වයට මුහුණ දෙන්නේ කෙසේද කියන එක ගැනය. එහෙත් ඔහුට ස්වභාව ධර්මය පරාජය කර ඉදිරියට යන්න පුළුවන් වුණේ නැත. එහි භයානකම ප්‍රතිඵලය පැමිණියේ මේ ශුෂ්ක කාලගුණය සමඟ වෙසක් මස ගෙවී යාමත් සමඟය.

පොසොන් මස ආරම්භයත් සමඟ බෝවෙන ලෙඩ ගමේ හැම තැනම පැතිරෙන්න ගත්තේය. බලා ඉඳිද්දී වගේ මිනිසුන් ඔත්පළ වෙන්න පටන් ගත්තේය.

ගමේ වෙද රාළට ඉස්පාසුවක් නැති වුණේය. ඔහු එහාට දිව්වේය. මෙහාට දිව්වේය. ලෙඩ වෙන ලෙඩ වෙන ගම්වැසියන්ට හැකි සෑම විදිහටම වෙදකම් කරන්න ඔහු උත්සාහ කළේය. කට්ටඩි රාළ තමන් දන්නා ශිල්ප ශාස්ත්‍ර සියල්ලම පාවිච්චි කළේය. බෝවෙන රෝග හතර අත පැතිරී සතිය දෙක යන විට ඔහුගේ කහ නූලක් නොබැඳගත් අයෙක් ගමේ නැති වුණේය. කොච්චර මහන්සියෙන් වුණත් ඔහු ආතුර රෝගීන්ගේ ගෙවල්වලට ගොස් පුළු පුළුවන් විදිහට ශාන්තිකර්ම කළේය.

වසූරිය හැදී ගමේ මුලින්ම මිය ගියේ නළලේ තුවාල කැළල සහිත වූ සුරඹලෑ අම්මාය. වෙද රාළත්, කට්ටඩි රාළත් ඈ ගොඩගන්න කෙතරම් උත්සහ කළත් එය බැරි වුණේ වසූරිය රෝගයත් සමඟ ඇගේ සිරුර පුරාම ඉහඳ පණුවන් පැතිරී සිටි නිසාය. මුලදි මුලදී සුරඹාලෑ අම්මාගේ සිරුරෙන් එළියට ආ ඉහඳ පණුවන් එකා දෙන්නා ඈ වැතිර සිටි ඇඳේ එහා මෙහා යන විට හීන් අම්මා එළියට විසි කළ නමුත් දවසින් දවස පහු වන විට එකෙක් ඉවතට විසි කරන විට තව පස් දෙනෙක් එළියට ඇවිත් සිටියහ. ක්‍රම ක්‍රමයෙන් මේ අනුපාතය වැඩි වූ අතර එක දවසක් ඈ ඉහඳ

The Reader's Place

පණුවන් කීප දෙනෙක් එළියට විසි කර නැවත සුරඹලැ අම්මාගේ ඇඳ ළඟට එන විට පණුවෝ සීයක් විතර ඇඳේ එහාට මෙහාට දුවමින් සිටියහ.

අන්තිමට බැරිම තැන ගම්මු එකතු වී සුරඹලැ අම්මා පණ පිටින් සිටිද්දීම ඇඳ පිටින් උස්සාගෙන ගොස් ඇගේ සිරුර කැලේට ගොස් දැමූහ. පහුවදා ඔවුන් ගොස් ඇගේ සිරුර පරීක්ෂා කර බැලූ විට ඇගේ වමතින් එක දිගට ගලා ගිය වැලිවලට යට වී ඇ මියගොස් සිටියාය.

'මට වැඩිය ඒකි පිං කරල තියෙනවා. ඒත් තවත් කල් ජීවත් වෙන්න සිද්ධ වෙන තරමට මං කරපු පව් වැඩියි...'

ඇගේ මරණයෙන් සැබවින්ම තෘප්තියට පත් වූ හීන් අම්මා පසුව එසේ පවසා තිබුණාය.

වෙද රාළත් කට්ටඩි රාළත් මේ බෝවෙන රෝගවලට ගොදුරු වන මිනිසුන් බේරාගන්න කළ උත්සාහයට නොමසුරුව දායක වූ තැනැත්තියක් සිටියාය. ඒ එතනාය. ඇබිත්ත උන්නාන්සේගේ මරණයෙන් පසු ඇ පන්සලේම නැවතී සිටියාය. පුංචා ගම්වැසියන් සමඟ එක්ව තාවකාලික නිවෙස් ඉදි කරන විට ඇයටත්, සොබනීටත්, හීන් සුරඹාවත් ඉන්න හිටින්න පන්සල පහළින් ගෙයක් ඉදි කළ නමුත් පන්සලේ තිබුණු මළ සොහොන් පාළුව නිසා ඇ පන්සල අත්හැර ගියේ නැත. ඇ ඇගේ තනියට සොබනීත් හීන් සුරඹාත් පන්සලේම නවතා ගත්තාය.

එතනා වෙද රාළත් කට්ටඩි රාළත් සමඟ ගමේ හැම ගෙදරකටම ගියාය. සමහර විටෙක රෝගීන්ගේ කැත කුණු අතගාමින් පවා ඇ ඔවුන්ට උදව් කළාය. රෝගය පැතිරීමට ප්‍රධාන හේතුව අපිරිසිදුකම බව තේරුම් ගත් එතනා මැණිකාගේ සහයෝගය ඇතිව හැකි තරම් පිරිසිදුව ඉන්න මිනිසුන්ට කියා දුන්නාය.

නමුත් මේ උත්සාහයේ ඛේදජනක බව උදා වූයේ ගමේ පුංචි ගුරු කට්ටඩි රාළ කොලරාව රෝගයට ගොදුරු වීමත් සමඟය. වෙද රාළ හොඳටම බිඳ වැටුණේය. එතනා ඔහු වෙනුවෙන් කළ හැකි හැම දෙයක්ම කළේය. එහෙත් සැබවින්ම මේ බෝවෙන

රෝගවලට උත්තරයක් කා ළඟවත් තිබුණේ නැත. සති දෙකක් රෝගයෙන් ආතුර වී සිටි කට්ටඩි රාළ අවසානයේ තුන්වන සතිය මුලදී මියගියේය.

කට්ටඩි රාළගේ මියයාම ගමේ හැම දෙනාටම මානසික වශයෙන් සැහෙන බරපතළ විදිහට බලපෑවේය. බෝවෙන ලෙඩේ හැදුණොත් බේරෙන්ට විදිහක් නැතිය කියන අදහස හැම දෙනාගෙම හිත්වල පැල පැදියම් වෙන්ඩ ගත්තේය. එහෙම හැකියාවක් තියේ නම් ගමේ කවුරු මැරුණත් ඕනෑම යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍රයක කෙල පැමිණී ඉහේ කෙස් ගාණට අණවින කොඩිවින තීන්දු කපා ඇති කට්ටඩි රාළ මිය නොයන බව ගම්මු විශ්වාස කළහ.

ඇහැළ මාසයේ දෙවන සතිය වන විට පොඩිනාගේ රහස් බෙත් වෙළෙඳාමට උදව් කළ බණ්ඩියාද, ආරච්චි වලව්වේ ආවතේවකම් කළ පිනාද කොලරාව හැදී මියගියහ.

එතනා දිවා රෑ නොබලා වැඩ කළාය. තවම දහතුන් වියට එළඹී දැරියක වූ එතනා මිනිසුන් තුළ සහජයෙන්ම පවතින ජීවත් වීමේ ආශාව සිය ඇස් දෙකෙන් අත් විඳ තිබුණාය. බෝවෙන ලෙඩේ හැදී මරණය අබියස දඟලන ඔවුන් කෙතරම් ජීවිතයට ආදරය කරනවාද කියා ඇ ඔවුන්ගේ මලානික ඇස්වලින් හඳුනා ගත්තාය. කිසි විටෙක තම ධෛර්යය අත් නොහළ ඇ සැබවින්ම මිනිසුන්ට මරණය පරාජය කළ හැකි බව තරයේ විශ්වාස කළාය. එසේම ඒ විශ්වාසය රෝගයෙන් ඔත්පළ මිනිසුන්ගේ හිතට අමතර ජීවයක් සමඟ රෝපණය කළාය.

මිනිස්සු ඇගේ දහිරිය පිළිබඳව කෙතරම් විශ්වාසයකින් විශ්වාස කළාද කීවොත් රෝගයෙන් තම ගෙදර අයෙක් ඔත්පළ වූ විට මුලින්ම වෙද රාළටවත් කියන්නේ නැතිව එතනාට ඇවිත් බලන්න කියමුයි කියන තැනට පත්ව සිටියහ. ගෙදර කෙනෙකු ලෙඩ වූ විට ලෙඩාට වඩා අනෙක් අය පරිස්සම් විය යුතු බව ඇ ඔවුනට කියා දුන්නාය.

බෝවෙන ලෙඩේ හැදුණු තැනැත්තා ගෙදරින් සහ ගමෙන් කොන් කළ යුතු යැයි පැවති සාම්ප්‍රදායික මතයට පිටුපෑ ඇය ඔවුන් සමඟ පෑ ගණන් ගත කළාය. ඔවුන්ගේ දුක්ඛිත ජීවිතයේ අතරින් පතර තිබූ තෘප්තිමත් රසවත් තැන් ඔවුන් ලවාම එළියට

The Reader's Place

ගෙන ඒවා තලු මර මරා කතා කරමින් සිනාසුණාය. මෙසේ ගෙදර නිවැසියන් සමඟ පවා කතා නොකළ රෝගයට ගොදුරු වූවෝ ඇ සමඟ කතා කරන්නත් ඇ එන පෙරමඟ බලා සිටින්නත් පුරුදු වූහ. ඔවුහු කෙතරම් ඇගේ සමාගමය ප්‍රිය කළාද යත් අවසන් හුස්ම යන්නට කලින් ඇ තව වරක් දැක ගත යුතු බව කියා ගෙදර මිනිසුන් සමඟ රණ්ඩු කරන්නට පවා පටන් ගත්හ.

මේ විදිහට බෝවෙන රෝගයෙන් ඔත්පළ රෝගීන්ගේ එකම බලාපොරොත්තුව එතනා බවට පත්ව තිබුණේය. එපමණක්ද නොව දෙවියන්ගේ ඇල්ම බැල්ම විශ්වාසය සමඟ තම මුළු ජීවිත කාලයම ගත කළ මිනිසුන් කොලරාවත්, වසූරියත් ඔවුන් තළා පෙළා මරා දමන විට දෙවියන්ගේ ඇල්ම බැල්ම තමන්ට නැතැයි හිතන්නට පුරුදු වූ අතර ඔවුන් තම එකම දෙවියන් විදිහට විශ්වාස කරන්න පටන් ගත්තේ ඔත්පළ රෝගීන්ට හිතාගන්න බැරි තරම් ආදරෙන් සැලකූ එතනාය.

මේ අනුව සමහර ගෙවල්වල එතනා වෙනුවෙන් පහනක් පත්තු වුණේය. ඔත්පළ රෝගියෙකු සිටින ගෙදරක නම් එය අනිවාර්ය පිළිවෙතක් බවට පත් වුණේය. එසේම මේ වගේ බෝවෙන ලෙඩ හැදුණු විට පුරාණයේ තම මුතුන් මිත්තන් කළ විදිහට එවැනි රෝගීන් කැළෙට විසි කර දමා එන්නේ කුමකටදැයි තම තමන්ගෙන්ම අසා ප්‍රශ්න කරන තරමට එතනා ගම්වැසියන්ගේ හිත්වලට බලපෑම් කර තිබුණාය.

එහෙත් ස්වභාව ධර්මය කෙතරම් අකාරුණික දැයි පසක් කරවමින් එතනා ලෙඩ ඇඳට වැටුණාය.

එතනාට වසූරිය හැදුණාය කියන ප්‍රවෘත්තිය සැබවින්ම කවුරුවත් විශ්වාස කළේ නැත. මේ බෝවෙන රෝගයෙන් ඔවුන් ගලවා ගන්නට පැමිණි ඉටු දේවතාවියක යැයි විශ්වාස කළ ඇය ඒ ලෙඩෙන් ඔත්පළ වේ යැයි ඔවුන් හීනෙකින්වත් හිතුවේ නැත. කටින් කට පැතිරුණ මේ ආරංචිය ඇත්ත දැයි බලන්න ගම්මු වැල නොකැඩී පන්සලට එන්න පටන් ගත්හ. බෝවෙන රෝගයෙන් ඔත්පළ රෝගීහු පවා තමන්ට ඇ බලන්න පන්සලට යා යුතු යැයි කියා තම ඥාතීන්ට කරදර කරන්න ගත්හ. අන්තිමට ඇවිදගන්න බැරි සමහර රෝගීන් වැතිරුණු ඇඳවල් පිටින්ම පන්සලට රැගෙන යන්න ඔවුන්ගේ ගෙදර අයට සිදු වුණේය. ඔවුන් එතනාට වසූරිය වැළඳී ඇති බව සැබවින්ම සහතික කර දැන ගත්තේ තමන්ගේ ඇස්වලින් දැකගත් පසුය.

එතනා ඇබිත්ත උන්නාන්සේ නිදාගත් ඇඳේ වැතිර සිටියාය. කෙතරම් අපහසුවෙන් හිටියත් ඇ අදහාගත නොහැකි ධෛර්යයකින් තමා බලන්න එන හැම කෙනෙක් සමඟම කතා කළාය. එය සාමාන්‍ය කතා බහක් හෝ දුක්ඛදායක කතා බහක් හෝ නොවීය. එය හරිම විනෝදවත් උද්යෝගයෙන් සපිරි කතාබහක් වුණේය. ඇ බලන්න ආ සමහර රෝගීන් සමඟ ඇ කෙතරම් හයියෙන් හිනා වෙවී කතා කළේද යත් සමහර වෙලාවට සතුටට ඇගේ ඇස්වලට කඳුළු පවා ඉනුවේය. ඇ දැක බලා ගෙදර පැමිණි රෝගීන් තම පවුලේ අයට කියා තිබුණේ කියන තරමට මෙය භයානක රෝගයක් නොවන බවය. එබැවින් තමන්ට ඉක්මනින් සුව විය හැකි බව ඔවුහු විශ්වාස කළහ.

වෙද රාළ එතනා වෙනුවෙන් කළ හැකි හැම දෙයක්ම කළේය. තමන් දන්නා බෙහෙත්වලින් ගුණයක් ඇති නොවූ කල පුස්කොළ පොත්වල තියෙන විවිධ ඖෂධ වර්ග ඔහු අත්හදා බැලුවේය. එහෙත් දවසින් දවස එතනාගේ තත්ත්වය දරුණු අතට හැරුණේය. ඇගේ සිරුරේ බිබිලි ටිකෙන් ටික ලොකු වී සැරව මතුවන්නට වුණේය. අලුත් බිබිලි සිරුරේ හැම තැනකින්ම මතුවෙන්න ගත්තේය. රෝගය දරුණු වෙන්න දරුණු වෙන්න එතනා වඩ වඩාත් උද්යෝගිමත් ලෙසත් විනෝදවත් ලෙසත් හැසිරුණාය. ඇ බලන්න ආ අය සමඟ පෙරළි පෙරළී හිනා වෙන විට ඇගේ සමහර බිබිලි පොඩි වී සැරව ගැලුවේය. එවිට ඇ තව තවත් හයියෙන් හිනාවුණාය.

ක්‍රම ක්‍රමයෙන් එතනාගේ රෝගී තත්වය දරුණු වන විට එතෙක් කල් ගමේ රෝගීන්ට දේවතාවියක ලෙස සරණ වූ ඇයට ස්වභාව ධර්මය මේ තරම් කුරිරු විදිහට සලකන්නේ ඇයි දැයි ගැමියන්ට හිතාගන්න බැරි වුණේය. දෙවියකු, බ්‍රහ්මයෙකු සිටිනවා නම් මෙය කෙලෙසකවත් සිද්ධ විය නොහැකි බව ඔවුහු

The Reader's Place

සිතන්නට වූහ. එබැවින් ඔවුහු දෙවියන් කෙරෙහි කෙතරම් කෝප ගත්තාදැයි කිවහොත් ගමේ නුග ගහ යට ඔවුන් විසින්ම සකස් කර වතාවත් කළ දේව රූප සියල්ල පොඩිකර දැමූහ. එතැනින් නොනැවතුණු ඔවුහු අහිංසක එතනාට මේ කළ අපරාධයටත් මුළු ගමේම පැතිරුණු වසංගතයටත් දෙවියන් වගකිව යුතු යැයි පවසා දෙවියන් ඉදිරියේ පොල් ගසමින් දෙවියන්ටම සාප කරන්නට වූහ.

නිකිණි මස දෙවන සතියේ එතනා මියගියාය. මියෙන්නට පැයකට විතර පෙර ඇගේ රහස් ප්‍රදේශයෙන් රුධිරය ගලා ගොස් තිබූ අතර එය දුටු සොබනී ඈ වැඩිවියට පත්ව ඇති බව ඇගේ කනට කර කීවාය. එයින් මහත් වූ සන්තෝෂයට පත් එතනා එක දිගට හිනා වූ අතර හරියටම සිංහල පැයකට පසු ඈ මිය ගිය පසුවත් ඒ හිනාවෙන් ඇගේ මුහුණ විකසිත වී තිබුණේය. ඒ අනුව එතනා දැරියක විලසින් නොව මල්වර වූ තරුණියක විලසින් මියගොස් තිබුණාය.

අටසිය දා හතර අවුරුද්දේ ලොකු හාමුදුරුවන්ගේ අපවත් වීමෙන් පසුව ගම්වැසියන් බෙහෙවින්ම කම්පනයට පත් කළ මරණය වූයේ එයය. සිරුර විකෘති වන තරමට සැරව බිබිලි මතු වී තිබුණු නිසා යන්තම් මුහුණේ ස්වල්පයක් හැර ඇගේ මළ සිරුරේ ඉතිරි සියල්ලම රෙදි කඩකින් වසා තිබුණේය. මියගිය වහාම අවසන් කටයුතු කළ යුතු යැයි වෙද රාළ උපදෙස් දී තිබූ බැවින් එදාම හවස් වරුවේ ගම්මු ඇගේ සිරුර ආදාහනය කළහ.

ඇගේ මරණයට සහභාගි නොවූ කෙනෙක් ගමේ නොසිටියේය. අතිශයින් රෝගාතුර වූ කෙනෙකු හැර හැම කෙනෙක්ම ඇගේ මරණයට සහභාගි වූහ. කොටින්ම ලොකු හාමුදුරුවන්ගේ මරණයට සහභාගි නොවුණ ගෝමරී පවා ඇගේ මරණය දැක ගන්න පන්සලට ගියාය. මීට අවුරුදු දහතුනකට විතර ඉස්සර ගෝමරී ඇගේ කුසින් මැය වදා තිබුණත් අතීතය සහමුලින් අමතක වූ ඇයට එතනා අඳුනාගන්න පුළුවන් වුණේ නැත. බොහෝ වේලාවක් එතනාගේ හිනාවෙන් විකසිත වූ මුහුණ දෙස බලා සිටි ගෝමරී එතැන සිටි අයෙකුට මෙසේ පවසා තිබුණාය.

'පව්...හරිම සීදේවි කෙල්ල... මේකි වදාපු අම්ම අද කොච්චර දුක් වෙනව ඇද්ද ...'

The Reader's Place

15

එතනාගේ මරණයෙන් වසංගතය නතර වුණේ නැත. එය තව තවත් භයානක ලෙසත් අමානුෂික ලෙසත් මිනිස් ජීවිත බිලි ගනිමින් සිටියේය.

එතනාගේ මරණයත් එක්කම වාගේ ලැයිසා රෝගාතුර වූවාය. ඉන් වඩාත් කලබලයට පත් වුණේ ගෝමරිය. පුංචා සිහි මූර්ජා වී සිටි කාලයේ ඔහුගේ කළමනා සොයා බලනවා විනා වෙන දේකට ඉඩක් පාඩුවක් සොයා නොගත් ගෝමරී ඉංග්‍රීසි හමුදාවේ පැමිණීමත් සමඟ ඔහු පියවි තත්ත්වයට පත් වූ පසු නිදහස් ගැහැනියක් බවට පත් වූවාය. එහෙත් ඒ නිදහස ඇයට සැබවින්ම වදයක් විය.

පුංචා සිහි මූර්ජා වී සිටි කාලයේ ඈ දවස ගත කර තිබුණේ ඔහුට පින් සිදු වන්නටය. ඔහුගේ සාත්තු සප්පායම්වල නිරතව සිටි ඇයට දවස ගත වෙනවා දැනුණේ නැත. එහෙත් ඔහු නැවත පියවි සිහියට පත්වූ පසු ඇයට දවස ගත කිරීම ලොකුම ලොකු ප්‍රශ්නයක් වුණේය. පියවි සිහියට පත් වූ පසු පුංචා ඇයට නිදාග න්නට වෙනම ඇඳක් සකස් කරදුන් නමුත් ඈ පුරුද්දට දිගටම නිදාගත්තේ ඔහුගේ ඇඳ ළඟ බිම අතුරන ලද පන් පැදුරේය.

පුංචා පියවි සිහියට පත් වූ පසුවත් ඈ පරණ පුරුද්දට උදෑසන ඔහුගේ තොල් නිකට නාසය පිරිමදින්න ගත් දවස් තිබුණේය.

The Reader's Place

එවිට පුංචා නැඟිට ඇඳ උඩින් ඉඳගත් විට ඇ හොඳටම කලබල වුණාය. මෙසේ කීප වරක් සිදු වූ නමුත් පසුව ඇ යථාර්ථය තේරුම් ගත්තාය. එහෙත් ලොකුම ප්‍රශ්නය වුණේ අවුරුදු අටකට කිට්ටු කාලයක් ඇ පුරුදු වී සිටි ඔහුගේ හදවතේ ඩිග් ඩිග් ශබ්දය ඔහු එළියට යනවාත් එක්කම නොඇසී යන එකය. මුලින් මුලින් ඔහු එළියට ගිය හැම දවසකම ඇ ක්ලාන්ත වී වැටුණාය. අවසානයේ පුංචා විසින් පපුවට අත තියා ඇගේ හදවතේ ඩිග් ඩිග් ශබ්දය අහන්නට ඇයට පුරුදු කළ අතර ඉන්පසු පුංචා ගෙදර නැති වේලාවට ඇ නිතරම හිටියේ පපුවට අත තියාගෙනය.

ඉස්සර මෙන් නොව පුංචා උදේ ඇඳෙන් නැඟිට එළියට ගිය පසු ඇයට කරන්න වැඩක් නොතිබුණේය. ඇය සති කීපයක්ම ගෙයි පිලේ ඔහේ ඉඳගෙන හිටියාය. ටික දවසකින් ඇයට එය එපා වූ අතර ඉන්පසුව වෙනදා හවසට පමණක් දුම් අල්ලා කියන ලද දේව ස්තෝත්‍ර උදේටත් දවල්ටත් කියන්න පටන් ගත්තාය. ඒකත් ඇයට ටික දවසකින් එපා වුණේය. ඉක්බිතිව ඇයට තමා සැබවින්ම අමතක කළ දෙයක් මතක් වුණේය.

එනම් පුංචා සිහි මුර්ජා වී සිටි කාලයේ ඇ හොඳටම කාර්ය බහුල වී සිටි බැවින් තම ස්වාමි දූ වෙනුවෙන් අතපසු කරන ලද යුතුකම් සියල්ල දූත් ඉටු කිරීමට කාලය එළඹ ඇති බව ඇය තේරුම් ගත්තාය. ගෝමරී ලැයිසාට හොරෙන් ඇගේ ඇඳුම් සෝදා දුන්නාය. ඇයට නාන්නට ළිඳෙන් වතුර ඇද තැබුවාය. ඇට හොරෙන් උයා පිහා තැබුවාය. දිනක් ලැයිසා එසේ නොකරන්නැයි ඇයට කියූ විට ගෝමරී ඕනවටත් වඩා බැගෑපත් වී මෙසේ පිළිතුරු දුන්නාය.

'මගේ දරුවයි මායි මේ ගෙදර ඉන්නෙ ස්වාමි දූට පිං සිද්ධ වෙන්න... ඉතිං යුතුකම් ඉටු නොකර කොහොමද ?...'

ලැයිසා රෝගාතුර වී ඇඳට වැටුණේ ඔය අතරය. ගෝමරී ඇ වෙනුවෙන් සියලු යුතුකම් ඉටු කරන්න ගත්තාය. ලැයිසාට කෑම ටික කැව්වේ ගෝමරීය. ලැයිසාට වතුර ටික පෙව්වේ ගෝමරීය. ලැයිසාගේ ඇඳ ඇතිරිලි මාරු කළේ ගෝමරීය. ලැයිසාගේ මුහුණ අතපය බෙහෙත් වතුරෙන් සේදුවේ ගෝමරීය. ලැයිසාගේ ඇඳට කොහොඹ කොළ ගෙනැවිත් ඇතිරුවේද ගෝමරීය. මෙසේ මේ ගෙදර සැබෑ මෙහෙකාරිය වූ ලැයිසාට මේ ගෙදර සැබෑ ස්වාමි දූ වූ ගෝමරී මෙහෙකාරකම් කරමින් සිටියාය. එසේම ඒ මෙහෙකාරකම හරහා ඇ යළිත් කාර්ය බහුල වීමේ ප්‍රීතියද භුක්ති විඳිමින් සිටියාය. එහෙත් ඛේදවාචකය එළඹියේ ඉන් පසුවය.

ලැයිසා වෙනුවෙන් සිය මුළු ගත හිතම යොදවමින් අප්‍රමාණ ප්‍රීතියකින් අප්‍රමාණව වෙහෙසෙමින් සිටි ගෝමරී හදිසියේම රෝගාතුර වූවාය. පුංචා හොඳටම කලබල වුණේය. සිය මවට උදව් කිරීමට ආ ගැහැනිය එක පැත්තකින් රෝගාතුරව සිටියදී තම මව තවත් පැත්තකින් රෝගාතුර වීම ඔහුව පිස්සු වට්ටන්නක් වුණේය. ඔහු හැකි ඉක්මනින් වෙද රාළ කැඳවූවේය. රෝගීන් දෙදෙනාම පරීක්ෂා කළ වෙද රාළ ලැයිසාගේ තත්ත්වය බරපතළ නොවන බව පැවසුවේය. එහෙත් ගෝමරීගේ තත්වය හොඳ මදි යැයි ඔහු කීවේය.

ගෝමරී දුර්වල වෙන්න පටන් ගත්තේ පුදුමාකාර වේගයකින් යුක්තවය. ඒ දුර්වල වීම වගේ දෙගුණයක වේගයකින් ඇගේ සිරුර පුරා රෝගය පැතිරෙන්න ගත්තේය. දවසින් දවස මොහොතින් මොහොත ඇසිල්ලෙන් ඇසිල්ල ඇ දුර්වල වෙමින් සිටියාය. එසේම රෝගයේ ගොදුරක් බවට ද පත් වෙමින් සිටියාය. මෙසේ රෝගය වැළඳී දෙදවසක් යන්නට මත්තෙන් ගෝමරී බෙහෙවින්ම අසාධ්‍ය තත්ත්වයට පත් වුණාය. පුංචා ඇගේ ඇඳ ළඟින් හෙල්ලුණේ නැත. ගෝමරී හැඟිම්බර ලෙස ඔහුගේ ඇස් දිහාම බලා සිටියාය.

'මං මැරෙන්ඩයි යන්නේ......' ඇ කීවාය.

'මගෙ නළලෙ අත තියල දිව්රපං...'

පුංචා තම අත ඇගේ නළල උඩ තිබ්බේය.

'කවදාවත් රාජසිංහ රජ්ජුරුවන්ට එරෙහි වෙන්න එපා... ඒ උත්තමයව දිවි හිමියෙන් ආරක්ෂා කරපං... එයා නිසයි උඹ අද ජීවත් වෙන්නේ....'

පුංචාගේ ඇස්වලට කඳුළු ඉනුවේය. එහෙත් ඒවා බිම වැටෙන්න ඉඩ නොදී ඔහු ඇස් කෙවෙනි අතර හංගාගත්තේය.

'ස්වාමි දූට සලකපං... ඇ හොඳට රැක බලා ගනිං. උඹ වෙනුවෙන් මට ඇට යුතුකම් ඉටු කරන්න බැරි වුණා...'

The Reader's Place

තම මවට අසනීප යැයි දැනගෙන මැණිකා දුවගෙන ආවේ එවේලේය. පුංචා ඔළුව උස්සා ඇයට ඇඳ ළඟට එන්න යැයි කීවේය. ගෝමරී මැණිකා දිහා ඇස් හරවා බලා සිනාවුණාය. පසුව පුංචා දිහා බලා මෙසේ කීවාය.

'උඹට හරියට ගැළපෙන කෙල්ල මේකි...'

ඊට පසු ඈ යළිත් මැණිකා දිහා බැලුවාය.

'උඹ උඹලෑ අම්මගෙන් අහල උත්තරයක් දීපං මගෙ කොල්ලට...'

එවර පුංචාට සිය ඇස්වල කඳුළු ඇස් කෙවෙනි අතර හංගාගෙන ඉන්න බැරි වුණේය. ඒවා ගොඩ ගොඩ ගා ඇස්වලින් පිටවී ගෝමරීගේ ඇඟ උඩට වැටුණේය. මැණිකා ගෝමරීගේ අත තදින් අල්ලාගත්තාය. ඒ සමඟම බොහෝ කලකට පෙර තම ස්වාමි පුරුෂයා, දරුවන් හා මුළු ගමම එක්ව මරා දමන ලද මේ ගැහැනියගේ අවසන් හුස්ම 'හෝස්' ගා ඉහළට යන හඬ ඇහුණේය.

අවුරුදු ගාණක් සිහි මූර්ඡාවෙන් සිටි පුංචා පියවි සිහියට පත්ව ගෝමරී ගැන කෙතරම් විස්තර කළත්, ඔහුට අවුරුදු අටක් පමණ සාත්තු සප්පායම් කළේ ඈ බව කෙතරම් තේරුම් කළත්, ගෝමරී මියගියේ යැයි විශ්වාස කළ ගැමියන් ඔහු කී දෑ පිළිගත්තේ නැත. ඔවුන් සහතික ලෙසම හිතාගෙන හිටියේ ගෝමරී මියගොස් ඇත්තේ බොහොම කලකට පෙර බවය. පුංචා සැබෑ පංචස්කන්ධයක් සහිතව ඔවුන් ඉදිරියට ආ බැවින් ඔහුගේ පියවි සිහියට පත්වීම ඔවුන් විශ්වාස කළ නමුත් ඔහු ගෝමරී සම්බන්ධයෙන් කියූ දේවල් ඔවුන්ට කට කමසෙයියාවට කියූ කතන්දර වුණේය.

එබැවින් බෝවෙන ලෙඩේ හැදී ගෝමරී මිය ගිය විට ගැමියන් ඇගේ මළ සිරුර බලන්න ආවේ සැබෑ ලෙස ජීවත් නොවූ අවතාරයක මළගම දැක බලාගැනීමේ කුතුහලයකින් යුතුවය. සමහරු ඇගේ මළ සිරුර බලන්න ඇවිත් ගේ ඇතුළට යන්න බයෙන් උළුවස්ස ළඟින් බෙල්ල දික් කර බලා ආපහු යන්න

හිතා. එවිට යන්තං ඡායාවක් විදිහට පෙනුණ ඇගේ සිරුර ඔවුන් හඳුනාගත්තේ ඇත්තටම අවතාරයක් විදිහටය. එබැවින් ඔවුන් තම හිතවතුන්ට සහතික කර කීවේ ගෝමරී සහතික ලෙසම මියගිය අවතාරයක් යැයි කියාය.

ගෝමරීගේ මළගමට පැමිණි පිරිස අතර සිරුරේ තාඹිය [illegible] වැවුණු දිග රැවුලක් සහිත ස්වභාවයෙන්ම හැඩපලු ගෙතුණු දිග කෙස්සකින් යුත් තාපසයෙක් වැනි කෙනෙක් සිටියේය. බරට එල්ලූ තෝඩු දෙකක් නිසා ඔහුගේ කන් අසාමාන්‍ය ලෙස දිග ඇදී තිබූ අතර මුළු සිරුර වැහෙන්නට කහවන් සාටකයක් හැඳ සිටියේය. වමතින් නව ගුණ වැලක් දරා සිටි ඔහු නිරන්තරයෙන් එය ස්පර්ශ කරමින් සිටියේය. බොහෝ වේලාවක් උපේක්ෂා සහගතව මේ මළ සිරුර දෙස බලා සිටි හෙතෙම යන්න ලැහැස්ති වී මළ සිරුර ළඟ ශෝකයෙන් ළතැවි ළතැවී සිටි පුංචාට එළියට කතා කළේය.

'මට ආරංචියි මේ ගමේ පන්සල පාළුවට ගිහින්ය කියලා...'

'එහෙමයි...'

පුංචා හිස වනා එය අනුමත කළේය.

'මම තැනින් තැන ඇවිද භාවනා කරන්නෙක්... ගමේ ඇත්තන්ගේ අකමැත්තක් නැත්තං මං කැමතියි ටික දවසක් පන්සලේ නතර වෙන්ඩ...'

පුංචා අමුත්තා දිහා අනුකම්පා සහගතව බැලුවේය.

'අවසරයි...! මේක බෝවෙන රෝග පැතිරෙන කාලයක්. ගමේ මිනිස්සුන්ට ජීවත් වෙන්න තියා කන්න හොයාගන්නවත් පුළුවන් කාලයක් නෙමෙයි එළඹිලා තියෙන්නේ. ඒ හින්දා ඔබතුමාට උපස්ථාන කරන්ට පුළුවන් කාලයක් නෙමෙයි මේක...'

පුංචා ඇත්ත ඇති සැටියෙන්ම කීවේය. තාපසතුමා යන්තමින් සිනාසී ඔහු දිහා බැලුවේය.

' ඒ කිසිම දේකට වද නොවුණට කාරියක් නෑ. මට උවමනා නිකං වැටිල ඉන්න තැනක් විතරයි...'

'මට ඇබින්දක කාලයක් දෙන්ඩ...'

The Reader's Place

පුංචා තාපසතුමාගෙන් අවසර ගෙන මළ ගෙදරට පැමිණ ඒ අසල සිටි වෙද රාළත්, නැකැත් රාළත් ළඟට ගියේය. ඔහු ඔවුන් දෙදෙනා සමග තාපසතුමා දිහා බලමින් ඒ දිහාට ඇඟිලි දික් කරමින් ටිකක් වෙලා කතා කළේය. ඉක්බිතිව තාපසතුමා ළඟට පැමිණ මෙසේ කීවේය.

'හොඳා... අපේ අකමැත්තක් නෑ ඒකට...'

ඔහු මඳ විරාමයක් අරගෙන පසුව එයට මෙසේද එක් කළේය.

'ඔබතුමා පන්සලට යන්ඩ... එතන මළ පාළුවට ගිහින් තියෙන්නේ. මං මේ මළගම එකලාසයක් කරල අහවර වෙලා මෙහෙට හවහට ඇවිත් පිළිසකර කර දෙන්නං...'

ගෝමරීගේ සිරුර වළ දමා මළ ගෙදර සියලු කටයුතු අහවරක් කර පසුවදා හවස පුංචා පන්සලට ගියේය.

උඩට නගින්නට තියෙන ගල් පඩිපෙළියේ පඩි කීපයක් නැග පන්සලේ හාත්පස පෙනෙන මානයට පැමිණි විට පුංචා ඇස් අදහාගත නොහැකිව ගල් ගැසී සිටියේය. ඉංග්‍රීසින් ගමට පහර දුන් දා සිට කැත්තක උදැල්ලක පහසක් නැතිව [illegible] වල් පඳුරු හැදී මහ මුකලානක් බවට පත්ව තිබුණු පන්සල එක දවසක් ඇතුළත හරිම සාරවත්ව පුද්ද ශුද්ද වී තිබුණේය.

හමා ගිය ශුෂ්ක හුළඟට දරා සිටිය නොහැකිව බෝ මළුව උඩ එක මත එක හරිපු ගණනක් වැටී දිරා ගොස් තිබූ බෝ කොළ සියල්ල අතුරුදන් වී තිබුණේය. ආවාස ගෙයත් ඇතුළු කුටියත් පිළිවෙළකට පිරිසිදු වී තිබුණු අතර ඇතිත්ත උන්නාන්සේගේ අවසන් වරට හිඳ සිටි ආසනය සහිත එතනා විසින් පිරිත් නූල්වලින් වට කළ ස්ථානය විසරන් ඒ විදිහටම තිබුණේය.

පුංචා ආවාස ගෙට ඇතුළු වන විට තාපසතුමා ඇතුළු කුටියේ සිට ඉදිරියට ආවේය.

'මං ටිකක් පිරිසිදු කළා...'

තාපසතුමා මඳ මන්දස්මිතයක් ඇතිව එසේ කියද්දී පුංචා විස්මිතයෙන් ඔහු දිහා බලා කල්පනා කළේ මේ තාපසතුමා මිනිස මේ තනි අත් දෙකෙන් එකම එක දවසක ගෝරා කීයක් ඇතුළත මෙපමණ හරියක් කළේ කොහොමද කියන එකය.

පුංචා ඇතුළු පිරිස ඉංග්‍රීසින් ගිනි තැබූ ගෙවල් වෙනුවට අලුත් ගෙවල් ගම පුරා සාදන විට කිසිම අයිතිකරුවෙකු නැතිව තිබූ පන්සල මඟ හැරී තිබුණේය. එතනා සොබනීත් ගීත් සුරඹාත් සමග පන්සලේ සිටි නමුත් ඈ සිය මුළු කාලයම රෝගීන් වෙනුවෙන් ගත කර තිබූ බැවින් ඒ ගැන වෙනම හිතන්න ඇට වෙලාවක් නොතිබුණේය. සපුමලී පිළිබඳ නිමා නොවන පශ්චාත්තාපයකින් දුවී සොබනීටත් ඒ ගැන හිතන්න ඉඩක් පාඩුවක් නොතිබුණ අතර තාපසතුමා පන්සලට පැමිණි විට ඈ ගීත් සුරඹා සමග පුංචා සාදා දුන් තාවකාලික නිවසට ගොස් සිටියාය.

පුංචා කිසිම අයිතිකරුවෙකු නොසිටි මේ භූමියට තාවකාලිකව හෝ අයිතිකරුවෙකු පැමිණීම ගැන සතුටු වුණේය. පන්සල වටා බඹ කිහිපයක් හක්කලං කොට ආපසු ගල් පඩිපෙළ බසින අතර ඔහු තාපසතුමාට මෙසේ කීවේය.

'සතියක් දෙකක් නෙමෙයි මාසයක් හමාරක් හිටියත් ඔබතුමා තමුන්ගේ තැන වගේ මෙතන බලාගන්ඩ...'

ගෝමරීගේ මළගම සිදුකර විසි දවසකට පසු එළඹි වප් මාසයේ මුල් [illegible] අමුත්තන් දෙදෙනෙක් ගමට පැමිණියහ. එහෙත් සැබැවින්ම ඔවුනු අමුත්තන් නොවූහ. එහෙත් ගුරු මහ ඉංග්‍රීසි හමුදාව එල්ල කළ ප්‍රහාරයත් සමග හදිසියේ ගමෙන් අතුරුදන් වූ මේ දෙදෙනා යළි පැමිණියේ නව මසකට මෙණ පසු බැවින් ඔවුනු තරමක ආගන්තුකයෝ වූහ. මාග වෙලාවට ඔවුන් නොව ගම සැබවින්ම වෙනස් වී තිබුණේය. බැවින් ඇත්තටම සිදු වෙන්නට ඇත්තේ ඔවුන් ගමට නොව ඔවුන්ට ගම ආගන්තුක වීමය.

වල්ලීත්, පොඩි තිලකේත් මෙසේ ගමට පැමිණියේ සාමාන්‍ය ජීවිතයෙන් නොවේ. පොඩි තිලකේ, වල්ලී තම කර මත තියා ගෙන ආවේය. මෝරවන ලෙඩේ හැදී ඈ සිටියේ හොඳටම දුර්වලවය. තම කර මතින් ඈ රැගෙන එද්දී ඇගේ සිරුර පුරා හටගත් බිබිලි පුපුරා ලේ හැරව ගලා ගොස් පොඩි තිලකේගේ මුළු සිරුරම කුණු ලේ හැඩය ගෙන තිබුණේය. හරි තමන්

සිහියක් පතක් නැතිව සිටි වල්ලී පොඩි නිලමේගේ කර මත මළ සිරුරක් වගේ ඔහේ පත් බැවී සිටියාය. ගමට එන අතරමඟ ඔහු තැන් කීපයකදී ඇගේ සිරුර බිම තියා ඇගේ නාඩි පරීක්ෂා කර තිබුණේය. මේ දැන් පණ යයි කියන සැකයෙන් ඔහු හැම විටම සිටි නිසා කර තියා එන ගමනුත් ඔහු ඇගේ හුස්ම වැටීම ගැන පරීක්ෂාකාරී වුණේය.

ගමට ආ ඔවුන් දෙදෙනා මුලින්ම මුණ ගැහුණේ නැකැත් රාළටය. ඔහුට ඔවුන් දෙදෙනා එක වර හඳුනාගන්න බැරි වුණත් පොඩි නිලමේ තමන්ව හඳුන්වාදීමෙන් පසු ඔහු හිසේ අත ගසා ගත්තේය. ඉංග්‍රීසින් විසින් කළ පහර දීමේදී ගිනිබත් වූ ඔවුන්ගේ නිවස ඔවුන් යළි ගමට පැමිණේ යැයි විශ්වාස නොකළ පුංචා සහ පිරිස විසින් යළි ඉදි කර නොතිබූ බැවින් සැබවින්ම ඔවුන්ට ඉන්න තැනක් ගමේ නොතිබුණේය. එබැවින් නැකැත් රාළ වහාම ඔවුන් දෙදෙනා පන්සලට පිටත් කළේය. පසුව ඔහු පුංචාවත්, වෙද රාළවත් කැඳවාගෙන පන්සලට ගියේය.

ඔවුන් පන්සලට යන විට කලින් ඇබිත්ත උන්නාන්සේ පාවිච්චි කළ පසුව එතනා මියගිය ඇඳ මත වල්ලීගේ සිරුර තබා තිබුණේය. තාපසතුමා ඇගේ සිරුර පරීක්ෂා කරමින් සිටි අතර වෙද රාළ සහ පිරිස පැමිණි පසු ඔහු පසෙකට වී ඔවුන්ට ඉඩ දුන්නේය. වෙද රාළ බොහෝ වේලාවක් වල්ලී පරීක්ෂා කළේය. පසුව ඔහු පොඩි නිලමේ දෙසට හැරී මෙසේ කීවේය.

'මට දුකයි... දැන් කරන්න කිසිම දෙයක් නෑ... ඕන්නං තව දවස් දෙක තුනක් අල්ලල හිටියි...'

පොඩි නිලමේ වලහෙක් වගේ අඬන්න පටන් ගත්තේය. බිම පෙරළි පෙරළී වරින් වර ඇගේ සිරුර බදාගෙන ඔහු ඇඬුවේය. තාපසතුමා ඔහු සනසන්න කෙතරම් උත්සහ කළ නමුත් ඔහු සනසන්න බැරි වුණේය. එකදිගට සිංහල පැ දෙකක් ඇඬූ පසු තව වගුරන්න ඔහු ළඟ කඳුළු ඉතිරි වී නොතිබුණේය. අන්තිමට කඳුළු නැති ගොරෝසු හඬක් නැඟී එයද වේදනාවෙන් හූල්ලන ඉකි ගැහිල්ලක් බවට පත් වූ විට පුංචා ඔහු ළඟට කිට්ටු වී මෙසේ ඇසුවේය.

'ඇත්තටම මොකද උඹලට වුණේ...'

පොඩි නිලමේ ඉන් පසු ඔවුන්ට ඒ දීර්ඝ කතාව කියන්න පටන් ගත්තේය.

එදා ඉංග්‍රීසි හමුදාව පැමිණි දවසේ වල්ලී එක් සොල්දාදුවෙකු මිනිස් පිල්ලියක් ලෙස භාවිතා කර අනෙක් අය මැරූ හැටිත්, පසුව ඔවුන්ගේ සපිරිවර සමඟ ඔවුන් පැමිණෙන්නට පෙර තුවක්කුවක් සහ මූනිස්සම් පැසක් රැගෙන කැළේට පැන ගිය හැටිත් ඔහු විස්තර කළේය.

සැබවින්ම ඔවුන් විශ්වාස කළ නොහැකි ලෙස සොල්දාදුවන් තිදෙනකු මරා දමා තිබූ බැවින් ඒ පළිය ගන්නට ඉංග්‍රීසින් ඔවුන් පසුපස දිගටම පන්නන බව ඔවුහු දැන සිටියෝය. එබැවින් එක දිගට දවස් ගාණක් ඔවුන් හැංගි හැංගී මහ කැළෑව ඇතුළට මහ වැස්සේ තෙමී තෙමී දිව්වෝය. ඒ හැම වේලාවකම ඔවුන්ට ඉංග්‍රීසින් ළඟ ළඟ පසුපසින් එන බව දැනුණු අතර ඒ නිසාම ඔවුන් තව තවත් කැළෑව ඇතුළට රිංගා තිබුණේය.

මෙසේ යන අතරමඟ දවසකට කෙටිම කෙටි මොහොතකට ඔවුන්ගේ ඇස් නිදිමතින් පියවුණු අතර මහ වැස්සේ අතරතුර යළි ඇහැරෙන විට වල්ලී ඉංග්‍රීසි සොල්දාදුවෙකැයි කියා පොඩි නිලමේට බය වී තිබුණාය. එසේම පොඩි නිලමේටද ඇය ඉංග්‍රීසි සොල්දාදුවෙකු වගේ පෙනී තිබුණේය. මෙසේ දෙදෙනා දෙදෙනාටම වරින් වර බිය වූ බැවින් ඒ බිය විසින් ඔවුන් කෙතරම් ඈතකට තල්ලු කරන ලද්දේ දැයි දෙදෙනාම නොදැන සිටියහ.

පුරා දෙමාසයක් වට වැස්ස ගහ කොළ මතට වැටෙන විට මතු වන සද්දය ඔවුන් තේරුම් ගෙන තිබුණේ ඉංග්‍රීසි සොල්දාදුවන් මේ ළඟ ළඟ පැමිණෙන ලෙසය. පොඩි නිලමේ මෙසේ බිය වූ හැම වෙලාවකම ඈත ගහකොළ මත වැටෙන වතුර බිංදුවලට නිස්කාරණේ වෙඩි තබා තිබූ අතර දෙමාසය ගත වෙන විට ඔවුන්ගේ මූනිස්සම් අහවර වී තිබුණේය. ඔවුන් මේ දිවිල්ල නතර කර තිබුණේ පුරා දෙමසකට පසු වැස්ස නතර වූ පසුවය. එවිට ඔවුන් සිටින තැන ගැන කිසිම නිනව්වක් ඔවුන්ට නොතිබුණේය. එසේම තමන් තම ගමින් කොපමණ ඈත සිටිනවාද කියන හැඟීමක්ද ඔවුන්ට නොතිබුණේය.

The Reader's Place

වැස්ස නැවතී දවස් කීපයකට පසු ඔවුහු ගම් මණ්ඩියකට පැමිණියහ. පසුව ඒ ගමේ කීප දෙනෙකුගේ හොඳ හිත ඇතිව ඔවුහු ගමේ කෙළවරක පැලක් අටවාගත්හ. වාසනාවකට ඒ ගම ඉංග්‍රීසින් පහර දුන් ගමක් නොවීය. එහෙත් ඔවුන්ට එහි ජීවත් වෙන්නට කිසිම ක්‍රමයක් නොතිබූ බැවිනුත්, මහත් වූ ආහාර අර්බුදයකට ඔවුන් මුහුණ පෑ බැවිනුත් අන්තිමට වල්ලි ඒ ගමේ සාස්තර කියන්න පටන් ගත්තාය.

ඈ දවසින් දවස ඒ ගමේ ජනප්‍රිය වී තිබුණාය. ඒ ගමේ මිනිසුන්ගේ හොඳ හිත තව තවත් ඔවුන් කෙරෙහි ඇති වුණේය. ඒ ගමේ වැසියන්ද ක්‍රම ක්‍රමයෙන් බෝවෙන රෝගයට ලක් වෙන විට වල්ලි තම මව වූ ගෝමරීගේ ආවේගයෙන් ඔවුන් සුවපත් කරමින් සිටියාය. ඇගේ පුදුමාකාර ගුප්ත බලය හේතුකොට ගෙන ඒ පුංචි ගම්මණ්ඩියේ කවුරුන්වත් බෝවෙන රෝගයෙන් මිය ගොස් තිබුණේ නැත. ඒ නිසා සැබවින්ම ඈ පණ පිටින් සිටින දේවතාවියක ලෙස මිනිසුන්ගේ සැලකුම් ලබමින් සිටියාය.

එහෙත් හරියටම මීට සති තුනකට පෙර වල්ලීගේ සියලු බලයත්, ගුප්ත ආවේගයත් හදිසියේ අතුරුදන් වූ බව පොඩි නිලමේට පවසන විට සියල්ලන්ම එය අසා සිටියේ පුදුමයට පත්වය.

ඊට පසු ඈ කීප වරක් ආවේශ වන්නත්, සාස්තර කියන්නත් උත්සාහ කළ නමුත් ඒ සඳහා කිසිම බලයක් තමාට නැති විත්තිය ඈ තේරුම් ගත්තාය. ඇගේ ගුප්ත බලය අවසන් වූ දවසේ ඈ විසින් සුවපත් කළ රෝගීන් දොළොස් දෙනෙකු ඇගේ ඇස් පනාපිටම මියගොස් තිබුණේය. තවත් අට දෙනෙකු බලවත් ලෙස රෝගාතුර වුණේය. ඒ දවස තිස්සේ ඈ කෙතරම් උත්සාහ කළත් නැති වුණ බලය ඇයට නැවත ආරෝපණය කරගන්න පුළුවන් වුණේ නැත.

දෙවන දවසේ වල්ලී රෝගාතුර වුණාය. කෙතරම් ඉක්මනට ඈ අසාධ්‍ය තත්වයට පත් වුණාද කීවොත් රැජිනියක වගේ සිටි ඈ එකවරම හිඟන්නියක් වගේ වුණේ කොහොමද කියා පොඩි නිලමේට හිතාගන්න බැරි වුණේය. දවසින් දවස ඈ බලාගෙන ඉද්දී දුර්වල වුණාය. අන්තිමට තුන්වන දවසේ ඈ පොඩි නිලමේට මෙසේ කීවාය.

'මං මැරෙන්ඩ යන්නේ.. මට ඒකෙන් ගැලවෙන්ඩ බෑ... ඒත් මං කැමතියි මගේ ගමට ගිහිං මැරෙන්ඩ...'

එදාම රාත්‍රී යාමයේ පොඩිනිලමේ ගමේ කාටවත්ම නොකියා වල්ලී කර තබාගෙන එන්න පිටත් වුණේය. ඉණේ රඳවාගත් රෙදි කඩක ඔහු ගතවෙන දවස් ගල් පතුරකින් සටහන් කරගෙන තිබුණේය.

'කොහොම හරි දවස් දාහතක් යන කොට මට මගේ ගමට එන්ඩ පුළුවන් වුණා...'

පොඩි නිලමේගේ දීර්ඝ කතාවෙන් පසු ගුප්ත නිහැඬියාවක් පැතිරුණේය. සියලු දෙනාම හිටියේ ඒ නිහැඬියාව තුළ පුදුමයට පත්වය. අවසානයේ නැකැත් රාළ පොඩි නිලමේ දිහා බලා මෙසේ කියමින් ඒ නිහැඬියාව බින්දේය.

'වල්ලීගේ ඒ ආවේශ බලය නැති වුණේ මීට සති තුනකට ඉස්සර. එතකොට ගෝමරී නැති වුණෙත් හරියටම මීට සති තුනකට ඉස්සර. ඒ කියන්නේ වල්ලී මෙච්චර කල් සාස්තර කියල තියෙන්නේ ජීවමාන ගෝමරීගේ ආවේශයෙන්...'

ඒ සැබෑ සත්‍යය ඔවුන් සියලු දෙනාම නැවත පුදුමයට පත් කලේය. කිසිවෙකු ඉන්පසුව කතා නොකළ අතර සියල්ලෝම ඉන්පසු ඒ අසාමාන්‍ය සත්‍යය ගැන නැවත නැවත සිතන්නට වූහ. කෙසේ නමුත් මිය ගිය කෙනෙකුගේ ආත්මයක් උපයෝගී කරගෙන එයින් බලයක් ලබා ගත් ගැහැනුන් මිනිසුන් පිළිබඳව ඔවුන් ඕනෑ තරම් අසා තිබුණත් ජීවමාන ගැහැනියකගේ ආත්මයක් උපයෝගී කරගෙන එයින් අසාමාන්‍ය බලයක් උපදවාගත් අසාමාන්‍ය ගැහැනියක ගැන හෝ මිනිහෙකු ගැන හෝ ඔවුන් මීට කලින් අසා තිබුණේ නැත.

නමුත් ඇයට ඒ අසාමාන්‍ය බලය උපදවා ගන්නට ජීවය දුන් ගෝමරී මියගොස් තිබුණාය. එසේම ගෝමරී ගිය මඟ යමින් දුන් වල්ලීද මියයමින් සිටියාය.

පොඩි නිලමේ වල්ලී පිළිබඳ සියලු බලාපොරොත්තු අත හැර දැම්මේය. කොටින්ම ඔහු ඔහු ගැනත් බලාපොරොත්තු අත හැර දමා බලාගන්නු අත බලාගෙන ඉන්න පටන් ගත්තේය.

අතීතයේ දවස්වල ඔවුන් දෙදෙනා ඔවුන්ටම ආවේණික ලෙස ජීවිතයේ පරම සුවය වූ ආලිංගනයෙන් හා රමණයෙන් කෙතරම් පරමානන්දයට පත් වී දයි සිහි වන හැම විටකම ඔහු හුස්ම ඉහළට අරගෙන හිල්ලුවේය. එමෙන්ම තමාගේ සිරුර පුරා පවතින, සුරතාන්තයට පත් වෙද්දී ඈ සපා කෑ තැන්වල කැළැල් ඔහු ආදරයෙන් අත ගෑවේය. ඒ සමගම ඇගේ සිරුර පුරා පවතින ඒ ලප කැළැල් බලන්නට ඔහුට ආශාවක් උපන් නමුත් ඒ සියලු කැළැල් වසා පැතිරී ගත් වසූරිය බිබිලි ගැන මතක් වී ඔහු තිගැස්සුණේය. ඇත්තටම දුන් දුන් ඈ දිහා බලන්නට පවා ඔහු බිය වුණේය. සැබවින්ම තමා මෙතරම් පරම සුවයට ගෙන ගිය ඒ ගැහැනු කය මියයන බව දකින්නට ඔහුට ශක්තියක් නොතිබුණේය. සැබැවින්ම වල්ලි කෙඳිරි ගාන වාරයක් වාරයක් පාසා ඔහු අත් දෙකෙන් කන් දෙක වසාගත්තේය.

මෙසේ වල්ලිගේ සියලු ආවතේව කටයුතු තාපසතුමා මත පැටවුණේය. පොඩි නිලමේ වල්ලිගේ මරණය දක මුලු ගැන්වෙද්දී තාපසතුමා ඈ ළඟටම වී ඇගේ අවසන් මොහොතේ සියලු අභිලාෂයන් සපුරමින් සිටියේය. ඔහු බෙහෙත් වතුරෙන් ඇගේ සිරුරෙන් පිටවන උණුසුම සමනය කළේය. වෙද රාළ සකස් කර දුන් බෙහෙත් ඖෂධ අමාරුවෙන් ඇගේ කට ඇර ඇගේ සිරුරට වත් කෙළේය.

තුන්වන දවසේ හැන්දෑවේ ඈ අමාරුවෙන් හුස්ම ගන්න වූවාය. ඈ හයියෙන් හති අරිමින් වගේ කෙඳිරි ගාන්න පටන් ගත්තාය. ඇගේ ඇහේ කළු ඉංගිරියාව උඩ ගිය අතර දිව කට ඇතුළට ගියේය. පොඩි නිලමේ කන් දෙක වසාගෙන බය බිරාන්තව ආවාස ගෙයින් එළියට බැස්සේය. තාපසතුමා ඈ ළඟට තවත් ළංවී ඇගේ හිස අත ගාන්න පටන් ගත්තේය. ක්‍රමයෙන් ඇගේ සිරුර වෙව්ලන්නට වූ අතර ක්‍රම ක්‍රමයෙන් එහි වේගය වැඩි වුණේය. ඒ වෙව්ලිල්ල අතර මැද තාපසතුමා දිහා බැලූ ඈ හරියටම හඬක් පිට නොවුණත් උගුරෙන් මේ වගේ හඬක් පිට කළාය.

'මට... වතුර ටිකක්...'

තාපසතුමා වහා හුන් තැනින් නැගිට ඇතුළු ගෙට ගියේය. හතර අත හතර කොණේ බැලුවත් වතුර පුරවන කළ හතරේම වතුර බිංදුවක්වත් තිබුණේ නැත. තාපසතුමා කළය මුණින් අතට නමා වතුර උගුරක්වත් මඩක්කුවට පුරවා ගන්න උත්සහ කළත් එය හරි ගියෙත් නැත. ඔහු භාජන මැටි බඳුන් පෙරළමින් වතුර ඇබින්දක් හෙව්වේය. එහෙත් අවාසනාවට එක ඇබින්දක්වත් ඔහුට හම්බ නොවුණේය. මේ වෙලාවේ පන්සල් ළිඳෙන් වතුර අදින්න ගියහොත් අසරණ රෝගියා සහසුද්දෙන්ම මියයන බව ඔහු දන සිටියේය. සැබවින්ම එයට වෙලාවක් තිබුණේ නැත. තාපසතුමා කෙතරම් සන්තාපයටත් කලබලයටත් පත් වී ද යත් හදිසියකට ගන්න වතුර ටිකක් පැත්තකින් අඩුක්කර නොතිබීම ගැන තමාටම සාප කර ගනිමින් සිටියේය.

එහෙත් හදිසියේම ආවාස ගෙයි කෙළවර මකුළු දැල් බැඳුණු මුල්ලක කළු පාට බරණියක් ඔහු දක්කේය. වහා එතනට ගිය ඔහු හොඳට තදවෙන්න බැඳ තිබූ එහි කට කෙටි උත්සාහයකින් පසුව බුරුල් කරගත්තේය. කිසියම් දියරයක් එහි පුරවා තිබෙන බව ඔහු දුටුවේය. බරණිය පැත්තකට ඇල කර ඔහු මඩක්කුවට ඒ දියරයෙන් ටිකක් වත් කළේය. එවිටය, තාපසතුමා දුටුවේ එහි පුරවා ඇත්තේ රුධිරය බව.

මීට අවුරුදු ගණනාවකට ඉස්සර ලොකු හාමුදුරුවන් අපවත් වුණු දවසේ උන්වහන්සේගේ බෙල්ලේ කැපුම් තුවාලයකින් ගලා ගිය රුධිරය මෙසේ බරණියකට එකතු කර තිබුණේ ඇබිත්ත කොලුවා විසින්ය. එහෙත් එය කැටි නොගැසී එදා ගලා ගිය රුධිරය විදිහටම ඒ රතුම රතු පාටින් තිබුණේය.

තාපසතුමා මඩක්කුවට පුරවා ගත් රුධිරය අතේ තියාගෙන මොහොතක් කල්පනා කළේය. තව ස්වල්ප මොහොතකින් ඈ මියයන බව ඒකාන්තය. ඒ අවසන් මොහොතේ සා පිපාසාවෙන් වතුර බිඳක් ඉල්ලූ ඇයට මා කිසියම්ම හෝ දෙයක් නොදුන්නේ නම් එය මහා පාප කර්මයක් වන්නේය. මේ මොහොතේ ඇගේ මානසික ව්‍යාකූලතාවය අනුව මෙය වතුරද රුධිරයද කියා වෙන් කර හඳුනාගන්න පුළුවන් ශක්තියක් ඇයට නොමැත්තේය. එබැවින් වතුර ඉල්ලූ ඇයට මා මේ රුධිරය දුන්නා යැයි කියා පව් සිදු නොවන්නේය.

The Reader's Place

අවසානයේ තම සිත දඩි කරගත් තාපසතුමා රුධිරය පිරුණු මඩක්කුවත් රැගෙන වල්ලිගේ ඇඳ ළඟට ගියේය. තාපසතුමා ඇගේ ඇඳ ළඟට යන විට ඇගේ සිරුරේ තිබුණු වෙව්ලිල්ල නැවතී තිබුණේය. ඇගේ ඇස් උඩ ගොස් තිබුණේය. කට ඇරී තිබුණේය. සියල්ල අවසන් යැයි සිතා එක් වරම මඩක්කුව ඇතුළ ගෙයින් තබා එන්නට ආපසු හැරෙන අතර යන්තමින් ඇගේ පපුව ගැහෙන හැටි ඔහුට පෙනුණේය.

ඔහු වහා ඇගේ ඇරුණු කටට රුධිරය බිඳක් වත් කළේය. නිසොල්මන් වී තිබුණු ඇගේ සිරුර එක් වරම ගැස්සුණේය. ඔහු තවත් රුධිරය බිඳක් ඇගේ කටට වත් කළේය. යළිත් පෙර පරිදිම ඇගේ සිරුර වෙව්ලන්නට වූ අතර ඒ වෙව්ලිල්ල ක්‍රම ක්‍රමයෙන් බලා ඉන්නට බය හිතෙන තරම් වේගවත් වී එක් වරම නැවතුණේය. තාපසතුමා තවත් රුධිරය බිඳක් ඇගේ කටට වත් කළේය. එවර යළිත් ඇගේ හුස්ම ගැනීම වේගවත් වී පසුව සාමාන්‍ය තත්ත්වයට පත් වුණේය.

හෝරාවකට පමණ පසු ඇ ඇස් ඇරියාය. වටපිට බැලුවාය. තාපසතුමා දිහා බලා යාන්තමින් හිනා වුණාය. පහුවදා උදෑසන වන විට ඇගේ තුවාලවල පිරුණු සැරව වේළී තිබුණේය. ඉර මුදුන් වන විට ඇගේ තුවාල හොඳටම සුව වෙමින් තිබුණේය. හවස් වන විට වල්ලිට ඇඳෙන් නැගිටින්න පුළුවන්කම ලැබුණේය.

පන්සලේ ඇතුළු ගෙයි මකුළු දැල් බැඳුණු මුල්ලක තිබී තාපසතුමා විසින් සොයාගත් මේ රුධිරය පිරුණු බරණිය පිළිබඳ කතාව ලැව් ගින්නක් වගේ ගමේ පැතිරෙන්න වැඩි වේලාවක් ගියේ නැත.

සමහරෙක් මෙය විශ්වාස කළ නමුත් සමහරෙක් මෙය විශ්වාස කළේම නැත. තුවාලයකින් වුණත් ගලන රුධිරය කෙටි කලක් ඇතුළත කැටි ගැහෙන බව අත්දැකීමෙන් දන සිටි ගම්මු මෙහෙම දෙයක් වෙන්නේ කොහොමදැයි තර්ක කරන්නට වූහ. එහෙත් තාපසතුමා විසින් වල්ලිට පෙවූ මඩක්කුවේ තිබුණු දියරය හොඳින් පරීක්ෂා කර බැලූ වෙද රාළ එය සැබවින්ම මිනිස් රුධිරය බව ප්‍රකාශ කිරීමෙන් ඉක්බිතිව ඔවුහු පුදුමයට පත් වූහ.

The Reader's Place

ඒ අනුව සමහරෙක් මෙය [illegible]
හෝ ඉංග්‍රීසි හමුදාවේ තුවක්කු [illegible]යකින් මිය ගිය ඇබිත්ත උන්නාන්සේ හෝ අනාගතය දිවැසින් බලා ගම් වැසියන් පිළිබඳ කුලුණු ගුණයෙන් යුතුව කළ මහා ආශ්චර්යයක් බව ප්‍රකාශ කළහ. තවත් සමහරෙක් මෙය හදිසියේ ගමට ප්‍රාදුර්භූත වූ තාපසතුමාගේ පින්බල මහිමයෙන් එතුමාණන් විසින් සිදු කළ ආශ්චර්යයක් බව ප්‍රකාශ කළහ.

කොයි කෙසේ වෙතත් පහුවදා පාන්දර වන විට පන්සලේ ආවාස ගෙයි සිට ගල් පඩිපෙළත් පසු කොට බොරලු පාර වන තෙක් හු දෙකක විතර දිග පෝලිමක් දක්නට ලැබුණේය.

මේ පෝලිමේ මිනිස්සු භාජන අරගෙන මඩක්කු අරගෙන තෙරපි තෙරපී තම ගෙවල්වල බෝවෙන රෝගයෙන් ඔත්පළ වුණු ඥාතීන් වෙනුවෙන් රුධිරය අරගෙන යන්න පෙළ ගැසී සිටියහ. තාපස තුමා රුධිරය පිරුණු බරණියෙන් හැම දෙනාටම එක ප්‍රමාණයක රුධිරය ඔවුන් රැගෙන එන භාජනවලට පුරවමින් සිටියේය. ඒ වන විට වල්ලී තුවාල වේළී හොඳට ඇවිදින්න පුළුවන් තත්ත්වයේ සිටි බැවින් ඇ පොඩි නිලමේ සමග එක්ව තාපසතුමාට උදව් කරමින් සිටියාය.

පෝලිම දිගේ පැමිණි ගැමියෝ තාපසතුමාගෙන් රුධිරය අරගෙන යළි යන ගමන් එතුමාගේ නාභිය තෙක් දිගට වැවුණු රැවුල දිහාත්, ලොකු තෝඩු දෙක නිසා දිගට එල්ලුණු කන් පෙති දිහාත් ඔනෑකමින් බලා ඒ තේජවන්ත සිරුරට පසඟ පිහිටුවා වැඳ මෙසේ කීහ.

'ඔබතුමා බුදුන් දක නිවන් දකින්ඩ ඕන...'

මෙසේ පසඟ පිහිටුවා වැඳ හිස ඔසවන අතර සමහරෙක් තාපසතුමා හොඳට දක පුරුදු කෙනෙකු විදිහට දක තිබුණහ. තවත් සමහරෙකු කීවේ පන්සලේදී තමන් ඇස් පියා පන්සිල් ගන්නා අතරතුර එවන් තාපසයෙකු දුටු බවය. තවත් කෙනෙකු මෙලෝ සම්මජ්ජාතියකට එවැනි තාපසයෙකු දක තිබුණේ නැත. එහෙත් තාපසතුමා ගැන සැක සංකා තිබුණත් නැතත් එතුමාගෙන් ඒ ගැන විමසන්න එඩිතර වූ කිසිවෙකු ගමේ සිටියේ නැත.

වජ් මස ගෙවී ඉල් මස ලබන විට ගමේ එක බෝවෙන රෝගියෙක්වත් හොයාගන්න බැරි වුණේය. එපමණක් නොව ඈත ගම්වලිනුත් මිනිස්සු රුධිරය අරගෙන යන්න පන්සලට පැමිණියෝය. තාපසතුමා මුලින් මුලින් හරි අරපරිස්සමින් රුධිරය මිනිස්සුන්ට ලබා දුන්නත් පසුව බරණියේ රුධිරය අවසන් නොවන බව එතුමා තේරුම් ගත්තේය. ඒ අනුව ඉල්ලන ඉල්ලන ප්‍රමාණයට ඇති තරම් රුධිරය දෙන්න අන්තිමට එතුමා බය නොවුණේය.

බෝවෙන රෝග අනතුර සහමුලින්ම පහව ගිය පසු පුංචා නැවත වැඩ කරන්න පටන් ගත්තේය.

නවම් මැදින් මාසවල වට වැස්සෙන් පසු බක් මාසයේ ඔහු ගම තුළ ඇති කරන්නට ගත් වෙනස වෙසක් පොසොන් මාසය සමග ඇති වූ දැඩි නියගය කරණ කොට ගෙන විනාශ වී තිබුණේය. ඒ සමග පැමිණි බෝවෙන රෝග භය මිනිසුන් සහමුලින්ම පොළොවට සමතලා කරදමා තිබුණේය. ඔවුන්ට කන්න හාල් සේරුවක්, කුරහන් කුරුණියක් හොයාගන්න බැරි තරමට ආහාර අහේනිය බරපතළ ප්‍රශ්නයක් බවට පත්ව තිබුණේය. ගස්වල කොළ-මුල් කමින්, අල-බතල හාරමින් ඔවුහු කාලය ගත කරමින් සිටියහ. එබැවින් පුංචාට සියලු දේ අලුතින් පටන් ගන්න සිදු වුණේය.

අහේනියෙන් බඩ පොත්ත පිටට ඇලුණු, එක සිරුවට පැය කීපයක් වෙහෙස වෙන්න හයි හත්තියක් නැති මිනිසුන් එකතු කරගෙන ඔවුන්ට බලාපොරොත්තුව පිළිබඳව සිහිනය දල්වමින් ඔහු යළිත් වැඩ කරන්න පටන් ගත්තේය.

ඉල් මහේ අතරමැද අතරින් පතර යන්නම් වට වැස්ස ඔවුනට මහත් වූ සහනයක් අරගෙන ආවේය. එය ගත වුණු ඉක්ත කාලයේ බිහිසුණු බව සහමුලින් අකාමකා නොදැම්මත්, ඒ යන්නම් වට වැහි පොද නිසා යන්තම් දළු ලා හිස ඔසවන්න ගත් හාත්පස පරිසරය වගේ ඔවුන්ගේ හිත්වලත් අලුත් සිතිවිලි දළුලන්න එය ප්‍රමාණවත් වුණේය.

ඔවුහු ඇළවල් දිගේ වැවේ වතුර කුඹුරුවලට වැටෙන්න සකස් කරගෙන නැවත කුඹුරු කරන්න පටන් ගත්හ. නියඟයට

...ණු මුකලාන් යායවල් ගිනි තියා නව දැලි හේන් සකස් කර ...න්, කොල්ලු, මුං, උඳු, මෑ, අසමෝදගම් ආදී බෝග හිටවන්න ...ත, පොඩි පොඩි කොරටුවල මෑ, ලබු, වට්ටක්කා, බඩ ඉරිඟු ...සිරි, තියඹරා වැනි බෝග හිටවන්න ගත්හ.

මෙසේ ගැමියන්ගේ හිත්වල අනාගතය පිළිබඳ සුබවාදී ...පොරොත්තු විළිලන අතරතුර කතේ ඇබ ගසාගත්, මේ වන ...ව සොළොස්වන වියට එළඹ සිටි මැණිකා ගැබ්බර වුණාය. ...මාස කීපයක සිට ඇගේ කුස ඉදිරියට නෙරා එමින් තිබූ ...ත් සැබවින්ම මැණිකා පවා තමා ගැබ්ගෙන ඇති බව විශ්වාස ...ළේ නැත. ඇත්තම කාරණය ඈ කිසිම පිරිමියෙකු සමග මේ ...වා නිදිවැදී නොසිටීමය. එබැවින් තමා ගැබ් ගන්නේ කෙසේදැයි ...ණිකා පවා පුදුමයට පත්ව සිටියාය. මුලින් මුලින් ඇගේ කුස ...දිරියට නෙරා එන විට ඈ හිතුවේ එය එතරම් ගණනකට නොගත ...යු සාමාන්‍ය තත්ත්වයක් බවය. ඒ නිසා ඈ එය නොසලකා ...රියාය. එහෙත් ඉල් මහේ දවසක තම කුස තුළින් පා පහරක් ...කි දෙයක් දැනුණු විට සැබවින්ම එය සාමාන්‍ය තත්ත්වයක් ...බව ඈ තේරුම් ගත්තාය.

...ඒ වහාම වෙද රාළ නිවසට කැඳවූවාය.

ඈ වහාම වෙද රාළව කැඳවූවාය. ගැබිනියක්ද නැද්ද සාමාන්‍යයෙන් වෙද රාළට ...යන්න වැඩි වේලාවක් යන්නේ නැත. එහෙත් ඔහු මැණිකා ...ශ්චිතවයෙන් එවැනි ප්‍රකාශයක් කරන්න හෝරාවකට ආසන්න ...කාලයක් ගත්තේය. ඒ නිසා ඒ හෝරාවට පසුවත් ඔහු හිටිය ...පුදුමයට පත්වය.

'යෝනි පටලවත් සිදුරු වෙලා නෑ... තාම කන්‍යාවියක...

එහෙනං උඹ කොහොමද මිනිහෙක් එක්ක බුදියගත්තේ...'

'මං තාම කිසිම මිනිහෙක් එක්ක නිදාගෙන නෑ...'

මැණිකා සිය හස්ත මුද්‍රා භාෂාවෙන් වෙදරාළට කීවාය. ...ඇගේ භාෂාව හොඳින් තේරුම් ගත් වෙද රාළ ඇස් දෙක ලොකු කරගෙන යළිත් ඈ දිහා බැලුවේය.

'උඹ මට බොරු කරනව මැණිකා. උඹ මිනිහෙක් එක්ක නිදාගෙනම තියෙනවා....'

The Reader's Place

එහෙත් ඈ යළිත් එසේ නොමැති බව ඔහුට සිය භාෂාවෙන් සංඥා කළාය.

'එහෙනං කොහොමද මෙහෙම වෙන්නේ...'

මැණිකා වෙද රාළ ළඟට කිට්ටු වී ඔහුගේ උරහිසින් අල්ලා හොලවමින් සැබවින්ම තම කුස තුළ දරුවෙකු සිටිනවාදැයි සිය හස්ත මුද්‍රා භාෂාවෙන් වෙද රාළගෙන් විමසුවාය. මොහොතක් ඇගේ මුහුණ දෙස පුදුමයෙන් බලා සිටි වෙද රාළ 'ඔව්' යැයි කියන්නට හිස සෙලවීය.

ඉක්බිතිව ඈ සියල්ල තේරුම් ගත්තාය. බිංදු මිය යන්නට සතියකට විතර පෙර ඔවුන් දෙදෙනා ලොව සියල්ලන්ගෙන්ම වෙන්වී දෙදෙනාගේ සිරුර දිහා නිරුවතින් බලාගෙන එහෙත් දෙදෙනාගේ සිරුරු ස්පර්ශ කරන්නේවත් නැතිව සතියකටත් වඩා හිටි හැටි ඇයට මතක් වුණේය. ඒ වන විට ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන සංවේදීතාවයන්ට වඩා රූප සංවේදීතාවයේ අනන්තයට කිමිදී සිටි මැණිකා ඔහු සමඟ රූපයෙන් හෙවත් ඇසින් රමණයේ යෙදුණු අයුරු ඈ සිහියට නඟාගත්තාය.

සැබවින්ම පුරා සතියක් ඔවුන් දෙදෙනා දෙදෙනාගේ සිරුරු වලට අත තියන්නේවත් නැතිව දෙදෙනාගේ නේත්‍රාවලින් පමණක් රමණයේ යෙදී තිබුණෝය. අවසානයේ ඒ ඇසින් සිදුවූ රමණයේ කෙළවර මැණිකා ඔහුගේ පුරුෂ නිමිත්තේ පහස තම යෝනි පටලවල දුවටෙන්නේවත් නැතිව ගැබ්ගෙන සිටියාය.

'මගෙ හිතේ දූන් මාස හතකටත් වැඩියි...'

වෙද රාළ ඇයට සංඥා කර පෙන්නුවේය. කාල පරතරය ගණන් හදා බැලූ ඇය සැබවින්ම වෙද රාළගේ අනුමානය නිවැරදි බව තේරුම් ගත්තාය.

'එතකොට අප්පුච්චෙක් නැති දරුවෙක්ද බඩේ ඉන්නේ...'

වෙද රාළ ඇගෙන් විමසුවේය. ඔහුගේ ප්‍රශ්නය තේරුම් ගත් ඈ එසේ නොවන බව කියන්නට හිස දෙපැත්තට හැරවූවේය. එහෙත් ඈ කියන කිසිවක තේරුමක් හෝ ඈ ගැබ්ගෙන ඇත්තේ කෙසේද කියා අබමල් රේණුවක තරම්වත් හැඟීමක් හෝ නොමැතිව ගල් ගැසී ඈ දිහාම බලා සිටි වෙද රාළ අන්තිමට මෙසේ කියා යන්ඩ ගියේය.

'අපේ පරම්පරාවේ අත්ත මුත්ත සිරිකිත්තලා පවත් කන්‍යාවියක් බඩ දරු වෙච්ච සිද්ධියක් ගැන මං මේ ඇහුවමයි. කොහොම හරි උඹ බඩින්... එච්චරයි මට කියන්ට පුලුවන්... කෝකටත් නව මාසෙකින් දෙකකින් කරදරයක් නැතිව බඩ හැල්ලු වෙන්නය කියල ප්‍රාර්ථනා කරගෙන පන්සලට හිහිං අර තාපසතුමාට කිරි ආහාරයක් පූජා කරපං....'

පහුවදා ඉරිමා උදයේ මේ ගම් මණ්ඩියේ අනාගතය බාර ගැනීමට නියමිත, ගැහැනියකගේත් පිරිමියෙකුගේත් සහවාසයෙන් කලල බීජයක් හට නොගත්, ඇඟිල්ල දික් කර අප්පුච්චා යැයි නම් කරන්ට බැරි ඕපපාතික දරුවෙකු කුස තුළ දරාගෙන මැණිකා නමැති නොඉඳුල් කන්‍යාවිය පන්සලේ ගල් පඩිපෙළ නඟිමින් සිටියාය.

The Reader's Place

පසු සටහන

අටසිය දහනවය අවුරුද්දේ දුරුතු මහේ දවසක ඉංග්‍රීසි ආණ්ඩුවට පක්ෂපාත වූ එක්නැලිගොඩ නිලමේගේ වෙඩි පහරින් මිය යන්නට ටික වේලාවකට පෙර ඇබිත්ත උන්නාන්සේ ඔහු ගේ ඉල්ලීම පරිදි ඔහු ගේ අනාගතය ගැන තොරතුරු ප්‍රකාශ කර තිබුණේය.

ඒ අනුව යුද නීතිය සියතට ගෙන වෙල්ලස්සේ ගම් බිම් වනසමින් මිනිසුන් තළා පෙළා මරා දමා ඉංග්‍රීසි ආණ්ඩුවට කළ සේවයට රජු තිළිණ වශයෙන් ඔහුට රන් පදක්කමක් පමණක් නොව, බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර තැන විසින් සබරගමුවේ අටකලන් කෝරළේ මැද පත්තුවේ පිහිටි නිරමඩගම නම් ගමද ඔහුගේ නමට ප්‍රදානය කරන ලදී.

එහෙත් ඇබිත්ත උන්නාන්සේ ප්‍රකාශ කළ පරිදි ඊට අවුරුදු තුනකට ඉක්බිතිව එනම් අටසිය විසි දෙක අවුරුද්දේ දී අවුරුදු තිස් නමයක් වූ තරුණ වියේදී ම ඔහු මරණයට පත් වුණේය.

මාගම් සෝලිය

මොහාන් රාජ් මඩවල

වරින් වර නතර කර මා මේ පොත කියෙව්වේ ඉක්මනට ඉවර වේය කියන බිය මා දැඩිව වෙළා ගත් බැවිනි.

රත්න ශ්‍රී විජේසිංහ - දිවයින ඉරිදා සංග්‍රහය

සිද්ධාර්ථ - යසෝධරා සම්මත ආදර කතාව සේම සිංහබාහු - සිංහ සීවලී අසම්මත කතාවද අපේ ඉතිහාසයේ තිබේ.

ඌව බින්තැන්න ප්‍රධාන සංඝනායක නාපවෙල ධම්මානන්ද හිමි - ලංකාදීප

'මාගම් සෝලිය' නවකතාව ගොඩ වී තිබෙන්නේ දාර්ශනික පදනමක විහිදාය.

ජැක්සන් ඇන්තනි - සිළුමිණ

'මාගම් සෝලිය' ඇගේ වෛරය 4 වැන්නක් සඳහා ලියැවුණු සිනමා පිටපතක් වැන්නකි.

මහාචාර්ය අජන්තා හපුආරච්චි - ලක්බිම

ස්වර්ණ පුස්තක සම්මානයෙන් 'මාගම් සෝලිය' කුණුහරුපයක් කියා කපා හැරියේය. කතුවරයාගේ ආඛ්‍යානයෙහි ඇති අපූර්වත්වය ඔවුන් දුක නැත.

රන්ජන් අමරරත්න - දිනමිණ

ඌව වෙල්ලස්සේ ගමක් සහ එහි පන්සල කේන්ද්‍ර කරගෙන කතුවරයා මවන්නේ යථාවත් මායාවත් මුසුවූ ලෝකයකි

මහාචාර්ය කේ. එන් ඕ. ධර්මදාස - මව්බිම

'මාගම් සෝලිය' පොනොග්‍රෆි ගණයට අයත් නවකතාවක්.

දයා දිසානායක - රිවිර

මෙය ශිෂ්ටත්වයේ ආරක්ෂක රූහැන්පට ඇති අප සමාජයට අතහළ ලිංගිකත්ව චර්යා හා ආකල්ප පිළිබඳ න්‍යෂ්ටික බෝම්බයකි.

ආචාර්ය සාලිය කුලරත්න - දිවයින

Rs - 500/-

Novel

ISBN 978-955-4690-00-4
9 789554 690004

ප්‍රකාශන

00139881-25

Rs. 500.00

Cover Designer | Sanjaya Epa Senevirathna | epa design studio